සසර දුක් ගිනි නිවන

ශ්‍රී සද්ධර්මයෙන් බිඳක් ...

මම හදවතින්ම ප්‍රාර්ථනා කරනවා ඔය පින්වතුන්ට, ඇත්තටම සත්‍යය
අවබෝධයක් කරගන්න ලැබේවා කියලා. ඉතින් හැමදෙනාම මගෙ මේ බණ දහම්
නිකමට හරි ඇහුවනම් කල්‍යාණ මිත්‍රයෙක් හැටියට ඔය පින්වතුන් වෙනුවෙන්
කරන්න පුළුවන් උපකාරයක් තියෙයිනම්,
ඒක වචනෙ වචනෙ හරි
අර්ථය තෝරගෙන ජීවිතයෙ හැසිරෙන්න.

එතකොට මම ගත්ත මේ වෙහෙසේ, උත්සාහයේ ප්‍රතිඵලයක් තියෙයි.
මට ඒක බොහෝ කාලයක් සතුට පිණිස පවතියි.
ඒ කුසලය මට බොහෝ කාලයක් රැකවරණය පිණිස පවතියි.
ඔය පින්වතුන් බාහිර මොනවා හරි යමක් දුන්නනම් ඒ පින වහාම අතහැරෙයි.

නමුත් පින්වතුන්, ඒක කුසල සිතක් උපදවා ගත්තොත්,
ඒ කුසලය මගේ ජීවිතයටත් සම්බන්ධ වෙලා ඒක අතහරින්නෙ නැතුව
මට බොහෝ කාලයක් යහපත පිණිස පවතියි.

මේ සත්පුරුෂ වැටේ උපකාර කළ මහා සංඝරත්නයේ සියලුම දෙනාට
බොහෝ කාලයක් උපකාර පිණිස පවතියි.

අප වෙනුවෙන් ධර්මය ලෝකයේ පහළ කළ බුදුරජාණන් වහන්සේ වෙනුවෙන්
ඒ සත්පුරුෂ උත්තමයාණන්ට
අපෙනුත් ප්‍රතිඋපකාරයක් කළා යන අදහස ඇතුව
මේ දහමේ හැසිරෙන්න.

අති පූජ්‍යපාද මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ

සසර දුක් ගිනි නිවන ශ්‍රී සද්ධර්මයෙන් බිඳක් ... අති පූජ්‍යපාද මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ

සසර දුක් ගිනි නිවන

ශ්‍රී සද්ධර්මයෙන් බිඳක් ....



"රූපය පිරිසිඳ
දැකීමෙන් අනාගාමී
විය හැක,
අරිහත්වයට පත්විය
හැක්කේ නාමධර්ම
පිරිසිඳ දැකීමෙනි"

අති පූජ්‍යපාද මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ

හදවතින්ම පිදෙන දහම් පඬුරකි.

මෙම පොත කියවීමෙන් පසු තවත් කෙනෙකුට කියවීමට ඉඩ ප්‍රස්ථාව සැලසීමෙන්, ඔබටත් මෙම ධර්ම දානයට දායක විය හැකිය.

මහණෙනි, අප්‍රමාදීව, සිහි ඇතිව, සිල්වත්ව වාසය කරන්න. මනාව සමාධිගත කළ සිතුවිලි වලින් සිය සිත රැකගන්න. යමෙක් මෙම ධර්ම විනයෙහි නොපමාව යෙදෙන්නේ නම් හෙතෙම මේ සසර හැර දුක් කෙළවර කරයි.

- බුදුරජාණන් වහන්සේ -

සසර දුක් ගිනි නිවන

ශ්‍රී සද්ධර්මයෙන් බිඳක්....

අතිපූජ්‍ය මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ

සසර දුක් ගිනි නිවන ශ්‍රී සද්ධර්මයෙන් බිඳක් ....

© අතිපූජ්‍ය මාන්කඩවල සුදස්සන ස්වාමීන්වහන්සේ

ප්‍රථම මුද්‍රණය	: 2014 සැප්තැම්බර්
පිට කවර නිර්මාණය	: සංජය දිසානායක
පරිගණක පිටු සැකසුම	: මල්ෂා නිර්මාණි (තරංගා ප්‍රින්ටර්ස්)
මුද්‍රණය	: තරංගා ප්‍රින්ටර්ස් 142/B, මාකොළ පාර, කිරිබත්ගොඩ, දුඃකඃ 2910798 / 2912013

පොත පිළිබඳ විමසීම්	: 077 8143128
ස්වාමීන් වහන්සේලාට පොත පිළිබඳව විමසිය හැකි දුඃක අංකය	: 077 2166410
දේශනාවන් ශ්‍රවණය කිරීම සඳහා පිවිසිය හැකි වෙබ් අඩවි	: http://sudassana.org www. sobhana.net

ස්ථිර නවාතැනක් නැතුව ඔන්න එක මනුස්සයෙක් ගෙදරකට යනවා. ටිකක් වෙලා ඉන්නවා. 'දැන් මෙහෙ ඉන්න බැහැ හිටියා ඇති, උඹ පලයන්' කියලා තව කොහෙට හරි යවනවා. මෙහෙදි ලෙඩ හැදෙනවා, අසනීපවෙනවා, තව ගෙදරකට එලවනවා, ගෙයින් ගෙට එලවනවා. මේ මනුස්සයා පාරෙ තියෙන අම්බලමක නතර වෙලා ඉන්නවා. පහුවදාට ඒකෙන් බැහැලා ගිහිල්ලා ගිහිල්ලා, තව අම්බලමක ඉන්නවා. ස්ථිර තැනක් නැතුව, නවාතැනක් නැතුව, අම්බලමෙන් අම්බලමට යන මේ ජීවිතයම දුක් සහගත නැද්ද කියලා බලන්න.

ගෙවල් දොරවල් හදාගත්තා, දරු මල්ලො හදා ගත්තා. බඩු මුට්ටු මල්ලකට දාගෙන දැන් ආයෙත් 'උඹ හිටියා ඇති පලයන්' කියලා එළියට දැම්මා. ආයෙත් වෙන තැනකට ගිහිල්ලා පැදුරු කොට්ට එළාගෙන යන්න අදහසක් නැහැ, දැන් මේ ඉන්නමයි හදන්නෙ.

හොඳට බලන්න. තැනින් තැනට යන මේ අම්බලන් ජීවිතේ දුක් සහගත නැද්ද කියලා. ගඟාට ඉණිකපනවා වගේ වැඩක් නෙවෙයිද කියලා අපි මේ කරන්නෙ. ගෙවල් හදනවා, දරුවො හදනවා, යාන වාහන ඉඩකඩම්... මැරිලා මැරිලා මැරිලා මැරිලා දුක් විඳලා, ඒක දාලා හිඟන්නෙක් වගේ පන් පැදුරු කෑල්ලක් අරගෙන හිස් අතින්ම එහා පැත්තට යනවා.

නිකමට හිතන්න ඔය පින්වතුන්, ඕනෑවට වඩා කිඳා බැහැලා මේ වටිනා අවස්ථාව අත හැර ගන්නෙ ජීවිතේ ඇයි? අපි අදක නෙවෙයි, ඊයෙක නෙවෙයි, අවුරුදු කෝටි ප්‍රකෝටි ගණනකට ඉස්සෙල්ලා මේ කෙළෙසයට අහුවුනේ, වැරැද්ද කළේ. ඒ ඔක්කොටම වඩා වැරැද්ද මේකෙන් මිදෙන්න අවස්ථාව ලැබිලා තියෙද්දි, මිදෙන්න ධර්මය ලැබිච්ච අවස්ථාව ලැබිලා තියෙද්දි ඒක මග හැරලා... නැති කාලෙකදි නම් ඒකෙ වැරද්දක් නැහැ මේක සෙල්ලමක් නෙවෙයි. ඒ තරම් පින්වතුනි, මේක වටිනවා කියලා තේරෙන මනසකට, මේක රත්තරන් කියලා තේරෙන මනසකට, මැණිකක් කියලා තේරෙන මනසකට හමුවුනොත් අත හරින්නෙ නැහැ.

රජවරු රජකම් අත හැරියෙ, සිටුවරු සිටුකම් අත් හැරියෙ, නිකං එහෙම නෙවෙයි. අපිට මොනවද අත හරින්න තියෙන්නෙ කියලා හිතන්න. ඒ බුදු හාමුදුරුවන්ගෙ කාලෙ රජවරු, සිටුවරු අත හැරපු අත් හැරීල්ලෙ හැටියට. ඔය පින්වතුන් අනුරුද්ධ කුමාරයා ගැන අහලා තියෙනවා නේද, 'නැහැ' කියන වචනය අහලා තිබුණේ නැහැ. කොච්චර පින් තියෙනවද එයාගෙ ජීවිතේ කවදාවත් නැහැයි කියලා එකක් දන්නෙ නැහැ. අඩුවක් නැහැ. බත් හැදෙන්නෙ කොහොමද කියලා දන්නෙ නැහැ. එච්චරට සුකුමාලයි. ඒ වගේ සුකුමාල ජීවිත තිබුණා ඒ අය පවා දැක්කා මේක තාවකාලික අම්බලමක් කියලා. දෙපාරක් හිතුවෙ නැහැ. ගිහිල්ලා ආයෙත් මෙහාට කෙළ හල හල හිටියෙත් නැහැ. සියලුම ධර්මතා දේවල් ඔක්කොම අතහැරලා, පණුවො ගහපු මිනිවල ඔතපු සිවුරු කෑල්ලක් ඇඳගෙන හැමෝම අනලා දාපු බත් ටිකක් කබලකට අරගෙන ඒක වළඳලා, ගහක් යටට වෙලා ජීවත්වෙන්න තරම් ඒ කැපවීම මොනතරම් කැපවීමක් ද කියලා හිතන්න, මේ දහම වෙනුවෙන්. ඒ දහමෙන් ලැබෙන අර්ථය කොච්චරද?

ඉතින් මම මතක් කලේ, මේ දහම එච්චරට ජීවිතේට වටිනවා. ඊටත් වඩා මේක බොරුවක් නෙවෙයි. මේ 'සම්මා දිට්ඨි' කියන එක දැන දැක කරගන්න පුළුවන් එකක්. ගිහි ගෙවල් වලින් යන්න ඕනෙ නැහැ. ගිහි ගෙවල් වල ඉඳගෙනම මේ සඳහා උත්සහයක් ඇති කරගන්න, කොහොම හරි මේ ටික කරගන්න කියන ටික මතක් කරනවා. මොකද මේ අවස්ථාව අපිට හම්බ වෙන්නෙ නැහැ. මේක කියලා දෙන්න කෙනෙක් එන්නෙ නැහැ. මේ බුද්ධෝත්පාද කාලෙ මනුස්ස ජීවිතයත්, සද්ධර්මය තියෙන වටපිටාවත් හම්බ වුනොත් විතරයි අපිට මේක කරගන්න පුළුවන්.

ඉතින් මේ අම්බලමෙන් අම්බලමට යන ගමන නතර කර ගන්න උත්සහවත් වෙන්න. හොඳට තමන්ගේ සිතින්ම තර්ක විතර්ක කරලා බලන්න. මේ දුවා පුතා ගෙවල් දොරවල් කියලා හදලා හිස් අතින්ම ගිහින් ආයෙත් එහා පැත්තෙ හදන්න පටන් ගන්නවා. මේක මසැසට නොපෙනුනාට ධර්මතාවය ඇත්තයි. ඒ නිසා ඒ ගැනත් සිහිකරලා හැමෝම මේ දහම ජීවිතයට ගන්න උත්සහවත් වෙන්න.

~ මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ ~

පිදුම

බුද්ධ ශක්තියේ බල මහිමයෙන්. ඒ තථාගත බුදුරපිදුන්ගේ
බුද්ධ වචනය අප කරා රැගෙන එන
පණිවිඩකරුවාණෙනි,
ත්‍රිපිටකයේත්, අභිධර්මයේත් සඳහන්ව පවතින බුදු පියාණන්ගේ ගැඹුරු
ශ්‍රී මුඛ දේශනාවන් ඒ අයුරින්ම ගෙනහැර පාමින් අපගේ
ලාමකවූ හදවත් වලට තේරුම් ගත හැකි අයුරින් අරුත්බර නිදසුන් ගෙන
ගලපා සිතෙහිත් කයෙහිත් වෙහෙස නොබලාම දිවා රෑ අප කෙරෙහි වූ සානුකම්පිත
හැඟීමෙන්ම ඒ ශ්‍රී මුඛ දේශනාවන් අපට පහදා දෙන
දේශකයාණෙනි,
මේ අනවරාග්‍ර අති දීර්ඝ වූ සංසාරයේ ඇති භයානක කමත් ඒ සංසාර දුක
නැමැති රෝගයෙන් පෙළෙන්නාවූ අප හට එයින් මිදීමට ඉවහල්වෙන අති
දුර්ලභ වූ ඒ ඖෂදීය පානය බඳුවූ ශ්‍රී සද්ධර්මය අපට කරුණාවෙන් පහදා දෙන්නාවූ අපගේ,
ගුරු පියාණෙනි,
තුන්ලොව කිසිම දෙයකට සමකළ නොහැකි ඔබ වහන්සේ ලබාදුන් ඒ උතුම් වූ මහඟු
තිළිණයට අසරණ මා හට කෘතගුණ සැලකීමට වෙන කළ හැකි දෙයක් නොමැත.

එබැවින් මා පිළිගන්වන මේ දහම් පුස්තකය
දොත් මුදුන් දී දෙපා නැමැද මම ඔබ වහන්සේට පූජා කරමි.
ඔබ වහන්සේට එය පූජාම වේවා !

2014 වර්ෂයේ ඔක්තෝබර් මසට ඔබ වහන්සේගේ පැවිදි ජීවිතයට අවුරුදු
දහ අටක් පිරීම නිමිත්තෙන් හදපත්ලෙන්ම කෙරෙන පූජෝපහාරයයි මේ,

මා ගැන අනුකම්පාවෙන් එය පිළිගන්නා සේක්වා !

මේ ආත්ම භවයේදි ඔබ වහන්සේ ලබා ගත්තාවූ
මේ කුසල බල මහිමය ඔබ වහන්සේට අනුපාදා පරිනිර්වාණයටම හේතු උපනිශ්‍රය වේවා !

පුණ්‍යානුමෝදනාව

ඒ තථාගතයන් වහන්සේගේ ශ්‍රී මුඛ දේශනාවන්හි සැබෑමවූ අරුත මට පහදා දුන් අති පූජ්‍ය මාන්කඩවල ස්වාමීන් වහන්සේටත්,

උන්වහන්සේව මෙලොවට දායාද කළ ඒ පින්වත් දෙමාපිය යුවලටත්,

තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු විරාත් කාලයක් මේ දක්වාම ඒ ශ්‍රී සද්ධර්මය ලෝකය තුළ රැකගනිමින් ලෝකයාට අවබෝධ කර දීමට යත්න දරන පහන් ටැඹක් බඳුවූ අපගේ මහා සංඝරත්නයටත්,

එවගේම, මුල්ම අවධියේදි මගේ ධර්‍ම පිපාසය බොහෝ දුරට සංසිඳවූ බෞද්ධයා නාලිකාව ඇතුළු අනෙකුත් නාලිකාවන්ටත් (ඒ දේශකයාණන් වහන්සේලා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුම දෙනාට),

අන්තර්ජාලය හරහා සම්බන්ධවෙමින් සුදස්සන ස්වාමීන් වහන්සේගේ දේශනාවන් ලොවට ශ්‍රවණය කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබාදීමට කටයුතු කරන ඕස්ට්‍රේලියාවේ පදිංචි පද්මසිරි ලියනගේ මහතාටත්,

එවගේම, අති මහත් කැපවීමකින් කටයුතු කරමින් අන්තර් ජාලය හරහා කටයුතු කරන හෝමාගම පදිංචි ඒ ලාබාලවූ තරුණ මහතා වන ජනක ප්‍රදීප් ලියනගේ පුතණුවන්ටත්(එතුමන්ගේ මේ මහඟු සත් ක්‍රියාව නොතිබුණේ නම් මට මෙතරම් උණ්වහන්සේගේ දේශනාවන් ශ්‍රවණය කිරීමටත් මෙවන්වූ පොතක් එළිදක්වන්නටත් ස්ථිර වශයෙන්ම නොහැකි වනු ඇත)

ඒ වගේම, මේ අනවරාග්‍රවූ අති දීර්ඝවූ සංසාරයේ ආරම්භයේ පටන් මේ දක්වාම මගේ නැණ නුවණ පහදා ඒ දහම තුළම මා රැඳවූ මාගේ සියලුම කළ්‍යාණ මිත්‍ර පරපුරටත්,

පවිත්‍රවූ හදවතින්ම පුණ්‍යානුමෝදනා කරමි !

හැඳින්වීම

බුදුසමය ස්වභාවයෙන් ම ප්‍රඥාගෝචර වූවකි. එය බෞද්ධ යැයි සම්මත කිසියම් ජනවර්ගයකට සීමා වූවක් නොවේ. අසඨ, අමායාවී, ඍජුගති ඇති, ප්‍රඥා වූ කවරෙකුට වුවද බුදුසමය විවෘත ව ඇති බව ඊට ම ආවේණික ලක්ෂණයකි. නුවණැතියන් විසින් විමසීමේදී නින්දාවට ගොදුරුවේය යන බියක් බුදුසමයට කැළම නැත. ලෝකයෙහි විවෘතවූ කල්හි බබළන ධර්ම අතර බුදුසමය ප්‍රධාන වේ. ඇත්ත වශයෙන් ම ඊට හේතුව එහි විවරණය වනුයේ ලෝකයෙහි හැම කල්හි ම පවතින යථා ස්වභාවය යි. නෛරාත්ම්‍යය ආදී ධර්ම විභාග සමස්ත ලෝකයට ම විශ්ව සාධාරණ ධර්ම වශයෙන් ඉදිරිපත් වන්නේ නම් එය නුවණැති බොහෝ දෙනෙකු ග්‍රහණය කරගනු නොඅනුමානය. කෙසේ වුව ද බුද්ධධර්මය තවත් එක් ආගමක් වශයෙන් වර්ග කිරීමෙන් එයින් ලෝකයට සිදුවිය යුතු මහත් අර්ථයට මග අවුරා ඇති බව පෙනේ.

බුදුරජාණන් වහන්සේගේ ධර්ම දේශනා නිසියාකාරයෙන් විවරණය කර නොගැනීම නිසා ද බෞද්ධ යැයි සම්මත ජනතාව පවා අපේක්ෂිත අර්ථයෙන් ගිලිහෙනු පෙනේ. වැරදි අර්ථ කථනයනට හා නිසි අර්ථ මතු නොවීමට ප්‍රධානතම කාරණය නම් නිවැරදි විචාර මාර්ග භාවිත නොකිරීම ය. ඒ සඳහා බුදුදහම තුළ ම නිර්දිෂ්ට ක්‍රම වේද තිබියදී පවා ඒවා භාවිතයට නොගැනීම එක් අතකින් අභාග්‍යයකි. ධර්මකාමී සත්පුරුෂයෝ නෙත්තිප්පකරණය, පේටකෝපදේසය වැනි ධර්ම ග්‍රන්ථවල එන එම පර්යේෂණ ක්‍රමවේද භාවිත කොට නිවැරදි අර්ථ මතුකොට දක්වන්නේ නම් මැනවි.

පූජ්‍ය පාද මාන්කඩවල සුදස්සන ස්වාමීන් වහන්සේ බුද්ධධර්මය පිළිබඳ හසළ දැනුමක් හා අවබෝධයක් ඇති යතිවරයෙකි. පටිච්චසමුප්පාදය, පඤ්චඋපාදානඛන්ධය ආදී ධර්ම පිළිබඳ ස්වාමීන් වහන්සේ මතුකොට දක්වන අර්ථ විභාග බුදුසමය හා අනුකූල බව පෙනේ. ඇත්තවශයෙන් ම ඊට හේතුව ස්වාමීන් වහන්සේ භාවිත කරනුයේ යථෝක්ත ක්‍රමවේදය වීමයි.

මෙම ධර්ම ග්‍රන්ථය ස්වාමීන් වහන්සේ විසින් ඔස්ට්‍රේලියාවේදී පවත්වන්නට යෙදුණු ධර්ම දේශනා කිහිපයක් පිටපත් කිරීමෙන් නිපැයුණකි. එහෙයින් මෙය ලේඛණ සම්ප්‍රදායයට වෙනස් ව රචනා වී තිබේ. එහෙත් අර්ථය කැමැත්තවුනට එය බාධාවක් නොවන බව පෙනේ. ස්වාමීන් වහන්සේ පැවිදි භූමියට පත් ව අටළොස් වසරක් පිරීම නිමිත්තෙන් හා පෙර අන්‍ය ආගමක විසූ තමනට නිවැරදිව ධර්මය වටහා ගැනීමට මග පාදා දුන් ස්වාමීන් වහන්සේට උපහාරයක් වශයෙන් මෙම ධර්ම ග්‍රන්ථය බෙදා දීම, මේ සඳහා දායකත්වය දරණ පින්වතුන්ගේ අභිලාශය වේ. අවසාන වශයෙන් මෙම ධර්ම දානමය ආනිශංසය දේශක ස්වාමීන් වහන්සේට හා මෙයට සහය දැක්වූ දායක කාරක සැමටත් සදේවක ලෝකයාටත් උපස්ථම්භක වීමෙන් නිදුක් නිරෝගී සුවපත් භාවය, චිර ජීවනය හා නිර්වාණාවබෝධය වේවායි ප්‍රාර්ථනය කරමු.

මෙයට
ශාසනස්ථිකාමී, රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති
පූජ්‍ය කොත්මලේ කුමාරකස්සප හිමි.

ස්තූතිය

මෙම පුස්තකය කරන අතර තුර මා හට නන් අයුරින් උපකාර කළ
සහ
මා දිරිමත් කළ මගේ කල්‍යාණ මිතුරියන් වන වසන්තා සහ දීපිකාටත්
ඒ වගේම අබේසිංහ ලේබම් මහතාටත්,

සෝදුපත් බලා පෙරවදන සකසා දුන් පූජ්‍ය කොත්මලේ
කුමාරකස්සප ස්වාමීන් වහන්සේටත්,

චාම්, ශාන්තවූ පිටකවරයක් කර දුන් මා ආදරණීය පුත්‍ර සංජයටත්

පරිගණක සහ මුද්‍රණ කටයුතු ඉතාමත් කැපවීමකින්,
ලඟි ලඟියේ කර මේ අමිලවූ දහම් පුස්තකය මා අතට පත්කළ
තරංගා ප්‍රින්ටර්ස් අධිපතිතුමා ඇතුලු ඒ කාර්ය මණ්ඩලයටත්

සැම කටයුත්තක්ම සොයා බලා මට අත හිත දුන් මගේ ස්වාමි
පුරුෂයාටත්

මාගේ ආදර අවංක ස්තූතිය පිරි නමමි.

ඔබ සැමට වහ වහා චතුරාර්ය සත්‍යයම අවබෝධ වේවායි පතමි.!

කියවීමට ලැදි ඔබට ....

අනාගාමිකයෙක්වී මෙලොව එළිය දුටු මා හට තේරෙන ළමාවිය පසුකරන සමයේ පටන් ලෝකයෙහි සිදුවන දේ පිළිබඳව නිවැරදි දැනුම, මා ඇසුරු කළ මා හැදුනු වැඩුනු පරිසරය තුලින් මා නොලත් හෙයින්, මම නොයෙක් දේ පිළිබඳව විමර්ශණශීලි වීමි.

ලෝකයේ පවතින සැබෑමවූ යථාර්ථය උඩින් පෙනෙන දේ නොවන බව මට තේරෙන්නටත් දැනෙන්ටත් වීමි. ඒ නිසාම මම තව තවත් විමසිලිමත් වීමි. නොයෙක් ශාස්තෲවරුන් දේශනා කළ ධර්මයන් ගැනද සෙව්වෙමි, කියෙව්වෙමි. නමුත් ඒ කිසිම දෙයකින් සෑහීමට පත්වන්නට මට නොහැකි විය. 'නැහැ, මීට වඩා යමක් මේ ලෝක ස්වභාවය තුළ තිබිය යුතුමය' යන්න මට මගේ හදවත කියාපාන්නට විය. එනිසාම නොයෙකුත් දේ පිළිබඳව විමර්ශණයට ලක් කිරීමෙන් අනතුරුව මා නතර වුයේ බුදුපියාණන් දෙසූ දහම අභියසයි.

ලෝකය පිළිබඳව ලෝකයේ සිදුවන දේ පිළිබඳව මට දැනුන දේ සහ මා තවත් දැනගත යුතුව තිබූ දේ යන සියල්ලටම පිළිතුරු මා ලද්දේ බුදුපියාණන්ගේ ශ්‍රී මුඛ දේශනාවන් තුළින්මයි. උන්වහන්සේගේ මුවින් දේශනා කළ පරිදිම 'විමර්ශණය කරන්නාමයි, විශේෂණයට ලක්වෙන්නේ' කියලා මා විමර්ශණය කළ නිසාමයි මේ දහම මට ලැබුණේ, එහි වටිනාකම මට දැනෙන්න. නොයෙක් පොත පත කියවීමෙනුත් රූපවාහිනියේත්, විශේෂයෙන්ම බෞද්ධයා නාලිකාවේත් ධර්ම දේශනාවන්ට සවන් දෙමින් සුප්‍රකට ස්වාමීන් වහන්සේලාගේ දේශනාවන්ට සවන් දෙමින් ධර්ම සාකච්ඡාවලට සහභාගි වෙමින් ඒ ධර්මය තුළම ජීවිතය පවත්වාගෙන යමින් සිටින කාල වකවානුවේදීයි, මාගේ කළ්‍යාණ මිත්‍ර වසන්තා කරුණාරත්න සොහොයුරිය මා අති පූජ්‍ය මාන්කඩවල ස්වාමීන් වහන්සේගේ දේශනාවන්ට යොමුකළේ.

එදා පටන් මේ දක්වා මම සුදස්සන ස්වාමීන් වහන්සේගේ දේශනාවන් සිය ගණනක් ශ්‍රවණය කර ඇත්තෙමි. ඒ දේශනා අඩංගු පොත පත කියවා ඇත්තෙමි. උණ්වහන්සේගේ දේශනාවන් තුලින්, ශ්‍රී මුඛ දේශනාවන් පිළිබඳව මා ලද දැනුම් සම්භාරය කරන කොට, ඊට අනුව ජීවිතය පවත්වාගෙන යාමෙන් මේ භවයේදීම මට සතර අපා දුකින් මිදී යම් දිනක කෙසේ හෝ සසර දුක නිමා කර ගැනීමට හැකිවේ යයි මාගේ ඒකායන විශ්වාසයයි.

සුදස්සන ස්වාමීන් වහන්සේ අප ගැන අනුකම්පාවෙන් අපව මේ සසර දුක් ගින්නෙන් ගලවා ගැනීමට කොපමණ වීර්යයක් උත්සාහයක් දරනවාද යන්න තේරුම් ගත හැක්කේ නිරතුරුවම උණ්වහන්සේගේ දේශනාවන්ට සවන් දීමෙන්ම පමණි.

උණ්වහන්සේ දේශනා කරනවා,

'නිවන් දකිනවා කියලා අපි මොනවා හරි දෙයක් කරනවා නෙවෙයි, සත්‍යය අවබෝධයක් අපිට තියෙන්නෙ. සත්‍යය කියලා කියන්නෙ, යථාභූත ස්වභාවය. යථා - කියලා කියන්නේ, යම්සේ වූද, භූත - කියලා කියන්නේ, එබඳුවූ ස්වභාවයක්. මනුස්සයන්ට පෙනෙන රූප වෙනස්. දෙවියන්ට පෙනෙන රූප වෙනස්, බ්‍රහ්මයන්ට පෙනෙන රූප වෙනස්. එක එක්කෙනාගෙ මට්ටම් වලට අනුව එක එක්කෙනාට පෙනෙන රූප නෙවෙයි, රූපයේ තියෙනවනේ ඇත්තක්. ඒ යථාභූත ස්වභාවය දකින්න. දැන් මේක නොදන්නා කම නිසා ඇති වෙච්ච ප්‍රතිඵල ටික සහ ජීවිතය ගැන කියන්න සාක්ෂි ඕනෙ නැහැ. අපිට තියෙන්නෙ 'මේ අපි' කියලා අත උස්සන්න විතරයි.'

තවත් අවස්ථාවක,

'මම සත්පුරුෂ ධර්මයේ පිහිටලා සත්පුරුෂකම කරනවා කියලා කියන්නෙ, ඔය පින්වතුන්ව නිවන් දක්වන්න හදවන එක නෙවෙයි. ඒ කියන්නෙ, කවන්න හදන්න ඕනෙ නැහැ. බත් ටික බෙදලා දෙන්න විතරයි ඕනෙ. ඔය පින්වතුන්ට හිතන්න, හිතන හැටි කියලා දුන්නොත් ඇති. මම හිත ඇතුලට රිංගලා 'හිතවන්න' හදවනවා වගේ වැඩක් මේ කරන්න හදන්නෙ. දැන් කට්ටියත් ඒකට පුරුදු වෙලා. ඒකත් හරි පහසු වැඩේනෙ. ඒ කියන්නෙ 'හාමුදුරුවො අපිව භාවනා කරවයි' කියන තැනක ඉන්නෙ. නමුත් එහෙම බැහැ. කාටවත් දෝෂයක් කියනවා නෙවෙයි, මම කියන්නෙ ඇත්ත.'

නමුත් උණ්වහන්සේගේ බණ අහන්න අහන්න, මට නම් දැනෙන්නෙ 'උණ්වහන්සේ අපිව හිතවනවා' කියලා. ඒ තරම් වීර්යයක් උත්සහයක් කැපවීමක් උණ්වහන්සේ දරන්නෙ, මේ සසරේ ඇති දුක භයානක කම ගැන අපි හැමෝටම වඩා උණ්වහන්සේට දැනෙන නිසා, අපි හැමෝ කෙරෙහිම හදවතින්ම නැගෙන සානුකම්පිත හැඟීමෙන්මයි.

නැවතත් උණ්වහන්සේ මෙහෙමත් කියනවා,

'මේක ජීවිතය පිළිබඳ ප්‍රශ්නයක්, අනන්ත දුක් සහගත සසර පිළිබඳ ප්‍රශ්නයක්. ඔය පින්වතුන්ට ධර්මය කියලා දෙන්න මම දරන උත්සහයට වඩා දහස් ගණනකට වැඩි උත්සහයක් ඔය පින්වතුන් තුළ තියෙන්න ඕනෙ. සසර බිය තේරෙනවනම්, සසර දුක තේරෙනවනම්, මේ දුක් සහගත සසරින් එතෙර වෙන්න ඕනෙ නම් මනසේ හොඳ අවදිබවක් ඇති කරගෙන හොඳ උවමනාවෙන් මේ ටික අහන්න. මොකද සසරට වැටුණොත් කව්රු වෙනුවෙන් හරි, අපිව බේරගන්න කිසිම කෙනෙක් එන්නෙ නැහැ. ඒ නිසා අප්‍රමාදීව මේ ධර්මයේ යෙදිලා තමන්ගේ නිවීම, තමන්ගේ මිදීම, මේ ජීවිතයේදීම හඳුනාගන්න උත්සහවත් වෙන්න. එහෙම උත්සහයෙන් හිතන කෙනයි හැම වෙලාවේම විශේෂණයකට පත්වෙන්නෙ'

මේ වදන් අහන කොට මට හිතුනේ, උණ්වහන්සේ මටමයි මේ කතා කරන්නෙ කියලා. උණ්වහන්සේගේ දේශනා කිහිපයකටවත් උවමනාවෙන් සවන් දුන්නොත්, ඔයාලටත් හිතෙයි ඔයාලටමයි මේ උණ්වහන්සේ කියන්නෙ කියලා.

'අපි ලෝක නිරෝධය ගැන කතා කරන්නෙ, ලෝකෙ තුළ ඉඳගෙන. ඒ හින්දා මම මේ කියන්නෙ, මට මේ දහමෙ වටිනාකම තේරෙන තරම් මේ පින්වතුන්ට තේරෙනවද කියන එක මම දන්නෙ නැහැ. මං ඉතින් මට දෙන්න පුළුවන් ඉහළම දේ ලෝකයා වෙනුවෙන් හදවතින්ම දෙනවා. එච්චරට මම දන්නවා මේක

වටිනවා කියලා. ඒ කියන්නෙ මේ ටික අනුමානෙට හරි වැටහුනොත් එපමණකින්ම, ඒ ජීවිතය නාඨයි, අනාඨ නැහැ. ඒ හින්දයි මම මේ නැවත නැවතත් මතක් කරන්නෙ. ඔය ධර්මතා ටික ඔක්කොම ලැබෙනවා ගිහි ජීවිතයෙ ඉන්න මේ පින්වතුන් අවධාරණයෙන්ම කළයුතු 'සති නිමිත්ත' හුරු කරන්න. මම කියන්නෙ 'නිවන' හුරු කරන්න කියලා. සති නිමිත්ත කියන එක නිවන කිව යුතුයි.'

එක වෙලාවකට මට හිතෙනවා, උන්වහන්සේට බණ දේශනා කරන්න මේ තරම් ධෛර්යක්, ශක්තියක්, දැනුම් සම්භාරයක් ලැබුනෙ ඒ බුද්ධ ශක්තිය නිසාමයි කියලා. වේලාව ගෙවෙන කොට අපිට අහන් ඉන්න අමාරු වුණත්, උන්වහන්සේට කතා කරන එකේ මහන්සිය නම් චුට්ටක්වත් දැනෙන්නෙ නැහැ.

'අමාරුද කට්ටියට, අමාරුයි වගේ නේ, මට නම් බණ කිව්වැකි තව ගොඩක්' කියලා උන්වහන්සේ කියන්නෙ ඒ නිසයි. එහෙම කියලා උන්වහන්සේ කරුණාවෙන් අපිට මෙහෙමත් කියනවා.

'මෙහෙම එකක් තියෙනවා. කඩාගන්න බැරිදේ කඩාගන්න උපායශීලි වෙන්න, තමන්ටත් උත්සහයක් තියෙන්න ඕනෙ. ඕනෑවට වඩා දියාරු වෙලා නම් මේ ගමන යන්න බැහැ. තමන්ට යම් පෞරුෂත්වයක් තියෙන්න ඕනෙ'.

ගිහි ගෙවල්වල නොයෙකුත් බැඳීම් වලට යුතුකම් වලට යටත් වෙලා ඉන්න අපිට, ඒ හැමදේම හොඳින් ඉටුකරන ගමන් අපි හැමෝටම තනි තනියෙන් යන්න සිද්ධ වෙලා තියෙන ගමනක් මේ තියෙන්නෙ. අපිට මොනතරම් දරුවො, දෙමව්පියො, සහෝදරයෝ, නෑදෑ හිතමිත්‍රාදීන් හිටියත්, මොන තරම් අඟහිඟ කම් තිබුණත් කොයි තරම් දේපල වස්තුව තිබුණත් අපි හැමෝම තනි තනියෙන්ම ආව එවගේම තනි තනියෙන්ම යන අති දීර්ඝවූ ගමනක් මේ තියෙන්නෙ. ඒ නිසයි උන්වහන්සේ අපිව දිරිමත් කරන්නෙ ඒ විදියට.

ඒ නිසාමයි මමත් ඔයාලට කියන්නෙ, උන්වහන්සේගේ බණ අඩුම තරමේ දහයක් දොළහක්වත් අහන්න. උන්වහන්සේම දේශනා කරන පරිදි ඒ දේශනාවන් ස්වභාවයෙන්ම ටිකක් ගැඹුරුයි. ඒ නිසාම මම සරල තැන ඉඳලා ටිකෙන් ටික ගැඹුරට යන විදියෙ දේශනාවන් කිහිපයක් තමයි මේ පොතේ සම්පිණ්ඩනයට තෝරා ගත්තේ. මේ පොත අඩුම තරමෙ දෙතුන් වතාවක්වත් කියවන්න ඔබට හැකිවුනොත්, අනුමානෙට හිරි එහි අන්තර්ගතය ඔබට වැටහුණොත් එපමණකින්ම ඔබේ ජීවිතය නාථයි, අනාථ නැහැ කියලා මමත් කියනවා.

මා ලියූ මේ වදන් පෙළ, ඔබේ ඇසට ගැටුණු රූප මාත්‍රයක්ම පමණි. එහි ගැබ්ව ඇති භාෂා අරුත, ඔබේ මනසට ධම්මාරම්මණයක්ම පමණි. මේ සෑම වචනයක්ම ක්ෂණයකින් අතීතයට එක්වෙයි. අතීතය නිරුද්ධයි අනාගතය ඉපදිලා නැහැ. වර්තමානය පෙර නොතිබීම හට ගෙන ඉතුරු නැතුවම නැති වෙලා යනවා. මේ වදන් පෙළ ගස්වන මා 'මේ කවිද' යන්න ඔබ නොසිතිය යුතු 'ශූණ්‍යතාවයක්' ම පමණි.

ඔබ සැමට වහ වහා සසර දුක් ගිනි නිවන ශ්‍රී සද්ධර්මය අවබෝධ වේවා!

අන්තර්ගතය

★ බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළ උතුම් වූ ශ්‍රී සද්ධර්මය 1
- බුද්ධෝත්පාද කාලයකදීම පමණක් ලබා ගත හැකි 'ධම්මට්ඨිති ඥාණය' (සුසීම සූත්‍රය ඇසුරෙන්) 5
- අතීතය නිරුද්ධ වූවක් අනාගතය නූපන්නක් ශූන්‍යතාවයක් තුළම රැඳෙන වර්තමානය 16
- සත්‍යය අවබෝධ කරගැනීමටත් අසත්‍යය දුරු කිරීමටත් කළ යුත්තේ 'සත්‍යය දැකීම'ම පමණි 27

★ බුදු දහමේ මූලික පදනම සිත පිරිසිදු කර ගැනීමයි 40
- හතර ඉරියව්වක් පරිහරණය කරමින් 'අනිත්‍ය, දුක්ඛ, අනාත්ම' මෙනෙහි කළ හැකිද? 49
- ආයතන පිරිසිඳ දැකගැනීමෙන් අනුසය ධර්ම දුරුවී ලෝකොත්තරයට පිය නැගීම 53

ස්පර්ශ ආයතනයන්ගේ ඉපදීමමයි ලෝකයේ හටගැනීම 66
- ආධ්‍යාත්මික බාහිර යැයි නොබෙදිය හැකි බාහිරමවූ 'රූපායතනය' 71
- මහාභූත පටලය මත විද්‍යමාන වන උපාදාය රූප (වර්ණ සටහන්) 77
- එකටම ඉපිද එකටම මියයන (නිරුද්ධවන) ආධ්‍යාත්මික සහ බාහිර ආයතනයෝ 79
- ස්පර්ශ ආයතනයන්ගෙන් උපද්දවා පරිහරණය කරන පෙර නොතිබීම හටගත් ලෝකය 82
- ඇත්ත ඇති හැටි නොදන්නාකම නිසා මං මුලා වූ අසරණ ලෝකයා 83

ලෝකෝත්තර සම්මා දිට්ඨිය (මහා සළායතනික සූත්‍රය ඇසුරෙන්) 96
- දුක සහ දුක්ඛ සමුදය 98
- නිරෝධය සහ මාර්ගය 115
- චතුරාර්ය සත්‍ය අවබෝධය 126

ලෝකෝත්තර නුවණකටම හසුවන ක්ෂණ මාත්‍රයකට ඉපිද නිරුද්ධවන ලෝකය 133
- ලෝකයෙන් එතෙරවීමට ඉවහල්වන 'අනිත්‍ය, දුක්ඛ, අනාත්ම' යන ධර්මතාවයෝ 144
- නීවරණ චිත්තයෙන් මිදීමට යොදාගන්නා සමථ භාවනාවට කමටහන් 155
- සමථ, විදර්ශනා යුගනන්ද්ව 160
- ක්ලේශ පරිනිර්වාණයෙන් උපන් ස්කන්ධ පරිනිර්වාණය 175

✶ අන්තවලින් මිදී මැදද නොතැවරී සැබෑමවූ 'තණ්හාව' ඉක්මවීම 178
(මජ්ඣෙ සූත්‍රය ඇසුරින්)
- අතීතය එක් අන්තයක්, අනාගතය දෙවෙනි අන්තයයි, වර්තමානය මැදයි 185
- සැප වේදනාව එක් අන්තයක්, දුක් වේදනාව දෙවෙනි අන්තයයි, උපේක්ෂාව මැදයි 200
- නාමය එක් අන්තයක්, රූපය එක් අන්තයක්, විඤ්ඤාණය මැදයි 206
- ආධ්‍යාත්මික ආයතන එක් අන්තයක්, බාහිර ආයතන දෙවෙනි අන්තයයි, විඤ්ඤාණය මැදයි 209
- සක්කාය එක් අන්තයක් සක්කාය සමුදය දෙවෙනි අන්තයයි, සක්කාය නිරෝධය මැදයි 213

✶ සතර මහාධාතුවෙහි සැරිසරන 'භූත' 223
- කාම භූමිය අනුව ගිය සත්වයන්ට බෙහෙවින් උපකාර වන 'රූපස්කන්ධය' 226
- මහාභූත ඇසුරු කරගෙන පවතින 'උපාදාය රූප' 251
- උපාදාය රූපයන්ගේ 'රළු' සහ 'සියුම් රූප' 276
- ධම්මායතනය පරියාපන්න 'සුඛුම රූප' 281

✶ ලෝකයෙන් එතර වීමට නම් ලෝකයේ කෙළවරට යා යුතුමය 308
(රෝහිතස්ස සූත්‍රය ඇසුරෙන්)
- බඹයක් පමණ ශරීරය අරක් ගෙන ලෝකයම මවන ස්පර්ශ ආයතන 309

''මේ ධර්මය ගැඹුරුය. දැක ගැනීම අපහසුය. අවබෝධය දුෂ්කරය. ශාන්තය, ප්‍රනීතය. අතර්කාවචරය. සියුම්ය. ප්‍රාඥයන් විසින්ම අවබෝධ කරගත යුතුය.''

- බුදුරජාණන් වහන්සේ -

බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළ උතුම් වූ ශ්‍රී සද්ධර්මය

නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

යෝචේ වස්ස සතං ජීවේ - අපස්සං ධම්ම මුත්තමං
ඒකාහං ජීවිතං සෙය්‍යෝ - පස්සතෝ ධම්ම මුත්තමංති

ශ්‍රද්ධා බුද්ධි සම්පන්න ගුණගරුක කාරුණික පින්වතුනි, මේ පින්වත් පිරිස මේ මොහොතේ සූදානම් වෙන්නේ, සසර දුක් ගිනි නිවීම පිණිස ලොව්තුරා බුදුරජාණන් වහන්සේ අපි කෙරෙහි අනුකම්පාවෙන් දේශනා කළ සද්ධර්මයෙන් බිඳක් ශ්‍රවණය කරන්නටයි. මුලින්ම ඒ සංසාර මොක්ෂය අපට ලබා දුන්න ලොව්තුරා බුදුරජාණන් වහන්සේ කෙරෙහි සැදැහැ සිත් උපදවාගෙන, බුද්ධ ගෞරවය ඇති කරගෙන, ඒ සසර දුක් ගිනි නිවන ඒ උතුම් ශ්‍රී සද්ධර්මය කෙරෙහි අනන්ත අප්‍රමාණ වූ ගෞරවය ඇති කරගෙන, පරම්පරාවෙන් පරම්පරාවට ලොවට ශාන්තිය රැගෙන ආපු ආර්ය මහා සංඝරත්නය කෙරෙහි ශ්‍රද්ධාව ඇති කරගෙන, අනේ මේ මොහොතේදි මේ අවස්ථාවේදි, මේ සසර දුක් ගිනි නිවෙන සද්ධර්මය මටද අවබෝධ වේවා! කියන කළණ සිත් ඇතුව සැමදෙනාම මේ මොහොතේදි මේ දහම ශ්‍රවණය කරන්නට ඕනේ.

ධර්මයේ සඳහන් වෙන්නේ **සුනාථ ධාරෙථ චරාථ ධම්මේ** - ධර්මය අහන්නට ඕනේ. අහගත්තා වගේම ඒ දහම් කරුණු අපේ සිත්වල ධාරණය කර ගන්නටත් ඕනේ. ධාරණය කරගත් දහමට අනුව ධර්මයේ හැසිරෙන්නටත් ඕනේ, ජීවිතය හදාගන්නටත් ඕනේ. ධර්මයේ හැසිරෙන්නට පුළුවන් කමක් නැහැ, ජීවිතය දහමකින් හදාගන්නට පුළුවන් කමක් නැහැ පින්වතුනි, සද්ධර්මය පිළිබඳව අවබෝධයක්, මතකයක්, දැනුමක් අපේ

සිත්වල ධාරණය වෙලා නැත්නම්. සද්ධර්මය අපේ සිත්වල ධාරණය වෙන්නේ නැහැ බොහොම ආදරයෙන් සකසා සද්ධර්මය අපි ඇහුවෙ නැත්නම්. ඒ නිසයි මුලින් හොඳට සිහිය පිහිටුවාගෙන සද්ධර්මය අහන්නත් ඕනේ. අහගත්තා වගේම අහගත්ත දහම, දහම් කරුණු අපේ සිත්වල ධාරණය කරගන්නටත් ඕනේ. ධාරණය කරගත්ත දහම පුන පුනා නුවණින් මෙනෙහි කරලා ඒ තුළින් ජීවිතය හදාගන්නට උත්සාහවත් වෙන්නටත් ඕනේ. මෙන්න මෙබඳු කෙනාටයි බුද්ධ ශාසනයෙන් ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් වෙන්නේ.

පින්වතුනි, මම අද බොහොම වටිනා දහම් කොටස් ටිකක් පෙන්වන්නට, විස්තර කර දෙන්නට බලාපොරොත්තු වෙනවා. ඊටත් කලින් එක කරුණක් කෙටියෙන් මතක් කරනවා මම. බොහෝසෙයින් මගේ දේශනාවල මේ ස්වභාවය නැවත නැවත මම මතක් කරනවා. අපි නොදන්න, අපි නොදකින, එහෙත් අපේ ජීවිතවල සැබෑවටම පවතින යථාර්ථයක් තියෙනවා. මෙන්න මේ ස්වභාවය අපි ඇවිදින, අපි යන සසරේ ස්වභාවය කෙටියෙන් මතක් කරලා, එබඳුවූ දුක් සහගත සංසාරයට තියෙන එකම පිහිට මේ සද්ධර්මයයි. ඒ දහම මොකක්ද කියන කාරණාව පෙන්වන්නට මම මේ මොහොතේදි උත්සාහවත් වෙනවා.

පින්වතුනි, එයින් මම මුලින්ම මතක් කළේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා,

අනමතග්ගො යං භික්ඛවේ සංසාරෝ - පුබ්බා කෝටි න පඤ්ඤායති
අවිජ්ජා නීවරණානං සත්තානං තණ්හා සංයෝජනානං - සංධාවතං සංසරිතං - මමංචේව තුම්හාකංච

මහණෙනි, මේ දීර්ඝ සංසාරයේ මුල් කෙළවරක් පෙනෙන්නේ නැහැ, පනවන්නට පුළුවන් කමකුත් නැහැ. අවිද්‍යාව නැමැති නීවරණයෙන් වැහිලා, තණ්හාව නැමැති සංයෝජනයෙන් බැඳිලා, නුඹලාත් මමත් මේ දීර්ඝ සංසාරේ බොහෝ කාලයක් ඒ මේ අත දුවන ලදී, සැරිසරන ලදී කියලා පෙන්වා වදාළා.

පින්වතුනි, මේ දීර්ඝ සංසාරයේ අපි නිකම්ම ඒ මේ අත දිව්වා සැරිසැරුව නෙවෙයි. මේ දීර්ඝ සංසාරයේ ඒ මේ අත දුවන කොට ලැබුණ ආත්ම භාව වලදි තමන්ට ඇඟ ලේ කිරි කරලා පොවපු, තමන්ගේ ආදරණීය මවු මළ දුකට අඬපු කඳුළු සතර මහා සාගරයේ ජලයට වඩා වැඩියි කියලා බුදු රජාණන් වහන්සේ පෙන්වා වදාළා. ඒ වගේමයි බොහෝම දුක් මහන්සියෙන් හරි හම්බ කරලා තමන්ව පෝෂණය කළ පියා මළ දුකට අඬපු කඳුළු එකතු කළා නම් මේ සතරමහා සාගරයේ ජලයට වඩා වැඩියි කියලා

පෙන්නුවා. ඒ විතරකුත් නෙමෙයි, තමන්ගේ දුවා, පුතා, සහෝදරයා, සහෝදරී, අනෙක් ඥාති හිතමිත්‍රාදීන්, මැරුණ වෙලාවෙදිත් එහෙමයි. ඒ විතරකුත් නෙවෙයි මේ දීර්ඝ සංසාරේ එනකොට, තමන්ගේ බෙල්ල කපන වෙලාවෙදි තිරිසන්ගත ආත්මවල ඉපදුන වාරවලදී, මස් පිණිස තමන්ව මරණ කොට බෙලි කැපුම් කනකොට ගලා ගිය රුධිරය එකතු කරන්න පුළුවන් නම්, ඒත් සතර මහා සාගරයේ ජලයට වැඩියි කියලා පෙන්වා වදාළා. ඒ විතරකුත් නොවෙයි පින්වතුනි, අද අපේ ජීවිතවල මෙබඳු ස්වභාවයක් පැවතුනාට, ගෙවුණු අතීතය තුළ අපිට ලැබිලා තියෙන්න ඇති දුක්ඛදායක ආත්මභාවයන්. ඇස් දෙකම අන්ධ වෙලා, කිසි කෙනෙකුගෙ පිහිටක් පිළිසරණක් නැතුව ගල් මුල් වල පය හැපි හැපී වැටිලා ජීවිතය අවසන් වුණ වාරවල් ඕනෙ තරම් තියෙන්න ඇති. අතපය හතරම නැතුව පිලෙක් වෙලා කිසිවෙකුගෙ පිහිටක් සරණක් නැතුව ජීවිතය අවසන් වුණ වාරවල් ඕනෙ තරම් තියෙන්න ඇති. ඒ වගේම, නොයෙක් දරුණු රෝග හැදිලා මල මුත්‍රා ගොඩේ වැටිලා ජීවිතය අවසන් වුණු වාරවල්, ඕනෙ තරම් තියෙන්නට ඇති.

පින්වතුනි, භවයෙන් වැහිලා නිසා අද අපිට පෙනෙන්නේ නැහැ. භවයෙන් වැහිලා නිසා අද අපිට නොපෙනුනත්, භවය තුළ මෙහෙම දුකක් තියෙන නිසා, භවය තුළ ඉන්න සත්වයෝ මෙබඳු දුකක් විඳින නිසායි ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේලා ලෝකයේ පහළ වෙන්නේ. පහළ වෙලා බොහෝම අනුකම්පාවෙන් මේ සංසාර දුකෙන් අතමිදෙන්නට, නැතිනම් ඒ භව නිරෝධය සඳහා ධර්මය දේශනා කරනවා.

පින්වතුනි ඒ බුද්ධෝත්පාද කාලයක් අපිට හැමදාම ලැබෙන්නේ නැහැ. අපි වචනයෙන් නම් කියනවා, අහලා තියෙනවා, ***දුල්ලභෝ බුද්ධුප්පාදෝ ලෝකස්මිං*** කියලා. බුදුරජාණන් වහන්සේලාගේ ලෝකයේ පහළවීම දුර්ලභයි කියලා. ඒත් ඒ දුර්ලභ ස්වභාවය අපි හැම කෙනාටම හුදු වචන මාත්‍රයක් වෙලා මිසක, යම් පමණකට හෝ ඒකේ අර්ථය වැටහෙන බවක් නම් නැහැ. පින්වතුනි, යම් පමණකට හෝ එහි අර්ථය වැටහෙනවා නම් අපි මෙයිටත් වඩා මේ දහමට උත්සහවත් වෙනවා.

පින්වතුනි, බුදුරජාණන් වහන්සේලාගේ පහළ වීම දුර්ලභයි කියන එකට මම පුංචි කරුණක් කියන්නම්. බුදුරජාණන් වහන්සේ නමක් පහළ වෙලා පිරිනිවන් පෑවට පස්සෙ, තව බුදුරජාණන් වහන්සේ නමක් පහළ වෙනවා කියන කරුණ පින්වතුනි, හැමදාම කල්පයෙන් කල්පයට ලැබෙන්නේ නැහැ. බොහෝ අවස්ථාවල බුද්ධ ශූන්‍ය කල්ප, බුදුරජාණන් වහන්සේලා පහළ නොවෙන කල්ප ගණනින් අසංඛෙයියයි කියලා පෙන්වනවා. අසංඛෙයියයි කියලා කියන්නේ පින්වතුනි, එකයි බින්දු එකසිය හතලිහකින් ලියන ගනනක්. එතකොට කල්පය කියන එකට ධර්මයේ උපමාවක් පෙන්වනවා, යොදුනක්

දිග යොදුනක් උස යොදුනක් පළල මහා විශාල ගල් පර්වතයක් තියෙනවා නම්, මනුස්ස ලෝකෙන් අවුරුදු සීයයකට සැරයක් යම්කිසි කෙනෙක් රෙදි කෑල්ලක් අරගෙන මේ ගල් පර්වතය පිසදානවා නම්, යම් කාලෙක මේ ගල ගෙව්ලා ගියත් මේ කල්පය ඉවර වෙන්නේ නැහැ කියලා. මහණෙනි, කල්පයට අවුරුදු කීයක්ද කියන්න බැහැ. මෙබඳු උපමාවකින් අනුමාන වශයෙන් දක්වන්නට පුළුවන් කියලයි බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළේ. යොදුනක් කියලා කියන්නේ පින්වතුනි, සැතපුම් දාසයක්. කෙනා කෙනා ටිකක් හිතට නගාගන්න මේ ස්වභාවය. සැතපුම් දාසයක් දිග, සැතපුම් දාසයක් උස, සැතපුම් දාසයක් පළල මහා ගල් පර්වතයක් තියෙන්නේ. මේ ගල් පර්වතය අවුරුදු සියයකට සැරයක් පිසදානකොට යම් දවසක ගෙව්ලා ගියාමයි කල්පය. පින්වතුනි, බුදුරජාණන් වහන්සේලා නැති බුද්ධ ශූන්‍ය කල්ප අසංඛෙයියයි කියලා කියන්නේ, ඔන්න ඔය වගේ එක ගලක් ගෙව්ලා යනවා, දෙකක් ගෙව්ලා යනවා, තුනක් හතරක් පහක් දහයක් විස්සක් තිහක් පනහක් සීයක් දාහක් ලක්ෂයක් කෝටියක් ප්‍රකෝටියක් කෝටි ප්‍රකෝටියක්. මෙන්න මේ වගේ බුදුරජාණන් වහන්සේ නමක් නැහැ ලෝකයේ. හොඳ නරක දෙකවත් කියලා දෙන්න කෙනෙක් නැහැ සමහර විටෙක, මේ වගේ අසංඛෙයිය ගනන් බුද්ධ ශූන්‍ය කල්ප පවතිනවා.

එබඳු වූ දීර්ඝ වූ සංසාර ස්වභාවය අනුව බලන කොට පින්වතුනි, අපි හැමදෙනාම හරිම පුණ්‍යවන්තයි, භාග්‍යවන්තයි. එච්චර දුර්ලභ කාලයකින් ලොවට පහළවන ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමක් පහළ වෙලා. ඒ වගේම සසර දුක් ගිනි නිවන සද්ධර්මයත් දේශනා කරලා තියෙනවා, පවතිනවා. අපිද හඟවා කියන අර්ථයක් තේරුම්ගන්න පුළුවන් මනුස්ස ආත්මභාවයක් ලබාගෙන තියෙනවා. ඒ නිසා ඒකාන්තයෙන්ම මේ ඉමක්, කොනක්, පරක්, තෙරක්, නැති මේ දීර්ඝ සංසාරෙන් එතෙර වෙන්නට අතමිදෙන්නට අවශ්‍යය සියළු වටපිටාව අපිට ලැබිලා තියෙනවා. අද අපිට අවශ්‍යය වෙන්නේ ශ්‍රද්ධාව ඇති කරගන්නටයි. ***සද්ධාය තරති ඕඝං*** ශ්‍රද්ධාවෙන් තමයි මේ ඕඝය තරණය කරන්න වෙන්නේ. ශ්‍රද්ධාව මුල් කරගෙනයි පින්වතුනි, තුණුරුවන්ට ජීවිතය ළං කරන්න වෙන්නේ, ළං වෙන්නේ. එබදු කෙනාටයි සද්ධර්මය අවබෝධ වෙන්නේ.

ඉතින් මම මතක් කළේ කෙටියෙන්, අපි හැම කෙනෙක්ම මේ දීර්ඝ සංසාරේ මහා ගොඩක් දුක් වින්ද අය. ලොව්තුරා බුදුරජාණන් වහන්සේලා අතීතයේ ඕනෙ තරම් පහළ වෙන්න ඇති. සසර දුක් ගිනි නිවන ධර්මය දේශනා කරන්නත් ඇති. ඇස් නැත්තෝ වගේ, කන් නැත්තෝ වගේ, අපි ඒ ධර්මය නොබලපු නිසා, නොඅසපු නිසා තවම අපි මේ සංසාරේ ඒ මේ අත දුවනවා, සැරිසරනවා. මේ සසර ස්වභාවය ගෙවා ගන්න උපකාරවන වටපිටාවක් ලැබිලා තියෙන මේ මොහොතෙදි, අපි හැමදෙනාම ඒ සඳහා උත්සාහවත් වෙන්න ඕනේ.

පින්වතුනි බුදුරජාණන් වහන්සේ දවසක්, ධර්ම චාරිකාවේ යන කොට පාරේ යන කඩි රෑනක් දැක්කා. දැකලා බුදුරජාණන් වහන්සේ සිනහ පහළ කරනවා. ආනන්ද හාමුදුරුවෝ අහනවා, ''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, සිනහ පහළකොට වදාල හේතුව මොකක්ද'' කියලා. ''ආනන්ද, මේ කඩි රෑන ඔබට පෙනෙනවද?'' ''එහෙමයි. ස්වාමීනි මට පෙනෙනවා''. ''ආනන්ද මේ කඩි රෑනේ චක්‍රවර්තී රජ නොවුණු එකම කඩියෙක්වත් නැහැ'' කියලා බුදුරජාණන් වහන්සේ පෙන්නුවා. එහෙනම් පින්වතුනි, අපි ගැන කුමන කතාද? අපි හැම කෙනෙක්මත් මුළු ලෝකයටම අධිපති, චක්‍රවර්තී රජවරු වෙලා ඉන්නත් ඇති. ඒත් අද දවසේදි අපේ ජීවිත මෙබඳු මට්ටම්වලට පත් වෙලා. ඒ නිසා අපි අපේ ජීවිතය ජීවත් කරන්නට ලැබුණු මේ වටපිටාව තුළ, නුවණින් ඇසුරු කරමින් පරිහරණය කරමින් මේ ධර්මය අවබෝධ කරගන්නට උත්සාහවත් වෙන්න ඕනේ.

බුද්ධෝත්පාද කාලයකදීම පමණක් ලබා ගත හැකි 'ධම්මට්ඨිති ඥාණය' (සුසීම සූත්‍රය ඇසුරෙන්)

ඒ නිසයි අද මම ධර්ම දේශනාවට මාතෘකා කළේ ඒ ධම්ම පදයට අයිති කුද්දක නිකායේ ගාථාවක්. එහි සඳහන් වෙනවා.

යෝචේ වස්සසතං ජීවේ - අපස්සං ධම්ම මුත්තමං
ඒකාහං ජීවිතං සෙය්‍යො - පස්සතො ධම්ම මුත්තමංති කියලා

'යම්කිසි කෙනෙක් මේ ධර්මය අවබෝධ කරගන්නේ නැතුව අවුරුදු සියයක් ජීවත් වුණත්, ඒ ජීවිතය වටින්නේ නැහැ හිස් එකක්. යම් කිසි කෙනෙක් මේ උතුම් වූ සද්ධර්මය අවබෝධ කරගෙන එක දවසක් ජීවත් වුණත් ඒ ජීවිතය වටිනවා, ශ්‍රේෂ්ඨයි' කියන එකයි ඒ ගාථාවෙන් පෙන්වා වදාළේ.

අපි පොඩ්ඩක් පින්වතුනි බලමු 'අවබෝධ කරගන්නේ නැතුව අවුරුදු සියයක් ජීවත් වුණත් වටින්නේ නැති හිස්වෙන, අවබෝධ කරගෙන දවසක් ජීවත් වුණත් වටිනවා හිස්වෙන්නේ නැති' ඒ දහම මොකක්ද කියලා. අපිට ඒ දහම් පරියාය පුරවන්නට බොහොම වටිනා අර්ථයක් පෙන්වනවා, සංයුක්ත නිකායේ මහා වග්ගයට අයත් සුසීම කියන සූත්‍රයෙන්.

පින්වතුනි, බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයේ වැඩ ඉන්න කාලෙදි බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ, ධර්මය හොරකම් කරන්න සුසීම කියලා එක්තරා පරිබ්‍රාජකයෙක් ඇවිල්ලා පැවිදි වුණා. ඒ පරිබ්‍රාජකයා පැවිදි වුණාට පස්සේ නම සුසීම, ඒ සුසීම භික්ෂුන්වහන්සේ අරභයා බුදුරජාණන් වහන්සේ බොහොම වටිනා දහම් පරියායක් දේශනා කරනවා. අන්න ඒ ටික මම මෙතැනදි පින්වතුන්ට මතක් කරනවා, මේ ටික නොදැන ඒ ධර්මතාවය අවබෝධ කරගන්නේ නැතුව කිසිම කෙනෙක් මේ සංසාරෙන් එතෙර වෙන්නේ නැහැ. සසර දුකින් එතෙර වෙන්න පුළුවන් කමක් නැහැ.

බුදුරජාණන් වහන්සේ ඒ සුසීම කියන භික්ෂුන්වහන්සේට පෙන්වනවා.

අජානෙය්‍යා සි ත්වං සුසීම, නවාත්වං අජා නෙය්‍යාසි
අථඛෝ ධම්මට්ඨිති ඤාණං පුබ්බේ, පච්ඡා නිබ්බානේ ඤාණං

''සුසීම, නුඹ දැන ගත්තේ වේවා, නොදැන ගත්තේ වේවා, මුලින්ම යම්කිසි කෙනෙකුට **ධම්මට්ඨිති ඥාණය** ඇති වෙනවා. ***පච්චා නිබ්බානේ ඤාණං*** පසුව නිර්වාණෝ නුවණ ඇති වෙනවා''. මෙන්න මේ ටික අපි තේරුම් කරගන්නට ඕනේ. මෙන්න මේ ටික තමයි පින්වතුනි, අපිට අබුද්ධෝත්පාද කාලෙක ලැබෙන්නේ නැත්තේ. බුදුරජාණන් වහන්සේ නමක් පහළ වෙන්නේ මෙන්න මේ ටික පහදලා දෙන්නටමයි. බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයේ පහළ නොවුණ කාලෙදිත් කුසල ධර්ම තියෙන්නට පුළුවන්. කුසල විපාක තියෙන්නටත් පුළුවන්. කුසල ධර්ම කරන්න කියලා පනවන ශාස්තෘන්වහන්සේලා බිහිවෙන්නටත් පුළුවන්. ඒත් පින්වතුනි, මේ ලෝක නිරෝධය පිණිස පවතින ප්‍රතිපදාවක් පනවන්න නම් කෙනෙක් ලොවට පහළ වෙන්නේ නැහැ, සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් හැරෙන්න. ඒ නිසයි අපිට මේ ටික වටින්නේ. පින්වතුනි, අපි පොඩ්ඩක් නුවණින් බලමු මොකක්ද ඒ තථාගතයන් වහන්සේ පෙන්වා වදාළ **ධම්මට්ඨිති ඥාණය** කියලා කියන්නේ, කොහොමද නිර්වාණ නුවණ පසුව උපදින්නේ කියන කාරණාව. මෙන්න මෙතැනයි අපිට ගොඩක් වටිනාකම තියෙන්නේ.

පින්වතුනි, ධම්මට්ඨිති ඥාණය කියලා කියන්නේ, තථාගතයන් වහන්සේ ඇති කල්හිත් නැති කල්හිත්, තථාගතයන් වහන්සේ ලෝකයේ පහළ වුණත්, නැතත් මේ සංඛත ධාතුව තුළ පවතින යථාභූත ස්වභාවයක් තියෙනවා. යථාභූත කියලා කියන්නේ, යථා කියලා කියන්නේ 'යම් සේ වූද' භූත කියලා කියන්නේ 'එබඳුවූ ස්වභාවයක්, එබඳුවූ පැවැත්මක්' තියෙනවා. මෙන්න මේ යථාභූත ස්වභාවය කිසිම දවසක පින්වතුනි, ලෝකයේ කෙනෙකුට හම්බ වෙන්නේ නැහැ. ලෝකයේ කෙනෙකුට පෙනෙන්නේ නැහැ. මේ යථාභූත ස්වභාවය ලෝකයට සාධාරණ නැහැ. මේ යථාභූත ස්වභාවය දැනගෙන, දැකලා තමයි ලෝකයෙන් යම් කිසි කෙනෙකුට මිදෙන්න

පුළුවන්කම වෙන්නේ. මේ යථාභූත ස්වභාවය පෙන්නන, යථාභූත ස්වභාවය ගැන ඇත්ත ඇති හැටිය පෙන්නන දහම් පරියායටයි, ධම්මට්ඨිති ඥාණය කියලා කියන්නේ.

පින්වතුනි, මේ යථාභූත ස්වභාවය පෙන්වන තථාගතයන් වහන්සේ, මේ ධාතුව තුළ යථාභූත වශයෙන් පවතින්නේ ධර්මතා හතරයි; **චිත්ත, චෛතසික, රූප, නිබ්බාන** කියන ධර්මතා හතරක් පෙන්වා වදාළා. එයින් සංඛත ධාතුව තුළට අයිති චිත්ත,චෛතසික,රූප කියන ධර්මයෝ. නිවන කියන්නේ අසංඛත ධාතුව.

එයින් මේ චිත්ත, චෛතසික, රූප කියන ධර්මයන්ගේ යථාභූත ස්වභාවය ඇත්ත ඇති ස්වභාවය අපේ ජීවිතයෙන් අපි දකින්න ඕනේ. වචනය පිළිබඳ දැනුම නෙමෙයි, ඇත්ත ඇති සැටියේ අපි දැන ගන්නට ඕනේ.

විශේෂයෙන්ම මෙතැනදි ඒ චිත්ත, චෛතසික, රූප කියන ධර්මතා සූත්‍ර ක්‍රමයට පෙන්වනවා නාම-රූප කියන ධර්මතා දෙකකින්. ඒ නාම-රූප කියන ධර්මතා දෙක තමයි අභිධර්ම ක්‍රමයට චිත්ත, චෛතසික, රූප කියලා තවත් ටිකක් සියුම්ව බෙදලා පෙන්වන්නේ. එයින්ද පින්වතුනි, මුලින්ම අනුමානයෙන් අපි දැනගන්න ඕනේ තථාගතයන් වහන්සේ පෙන්වා වදාළ දහම් පරියාය තුළ **'රූපය'** ගැන. මේ ටික මම මතක් කරන්නේ, මේ පෙන්වන ටික මේ පින්වතුන්ට කරන්න කියනවා නෙමෙයි. මේ දේ කරන්න බැහැ. නමුත් මේ දැනුම තුළිනුයි යමක් කළ යුතුනම් කළ යුතු දේ අරභයා නුවණ එන්නේ. ඒ නිසයි මේ ටික මුලින්ම මතක් කරන්නේ.

බුදුරජාණන් වහන්සේ **'සත්‍යය'** පෙන්නුවාට පස්සෙයි, අනිත් අයට තේරෙන්නේ 'අපි එහෙනම් මෙච්චර කල් ඉඳලා තියෙන්නේ වැරැද්දකයි, එහෙනම් අපි සත්‍යය අවබෝධ කරගන්න ඕනේ' කියලා. අපි ඕනෙම කෙනෙක්ගෙන් ඇහුවොත් 'භාවනා කරන්නේ ඇයි අපි' කියලා, 'සත්‍යය අවබෝධ කරගන්න' කියලා කියයි. 'අවබෝධ කරගන්න හදන සත්‍යය මොකක්ද' කියලා ඇහුවොත් අපි වචන ටිකක් කියයි, 'චතුරාර්ය සත්‍යය දකින්න, අවබෝධ කරගන්න' කියලා. ඒත් අපේ ජීවිතයෙන් අපි සත්‍යය කියන එක දන්නේ නැහැ. අපේ ජීවිතයෙන් අපි සත්‍යය කියන එක දන්නේ නැහැ කියලා කියන්නේ, අපි අසත්‍යය කියන එක දන්නෙත් නැහැ.

පින්වතුනි, අපි නිදාගෙන ඉන්න වෙලාවට හීන දකිනවා. හීනය තුළදි අපිට 'හීනය' හීනයක් කියලා තේරෙනවද? හීනය තුළදි 'හීනය', හීනයක් කියලා දන්නේ නැහැ. මේ තරම් වෙලා ඉඳලා තියෙන්නේ හීනෙක කියලා අපි දන්නේ නැගිට්ටොත් විතරයි. ඒ වගේ පින්වතුනි, මේ ලෝකයට 'ලෝකයා ඉන්නේ මෝඩකමකද ඇත්තකද' කියලා ලෝකයා දන්නේ නැහැ. යම් දවසක ඇත්තක් දැක්කොත් තමයි ඒකට ප්‍රතිපක්ෂයක්

වශයෙන් මෝඩකම කියන එක පෙනෙන්නේ. මෝඩකම තුළ ඉඳගෙන, 'අපි ඉන්නේ මෝඩකමකයි' කියලා යම්කිසි කෙනෙක් කියනවා නම් ඒ කාගෙන් හරි උපුටවා ගත්ත අර්ථයක් මිසක ජීවිතයෙන් දැකපු එකක් නෙවෙයි.

මම ඒකෙදි මතක් කළේ යම්කිසි කෙනෙක් බිත්තරයක් ඇතුළෙ ඉපදිලා බිත්තරයක් ඇතුළෙම හැදිලා, වැඩිලා ඒ බිත්තර කටුව ඇතුළෙම මැරෙණවා නම් එයාට සාධාරණ නැහැ 'මම ඉන්නේ බිත්තර කටුවක් ඇතුළෙ නේද' කියන දැනුම. මොකද ජීවිතය එයාගෙ ඒ ටිකයි. ලෝකය එයාගෙ ඒ ටිකයි. 'මම ඉන්නේ බිත්තර කටුවක් ඇතුළෙ නේද' කියන එක, අදහස, දැක්ම එන්න නම් එයින් ඔබ්බට දැකපු කෙනෙක් වෙන්න ඕනේ.

පංච උපාදානස්කන්ධයක්මයි පින්වතුනි, අපි උපදින කොටම පහළ වෙන්නේ. පංච උපාදානස්කන්ධයකමයි අපි ජීවත් වෙන්නේ. පංච උපාදානස්කන්ධයකමයි අපි මැරෙණ්නෙ. කෙටියෙන් තව පරියායකින් මම මතක් කළොත්, ඇහැත් රූපයත් දෙක අරගෙනමයි අපි උපදින්නේ. ඇහැත් රූපයත් දෙක අතරමයි, ඒ දෙක ඇසුරු කරගෙනමයි අපි ජීවත් වෙන්නේ. ඇහැත් රූපයත් දෙක පරිහරණය කරමින්මයි අපි මැරෙණ්නෙ. ඇහැටත් රූපයටත් ඔබ්බෙන් ධර්මතාවයක්, උපදින්න පෙරවත්, ඉපදිලාවත්, මැරෙණ අවස්ථාවේදිවත් අපට හම්බ වෙන්නේ නැහැ. කනයි ශබ්දයයි දෙක අරගෙනයි අපි ඉපදෙන්නේ. අපි උපදිනවා කියලා කියන්නේ, කනයි ශබ්දයයි දෙකේ පහළවීම. අපේ පැවැත්ම කියලා කියන්නේ, කනයි ශබ්දයයි දෙකේ පැවැත්ම. අපි මැරෙණවා කියලා කියන්නෙ කනයි ශබ්දයයි දෙකේ නැති වීම. එහෙම අපිට, ඒ ධර්මතාවයන්ගෙන් ඔබ්බෙ ධර්මතාවයක් පෙනෙන්නේ නැහැ. නොපෙනීම පුදුමයක් නැහැ. පෙනුනොත් තමයි පුදුමේ.

ඒ වගේ මේ ඇහැ, කන, දිව, නාසය, ශරීරය, මනස කියන ස්පර්ශ ආයතන හය අරගෙනමයි අපි උපදින්නේ. ඒ කියන්නේ **මේ ස්පර්ශ ආයතන හයේ ඉපදීමයි අපේ ඉපදීම කියලා කියන්නේ. මේ ස්පර්ශ ආයතන හයේ පැවැත්මයි අපි ජීවත්වෙනවා කියලා කියන්නේ. මේ ස්පර්ශ ආයතන හයේ නැති වීමයි පින්වතුනි අපි මැරෙණවා කියලා කියන්නෙ. මේ ස්පර්ශ ආයතන හය ඇතුවම ඉපදිලා ස්පර්ශ ආයතන හය පරිහරණය කරමින්ම, ඒ ස්පර්ශ ආයතනයන් විනිවිද ගිහිල්ලා ඒ ස්පර්ශ ආයතනයන්ගෙන් බැහැර වූ ඔබ්බෙන් වූ යමක් දැන ගන්නවා, දකිනවා කියන එක ස්පර්ශ ආයතන හය ඇතුළෙ ජීවත් වෙන කෙනාට හීනයක් වගෙයි. ඊට එහා තියෙනවද කියන ප්‍රශ්නයක් එයි.**

තව පරියායකින් මම මතක් කළොත් **අපේ ජීවිතය කියලා කියන්නේ හතර ඉරියව්වක්. එක්කෝ අපි ඉඳගෙන ඉඳියි, එක්කෝ අපි හිට ගනියි, එක්කෝ අපි නිදාගනියි, එක්කෝ අපි ඇවිදියි. ඔය ඉරියව් හතරින් තොර පැවැත්මක් අපිට හිතන්නවත් බැහැ. ඒ**

ඉරියව් හතරෙන් ඔබ්බෙ යමක් හිතන්න පුළුවන් නම්, ඒ කියන්නේ අපි ලෝකයට අයිති නැති දෙයක් හිතන්න දන්නවා කියන එක. මේ ඉරියව් හතරයි පින්වතුනි, ලෝකය කියන්නේ. අපි හිතාගෙන ඉන්නේ මෙච්චරයි තියෙන්නේ කියලා, නැහැ. මේ ඉරියව් හතරට අයිති නැති, ඒ කියන්නේ ලෝකයට අයිති නැති තව පැවැත්මක් තියෙනවා, **ලෝකෝත්තර පැවැත්මක්.** ඒ ටික අපිට කවදාවත්ම හම්බ වෙන්නේ නැහැ.

මම මේ ටික විස්තර කළේ, බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයේ පහළ වුණහම තියෙන වටිනාකම පෙන්වන්න. මේ ලෝකයට සාධාරණ නොවූ, ලෝකය තුළ ඉපදිලා, ලෝකය තුළම හැදිලා වැඩිලා, ලෝකයෙන් මිදිලා ලෝකයට අයිති නැතුව ලෝකය හා නොගැටී පවතිනවා බුදුරජාණන් වහන්සේ. ස්පර්ශ ආයතන හය ඇතුළෙම ඉපදිලා, ස්පර්ශ ආයතන හයේම හැදිලා වැඩිලා, මේ ස්පර්ශ ආයතන හයෙන් ඔබ්බට ගිහිල්ලා මේ ස්පර්ශ ආයතන හයේ නොගැටී නොබැඳී නොඇලී, වාසය කරනවා කියන ධර්මතාවයක් තියෙනවා.

මම ඒ ටික පෙන්වන්නම්. ඒ ටික පෙන්වන්නට මම මේ පරියායකින් මතක් කළේ, අද මම පෙන්වන්නට හදන දහම් කරුණු ටික, අපේ ජීවිතයේ මේ ස්පර්ශ ආයතන හය ඇතුළෙන් අපි ඉගෙන ගත්ත දැනුමට සාධාරණ නැහැ. ඒ කියන්නේ අපි අහලා හුරු පුරුදු සිද්ධාන්තයක් නෙවෙයි මම මතක් කරන්න හදන්නේ. ඒ නිසා අපිට මේ කාරණාව එක පාරටම තේරෙන්නේ නැති වෙයි. නුවණින් අපි මේ කියන දහම් කරුණු සම්මර්ශණය කරමින් බැලිය යුතුයි. අන්න එදාටයි එච්චරයි මෙන්න මෙහෙම පැවැත්මකුත් එහෙනම් තියෙනවා නේද, කියන අනුමාන නුවණක් හරි එන්නේ.

එතකොට මම මතක් කළේ මෙන්න මේ ස්පර්ශ ආයතන හයෙන් එපිටට යන්න යම් මගක් තියෙනවා නම්, දැනුමක් තියෙනවා නම්, මේ සතර ඉරියව්වෙන් ඔබ්බට යන්න, සතර ඉරියව්වෙන් වෙන්ව එකකටවත් අයිති නොවුණු විදියට වාසය කරන්න තියෙන යම් මගක් තියෙනවා නම්, අන්න ඒ මග හෙළිවෙන්නේ මේ ධම්මට්ඨිති ඥාණය හරහායි. ඒ නිසයි මම මේ ටික මතක් කළේ. බිත්තරය නැමැති කෝෂයෙන් ඔබ්බට යන්න නම්, එළියට යනවා නම්, ඒ එළියට යන්න තියෙන්නේ මේ ධම්මට්ඨිති ඥාණය හරහායි.

අපි බිත්තරයක් ඇතුළෙ, කෝෂයක් ඇතුළෙ ඉන්නේ කියන එක බුදුරජාණන් වහන්සේ බොහොම ලස්සනට පෙන්වනවා, සංයුක්ත නිකායේ කුක්කුටික කියන සූත්‍රයෙන්. 'මහණෙනි, යම් කිකිළියක් බිත්තර හතක් අටක් දාලා රකිනවා නම්, සුදුසු කල්හි උෂ්ණය සපයනවා නම්, මෙහෙම ආරක්ෂා කරන මේ බිත්තර වලින් යම් කුකුල් පැටියෙක්, හොටෙන් හරි නියපොතුවලින් හරි අර බිත්තර කටුව බිඳගෙන ඉස්සෙල්ලාම එළියට ආවොත්, ඒ

ඉස්සෙල්ලම ආව කුකුල් පැටියට කියනවා, පැටව් අතර ශ්‍රේෂ්ඨ ජ්‍යෙෂ්ඨ කුකුල් පැටියා කියලා. වැඩිමහල් කුකුල් පැටියා කියලා'. බුදුරජාණන් වහන්සේ පෙන්වනවා, 'මහණෙනි, ඒ වගේ අවිද්‍යාව නැමැති කෝෂය තුළ ඉන්න මේ ලෝකය තුළ, අවිද්‍යාව නැමැති කෝෂය බිඳගෙන එයින් එළියට ගිය නිසා, මම ලෝකයට ශ්‍රේෂ්ඨයි, ජ්‍යෙෂ්ඨයි, අග්‍රයි' කියලා.

අපි තාම ඉන්නේ පින්වතුනි, අවිද්‍යාව නැමැති කෝෂය තුළ. අවිද්‍යාව නැමැති කෝෂය තුළ ඉන්නවා කියන එකට කෙටි නිදසුනක් මම පෙන්වන්නම්.

එයා ස්පර්ශ ආයතන හයෙන් තොර පැවැත්මක් දකින්නේ නැහැ. දන්නේ නැහැ. ස්පර්ශ ආයතන හයට ඇතුළත්ව, ඒ ස්පර්ශ ආයතන හය තුළ පින්වතුනි, නිවන කෙරෙහි නුවණක් එන්න බැහැ. ස්පර්ශ ආයතන හය ලෝකය නම්, ඒ ධර්මතා හය ඇතුළෙ පහළ වෙන යම් නුවණක් තියෙනවා නම්, ඒ නුවණ ලෝකයට අයිති නුවණක්. ඒකට කියනවා ලෞකික නුවණක්, ප්‍රඥාවක් කියලා. යම් කෙනෙක් මේ ස්පර්ශ ආයතන හයෙන් ඔබ්බට යන්න දන්නවා නම්, දැක්කොත්, මේ නුවණ තමයි ලෝකෝත්තර කියලා කියන්නේ. ලෝකයේ කෙනෙකුට මේ ස්පර්ශ ආයතන හයෙන් ඔබ්බට ධර්මයක් ගැන හිතාගන්නවත් බැහැ. හිතාගන්න පුළුවන් වුණොත් එයා ලෝකයට අයිති නැහැ. එයා ආර්ය භූමියට පත්වෙනවා.

යම්කිසි කෙනෙකුට මේ ස්පර්ශ ආයතන හයෙන් තොර යමක් හිතන්න පුළුවන් නම් හිතන්න වැටහෙනවා නම් එයාට 'ලෝකයාට සාධාරණ නැති නුවණක්' තියෙනවා. ලෝකයට මේ කියන දේ විහිළුවක්මයි, එහෙම දෙයක් තියෙනවද යන ගණයට යනවා. මොකද අපේ දැනුම් පරාසය තියෙන්නේ අපි ඉන්න ලෝකය තුළ නිසා. බිත්තරයක් ඇතුළෙ ඉන්න කෙනෙකුට, බිත්තරෙන් එහා පැත්තක් තියෙනවා කියනකොට, තේරුණොත් තමයි පුදුමේ. **ඒ වගේ මේ ලෝකය තුළ ඉන්න කෙනෙකුට ලෝකෝත්තර යමක් කියනකොට තේරුණොත් තමයි පුදුමේ.**

මෙතැනදී, බුදුරජාණන් වහන්සේලා ලෝකයේ පහළ වෙන්නේ, බුදුරජාණන් වහන්සේලා ශ්‍රේෂ්ඨයි කියන්නේ, ඒ ලෝකයා අතරින් 'මේ ලෝකය තුළ මේ පැවැත්ම නෙවෙයි ඇත්ත, මෙයින් ඔබ්බේ ඇත්තක් තියෙනවා නේද' කියලා කිසිම කෙනෙකුගෙන් අහගන්නේ නැතුව, තනියම ලෝකයෙන් එතෙරට යනවා. ගිහිල්ලා ඊටපස්සේ ආපහු අනෙක් අයට කිව්වහම, එහෙම කිව්වහම නම් පෙනෙනවා. ඉස්සෙල්ලා තනියම ලෝකයේ කෙනෙක් මේක තේරුම් කරගන්නවා කියන කාරණාවක් වෙන්නේ නැහැ.එහෙම තේරුම්කර ගත්තොත් සම්මා සම්බුද්ධයි, නැත්නම් පච්චේක බුද්ධයි කියලා කියනවා.

අන්න ඒ ලෝකයෙන් ඔබ්බට යන්න තියෙන, කෙටියෙන් කියනවා නම් ජරා,

මරණ, සෝක, පරිදේව, දුක් දොම්නස්, වලින් එපිටට යන්න තියෙන මාවත ගැන කියලා දෙන්නයි මම මේ හදන්නේ.

ධම්මට්ඨිති ඥාණය කියන්නේ මෙතන බොහොම සියුම්, ගැඹුරුයි. ඒක අපිට හිතන්නවත් බැහැ. ඒ නිසයි මම කිව්වේ මේක අනුමානෙන් අපිට දැන ගන්න පුළුවන්. **ඒ කියන්නේ ඉස්සෙල්ලාම පහළ වෙන්නේ 'සත්‍ය අනුලෝමික ඥාණයක්' මිසක සත්‍යය ක්ෂාත් වෙන්නේ නැහැ. සත්‍යයක් තියෙනවා නම් ඊට අනුලෝම නුවණක් තියෙනවා, එහෙනම් මෙහෙම එකක් තියෙනවා තමයි කියලා. අන්න ඒ සත්‍යය අනුලෝමික ඥාණය පහළ වුණොත් තමයි, නිර්වාණ ඥාණය උපදින්නේ. ඒ සත්‍යය අනුලෝමික ඥාණය ලබාගන්න එකට තමයි මේ ධම්මට්ඨිති ඥාණය කියලා කියන්නේ.**

මම මේ නැවත නැවත එකම තැන අරගෙන වර්ණනා කරන්නේ, විස්තර කරන්නේ මේ අවිජ්ජාගතය තුළ, ලෝකය තුළ, ඒ මේ අත දුවන සැරිසරන අපේ ජීවිත වලට ලෝකය තුළ පිහිටක්, රැකවරණයක්, කවදාවත්ම තිබුණේ නැහැ, තියෙන්නෙත් නැහැ, එබඳු ජීවිතයකට තියෙන එකම පිහිට, රැකවරණය, මේ ලෝකයෙන් එතෙරට යන එකයි. එබඳුවූ තැනකට යන්න තියෙන මාර්ගය ගැන පෙන්නන්නයි නැවත නැවත මේ ටික මම වර්ණනා කරන්නේ, පෙන්නන්නේ.

අපි මතක් කරලා තියෙනවා, විශාල ගිනිගොඩක් ඇවිලෙනවා නම්, මේ ගිනිගොඩ ඇතුළට දෙන්නෙක් යනවා. දැන් ගිනිගොඩ ඇතුළෙ ඉන්නෙ. එක්කෙනෙක් ගිනිගොඩ ඇතුළෙ ඒ පැත්තට මේ පැත්තට පැන පැන නොපිච්චි ඉන්න උත්සාහවත් වෙනවා, එක්කෙනෙක් කිසිම උත්සහයක් නැතුව අත් දෙක බැඳගෙන ඔහේ ඉන්නවා. පින්වතුනි, ගිනිගොඩ ඇතළෙ නම් ඉන්නේ, නොපිච්චි ඉන්න උත්සාහවත් වුණත් පිච්චෙනවා, උත්සාහවත් නොවුණත් පිච්චෙනවා. ඒ උපමාවෙන් මම කිව්වේ, යම්කිසි කෙනෙක් මේ ලෝකය තුළ නම් ඉන්නේ අනිත්‍යවූ, දුක්වූ, අනාත්මවූ දේ තමාගේ යයි කියන තැනක නම් ඉන්නේ, දුක නැතුව ඉන්න උත්සාහවත් වුණත් නැතත් දුක් විඳින්න වෙනවා. ගිනිගොඩ ඇතුළේ ඒ පැත්තට මේ පැත්තට පැන පැන නොපිච්චි ඉන්න උත්සාහවත් වුණත් පිච්චෙනවා වගේ, මේ ලෝකය තුළ දේපල, වස්තු, හරක බාන, ඉඩකඩම්, මිල මුදල්, එකට එකතු කරලා දුක නැතුව ඉන්න උත්සාහවත් වෙන පිරිසක් ඉන්නවා නම්, මේවා එකතු කරලා දුක නැතුව ඉන්න හැදුවත් පින්වතුනි, දුක එයා කරා එනවා. ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක් දොම්නස් වලින් මිදෙන්නේ නැහැ. උත්සාහයක් නැතුව ඉන්න කෙනාත් පිච්චෙනවා වගේ, ලෝකය තුළ දියුණු වෙන්නට, දුක නැතුව ඉන්නට කියලා කිසි උත්සාහයක් නැතිව, කුසීතවූ කම්මැලිකමින් යම්කිසි කෙනෙක් ඉන්නවා නම් එයත් ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක් දොම්නස්වලට පත්වෙනවා. ලෝකය තුළ

උත්සාහවත් වෙන කෙනාත් නැති කෙනාත් දෙන්නම මේ දුකට පත්වෙනවා.

මේක අවස්ථාවක් නෙවෙයි, ඔය ස්වභාවය තථාගතයන්වහන්සේ දේශනා කර වදාළා හරිම ලස්සනට ඕඝතරණ කියලා සූත්‍රයක් තියෙනවා, මෙන්න මේ ඕඝතරණ කියන සූත්‍රයේදී.**'ඕඝය තුළ යම්කිසි කෙනෙක් පිහිටා හිටියත්, වෑයම් කළත් දෙන්නම දුක් සහිතයි, දොස් සහිතයි. ඒ නිසා මම ඕඝය තුළ පිහිටාද නොසිටිමින්, වෑයම්ද නොකරමින් ඕඝය තරණය කළා'** කියලා බුදුරජාණන් වහන්සේ ඕඝතරණ සූත්‍රයේ දී දේශනා කළා.

පින්වතුනි, ලෝක නිරෝධයට යන මේ මාවත, මේ සත්‍යය කියන එක තේරුම් ගන්න බැරුව, අපි ලෝකය තුළ ඉඳගෙන සැනසිල්ලක් ලබන්න හැදුවට, කවදාවත්ම ඒ දේ ලැබෙන්නේ නැහැ. අද විතරක් නෙමෙයි, අනන්ත සංසාරෙම අපි කළේ දන්න මට්ටමට දුක නැතුව ඉන්න හැදුවා, නමුත් අපි දන්න මට්ටමට කිවුවොත් ඔක්කොම දුක ඇතුළෙයි කියන එක අපිට තේරුනේ නැහැ. මේ ස්පර්ශ ආයතන හයේ යම්ම අත්දැකීමක් අනුසාරයෙනුයි අපි දුක නැතුව ඉන්න කටයුතු කරලා තියෙන්නේ. **ස්පර්ශ ආයතන හයේ පැවැත්ම කියන්නෙම දුක නම් පින්වතුනි හොඳට හිතන්න, ඒ ස්පර්ශ ආයතන හයේ පැවැත්ම කියන්නෙම දුක නම්, ඒ ස්පර්ශ ආයතන හයේ අත්දැකීම් අනුසාරයෙන් දුකෙන් මිදෙන්න දරන උත්සහය තියෙන්නෙත් දුක උඩ නේ, දුක තුළයි. ඒ නිසයි අපිට, ලෝකයාට දුක නැති වෙන්නේ නැත්තේ.**

එබඳු ලෝකයකට අනුකම්පාවෙන් බුදුරජාණන් වහන්සේලා පහළ වුණේ.
පහළ වෙලා පෙන්නපු දහම තමයි පින්වතුනි, මෙන්න මේ සත්‍යය ඥාණය කියන තැන, නැත්නම් ධම්මට්ඨිති ඥාණය කියන තැන. අපි ඒක පොඩ්ඩක් නුවණින් බලමු.

අපි ඇහෙන් රූපයක් බලනවා, කනෙන් ශබ්දයක් අහනවා, නාසයෙන් ගඳ සුවඳක් දැන ගන්නවා, කියන තැනක අපි නොදකින, අපිට හමු නොවන, එහෙත් යථාභූතව පවතින ඇත්තක් තියෙනවා. මේ ඇත්ත තමයි, කිසි වෙලාවක අපි ඇහෙන් රූපයක් දකිනවා නෙවෙයි. රූප ගැටීම නිසා, සිතට නාමධර්මයක් පහළ වෙන්නේ. ඒ කියන්නේ යම් වස්තුවක් පෙනෙන බව තියෙන්නේ හිතට මිසක පින්වතුනි, 'රූපයක් පෙනෙනවා හෝ රූපෙකට පෙනෙනවා' නෙමෙයි.

හොඳට සිහි කරගන්න ටිකක්, මැරුණු, අචේතනික, අවිඤ්ඤාණක, අසංඥී මළ මිනියක් සිහිකරගන්න. අචේතනික කියලා කියන්නේ චේතනා නැහැ. අවිඤ්ඤාණක කියලා කියන්නේ විඤ්ඤාණයක් නැහැ, අසංඥයි කියලා කියන්නේ සංඥා නැහැ. මළ මිනියක ස්වභාවය ගන්න. අපි හැමදෙනා තුළම පවතින, කන බොන ආහාරයෙන් හැදෙන ශරීරය අදද එබඳුයි. එබඳු වූ මේ රූපයට කිසිම වස්තුවක් පෙනෙන, ඇහෙන, දැනෙන

බව නැත්නම්, අනුමානෙට හිතන්න. පෙනෙනවා, දැනෙනවා, ඇහෙනවා කියන ටික හිතක කෘත්‍යය නේද? හිතක තියෙන ක්‍රියාවලියක් නේද? හිතක තියෙන ක්‍රියාවලිය ඇයි රූපෙකට අයිතියි කියලා හිතන්නේ? මෙන්න මේ ටිකයි අපිට තේරුම් කරගන්න බැරි,

පින්වතුනි, යකඩ කෑලි දෙකක් එකට ගැටුනහම ශබ්දයක් ඇති වෙනවා නම්, ඇති වෙන ශබ්දය ආපහු කවදාවත්ම ඒ යකඩ කෑලි දෙකට අයිති වෙන්නේ නැහැ. යකඩ කෑලි දෙක ඇතුළට යන්නේ නැහැ. ඒ වගේ ඇහැත් රූපයත් දෙක ගැටුණා නම්, යමක් පෙනෙනවා නම්, පෙනෙන දේ පෙනෙන සිද්ධිය ආපහු ඇහැට රූපෙට අයිති නැහැ. ඒකයි, මෙතන තියෙන යථාභූත ස්වභාවය අපිට තේරෙන්නේ නැත්තේ. නමුත් මම මේ ටික අනුමානෙට පෙන්නලා. අපහසුවකින් තොරව ඒක බලන්න පුළුවන් පරියායක් ආපහු පෙන්වනවා.

තව උපමාවක් ගත්තොත්, අපි දැකලා තියෙනවා කුඹුරු වැඩ කරන කොට ගොයම් කපලා වී බැත ගොඩ ගහනවා. බැත ෆෑන්(fan) කරනවා කියලා කියන්නේ. හොඳට බලන්න, කුල්ලක් අරගෙන හුළඟට අල්ලන කොට වී ඇට ඇට ඇට ඇට වැටෙනවා. මෙතන තියෙන යථාභූත ස්වභාවය කියන එක හිතට නගාගන්න උත්සහවත් වෙන්න. වී ඇටේක ස්වභාවය හොඳට හිතට ගන්න. මේ එක වී ඇටයක් අනෙක් වී ඇටේ ගැන දන්නවද, අනෙක් වී ඇටය අනෙක් වී ඇටය ගැන දන්නවද, මේ එක වී ඇටයක් තව වී ඇටයක් හා බැඳිලාද එකටමද තියෙන්නේ? නැහැ. වී ඇට ඇට ඇට ඇට තියෙන තැන, ඕක තමයි යථාර්ථය. ඔහොම තියෙන තැනක වී ගොඩක්, කන්දක් පෙනෙන්නේ අපේ හිතට නේද? හොඳට බලන්න මෙහෙම බැලුවහම අපිට කන්දක් පෙනෙනවා. නමුත් එහෙම පෙනෙන තැනක තියෙන්නේ වී ඇට මිසක, වී කන්දක් කියලා එකක් යථාර්ථ වශයෙන් තියෙනවා නෙමෙයි. **අපි පෙනෙන දේ අල්ලන්න කියලා ගියොත්, ඇල්លුවොත් අපිට වී ඇට ටිකක් අහුවෙයි මිසක 'කන්දක්' කවදාවත් අහුවෙන්නේ නැහැ.** වී ගොඩ අහුවෙන්නෙ නැහැ. නමුත් අපි හිතාගෙන ඉන්නේ අපිට හිතට පෙනුන වී ගොඩ තමයි මේ ඇල්ලුවේ කියලා. යථාර්ථය තමයි රූපය නිසා හිතට හැඩයක් පෙනෙනවා.

අපි මේ තරම් කල් හිතාගෙන හිටියේ 'මේ පෙනෙන දේ තියෙන දේ' කියලා. නමුත් පින්වතුනි, 'පෙනෙන දේ තියෙන දේ නෙමෙයි, තියෙන දේ නිසා පෙනෙනවා'. මම අර උපමාවක් ගන්නේ, මිරිඟුව දිහා බලනකොට ජලය වගේ පෙනෙනවා. නමුත් අපිට පෙනුනට පෙනෙන දේ තියෙනවා නෙවෙයි. අපි හිතාගෙන ඉන්නේ මේ තරම් කාලයක් මේ තියෙන දේමයි පෙනෙන්නේ කියලා. නමුත් 'තියෙන දේ පෙනෙනවා නෙවෙයි, තියෙන දේ නිසා පෙනෙනවා.'

මම ඒ මිරිඟු උපමාවෙන්ම කියන්නම්, තිරිසන්ගත සතෙක් හරි මුවෙක් හරි මිරිඟුව දිහා බැලුවොත් ජලය වගේ පෙනෙයි. එයාට හිතෙන්නේ මේ පෙනෙන දේමයි තියෙන්නේ, තියෙන දේමයි පෙනෙන්නේ කියලා. ජලය හොයාගෙන ඒ පැත්තට දුවනවා. නමුත් නුවණක් තියෙන හින්දා අපි එහෙම රැවටෙන්නේ නැහැ. අපි දන්නවා මෙහෙම පෙනුනට, පෙනෙන දේ තියෙනවා නෙමෙයි, තියෙන්නේ මිරිඟු ස්වභාවය, මිරිඟු ස්වභාවය නිසා ජලය වගේ පෙනෙනවා. පවතින දේ සහ පෙනෙන දේ කියලා ධර්මතා දෙකක් අපි දකිනවා. තිරිසන්ගත සතා එහෙම දෙයක් දකින්නේ නැහැ. පවතින දේමයි පෙනෙන්නේ, පෙනෙන දේමයි පවතින්නේ කියලයි මිරිඟුව දකින්නේ.

හොඳට බලන්න, **පෙනෙන දේමයි පවතින්නේ, පවතින දේමයි පෙනෙන්නේ** කියලා දැක්කම ඒ ඔස්සේ දුවනවා. පවතින දේ අනෙකක්, පෙනෙන දේ අනෙකක් කියලා දැක්කම, දන්නවා පවතින දේ යථාභූත ස්වභාවය, මිරිඟු ස්වභාවය නම්, පෙනෙන්නේ හිතට නම් ජලය වගේ මේ පෙනෙන දේ ගන්න බැහැ, කියන නුවණක් එනවා.

ඔන්න ඔය මිරිඟුවේ ස්වභාවයෙන්ම අපට වෙලා තියෙන්නේ පින්වතුනි, පවතින ස්වභාවය හරියට මිරිඟුව වගේ, රූප කලාප කලාප හැම තැනකම තියෙන්නේ පෙනෙන දේ තමයි, දිගට, හතරැස්ව, වටැස්, රවුම්, නිල්, කහ, සුදු, හැඩ කියලා නොයෙක් වර්ණ සටහන් වලින් යුක්ත සංඥාවක් තමයි අපේ හිතට පහළ වෙන්නේ. නමුත් 'අපිට පෙනෙන දේ, පවතින දේ නෙමෙයි.පවතින දේ පෙනෙන දේ නෙවෙයි'.

ධම්මට්ඨිති ඥාණයට කෙටියෙන් කියන කොට බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළෙ, මේ නාම-රූප දෙක බැලුවේ මොකටද, පෙන්නුවේ මොකටද, වෙන මොකටවත් නෙවෙයි, මේ රූප, වේදනා, සංඥා, සංඛාරා, විඤ්ඤාණ කියන ස්කන්ධ ටික පෙන්නුවේ, මේ ස්කන්ධ ටික නොදකින කෙනා 'පෙනෙන දේමයි පවතින දේ, පවතින දේමයි පෙනෙන දේ' කියලා රැවටෙනවා. **ස්කන්ධ ටික, ස්කන්ධයන්ගේ ස්වභාවය තේරුම් කරගත්තොත්, යමක් දකින කොට එතැන පෙනෙන දේ සහ පවතින දේ කියලා දෙකක් තියෙනවා කියලා නුවණක් එයාට එනවා.**

යමක් අහනකොට, ඇහෙන දේ සහ පවතින දේ කියලා ධර්මතා දෙකක් තියෙනවා. ගඳ සුවඳ දැනෙනවා කියනකොට, ගඳ සුවඳ දැනෙන දේ සහ පවතින දේ කියලා දෙකක් තියෙනවා. නමුත් අද අපිට එහෙම දෙකක් හම්බ වෙන්නේ නැහැ, අපිට හම්බ වෙන්නේ පවතින දේමයි පෙනෙන්නේ ඇහෙන්නේ, පෙනෙන ඇහෙන දේමයි, පවතින්නේ කියලා. **එතකොට මේ යථාභූත ස්වභාවය බුදුරජාණන් වහනසේ ස්කන්ධ ටිකෙන් පෙන්නුවේ 'පවතින දේ අනෙකක්, පෙනෙන දේ අනෙකක්' කියන දෙක වෙන්කරලා**

පෙන්වන්නයි, ස්කන්ධ ටික පෙන්නුවේ.

මේ පින්වතුන් ස්කන්ධ එකින් එක බලන්න ඕනෙ නැහැ. අනුමාන ඥාණයක් ඇතිකරගන්න, අපිට මෙච්චර සජීවීව තියෙන දේමයි පෙනෙන්නේ කියලා පෙනුනට, මිරිගුව දකිනකොට 'පෙනෙන දේ අනෙකක් පවතින දේ අනෙකක්ව' තිබුණා වගේ, එහෙනම් මෙතැනත්, අනුමාන නුවණක් ඇති කරගන්න, තාම පෙනෙන්නෙ ඔය පින්වතුන්ට, පවතින දේමයි පෙනෙන්නෙ, පෙනෙන දේමයි පවතින්නෙ කියලා, අනුමාන නුවණක් මේ දහම් පරියායෙන් තථාගතයන් වහන්සේගේ මේ ධර්ම අනුසාරයෙන්, අනුමාන විශ්වාසයක් ඇති කරගන්න. ශ්‍රද්ධාව කියන්නේ ඔතෙන්ට. තමන්ට පෙනෙන දේමයි පවතින්නේ පවතින දේමයි පෙනෙන්නේ කියලා තමන්ට පෙනෙද්දිත්, බුදුරජාණන් වහන්සේගේ වචනය විශ්වාස කරනවා, මෙහෙම පෙනුනත් එහෙනම්, මේ පෙනෙන දේ පවතිනදේ නෙවෙයි, පවතින දේ පෙනෙන දේ නෙවෙයි නේද, මේ දහම් පරියායට අනුව ඕක එහෙනම් මෙහෙම සිද්ධියක් වෙන්න ඕනේ. අපිට මෙහෙම පෙනුනට බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ මෙහෙම සිද්ධියක් නේ කියලා පෙන්වනවා. ස්කන්ධ ටිකෙන් පෙන්නුවේ පවතින දේ අනෙකක්, පෙනෙන දේ අනෙකක් කියන ටික පෙන්වන්න. ඒකෙ කෘත්‍යය එතැනින් ඉවරයි.

පෙනෙන දේ අනෙකක් පවතින දේ අනෙකක් කියලා ගත්තේ මොකටද?

පවතින දේ අනෙකක් නම්, පෙනෙන දේ අනෙකක් නම්, පෙනුන දේ පෙනීමෙන් පස්සේ නැති වෙනවා, පවතින දේහි යථාභූත ස්වභාවය විතරයි ලෝකයේ තියෙන්නේ. ඔන්න ඔය නුවණ ගන්නයි, ඒ කියන්නේ, **'දිට්ඨේ දිට්ඨ මත්තං, සුතේ සුත මත්තං, මුතේ මුත මත්තං, විඤ්ඤාතේ විඤ්ඤාත මත්තං**

පවතින දේ පවතින දේ විතරයි, දකින දේ දැකීමෙන් පස්සේ නිරුද්ධ වෙනවා කියන නුවණ කෙනෙකුට එනවානම් එන්නේ, පවතින දේ සහ දකින දේ කියලා දෙකක් වෙන් වුණොත් විතරයි.

මම කියන මේ ටික ගැඹුරු වෙයි. ගැඹුරුයි, ඒක එහෙමම විය යුතුයි. මොකද ලෝකයට අයිති සිද්ධියක් නෙවෙයි මම කියන්නේ. නමුත් මේ ස්වභාවය මම ඔය පින්වතුන්ට බලන්න කියන්නේ නැහැ. මම නැවතත් කියන්නේ, නැත්නම් අපිට කම්මැලි හිතෙයි, මොනවද මේ හාමුදුරුවො කියන්නේ, ඕක මොනවද, කොහොමද බලන්නේ කියලා. මේ තැන කෂාත් වෙන්න, වෙන පරියායක් ක්‍රමයක් තියෙන්නේ. මේක කාටවත් කරන්න බැහැ. මේ පවතින දේ අනෙකක් පෙනෙන දේ අනෙකක් නේද කියලා, ඔහොම

හිතලා කවදාවත් යන්න බැහැ. ආශ්‍රව කියලා කියන්නේ 'මේ තියෙනවා' කියන මට්ටම තමයි අපට හම්බ වෙන්නේ. ලෝකය තුළ හම්බ වෙන දෙයින් ලෝකෝත්තරයක් ලබන්න බැහැ.

වෙනම ක්‍රමයක්, වෙනම මගක් තියෙන්නේ. ඒ මග කියන්න ඉස්සෙල්ලයි මම මේ ක්‍රමය පෙන්වන්න හදන්නේ. ඒ නිසයි මම මේ ටික මතක් කළේ. නැත්නම් අපිට මේ බණ බොහොම ගැඹුරුයි, මේවා කාටද ඔරොත්තු දෙන්නේ, මොනවද මේ කියන්නේ කියලා හිතෙයි. මේ ටිකෙන් උත්තරේ අරගෙන දුන්නේ, පෙනෙන දේ සහ පවතින දේ කියලා දෙකක් තියෙනවා කියලා උත්තරේ අරගෙන දුන්නේ, පෙනෙන දේ පෙනීමෙන් පස්සේ නිරුද්ධ වෙනවා කියන උත්තරේ ගන්න.

පෙනෙන දේ පෙනීමෙන් පස්සේ නිරුද්ධ වෙනවා කියන උත්තරේ ආවහම අපට ලැබෙනවා උත්තරයක්, **'එහෙනම් අතීතයේ දැකපු දේවල් නිරුද්ධ වෙලා, අනාගතේ තාම ඇති වෙලා නැති නිසා හටගෙන නැහැ, වර්තමානයේ යමක් දැක්කොත් ඒක නැති වෙනවා'** - ඔන්න ඇත්ත.ඔය ටිකට ආවහම, ඔය ටික තමයි **ධම්මඨිති ඥාණය** කියලා කියන්නේ.

අතීත නිරුද්ධවූවක් අනාගතය නූපන්නක් ශූන්‍යතාවයක් තුළම රැඳෙන වර්තමානය

බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. **'අතීතය නිරුද්ධ වෙලා අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා'** කියලා. **ඔය වචන ටික කියන්න බුදුරජාණන් වහන්සේට පවා හයියක් වුණේ මොකක්ද අන්න අර ඇත්ත, යථා භූත ස්වභාවය.**

ස්කන්ධයෝ මෙහෙමයි, ඒ ස්කන්ධයෝ හටගන්නේ මෙහෙමයි, මෙහෙම හටගෙන මෙහෙම නැති වෙන හින්දයි, මේ අතීත ධර්මයෝ නිරුද්ධ වෙන්නේ කියලා පරියායක් තියෙන්නේ. දැන් මේක බලන්න කිව්වා නෙවෙයි. හොඳට බලන්න, මෙතැනදි අපට හම්බ වෙනවා දැන් ධර්මතා දෙකක්. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, 'අතීතය නිරුද්ධ වෙලා අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නැති වෙනවා' කියලා. **එහෙම දේශනා කළාට අපට අපේ මනසින් හම්බ වෙනවා අතීතයේ කළ කී දේවල් තියෙනවා, අනාගතයේ කරන්න කියන්න පුළුවන් යම් යම් දේවල් තියෙනවා. වර්තමානයේත් මේ යම් යම් දේවල් ඉන්නවා, තියෙනවා කියන තැනකින් හම්බ වෙනවා. ඔන්න දැන් සත්‍යය අසත්‍යය දෙක හම්බ වෙන තැන. දැන් අපට බොරුව ඇත්ත වෙලා, ඇත්ත බොරුව වෙලා.**

බුදුරජාණන් වහන්සේ දේශනා කළ සත්‍යය තමයි ඔය ධම්මට්ඨිති ඥාණය, එකින් එක බලන්න ඕනේ නැහැ. ඔය ටිකෙන් බුදුරජාණන් වහන්සේ ඇත්ත කියලා ඔය ඇත්ත ගත්ත ක්‍රමයයි බුදුරජාණන් වහන්සේ පෙන්නුවේ. ඇත්ත හැටියට, බුදුරජාණන් වහන්සේ දේශනා කළ සත්‍යය හැටියට, පෙන්නුවේ මොකක්ද? අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නැති වෙනවා කියන එක තමයි සත්‍යය. හැටියට පෙන්නුවේ. දැන් හොඳට බලන්න. බුදුරජාණන් වහන්සේ ඇත්ත කියලා පෙන්නපු දේ අපට බොරු නෙවෙයිද? අතීතය නිරුද්ධයි කියන දේ අපට බොරු නෙමෙයිද? බුදුරජාණන් වහන්සේ අතීතය නිරුද්ධයි කියලා පෙන්නුවා නම් අපිට හම්බවෙන්නේ අතීතය නිරුද්ධ වුණු බවද, ඇති බවට නේද? දැකපු, අහපු, දැනුණු, දැනගත්ත අය ඉන්නවා කියන තැනක නේද? බුදුරජාණන් වහන්සේ දේශනා කරපු ඇත්ත, අද අපිට ඇත්තද? අපේ ජීවිතයෙන් දකින්න. අපට ඒ ඇත්ත බොරු නේද? බොරු.

අනාගතය ඉපදිලා නැහැ කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළා. අපි දකින අහන නෑදැයො හෙට හම්බ වෙන්න පුළුවන්, හෙට කඩේ යන්න පුළුවන්, අනාගතයේ කරන්න පුළුවන්, කියලා ඇති බව අපිට හම්බ වෙනවා මිසක බුදුරජාණන් වහන්සේ ඇත්ත කියලා දේශනා කරපු දේ අපිට ඇත්තද? නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කරපු දේ අපට ඇත්ත නෙමෙයි. ඒ කියන්නේ අද අපට සත්‍යය කියන එක බොරු වෙලා, බොරුව සත්‍යය වෙලා තියෙන්නේ. අතීතයක් තියෙනවා, අනාගතයක් තියෙනවා, වර්තමානයේ ඉන්නවා කියන එක නේද ඇත්ත. හොඳයි මේක ඇත්ත නම්,'අතීතයේ නිරුද්ධ වෙලා අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා' කියන එක, බොරු වෙන්න ඕනෙ නේ. හොඳයි ඒක ඇත්ත නම් අතීතය නිරුද්ධ වෙලා අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නැති වෙනවා කියන සිද්ධිය ඇත්ත නම්, මේ තුන් කාලයක් ඇති බවට හම්බ වෙන එක බොරු වෙන්න ඕනේ නේද?

කව්රු හරි කෙනෙක් කියනවනම් **අතීතය නිරුද්ධ වුණු දෙයක්, අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය අනිත්‍ය වෙනවා කියලා, ඒ කියන්නේ දැකපු අහපු හැම දෙයක්ම නැවත සිහිකරන්න බැරි තත්වයටම පත්වෙලා.** පුංචි කාලෙ ඉඳලා යම්කිසි කෙනෙක් ඉන්නවා නම්, දැකපු, අහපු, දැනුනු, දැනගත්ත මේ මොහොත වන විට, ඊට ඉස්සර වෙලා හිතපු, හම්බ වුණු යම්ම දෙයක් තියෙනවනම් නැවත සිහි කරලා යන්න බැරි ස්වභාවයෙන් යුක්තයි. එහෙම දෙයක් දැන් කොහෙවත් නැහැ. එහෙම දෙයක් හොයාගෙන අනාගතයට යන්න කියලා එහෙම දෙයක් නැහැ. දැන් පෙනෙන දෙයක් තියෙනවා නම් ඒකද නැති වෙනවා කියලා යම්කෙනෙක් කියනවා නම් අද අපට හම්බ වෙන මනසට සාපේක්ෂව ඒ වචනය වැරදියි නේද? බොරුනේද? ඒ වචනය ඇත්ත නම් අද අපිට මේ හම්බවෙන එක බොරු

නේද? අතීතය නිරුද්ධ වෙලා කියලා කියපු වචනය ඇත්ත නම් අතීතය තියෙනවා කියන මනස බොරු වෙන්න ඕනෙන, අතීතය තියෙනවා කියන මනස හරි නම් අතීතය නිරුද්ධ වෙලා කියන එක බොරු වෙන්න ඕනෙනෙ, නේද? අනාගතය ඉපදිලා නැහැ කියන එක ඇත්ත නම් අනාගතයේ යම් යම් දේවල් කරන්න පුළුවන් කියලා අපිට හම්බ වෙන මනස බොරුනෙ. අපිට අනාගතයේ කරන්න පුළුවන් කියලා හම්බ වෙන එක බොරු නම් අනාගතය ඉපදිලා නැහැ කියන එක ඇත්ත වෙනවා. තේරෙනවද මම මේ කියන එක.

දැන් අපිට තියෙනවා ප්‍රශ්නයක්. බුදුරජාණන් වහන්සේගේ වචනය විශ්වාස කරනවද ඇත්තයි කියලා, නැත්නම් ඇත්තටම අපේ ජීවිතයට එළඹ සිටින එක පිළිගන්නවද ඇත්තයි කියලා, උත්තරයක් තියෙනවා දැන් අපිට.

අපට හම්බ වෙන්නේ, දැන් ගියොත් ගෙදර යන්න පුළුවන්, ගෙදර තියෙනවාමයි, ඉන්නවාමයි කියන තැනකින්නේ හම්බ වෙන්නෙ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා අතීතය නිරුද්ධ වෙලා, එහෙම දෙයක් හොයාගෙන යන්න බැහැ මොකුත් නැහැ කියලා පෙන්වනවා. දැන් බුදුරජාණන් වහන්සේගේ වචනය පිළිගන්නවාද, එහෙම නැත්නම් අපිට හම්බ වෙන දේ පිළිගන්නවාද?

ශ්‍රද්ධාව කියන එක එන්නේ ඔතෙන්ට. අපිට මෙච්චර සජීවී කරලා, මෙච්චර ඇති බවට හම්බ වුණත් බුදුරජාණන් වහන්සේගේ වචනයේ වෙනස් කමක් වෙන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කළා නම් 'අතීතය නිරුද්ධ වෙලා අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නැති වෙනවා' කියලා, ඕකනම් ඇත්ත, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. **'මහණෙනි, මේකයි ඇත්ත, අතීතය ඇති බවට, දැකපු අහපු දේවල් ඇති බවට, දකින්න අහන්න දේවල් තියෙන බවට, වර්තමානයේ නිත්‍ය බවට හම්බ වෙන දේ බොරු'.** ඔහොම ඉන්න කෙනාට කියනවා 'සත්‍යය අවබෝධ කරගන්න කියලා' සත්‍ය අවබෝධ කරගන්න කියලා මොකක්ද කිව්වේ, 'අතීතය නිරුද්ධ බව ක්‍ෂාත් කරගන්න, අනාගතය නූපන්න බව ක්‍ෂාත් කරගන්න, වර්තමානය හටගෙන නැති වෙන බව ක්‍ෂාත් කරගන්න.' මේ ඇත්ත අවබෝධ කරගන්න කිව්වේ කාටද, මේ ඇත්ත තුළ වාසය නොකරන කෙනාට. නැත්නම් ඉතින් අපේ ජීවිතයේ හම්බ වෙන එක තුළ ඇත්තක් තියෙනවා නම් අපි ඔය තුන් කාලය තුළ ඉඳගෙනනේ 'ඇත්ත ඇත්ත' කියලා ඇත්තක් හොයන්නේ, ඔය තුළ ඇත්තක් තියෙනවා නම් ඇත්ත අවබෝධ කරගන්න කියලා වෙන එකක් පනවන්නේ නැහැ.

මේ බොහොම ගැඹුරු සිද්ධාන්තයක් කියන්නේ. මේ කියන ටික තේරෙනවද කියන එකයි ප්‍රශ්නෙ? නමුත් මේ ටික තේරුනොත් අපි ඇත්තටම ජීවිතයේ ජයගන්නවා. ඒ කියන්නේ,

එදාට අපි සත්‍යය කියන එක දකිනවා.

අපි ‘සත්‍යය අවබෝධ කරගන්න සත්‍යය අවබෝධ කරගන්න’ කියලා උත්සාහවත් වෙනවා, කතා කරනවා. නමුත් සත්‍යය කියන්නේ මොකක්ද, බොරුව කියන්නේ මොකක්ද කියලා දන්නේ නැහැ. **බොරුව තුළ අපි සත්‍යයක් දකිනවා. බොරුව තුළ සත්‍යයක් කියන්නේ අතීතය ඇති බවට, අනාගතය ඇති බවට, වර්තමානය ඇති බවට,** තුන් කාලයම ඇති බවට අපිට හම්බ වෙන මේ තුළයි අපි ඇත්ත අවබෝධ කරගන්න කියලා උත්සාහවත් වෙලා තියෙන්නේ.

නමුත් ඇත්ත කියලා කිව්වේ ඒකට නෙවෙයි. බුදුරජාණන් වහන්සේ. මේ හේතුඵල දහම පෙන්නුවේ, මම කිව්වේ ඒකයි. ඔය පින්වතුන් **ස්කන්ධ ගැනවත් කරදර වෙන්න එපා, ඕවා එකක්වත් බලන්න කිව්වා නෙමෙයි. ‘අතීතය නිරුද්ධ වුණු බවට, අනාගතය ඉපදුණේ නැති බවට, වර්තමානය ඉපිද නිරුද්ධ වෙන බවට පින්වතුන් කියන්නේ කොහොමද කියලා කව්රු හරි ඇහුවොත්? උත්තර දෙන්න පරියායක් තියෙන්න ඕනෙ නේ. මේ පරියාය නිසයි අතීතය නිරුද්ධ වෙලා කියලා කියන්නේ, මේ ස්කන්ධයෝත් ස්කන්ධයන්ගේ පටිච්ච සමුප්පන්න බව, හේතුඵල දහම් දැකපු හින්දයි බුදුරජාණන් වහන්සේ බය නැතුව සිංහනාද කරන්නේ පිරිස මැද, ‘අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපදිලා නැහැ’ කියලා.**

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා භද්දේකරත්ත සූත්‍රයේ,

අතීතං නාන්වාගමෙය්‍ය - නප්පටිකඞ්චේ අනාගතං
යදතීතං පහීනං තං - අප්පත්තඤ්ච අනාගතං
පච්චුප්පන්නඤ්ච යෝධම්මං - තත්ථ තත්ථ විපස්සති
අසංහීරං අසඞ්කුප්පං - තං විද්වා මනුබ්‍රෑහයේ

අතීතය අනුව යන්න එපා. අනාගතය ප්‍රාර්ථනා කරන්න එපා. ඇයි?
යදීතං පහීනං තං - යම් අතීතයක් තියෙනවා නම් ප්‍රහීන වෙලා
තං අප්පත්තඤ්ච අනාගතං - අනාගතය පැමිණිලා නැහැ.
පච්චුප්පන්න යො ධම්මං - තත්ථ තත්ථ විපස්සතී -

වර්තමාන ධර්මයන් ඒ ඒ තැන බලන්න. ඉස්සෙල්ලා හොඳට සත්‍යය අසත්‍යය දෙක තෝරාගන්න. ඒකයි මේකට සත්‍යය අනුලෝමික ඥාණය කියන්නේ. සත්‍යය ඥාණයේ පිහිටනවා මෙතෙන්ට ආවොත් ඉබේම. සත්‍යය අවබෝධ කරගන්න, සත්‍යය අවබෝධ කරගන්න කියලා කිව්වට අපි ‘චතුරාර්ය සත්‍යය අවබෝධ කරගන්න ඕනේ’

කියනවා මිසක, ඇත්තටම අපේ ජීවිතයේ මෙන්න මෙතෙන්ට යන්නයි ඔය කියන්නේ නේද, කියලා දැකලා තියෙනවාද අපි. **සත්‍යය අවබෝධ කරගන්න යන්න නම් අපි එතැන දැකලා තියෙන්න එපායැ.**

ඔය පින්වතුන්ට මම කියනවා අනුරාධපුරේට යන්න කියලා. යන්න නම් ඉස්සෙල්ලා අහලා හරි අනුරාධපුරේ කියලා එකක් තියෙනවා, ඒකට යන්නේ මෙහෙමයි කියලා දැනුම තිබුණොත් එපැයි යන්න. නැත්නම් තල්ලු කෙරුවොත් අනුරාධපුරේට යන්න කියලා මම ඕවා ගැන මොකුත් විස්තර කරන්නේ නැතුව, තල්ලු කෙරුවා කියලා පින්වතුන් අනුරාධපුරේට යැවෙයිද? අනුරාධපුරයක් තියෙනවා, ඒකට යන්නේ මෙහෙමයි කියලා කිව්වොත් යයි. අනුරාධපුරේ කියලා ගමක් තියෙනවා කියලා වචනයක් හරි කිව්වොත් නම් යයි. අනුරාධපුරේ ගැන දැනුමක් එයි. ඔහොම වචන මොකුත් නොකියා මෙතනින් ගේට්ටුවෙන් එහාට පින්වතුන්ව යවනවා, මම හිතේ තියාගෙන අනුරාධපුරේට යවනවා කියලා, යයිද? යැවෙන්නේ නැහැ.

සත්‍යය අවබෝධ කරගන්න කියලා සත්‍යය කියන එකක් මොකක්ද කියන එකවත් දන්නේ නැතුව අපි සත්‍යය අවබෝධ කරගන්න කියලා යනවා, කොහාටද යන්නේ? තේරුනාද මම කියන එක. ඒ කියන්නේ සත්‍යය අවබෝධ කරගන්න කියලා මෙන්න මේකයි සත්‍යය, මෙන්න මෙතැනටයි යන්න කියලා කියන්නේ, මෙන්න මේකයි කරන්න ඕනේ කියන කාරණාව තේරෙන්න ඕනේ, අපිට.

සත්‍යය හැටියට පෙන්නුවෙ බුදුරජාණන් වහන්සේ මොකක්ද, ඔය ධම්මට්ඨිති ඥාණය කියන එකෙන්, ඔය වචන වලට බය වෙන්නට එපා දහම් කරුණු වල, මේ ස්කන්ධයන්ගේ ඉතා සියුම් ස්වභාවය, රූපයේ ස්වභාවය, රූපය නිසා නාමධර්ම පහළ වෙනවා කියන එක, ඒ රූපය නැති වෙන කොට නාමධර්ම නැතිවෙනවා කියන එක, ***දිට්ඨේ දිට්ඨ මත්තං, සුතේ සුත මත්තං*** කියලා ඔය ඔක්කොම පෙන්නුවා නම් පෙන්නුවේ, අතීතය නිරුද්ධ වෙලා කියන එක පෙන්වන්න. ඇයි ***දිට්ඨේ දිට්ඨ මත්තං*** දැකීම දැකීමක් පමණයි කියලා කියන කොට එහෙනම් අතීතයේ දැකපු දේ දැන් නැහැ නේද කියන්නයි මේ එන්නේ, ***සුතේ සුත මත්තං*** කියලා කියන්නේ, එහෙනම් කලින් ඇහුණු එක දැන් තියෙනවා නෙමෙයි නේද, කියන මේ නුවණ පුරවන්නයි මේ එන්නේ මිසක, වෙන මොකුත් නෙවෙයි.

එතකොට ඔය කරුණු ටිකෙන්, ඕකට බය වෙන්න එපා කියලා මම කිව්වේ, ගැඹුරුයි කියලා. කිව්වට, ඔය ගැඹුර නෙවෙයි, අන්තිමට අපේ ජීවිතයට හම්බ වෙන්නේ. නුවණක්

තියෙන කෙනාට බොහොම චූටි තැනක් අල්ලගන්න තියෙන්නේ. මේ මහා විශාල පරියායකින් අපි විස්තර කරලා තියෙන්නේ එක තැනක්. අසූහාර දහසක් ධර්මස්කන්ධයකින්ම තථාගතයන් වහන්සේ විස්තර කෙරුවේ, 'අතීතය නිරුද්ධ වෙලා අනාගතය ඉපදිලා නැහැ වර්තමානය හටගෙන නැති වෙනවා' ඕකයි ඇත්ත. ඔය බව ක්‍ෂාත්වෙලා නැති කෙනාට, ඕක ක්‍ෂාත් කරගන්න කියන එකයි කිව්වේ. ඔය ටික ඇත්ත වුනානම්, බුදුරජාණන් වහන්සේව අපි අදහනවා කියලා කිව්වේ, ශ්‍රද්ධාව කියලා කිව්වේ මේ පරියායෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළා, අතීතයේ දැකපු, අහපු, දැනුන, දැනගත්ත (දිට්ඨි, සුත, මුත, විඤ්ඤාත)හැම දෙයක්ම නිරුද්ධ වෙලා. අනාගතයේ තවම දකින, අහන දේවල් ඉපදිලා නැහැ. ඉපදිලා නැති දෙයක් ගැන දැනුමක් එන්න බැහැනේ අපට නේද? වර්තමානයේ හම්බ වෙනදේ හටගෙන නිරුද්ධ වෙනවා. ඕක තමයි තථාගතයන් වහන්සේ ඇති කල්හිත් නැති කල්හිත් ලෝකය තුළ, සංඛත ධාතුව තුළ පවතින ඇත්ත.

දැන් අතීත, අනාගත, වර්තමාන කියන තුන්කාලයම ඇති බවටම ඉපදිලා, ඇති බව තුළම පරිහරණය කරලා ජීවත් වෙලා, ඔය තුන් කාලයක්ම ඇති බව තුළ මැරෙණ අපිට අර ඇත්ත හම්බ වෙනවාද? හම්බ වෙන්නේ නැහැ. මේ ටික කියා දෙන්නයි බුදුරජාණන් වහන්සේ ලෝකයේ පහළ වුණේ. 'අතීතය නිරුද්ධයි අනාගතය ඉපදිලා නැහැ වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා' ඒකයි ඇත්ත. ඔතැන ඇත්ත නම් පින්වතුන්ගේ මනසට අද හම්බ වෙන දේ ඇත්තද කියලා බලන්න.

ඔන්න දැන් පෙන්වනවා බොරුව කියන එක. මේ ඉන්න එකට, බොරුව කියන එකට, හයිය එච්චරයි. මම කිව්වේ, අපි නිදාගෙනම ඉන්නවා නම්, හීනෙට හීනයක් කියනවද? නැහැ. හීනය හීනයක් වෙන්න නම් අවදි වෙන්න ඕනේ. **අතීතය ඇති බවට අනාගතය ඇති බවට වර්තමානය ඇති බවට ඔය අතීත මට්ටමේම ඉපදිලා, ඔය මට්ටමේම පවතින අපිට, ඕක බොරු හෝ ඇත්ත කියන්න මිම් නැහැ.** යම් කාලෙක බුදු රජාණන් වහන්සේ පෙන්නුවොත් 'අතීතය නිරුද්ධ වෙලා අනාගතය හටගෙන නැහැ වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා' කියලා, ඔන්න දැන් ඇත්තක් තියෙනවා, බුදුරජාණන් වහන්සේ දේශනා කළ දේ ඇත්ත නම්, අපි ඉන්න එක බොරු නේද? දැන් මනින්න මිම්මක් තියෙනවා. අපි ඉන්න එක ඇත්ත නම් බුදුරජාණන් වහන්සේ කියන දේ බොරු.

ශ්‍රද්ධාව කියන කොට ඒකයි, ඊට පස්සේ එන්නේ අපිට මෙහෙම පෙනුනත් ශාස්තෲන්වහන්සේගේ වචනයේ අන්‍යතාවයක් නම් නැහැ. අපි ඉතිපිසෝ භගවා කියලා ගාථාවල් කියන කොට ඇස් දෙකේ කඳුළු පෙරෙන්න ඇඬුවත් ඒකට ශ්‍රද්ධාව කියන්නේ

නැහැ. කෙනෙක් තමන්ට මෙච්චර ඇති බවට හම්බ වෙද්දිත්, අතීතය නිරුද්ධ වෙලා කිව්වා නම් ඒ වචනය අදහනවා, එපමණකින්ම. තමා තුළ ඇති කුමන හෝ කෙළෙසයක් නිසා දෝෂයක් නිසා මෙහෙම මෙච්චර ඇති බවට පෙනුනත්, ඇති බවට පෙනෙනවා කියන සිද්ධියක් වෙන්න ඇති. නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කළ මේ දහමමයි ඇත්ත, කියන තැන වෙනසක් වෙන්නේ නැහැ. ඒකයි, නැත්නම් වචනෙට ශ්‍රද්ධාව ඇති වෙනවා කියන තැනකින් නම් අපිට මේ විමුක්තියක් ලැබෙන්නේ, ඕනෙම කෙනෙක්, ඔක්කොම අය, සතර අපායෙන් මිදිලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, 'මහණෙනි, මා කෙරෙහි යම්කිසි කෙනෙක් ශ්‍රද්ධා මාත්‍රයක්, ප්‍රේම මාත්‍රයක් තියෙනවා නම් අපායට යන්නේ නැහැ' කියලා. නමුත් හැමෝම එහෙම වෙන්නේ නැහැ. අපි දන්නවා පෘථග්ජනයන් අතරින් අජාසත්ත රජතුමා තමයි ශ්‍රද්ධාවන්තයින් අතරින් ශ්‍රේෂ්ඨම කෙනා. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවා කියලා කියන කොට තුන්පාරක් සිහි නැති වුණා, එබඳු කෙනෙකුත් අපායට ගියේ එහෙනම්.

ඒ කියන්නේ **මෙන්න මේ වගේ දහම දකින තැනකින් පෙන්නන්නේ ධම්මානුසාරී ශ්‍රද්ධානුසාරී කියන තැනකින් පෙන්නන්නේ මෙන්න මේ ඇත්ත දැකපු කෙනා තමයි මාර්ගඵල ලබනවා කියන තැනට එන්නේ. මේ ඇත්ත දැක්කොත් එයාට දැන් මිම්මක් තියෙනවා.** එයා දන්නවා ඇත්තටම යථාර්ථය තමයි, අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා. මෙහෙම තැනක අතීතය, අනාගතය, වර්තමානය ඇතිබවට හම්බ වෙන්නේ අපේ මනසට නේද? දැන් මේ තරම් කාලයක් අපි හිතාගෙන හිටියේ අතීත දේවල්, ලෝකයේ තියෙන අතීත දේවල් හම්බ වෙනවා, අනාගත දේවල්, ලෝකයේ අනාගත දේවල් හම්බ වෙනවා, වර්තමාන දේවල් ලෝකයේ වර්තමාන දේවල් හම්බ වෙනවා කියලනේ.

මේ දහම් පරියායෙන් තේරෙනවා, ඒ තුන්කාලය කියන එක මනස පිලිබඳ වුවක්. තුන්කාලයට තමයි ලෝකය කියන්නේ. ලෝකය කියන පැනවීමක් පනවන්න පුළුවන්ද අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නැති වෙනවා, කියන තැනකින් ලෝකයක් පනවන්න පුළුවන්ද? ඒ කියන්නේ මේ මොහොත වෙන කොට, ඊට ඉස්සෙල්ලා ඒ මොහොතෙන් ඔබ්බෙ, උපන්න තැන ඉඳලා, කිසිම දැනුමක් ඔය පින්වතුන්ට නැති වුණොත් ජීවත් වෙන්න පුළුවන්ද, මේ ලෝකයේ. ලෝකය කියලා එකක සංයෝජන ඇතුව කටයුතු කරන්න පුළුවන්ද, මම වැඩට යනවා, දරුවා වඩා ගන්නවා කියලා එකක්වත් කරන්න පුළුවන්ද, දරුවෙක් ඉන්නවා කියන මතකයක් තිබුණොත්, කඩේ තියෙනවා කියන තැනක තිබුණොත් නේද අපට යන්න වෙන්නේ, නේද? තුන් කාලය කියන එක නැති වුණොත් ලෝකය පනවන්න බැහැ.

ලෝකය කියන එක තියෙන්නේ කොහෙද, මේ තුන් කාලය තුළයි. ඒක අපිට පිළිගන්න පුළුවන්නේ. තුන් කාලය කියන එක තියෙන්නේ සත්‍යය තුළද එහෙනම්? සත්‍යයට තුන් කාලයක් ලැබෙනවද? අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපදිලා නැහැ වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා කියන තැනයි ඇත්ත. මෙහෙම තැනක අතීත, අනාගත, වර්තමාන කියලා තුන් කාලයක් හම්බ වෙනවා නම් හම්බ වෙන්නේ, ලෝකයටයි. එහෙනම් ලෝකය කියන එක කොහෙද තියෙන්නේ, මනසේ.

බුදුරජාණන් වහන්සේ බොහොම ලස්සනට ඕක දේශනා කරනවා සංයුක්ත නිකායේ රෝහිතස්ස කියන සූත්‍රයේ.

ඉමස්මිඤ්ඤෙව බ්‍යාමමත්තේ කළේබරේ සසඤ්ඤම්හි සමනකෙ ලෝකඤ්ච පඤ්ඤාපෙමි, ලෝකඤ්ච සමුදයඤ්ච පඤ්ඤාපෙමි, ලෝක නිරොධඤ්ච පඤ්ඤාපෙමි, ලෝක නිරොධ ගාමිණී පටිපදඤ්ච පඤ්ඤාපෙමි. 'මහණෙනි, මේ බඹයක් පමණ වූ ශරීරය තුළම මම ලෝකයද පනවමි, ලෝක සමුදයද පනවමි, ලෝක නිරෝධයද පනවමි, ලෝක නිරෝධ ගාමිණි පටිපදාවද පනවමි'. චතුරාර්ය සත්‍යයම පැනෙව්වා තමා තුළින්.

අද අපිට දුක්ඛ සත්‍යය පෙනෙන්නේ බාහිරෙන් නේ නේද? ඔය බාහිරෙන් දුක්ඛ සත්‍යය පෙනෙන එක මේ ශාසනයේ විතරක් නෙවෙයි චතුරාර්ය සත්‍යය කියන එක මේ ශාසනයෙන් බැහැර අයටත් පෙනෙනවා. **නමුත් කෙනෙකුට උපකල්පනයෙන් ගන්නයි තියෙන්නේ, 'සත්‍යය අනුලෝමික' නුවණක් නිසයි මේ දුක කියන එක තමා තුළ වුවක් කියන එකට එන්නේ.**

අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපදිලා නැහැ. වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා මේක නම් ඇත්ත, අපට අඬන්න, විලාප දෙන්න හම්බ වෙන අතීත, අනාගත, වර්තමාන මනෝමයෙන් උපදවාගෙන නේද තියෙන්නේ, මනස තළ සිද්ධියක් නේද තියෙන්නෙ, තාම දකින්නෙ නැහැ, අනුමානයක්, උපකල්පනයක්. දැන් 'ඉන්න කෙනෙක්' මැරුණොත් නේද අඬන්න වෙන්නේ, නැති කෙනෙකුට අඬනවද, මම කියන එක තේරෙනවද? ඒ කියන්නේ ඔය පින්වතුන්ට මේ මොහොතෙදිත්, 'දැන් මේ දකිනවා' කියන සිද්ධියට අමතරව වෙන කිසි දෙයක් සිහිවෙන්න නැත්නම්, අහවලා මැරුණා කියලා පණිවිඩයක් ආවොත් සද්දයකට අඬයි මිසක, සිහිකරලා අඬන්න කෙනෙක් ඉන්නවද එතන? දැන් අපිට ඇහෙනකොටම සිහිවෙන්න අය ඉන්නවා. දැකපු අය ඉන්නවා. අඬන්නේ ඒ නිසයි නේද? රතනන් වහන්සේලා කියන්නේ එහෙම අඬන්න කවුරුවත් නැහැ කියන තැනකට. ඒ කියන්නේ සත්‍යය අවබෝධ කළා, දුකේ නිරෝධය සෂාත් කළා කියන

තැන.

මේ සිද්ධියේදි ගොඩක් සියුම්, ගොඩක් ගැඹුරු කරුණු තියෙනවා, ඔරොත්තු දෙන්නේ නැති වෙයි, මම ඒ ටික මතක් කරන්නේ නැහැ. දැනට ඕනේ වුණේ මේ දේශනාවෙන් එක දෙයක් මතක් කරන්න. **සත්‍යය අවබෝධ කරන්න යන්නේ, සත්‍යය අවබෝධ කරන්න යන්නේ කියලා මෙච්චර උත්සාහවත් වෙන මේ මුළු ලෝකයක්ම අසරණයි කියලා මට හිතෙනවා. තමන් අවබෝධ කරගන්න හදන සත්‍යය මොකක්ද කියලා දන්නේ නැහැ. හැබැයි එක වටිනාකමක් තියෙනවා, තමන් අවබෝධ කරගන්න යන සත්‍යය දන්නවා කියන්නේ, සත්‍යය ඥාණයේ පිහිටලා. ඒ කියන්නේ නොබෝ කලකින් මාර්ගය උපදිනවා හරියට කෙනෙක් මේක කළොත්, ඇයි සත්‍යය ඥාණය කියන්නේ මොකක්ද?**

ඊට පස්සේ **කෘත්‍ය ඥාණය,කෘත ඥාණය.** සත්‍ය ඥාණය දැක්කට පස්සෙ, කළ යුත්තේ මේකයි කරලා ඉවරයි කියන තැනට එනවා ඉබේම. ඒකයි කෘත්‍ය ඥාණය කියන්නේ - කරන්න මග. කෘත ඥාණය කියන්නේ - කරලා ඉවරයි. **සත්‍ය, කෘත්‍ය, කෘත** කියන මේ ධර්මතා තුනම වැඩුනහම යථාභූත ඥාණ දර්ශනය පිරිසිදුයි. ***එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණ දස්සනං සුවිසුද්ධං අහොසි.*** යථාභූත ඥාණ දර්ශනය කියලා කිව්වේ මොකක්ද? අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා, කියන එකයි ඇත්ත.

ඔය ඇත්ත පිලිසිර වුණාම මේ හතර හරියට වඩනකොට, යථාභූත ඥාණ දර්ශනයයි පිරිසිදු වුණේ. නිරෝධය සෂාත් කරනවා කියන්නේ මොකක්ද, අතීතය නිරුද්ධ වුණු බව සෂාත් කරලා, අනාගතය නූපන්න බව සෂාත් කරලා, වර්තමානය හටගෙන නැති වෙනවා කියන තැන සෂාත් කරලා. මේ ටික දැක්කහම දුරුවෙලා තියෙන්නේ මොකක්ද? ජාති,ජරා,මරණ,සෝක,පරිදේව,දුක්ඛ,දෝමනස්ස, උපායාස. ඇයි දැන් අඬන්න, වැලපෙන්න කෙටියෙන් කියනවා නම් ***සංඛිත්තෙන පංචුපාදානක්ඛන්ධා දුක්ඛා*** තුන්කාලයම ඇති බවට හම්බ වෙන එකම ධර්මයක්වත් හම්බ වෙන්නේ නැහැ.

මෙහෙම පරියායක්, තර්කයක් ගත්තොත් අපි, අතීත, අනාගත, වර්තමාන කියන තුන් කාලයක් හම්බ වෙනවා නම්, ඒ තුන් කාලය තුළ තමයි ලෝකය පනවන්න පුළුවන්. ලෝකය කියන එක ඊට පස්සේ බෙදනවා, කාම ලෝකය, රූප ලෝකය, අරූප ලෝකය කියලා කොටස් තුනකට. රූප ලෝකයෙත් අතීත, අනාගත, වර්තමාන කියලා තුන් කාලයක් තියෙනවා. අරූප ලෝකයෙත් තියෙනවා. මේ තුන්කාලයටම අයිති ධර්මයෝ තමයි ලෞකික හැම ධර්මයක්ම. **ලෞකික හැම ධර්මයක්ම කියන කොට ඕකෙ ඇතුළට අයිති**

මොකක්ද? ආයතන දොළහක්, අටලොස් ධාතුවක්, උපාදානස්කන්ධයෝ පහක් (පංච උපාදානස්කන්ධයක්) මේ ටික තමයි ලෝකය.

අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නැති වෙනවා කියන කොට, මේ දැන් ස්කන්ධ පංචකයක් ඉපදෙනවා, ඒ ටික නිරුද්ධ වෙනවා මිසක, ඊළඟට උපදින එක, ඒකත් ස්කන්ධ පංචකයක්. ඉපදිලා ඒකත් නිරුද්ධ වෙනවා මිසක, හැම වෙලාවෙම එක එක වුණොත්, එකයි කියන එක නිරුද්ධ වුනහම ඒක හිතේ මතක තියාගෙනනේ අපි දෙකයි කියන්නේ. මතකයක් ඇඳන්නේ නැත්නම් හැම වෙලාවෙම එකයි, එකයි මිසක දෙකක් නැහැනේ නේද?

එතකොට ස්කන්ධයෝ හටගෙන නිරුද්ධ වෙනවා කියන තැනක නම් තියෙන්නේ, කලින් එක මේකට ඇඳන්නේ නැත්නම් හැම වෙලාවෙම එක ස්කන්ධ පංචකයයි, මෙතැනින් ජීවත්වෙනවා කියන තැනකින් විතරයි. අපිට එකයි දෙකයි තුනයි කියලා ගනින්න පුළුවන් නම් ඒ තමයි ලෝකය. දෙකක් කියන්න බැහැ එකයි නොකිව්වොත්, තුනක් කියන්න බැහැ එකයි දෙකයි ඒකට ඇඳගත්තේ නැත්නම්. නැත්නම් එකමයි නේද?

ඒ නිසා ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක් දෝමනස් කියන මේ ධර්මයන්ගෙන් සම්පූර්ණයෙන්ම මිදුණ තැන තමයි, (පංච උපාදානස්කන්ධයාගේ නූපදින ස්වභාවයට පත් කිරීම තමයි) **නිවන** කියලා කියන්නේ. තව පැත්තකින් ගත්තොත් කෙටිම වචනය, අතීතය නිරුද්ධ බව, අනාගතය නූපන්න බව, වර්තමානය හටගෙන නිරුද්ධ වෙන බව ක්‍ෂාත් කරලා. කාටද මේ කිව්වේ සත්‍යය අවබෝධ කරන්න, ක්‍ෂාත් කරන්න කියලා, ඔය තුළ මනස තියෙන කෙනෙකුට කියනවද? නැහැ. කිව්වේ කාටද? අතීතය ඇති බවට, අනාගතය ඇති බවට, වර්තමානය ඇති බවට මනස පාවිච්චි කරන, පරිහරණය කරන කෙනාටයි. ඒකට කියනවා 'ලෝකයාට' කියලා. ඔය ටික පරිහරණය කරන කෙනාට කියනවා 'ලෝකෙ කෙනා' කියලා. ලෝකයාට කිව්වේ ඇයි? ඔය ටික තුළ තමයි ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක් දොම්නස් එන්නේ. ඔය දුකෙන් මිදෙන්න බැහැ, තුන් කාලය කියන එකෙන්, ලෝකය කියන මට්ටමින් නොමිදි. ඔය දැනුම තුළ ඉඳගෙන කරන දෙයක් තුළ ජරා මරණයෙන් මිදෙන්න පුළුවන් වෙයිද? බැහැ.

ඊට පස්සේ සත්‍යය පෙන්නලා, බුදුරජාණන් වහන්සේ අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා කියලා සත්‍යය පෙන්නලා, ඊට පස්සේ පෙන්නුවා ලෝකය කියන එක. මේ පංච උපාදානස්කන්ධ ලෝකයක් පරිහරණය කරන්නේ. ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ ලෝක නිරෝධයට ප්‍රතිපදාවක් පෙන්නුවා වෙනම.

'මහණෙනි, මම ලෝකයත් දේශනා කරමි, ලෝක සමුදයත් දේශනා කරමි, ලෝක නිරෝධයත් දේශණා කරමි, ලෝක නිරෝධගාමිණී පටිපදාවත් දේශනා කරමි'.

අපි හිතාගෙන ඉන්න විදියට මේ ලෝකය බාහිර භෞතික දේත් එක්ක නම් තියෙන්නේ ලෝක නිරෝධයක් කියලා එකක් පනවන්න බැහැ. නමුත් ලෝකය කියන එක මනස පිළිබඳ වුවක් නිසයි, ලෝක නිරෝධයක් පැනෙව්වෙත්, ලෝක නිරෝධ ගාමිණී පටිපදාවක් පනවන්න පුළුවන් වුණෙත්. ඒක මේ මරණින් පස්සේ එකක්ද? මරණින් පස්සේ එකක් නම් මේ සාසනේ සංදිට්ඨිකයි, අකාලිකයි, ඒහිපස්සිකයි කියලා කියන්න බැහැ.

අකාලිකයි කියන එකේ තේරුම මොකක්ද? කාලිකයි, අකාලිකයි කියන්නේ, මේ පින්වතුන් දැන් මේ ඊයෙ පෙරේදා ලොකු පින්කම් කළා. දැන් මේ පින්, කාලිකයි කියලා කියන්නේ, කරලා ඉවර වෙනකොටම විපාක හම්බ වෙනවද? නැහැ. සුදුසු කාලය එන්න ඕනේ ඕකට විපාක එන්න. දිව්‍ය ලෝකෙ හෝ බ්‍රහ්ම ලෝකෙ යන්න සුදුසු කාලයක් තියෙනවා. ඒ හින්දා ඔය පින් වලට කියන්නේ කාලිකයි කියලා. කෙනෙක් දැන් මවු මැරුවා, පියා මැරුවා, අජාසත්ත රජ්ජුරුවෝ තාත්තා මැරුවා, මරපු ගමන්ම අපායේ ගියාද? නැහැ. රජකම් කෙරුවා නේ, ඒ පව විපාක දෙන්න කාලයක් තියෙනවා. ඒ නිසා ඒ පවට කියනවා කාලිකයි කියලා. නමුත් මේ දහම, අකාලිකයි කියන්නේ, කරලා ඉවරවෙන කොටම කල් නොයවා විපාක දෙනවා. අපි දන් දුන්නහම, දානේ දීලා ඉවර වෙනකොටම දිව්‍ය ලෝකයේ පහළ වෙලා නැහැ. ඒ නිසා ඒ පින්වලට කියනවා කාලිකයි කියලා. අකාලිකයි කියන එකත් එහෙම වුණොත් මේ ශාසනෙත් එහෙම නම් මේ ශාසනේට අකාලිකයි කියලා කියන්න පුළුවන්ද? බැහැ.

අකාලිකයි කියලා කියන්නේ, දැන්ද කෙනෙක් බුදුරජාණන් වහන්සේ දේශනා කරන මේ ප්‍රතිපදාව වඩන්නේ, වඩලා ඉවර වෙනවාත් එක්කම ලෝකයෙන් මිදිලා, ලෝක නිරෝධය. පංච උපාදානස්කන්ධ දුකෙන්ම මිදිලා. ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ දෝමනස්ස, උපායාසයන් ගෙන්ම මිදිලා. එයා සිංහ නාදයක් කරනවා. ප්‍රීති වාක්‍යයක් ප්‍රකාශ කරනවා. මොකක්ද? ***ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්තත්ථාය පජානාති.***

ඛීණා ජාති - මම ආයේ උපදින්නේ නැහැ. ***කතං කරණීයං*** - කළ යුත්ත කළා. ***නාපරං ඉත්තත්ථාය*** - මත්තේ මට කරන්න දෙයක් නැහැ. බය නැතුව කියන්නේ මොකද, මාර්ගයට අනතුරුවම ඵලය ලැබිලා කියන තැනකින්, අකාලිකයි. එතකොට ලෝක නිරෝධය සඳහා මාර්ගය වැඩුවා නම් ලෝක නිරෝධය වෙන්නේ මරණින් පස්සේ එහෙම

නෙමෙයි.

ඒ අනුසාරයෙන් ඇති කරගන්න, ලෝකය කිව්වේ ස්පර්ශ ආයතන හය නම්, පංච උපාදානස්කන්ධය නම්, තුන් කාලය නම්, මේ ධර්‍මයන්ගෙන් මිදෙන්න පුළුවන් ධර්‍මතාවයක් තියෙනවා කියන එක. මම මේ පෙන්වන පරියාය හැම තැනකටම, හැම දෙනාටම සාධාරණ නැති වෙන්න පුළුවන්. **නමුත් මේ කියන එක නොතේරුනත් අනුමානයක් හෝ හිතේ තබාගන්න, මේ හාමුදුරුවො මහා මොකක්දෝ එකක් කිව්වා කියලා හරි. එපමණකිනුත් ජීවිතේට ලාභයක් වෙයි. මොකද මම අද මේ ටික කතා කරන්නේ ප්‍රපංච ධර්‍ම තුළින් නෙවෙයි. ලෝකය තුළ තියෙන සිද්ධියකින් නෙවෙයි, මේ දහම් පරියාය තුළින්. මොකද, මේ සිද්ධාන්තය හැරෙන්න වෙන සත්‍යය අවබෝධ කරනවා කියන සිද්ධියක් නැහැ.**

සත්‍යය අවබෝධ කරගැනීමටත් අසත්‍යය දුරු කිරීමටත් කළ යුත්තේ 'සත්‍යය දැකීම' ම පමණි

ඊට පස්සේ, ඔන්න ඔය සත්‍යය බුදුරජාණන් වහන්සේ පෙන්නුවාට පස්සෙයි තේරුනේ, අවිද්‍යාව කියන එක. ඒ නිසයි, ඔය නුවණක් තියෙන කෙනායි මේ සත්ව, පුද්ගල, ආත්ම භාවය වැරදියි කියලා කියනවා නම්, ඒක මිත්‍යා දෘෂ්ටිය කියලා කියනවා නම්, ඒ වචනය කියන්න සාධාරණ එකම කෙනා, මේ සත්‍යය ඥාණයේ පිහිටි කෙනෙක් විතරයි. ඇයි? සත්ව, පුද්ගල, ආත්ම භාවයේ ඉන්න මෙහෙම ඇත්තක් නොදැකපු කෙනා, මේක සත්ව පුද්ගල භාවයෙන් බලනවා නම් බොරුවක්, මේක මිත්‍යා දෘෂ්ඨියක් කියලා කියනවා නම් එයා කාගෙන් හරි අහගත්ත වචනයක් කියනවා මිසක, එයා දැකලා කියනවා නොවෙයි. ඒකද එයාගෙ මිත්‍යා දෘෂ්ඨිය. මිත්‍යා දෘෂ්ඨිය ඇතුළෙ එහෙම කියනවා නම් කෙනෙක් ඒකද මිත්‍යා දෘෂ්ඨිය. බොරුව ඇතුළෙ ඇත්ත නැහැ, බොරුව, බොරුව කියලා බලන්නත්, ඇත්ත, ඇත්ත කියලා බලන්නත්, තියෙන්නේ ඇත්ත විතරයි. ඒ කියන්නේ, දැන් මේ අපි ඉන්න එකට බොරුව, බොරුව කියලා පෙනෙනවද? බොරුව, බොරුව කියලා පෙනෙන්නේ නැහැ. බොරුව, බොරුව කියලා බලන්න ක්‍රමයක් නැහැ. බොරුව, බොරුව කියලා බලන්නත් ඇත්ත, ඇත්ත කියලා බලන්නත්, බලන්න තියෙන්නේ ඇත්ත. බොරුව, බොරුව කියලා බලන්න එකක් තියෙනවා නම්, ඒක බොරු නෙවෙයි. බොරු නම් ඒකේ මොකක්ද බලන්නේ.

අපි අර කියන්නේ, දැන් පඹයා බව නොදන්නා කම නිසා මනුස්සයා කියලා අදහසක් එනවා නම්, මනුස්සයා කියන අදහස බොරුයි කියන්න අපිට තියෙන හයිය

මොකක්ද? මනුස්සයා කියන අදහස බොරුයි කියලා ඒ බොරුව දුරු කරන්නත් ඇත්තටම තියෙන ඇත්ත දකින්නත් දෙකටම තියෙන්නේ පඹයා කියලා බලන එක මිසක මනුස්සයා දුරු කරනවා කියලා වෙන එකක් නැහැනේ. **ඒ වගේ සත්‍යය අවබෝධ කරනවා කියන එකටත්, අසත්‍ය දුරු කරනවා කියන එකටත්, සත්‍යයමයි මිම්ම.**

ඔන්න ඔය ටික දැක්කට පස්සෙයි, ඔය ටික හම්බ වුණාට පස්සෙයි, සත්‍යය පෙන්නලා, අතීතය නිරුද්ධ වෙලා අනාගතය ඉපදිලා නැහැ වර්තමානය හටගෙන නැති වෙනවා කියන තැනකින් ඇත්ත පෙන්නලා, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, 'මෙන්න මේකයි ඇත්ත. අතීත, අනාගත, වර්තමාන කියන ධර්‍මතා තුනම එකට එකතු කරලා තමන්ගේ මනස තුළ හම්බ වෙනවා නම් මේ ටිකටයි මහණෙනි, ප්‍රපංච කියන්නේ. මේ ටිකටයි **තණ්හා, මාන, දිට්ඨි** කියන්නේ. මේ ටිකටයි කෙළෙස් කියන්නේ'.

යාවතා ඵස්සයාතනස්ස ගති තාවතා පපංචස්ස ගති,
යාවතා පපංචස්ස ගති තාවතා ඵස්සායතනස්ස ගති

ස්පර්ශ ආයතන හයේ ගතිය යම්තාක්ද තණ්හා, මාන, දිට්ඨීන්ගේ ගතිය ඒතාක්. තණ්හා, මාන, දිට්ඨීන්ගේ ගති යම්තාක්ද, ස්පර්ශ ආයතන හයේ ගතිය ඒ තාක්. මේ ස්පර්ශ ආයතන හය ගැන යම්කිසි කෙනෙකුට අත්දැකීමක් තියෙනවා කියන්නේ, ඔය තමයි තණ්හා, මාන, දිට්ඨි කියන කෙළෙස්. තණ්හා, මාන, දිට්ඨි කියන කෙළෙස් වල යම්තාක් අත්දැකීමක් වෙයි ද, ඒතාක් ඇස, කන, දිව, නාසය ගැන එයාට අත්දැකීමක් තියෙනවා. **අපි ඔය ගැන නොදැන අද මිදෙන්න කියලා බලන්නෙත් ඇස, කන, දිව, නාසය කියන තැනින් නේ.** නමුත් මේ ටික බැලුවා නම් බැලුවේ මෙහෙම තැනකට එන්නයි.

ඊට පස්සේ ඔය සත්‍යය පෙන්නලා, මේ අද හම්බ වෙන ලෝකය ප්‍රපංච කියලා පෙන්නලා, බුදුරජාණන් වහන්සේ ප්‍රතිපදාවක් පනවනවා, ලෝක නිරෝධයට, **සීල, සමාධි, ප්‍රඥා** කියලා.

අපි තවම දක්ෂ මදි. හරියට මේ උත්තර ටික ආවා නම් **අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නැති වෙන බව නම් ඇත්ත, ඔහොම තැනක තුන් කාලයම ඇති බවට හම්බ වෙනවා නම්, හම්බ වෙන්න පුළුවන් මනෝ විඥ්ඥාණය හරහා විතරමයි. මනසින් විතරමයි, තුන් කාලය හම්බ වෙන්නේ.**

එහෙනම් දැන් එයාට කිසිම සැකයක්, වෙනසක් නැහැ, ඔය ටිකේ පිහිටි කෙනාට. උපදින උපදින හැම විතර්කයක්ම තමන්ගේ මනස පිලිබඳවයි කියන එක.

සීලයක පිහිටලා **සති නිමිත්තක** හිත තබාගෙන උපදින උපදින හැම විතර්කයක්ම තමා තුළයි කියලා නුවණින් බලනවා. ඔච්චරයි කරන්න තියෙන්නේ. මේ ටික කරන කොට, කරන කොට, තමා තුළ තියෙන විතර්ක සංසිඳෙනවා, විතර්ක සංසිඳෙන්න සංසිඳෙන්න ඒකට කියනවා 'සංඛාර වූපසම' වෙනවා. **සංඛාර කියලා කියන්නේ තුන් ලෝකය අනුව ගිය කාම භූමිය, රූප භූමිය, අරූප භූමිය කියන තුන් ලෝකය අනුව ගිය හැම ධර්මයක්ම සංඛාරයි යන ගණයට යනවා.** සියළු සංස්කාර ධර්මයෝ කියනවා නම් ගෙවල් දොරවල්, යාන වාහන, ඉඩ කඩම්, මිල මුදල් කියලා තුන් භූමිය අනුව ගිය යම් ධර්මයක් හමුවෙනවා නම් මේ ඔක්කොම සංස්කාරයි. සියළු සංස්කාරයන්ගේ සංසිඳීමක් වෙනවා.

මෙතැනදි සියළු සංස්කාරයෝ අනිත්‍යයි කියලා දකිනවා. දකිනවා කියන්නේ **සීලයක පිහිටලා සති නිමිත්තක හිත තබාගෙන උපදින උපදින විතර්කයන්ගේ අනිත්‍යය බලන්න විතරයි තියෙන්නේ මොකද, දැන් මනායතනය රැකගන්න විතරයි තියෙන්නේ.** කියන තැනකට එයා දක්ෂයි. පංචායතනයෙන් මෙහෙම පෙනුනත්, මනායතනයේ දෝෂෙ නිසයි මෙහෙම පෙනෙන්නේ කියන තැනකට දක්ෂයි.

ඒ හින්දා හිතේ, ඒ කියන්නේ තමන් තුළ උපදින, තව කෙටියෙන් ගත්තොත් බැහැර ආයතනයේ විඤ්ඤාණය පිහිටන්න දෙන්නේ නැහැ. බැහැර ආයනයේ විඤ්ඤාණය පිහිටන්න දෙන්නේ නැහැ, කියලා කියන්නේ, අපි කියමු දැන් ගෙදර කියලා මතක් වෙන කොට, ලෝකයේ සිද්ධිය තමයි 'ගෙදරමයි' කියලා දිව්වේ. දැන් එක පාරටම සත්‍යය සිහිවෙනවා. ගෙදර තියෙනවා කියලා සිහි වුණාට බුදුරජාණන් වහන්සේ දේශනා කළේ දැකපු දේ අනිත්‍යයි කියලනේ. එහෙම නම් මේ මනස නේද, කියලා එක පාරටම අහුවෙනවා. **දැකපු දේ අනිත්‍ය නම්, දැන් දැකපු දේ ඇති බවට සිහිවෙන එක මනස පිළිබඳ වුවක් නේද කියලා තමන්ට ක්ෂණිකව මිම්මක් එනවා දැන්.**

හැම වෙලාවෙම තමන්ට තියෙන හයිය තමයි 'ඇත්ත' තේරුනා නේද? දරුවා කියලා සිහිවෙන කොටම, 'මේ තමයි ඇත්ත, මනස පිළිබඳ වුවක් නේද' කියලා බලනවා. ඔහොම බලන්න කෙනෙකුට හයිය නැත්නම්, බැලුවට පෙනෙන්නේ නැත්නම්, ඒ කියන්නේ සමාධියේ බලවත්කම අඩුයි. ඕකට කියනවා 'ඉන්ද්‍රිය පරිපාකෙට' ගිහිල්ලා නැහැ. ඉන්ද්‍රිය මුහුකරලා නැහැ. සද්ධා, සති, වීරිය සමාධි, ප්‍රඥා කියන මේ ඉන්ද්‍රිය ධර්ම. **දැන් ඉන්ද්‍රිය ධර්ම වඩන්න ඕනේ. ඒ ඉන්ද්‍රිය ධර්ම වඩන්න තමයි සීලයක පිහිටලා සමථ නිමිත්තක හිත තබාගන්නේ.** ඒ කියන්නේ අර උපදින විතර්ක, මනස පිලිබඳ වුවක් කියන එක පෙනෙන්නේ නැත්නම් ආශ්‍රව වලට වැටිලාමයි අපට හම්බ වෙන්නේ, බැහැර දෙයක්මයි අපට හිතෙන්නේ, කියන එකෙන් අහුවෙන්නේ. ඒ කියන්නේ සිහිය, සති ඉන්ද්‍රිය දුබලයි කියන එක.

ඒ නිසයි බුදුරජාණන් වහන්සේ මේ සිහිය කියන එක පනවන්නේ. මහණෙනි, **මේ සිහිය කියන ධර්මතාවයෙන් තොර මිදීම කියන කාරණාවක් නැහැ.** සති නිමිත්තෙහි හිත තබාගෙන, ඒ සිහිය තමා තුළ පවතින බව එන්න එන්න ආසේවනය කරලා, ඒක බලවත් වුණ දවසටයි 'දරුවා' , මේ දරුවා කියන එක තමන්ටමයි හිතෙන්නේ කියන කාරණාව වැටහෙන්නේ. තමන්ට එදාටයි, 'නැහැ එහෙ ඉන්නවනේ දරුවා', 'එහෙ ඉන්නවනේ' කියලා හිතෙන්නෙත් මටමනේ කියන තැනට එනවා. යමක් යමක් විතර්කනය කරයි නම් කරන්නේ මේ තමන්ගෙම මනසින් නේ කියන තැනට එනවා. හැම දෙයක්ම, 'මනසිකාර පටිබද්ධයි' කියන තැනට අහුවෙනවා සිහිය පිහිටියොත්.

ඒ හින්දා, සීලය කියන එක ඕනෙ වුණේ හිත තැන්පත් කරගන්න උපකාර පිණිස. හිත තැන්පත් කරගත්තොත්, හිත එකඟ කරගත්තොත් හිත එකඟ කරගන්නේ මොකටද? උපදින උපදින ධර්මයන්ගේ අනිත්‍ය බලන්න. ඇයි උපදින උපදින ධර්මයන්ගේ අනිත්‍ය බලන්නේ? සත්‍යය අවබෝධ කරගන්න. මේ හිතේ උපදින විතර්කයන්ට කියනවා 'ප්‍රපංච' කියලා. අද දවසේ අපේ හිතේ තියෙන මේ විතර්ක සංසිඳුනු දවසට ඉබේමයි, ඉබේමයි අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා කියන ධර්මතාවය තුළ ජීවිතය නතර වෙන්නේ. සියළු සංස්කාරයෝ සංසිඳුනු දවසටයි ඔය තැන ඉබේම ජීවිතය නතර වෙන්නේ. සීලයක පිහිටලා සමථ නිමිත්තක හිත තබාගෙන උපදින උපදින විතර්කයන්ගේ, (ඕකට කියනවා **පංච උපාදානස්කන්ධයක් උපන්නා කියලා, ඒ කියන්නේ පහළ වෙන්නේ, සිහි වෙන්නේ පංච උපාදානස්කන්ධයක්.**) දැන් ගෙදර කියලා සිහිවෙන කොට, පංච උපාදානස්කන්ධයක් උපන්නා නේද, මේ දුක උපන්නා නේද, රෝගයක් උපන්නා නේද කියලා බලනවා.

අනිච්චතෝ දුක්ඛතො, රෝගතො, ගන්ඩතො
සල්ලතො යොනිසො මනිසිකා තබ්බා

ඇවැත්නි, කොට්ඨිතයිනි, සිල්වත් භික්ෂුව කුමක් කළ යුතුද? පංච උපාදානස්කන්ධය අනිත්‍යය වශයෙන්, දුක්වශයෙන්, රෝගයක් වශයෙන්, හුලක් වශයෙන් 'යෝනිසෝමනසිකාර' කරනවා. යෝනිසෝමනසිකාරය කරන කොට සෝවාන් ඵලය සාක්ෂාත් වෙනවා. සෝවාන් පුද්ගලයා කුමක් කල යුතුද? පංච උපාදානස්කන්ධය අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, රෝග වශයෙන් බලන කොට සකෘදාගාමී බවට පත්වෙනවා. සකෘදාගාමී කෙනා කුමක් කළ යුතුද? පංච උපාදානස්කන්ධය අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් බලන කොට ආනාගාමී වෙනවා. අනාගාමී කෙනා කුමක් කල යුතුද? පංච උපාදානස්කන්ධය අනිත්‍යය වශයෙන්, දුක් වශයෙන්, රෝග වශයෙන් බලනකොට රහත් වෙනවා. රහත් වුණු කෙනා කුමක් කළ යුතුද? පංච උපාදානස්කන්ධය අනිත්‍යය වශයෙන්, දුක් වශයෙන්, රෝග වශයෙන් බලන

කොට දිට්ඨ, ධම්ම සුඛ විහරණය පිණිස පවතිනවා.

පංච උපාදානස්කන්ධය අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් බලනවා කියන්නේ, ඉපදිලා නෙවෙයි. පංච උපාදානස්කන්ධය කියන එක අනිත්‍ය වෙන ස්වභාවයෙන්, රෝග ස්වභාවයෙන් යුක්ත ධර්මයක් නේද කියලා බලන කොට එයාට සැනසිල්ල එනවා. ඒ කියන්නේ අපාය කියලා කියන්නේ, අවීචිය කියන්නේ මහා ගිනිගොඩක් නේද, පිච්චෙන එකක් නේද කියලා අපිට හිතන්න පුළුවන්නේ, හිතුවා කියලා අපායේ දුක ඉපදිලා නැහැ නේ. ඒ වගේ රහතන් වහන්සේට පංච උපාදානස්කන්ධය දුකක් හැටියට, රෝගයක්, හුලක් හැටියට හිතන්න පුළුවන්. හිතුවා කියලා උන්වහන්සේ පංච උපාදානස්කන්ධය පරිහරණය කරනවා නෙවෙයි.

පංච උපාදානස්කන්ධය කිව්වේ ලෝකය, අර මනෝමයෙන් ගන්න සිද්ධිය තියෙන්නේ, ඔය ටිකේ. ඔය උපදින උපදින දේ තමන් තුළ මෙහෙම විතර්කයක් ඉපදුණා කියන්නේ, ජරා මරණ උපන්නා. ඇයි ජරා මරණ උපන්නා කියන්නේ, මේ නිමිත්තක් මරණාසන්න මොහොතේ අහුවුණොත්, ඊට අනුව ප්‍රතිසන්ධියට ගිහින් ජරා, මරණ ලැබෙන්නේ නැද්ද, ලැබෙනවා. එහෙනම් මේ නිමිත්තට ජරා, මරණ කිව යුතුයි. මේ නිමිත්තක් උපන්නා කියන්නේ රෝගයක් උපන්නා. මේ නිමිත්ත අනුව විඤ්ඤාණය පිහිටියොත්, නැවත උපන්නොත් තමන් රෝගයකට පත්වෙන්නේ නැද්ද, එහෙනම් මේ නිමිත්තක් නෙවෙයි, මේ රෝගයක්. මේ නිමිත්තේ හරියට හිත පිහිටියොත් මරණාසන්න මොහොතේ යම් තැනක උපන්නහම, කුණු වුණු, සැරව පිරුණු ශරීරය එකම සැරව ගෙඩියක් බවට පත්වෙන්නේ නැති වෙයිද? එහෙනම් මේකට ගඩක් කිව යුතුයි.

මේ අර්ථයෙන් මේ පහළ වෙන මේ දේ කියන්නේ දුකක්, රෝගයක්, හුලක්, ගඩක්. තව පැත්තකින් කියනවා **'ද්වාචත්තාරිසාකාර ශූන්‍යතා භාවනාව'** කියලා. මේවා අපි ගොඩක් දෙනෙක් කරනවා. ඒත් මේ දේ කරන්න ඕනේ යම් අර්ථයක් දැනගෙනද, ඒ අර්ථය නැහැ. ඒ හින්දා ප්‍රතිඵල නැහැ. ප්‍රතිඵල දන්න කෙනෙක් මේක කරන්නේ නැත්නම් ඒ හරියන්නෙත් නැහැ. කරන කෙනා මේක කරන්නේ මොකටද කියලා දන්නේ නැත්නම් ඒත් වැඩක් නැහැ.

අනිච්චතෝ, දුක්ඛතෝ, රෝගතෝ, ගණ්ඩතෝ, සල්ලතෝ, අඝතෝ
පරතෝ, පලෝකතෝ, භයා, උපද්දවා, චලා, පභංගා, අද්වා,
අද්ධාන, අලේනා, අසරණා, රිත්තා, සුඤ්ඤා, සාසවා,
අඝමූලකා, ජාති ධම්මා, ජරා ධම්මා, ව්‍යාධි ධම්මා....

මේ පංච උපාදානස්කන්ධය මෙනෙහි කරන්න ක්‍රම ටිකක් පෙන්වනවා. ඕකෙන් ඔය ටිකක් තමයි සැරියුත් මහරහතන් වහන්සේ පෙන්වන්නේ කොට්ඨිත හාමුදුරුවන්ට.

ඒකෙන් මම කිව්වේ, පංච උපාදානස්කන්ධය මෙනෙහි කරනවා කියලා කිව්වේ මනසේ උපදින උපදින විතර්කයන් හඳුනා ගන්නේ එයා. විතර්කයක් උපන්නා කියන්නේ, ජරාව උපන්නා, විතර්කයක් උපන්නා කියන්නේ, මරණය උපන්නා. විතර්කයක් උපන්නා කියන්නෙ, දුක් දොම්නස් උපන්නා. ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, ආදිත්‍යය කියන සූත්‍රයේ 'ඇවිල ගන්නා ලදී' කියලා. මොකන් ඇවිලගන්නා ලදී ද 'ඇස ඇවිල ගන්නා ලදී' රූපය ඇවිල ගන්නා ලදී, මොකෙන්ද ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ දෝමනස්ස, උපායාසයන්ගෙන් ඇවිල ගන්නා ලදී. එකොළොස් ගින්නකින් ඇවිල ගන්නා ලදී කියලා පෙන්නන්නේ. ඇහැ ඇති බවට සිහි වෙනවා නම් අපට, මේ දේ ඇති ප්‍රතිසන්ධි වශයෙන් ගිහිල්ලා මේ ටික ඔක්කොම ලැබෙන්න.

එතැනදි තව ගොඩක් ගැඹුරු අර්ථ තියෙනවා. ඒකෙන් මම එක දෙයක් විස්තර කළොත්, ඒ තමයි අනුමානෙට දැනගන්න මම අර ස්කන්ධයන්ගේ නාම-රූප ධර්මයන් පවා කිව්වා නම්, ඒවාවත් මේ පින්වතුන් හිතට බරක් වශයෙන් ගන්න එපා. ඔය ටිකෙන් මට ඕනේ වුණේ මේ සත්‍යය ඥාණය කියන එක පෙන්වන්න. සත්‍යය තමයි අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපදිලා නැහැ වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා කියන එක, ඔය ටික පින්වතුන්ට ඇත්ත හැටියට තේරුනා නම් ඔය පින්වතුන්ට තේරෙනවා ඉබේම, එහෙනම් අද අපි ඉන්නේ සත්‍යය බොරු වෙලා නේද? ලෝකය කියලා කියන්නේ සත්‍යය කියන එක බොරු වෙලා බොරුව සත්‍යය වෙලා ඉන්නෙ. තුන් කාලය නිරුද්ධයි කියන එක ලෝකයට බොරු, තුන් කාලය තියෙනවා කියන එක ලෝකයට ඇත්ත, මෙන්න මේ නුවණ ලැබෙන්නයි. ලෝකය අපිට හම්බ වෙලා තියෙන්නේ, බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාවෙන් අපිට හම්බ වෙලා තියෙන දේ වැරදියි කියලා විනිශ්චය කර ගන්නයි, ඔය ටික කියන්නයි ස්කන්ධයෝ ගැන පෙන්නුවේ. ඒ හින්දා ස්කන්ධයෝ ගැන බරක් ගන්න එපා. කොහොමද නාම-රූප බලන්නේ කියලා. ඒ ප්‍රශ්නෙනුත් ඔය පින්වතුන් නිදහස්. ඔය නුවණ විතරක් තිබුණා නම් ඇති.

නුවණ කිව්වේ සත්‍යය හඳුනාගන්න, සත්‍යය කියන එක දැනගන්න අනුමානෙට සත්‍යය දන්නවා ඔය පින්වතුන්. මොකක්ද, අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා. මේක තමයි ඇත්ත. හැබැයි ඇත්ත අපට ක්ෂාත් වෙලා නැහැ. ඇත්ත අපි අවබෝධ කරගෙන නැහැ. ඇත්ත තුළ අපි ජීවත් වෙන්නේ නැහැ. දැන් ඇත්ත ක්ෂාත් කරගන්න, ඇත්ත අවබෝධ කරගන්න, ඇත්ත තුළ ජීවත්

වෙන්න, ඒ කියන්නේ රහතන් වහන්සේ විතරයි ඇත්ත ක්ෂාත් කරලා තියෙන්නේ සත්‍යය ක්ෂාත් කරලා තියෙන්නේ, සත්‍යය අවබෝධ කරලා තියෙන්නේ, සත්‍යය තුළ ජීවත් වෙන්නේ. අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපිදිලා නැහැ, වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා කියන තැනකින් යම්කිසි කෙනෙකුගෙ ජීවිතය පනවනවා නම් පනවන්න වෙන්නේ, රහතන් වහන්සේ නමකට විතරයි.

***අතීතං එකො අන්තො අනාගතං දුතියො අන්තො, පච්චුප්පන්නං මජ්කෙඩ* - අතීත අන්තයක් අතහැරලා, අනාගත අන්තයත් අතහැරලා, වර්තමානය මැදයි** කියලා ජීවත් වෙනවා කියනවා නම් පනවන්න වෙන්නේ රහතන්වහන්සේ නමකට විතරයි. ඔතෙන්ට ගන්නයි මේ ජීවිතය තියෙන්නේ. මේ දහම තියෙන්නේ. අර පරියායෙන් ඒ ටික පෙන්නුවා.

ඊට පස්සේ, ආර්ය අෂ්ටාංගික මාර්ගය කියන එක තියෙන්නේ. අනේ අපි ඉපදෙනවා නේද, ලෙඩ වෙනවා නේද කියලා මෙනෙහි කර කර ඉන්න නෙවෙයි. පංච උපාදානස්කන්ධය දුකයි ***දුක්ඛෙ ඤාණං*** කියලා නුවණක් ඇති කරගන්න.

පංච උපාදානස්කන්ධය කියන කොට දැන් ඔය පින්වතුන්ට වෙන කොහෙවත් හම්බ වෙන්න බැහැ. හම්බ වෙන්න ඕනේ කොතැනින්ද, තුන්කාලයක්ම ඇති බවට හම්බවෙන මනස. දැකපු දේ තියෙනවා කියලා සිහි කරන්නෙත් හිතෙන් නේද අපි, හෙට මෙහෙ යන්න ඕනේ කියලා හිතන්නෙත් හිතෙන් නේද, ඕක තව හොඳට දහමේ පෙන්වනවා, **වර්තමානය ඇසුරුවෙන්නේ පංචායතනයට විතරයි. අතීත අනාගත දෙක ඇසුරු වෙන්නේ මනෝ විඤ්ඤාණයට විතරයි** ඒකෙන් පංච උපාදානස්කන්ධය අනිත්‍ය හැටියට, දුකක් හැටියට, රෝගයක් හැටියට, බලන නුවණක් තියෙනවනම් මේක තමයි පංචස්කන්ධය කියලා කියන්නෙ. ඒ බලන්න, තමා තුළ දුකක් උපන්නේ කියලා බලන්නත් පුළුවන් වෙන්නේ සිහිය යම් මට්ටමක දියුණු වුණු කෙනාට. නැත්නම් මට ගෙදර සිහිවුණා කියන තැනකින්මයි අහුවෙන්නේ, දරුවා කියන තැනකින්මයි අහුවෙන්නේ. **අපි අහුවෙලා, වැටිලා ඒක තුළ කෙළෙස් අතින් ගිහිල්ලත් ඉවරයි. එච්චරට වේගවත් අපි.**

මේක විතර්කයක් නේද ස්කන්ධයක් නේද, නැත්නම් මේක තමයි කෙළේසය කියලා හරි හිතන්න යම් විවේකයක් තියෙන්න ඕනේ. වේගවත් බව අඩුවෙලා තියෙන්න ඕනේ, ආශ්‍රව අඩුවෙලා තියෙන්න ඕනේ. ඒ බව කරන්නේ සමාධියෙන්. ප්‍රඥාව තමයි පංච උපාදානස්කන්ධය දුක බව බලන එක. උපදින උපදින විතර්කයන් දුක බව බලන එක. ඒ බලන එකට උපකාර පිණිසයි, සමාධිය තියෙන්නේ. අද අපිට බලන්න බැහැ කියන්නේ සමාධිය අඩුයි කියන එක. සමාධිය ඇති කරගන්න උපකාර පිණිසයි සීලය තියෙන්නේ.

සීලයක පිහිටන්න, සමාධියක හිත එකඟ කරගන්න, අර විදියට නුවණින් බලන්න.

සීල, සමාධි, ප්‍රඥා කියන මේ ධර්මතා තුන වැඩුවහම අවබෝධ වෙන්නේ චතුරාර්ය සත්‍යය. ඒ කිව්වේ **අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා කියන තැනක ජීවිතය පවතිනවා. මේ නිවනයි පෙන්නන්නේ.** නිරෝධය ක්ෂාත් කළා කියලා කියන්නේ මොකක්ද, අතීතය නිරුද්ධ වුණු බව ක්ෂාත් කරලා, අනාගතය ඉපදිලා නැති බව ක්ෂාත් කරලා. ලෝකයක් පනවන්න බැහැ. වර්තමානය හටගෙන නැති වෙනවා කියන තැන ක්ෂාත් කරලා. වර්තමානයේදී මේ ස්වභාවය ටික ටික හරි පෙන්වනවා නම් මේ ලෝකය මෙහෙම හිටින්නේ නැහැ. අද අපි ලෝක නිරෝධයක් ගැන කතා කරන්නේ, ලෝකය තුළ ඉඳගෙන. ඒ හින්දා මම කියන්නේ, මට මේ දහමේ වටිනාකම තේරෙන තරම් මේ පින්වතුන්ට තේරෙනවද කියන එක මම දන්නේ නැහැ. මම ඉතින් මට දෙන්න පුළුවන් ඉහළම දේ ලෝකයා වෙනුවෙන්, ඒ කියන්නේ මම හදවතින්ම, එච්චරට මම දන්නවා මේක වටිනවා කියලා. ඒ කියන්නේ **මේක අනුමානෙට හරි කෙනෙකුට තේරුනොත් එපමණකින්ම ඒ ජීවිතය නාථයි, අනාථ නැහැ කියලා තේරෙනවා මට.** ඒ හින්දයි මම මේ ටික නැවත නැවත මතක් කරන්නේ, වර්ණනා කරන්නේ, ඔය පින්වතුන්ට ග්‍රහණය කරගන්න.

නිවනටම නැඹුරුව පවතින 'සති නිමිත්ත'

ඔය ධර්මතා ටික ඔක්කොම ලැබෙනවා, ගිහි ජීවිතයක ඉන්න මේ පින්වතුන්ට. **අවධාරණයෙන්, උත්සාහයෙන් කළ යුතු තව එක දෙයක් විතරක් මම මතක් කරනවා. ඔය සත්‍යය කියපු එක දැන් දන්නවනේ. ඕක ක්ෂාත් කර ගන්නත්, ප්‍රඥාව වඩා ගන්නත්, සීලය වඩා ගන්නත් චුට්ටක්වත් අමාරු නැහැ. සති නිමිත්ත හුරු කරන්න. සති නිමිත්ත නෙවෙයි. මම ඒකට කියන්නේ නිවන හුරු කරන්න කියලා.** එච්චරට ඒක නිවනට උපකාරි ධර්මයක් බව කිව යුතුයි. සති නිමිත්ත කියන එක නිවනයි කිව යුතුයි. නිවනට පරියාය නමක් කිව යුතුයි. මේ සිහිය තමා තුළ තිබුණොත් උපදින විතර්කය තමා තුළයි, මේක පංච උපාදානස්කන්ධයක්, මේක දුකක් කියන එක පෙනෙන්නේ ඉබේමයි. ඒ ධර්මතාවය පෙනුනොත් පංච උපාදානස්කන්ධය නූපදින බවට පත්වෙලා, සත්‍යය තුළ ජීවිතය පවතින්නේ ඉබේමයි. මොකද දැන් එයා දන්නවා මේක කළේ මේ ඇත්ත ගන්නයි කියන එක, ඉබේම මතු වෙනවා.

එතකොට සති නිමිත්ත තුළ හිත තබාගන්නවා කියන කාරණාවෙන් මම කියන්නේ, මම එදත් මතක් කළා මේ එකදු දෙයක්වත්, මම මගේ පෞද්ගලික ජීවිතයෙන් හිතුවක්කාර අර්ථ වලින් කියන්නේ නැහැ. මේ කියන්නේ පිටකෙ තියෙන පෙළ දහම තුළමයි. මේ දේශනාව පටිගත වෙනවා මම හිතන්නේ. අහන ඕනම කෙනෙකුට වුණාත් මෙහෙම කියන්නෙ ඇයි කියන කාරණාව කියන්න මම සූදානම්, තර්කයක් කරන්න නෙවෙයි, මේ අර්ථයෙනුයි මේ දහම කිව්වේ කියන කාරණාව.

එතකොට ඔය සති නිමිත්ත කියන එකත් මම කියන්නේ, මේ නාසයේ හෝ මුඛ නිමිත්තේ සිහිය තබාගන්න එක. අද අපි ගොඩාක් දෙනෙක් හිතන්නේ ආනාපාන සතිය වඩන කොට විතරයි කියලා හිත එහෙම තියාගන්න ඕනේ, අනිත් ඒවට නැහැ කියලා. නමුත් අභිධර්ම පිටකයේ විභංග ප්‍රකරණයේ ඣාන විභංගයේදි 'ලෞකික වේවා, ලෝකෝත්තර වේවා යම්ම ධ්‍යානයක් ඇති කර ගන්නවා නම්, චේතෝ සමථයක් ඇති කරගන්නවා නම්, චිත්ත සමාහිත බවක් ඇති කරගන්නවා නම්, ඇති කරගන්නේ කොහොමද' කියන එක හොඳට බෙදලා බෙදලා බෙදලා බෙදලා පෙන්නනවා, එතැනදි එයාගේ වටපිටාවේ ඉඳලා, සීලයේ ඉඳලම පෙන්වනවා. ***කතං පරිමුඛං,*** නාසිකාග්‍රයේ හෝ වේවා මුඛ නිමිත්තේ හෝ වේවා නාසයේ කෙළවර හෝ මුඛ නිමිත්තේ, ***අයං සති උපට්ඨිතා හොති සූපට්ඨිතා***, මේ සිහිය එළඹ සිටියේ වෙයි. මනාකොට එළඹ සිටියේ වෙයි, හැම වෙලාවෙම සිහිය නාසිකාග්‍රයේ හෝ මුඛ නිමිත්තේ එළඹ සිටින විදියට තබාගන්න.

ආනාපාන සතිය උපායක්. සති නිමිත්තෙහි හිත තබාගෙන ආනාපාන සතිය වඩන එකෙන් කළේ, ආනාපාන සතිය ඕනේ හින්දා නෙවෙයි. අනාපාන සතිය සිහියට ආරක්ෂාවක්. මේ ආශ්වාස ප්‍රශ්වාසයට හිත තැබුවහම, සිහිය පිහිටුවා ගෙන මේ සති නිමිත්තෙන් හිත අතහැරවලා, අහකට යන්න තියෙන හේතුව මගහැරෙනවා. දැන් **රාග, ද්වේශ, මෝහ අරමුණක් සිහි වුණොත් සිහිවෙන්නේ සති නිමිත්ත අත හැරිලා බාහිරයට නැමිලමයි. නමුත් ආනාපාන සතිය සිහිවෙන කොට බාහිරයට යන්නේ නැහැ, සිහිය තුළම නැමිලයි ඒක අහුවෙන්නේ අපිට. කය අනුව බලන කොට බාහිරයට යන්නේ නැහැ, සිහියට නැඹුරු වෙලාමයි ඒක අපට තේරෙන්නේ.** නමුත් රාග, ද්වේශ විතර්කයක් ඇති වුණොත් විතර්ක ඇති වෙන්නේ සිහිය අතහැරිලා බාහිරයට නැඹුරු වෙලාමයි.

ඒ හින්දා ඕනෙම කමටහනක් වඩනවා නම් වඩන්න ඉස්සරවෙලා සති නිමිත්ත තුළ හිත තබාගෙන, **සති නිමිත්ත කියලා කිව්වේ නාසය කෙළවර හෝ තොල් දෙකගාව හිත තබාගෙන හොඳට සිහිවත්ව, දැනුම් ඇතුවම, සිහි ඇතුවම ඒ කමටහන වඩන්න.** ඊට පස්සෙ

නැගිට්ටට පස්සේ වෙනදා භාවනා නොකරන ලෝකයාගේ ගණයට යන්නේ නැහැ. භාවනා නොකරන ලෝකයාගේ මනස නිතරම විසිරිලා නම් තියෙන්නේ, අරයා භාවනා කලාට පස්සෙත් භාවනා මනසිකාරයෙන් නැගිට්ටට හිත, මේ සති නිමිත්ත තුළ තියෙනවා. හිත සති නිමිත්ත තුළ තබාගන්න උත්සාහවත් වෙනවා. වැඩපල කරද්දි. හිත සති නිමිත්ත තුළ තියාගෙන කරන්න දක්ෂ මදි හින්දයි, එක තැනක ඉඳගෙන හුරුවෙන්නේ මේ.

මේ භාවනා කරනවා කියලා කළේ මේ සිහිය හුරු කරන එක. සිහිය වඩනවා **සතිපට්ඨානය** කියන්නේ වඩන්න පුළුවන් එකක් නේ. සිහිය කියන එක වඩන්න පුළුවන් එකක් නේ. බුදු ගුණ මෙනෙහි කරන එක කොහොමද වඩන්නේ. අද මෙනෙහි කළා, නැති වුණා. ආයේ හෙටත් මෙනෙහි කළාට පස්සේ නැති වෙනවා. කරන කරන එක නැති වෙනවා නම්, නැවත නැවත රැස්වෙන්නේ නැත්නම් වැඩෙනවද? නැහැ.

නමුත් මේ සති නිමිත්ත තුළ අද හිත තබාගෙන කරන කොට, කරන කොට ටිකක් හුරු වුණහම, හෙට සති නිමිත්ත තුළ හිත තබාගෙන කරන කොට ඊට වඩා ටිකක් හුරුව වැඩි වෙනවා. ඊගාවට සති නිමිත්ත තුළ හිත තබාගෙන තව ටිකක් කරන කොට වෙනදටත් වඩා හොඳට ඉන්න පුළුවන්. **මේ සිහිය පිහිටා තියෙන බව, බැඳිලා තියෙන බව එන්න එන්න වැඩෙනවා. දැන් මේ සතිපට්ඨානය වඩනවා, සිහිය පිහිටුවීම වඩනවා. වැඩිලා, වැඩිලා, වැඩිලා යම් දවසක් තියෙනවා වඩන්න ඕනේ නැහැ. කෘත්‍යය ටික වෙලා ඉබේම. හතර ඉරියව්වේම තමා තුළ සිත එළඹ සිටින තැන ඉබේම වෙනවා. සති *ආරද්දෝ හෝති*** .....සිහිය එළඹ සිටියේ වෙයි එයාට. ඒ කාලෙදි **සති සම්බොජ්ජංගය** පිරෙනවා. එදාට ඉබේමයි **ධම්ම විචය සම්බොජ්ජංගයට** නුවණ එන්නේ, උපදින විතර්කයන් අනිත්‍යය හැටියට, දුක් හැටියට දකින්න ඉබේමයි නුවණ එන්නේ. ඉබේමයි ඒ අයට **වීරිය සම්බොජ්ජංගය** එන්නේ. මේ බොජ්ජංග ටික කරන කෙනාට කෙළෙස් දුරුවෙලා ***පමුදිතස්ස ප්‍රීති ජායති*** - **ප්‍රීති සම්බොජ්ජංගය** එන්නේ ඉබේමයි. ***ප්‍රීති මනස්ස කායං පස්සම්භති*** - ප්‍රීති සහගත කෙනාගේ හිත කය දෙක සංසිඳෙනවා. **පස්සද්ධි සම්බොජ්ජංගය** එන්නේ ඉබේමයි. කය සිත දෙක සංසිඳුණු කල්හි සැප ලැබෙනවා, ***සුඛිනෝ චිත්තං සමාධියති*** - **සමාධි සම්බොජ්ජංගය** පිරෙන්නේ ඉබේමයි. සමාධිය ඇති කල්හි, ඇත්ත ඇති හැටියෙ දකිනවා. ඇත්තටම අතීතය නිරුද්ධ වෙලා නේද? ඔන්න ඔය සමාධිගත මට්ටමකදී තමයි ඔය පින්වතුන් ඇත්ත දකින්නේ. දැන් අද පෙනෙන්නේ නැහැ. අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා කියලා කිව්වට පෙනුනේ නැහැ. 'නැහැ මේ තියෙනවා වගේමයි' කියලා හිතුනේ.

ඊට පස්සේ මේ ප්‍රතිපදාව පුරාගෙන ගියා කියන්නේ ඇතුළෙන් භාරගෙන, භාරගෙන, භාරගෙන ගිහිල්ලා, **හිත සමාධි මට්ටමට ආව කියන්නේ, අන්න ඔය පින්වතුන් ඇත්ත ඇති හැටියේ දකිනවා. *සමාහිතෙ භික්ඛු යථා භූතං පජානාති*** - හිත සමාධි වුණාහම ඇත්ත ඇති හැටියේ දකිනවා. අතීතය නිරුද්ධ වුණ බව 'පෙනෙනවා'. ප්‍රාර්ථනා ඕනේ නැහැ. අනාගතේ ඉපදිලා නැති බව පෙනෙනවා. වර්තමානය හටගෙන නැති වෙන බව පෙනෙනවා. 'පෙනෙනවා,' ආයේ ප්‍රාර්ථනා එපා, දැන් ඇදහීම් නැහැ, විශ්වාස නැහැ, ප්‍රත්‍යක්ෂයි පෙනෙනවා. ඇත්ත ඇති හැටියේ දකිනවා.

ඇත්ත ඇති හැටියේ දකින කොට ***නිබ්බින්දති*** කලකිරෙනවා. දැන් එදාට තමයි එයාගේ ලොමුදැහැගන්නේ. ඒ කියන්නේ බය හිතෙන්නේ. මෙච්චර ඇත්තක් තියෙන තැනක මේ ධර්මතා ඔක්කොම ඇති බවට, මේ මනෝමයෙන් ගන්න සිද්ධිය ගැන කලකිරෙන්නේ එදාට. තුන් භවයම ගිනිගත්ත යකඩ වැටක් වගේ කියලා කියන්නේ, **ලෝකයා තමන්ගේ කෙළෙස් නිසා ලෝකය උපද්දවාගෙන දුක් විඳින සිද්ධියක් පෙනෙන්නේ.** ලෝකයා මොනතරම් අසරණද කියලා පෙනෙන්නේ, ලෝකය කියන්නේ දුක කියලා පෙනෙන්නේ.

අවිද්‍යාව තුළ හටගත්ත මේ සිද්ධියම දුකයි. ආයෙ ඕකෙ හොඳ නරක බෙදන්න දෙයක් නැහැ. උපදිනුයේ දුකම උපදිනවා, පවතිනුයේ දුකම පවතිනවා, නිරුද්ධ වනුයේ දුකම නිරුද්ධ වෙනවා කියලා පෙනෙනවා.

එදාට දුකේ කලකිරෙනවා, නොඇලෙනවා. දැන් මේ 'ඇති බවට සිහිකරනවා' කියන සිද්ධිය නොවෙන්නේ එදාටයි. නොඇලෙන කොට මිදෙනවා. මිදෙනවා කියන්නේ, අතීතය නිරුද්ධ වෙලා අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා, කියන තැනක ජීවිතය පවතිනවා. **නිරුද්ධ වුණු දේ ඇති බවට ගන්නවා කියන සිද්ධියත් අරගෙන යම්කිසි කෙනෙක් දුක් විඳිනවා කියන සිද්ධියෙනුත් තමන් මිදිලා. දැන් තමන් 'ලෝකයෙන් මිදිලා'.** මිදුණු ගමන්ම මිදුණා කියන නුවණ එනවා. ***විමුත්තස්ස විමුත්තමිති ඤාණං හොති*** මිදුණ ගමන්ම සියළු දුකෙන්ම මිදුණා, කළ යුත්ත කළා කියලා නුවණක් එනවා.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★

ඒ හින්දා මට ඕනේ කළේ ඔය පින්වතුන්ට නිවන කියලා 'අද ලෝකයා සංකල්පනා තුළ යන්න හදන නිවන එහෙම නෙවෙයි, සජීවීව දැකලා යන්න' කියන එක කියන්න.

අපි ඔක්කොම ඉන්නේ ප්‍රාර්ථනා තුළ හිරවෙලා. අපි හිතාගෙන ඉන්නවා මනෝමයෙන් මොකක් හරි නිවන කියලා එකක් තියෙනවා, මොකක් හරි හිස් බවක් වගේ එකක්, අපට ගිහිල්ලා නිවන දකින්න පුළුවන් වගේ එක එක තැන්වල සංකල්ප ආකල්ප තියෙන්නේ. සත්‍යය අවබෝධයක් කියනවා, සත්‍යය අවබෝධ කරගන්න හදනවා, නමුත් ආකල්ප සංකල්ප මත හෝ එහෙම නැත්නම් මනෝමයෙන් උපදවා ගත්ත විතර්ක මත යන්න පුළුවන්, සාක්ෂාත් කරන්න පුළුවන් ධර්මයක් නෙවෙයි. කොටින්ම කියනවා නම් 'ලෝකෙ තුළ දෙයක්' සමහර විටෙක ලැබෙන්න පුළුවන්, සමහර විටෙක නොලැබෙන්න පුළුවන්.

නමුත් මේ සත්‍යය කියන එක, සත්‍යය අනුව ගියොත්, සත්‍යය කියන එක සාක්ෂාත් වෙනවාමයි, කියන තැනකින් ඔච්චරමයි ඇත්ත, බොරුවක් නොවී තියෙන්නේ. **අතීතය නිරුද්ධ වෙලා, අනාගතය ඉපදිලා නැහැ, වර්තමානය හටගෙන නිරුද්ධ වෙනවා කියන මේකමයි ඇත්ත. එහෙනම් අපට හම්බ වෙන මේ මනස බොරු. එහෙනම් මේ ටික නිරුද්ධ කරන්න ඕනේ කියලා ප්‍රතිපදාව පිරුවොත්, මේ පින්වතුන් සත්‍යය තුළ ඉන්නේ නැති වෙයිද? ඉන්න බැරිද? මේ ජීවිතයෙම ඉන්න බැරිද? මරණින් පස්සෙද ඉන්නේ? එහෙනම් මේ ජීවිතයේ නිවන් දකින්න බැරිද?**

නිවන කිව්වේ මොකේටද? අර තුන් කාලය, පංච උපාදානස්කන්ධය කියලා 'මනෝමයෙන් උපද්දපු' සිද්ධිය. මනෝමයෙන් ඉපදුනේ මේ ඇත්ත තියෙන තැනට ජීවිතය පත් කරලා නැති බව. මේ ඇත්ත තියෙන තැනට ජීවිතය පත් කළොත්, බොරුව කියන එක උපදින්න තියෙන හේතුව නැහැ.

ධර්ම දේශනාව මම මීට වඩා දීර්ඝ කරන්නේ නැහැ. කියනවා නම්, පෙන්වනවා නම් මීටත් වඩා ගොඩාක් කරුණු තියෙනවා. එතකුදු වුවත් මට ඕනේ වුණේ විශේෂයෙන්ම මේ ලෝකයාට අනුකම්පාවෙන් මේ කාරණාව තේරුම් කරදෙන්න. දුවන්නම් වාලේ දුවන සමාජ රටාවකට අනුව ඔහේ ගතානුගතිකව දුවන්නේ නැතුව, කරන දේ කියන දේ විමසිලිවත්ව බලලා, ඇදහීමක් එපා. අපිට වැඩක් නැහැ, යම්කිසි කෙනෙක් බෙහෙතක් නම් ගේන්නේ, අපිත් රෝගී වෙලා නම් ඉන්නේ, ලෙඩෙක් නම්, ඒ ලෙඩේ සුවවෙන්න බෙහෙතක් ගේනවා නම්, ගේන්නේ පොඩි කෙනෙක්ද මහළු මනුස්සයෙක්ද, තරුණ මනුස්සයෙක්ද, කොරෙක්ද, අන්ධයෙක්ද, බිහිරෙක්ද අපිට ඒවා වැඩක් නැහැ. අපි මේ බෙහෙත් ටික අරගමු. **බෙහෙත් ටික ගත්තම අපි සුවපත් වෙනවා නම්, අපිට ඕනේ බෙහෙත් ටිකේ වටිනාකමනේ. ඒ නිසා තරාතිරම් බලන්නේ නැතුව මේ ධර්ම ඖෂධය හරියටම තේරුම් අරගෙන පානය කරන්න. හැබැයි බෙහෙත් යන සංඥාවෙන් 'මොනවා හරි' බිව්වට ලෙඩේ හොඳ වෙන්නේ නැහැ. ඒක නියම බෙහෙතම වෙන්න ඕනේ.**

ඒ නිසා මට හිතෙනවා ආකාර පරිවිතර්කයෙන්, ඇදහීමකින් නෙවෙයි විඥ්ඥ පුද්ගලයෙක් ඉන්නවා නම් හිතන්න පුළුවන්, තර්කයෙන්. අනුලෝම ක්‍ෂාන්තියකින් පෙන්නනවා, මෙන්න මේ පරියාය හැර වෙන වෙන්න එකක් නැහැ. මොකද **සත්‍යය අවබෝධ කරන්න තියෙන්නේ මෙහෙම එකකින් මිසක වෙන එකක් නැහැ. සත්‍යය අවබෝධය කියලා යමක් තියෙනවා නම් සත්‍යය අවබෝධ කරන්න කියන්නේ බොරුව තුළ ඉන්න කෙනාටයි. බොරුව කියන්නේ මොකක්ද, සත්‍යය කියන්නේ මොකක්ද, මෙන්න මේ දෙක වෙන් කරගන්න.**

මේ ජීවිතයේදීම මම හිතනවා දුක නිරුද්ධ කරගන්න පුළුවන් හැමෝටම කියලා. හරි මඟ පෙන්වීමක් තියෙනවා නම්, අපිත් ඒ සඳහා උත්සාහවත් වෙනවා නම්. අද මගෙ මේ දේශනාව ඒ සඳහා යම් පමණක හෝ උපකාරක ධර්මයක් වේවා! මේ අහිංසක ලෝකයා සංසාර දුකෙන් මිදෙත්වා ! ඒ සඳහා මේ ධර්ම දේශනාව හේතු උපනිශ්‍රය වේවා ! කියලා මෛත්‍රී සහගතව මතක් කරනවා.

බුදු දහමේ මූලික පදනම සිත පිරිසිදු කර ගැනීමයි

සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං ඒතං - බුද්ධානු සාසනංති

පින්වතුනි, අද අපිට නිර්භය වෙන්න පුළුවන් අවස්ථාවක් ලැබිලා තියෙනවා. මනුස්ස ජීවිතයක් ලැබිලා තියෙන මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න, උත්සහවත් වෙන්න. මේ දුවන්නන් වාලේ දුවන සමාජ රටාවට එකතු වෙලා දුවන්න එපා. මනුස්සයෝ විතරක් නෙවෙයි. මේ තිරිසන්ගත සත්තුත් කෑම කනවා, ආහාර පාන ටික කොහොම හරි හොයාගන්නවා. වර්ගයා බෝ කිරීමට තමන්ගේ පැවැත්ම කොහොම හරි හදාගන්නවා. බයක් ඇති වුණාහම දුවලා පැනලා කොහොම හරි බේරෙනවා. නිදාගන්න තැනක් ඕන වුණාහම ගහක් මුලක වුණත් කොහොම හරි නිදාගන්නවා.

ඉතින් ධර්මයේ පෙන්වන්නේ මනුස්සයයි තිරිසනයි මේ කාරණා හතරෙන් සමානයි. මනුස්සයෙකුගෙ වෙනස නම් ධර්මයකින් යුක්ත වීමයි. ධර්මයෙන් හීන කෙනා, ධර්මයේ නැති කෙනා අර කාරණා හතරට විතරයි සමාන වෙන්නෙ.

ඒ නිසා මේ බුද්ධෝත්පාද කාලයේ මනුස්ස ජීවිතය ලැබුණු වෙලාවෙ තමන්ගේ පිහිට, තමන්ගේ සරණ තමන්ම ඇති කරගන්න කියන එකත් මතක් කරනවා. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන්න මොහොතකට කලින්, නොබෝ දිනකට කලින් ලෝකෙට අවවාදයක් කරනවා. මොකක්ද? ***අත්ත දීපා භික්ඛවේ අත්ත සරණා අනඤ්ඤ සරණා, ධම්ම දීපා භික්ඛවෙ, ධම්මා සරණා අනඤ්ඤ සරණා*** 'මහණෙනි, තමන් තමන්ට පිහිටක් කොට තමන් තමන්ට ආලෝකයක් කොට වාසය කරගන්න. ධර්මය පිහිටක් කොට වාසය කරන්න. වෙන පිහිටක් වෙන සරණක් නැහැ' කියලා.

එකට ඉන්න කොට අපිට හිතෙන්නෙ, අපිට පිහිට පිණිස අපට සරණ පිණිස ගොඩක් අය ඉන්නවා, දෙමව්පියෝ, සහෝදරයෝ, ඥාතී හිතෛෂීන්, දූ දරුවෝ කියලා. නමුත් ගොඩාක් අයත් ඕනෙ නැහැ, බඩේ කැක්කුමක් ඔළුවෙ කැක්කුමක් හැදුනම බලන්න ළඟම ඉන්න පුතාට කතා කරලා පුතේ මේකෙන් කොටසක් ගන්නකො කියලා, කියන්න පුළුවන්ද? බැහැ. තම තමන්ටම විඳින්න වෙනවා. ඒ නිසා මේ සසරෙ ස්වභාවය සිහිපත් කරලා, මේ දුක් සහගත සසරෙන් කොහොම හරි එතෙර වෙන්න ඕනෙ කියන ධර්මඥාණය ඇති කරගන්න, හැම කෙනාම උත්සහවත් වෙන්නට ඕනෙ. ඉතින් ඒ සඳහා ධර්මයේ යම් මට්ටමක් තේරුම් කරගන්න පුළුවන් වෙන ගාථාවක් තමයි මම අද දවසෙදි මාතෘකා කළේ. බොහොම සරලයි මේක. ඒ ටික තේරුම් ගත්තොත් අපේ ජීවිතයේ මුල් කොටස හදාගන්න හරි වටිනවා. ඒ ටික හදාගත්ත කෙනෙකුටයි ඊට වඩා වැඩිතර දහමක් ඔරොත්තු දෙන්නෙ.

පින්වතුනි, බුදුරජාණන් වහන්සේලා දේශනා කරනවා

සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උප සම්පදා සචිත්ත පරියෝදපනං - ඒතං බුද්ධානු සාසනං

අපේ බුදුරජාණන් වහන්සේට විතරක් නෙවෙයි, අතීතයේ වැඩ සිටියාවූ හැම බුදුරජාණන් වහන්සේලාගේත් අනාගතයේ ලෝකයේ පහළ වන්නාවූ සියළුම බුදුරජාණන් වහන්සේලාගේත්, ලෝකයට කරන අවවාදය, අනුශාසනාව තමයි, ***සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා සචිත්ත පරියෝදපනං*** - **සියළු පව් කරන්න එපා. කුසල ධර්ම කරන්න. සිත පිරිසිදු කරගන්න.**

ඔන්න ඔය ටික විතරයි. බුදුරජාණන් වහන්සේලා දේශනා කරන්නෙ. ඔය ටිකේ තියෙනවා පින්වතුනි, අසූ හාරදහසක් ධර්මස්කන්ධය. යම් දවසක බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත් වුණාද, යම් දවසක අනුපදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන්පා වදාළද ඒ අතර තුර යමක් ලෝකයාගේ හිතසුව පිණිස දේශනා කළා නම් පැනෙව්වා නම් පිහිටෙව්වා නම් ඒ සියලුම වචනවල අර්ථය, ඒ සියලුම දේශනාවන් වල අර්ථය, මෙන්න මේ පේලි තුනේ තියෙනවා. පව් කරන්න එපා, කුසල ධර්ම කරන්න, සිත පිරිසිදු කරගන්න, කියලා.

ඇයි බුදුරජාණන් වහන්සේලා ලෝකයාට ඔය විදියට අවවාද කරන්නෙ, ඔය විදියට අනුශාසනා කරන්නෙ. පින්වතුනී, අපි පුද්ගලභාවයක් පැවැත්වුවට මේ මම, මේ මගෙ අම්මා, අප්පච්චි, මේ මගෙ දුවා පුතා, කියලා අපි සත්ව පුද්ගල සංඥාවක් ඇති කරගෙන තිබුණාට ඇති කරගත්තට මේ ලෝකයේ පවතින යථාභූත ස්වභාවයක්

තියෙනවා. අපි කෙනා කෙනා දන්න විදියට නෙවෙයි. ලෝකයේ පවතින සැබෑම සිද්ධාන්තයක් තියෙනවා. ඉතින් බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්වුණා කියලා කියන්නෙ වෙන මොකුත් වුණා නෙවෙයි, මේ ලෝකයේ පවතින සැබෑව, සැබෑම විදියට අවබෝධ කරගත්තා. එදා සම්මා සම්බුද්ධත්වයට පත්වුණා කියලා කියන්නෙ, මේ ලෝක ධාතුවේ තියෙන සවිඤ්ඤාණක අවිඤ්ඤාණක, සිත් ඇති නැති, මේ හැම දෙයක් තුලම තියෙන ඇත්ත ඇති සැටි අවබෝධ කරගත්තා නුවණට.

මොකක්ද බුදුරජාණන් වහන්සේ අවබෝධ කරගත්ත ඇත්ත? ඒ තමයි 'පටිච්ච සමුප්පාද ස්වභාවය' - හේතුඵල දහම. මෙන්න මේ පටිච්ච සමුප්පාද ධර්මයට හේතුඵල දහමට තථාගතයාණන් වහන්සේගේ නුවණ තියෙන හින්දයි, අකුසල් කරන්න එපා, කුසල් කරන්න, සිත පිරිසිදු කරගන්න කියන දේශනාව, දේශනා කරන්නෙ. ඇයි ඒ? මේ සත්ව පුද්ගලභාවය පවත්වන ජීවිත තුළත් එයින් පරිබාහිර වස්තූන් තුලත් පවතින්නෙ එකම යථාර්තයක් කියලා දැක්කා. ඒ හේතු ඵල දහම නැමැති ඒකත්වය තුළ ධාතු නානත්වය නැමැති නානත්වයකුත් තියෙනවා, කියලා දැක්කා. ඒ නානත්වය තුළ හේතුඵල දහම නැමැති ඒකත්වයකුත් තියෙනවා කියලා දැක්කා. ඒකත්වය තුළ නානත්වයකුත්, නානත්වය තුළ ඒකත්වයකුත්, දැකපු නිසා බුදුරජාණන් වහන්සේ මේ විදියට අවවාද අනුශාසනා කරනවා. ඒක අපිට තේරෙන විදියකට අපි පොඩ්ඩක් නුවණින් බලමු. හේතුඵල දහම ගැන තථාගතයන් වහන්සේගේ නුවණ පවතින්නෙ කොහොමද? මොකක්ද හේතුඵල දහම කියන්නෙ කියලා.

යම් ධර්මයකින් යම් ධර්මයක් උපදීනම්, යමක් උපද්දවන දේට කියනවා හේතුව කියලා. යමකින් යමක් උපදීනම් උපදින දේට කියනවා, ඵලය කියලා. අපි කියමු කොහොඹ ඇටයක් වගේ දෙයක් ගන්න. මේ කොහොඹ ඇටේට කියනවා, හේතුව කියලා. කොහොඹ ඇටේ නිසා කොහොඹ ගහක් කොහොඹ ගෙඩි හැදෙනවා නම් මේකට කියනවා, ඵලයක් කියලා. එතකොට කොහොඹ ඇටේ හේතුව, කොහොඹ ගහ කොහොඹ ගෙඩි ඵලය. මේ හේතුව නිසා මේ ඵලය. ඒ වගේම මිහිරිවූ මී අඹ ඇටයක් ගන්න. මී අඹ ඇටයට කියනවා හේතුව කියලා. ඒ නිසා මී අඹ ගහක් හැදෙනවා නම් ගහේ ගෙඩි හැදෙනවා නම් ඒකට කියනවා ඵලය කියලා. හේතුව සහ ඵලය. දැන් මෙතන හේතුඵල දහම නැමැති ඒකත්වයක් තියෙනවා. නමුත් මෙතන බීජ නානත්වයත් තියෙනවා. අපි දැක්කා, කොහොඹ කියන දේ බලන්න. හැම වෙලාවෙම අමිහිරිවූ අමිහිරි ස්වභාවයෙන් යුක්ත කටුක රසයක් ඒ තුළ තියෙන්නෙ. අමිහිරිවූ අමිහිරි ස්වභාවයෙන් යුක්ත කටුක ස්වභාවයෙන් යුක්ත කොහොඹ ඇටයක් හිටෙව්වොත් අමිහිරිවූ අමිහිරි ඵලයක් ලෙසට හැදෙනවා මිසක, ඒ කොහොඹ ඇටයෙන් මී අඹ එහෙම හැදෙන්නෙ නැහැ. හේතුඵල දහම වුණාට මේ බීජය වෙනස් වෙන්නෙ නැහැ. කොහොඹ ඇටේකට හැදෙන ඵලය කොහොඹ ගහ, කොහොඹ

ගෙඩි ඒකත් අම්හිරිමයි. බැරි වෙලාවත් කොහොඹ ඇටේකින් මී අඹ එහෙම හැදිලා තියෙනවද? නැහැ. හේතුඵල දහම.

ඊට පස්සෙ මී අඹ ඇටයක් හිටෙව්වොත් මිහිරිවූ මිහිරි ස්වභාවයෙන් යුක්ත ඵල උපදවන හේතුවක්. ඒ හේතුව නිසා ගහක් හැදිලා ඒ ගහේ යම් ගෙඩියක් හැදුනොත් ඒ ගෙඩිය මිහිරිවූ මිහිරි ස්වභාවයෙන් යුක්තමමයි. කවදාවත් මී අඹ ඇටයක් හිටෙව්වහම කොහොඹ ගහක් කොහොඹ ගෙඩි හැදෙන්නෙ නැහැ. මී අඹ ඇටේ හේතුව, මී අඹ ගහ මී අඹ ගෙඩි, ඵලය. කොහොඹ ඇටේ හේතුව, කොහොඹ ගහ කොහොඹ ගෙඩි, ඵලය. හේතුඵල දහම තමයි දෙකම. නමුත් බීජ නානත්වයක් තියෙනවා වෙනස් වෙන්නෙ නැහැ. මිහිරි හේතුවක් නිසා හටගන්න ඵලය කවදාවත් අම්හිරි වෙන්නෙ නැහැ. මිහිරිමයි කියලා න්‍යායක් තියෙයි. අම්හිරි හේතුව නිසා හටගන්න ඵලය අම්හිරිමයි, ඒක මිහිරි වෙන්නෙ නැහැ කියලා ධර්ම නියාමයක් තියෙයි. ඒක වෙනස් වෙන්නෙ නැහැ. ඒ ධර්ම ධාතුව බුදුරජාණන් වහන්සේ හොඳටම දැක්කා, බාහිර භෞතික වස්තූන්ගෙන් ඔය උපමාවෙන් පෙන්වනවා වගේ. **සත්ව පුද්ගලභාවයක් අපි පැවැත්වුවට අපගේ ජීවිත තුළත් පවතින්නෙ හේතුඵල දහමක් කියලා දැක්කා.** පුද්ගලභාවයක් පවත්වන අපේ ජීවිත තුළ පවතින යථාර්තය තමයි හේතුඵල දහම.

එතනදි අම්හිරිවූ අම්හිරි ස්වභාවයෙන් යුක්ත වූ කටුක ඵල උපදවන කොහොඹ බීජය වගේ දැක්කා, කෙනෙකුගෙ ජීවිතයට අයහපත ගෙනත් දෙන දුක ගෙනත් දෙන ශෝකය පරිදේවය ගෙනත් දෙන හාත්පස දැවිල්ල වෙහෙස නැමැති දුක නැමැති අම්හිරි ඵල ගෙනත් දෙන, බීජ හැටියට දැක්කා මොකක්ද, පව් කියන ටික, අකුසල් කියන ටික. පස්පව් තියෙනවනම් කාය දුෂ්චරිත, වාග් දුෂ්චරිත, මනෝ දුෂ්චරිත ආදී ත්‍රිවිධ දුෂ්චරිත තියෙනවනම්, දස අකුසල කර්ම පථයන් තියෙනවනම්, මෙන්න මේවා දැක්කා බුදුරජාණන් වහන්සේ මොනවා හැටියටද, බීජ හැටියට, හේතු හැටියට, කර්ම හැටියට. මොනවට බීජද, මොනවට හේතුද? අම්හිරිවූ අම්හිරි ස්වභාවයෙන් යුක්ත ඵල උපදවන බීජ කියලා දැක්කා. කොහොඹ ඇටයක් හිටවලා කවදාවත් මී අඹ ලැබෙන්නෙ නැහැ වගේ, මේ පව් නැමැති හේතු කළොත් රැස් කළොත් හදා ගත්තොත් කවදාවත් මිහිරි විපාකයක් නම් ලැබෙන්නෙ නැහැ, ලැබෙන විපාකය අම්හිරිමයි කියලා දැක්කා.

ඒ දැකලා ලෝකයාගේ දුක දැකලා අනුකම්පාවෙන් කරුණාවෙන් සිසිල් වුණු හදවතක් ඇති බුදුරජාණන් වහන්සේ කරුණාවෙන් ලෝකයාට ප්‍රකාශ කරනවා, ***සබ්බ පාපස්ස අකරණං*** කියලා. ඒ කියන්නේ, අම්හිරිවූ, අම්හිරි ස්වභාවයෙන් යුක්ත ඵල උපදවන බීජ හදාගන්න එපා කියන අදහසයි ඒකෙන් කියන්නේ. පින්වතුනි, අපි ප්‍රේතයෝ, අසුරයෝ, නිරිසත්තු, තිරිසන්ගත සත්වයෝ, කියලා සතර අපායක් ගැන කතා කළාට

සත්වභාවයෙන්, එතැන තියෙන්නේ ඵලයක්. අකුසල කර්ම නැමති බීජ හදාගත්ත එකක ඵලයක් තමයි සතර අපාය කියන්නේ. සතර අපායේ විපාක හදාගන්න එපා කියන අදහසිනුයි මේ ***සබ්බ පාපස්ස අකරණං*** කියන ගාථාවෙන් අවවාද අනුශාසනා කරන්නේ.

එතකොට මේ හේතුඵල දහම පුද්ගලයෙකුට, සත්වයෙකුට, අයිති සත්ව පුද්ගලභාවයට යටත්ව පවතින ධර්මතාවයක් එහෙම නෙවෙයි. සත්ව පුද්ගල ක්‍රියාකාරකම් වලින් වෙනස් කරන්න පුළුවන් ධර්මතාවයක් එහෙම නෙවෙයි. ඒක පවතින යථා ස්වභාවය, ඇත්ත. එතකොට ඒ ධර්මතාවයේ ස්වභාවය තමයි ස්වභාවික සිද්ධියක්.

අපි කියමු කොහොඹ ඇටයක් තෙතමනය ඇති පස් ඇති තැනක, යට කළොත් කොහොඹ ඇටයක් නරක් වෙලා කුණු වෙලා නැත්නම්, දැන් එහෙම තැනක හිටවලා වැඳගෙන අපි ප්‍රාර්ථනා කළොත් 'පැලවෙන්න එපා, පැලවෙන්න එපා' කියලා, පැල නොවී තියෙයිද? පැලවෙනවා. අනාත්මයි කියන්නේ ඒකයි. ඒක කියලා, ප්‍රාර්ථනා කරන්න පුළුවන් එකක් නෙවෙයි. ඒ වගේ අකුසල කර්ම නැමැති බීජ රැස් වෙලානම් තියෙන්නේ, මේකෙ විපාක අපිට ලැබෙන්න එපා කියලා ප්‍රාර්ථනා කළත් හරියන්නේ නැහැ. නොලැබී තියෙන්නේ නැහැ. අනාත්මයි කියන්නේ ඒකයි. හේතුව සකස් වෙලා නම් තියෙන්නේ ඵලයක් උපදිනවා කියන එක නතර කරන්න බැහැ. අන්න ඒ බව දැකපු නිසයි ***සබ්බ පාපස්ස අකරණං*** කියලා දේශනා කළේ.

ඊට පස්සේ මිහිරිවූ, මිහිරි ස්වභාවයෙන් යුක්ත හේතුවක් නිසා හටගන්න ඵලය අම්හිරි නැහැ කියලා බුදුරජාණන් වහන්සේ දැක්කා. ලෝකයාගේ සැපයේ ඊර්ෂ්‍යා නොකරන මුදිතා ගුණය බුදුරජාණන් වහන්සේ ළඟ තියෙන නිසා ලෝකයාගේ සැපයේ සතුටු වන, සැප ප්‍රාර්ථනා කරන ගතිය මුදිතා ගතිය බුදුරජාණන් වහන්සේ ළඟ තියෙන නිසා, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ***කුසලස්ස උපසම්පදා*** කියලා.

පින්වතුනි, කුසල් කියලා කියන්නේ, කාය සුචරිත, වාග් සුචරිත, මනෝ සුචරිත, දස කුසල කර්ම පථය, දාන සීල භාවනා කියන සියළු පුණ්‍ය ක්‍රියා වස්තු මේවා කුසල්. මේ කුසල් කියන්නේ මොනවද, මේවා බීජ, හේතු. මොනවට බීජද, මොනවට හේතුද? මිහිරිවූ මිහිරි ස්වභාවයෙන් යුක්ත ඵල උපදන හේතු. අපි මනුස්සයෝ කියලා මනුස්ස ආත්ම භාවයක් ගැන කතා කළාට, දෙවියො කියලා දෙවියො ගැන, බ්‍රහ්මයෝ කියලා බ්‍රහ්මයෝ ගැන කතා කළාට පින්වතුනි, එහි යථාර්ත වශයෙන් පවතින්නේ ඵලයක්. මේ තත්වයට, මේ මට්ටමට අපිව පත්කළේ කුසල කර්මයයි. කුසල කර්මය නොතිබුණෝ නම් ඔය පින්වතුන් හිතනවද ඇහැ කියලා එකක් තියෙයි කියලා. කන, දිව, නාසය, ශරීරය කියලා එකක් තියෙයි කියලා. ඔය පින්වතුන්ට මේ වගේ අත පය හතරක් තියෙයි කියලා හිතනවද කුසල

කර්මයක් කියලා එකක් නැත්නම්. ඔය පින්වතුන්ගේ අම්මට තාත්තට හදන්න පුළුවන් වෙයි කියලා හිතනවද, ඇහැ, කන, දිව, නාසය, අතපය. එහෙම නම් ඇස් නැති, අත පය නැති දරුවෝ හදන්න අම්මලා තාත්තලා කව්රුවත් කැමති වෙනවද? සමහර අම්මලා තාත්තලාගෙ දරුවන්ගේ අත පහ නැහැ උපතින්ම. මොකද අම්මලා තාත්තලාට හදන්න පුළුවන් නම් කොයි අම්මා තාත්තාද කැමති වෙන්නේ දරුවන්ගේ ඇඟ පත අඩුවෙන් හදන්න. නමුත් හොඳට දකින්න තමන්ගේ කර්මයයි තම තමන්ව හදන්නේ. **ඒක අපිට තේරෙන්නේ නැහැ. ඒක ආත්ම කරගන්න විතරයි අපි දන්නේ. නමුත් අපි ආත්ම වශයෙන් ගත්තට මේ ටික ඔක්කොම හැදිලා තියෙන්නේ කර්මය නැමැති නෑදෑයාගෙන්.**

කම්මස්ස කෝම්හි කම්ම යෝනි, කම්ම බන්ධූ, කම්ම පටිසරණා, යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා, පාපකං වා තස්ස දායාදෝ භවිස්සාමීති. අභින්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසේන වා, ගහට්ඨේන වා, පබ්බජිතේන වා - බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා 'මම කර්මය උප්පත්ති කොට, කර්මය නෑදෑයා කොට, කර්මය පිහිට කොට කර්මය පිළිසරණ කොට ඉන්න කෙනෙක් නේද' කියලා, හැම වෙලාවෙම ස්ත්‍රියෙක් වේවා, පුරුෂයෙක් වේවා, ගිහි ගෙදරක ඉන්න කෙනෙක් වේවා, පැවිද්දෙක් වේවා නිතර මෙනෙහි කරලා බලන්න කියෙනවා. **අපිට ඉන්න එකම නෑදෑයා, එකම පිහිට, එකම පිළිසරණය කර්මය. ඒ නිසා හොඳට බලන්න, අපි ලබපු මේ ජීවිතය ඵලයක්, කුසල කර්ම නැමැති හේතුවක ඵලයක්.**

ඉතින් මනුස්සයෙක්, දෙවියෙක්, බ්‍රහ්මයෙක් කියලා කියන්නේ කුසල කර්මයක ඵලයක්. බුදුරජාණන් වහන්සේ දැක්කා මිහිරිවූ, මිහිරි ස්වභාවයෙන් යුක්ත වූ හේතුව, අමිහිරි ඵල උපදින්නේ නැහැ. උපදින ඵලය මිහිරියි. ඒ වගේ කුසල ධර්මයන්ට කවදාවත් සතර අපායේ දුක් විඳින්න වෙන්නේ නැහැ. මනුස්ස ආත්ම භාවයක් බ්‍රහ්ම ලෝකෙ උප්පත්තියක්, දිව්‍ය සම්පත්තියක් ලැබෙනවා මිසක, ඒ නිසා ***කුසලස්ස උප සම්පදා*** කියන කාරණාවෙන් පෙන්නුවේ, මිහිරි වූ මිහිරි ස්වභාවයෙන් යුක්ත ඵල උපදවන හේතු හදාගන්න, හදාගෙන සැපවත් ජීවිතයක් ලබාගන්න, සැපවත් ඵලයක් උපදවා ගන්න. ඒ ඵලය භුක්ති විඳින කෙනාට ඒක අමිහිරි වෙන්නේ නැහැ.

මොකද පොඩි ළමයෙක්, අපි කියමු අඹ ඇටයක් හිටවනවා, මේක පැලවෙයිද නැද්ද කියලවත් දන්නේ නැහැ. එයා දැන ගත්තත්, නොදැන ගත්තත් ඒ අඹ ඇටය පොළවේ යට කළොත් තෙතමනය, පස් තියෙනවානම් පැල වෙනවනේ, නේද? **යම් කිසි කෙනෙක් මේක හොඳ විපාකයක්ද, මේකෙන් හොඳ විපාකයක් ලැබෙයි නේද? කියලා දන්නේ නැතුව වුණත් හොඳ දෙයක් කළොත් එයාට යහපත් දේ ලැබෙනවාමයි.** මොකද ඒ බීජය

යහපත් නිසා. බීජය කියන එක මිහිරි එකක් නම් හටගන්න ඵලය අමිහිරි වෙන්න බැහැ. ඒ බව දැකපු නිසා ***කුසලස්ස උපසම්පදා*** කියලා දේශනා කළා, අනුශාසනා කළා.

තව කාරණාවක් තියෙනවා, මේ ලෝකයේ ස්වභාවය තමයි, හේතුව ටිකයි, ඵලය බොහෝ වෙනවා. වී වපුරන කොට එක වී ඇටයක් තමයි අපි කුඹුරට දාන්නේ. ඒක ගහක් වෙලා කරල් හැදෙන කොට ඒ වී ඇටයෙන් හටගන්න කරලේ වී ඇට කොච්චරක් තියෙයිද? සෑහෙන ප්‍රමාණයක් තියෙනවා නේ. හේතුව ටිකක් වුණාට ඵලය බොහෝ වෙනවා. එක පේර ඇටයක් හිටෙව්වොත් ඒකෙන් එක පේර ගහක් හැදෙයි. ඒ ගහේ ගෙඩි හැදෙන කොට ගෙඩි කියක් හැදෙයිද? ගෙඩියක් ඇතුළෙ පේර ඇට කොච්චර හැදෙයිද? එක ඇටය ඵල දරන කොට බොහෝ වෙනවා. **ඒ වගේ අකුසලය ටිකක්, වෙන්න පුළුවන්. ඒක ඵල දරන කොට එක ආත්ම භාවයකින් එක ජීවිතයකින් නතර වෙන්නෙ නැහැ කියලා දැක්කා.** ඒ හින්දා ***සබ්බ පාපස්ස අකරණං*** කියලා පෙන්නුවා.

කුසල කර්මයත් එහෙමයි. කුසල කර්මය චූටි එකක්, හොඳ දෙයක් එකක් වෙන්න පුළුවන්. ඒක ඵල දරන කොට ආත්ම සීයයි, දාහයි, ලක්‍ෂයයි, කෝටියයි කියලා හිතන්නවත් බැහැ. දැන් ඔය සාංඝික දාන පූජා කරන කොට ඔය පින්වතුන් අහලා ඇති ***අසංඛෙය්‍යං අප්පමෙය්‍යං වදාමි*** කියලා වචනයක් කියනවා. ස්වාමීන් වහන්සේ. ***අසංඛෙය්‍යං අප්පමෙය්‍යං*** සංඛ්‍යාවක්, ප්‍රමාණ කරන්න බැහැ කියනවා. සාංඝික දානයක ආනිසංස පක්‍ෂය, සංඛ්‍යාවක් කියන්න බැහැ කියනවා. ආත්ම සියයයි නුඹට යහපත ලැබෙන්නේ, දාහයි, ලක්‍ෂයයි, කෝටියයි එහෙම සීමා කරන්න බැහැ කියනවා. එච්චරට ප්‍රමාණ කරන්න බැරි ආනිසංසයක් ලැබෙනවා, ඒ නිසා ඒ බව දැකපු නිසයි බුදුරජාණන් වහන්සේ ***කුසලස්ස උපසම්පදා*** කියලා දේශනා කළේ. ***සබ්බ පාපස්ස අකරණං*** කියන කාරණාවෙන් සතර අපායට යන්න තියෙන පාර වහලා, තිරිසන්ගත මනසක් හදාගන්න තියෙන හේතු වහලා, ***කුසලස්ස උපසම්පදා*** කියන කාරණාවේ පිහිටලා අපිව මනුස්සයෙක් දෙවියෙක් බවට පත් කළා. එබඳු මානසික මට්ටමක් හදනවා. ලෝකය තුළ යහපතක් හදනවා. මනුස්සයෙකුට තමයි ඊට වැඩියමක් පුළුවන්. දෙවියෙකුට තමයි ඊට වැඩි යමක් පුළුවන්.

බුදුරජාණන් වහන්සේ එබඳු මානසික මට්ටමක් තියෙන කෙනාට ***සචිත්ත පරියෝදපනං*** කියලා පෙන්වනවා, තමන්ගේ හිතත් පිරිසිදු කරගන්න කියලා. මොකද යහපතට මනුස්සයෙක් වුණත් දෙවියෙක් වුණත් පින්වතුනි, ඒ ජීවිතයත් ස්ථාවර නැහැ. මනුස්ස ලෝකය ඉපදෙනවා කියන්නේ, දිව්‍ය ආත්මභාවයක් ලැබෙනවා කියන්නේ, මුදලක්

අරගෙන ලොකු තරුපහේ හෝටලයකට ගියා වගේ. ඒ මුදල අතේ තියෙනකල් ඉන්න පුළුවන්. මාස ගණනක්, අවුරුදු ගණනක් හිටියත් එක දවසක් ණයට එහෙම ඉන්න දෙයිද කියලා බලන්න, බැහැ. යන්න කියනවා. ඒ වගේ මනුස්ස ලෝකයේ පින් නැමැති මුදල් අරගෙන ආවහම ඒක ඉවර වුණාහම ණයට ඉන්න බැහැ. යන්න වෙනවා. දිව්‍ය ලෝකයට පින් නැමැති මුදල් අරගෙන එහෙට ගියහම ඒක ඉවර වුණාහම ඉන්න බැහැ. යන්න වෙනවා. ඉතින් ආපහු ජරා, මරණ, දුකට වැටෙන්න තියෙන හේතුව තියෙනවා. මෙබඳු වූ කුසල කර්මයකට විපාක හැටියට ඉපදිලා මේ තරම් යහපතක් කරගත්ත කෙනා ආපහු පහළට මොන විදියෙකින් වත් වැටෙන්නේ නැතුව, ඉහළින් ඉහළටම යන විදිහට, මේ සංසාර සාගරයෙන් එතෙර වෙන, ජරා, මරණ, සංඛ්‍යාත දුකෙන් එතෙර වෙන සද්ධර්මය ලබාගන්න උත්සාහවත් වෙන්න, කියන අදහසින් සියළුම දුකින් නිදහස් වෙන්න කටයුතු කරගන්න කියන අදහසින් 'සිත පිරිසිදු කරගන්න' කියලා බුදුරජාණන් වහන්සේ අවවාද කරනවා. අනුශාසනා කරනවා.

මොකද සිත පිරිසිදු කරගත්ත කෙනාට විතරයි කර්ම රැස් නොවෙන්නේ. අවිද්‍යාව කියන කාරණාව නැත්තේ. අවිද්‍යාව තමයි නීවරණයන්ගෙන් කෙළවරම නීවරණය. අවිද්‍යාව නීවරණයක් කොට පැනෙව්වහම, අපි කියමු පංච නීවරණ ධර්මයන් කියලා, නීවරණ ධර්ම පහක් තියෙයි. ඔය පහ ආවරණය වෙන්නේ කාම ලෝකයට විතරයි. අවිද්‍යාව නීවරණයක් කොට බුදුරජාණන් වහන්සේ ඊට පස්සේ පනවනවා, ඒ කියන්නේ භවත්‍රයේ කෙළවර දක්වාම මේක ආවරණයක් වෙලා තියෙනවා. ඔය අවිද්‍යාව නැමති නීවරණයෙන් මිදෙන්න තියෙන එකම දේ තමයි හිත පිරිසිදු කරගන්න එක.

ඒ හිත පිරිසිදු කරගන්න එක ක්‍රම දෙකකට තියෙනවා. චිත්ත සමථයක් වඩලා ඖදාරික මට්ටමේ නීවරණ දුරු කරගන්න එකත්, විදර්ශනා භාවනාවකින් අනුශය දුරුකරලා, අවිද්‍යා නීවරණයෙන් මිදෙන එකත් කියන ක්‍රම දෙකක් තියෙයි. එතැනදි සීලයක පිහිටලා යම් කිසි කෙනෙකුට නිතර බුදුගුණ මෙනෙහි කරන්න පුළුවන් නම්, ආනාපාන සතිය වගේ භාවනාවක් වඩන්න පුළුවන් නම්, ඒ වගේම මරණානුස්සතිය, අසුභානුස්සතිය වගේ භාවනාවක් ටික ටික හරි කරන්න පුළුවන් නම් එක ශේෂයක් හරි ටික ටික හරි තමන්ගේ සිතේ තියෙන කෙළෙස් මල දුරු වෙලා සිත පිරිසිදු වෙනවා. ඒ පිරිසිදු වෙන මට්ටමට එයාට රැකවරණයක් තියෙනවා. ඔන්න රළු මට්ටමේ මලකඩ ටික හූරලා දාල හිත පිරිසිදු කරගන්නවා ඔය ක්‍රමයෙන්. ඊට පස්සේ ඉතාමත් සියුම් මට්ටමේ සිතේ අපිරිසිදු බවක් ආවරණීය ධර්මයක් තියෙනවා. ඒ ටික දුරුවෙන්නේ ලෝකෝත්තර මාර්ගයකින්ම විතරයි. හිත පිරිසිදු කරගන්න කෙළවරම එක තමයි, අනුශය කියන ධර්මතාවය දුරු කිරීමෙන් හිත පිරිසිදු කරගන්නවා. **අනුශය කියන ධර්මතාවය දුරු කරගන්න වෙන්නේ දුරු වෙන්නේ ලෝකෝත්තර සම්මා දිට්ඨියකට**. එතකොට ලෝකෝත්තර සම්මා දිට්ඨිය කියලා කියන්නේ

වෙන මොකුත් නෙවෙයි. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප. කියලා පෙන්වනවා. සම්මා දිට්ඨි කියලා කියන්නේ එතැනදි, මේ ලෝකයේ පවතින සැබෑම ස්වභාවයක් තියෙයි නම් ඒ සැබෑම ස්වභාවය ඒ ආකාරයෙන්ම දන්න දකින කමට කියනවා **සම්මා දිට්ඨි** කියලා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ***චක්ඛුං භික්ඛවේ ජානං පස්සං යථා භූතං තං සම්මා දිට්ඨි චක්ඛුං භික්ඛවේ ජානං පස්සං යථා භූතං*** ඇහේ ඇත්ත ඇති හැටියේ දන්නවා නම් දකිනවා නම් ***තං සම්මා දිට්ඨි*** ඒක සම්මා දිට්ඨියක්. ඒ සම්මා දිට්ඨියට අනුව යම් කල්පනාවක් තියෙනවා නම් ඒ 'සම්මා සංකප්ප'. ඒ දැක්මට අනුව යම් උත්සාහයක් තියනවා නම් ඒ 'සම්මා වායාම'. ඒ ඇහේ ඇත්ත ඇති හැටිය දකින්න යම් සිහියක් යොදයි නම් ඒ 'සම්මා සතිය'. ඇහැ කියන ධර්මතාවයේ ඇත්ත ඇති හැටියේ දකිනවා නම් ඒකට කියනවා 'සම්මා දිට්ඨිය'. ඇහේ ඇත්ත ඇති හැටිය දකින්න මෙනෙහි කරනවා නම් ඒකට කියනවා 'සම්මා සංකප්පය'. ඇහේ ඇත්ත හැටිය දකින්න යම් උත්සහයක් යොදනවා නම් ඒකට කියනවා 'සම්මා වායාම'. ඇහේ ඇත්ත ඇති හැටිය දකින්න යම් සිහියක් යෙදෙයි නම් ඒකට කියනවා 'සම්මා සති'. ඇහේ ඇත්ත ඇති හැටි දකින්න යම් චිත්ත සමථයක් උදව් කරයි නම් ඒකට කියනවා 'සම්මා සමාධි'. වාචා, කම්මන්ත, ආජීව කියන ධර්මතා තුනේ පිහිටලා ඉන්නවා කියලා. ඇහැ, පිරිසිඳ දකින්න උත්සාහවත් වෙන ඒ මොහොතේ 'ලෝකෝත්තර සම්මා දිට්ඨියම' උපදින හැටි බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළා.

එතකොට හොඳට බලන්න ලෝකෝතර සම්මා දිට්ඨිය කියන්නෙ, ඇහේ යථාභූත ස්වභාවය දකින්න ඕනේ. මොකක්ද මේ ඇහේ යථාභූත ස්වභාවය ඇයි දැන් තියෙන ඇහැ නෙවෙයිද, බුදුරජාණන් වහන්සේ ඔය කියන ඇහැ? ඇහැ, කන, දිව, නාසය, ශරීරය, හිත කියන ආධ්‍යාත්මික ආයතන හයම පෙන්වනවා. බාහිර ආයතනයත් පෙන්වනවා, රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම කියන බාහිර ආයතන හයත් පෙන්වනවා. ඒකෙදි ගොඩක් තියෙන නිසා, යම් ධර්මයක් මනා කොට අවබෝධ වීමෙන් හිත පිරිසිදු වෙලා අනුශය ධර්ම දුරුවෙලා මේ සසර ගමනම අවසන් වෙනවා නම්, එසේ වූ ධර්මතාවයක් ඇති කරන්න උපකාර වුණ මේ ආයතන ටික පිරිසිඳ දකින්න අපි මොහොතකට හරි උත්සහවත් වෙමු.

හතර ඉරියව්වක් පරිහරණය කරමින් ‘අනිත්‍ය, දුක්ඛ, අනාත්ම’ මෙනෙහි කළ හැකිද?

අද අපිට ඇහැ ගැන හම්බ වෙන මට්ටමට සාක්ෂි ඕනෙ නැහැනේ නේද? අපිට තියෙන්නේ, ඉපදුණු දවසෙ තමයි මේ ඇහැ උපන්නේ, ජීවත් වෙන තාක් ඒ ඇස්දෙක අපිට තියෙනවා, මරණෙන් පස්සෙ තමයි මේ ඇහැ අපිට නැති වෙන්නේ. ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින කියන හතර ඉරියව්වම පරිහරණය කරන අපිට, ඇහැ තියෙනවා කියන මානසික මට්ටමකුයි තියෙන්නේ. ඔන්න ඔය මට්ටමේ ඇහැක් තියෙන හින්දයි අපිට ඇහේ අනිත්‍ය කියන එක පෙනෙන්නේ නැත්තේ. ඔය මට්ටම කෙනෙකුට තියෙයි නම් ඕකට කියන්නේ ‘නිත්‍ය සංඥාව’ කියලා. ඔය මට්ටමේ මනස තියාගෙන ඇහැ අනිත්‍යයි කියලා මෙනෙහි කළාට, අනිත්‍ය කියන එක කවදාවත් දකින්න බැහැ, ඒක ‘අනිත්‍ය මනසිකාරයක්’ විතරයි. අපේ දැක්ම තියෙන්නේ ඇහැ නිත්‍යයි කියන එකකින්. නිත්‍යයි කියන දැක්මේ ඉඳගෙන අනිත්‍යයි කියන මනසිකාරය කළාට, අපේ ජීවිතයට විඳින්න වෙන්නේ නිත්‍යවූ ඇහැකින් විඳින සැප දුක් මිසක, ඊට එහා ඇහැ අනිත්‍යයි කියලා දැකලා තියෙන විරාග බවක් කවදාවත් ස්පර්ශ කරන්න ලැබෙන්නේ නැහැ.

ඒ කිව්වේ හැම දෙනාම බලන්න. ඉපදුණු දවසේ ඉඳලා මරණය දක්වාම එක ලෙසම ඇති ඇහැක් තියෙනවා වගේ හැඟීමක් තමයි අපට දැනෙන්නේ. ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින හතර ඉරියව්වම පරිහරණය කරන්නත් අපිට ඇහැක් තියෙනවා කියලා තේරෙනවා නම්, මෙන්න මේ මට්ටමට කියනවා ඇහේ ‘නිත්‍ය සංඥාවක්’ තියෙන්නේ කියලා. ඇහැ තියෙනවා කියන අදහසක් තියෙන්නේ. ඕක තමයි දැන් අපේ පැවැත්ම. මොනවා හරි ධර්මතාවයක් හම්බ වුණොත් ඔය මානසික මට්ටමට අනුව තමයි අපි ක්‍රියාත්මක වෙන්නේ. තියෙන ඇහැක් රකින්න හම්බ වෙන ප්‍රති උත්තර ටිකකින් තමයි අපි කටයුතු කරන්නේ. ඔය වගේ මානසික මට්ටමක පිහිටා ඉඳිමින්, ඇහැ අනිත්‍යයිනේ, ඇති වෙලා නැති වෙනවනේ, බිඳි බිඳි යනවනේ, හටගෙන නැති වෙනවනේ කියලා අපි කොච්චර මනසිකාරයක් කළත් ඒකෙදි අනිත්‍ය දකින්න බැහැ. අනිත්‍ය මනසිකාරයක් විතරයි.

මනසිකාරයේ ස්වභාවය, මෙනෙහි කිරීමේ ස්වභාවය, මෙනෙහි කිරීමෙන් පස්සේ අවසන් වෙනවා. ඒක අවසන් වුණු ගමන් ආයෙත් අපේ ජීවිතය පිහිටලා තියෙන්නේ කොතනද? ‘ඇහැ තියෙනවා’ කියන තැනකින්. ජීවිතයේ අපිට විඳින්න හම්බ වෙන්නේ, ඇහැක් තියෙනවා කියන තැනකින්. ඒ හින්දා අපිට හැම වෙලාවෙම ‘ඇහැ ආත්මයි ඇහැ

මගෙ වෙලා තියෙන්නේ’ මගෙ වුණු එක මම නෙවෙයි, මගේ නෙවෙයි, මගෙ ආත්මය නෙවෙයි කියන වචන කියලා අයින් කරන්න බැහැ. ජීවිතය වෙලා තියෙන්නේ ඇහැ. ඇහැ කියන්නේ ජීවිතය, ජීවිතය කියන්නේ ඇහැ, කියන තැනකින් පවතින්නේ. මේ මට්ටම ඇති වෙලා තියෙන හේතුව නැති කරන්නේ නැතුව, ඔය මට්ටම අපේ ජීවිතයට ඇහැ මේ විදියට ඇසුරුවෙලා තියෙන හේතුව මොකක්ද කියලා හොයලා ඒ හේතුව අයින් කරන්නේ නැතුව, හේතුව එහෙමම තියෙද්දි ඇහැ අනිත්‍යයි, දුකයි, අනාත්මයි කියන වචන කතා කෙරුවට හරියන්නේ නැහැ.

බඩේ තියෙන ආහාර ටික වැයවෙලා බඩගින්න හොඳටම හැදිලා තියෙන්නේ. දැන් ඒ හේතුව අයින් කරන්නේ නැතුව, තව ආහාර ටිකක් දෙන්නේ නැතුව, හේතුව අයින් කරන්නේ නැතුව, බඩගින්න කියන එක අනිත්‍යයි, මේක විපරිණාම වෙනවා, මොහොතක් මොහොතක් පාසා නැති වෙවී යනවා නේද කියලා හොඳට හිතුවා කියලා බඩගින්න නැති කරන්න පුළුවන්ද? ඇයි ඒ, ඒක ඇති වුණු හේතුව නැති කරන්නේ නැතුව වෙන ක්‍රමයක් මෙනෙහි කළා කියලා හරියන්නේ නැහැ. ඔය පින්වතුන් ඔහොම මෙනෙහි කරන්න ඕනෙත් නැහැ, කන්න දුන්නොත් බඩගින්න නැති වෙනවා කියන එක වෙයි. ඒ හේතුවටමයි අපි අනුග්‍රහය දක්වන්න ඕනේ, හේතුව ඇති කරන්න හෝ නැති කරන්න. ඒ වගේ ඇහැ ඇති බවට අපේ ජීවිතයේ ඇසුරු වෙලා තියෙන්නේ කුමන හේතුවක් නිසාද කියන කාරණාව හොයලා ඒ හේතුව අයින් කරන්න. ඇහැ අනිත්‍යයි කියන වචනෙ ඔය පින්වතුන් කියන්න ඕනෙත් නැහැ, උදේ ඉඳන් රෑ වෙනකල් ඇහැ ආත්මයි, ඇහැ නිත්‍යයි කියන වචනෙ කියන්න, ඒත් ඔය පින්වතුන්ගෙ ජීවිතය පිහිටලා තියෙයි ඇහැ අනිත්‍යයි කියන තැනකින්. ඒ හින්දා වචන ටිකකට විතරක් සීමා වෙන්න එපා.

ඔය ඇහැ වගේම කන, නාසය, දිව, ශරීරය කියන මේ ටිකත් සිත කියන මේ ධර්මතාවයත්, එකම විදියට ඉපදිලා මැරෙණ කල්ම, ඉපදීමෙන් හටගෙන මරණෙන් අවසන් වෙනවා කියන තැනකින් අපි ජීවත් වෙන්නේ. ඒ අතර තුර ගඟක් අතරක් නැතුව ගලනවා වගේ මේ ටික තියෙනවා කියලයි අපිට දැනෙන්නේ.

එතකොට ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින හතර ඉරියව්වක්ම පරිහරණය කරන අපිට මේ ඔක්කොම ටික තියෙනවා වගෙයි දැනෙන්නේ. එතකොට ගෙඩි පිටින්ම පුද්ගලයෙක්ව නිර්මාණය වීම පුදුමයක් එහෙම නෙවෙයි. මෙන්න මේ මට්ටම ඇහැ, කන, දිව, නාසය, ශරීරය, මනස කියන ධර්මතා ටික ඇති බවට අපේ ජීවිතයේ ඇසුරු වෙන්නේ කුමක් නිසාද කියන හේතුව හොයලා, ඒ හේතුව නැති නොකොට, බත් ටික වැයවුණ නිසා බඩගින්න ඇති වුණා කියලා තේරුම් ගෙන ආපහු කන්නෙ නැතුව බඩගින්න අනිත්‍යයි කියලා හිතුවට බඩගින්න නැති වෙන්නේ නැහැ වගේ, ඇහැ අනිත්‍යයි,

කන අනිත්‍යයි, නාසය, දිව, ශරීරය අනිත්‍යයි කියලා මෙනෙහි කළාට, හිතින් මේවා කෑලි කෑලි වලට කඩලා බැලුවට, අර බඩගින්න සියුම්ව කෑලි කෑලි වලට කඩලා බැලුවට බඩගින්න නැති වෙයිද? නැති වෙන්නෙ නැහැ. මොකද මේවා හිතේ කෑලි කෑලි වලට කඩලා බැලුවම නැති වෙන්න, ඇති වෙලා තියෙන්නේ අපි ඔය බලන තැන නෙවෙයි, වෙන ප්‍රත්‍යයකින්.

එතකොට මෙන්න මේ ඇහැ, කන, දිව, නාසය, ශරීරය, මනස කියන ආයතන ටික ඇත්ත ඇති හැටියෙ දකින්න නම්, ඔය 'නිත්‍ය සංඥාව' නැති වෙන්න නම්, මෙන්න මේ ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන ධර්මතා ටිකේ අපේ මනස එල්ලා සිටින්න ඕනෙ ලක්ෂණ ටිකක් බුදුරජාණන් වහන්සේ පෙන්වනවා. මෙන්න මේ ලක්ෂණ ටික, ගති ටික යම් දවසක අපේ මනස එල්ලා සිටියොත් විතරමමයි ඔන්න ඔය 'ඇති ඇහෙන්' අපි මිදෙන්නේ. ඇති කන, දිව, නාසය, ශරීරයෙන් මිදෙන්නේ. දැන් අපි මතක් කළේ ඔය අපිට ඇහැක් හම්බ වෙන මට්ටමනේ නේද? ඔය මට්ටමේදි තමයි අපිට හොඳට ගුටි කන්න පුළුවන්, බැනුම් අහන්න පුළුවන් ඇස් කන් ඇතුව ඉන්නේ අපි. බුදුරජාණන් වහන්සේ මේ ඇහැ ගැන පෙන්නලා තියෙන ටික බලමු.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★

ඔය පින්වතුන් දැනට මේ ලක්ෂණ ටික විතරක් තේරුම් කරගන්න. ඔය අර්ථයෙන් යුක්තව බණ අහනවා කියන්නේ මුලින් ඔය අර්ථ ටික පැහැදිලි කරගන්න ඕනේ. තාම මේ ධර්මය. පින්වතුන්ගේ ජීවිතයෙන්, ඔය වචනයක් වචනයක් ගානෙ තේරුම් ගත්තහම ධර්මයේ අර්ථය දන්නවා. එදාට **අත්ත මඤ්ඤාය ධම්ම මඤ්ඤාය ධම්මානුධම්ම පටිපන්නො හෝති.** එදාට දැන් ඔය පින්වතුන් සුදුසුයි භාවනා කරන්න. ඊට පස්සේ දැන ගත්ත දේ දැකගන්න, ඔය පින්වතුන්ට ඊට පස්සේ ක්‍රමය හම්බ වෙනවා.

අභිධර්ම පිටකයේදි බුදුරජාණන් වහන්සේ පෙන්වනවා,

- ඇහැ කියන එක අනිදස්සනයි. ඇහැ කියන එක කවදාවත් දකින්න බැරි දෙයක්. කන, නාසය, දිව, ශරීරය කියන මෙන්න මේ ටිකත් දකින්න බැහැ, අනිදස්සනයි. ඒ කියන්නේ අතීතයේදි දැකලත් නැහැ, අනාගතයේදි පෙනෙන්නෙත් නැහැ, වර්තමානයකද ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන එක පෙනෙන්නේ නැහැ,

- ඊට පස්සෙ ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන මේ රූප ටික, සතර මහාධාතූන්ගේ උපාදාය රූප. සතර මහාධාතු නිසා පහළ වෙන උපාදාය රූප.

- මේ ආයතන පහම, **අජ්ජත්තං වචනේති** ආධ්‍යාත්මික ධර්ම

මේ එකක් එකක් ගානෙ විශාල අර්ථයක් තියෙනවා. මේ එකක් ගානේ විශාල කෙළෙසයක් ගෙවෙනවා, එකින් එක හොඳට මතක තියා ගන්න. මේවා ඔක්කොම ආධ්‍යාත්මික ධර්ම.

- ඊට පස්සේ මේ ඔක්කොම ආයතන ටික **අවිජ්ජා සම්භූතං, කම්ම සම්භූතං තණ්හා සම්භූතං ආහාර සම්භූතං** අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන හේතූන්ගෙන් හට ගත්ත ටිකක්.

- මේ ආයතන ඔක්කොම ටික **අභූත්වා සම්භූතං භූත්වා න භවිස්සති.** පෙර නොතිබීමමයි මේ ආයතන ටික හටගන්නේ ඉතුරු නැතුවම නැති වෙනවා. ඇහැ පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුවම නැති වෙනවා. කන, නාසය, දිව, ශරීරය පෙර නොතිබීම හටගෙන, ඉතුරු නැතුවම නැති වෙනවා.

දැන් ඔය ටික තමයි **'සම්මා දිට්ඨි'** කියලා කිව්වේ.

ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන ටිකේ ඇත්ත ඔය පෙන්නුවේ බුදුරජාණන් වහන්සේ. දැන් බුදුරජාණන් වහන්සේ ඇත්ත පෙන්නුවාට, අපිට පෙනෙනවද? පෙනෙන්නේ නැහැ. ඒකයි අපිට 'සම්මා දිට්ඨිය' නැහැ කියන්නේ. ඇත්ත දකිනවා කියන එක ලෝකයට වැහිලා කියලා කියන්නේ ඒකයි. ඔහොම පෙන්නුවාට අපිට ඕක පෙනෙන්නේ නැහැ. වැහිලා තියෙන්නේ. එතකොට වැහිලා තියෙන්නේ මොකෙන්ද නීවරණයන්ගෙන්, අවිද්‍යාවෙන්. දැන් ඔය ටික ඉගෙන ගත්තා කියලා ඔය පින්වතුන් ඇහැ දැනගත්තා එහෙම නෙවෙයි.

දැන් ඔය ඇහැ පිළිබඳව තියෙන පෙළ දහමයි දැන ගත්තේ. දැන් ඔය පින්වතුන්ගේ ජීවිතයෙන් ඉගෙන ගන්න ඕනේ. ඇයි ඇහැට **අජ්ජත්තං** ආධ්‍යාත්මිකයි කියලා කියන්නේ ඇයි මහා භූතයන්ගේ උපාදායයි කියලා කියන්නේ? ඇයි පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුවම නැති වෙනවා කියලා කියන්නේ? ඇයි අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයන්ගෙන් හටගත්තා කියලා කියන්නේ? ඇයි ඇහැ අනිදස්සනයි කියලා කියන්නේ? කියන ටිකට උත්තර ඔය පින්වතුන් ගාව තියාගන්න ඕනේ. **මොන තරම් භාවනා කෙරුවත්**

ඔය උත්තර ටික ඔය පින්වතුන්ට හම්බ වෙන්නේ නැහැ. සීලයක පිහිටලා සමථ කමටහනකින් හිත වඩමින් පින්වතුන් අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, අනාත්ම වශයෙන් දන්න විදියට ස්කන්ධ, ධාතු, ආයතන වශයෙන් හිතුවා කියලා, ඇහේ ඔය ඇත්ත ටික අහලම දැනගත යුතුයි මිසක, ඒක කවදාවත් ලැබෙන්නේ නැහැ.

එහෙම ඔය පින්වතුන්ට ලැබුණොත් කාගෙන්වත් අහන්නේ නැතුව ඔය පින්වතුන්ටත් කියන්න වෙනවා, පච්චේක බුද්ධ කියලා. තමන්ම තනියම අවබෝධ කරගත්තා කියන්න වෙනවා. ඔය ටික අවබෝධ කරගන්නවා නම් භාවනා කරලා කිසිම කෙනෙකුගෙ උපදේශයකින් තොරව ඔය ආයතන ටිකේ ඇත්ත ඇති හැටියෙ දැක්කොත්, සත්‍යය අවබෝධ කරගත්ත කිසි කෙනෙකුගෙ උපකාරයකින් තොරව, පරඋපදේශ රහිතව, ස්වයංභූව අවබෝධ කරගත්තහම එක්කො සම්මා සම්බුද්ධයි එක්කො පච්චේක බුද්ධයි කියලා ඔය පින්වතුන්ට කියන්න වෙනවා. එහෙමනම් ඔය පින්වතුන් පසේ බුද්ධත්වයට පත්වුණු අය වෙනවා. එහෙම නැති හැම කෙනෙක්ම බුදුරජාණන් වහන්සේගෙන් හෝ ඒ බුදුරජාණන් වහන්සේගේ පණිවිඩය නිවැරදිව ලෝකයට කියලා දෙන ඒ කල්‍යාණ මිත්‍ර පරපුරෙන් මේ අර්ථය අසා දැන ගන්නම ඕනේ. එහෙම අහලා දැන ගත්තහම ඔය පින්වතුන්ට කියනවා **ශ්‍රැතමය ඥාණය** තියෙනවා කියලා. දැන් තාම ඔය ටිකේදි ශ්‍රැතමය ඥාණය තියෙනවා කියලාවත් කියන්නේ නැහැ. එහෙම අහලා දැන ගත්තහම ශ්‍රැතමය ඥාණය කියන එක තියෙනවා කියන්නෙ, ඊට පස්සෙයි ඔය පින්වතුන්ට නිවන් දකින ප්‍රතිපදාවක් හම්බ වෙන්නේ.

ආයතන පිරිසිඳ දැකගැනීමෙන් අනුසය ධර්ම දුරුවී ලෝකෝත්තරයට පිය නැගීම

මේ කොටස් ටික ගොඩාක් ගැඹුරුයි. ඇත්තටම ස්වභාවයෙන්ම ගැඹුරුයි. හැබැයි ගැඹුරුයි කියලා අහක දාන්න එපා. මේ ධර්මයේ ගැඹුරුකම නෙවෙයි. ඒ කියන්නේ හුඹහ ගැඹුරු නෙවෙයි. අපේ අත දිග මදිකම තියෙන්නේ. එතකොට ධර්මය ගැඹුරු නෙවෙයි, **අපේ මනස නීවරණ ධර්මයන්ගෙන් පිරිලා නිසයි අපිට තේරෙන්නේ නැත්තේ.** ඒ හින්දා හැම කෙනාම මේ ටික අහලා නොතේරුනොත් ඒකට කළකිරෙන්න එපා. හැබැයි මෙන්න මෙහෙම දහමක් කිව්වා නේද, අහන්න ලැබුණා නේද කියලා ඒක පැත්තකින් තබාගන්න. තබාගෙන ඒ ටික ඔරොත්තු දෙන මට්ටමට මනස ගන්න වෙන ක්‍රමයක් තියෙනවා. දැනට මම මේ ටික පොඩ්ඩක් මතක් කරන්නම්.

(i) චිත්ත චෛතසික ධර්ම නිසා ප්‍රකට වන උපාදාය රූපය

හැම වෙලාවෙම උපාදාය රූප කියලා කියන්නේ හැම තැනකම තියෙන උපාදාය රූප වල ලක්ෂණය මෙච්චරමයි. උපාදාය රූප කියලා කියන්නේ, මහාභූත තියෙන තැනක චිත්ත, චෛතසික නිසා ප්‍රකට රූපයක්, අපි ඕකෙදි ගත්තොත් අපි බිත්තියක චිත්‍රයක් ඇන්දොත් අපිට චිත්‍රය බලන්න පුළුවන්, ඒත් කවදාවත් ඒක අල්ලන්න බැහැ, ඇල්ලුවොත් අහුවෙන්නෙ බිත්තිය. බිත්තිය කියන්නේ චිත්‍රය නෙවෙයි, බිත්තිය නැත්නම් චිත්‍රයක් තියෙයිද? බිත්තියක් නැතුව චිත්‍රයකුත් නැහැ. නමුත් චිත්‍රය කියන්නේ බිත්තියත් නෙවෙයි, බිත්තිය කියන්නේ චිත්‍රයත් නෙවෙයි, චිත්‍රය දකින්න විතරයි පුළුවන්, බිත්තිය අල්ලන්න විතරයි පුළුවන්, බිත්තිය දකින්න පුළුවන්ද? බැහැ ඇයි ඒ? බිත්තිය චිත්‍රයට වැහිලා. දැන් මුළු බිත්තිය පුරාම චිත්‍රය ඇඳලා නම් තියෙන්නේ, බිත්තිය දකින්න බැහැ, ඇයි පෙනෙන්නේ චිත්‍රය, චිත්‍රය අල්ලන්න බැහැ අහුවෙන්නේ බිත්තිය.

ඒ වගේ මේ ඇහැ අල්ලන්න බැහැ, අහුවෙන්නෙ බිත්තිය වගේ, අහුවෙන්නේ මහාභූත නමුත් ඒ මහාභූත ටිකම උදව් කරගෙන චිත්‍රය ඇන්දා වගේ මේ ඉතාමත් ප්‍රසාදයක් හැදිලා තියෙන්නෙ. චිත්ත, චෛතසික ටිකයි හැදිලා තියෙන්නෙ. ප්‍රසාදය කියන එක අල්ලන්න බැහැ. ඒ චිත්‍රය බඳුම රූපයක් තමයි ඇහැ කියන එක. උදාහරණයක් ගත්තොත්, මැරුණු මිනිහෙකුගෙ ඇහැ නිරුද්ධයි. අදහසක් ගන්න, යථාර්ථයට අනුව මළ මිනියක ඇහැ නැහැ. ඇහැ බිඳිලා, චක්ඛු ඉන්ද්‍රිය නිරුද්ධයි. දැන් අර බිත්තියයි චිත්‍රයයි දෙක සිහිකර ගන්න. චිත්‍රය කියන එක බිත්තිය ඇසුරු කරගෙන තිබුණාට මොන තරම් සියුම් එකක්ද නේද? එතකොට ඔයගොල්ලන්ට පැහැදිලිද බිත්තිය පෙනෙන්නේ නැහැ කියන එකත්, චිත්‍රය අල්ලන්න බැහැ කියන එකත් පැහැදිලිද? ඇයි බිත්තිය පෙනෙන්නේ නැහැ කියලා කිව්වේ, චිත්‍රයට වැහිලා. ඇයි චිත්‍රය අල්ලන්න බැහැ කියලා කිව්වෙ, ඇල්ලුවොත් අහුවෙන්නෙ බිත්තිය. නමුත් බිත්තිය නැත්නම් චිත්‍රය කියලා එකක් ලැබෙන්නේත් නැහැ. ඒ වගේ ඇහැ කියන එක දකින්න චිත්‍රය වගේ. ඇහැ කියන අපි කතා කරන එක දකින්න චිත්‍රය වගේ. ඇල්ලුවහම අහුවෙන්නේ චිත්‍රය පිහිටලා තියෙන බිත්තිය වගේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ සංඛ්‍යාත කය, හරිද?

එතකොට ඇහැ කියන එක උපාදාය රූපයක් කියන්නේ ඒ මහාභූත තුළ, මහාභූතම ඇසුරු කරගෙන සිත නිසයි මේ ප්‍රසාද ගතිය හැදිලා තියෙන්නේ.තව ඒක නොතේරෙනවා නම්, මේ ඉතාම සියුම් රූප ටිකක් කියලා දකින්න. මම කිව්වෙ අත පය නවන්න පුළුවන් කමට කිව්වා අපි මොකක්ද? කම්මඤ්ඤතා රූප කියලා. මේක උපාදාය රූපයක්. මළ මිනියක අතපය නවන්න දිග හරින්න පුළුවන්ද බැහැ. ඒ මොකද ඒක

මහාභූත විතරයි. දැන් මේ රූපය නවන්න දිග හරින්න පුළුවන් නේද? පුළුවන්. මේ නවන්න දිග හරින්න පුළුවන් කම මේ රූපයේ හැදිලා තියෙන එකට කියනවා **කම්මඤ්ඤතා** රූපය කියලා. මහාභූත ටික නැතිනම් නවනවා, දිගහරිනවා, කියලා එකක් කරන්නත් බැහැ. හිතේ තියෙන චිත්ත, චෛතසික ටික නැතිනම් ඒත් එහෙම එකක් නැහැ. චිත්ත, චෛතසික නිසා නවනවා, දිග හරිනවා කියලා රූපයක් ලැබෙනවා. නවනවා, දිග හරිනවා කියන කෘත්‍යය මේ මහාභූත ටිකත් නෙවෙයි, තේරෙනවද? දැන් මේ අතේ ඇඟිලි මේ කෑලි ටික නෙවෙයි මේ නවනවා දිග හරිනවා කියන ටික. ඒ ටික නැති නම් නවනවා දිග හරිනවා කියන ක්‍රියාවක් පෙන්වන්න පුළුවන් කමකුත් නැහැ. චිත්‍රය වගේ තමයි මේ නවන්න දිග හරින්න පුළුවන් කම කියන රූපය. අත කියපු තැනක් තියෙනව නම් හම්, මස්, ලේ, නහර මේ පෙන්නපු ටික, මේක පඨවි. මේ සතර මහාධාතු.

එතකොට මේ උපාදාය රූපය කියන කොට මොනතරම් සියුම් එකක්ද? ඒ විදියයි ඇහැ. ඇහැ කියන එක අර චිත්‍රය බලන්න පුළුවන් වගේ, නමුත් අල්ලන්න බැහැ වගේ, මේ ඇහැට රූප පෙනෙනවා, රූපයක් පෙනෙන්න පුළුවන් කම තියෙනවා. නමුත් අල්ලන්න බැහැ. ඇහැ කියන එක නුවණින්ම දැක්ක යුතුයි මිසක පින්වතුන් හොඳට ඇහැ කියන එක පිරිසිඳ දැක්කොත්, එක පාරටම ඇහේ නිත්‍ය බව යනවා. එක පාරටම මෙහෙම අල්ලන කොට ඇහැ ඇල්ලුවා කියන ගතිය පින්වතුන්ට හිටින්නේ නැහැ. දැන් අද ඇහැ ගැන හොඳට තීක්ෂණව නොබලන හින්දයි ඔය පින්වතුන්ට හතර ඉරියව්වෙම පවතින ඇහැක් ඉතුරු වෙන්නේ.

මම අනිත් එක ඔය කියන්නේ ඉදිකට්ටකින් හරි, අල්පෙනෙත්තකින් හරි අද අපි ඇහැයි කියන තැනට ඇන්නොත් අපිට රිදෙනවනෙ නේද? එතකොට උපදින විඤ්ඤාණය කියලා කියන්නේ මොකක්ද? දුක් වේදනාවක්ද දැනෙන්නේ, සැප වේදනාවක්ද? දුක් වේදනාවක්. දුක් වේදනාවක් දැනෙන්නේ මොන විඤ්ඤාණයටද කාය විඤ්ඤාණයට. ඒ කය හින්දනේ කාය විඤ්ඤාණය උපන්නේ. ඇහැට ගැටිලා කාය විඤ්ඤාණය උපදිනවද? එහෙනම් කෝ ඇහැ? ඒකයි චිත්‍රය කවදාවත් අල්ලන්න බැහැ. ඇහැ කවදාවත් අල්ලන්න බැහැ කියලා හිතා ගන්න. එතකොට අහුවෙන්නෙ මහාභූත රූපය, ඉදිකට්ටකින් ඇන්නහම ඒ කය තුවාල වුණු නිසා ඒ වේදනාව දැනෙනවා මිසක, ඇහැ තුවාල වුණු නිසා නෙවෙයි.

ඇහැ කියන එකේ යථාර්ථය ගත්තහම කෘත්‍යයක්, වැඩක්. සිත නිසා අවස්ථාවට උපදින ධර්මයක් ඇහැ. මේ පෙනෙන කෘත්‍යය කරන ප්‍රසාදය කියන එකද තියෙනවා නෙවෙයි. අවස්ථාවට උපදින එකක්. ඊට පස්සෙ අහයි, එහෙනම් හාමුදුරුවනේ මැරුණහම ඇස් අරගෙන තව කෙනෙකුට දාන්නෙ කොහොමද කියලා. මම අර කිව්වෙ

'ඉත්ථින්ද්‍රිය රූපය' නිසා හැදුණු රූපය මළ මිනිය කියලා ඉතුරුවෙලා තියෙන්නේ කියලා. 'චක්ඛු ඉන්ද්‍රිය රූපය' නිසා හැදුණු ප්‍රසාදයයි ඒ තියෙන්නේ මිසක, ඒක චක්ඛු ඉන්ද්‍රිය නෙවෙයි. ඇහැ තියෙනවනම් එහෙනම් පෙනෙන්න ඕනෙනේ මැරුණු කෙනෙකුටත්, නමුත් පෙනෙන්නේ නැහැ. ඇහැ උපාදාය රූපයක් කියලා කිව්වේ ඒකයි.

(ii) පුරාණ කර්මයෙන් උපන් ප්‍රසාද නව කර්ම උපදවන හැටි

ඇහැ අනිදස්සනයි කියලා කිව්වේ කිසිම දවසක ඇහැට ඇහැ පෙනෙන්නේ නැහැ. ඔය පින්වතුන්ගේ ඇහෙන් බාහිර රූප ඕනෙ තරම් බලන්න පුළුවන්, ඇහෙන් ඇහැ බලන්න පුළුවන්ද කියන්න. ඇහැට ඇහැ පෙනෙනවද? දැන් බැරිනම් අතීතයේ කියලා පහු වෙලා තියෙන්නෙත් ඔක්කොම වර්තමානෙනේ. දැන් වර්තමානයක ඇහැට ඇහැ බලන්න බැරිනම් එබඳු වර්තමානය තමයි තව ටිකකින් අතීතය වෙන්නේ. එහෙනම් අතීතය කියන එකම තැනකවත් අපි අපේ ඇහැ දැකලා නැහැ. අනාගතය කියලා උපදින හැම තැනකදිමත් ඇහැට ඇහැ පෙනෙන්නේ නැහැ. වර්තමානයේදිත් ඇහැ කවදාවත් දැකලා නැති එකක්. තේරුනා නේද? කවදාවත් ඇහැ කියන එක අපි දැකලවත්, හීනෙකින්වත් දැකලා නැහැ,

ඕකෙදි මම උපමාවක් කියන්නේ අවුරුදු හතරක පහක පොඩි ළමයෙක් ඉන්නවා නම්, ඒ පොඩි ළමයටත් වකුගඩු හදවත කියලා දෙයක් ඇති, ඒක ජීවිතය වෙලා, ජීවිතය ජීවත් කරවනවත් ඇති. නමුත් ඒ ළමයා වකුගඩුව ගැන හදවත ගැන දන්නවද මොකවත්, වකුගඩුවක් නැහැ කියන්නවත් දන්නවද? තියෙනවා කියන එක ගැන කවර කතාද, නැහැ කියන්නවත් දන්නේ නැහැ. තියෙනවද, නැහැද කතාවලින් තොරයි එයාගෙ ලෝකය. එයාට වකුගඩු ගැන සිතීම්, කීම්, කිරීම් කරන්න බැහැ. ඒ නිසා අළුතෙන් කර්ම නැහැ. නමුත් ඒ ටික ජීවිතය වෙලා නොපවතිනවා නෙවෙයි.

ඒ විදියමයි ඇහේ ස්වභාවය. ඇහැ කියන එක ජීවිත ඉන්ද්‍රිය වෙලා පෙනීමේ කෘත්‍ය කරනවා. නමුත් පෙනීම සිදු කරන ඇහැ කවදාවත් අපි දැකලාවත්, දන්නේවත් නැහැ. අර පොඩි ළමයා ලොකු වෙනකොට දැන් තමන්ගේ ශරීරයේ වකුගඩු හදවතක් තියෙන බව දන්නේ නැහැ. පොඩි ළමයා ලොකු වෙනකොට අපි කියමු වෛද්‍ය විද්‍යාලයකට ගියා කියලා. මිනියක් කපන දිහා බලාගෙන ඉඳලා හෝ වීඩියෝ පටයකින් හෝ, මේ ඔක්කොම බාහිර දර්ශන, මේ දර්ශන දැකලා මේ තමයි වකුගඩුව, මේ තමයි වකුගඩුවෙ හරස්කඩ, මේ තමයි හදවත මේ තමයි හදවතේ කපාට මෙහෙමයි, මෙහෙමයි කියලා සටහන් ටිකක් ඉගෙන ගත්තා කියන්නකො, ඔන්න දැන් එයාගෙ හිතට නව

කර්මයක් එනවා, හදවත කියලා වකුගඩු කියලා දැනුමක් තියෙනවා, හදවත ගැන වකුගඩු ගැන හිතන්න කියන්න, කරන්න පුළුවන්. එයා හිතා ගන්නවා මගෙ ළඟ තියෙන හදවතක්, වකුගඩුවත් මෙහෙම තමයි කියලා. ඒකද කවදාවත් නොදැක්ක දෙයක් අරභයා උපකල්පනයකින් මනස පැවැත් වීමක් මිසක, ඔය දැනුම නැති කාලෙදිත් මේ සිද්ධිය තිබුණා. ඒ දැනුම ඇති කාලෙදිත් ඒ සිද්ධිය මේ තියෙන සිද්ධියට සම්බන්ධ නැහැමයි. හැමදාම පවතින සිද්ධිය, දැනුමෙ තියෙන සිද්ධියෙන් මිදිලා තියෙන්නෙ තේරුනාද මම කියන එක? මොකද ඔය දැනුම නැති කාලෙදිත් පැවතුනා නම්, ඔය දැනුම ඇති වුණා කියලා එයා වෙනස් වෙලා නැහැ. ඒ විදියටම තමයි පවතින්නේ. දැන් ඔය හදවතක්, වකුගඩුවක් කියන හිතේ තියෙන ටික තියෙනවනේ, මේ සැබෑවටම තියෙන හදවත වකුගඩුව නැති වෙනකොට අළුතෙන් හදවතක් වකුගඩුවක් හදාගන්න පුළුවන් ටික තමයි හිතේ තියෙන්නේ. ඕකට තමයි නව කර්‍ම කියලා කියන්නේ.

ඒ වගේ මේ ඇහේ ඇත්ත තමයි අපි ඉපදෙන කොට, මේ දැනුත් අර පොඩි ළමයගෙ හදවත වකුගඩුව වගේ තමයි කිසිම නිමිත්තක් නැති තැනක ඉඳලා පෙනීම් කෘත්‍ය කරනවා. ලොකු වුණාහම කණ්ණාඩියකට වැටෙන ඡායාවක් දිහා බලලා හෝ තව රූපයක් දිහා බලලා හෝ මේ තමයි ඇස් කියන්නෙ මගෙ ඇහැත් ඔය වගේ කියලා උපකල්පනයක ඉන්නවා අපි දැන්. මේ ඔක්කොම බාහිර සටහන්. අපි දැන් හිතාගෙන ඉන්නෙ මේ තියෙන ඇස් දෙක ගැනමයි මේ හිතේ තියෙන දැනුම් ටික කියලා. හිතේ තියෙන ඔය දැනුම් ටික, ඇහැ ගැන අද ඔය පින්වතුන්ට හිතන්න පුළුවන් සුදු පාටයි, කළු ඉංගිරියාවක් තියෙනවා කියලා විස්තර ටිකක් තියෙනවා නම් හිතේ අද අපිට, ඔය බාහිර වර්‍ණ සටහනක් දිහා බලලා ගත්ත නිමිත්තක් සහ ඒ අනුසාරයෙන් මගේ ඇහැත් මෙහෙම වෙන්න ඇති කියලා ගත්ත උපකල්පනයක් තියෙනවා. එතකොට ඔය දැනුම අපේ හිතේ නැති කාලෙත්, පුංචිම කාලෙත් අපි උපන්නහම ඇහැ තිබුණා, ඇහෙන් කෙරෙන්න තිබුණු වැඩ ටිකකුත් තිබුණා නම් අදත් එයා එබඳු මට්ටමකමයි ඉන්නේ. එතකොට අද අපි ගාව හිතේ ඇහැ ගැන තියෙන දැනුමක් තියෙනවා නම්, පවතින ඇහැට ඒකෙ කිසි සම්බන්ධයක් නැහැ. තියෙන ඇහැ නැති වෙනකොට අළුතින් ඇහැක් හදාගන්න තියෙන දැනුම් ටික තමයි අද අපිට ඇහැක් ගැන තියෙන මිම්ම.

ඕකට තමයි නව කර්‍ම කියලා කියන්නෙ. පුරාණ කර්‍මේට හැදුණු ඇහැම අවිද්‍යාවෙන් අපි කර්‍ම කරගෙන තියෙන්නේ. ඒ ඵලයම හේතුවක් කරගෙන මේ තියෙන්නෙ හිතේ තියෙන ඇහැ අද නැති නොකළොත් මේ ඇහැ නැතිවෙන කොට වෙන ඇහැක් හදාගන්නවාමයි. ඒ නිසා 'සළායතන නිරෝධය' කියන්නේ කර්‍මක්ෂය කියන්නෙ හිතේ තියෙන ඇහැ පිළිබඳ දැනුමකුත් නැහැ. ඒකත් සම්පූර්ණයෙන්ම අත හැරුණොත් තියෙන ඇහැ පිළිබඳව නිමිත්තකුත් නැති වෙන කොට එයා ඇස් නැතුවයි ඉන්නේ, තේරුනාද? එයා හැම

වෙලාවෙම ඇස් නැතුව ඉන්න කෙනෙක් වෙනවා. ඇස් නැතුව ඉන්න කෙනෙක් කියන්නේ නොපෙනෙනවා නෙවෙයි. ඒකයි මෙතන තියෙන ලොකුම විද්‍යාව. පෙනීම් කෘත්‍යයක් වෙනවා ඇහැකින් දුක් විඳින්න ඇහැක් ගැන හිතන්න කියන්න කරන්නටත් තියෙන දැනුම් ටික ඔක්කොම තියෙන්නෙ මනසෙනේ. අළුත් කර්‍මනේ, ඒ ටිකත් අත හැරලා තියෙන ඇහැ නොදන්නා මට්ටමකුයි එතකොට ඉතුරු වෙන්නෙ. පෙනීම් කෘත්‍යය කරනවා එයා ඇස් නැතුවයි ඉන්නෙ. ඉඳගෙන, හිටගෙන, ඇවිදින, නිදාගෙන කියන හතර ඉරියව්වක් පවත්වන ඇහෙන් එයා මිදිලා. හරියටම කෘත්‍යය සිද්ධ වෙනවා. ඇහෙන් පෙනෙනවා කියන සිද්ධිය වෙනකොට පෙනීම් කෘත්‍යයත් වෙනවා. පෙනීමෙන් පස්සෙ නිරුද්ධයි කියන එකත් අවස්ථාවට වෙනවා. පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුවම නැති වෙනවා කියන කොට ජීවිතයම වෙලා තියෙන්නේ ඇහැ.

අපි කියමු කුඩා ළමයාත් වකුගඩුව හදවත කියන දැනුම නැතුවනේ හිටියේ ලොකු වෙනකල්ම, බාහිරෙන් වීඩියෝ පටයක් බලලා හෝ ඇති කරගත්ත හදවත වකුගඩු කියන දැනුම් ටිකක් තිබුණා නම් ඔය ටික අයින් කළොත් එයාගෙන්, තියෙන ටිකේ දැනුමක් එයාට තියෙනවද? නැහැ. එතකොට එයා ඉන්නේ හදවත වකුගඩු නැතුව. අපිට 'සළායතන නිරෝධය' හුරු නැති හින්දනේ 'නැහැ හාමුදුරුවනේ ඒ වුණාට තියෙනවානේ' කියලා ආයෙත් හිතෙයි. ඒ ධර්‍මතාවය ජීවිතය වෙලා ඒකෙන් කෙරෙන්න තියෙන වැඩේ කෙරෙයි, කෙරෙනවා. ඒකට කියන්නේ 'ජීවිත ඉන්ද්‍රිය' කියලා එතකොට. එයාට නව කර්‍ම නැහැ. එයාට දුක් විඳින්න දේවල් නැහැ. ජරා මරණයට පත්වෙන ධර්‍මතාවයන් එයාට නැහැ. එයාට එහෙම දුක් විඳින්න එකක් නැහැ. එයා දුක් විඳින්නේ කය කෙළවර කොට ඇති දුක් වේදනාවකින් දුක් විඳියි. වකුගඩු අමාරුවෙන් එන දුක නැහැ එයාට, තියෙයිද? මොනවා හරි ඇතුළෙ වෙනකොට දුක් වේදනාව දැනෙයි, කය කෙළවර කොට ඇති දුක් වේදනාව විඳියි, හදවත් රෝගයක් නැහැ එයාට, රෝගයක් වෙන්න හදවතක් තියෙන්න එපායැ, මොකද මේ ටික එයාගෙ ජීවිතය වෙලා, කය වෙලා, ඒ නිසා ඒකෙ යම් කැඩීමක් බිඳීමක් හේතු ඵල දහමක් නිසා වෙනකොට එන දුක් වේදනාවක් වෙනවා නම්, දුක් වේදනාව දැනෙයි. කය කෙළවර කොට ඇති වේදනාව දිවි කෙළවර කොට ඇති වේදනාව විඳිනවා. ඕනෙ නම් හිතලා, හදවත රිදෙනවා, වකුගඩු රිදෙනවා කියලා කියන්න පුළුවන්, කිව්වට එයාට නිමිති නැහැ. එහෙම ඒවා, එහෙම දේවල් නැහැ.

එයාගෙ ජීවිතයේ ඇත්තටම අල්ලාගෙන විඳින රූප රාමු නැහැ, ඒක තමයි ඇත්ත. එතකොට ඇහැ කියන එක අනිදස්සනයි කියලා කියන්නේ, ඔන්න පුරාණ කර්‍මයෙන් හට ගත්ත විපාක කියලා කියන්නේ, ඒක ජීවිතය වෙලා මිසක සිතීම්, කීම්, කිරීම් කරන්න බැහැ. සිතීම්, කීම්, කිරීම් කළොත් දකින්න, ඒවා ඔක්කොම නව කර්‍ම. සංයුක්ත නිකායේ 'නව පුරාණ කර්‍ම සූත්‍රය' පොඩ්ඩක් බලන්න ඔය පින්වතුන්, ඒකෙදි හොඳට

පෙන්වනවා මහණෙනි **ඇහැ පුරාණ කර්මයයි. කන, නාසය, දිව, ශරීරය පුරාණ කර්මයයි. නව කර්ම මොනවද? වර්තමානයේදි යම් හිතීම්, කීම්, කිරීම් තියෙනවා නම් මේවා නව කර්ම.** ඇහැ ගැන මොනවාම හරි දෙයක් හිතන්න, කියන්න, කරන්න පුළුවන් නම් ඒ හිතන්න, කියන්න, කරන්න පුළුවන් ටික. සුදු පාට ඇහේ කළු පාට ඉංගිරියාවක් තියෙනවා කියලා කියන්න හරි, හිතන්න හරි පුළුවන් නම් දකින්න මේ නව කර්ම. ඒ නිසා ඇහැ කියන එක ගත්තහම අනිදස්සනයි කියලා කියන කොට, එයාට හොඳට තේරෙන්න ඕනේ ඇහැ ගැන අද තියෙන මේ ටික ඔක්කොම මනෝමය සිද්ධියක් කියන ටික වෙනම අහුවෙලා තියෙන්න ඕනේ, තියෙන ඇහැ ගැන දන්නෙත් නැහැ. නිමිති නැති වෙන්න ඕනේ, ඇහැ කියලා එක පාරට සිහිකරන කොට තමන්ට තේරෙන්න ඕනේ තමන්ගේ සිතින්ම විතර්කයක් සිහිකෙරුවා මිසක, සිහිකරන එක ඇහැ නෙවෙයි කියන කාරණාව. ඇහැ කියන එක කෘත්‍යයකින් දකින්න ඕනේ. එතකොට ඇහැ කියන එක උපාදාය රූපයක් කිව්වා. දකින්න බැහැ අනිදස්සනයි කියලා කිව්වා.

(iii) අවිද්‍යා, කර්ම, තණ්හාවෙන් උපන් ප්‍රතිසන්ධි විඤ්ඤාණය නාම-රූප වන හැටි.

ඇහැ කියන එක අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයන්ගෙන් හටගත්තා කියලා කියන්නේ පෙර ජීවිතයෙත් මේ වගේම ඇහේ ඇත්ත ඇති හැටිය නොදන්නා කම නිසා 'මේ තමයි ඇහැ, ඇහැ කියන්නෙ සුදු පාටයි කළු පාට ඉංගිරියාවක් තියෙනවා' කියලා ඔය වගේ නිමිති හදාගත්තා නම් ඒ තමයි පෙර ජීවිතයේ අවිද්‍යා කර්ම. මරණාසන්න මොහොතෙදි එබඳු ඇහැක් සිහිවෙන කොට ඇහැකට තියෙන තණ්හාව නිසයි ප්‍රතිසන්ධි වශයෙන් ආවෙ, ප්‍රතිසන්ධි විඤ්ඤාණය මවු කුසට බැස ගන්න කොට අවිද්‍යා, කර්ම, තණ්හා කියන ටිකක් තියෙයි. ඇහේ ඇත්ත ඇති හැටිය නොදැකීමම තමයි අවිද්‍යාව. ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන්නේ මොකක්ද ඇහැ පිළිබඳව හිතන්න, කියන්න, කරන්න පුළුවන් ටික තමයි අවිද්‍යාවෙන් රැස්වුණු කර්ම ටික.

චක්ඛුං ලොකේ පිය රූපං සාත රූපං එත්තේසා තණ්හා - උප්පජ්ජමානා උප්පජ්ජති, එත්ත නිවිසමානා නිවිසති - ඇහැ ලෝකයේ ප්‍රියයි, මධුරයි, තණ්හාව උපදින්නෙහි. එතකොට, ඇහැ තියෙන කෙනා, ඇහැට කැමතියි. දැන් අපි අද ඇහැට කැමතියි කියලා පෙනෙන්නේ නැහැ. නමුත් දෙයක් වෙන්න ඕනෙ බලන්න, කැමැත්ත ඉදිරිපත් වෙන හැටි. තණ්හාව කියන එක මෙහෙම ප්‍රකටව විද්‍යමාන වෙන්න ඕනේ නැහැ. අනෙක් දේවල් හරහාත් අපිට සම්බන්ධයි. අවිද්‍යා, කර්ම, තණ්හා කියන මේ ගති ටික තියෙනවා. ගතිටික නිසා විඤ්ඤාණය නිරුද්ධ නොවී, ආශ්‍රවක්ෂය නොවී,

තියෙන ඇහැ අතහැරෙන කොට නැවත ඇහැක් හදා ගන්න පුළුවන් තැනක ප්‍රතිසන්ධි වශයෙන් පැමිණෙනවා.

ඔන්න දැන් මවු කුසක බීජ කලලය ඇසුරු කරගෙන පවතින විඤ්ඤාණය ඔතෙන්ට පැමිනෙන්න හේතු ටිකක් තිබුණා. **අවිද්‍යා, කර්ම, තණ්හා කියන හේතු ටිකකින් තමයි විඤ්ඤාණය පැමිණියේ. දැන් විඤ්ඤාණය ඇසුරු කරගෙන පවතින රූපය හැදෙන්නේ කන,බොන ආහාරපානයන්ගෙන්.** දැන් කන බොන ආහාරපානයන්ගෙන් හැදුනු සතර මහාධාතු රූපය, අවිද්‍යා, කර්ම, තණ්හා කියන හේතුන්ගෙන් හටගත්ත විඤ්ඤාණයේ බැඳී පවතිනවා. මේ අවිද්‍යා, කර්ම, තණ්හා කියන හේතුන්ගෙන් හටගත්ත විඤ්ඤාණය ආහාරයෙන් හැදුනු රූපයේ බැඳී පවතිනවා. ඕකට කියනවා අඤ්ඤ මඤ්ඤව පවතිනවා, ඔවුනොවුන්ට උපකාරීව. මේ හිතේ තියෙන ගති ටිකයි, කන බොන ආහාරයෙන් හැදුනු රූපයයි දෙක එකට බැඳිලා තියෙන කම නිසා, ඒ සිතේ තියෙන ගති වලට අනුව සතර මහාධාතුවේ මේ ප්‍රසාද ටික හැදුනේ. ඒකයි විඤ්ඤාණය නිසා නාම-රූප වෙනවා. ඒ කියන්නේ මේ රූපය නාමධර්ම ටිකට, නාමධර්ම ටික රූපයට උපකාර පිණිස පවතින කොට, නාම-රූප දෙක ඔවුනොවුන්ට උපකාරීව පවතිනවා කියන්නේ ආයතන ටික හැදෙනවා.

දැන් හරියටම ඇහැ හැදිලා තියෙන්නේ මොකෙන්ද? අවිද්‍යා, කර්ම, තණ්හා කියන නාමධර්මයන්ගේ අනුග්‍රහයත් ලබලා, කන බොන ආහාරය නැමැති හේතුව,රූපයෙත් අනුග්‍රහයත් ලබලයි ඇහැ හැදිලා තියෙන්නෙ. කෙනෙක් ඇහැ මම නෙවෙයි මගේ නෙවෙයි මගෙ ආත්මය නෙවෙයි කියනවනම් වචන කියලා හරියන්නේ නැහැ, එයා හේතු ටික කියන්න ඕනේ. එයා හොඳට දන්නවා නම් අවිද්‍යා, කර්ම, තණ්හා කියන හේතු ටිකෙන් නාමධර්ම ඇති වුණ හැටි, ඒ නාමධර්ම ටික මහාභූත රූපයේ බැඳුණු නිසා මහාභූත රූපය මේ නාමධර්ම ටිකේ බැඳිලා නිසා මේ නාම-රූප දෙක පිහිටලා තියෙනවා, ඒ නිසයි මේ ආයතන ටික හැදුනේ කියලා දන්නවා නම්, ඇහැ හැදෙන්න හේතුව දන්නවා. කන බොන ආහාරයෙන් යුක්ත රූපය, හිතේ තියෙන ගති වලට ගොනුවෙලයි ප්‍රසාද පිහිටලා තියෙන්නේ කියලා දකින කොට, මම නෙවෙයි මගෙ නෙවෙයි මගෙ ආත්මය නෙවෙයි කියන වචන කියන්න ඕනේ නැහැ. ඉබේම තියෙනවා මේ ඇහැ හේතු ප්‍රත්‍යයි. ඇහැ අවිද්‍යාවෙන් කර්මයෙන් තණ්හාවෙන් ආහාරයෙන් හටගත්ත එකක් කියන එක ඉබේම තියෙනවා. මේ දර්ශනය දකින කොට, ඇහැ අනාත්මයි කියන්නේ නිකම් නෙවෙයි, මේ හේතු ටික දකින හින්දා. ඔන්න ඇහැ ***අවිජ්ජා සම්භූතං, කම්ම සම්භූතං, තණ්හා සම්භූතං, ආහාර සම්භූතං*** කියලා කිව්වේ ඒ හින්දා කියලා දකින්න.

(iv) පෙර නොතිබීම හට ගෙන ඉතුරු නැතිවම නැතිවන ප්‍රසාද

ඇහැ පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුව නැති වෙනවා. ඒ කිව්වේ දැන් අපි දැක්කා හිත, මේ මහාභූත රූපයේ ඇසුරු කරගෙන පවතින කොට නාම-රූප කියලා කිව්වා. නාම-රූප වෙනකොට ආයතන පිහිටනවා කියලා කිව්වනේ නේද? ඔය දැන් මුලින්ම මතක් කළේ මම 'ප්‍රතිසන්ධි විපාක' හිත. ඔය හිත හැමවෙලේම තියෙනවා නෙවෙයි. ඊට පස්සේ මේ මට්ටම නිරුද්ධ වෙලා දකින, අහන අරමුණක් එල්බගෙන කර්ම හිත උපදිනවා නම්, අපි කියමු කුසල සිතක් හෝ අකුසල හිතක් උපදින කොට ඒ හිත, හිතේ තියෙන චිත්ත, චෛතසික ටික එක්කම මහාභූත රූපය ඇසුරු කරනවා. මහාභූත රූපය මේ චිත්ත චෛතසික ටිකේ ඇසුරු වෙනවා. සිතක් උපදින උපදින ගානෙ නාම-රූප දෙක වෙනස් වෙනවා, ඒ කියන්නේ ආයතන ටික වෙනස් වෙනවා. දැන් ඉපදුණු වෙලේ ඉඳන් මැරෙණ කල්ම ප්‍රතිසන්ධි මට්ටමේ සිතක්ම තියෙනවා නම් ඕක හරි. ඒ මොහොතෙදි ඒ සිත ඇසුරුවෙන කොට නාම-රූප වෙලා ආයතන ටික හැදුනා ඔන්න. දැන් ආයතන ටිකට රූප, ශබ්ද, අරමුණු ගැටුනට පස්සේ භවාංග සිතටම ගැටෙනවා. ඊට පස්සේ ඒ අරමුණු අරභයා කුසල සහගතව හෝ අකුසල සහගතව හිතන්න කර්ම සිතක් උපන්නොත්, දැන් අර භවාංග මට්ටම මැකෙනවා. දැන් ඒ කර්ම සිත උපදින කොටම, ඒ හිතයි හිතේ තියෙන නාමධර්මයි දැන් මහාභූත රූපය ඇසුරු කරන්නෙ. දැන් මහාභූත රූපය ඒ කර්ම හිතටයි ඒකෙ තියෙන නාමධර්ම වලටයි උපකාර කරලා තියෙන්නෙ. එතකොට ආයතන ටික පවත්වන්නෙ දැන් ඒ හිතෙන්. අපි කෙටියෙන් ගනිමු. මෙතනදි කර්ම සිත් උපදිනවා, විපාක සිත් උපදිනවා, ක්‍රියා සිත් උපදිනවානෙ නේද? ඒ වගේ හිතක් හිතක් ගානෙ, ඒ හිතයි හිතේ තියෙන සිතුවිලියි ඇසුරු කරගෙන මහාභූත රූපය, මහාභූත රූපය නිසා සිතයි සිතුවිලියි කියන දෙන්නා වෙනස් වෙන ගානෙ, සිතක් සිතක් ගානෙ ආයතන වෙනස් වෙනවා කියන එක දකින්න.

ඒ නිසයි ඇහැ පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුව නැති වෙනවා කියලා කියන්නෙ. සිතක් සිතක් ගානෙ ඇහැ බෙදිලා තියෙනවා. මොකද ඇහැ අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයන්ගෙන් නම් හැදුණෙ, ඒ කිව්වේ චිත්ත චෛතසික ටික නිසයි, මහාභූත රූපය නිසයි ඇහැ හැදිලා තියෙන්නේ. ඒ සිත කර්ම සිතක් වේවා, විපාක සිතක් වේවා දැන් ඒ සිතේ වර්තමාන අරමුණ දිහා බලාගෙනයි අපි සිත නම් කරන්නේ. නමුත් ඒ චිත්ත, චෛතසික මෙතෙන්ට ආවෙ අවිද්‍යා, කර්ම, තණ්හා කියන ටිකකින් නිසා දැන් ආරම්මණය කුසල වේවා අකුසල වේවා, ක්‍රියා වේවා, විපාක වේවා එයා නතර වෙලා තියෙන තැන ගත්තහම, ඒ නිසා හැදෙන පරිසරය ගත්තහම අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයි කියන

ටිකකින් තමයි කතා කරන්නේ.

ඕක තේරෙන්නෙ නැත්නම් පුද්ගල භාවයකින් කියලා අපි කියමුකො, ගෙඩි පිටින් තියෙන මේ රූපය අවිද්‍යා, කර්ම, තණ්හාවකින් හැදුනේ කියන්නකො, දැන් මම අද කාමාවචර මට්ටමේ කර්මයක් කළත් රූපාවචර මට්ටමේ කර්මයක් කළත් අරූපාවචර මට්ටමේ කර්මයක් කළත් මට කියන්න වෙන්නේ අවිද්‍යා, කර්ම, තණ්හා වෙන් ආපු කෙනා මෙහෙම කර්ම කරගෙන කියන එක නේද? ඒ වගේ කුසල සිතක් අකුසල සිතක් විපාක සිතක් කියලා වර්තමානයේ අරමුණ දිහා බලලා මොන මට්ටමේ සිතක් කිව්වත් ඒ හැම සිතක්ම අවිද්‍යා, කර්ම, තණ්හාවෙන් යුක්තව මෙතෙන්ට පැමිණි කෙනා මේ වගේ කර්ම රැස්කර ගන්නවා වගේ තැනකින් තියෙන්නේ. තේරෙනවද?

එතකොට ඔන්න ඔය සිතක් සිතක් ගානෙ ප්‍රසාද ටික වෙනස් වෙන නිසා, බැරි වෙලා ඔය පින්වතුන්ට රාග සිතක් ඇති වුණොත් බලන්න මේ ආයතන ප්‍රසාද ටික වෙනස් වෙන්නේ නැති වෙයිද කියලා, වෙනස් වෙනවා. ඊට පස්සෙ බැරිවෙලා තරහා හිතක් ඇති වුණොත් ඒ සිත ගානෙ මේ ප්‍රසාද වෙනස් වෙන්නේ නැති වෙයිද කියලා බලන්න. ලජ්ජා හිතෙන සිතක් ඇති වුණොත් ඒ සිත ගානෙ මේ ප්‍රසාද ටික වෙනස් වෙන්නෙ නැද්ද බලන්න. ඔය පින්වතුන්ට තේරෙන්නේ නැහැ. මේ ප්‍රසාද ටික ඔක්කොම වෙනස් වෙනවා. අර රළු මට්ටම විතරයි ඔය පින්වතුන්ට ප්‍රකට. ඒ සිතක් සිතක් ගානෙ වෙනස් වන නිසයි. එහෙම වෙනවා නේද? වෙනවා. එතකොට බයක් දැනුනොත් මේ සම්පූර්ණ ප්‍රසාද වෙනස් වෙනවා. ඒ ඒ සිතට අනුව ක්ෂණිකව මේ රූප ටික වෙනස් වෙනවා. **ඒ නිසා සිතක් සිතක් ගානෙ මේ ආයතන ටික වෙනස් වෙන නිසයි ආයතන පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුවම නැති වෙනවා කියන්නේ මේ ප්‍රසාද ටික.**

(v) කෘත්‍යයකින් පමණක් විද්‍යමාන වන ආධ්‍යාත්මික ආයතන

ඊට පස්සෙ, උපාදාය රූප කිව්වා, දකින්න බැහැ අනිදස්සනයි කිව්වා, අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයෙන් හටගත්තා කියලා කිව්වා. පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුවම නැති වෙනවා කිව්වා,

ඊට පස්සෙ ***අජ්ඣත්තං චචත්ථෙති*** ඇහැ කියන එක ආධ්‍යාත්මිකයි කියන එක දකින්න. ඒකෙන් කිව්වේ ඇහැ කියන එක කවදාවත් බාහිරෙන් හම්බ වෙන්නේ නැහැ කියලා හොඳට ස්ථාවර වෙන්න කියනවා. කණ්ණාඩියකින් ඇහැ බලන්න බැහැ කියන එක දකින්න කියනවා. තව රූපවලින් ඇහැ කියන එක දකින්න බැහැ හොඳට ඒ මානසික

මට්ටම එළඹ සිටින තැනට ගන්න කියනවා. දැන් අද අපිට පුළුවන් නේද ඇහැට පෙනෙන රූපායතනයෙන් ඇහැ දකින්න පුළුවන්නේ අපිට, නේද? ඇහැට පෙනෙන්නේ රූපනේ. ඒ රූපවල අපි දකිනවානෙ ඇස් කියලා නේද? අපි අද ඇහැයි කියලා දකින රූපයක් තියෙනවා නම් ඒකද රූපයක් මිසක ඇහැ නෙවෙයි කියන කාරණාව තහවුරු කරගන්නයි, ඇහැ ***අජ්ඣත්තං වචත්ථෙති*** ආධ්‍යාත්මිකයි කියන්නෙ. බාහිර කිසිම දවසක ඇහෙන් දැකපු රූපයක් මිසක ඇහැක් තියෙනවා නෙවෙයි.

මට ඇස් පෙනෙනවා නම් බාහිරෙන්, මේ ඇහැ නැතත් ඔය ඇස් වලින් මට පෙනෙන්න ඕනෙ. කෙනා කෙනාට සාපේක්ෂව ඇහැ කියන සිද්ධාන්තය තියෙන්නේ. **ඇහැ කියන එක ආධ්‍යාත්මික, පෙනීමේ කෘත්‍යය කරන, සිදු කරන ධර්මතාවයක් කියන කාරණාවෙන් දකින්න, ඇහැ කියන එක නම් කළේ, චක්ඛු කියන නම නම් කළේ පෙනීම් කෘත්‍යකින් මිසක තව රූපයකින් නෙවෙයි.** කෝප්පය වගේ රූපෙකට තව ඇහැ කියලා නමක් කිව්වා නෙවෙයි. අපිට අද ඇහැ තියෙන්නේ එහෙම. මේසය, කෝප්පය කියලා තව භාණ්ඩයක් නම් කරනවා වගේ, ඇහැට පෙනෙන රූපයක් අපි තව නම් කරලා 'මේ ඇහැ' කියලා. නමුත් නියම ඇහැ කියන එක පෙනීම් කෘත්‍යය සිදු කරන සිද්ධියයි කියන එක දකින්න කියන එකයි මේ ***චක්ඛුං අජ්ඣත්තං වචත්ථෙති*** කියන එකෙන් කිව්වේ.

දැන් අපිට ආයතන පහෙන් එකයි තාම කියාගන්න පුළුවන් වුණේ එතකොට අනෙක් ඒවත් ඔය වගේ දකින්න.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★

මෙන්න මේ ටික දැන ගත්තහම, ඔය පින්වතුන්ට දැන් දෙපැත්තක් හම්බ වෙනවා. අද අපිට හම්බ වෙන ඇහැ මෙබදු එකක්. නමුත් බුදුරජාණන් වහන්සේ ඇහැ ගැන මෙන්න මෙහෙම විස්තර ටිකක් පෙන්නලා තියෙයි. දැන් ඔය පින්වතුන්, බනිනවා නම් බනින්න වෙන්නේ මට නෙවෙයි, පිටකෙට. මොකද පිටකයේ තියෙන ටිකමයි මම ඔය කියන්නේ, ඔය ටික හරියටම දැක්කොත් ඇහැ මම හෝ මගෙ හෝ මගෙ ආත්මය හෝ ඇහැ සත්වයෙක් පුද්ගලයෙක් කියන කෙළේසය දුරු වෙනවා. ඇහැ පිරිසිඳ දකින කොට සමුදය දුරු වෙනවා. මම, මගෙ, මගෙ ආත්මය කියලා දකින කම හෝ ඇහැ සත්වයෙක් හෝ ඇහැ සත්වයෙක්ගෙ හෝ කියලා ගන්න කම දුරු වෙනවා. එයින් මම, මගෙ, මගෙ ආත්මයයි කියලා හෝ ඇහැ සත්වයෙක් හෝ ඇහැ සත්වයෙක්ගෙ හෝ කියලා කියන ගති ටිකට තමයි 'සමුදය සත්‍යය' කියලා කියන්නේ, කෙළෙස් ටික. ඇහැ පිරිසිඳ දකින කොට

ඇහැ මම, මගේ, මගෙ ආත්මය කියන ගති ටික දුරුවෙනවා. සමුදය සත්‍යය දුරුවෙනවා. නිරෝධය සත්‍යය සාක්ෂාත් වෙනවා. ඇහැ මගෙ කරගෙන මගෙ ඇහැක් නිසා විඳපු දුකෙන් එයා නිදහස් වෙනවා. එතකොට මග වැඩෙනවා කියලා, 'චතුරාර්ය සත්‍ය' ම දුක පිරිසිඳ දැක්කා, සමුදය දුරු වුණා, නිරෝධය සාක්ෂාත් වෙනවා, මග වඩනවා කියන හතරම එකට තියෙන්නේ. ඕක තමයි ලෝකෝත්තර සම්මා දිට්ඨි.

දැන් ඔය ටික අහගත්තා කල්‍යාණ මිත්‍ර ඇසුරෙන්, සද්ධර්ම ශ්‍රවනයෙන් කියලා කිව්වේ ඇහේ ඇත්ත අහගත්තා. අහගත්තට පෙනෙන්නේ නැහැ. පෙනෙන්නේ නැත්තේ බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ පාරමිතා සම්පූර්ණ වෙලා නැති හින්දා හෝ අභව්‍ය හින්දා හෝ පදපරම හින්දා හෝ නෙවෙයි. එහෙම වෙන්නේ නැහැ. හුඟක් වෙලාවට බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ නීවරණ ධර්මයන්ගෙන් මනස වැහිලා. ඒ හින්දා දැන් නොපෙනෙන දේ නොදන්නවා නෙවෙයි දැන් දන්නවා. දැන් එයාට ජීවිතයේ ඉලක්කයක් තියෙනවා, ඒ කියන්නේ 'සම්මා දිට්ඨිය' අහලා දැනගෙන තියෙනවා, සත් පුරුෂ ඇසුර, සද්ධර්මශ්‍රවණය කියලා කිව්වේ ඇහේ ඇත්ත ඇති හැටියේ අහගත්තා. දැන් අහගත්තා කිව්වට. පෙනෙන්නේ නැහැ. ඒ කියන්නේ මෙතන ඉඳගෙන ලංකාව කියලා එකක් තියෙයි ලංකාවෙ ලැබුනෝරුවකන්ද සේනාසනය කියලා එකක් තියෙනවා කියලා අහගත්තා. අහගත්තට පෙනෙන්නේ නැහැ. ඇයි ඒ? අහගත්තේ මෙතන ඉන්න ඔය පින්වතුන්නේ. ඊට පස්සේ එහෙනම් යන පාර අහගන්න වෙනවා, පාර අහගත්තත් පෙනෙන්නේ නැහැ. ඊට පස්සේ ඔය පින්වතුන්ට වෙනවා, අහගත්ත විදියට යන්න. ගිය තරමටයි පෙනෙන්නේ. ටික ටික ලංවෙන්නේ.

ඒ වගේ දැන් ඔය ඇත්ත ඇති හැටියෙ දකින තැනට මනස ගන්න ඔය පින්වතුන්ට සීල, සමාධි, ප්‍රඥා කියලා ත්‍රිශික්ෂාවක් තියෙනවා. සීලයක පිහිටලා, සමථ කමටහනක් වඩමින් මේ ස්කන්ධ, ධාතු, ආයතන ටික අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කරමින් විදර්ශනා කරනවා, භාවනා කරනවා, ඕක තමයි දැන් ඔය පින්වතුන්ගේ ත්‍රිශික්ෂාව, සීලයක පිහිටලා, සමථ කමටහනක් වඩමින් ඔය පින්වතුන් අනිත්‍ය වශයෙන් මෙනෙහි කරනවා, දුක් වශයෙන් මෙනෙහි කරනවා, අනාත්ම වශයෙන්, අසුභ වශයෙන් මෙනෙහි කරනවා.

(භාවනාවට වැඩි විස්තර මෙම පරිච්ඡේදයේ අවසානයට දක්වා ඇත)



(සටහන 1)

ස්පර්ශ ආයතනයන්ගේ ඉපදීමමයි ලෝකයේ හටගැනීම

මේ කාම භූමියේ ඉන්න සත්වයන්ට බෙහෙවින්ම ආත්ම දෘෂ්ඨිය පවතින්නේ මේ කබලිංකාරාහාරයෙන් හැදුණු රූපය තුළ. එතකොට **රූපය කියන ධර්මතාවයේ යථාභූත ස්වභාවය හරියට පිරිසඳ දැන ගත්තොත් අනාගාමී තත්වයට පත්වෙන්න පුළුවන්.** අපි මේ රූපයේ එක කොටසක් කතා කළා ඒ කියන්නේ 'ඇහැ' ගැන අපි කථා කළා. අපි අනෙක් ඕදාරික රූප ගැනත් ටිකක් කතා කරමු. අපිට බොහෝ කොටස් තියෙනවා විශාල ප්‍රදේශයක්, දැන් මේ රූපයේ ස්වභාවය නැත්නම් රූපයේ ලක්ෂණ ටික කතා කරලා ඊට පස්සේ තව ඒ රූපය තියෙන ගති ටිකකුත් තියෙනවා. ඒවත් කතා කළොත් තමයි හරියටම මේ රූපය කියන එක පිරිසඳ දැන ගත්තා වෙන්නේ. අපිට තේරෙන පමණකින් කාල වේලා තියෙන පමණකින් අපි රූපය ගැන කතා කරමු.

ඊකෙදි මම ගොඩක්ම උදව් කරගන්නවා, මේ පිටකය. එතැනදි බුදුරජාණන් වහන්සේ රූපයේ ඇත්ත ඇති හැටියෙන් යම්කිසි කෙනෙක් දකිනවා නම්, ඒ ඇත්ත ඇති හැටියෙ දකිනවා කියන කොට බුදුරජාණන් වහන්සේ මිම්මක් අපිට පනවනවා, පෙන්නලා තියෙනවා. ඊක තමයි මම මතක් කළේ, ඇහැ කියන එක අනිදස්සන දෙයක්. මහාභූතයන්ගේ උපාදාය රූපයක්. එවගේම අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයන්ගෙන් හට ගත්ත දෙයක්. පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුවම නිරුද්ධ වෙන දෙයක්. ආධ්‍යාත්මික දෙයක් කියලා. මේ වගේ ගති ටිකක් තියෙනවා, ඊකෙ ලක්ෂණ ටික අපි දැනගන්න ඕනේ කියලා තමයි අපි කතා කළේ.

එතකොට අද අපි කන, නාසය, දිව, ශරීරය කියන අනෙක් ආධ්‍යාත්මික ආයතන ටික ගැනත් කතා කරමු. ඊට පස්සේ රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ කියන බාහිර ටිකත් කතා කරමු. මෙතැන තව තියෙනවා, සුඛුම රූප දාහතරක් කියලා කොටසකුත්, ඉත්ථින්ද්‍රිය පුරුෂින්ද්‍රිය වගේ. ඒ ටික තේරුම් කරගන්න ඉස්සෙල්ලා අපි මේ ඕදාරික රූප, රළු මට්ටමේ රූප ටික තේරුම් ගත යුතුයි. එහෙම තේරුම් ගත්තහම සියුම් නැතිනම් සුඛුම රූප වල ස්වභාවය අපිට තේරුම් ගන්න පුළුවන්.

අපි කතා කරමු බලමු, ආධ්‍යාත්මික ආයතන ටික. මෙතැනදි මේ ආයතන ටික එකින් එක එකින් එක දැන ගත්තහම, මුලින් ඉගෙන ගත්තහම හැමදාම ඔය පින්වතුන් මේ ආයතනයක් ආයතනයක් ගානේ බලන්න ඕනේ නැහැ. ඒ හින්දා මේක මහ හරසර වැඩක් කියලා හිතන්න එපා. මේ ටික මුලින් ඉගෙන ගත යුතුයි. දැනගත යුතුයි. එතකොට

තමයි ඒ රූපවල අපිට අර තදින් ඇවිල්ලා තියෙන ආත්ම සංඥාව, ආත්ම දෘෂ්ටිය ගෙවෙන්නේ, අඩු වෙන්නේ.

ඊට පස්සේ මේ ඔක්කොම කැටි කරලා, කෙටි කරලා ඇහෙන් මෙහෙම බලනකොට සිහි නුවණ පවත්වන්න එක දර්ශනයක් විතරයි හම්බ වෙන්නේ. කනින් ශබ්දයක් අහන කොට, ඇත්ත සිහි කරන මාත්‍රයක් විතරක් යෙදෙන දර්ශනයක් හම්බ වෙනවා. ඊට පස්සේ මේ හැමදාම මේ ඔක්කොම එකක් එකක් ගානේ භාවනා කරමින් හිත වඩ වඩ ඒවා බලන්න ඕනේ නැහැ. හැබැයි මේ ටික මුලින් හොඳට දැනගෙන අහලා තිබුණාහම තමයි තමන්ට ඒ සත්ව පුද්ගල භාවයෙන් යුක්ත රළු කෙළෙසය අඩු වෙන්නේ. ඒ අඩු වුණාහම ක්‍ෂණිකව ඒ දර්ශණාත්මකව දැක්ක යුතු, අරමුණක් ගානේ දැක්ක යුතු මට්ටමට අපහසුවෙන් තොරව සිහි නුවණ යොදාගන්න පුළුවන්. ඒ නිසා මේ ටික අනිවාර්යයෙන්ම ඉගෙන ගත යුතුයි. ඉගෙන ගත්තහම, ඉගෙන ගත්ත කෙනාට ජීවිතයෙන් ඊට පස්සෙ 'දකිනවා අහනවා' කියන තැන සිහිකිරීම්, නුවණ යෙදීම් මාත්‍රයක් විතරයි අවශ්‍ය වෙන්නේ.

ඒ නිසා හැමදාම, හැමකාලෙම මේ එකක් එකක් ගානෙම, මේ විදියටම හිතන්න ඕනේ කියන කාරණාවක් නැහැ. ඒ නිසා ඒ ගැනත් එච්චර බයවෙන්න එපා. මේවා කොහොමද අපි තනියම ඔක්කොම හිතන්නේ කියලා. මෙතැන ඉස්සෙල්ලා නුවණක් තියෙන කෙනාට හොඳට තහවුරු කරනවා, මේ රූපය කියන එකේ ස්වභාවය මෙහෙමයි, මේක හැදිලා තියෙන්නේ මෙහෙමයි කියලා. එහෙම ගත්තහම ඇහැ මම නෙවෙයි, මගේ නෙවෙයි, මගේ ආත්මය නෙවෙයි කියලා වචනයෙන් කියනවා වෙනුවට, එයාට දකින්න සලස්වනවා නුවණින්, ඇත්තටම ඇහැ කියන්නේ මෙන්න මෙහෙම ධර්මතාවයක් කියලා. මේ දැකීමෙන්ම එයාට රළු කෙළෙසයක් අඩු වෙනවා. ඊට පස්සේ එයාට බොහොම පහසුයි මේ මට්ටමට එළඹෙන්න එක දර්ශනයකින්. ඒ හින්දා මේ හැම කොටසක්ම මේ විදියටම ජීවිතයෙන් හැමදාම බැලිය යුතුයි කියලා එකකුත් නැහැ. අපි ඉදිරියටත් කරගෙන යමු. එතකොට තේරෙයි.

ඊට පස්සේ, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා දිව ගැන,

දිව කියලා කියන්නේ,

ජිව්හා අජ්ඣත්තං වචන්රේති - දිව කියලා කියන්නේ ආධ්‍යාත්මික ධර්මයක් කියලා හොඳට හිතන්න.

අවිජ්ජා සම්භූතොති වචන්රේති - අවිද්‍යාවෙන් හටගත්ත එකක් කියලා හිතන්න.

කම්ම සම්භූතොති වචන්රේති, තණ්හා සම්භූතොති වචන්රේති, ආහාර සම්භූතොති වචන්රේති කර්මයෙන් හැදුණු, තණ්හාවෙන් හැදුණු ආහාරයෙන් හැදුණු දෙයක් කියලා හොඳට ව්‍යවස්ථාපනය කරන්න. ඒ කියන්නේ හිතනවා, තීරණය කරනවා. හොඳට හිතන්න, හොඳට තීරණය කරන්න.

ජිව්හා චතුන්නංච මහා භූතානං උපාදායාති වචන්රේති - දිව කියන්නේ සතර මහා ධාතූන් නිසා හටගත්ත රූපයක් කියලා බලන්න.

ජිව්හා අභූත්වා සම්භූතං භූත්වා න භවිස්සති - දිව පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුව නැතිවෙන දෙයක් කියලා දකින්න

ජිව්හා අන්තවන්තො වචන්ථෙති, අද්ධුවා වචන්ථෙති, අසස්වතො වචන්ථෙති, විපරිනාම ධම්මොති වචන්ථෙති - දිව කියන්නේ ආත්ම වුවක් නෙවෙයි කියලා බලන්න. කෙළවරක් ඇති බව නැති බවකින් කතා කළ යුත්තක් නෙවෙයි කියලා බලන්න.

අද්ධුවා - ඒ කියන්නේ ස්ථිර වූවක් නෙවෙයි කියලා බලන්න.

අස්සවතො - අසාස්වතයි කියලා කියන්නේ (සාස්වත කියලා කියන්නේ දිගින් දිගටම පවතින) දිගින් දිගටම නොපවතින ධර්මයක් කියලා බලන්න.

විපරිනාම ධම්මා - හැමවෙලේම වෙනස්වෙන ස්වභාවයෙන් යුක්ත ධර්මයක් කියලා දකින්න.

අනිත්‍ය දෙයක්, සංඛත දෙයක්
පටිච්ච සමුප්පන්න දෙයක්,

ඛය ධම්මා, වය ධම්මා, විරාග ධම්මා - කියලා බලන්න කියලා බුදුරජාණන් වහන්සේ පෙන්නනවා.

ඔය විදියට අපි කෙටි කරලා ගත්තොත්, නාසයටත් ඔය වචන ටිකමයි. ඊට පස්සේ කනටත්, ශරීරයටත් කියන ටික ඔය දිවට කියපු කාරණා ටිකමයි තියෙන්නේ.

ඉස්සෙල්ලම අපි ඒකෙ ලක්ෂණ ටික ඉගෙන ගනිමු. මේ ඔක්කොම ටික එකටම බලමු අපි. මොකද අනිත් ආයතන ටිකකුත් තියෙනවා අපිට කරන්න. අපි මුලින් ඇහැ ගැන කරපු පරියාය තියෙනවානේ ඒ ටිකම මේකට යොදා ගන්නත් පුළුවන්.ඒ නිසා මේ අපි කෙටියෙන් මතක් කරමු,

✶ ✶ ✶

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, දිව කියන එක අනිදස්සනයි, දකින්න බැහැ කවදාවත්. දැන් අපිට හිතෙන්නේ අපිට දිව කියන එක දකින්න පුළුවන් කියලනේ

නේද? නමුත් දිව කියන එක කවදාවත් පෙනෙන්නේ නැහැ. එතකොට නාසය, ඊගාවට කන, ශරීරය කියන මේ ධර්මතා එකක්වත් පෙනෙන්නේ නැහැ. අපි කියමු දැන් උප්පත්තියෙන්ම ඇස් අන්ධ කෙනෙක් ගත්තොත් එයාට කන කියලා අපිට වගේ කනක සටහනක් එහෙම පෙනෙයිද? නමුත් එයාට කන ඇහෙනවා නම්, කන තියෙනවා නේද? නමුත් එහෙනම් අපිටත් අද තියෙන කනේ ඇත්ත ඒ මට්ටමම තමයි. දැන් අද අපිට කන කියන කොට, ඇහෙනවට අමතරව කන ගැන දකින්න සිහි කරන්න නිමිත්තකුත් තියෙනවා නේ නේද? නමුත් කොටින්ම ඇස් අන්ධ කෙනෙක් ගත්තොත් එයාට ඇහෙනවා. නමුත් අපි දැක්කා වගේ එයාට නිමිත්තක් නැති වෙයිනේ? එතකොට එහෙනම් අපි කන කියලා දැනගෙන ඉන්න, දැක්ක රූපය ඇහෙන කෘත්‍යය කරන කන නෙවෙයි කියන එකට අපිට සාක්ෂියක්. ඒ නිසයි උපතින්ම ඇස් නොපෙනෙන කෙනෙක් හිටියොත් එයාටත් ඇහෙනවා. එහෙනම් අදත් ඒ මට්ටමමයි, අපිට ඇහෙනවා. නමුත් ඇහෙන කන පෙනෙන්නේ නැහැ.

ඒ වගේම නාසයත් එහෙමයි. දිවත් එහෙමයි, ශරීරයත් එහෙමයි, අන්දස්සනයි කියලා කියන්නේ, ඒ ඒ ආයතනයෙන් රස දැනගන්න, ගඳ දැනගන්න ස්පර්ශය දැනගන්න, කෘත්‍යය වෙනවා, නමුත් ඒවා පෙනෙන්නේ නැහැ. ඒවා ඔක්කොම අපි අර ඇහැ ගැන කිව්වා වගේ, සතර මහාධාතූන් නිසා පවතින රූප, කියන එක දකින්න ඕනේ,

අපි මතක් කළේ, චිත්‍රයක් බිත්තියක ඇන්දොත් චිත්‍රය කියන එක පෙනෙනවා, අල්ලන්න බැහැ. බිත්තිය කියන එක අල්ලන්න පුළුවන්, පෙනෙන්නේ නැහැ. ඒ වගේ අපි දිව කියන තැනට අත තිබ්බොත් මහාභූත ටික හැපෙයි මිසක දිව අහුවෙන්නේ නැහැ. පෙනෙන්නේ නැහැ. අල්ලන්න බැහැ. නමුත් රස දැනෙනවා. රස දැනෙන ටික අහුවෙන්නේ නැහැ. අහුවෙන ටිකට රස දැනෙන්නේ නැහැ.

කනත් එහෙමයි. කන කියනකොට ධර්මයේ සඳහන් වෙන්නේ, ඇත්තටම මේ එළියෙ තියෙන, කන් පෙත්ත කියලා කියන, අපි කනයි කියලා හිතාගෙන ඉන්න මේ ටිකට නෙවෙයි මේ ඇහෙන කෘත්‍යය වෙන්නේ. ඇතුළෙ තියෙන අර කන්බෙරය කියලා කියන්නේ, ශබ්ද සංඝාදාවකට, ශබ්ද රූපයකට ස්පර්ශ වෙන විදියට, කම්පන මාත්‍රයක් තේරුම් ගන්න පුළුවන් විදිහේ සියුම් ප්‍රසාද ගතියටයි කන කියලා කියන්නේ.

නාසය පෙන්වන්නෙත් අපි මේ උඩ නාසය කියන ටික නෙවෙයි, නිකම් එළු කුරයක් වගේ. තියෙන සියුම් ප්‍රසාද ස්වභාවය.

ඊට පස්සෙ කය කියන කොටත් අපි තේරුම් කරගන්න ඕනේ. මේ අපි හිතාගෙන ඉන්න ඇහැට පෙනෙන මේ මුළු රූපයම එහෙම නෙවෙයි කය කියන්නේ. කය කියන කොට ඒ ඒ අවස්ථාවට හම්බ වෙන ඉතාම සියුම් තැනක්. අපි දැන් මේසය හරි මොනවා හරි

දෙයක් ඇල්ලුවොත් ඇස් දෙක වහගෙන ඇල්ලුවා කියන්නකො, දැන් පෙනෙන්නේ නැහැ. අල්ලනකොට මේසෙ අහුවෙන ඇඟිලි තුඩු ටිකක් තියෙයිනේ. ඒ ඇඟිලි තුඩු කියලා අන්න ඔච්චරයි ඒ වෙලාවට අපේ කය. කයයි පොට්ඨබ්බයයි නිසා කාය විඤ්ඤාණය කියලා අපි කියනවනේ, වැදුණු හැටියේ අපට තේරෙනවානේ. එතකොට අල්ලපු ටික තේරුනා කියලා අපි ඇඟිලි තුඩකින් මේසෙ කොනක් නම් ඇල්ලුවේ, පොට්ඨබ්බය එතැනයි දැන් අපිට, මේසෙ කියන තැන රූපය. එතකොට කය වෙන්නේ අපිට, කය පෙනෙන්නේ නැහැ. ඒකත් ඒ පොට්ඨබ්බයට යටවෙලා, වැහිලා. ඒ දෙන්නා නිසා කාය විඤ්ඤාණය උපදිනවා. ඒ කියන්නේ අපිට යමක් ගෑවුණු බව දැනෙනවා නේ, එතකොට ඒ දැනෙන්නේ මුළු ඇඟටම නෙවෙයිනේ නේද? ඔච්චරමයි කය ඒ වෙලාවට, ඒ ස්පර්ශය ඉවරවෙන කොට දැන් ඒ කයත් ඉවරයි.

ඒ වගේ අරමුණක් අරමුණක් ගානේ ඉතාම සියුම්, හැම වෙලාවෙම කය කියන එක ඒ ඒ අරමුණෙන් අරමුණට වෙනස් වෙනවා. එතකොට කාය විඤ්ඤාණය උපදින්න හේතු වුණු, කාය විඤ්ඤාණයට ආධාරක වුණු තැනයි හැම වෙලාවෙම කය වෙන්නේ. **එහෙම නැතුව එලඹ සිටින, සම්පූර්ණ අත පය හතරක් තියෙන කයත් එහෙම නැහැ යථාර්ථයට.** අපි මේ ඇහෙන් දකින රූපය කයයි කියලා හිතාගෙන ඉන්නේ. එතකොට ඒ වගේ මේ මහාභූතයන් නිසා පහළවෙන ප්‍රසාද ටික දකින්න **උපාදාය රූප** කියලා.

රස දැනෙන කොටයි ඒ දිව උපදින්නේ. ශබ්ද ඇහෙනවා කියන්නේ කන උපන්නා. ගඳ සුවඳ දැනෙනවා කියන්නේ නාසය උපන්නා, ස්පර්ශයක් දැනුණා කියන්නේ කය උපන්නා. පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුවම නැති වෙනවා කියලා කියන්නේ, අපිට ඇහෙන ශබ්දය නැති වෙනවා කියන්නේ ඒ කනත් නැහැ. ගන්ධය දැනෙන්නේ නැහැ කියලා කියන්නේ නාසය නැහැ. රස දැනෙන්නේ නැහැ කියන්නේ දිව නැහැ. දැන් ඒ පොට්ඨබ්බය දැනෙන්නේ නැහැ කියන්නේ කයක් නැහැ.

හැම වෙලාවෙම බාහිර ධර්මතා ටික තේරුනා කියලා කියන්නේ ආධ්‍යාත්මික වස්තු උපන්නා කියන එක. අධ්‍යාත්මික වස්තු නැති වුණා කියන්න තියෙන ලක්ෂණය තමයි, ඒ බාහිර වස්තු ටික අපේ දැනුම් පරාසයේ නැහැ. ඒ නිසයි හටගෙන නැති වෙනවා කියලා කියන්නේ.

✶ ✶ ✶

තව විස්තර වැඩිපුර ඕනෙ නම් තේරුම් ගන්න. මම ඇහැ ගැන මතක් කරපු පරියාය. මම බොහොම කෙටි කරලා මතක් කළේ ඒ ටික. **මේ ආධ්‍යාත්මික ටිකේ නෙවෙයි අපිට ගොඩක් සංයෝජන ලෙහාගන්න හේතුටික තියෙන්නේ බාහිර ගෝචර ධර්මතා ටිකේ.**

ගෝචර ධර්මතා ටික පිරිසිඳ නොදන්නා කම හරහායි, ආධ්‍යාත්මික සංයෝජනයකුත් අපිට තියෙන්නේ. ඒ හින්දා විශේෂයෙන්ම අපි තේරුම් කර ගත යුත්තේ බාහිර ආරම්මණ හය ගැනයි. මොකද හැම වෙලාවෙම අපිට තණ්හාව කියන එක ඇති වෙන්නේ රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, පොට්ඨබ්බ තණ්හා, ධම්ම තණ්හා කියලා බාහිර ආයතන හය හරහායි. ජීවිතයට තණ්හාව කියන එක එකතු වෙන්නේ. එතකොට බාහිර ආයතන හය පිරිසිඳ නොදකින කම නිසාම ආධ්‍යාත්මික සංයෝජනයක් අපිට තියෙන්නේ. නැත්නම් ආධ්‍යාත්මික ටිකේ කෙළෙසයක් අමුතුවෙන් ඇති වෙන්න ඉඩක් නැහැ. ආධ්‍යාත්මික ටික තියෙන්නේ පුරාණ කර්මයට හටගත්ත විපාක මට්ටමක. ඒ ටිකෙන් උපද්දපු නිමිති ටිකේ ඇත්ත නොදන්නා කම නිසයි, ආධ්‍යාත්මික ටිකේ අපේ මනස අද දවසේදි බැඳිලා තියෙන්නේ. ඇහැ ගැන අමුතුවෙන් කෙළෙසයක් අපිට නැහැ. රූපය හරියට පිරිසිඳ නොදැක්ක නිසයි, මගෙ ඇහැත් මේ වගේ කියලා අපි රැවටිලා හිතා ගෙන ඉන්නේ. කන ගැනත් අපිට හම්බ වෙලා නැහැ. ඒකෙන් වෙන කෘත්‍යය ටික තමයි පෙන්නුවේ ඇත්ත කියලා. නමුත් ඒ කන ගැන තණ්හා, මාන, දිට්ඨි කියලා ඇති වෙන නිමිති ඇති වෙලා තියෙන්නේ අපිට, ශබ්දය නිසයි. බාහිර ආයතන ටික පිරිසිඳ නොදකින නිසයි.

ආධ්‍යාත්මික බාහිර යැයි නොබෙදිය හැකි බාහිරමවූ 'රූපායතනය'

ඒ නිසා අපි අද දවසෙදි බාහිර ආයතන ටික ගැන විශේෂයෙන් කතා කරමු. ඒ ටික තමයි ඇත්තටම අපිට අවශ්‍ය වෙන්නේ. ඒකට කියනවා **ගෝචර නානත්ව ඥාණය** කියලා. මොකද තණ්හාව කියන එක පවතින්නේ, ඔන්න ඔය රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, ... කියන බාහිර ආයතන ටික මුල් කරගෙනයි. බාහිර ආයතන වලට කියන තව නමක් තමයි. ගෝචර ධර්ම කියලා. එතකොට ඒ ගෝචර ධර්මයන් ගැනත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා,

රූපය කියන්නේ,

- ***රූපං බහිද්ධා වවත්ථෙති*** - බාහිර එකක්,
- අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයන්ගෙන් හටගත්ත එකක්.
- සතර මහාධාතූන්ගේ උපාදාය රූපයක්
- උපන්න එකක්
- පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතිවම නැතිවන එකක්.

- ***අන්තමන්තෝ*** - රූපය කෙළවරක්
- ***අද්ධුවා*** - ස්ථිර එකක් නෙවෙයි
- ***අසාස්වතෝ*** - ව්‍යාපාර ණයක් තියෙන දිගින් දිගටම යන එකක් නෙවෙයි.
- විපරිණාම ස්වභාවයෙන් යුක්ත ධර්මයක්
- අනිත්‍ය ස්වභාවයෙන් යුක්ත ධර්මයක්
- සංඛත ධර්මයක්
- හේතූන්ගෙන් හටගත්ත ධර්මයක්
- ක්ෂය වෙන ධර්මයක්
- නිරෝධයට යන ධර්මයක්.

කියලා දකින්න කියලා පෙන්වනවා.

එතකොට රූපය ***බහිද්ධාවා වවත්ථෙති*** - රූපය බාහිරයි කියලා හොඳට තීරණය කරන්න කියලා කියනවා. එතකොට අපි තේරුම් ගනිමු ඉස්සෙල්ලා ඇයි රූපෙට බාහිරයි කියන්නේ කියලා. එතකොට ඒකෙදි දැන් අර අපි යම්කිසි කෙනෙක් දිවුරුමක් අරගෙන දිවුරලා පොරොන්දු වෙනවා වගේ, ඉස්සර වෙලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා හොඳට තීරණය කරන්න, වෙනස් වෙන්නෙ නැතුව හොඳට පිහිටලා හිටින්න. මොකක්ද රූපය කියන එක හැම වෙලාවෙම තමන්ගෙන් පරිබාහිර ධර්මතාවයක්, බාහිර වුවක්. ඒ කියන්නේ ඇහැ ආධ්‍යාත්මිකයි, රූප කියලා කියන්නේ ඇහැට පෙනෙන වස්තුවක් මිසක, රූප කියන එක ඇහැ වගේ ආධ්‍යාත්මික, නැත්නම් තමන්ගේ ජීවිතයට සම්බන්ධ වුණු සිද්ධියක් එහෙම නෙවෙයි. දැන් ඇහැ නම් තමන්ගේ ජීවිත ඉන්ද්‍රිය හා සම්බන්ධයි, ජීවිතය එක්ක සටිතව තියෙන්නේ, ජීවිතය එක්ක යෙදිලා තියෙන්නේ. ඒ හින්දා ඇහැ ආධ්‍යාත්මිකයි කියලා කියනවා. ඒ **ආධ්‍යාත්මික ඇහෙන් දකින රූපය හැම වෙලාවෙම බාහිර වස්තුවක් කියලා හොඳට තීරණය කරන්න, කියලා කියනවා. ඒක හොඳට තීරණය කළහම ලොකු කෙළෙසයක් ගෙවෙනවා.**

මොකද අපි මේ ඇහැ ආධ්‍යාත්මිකයි, රූපය බාහිරයි කියන දෙක පිරිසිඳ නොදන්න කම නිසා, බාහිර රූපායතනය දෙකට බෙදාගෙන තියෙනවා, ආධ්‍යාත්මික රූප සහ බාහිර රූප කියලා. ඒ කියන්නේ දැන් අපි ඇහෙන් අපි (තමන්) දිහා බැලුවහම මේ පෙනෙන රූපයට කියනවා ආධ්‍යාත්මික රූපය කියලා. මෙහෙම බාහිර (ඉදිරියෙන් ඇති) දෙයක් දිහා බැලුවහම කියනවා මොකක්ද, බාහිර රූපය කියලා. දැන් රූපය බාහිරයි කියලා, වෙනස් වෙන්නේ නැතුව ස්ථාවර බවකින් ඉස්සෙල්ලා හොඳට තීරණය කර ගන්න කියනවා. ඇහැ තමයි ආධ්‍යාත්මික, රූපය කියන එක හැම වෙලාවෙම බාහිරයි කියලා.

රූපය බාහිරයි කියන කාරණාව හොඳට තේරුනොත් ඔය පින්වතුන්ට, තමන් කියලා ජීවිතයක් ඇහෙන් දකින්න හම්බ වෙන්නේ නැහැ. ඇයි දැන් මෙහෙම තමන් දෙස බැලුවොත් ඇහැට සාපේක්ෂව මොකක්ද මේ? බාහිර රූපයක්. බාහිර රූපෙක 'තමන්ගේ ජීවිතය' තියෙනවද? නැහැ. ඇහැට මෙහෙම බැලුවම මේසෙ දැන් මේ තියෙන පොත්පත් බාහිරයි. මේ පොත්පත් ඇතුළෙ තමන්ගේ ජීවිතය තියෙනවද, තමන් ඉන්නවද? නැහැ. **එහෙනම් ඒ ඇහෙන් බලන මේ රූපය ආධ්‍යාත්මික, බාහිර කියලා බෙදන්න බැහැ, යථාර්ථයට. එකම රූපයමයි.** බාහිර මේ කෝප්පයකට මම කියලා කිව්වොත් ඒ වගේ හරියට මේ පෙනෙන එකටත් මම කියලා කියන එක. එතකොට තමන් කියලා බලන්න සිහිකරගන්න මේ පෙනෙන දෙයින් අමතරව යමක්, සිහිකරන්න යමක් හම්බ වෙන්නේ නැහැ. **අපිට මේ පෙනෙන (තමා ලෙස සලකන) රූ සටහන ඇහැට පෙනෙන බාහිර වස්තුවක් වුණොත්, එතකොට ඉඳගෙන, හිටගෙන, ඇවිදින, නිදාගෙන, ඉන්න තමන් කෙනෙක් දකින්න බැරි වෙනවා.** තමන්ගේ කියලා හතර ඉරියව්වක් දකින්න බැරි වෙනවා.

දැන් ඉඳගෙන ඉන්න චිත්‍රයක් ඇඳලා තිබුණොත්, ඒකෙදිත් අපිට ඉඳගෙන ඉන්නවා කියලා දකින්න පුළුවන්නේ, පෙනෙනවා. නමුත් අපි යටින් දන්නවා චිත්‍රය කියලා. ඒකද, **මේ චිත්‍රයට (තමා ලෙස සලකන) අපි ඉඳගෙන ඉන්නවා හිටගෙන ඉන්නවා කියලා පනවලා තියෙනවා මිසක, ඒ තුළ සැබෑ ඉඳගෙන ඉඳීමේ කෘත්‍යයක් තියෙනවා එහෙම නෙවෙයි. *බහිද්ධාවා චවත්ථෙති*** කියලා කිව්වේ, බාහිරයි කියලා කිව්වම ආධ්‍යාත්මික සංයෝජනයන්ගෙන් එයා මිදෙනවා.

මතකද අපි එක කාලයක් කතා කළා සමචිත්ත පරියාය සූත්‍රය කියලා. ඒකෙදි ආධ්‍යාත්මික සංයෝජන තියෙනවා නම් ඒකට කියන්නේ, ඕරම්භාගිය සංයෝජන කියලා. එතකොට බහිද්ධා කියලා කියන්නේ, උද්ධම්භාගිය සංයෝජන කියලා අපි මතක් කළා. ඒ කියන්නේ දැන් එකම **රූපායතනය තුළ අපිට ආධ්‍යාත්මික පැත්තක් හම්බ වෙන තාක් තමයි අපි කාමාවචර මට්ටමේ ඉන්නේ,** එතකොට මම කියලා රූපයක් අපිට විද්‍යමානයි. පුද්ගලයෙක් ඉන්නවා. බැරිවෙලා ***බාහිද්ධා* කියලා බාහිර රූපය හොඳට පිරිසිඳ දැක්කොත්, ආධ්‍යාත්මික කය අතුරුදහන් වෙනවා අපිට කබලිංකාරාහාරයෙන් අපි මිදෙනවා. මේ කබලිංකාරාහාරය මම කියලා දකින්න මිම්මක් නැති වෙනවා නේද?** ඒ හින්දා බුදු රජාණන් වහන්සේ රූපය කියන එක ***බහිද්ධා චවත්ථෙති*** කියලා පෙන්වනවා.

බහිද්ධා චවත්ථෙති කියන එකේ හොඳට තමන් වෙනස් නොවන ස්ථිර තත්වයක ඉන්න ඕනේ, ඒ අදහසේ. ආයේ ආධ්‍යාත්මික රූප කොහේවත් තියෙන්න බැහැ. රූප ගැන, ඇහැට පෙනෙන රූප ගැන, මම මේ කියන්නේ. ඇහැ ආධ්‍යාත්මික වෙන්න

පුළුවන්. නමුත් සනිදස්සන රූපය, දකින්න පුළුවන් ඇහෙන් දකින රූප ගත්තහම, ඒවා බාහිරමයි කියලා හොඳට දකින්න. එතකොට මේ කෙලෙස්, අපේ රළු කම, දැඩි කම හින්දා අපිට ඒක තේරෙන්නේ නැහැ. ඇඟට දැනෙන්නේ නැහැ. අපිට දැනෙන්නේ නැහැ, මේ මගෙ කය බලන්න පුළුවන් වගේ, මේ පෙනෙන රූපය මගේ - ආධ්‍යාත්මිකයි, මේවා අනුන්ගේ - බාහිරයි, කියලයි තේරෙන්නේ. ඔය කෙළේසයකට ඔය බෙදුම තියෙන්නේ. කෙළේසය අඩු වුණාහම, එකම අරමුණ ආධ්‍යාත්මික බාහිර කියලා බෙදන්න බැහැ. බෙදන්න බැරි තැනකට එනවා.

අන්තිමට **යථාර්ථය, සත්‍යය තමයි, එහෙම ප්‍රභේද නැහැ. එකම දර්ශනයක් විතරයි තියෙන්නේ, පෙනෙනවා කියන තැන කුමන ධර්මයක් පෙනුනත්, පෙනුනම තමයි. ඒ පෙනීම ආයෙ ආධ්‍යාත්මික පෙනීම, බාහිර පෙනීම කියලා නැහැ. තමන්ව පෙනෙනවා, අනුන්ව පෙනෙනවා කියලා එහෙම ඒවා නැහැ. පෙනීම එකමයි කියන තැනකට එනවා.**

එතකොට ඔන්න ***බහිද්ධා චවත්ථෙති*** කියන එකෙන් පෙන්වනවා, තමන්ට රූපායතනයෙන් ආධ්‍යාත්මික දේවල් දකින්න බැහැ කියලත් පෙන්වනවා. ඒ කියන්නේ රූපය බාහිරම නම්, ආධ්‍යාත්මික ඇස් එහෙම දකින්න බැහැ. ඒ කියන්නේ දැන් කණ්නාඩිය ළඟට ගිහිල්ලා අපි හිතාගෙන ඉන්නේ, ඇහැ බලන්න පුළුවන් කියලනේ, නේද? එහෙනම් බාහිර වස්තුවකින් ආධ්‍යාත්මික දේ දැක්ක හැකිද? බැහැ. එහෙනම් ඒකෙන් පෙන්වනවා, ඒ රූපයම තමයි තියෙන්නේ කියලා,

රූපය බාහිරයි කියන කාරණාවෙන් බාහිර රූපයෙන් කවදාවත් ඇහැ දකින්න බැහැ කියන කාරණාව කියනවා. කණ්නාඩියක් ගාවට ගිහිල්ලා, වතුරක් ගාවට ගිහිල්ලා තව කෙනෙක් ඉස්සරහ තියාගෙන ඇහැ දකින්න බැහැ. ඇහැ කියලා අපි පනවාගත්ත, මේ ඉදිරියෙන් පෙනෙන දේට අපි කෝප්පය කියලා කියනවා වගේ, ප්‍රඥප්තියකින් තව රූපයක් නම් කරගෙන තියෙනවා විතරයි. හොඳට තේරුම් ගන්න ඕනේ, අපිට දැන් මේ පෙනෙන සටහන කෝප්පය කියලා නම් කරනවා වගේ, ඇහැට පෙනෙන රූපයක් මේ ඇහැ කියලා නම් කරගෙන තියෙන්නේ.

එතකොට රූපය බාහිරයි කියන කාරණාවෙන් කරුණු දෙකක් කියනවා. ආධ්‍යාත්මික වස්තු කවදාවත්ම දකින්න බැහැ. රූපායතනය ආධ්‍යාත්මික බාහිර වශයෙන් බෙදන්න බැහැ කියන එකක් කියනවා.

ඉතින් එතැනදි ඇත්තටම සත්‍යය අවබෝධයක් කියලා කියන්නේ, **මේක තමයි ලෝකයේ ඇත්තටම ඇති ඇත්ත. මේ ඇත්ත දැක්කහම ඒ දැකීමටමයි කෙළෙස් නැති**

වෙන්නේ. මේ ඇත්ත දැකලා ඒ ඇත්ත දැකීමෙන්ම කෙළෙස් නැති වෙනවා මිසක, මේ කෙළෙසය නැති කරගන්න මේ ඇත්ත නොදැක, වෙන කුමන දෙයක් කෙරුවත් හරියන්නේ නැහැ. අපි කියමු මේ රූපය බාහිරමයි, ඒක ආධ්‍යාත්මික බාහිර කියලා බෙදන්න බැහැ කියන ඇත්ත ඒ විදියටම දකින්නෙ නැතුව, අපි මේ බෙදීම තුළ ඉඳගෙන මේ ආධ්‍යත්මික රූපය, අනිත්‍යය වශයෙන් බලනවා, දුක් වශයෙන් බලනවා, අනාත්ම වශයෙන් බලනවා, බාහිර රූප අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, අනාත්ම වශයෙන් බලනවා කියන කොට, අපි අවිද්‍යාව ඇතුළෙම තව උත්සාහයක් මේ තියෙන්නේ කියන කාරණාව තේරුම් ගන්න.

අද දවසේ අපහසු වුණාත් හරි දේට ටික ටික හරි උත්සාහවත් වෙන්න. ජීවිතේ අන්තිම මොහොතකදි හරි පින්වතුන්ට මේක නිබර දෙයක් වෙනවාමයි. නමුත් අපි මොනවා හරි දෙයක් කළොත් ඇත්තටම අපිට මේ වටිනා අවස්ථාව අත හැරෙනවා.

මේ රූපය කියන එක පිරිසිඳ දැක්කහම මහා විශාල කෙළේසයක් අත හැරෙනවා. ඒ කියන්නේ ආධ්‍යාත්මික ජීවිතය කියන තැනින්, මේ කබලිංකාරාහාරයට තමා කියලා හිතන්න පුළුවන්, දුක්වෙන්න පුළුවන්, කෙළෙස් වලින් තමන් මිදෙනවා.

මොකද දැන් අද අපි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, ලෝකයා එක ස්පර්ශයකින් දෙපාරක් දුක් විඳිනවා කියලා. අපි නිකමට කියමු මේ ඇහැට මොනවා හරි වැදුනොත්, යකඩ කෑල්ලක් හරි මොකක් හරි වැදුණා කියන්නකො. කාය ස්පර්ශය නිසා එන දුක් වේදනාවත් විඳිනවා, ඇහැ නැති වුණා කියලා වෙනම දුකකිනුත් දුක් විඳිනවා. ඒ කියන්නේ කයට දැනෙන දුක් වේදනාවත් විඳිනවා. ඇහැට මෙහෙම වුණා කියන තැනකිනුත් දුක් විඳිනවා. රහතන් වහන්සේ නමකට කයට දැනෙන දුක නිසා වේදනාවක් එනවා මිසක, ඇහැ තුවාල වීම නිසා දුක විඳින්නේ නැහැ. එහෙම දුක් විඳින්න ඇහැ ගැන නිමිති නැහැ.

මෙතැනදි සත්‍යය අවබෝධ කරනවා කියලා කියන්නේ, ඒ ඇත්ත ඒ ආකාරයෙන්ම දකින්න ඕනේ. ඒක දැක්හම බොරුව නිසා එන දුක් ටික ඔක්කොම නැති වෙනවා. මේ එකම බාහිර රූපායතනය පිරිසිඳ නොදන්නාකම නිසා ආධ්‍යාත්මික රූපයකුත් බෙදාගත්තා නම් ඒක කෙළේසයක්. එතකොට ආධ්‍යාත්මික, තමන්ගේ ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන තැනකින් අපි දුක් විඳිනවා. දැන් මගෙ මූණ කැතයි කියලා හෝ මගෙ මූණ අවලස්සනයි කියලා හෝ මගෙ මූණේ කුරුලෑ කියලා හෝ කෙනෙක් දුක් විඳිනවා නම් බලන්න මේ සම්පූර්ණ රූපායතනයක් නිසා විඳින සම්පූර්ණ පීඩනයක් තියෙන්නේ, නේද? මම කළු හම තියෙන කෙනෙක් අනිත් කෙනා සුදු හම තියෙන කෙනෙක් කියලා එකම බාහිර රූපායතනය තුළ කෙළේසෙකින් දුක් විඳින්නේ.

එතකොට ඒ බාහිර රූපායතනය පිරිසිඳ නොදන්නාකම නිසා ඇති වුණු ආධ්‍යාත්මික බාහිර කියන මිම්මක් තියෙයි නම් ඒ අවිද්‍යාව ඇතුළෙ තියෙන්නේ. ඒ රූපායතනය ගැන තියෙන යථාභූත ස්වභාවය නොදන්නා කම නිසානෙ. මොකද මම මේ කියන්නේ මගෙ අදහසක් එහෙම නෙවෙයි, මම පිටකයම ගෙනාවේ ***රූපං බහිද්ධා වවත්ථෙහි*** - රූපය බාහිරයි කියලා හොඳට තීරණය කරන්න කියන එකෙන් කියනවා, මොන විදියටවත් ආධ්‍යාත්මික රූප නැහැ කියන එක. දැන් ඒ රූපය, **බාහිර වර්ණ සටහන** කියන එක ඒ ආකාරයෙන්ම තේරුම් අරගෙන මේ කෙළෙසයෙන් මිදෙන්න ඕනේ මිසක, ඒ කෙළේසයෙන් මිදෙන්න ඒ කෙළේසය නැති කරන්න ආයෙ වෙන ක්‍රම නැහැ. මොකවත්ම ක්‍රම නැහැ.

ඒකයි මම හැමදාම කියන්නේ, මොනවා හරි දෙයක් කරන්න එපා, මෙතෙන්ට එන්න බොහෝ ක්‍රම ඇති. අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් අනාත්ම වශයෙන්, මම මේ නැවත නැවත කියන්නේ මේක පටලවා ගන්න එපා කියන එක. ඒ හින්දා ඕනෙම භාවනාවක් කරන්න. ආනාපාන සතිය වඩන්න, බුදු ගුණ වඩන්න, අසුභය වඩන්න, මරණානුස්සතිය වඩන්න, එහෙම නැත්නම් අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්න. හැබැයි ඔය පින්වතුන් දැනගන්න ඕනේ. මේ උපායක් නීවරණ ධර්‍ම දුරු කරන්න, මේ ඇත්ත ඇති හැටියේ දකින තැනට මනස ගන්න. **මේ එකක්වත් ඇත්ත නෙවෙයි. 'සම්මා දිට්ඨිය' නෙවෙයි කියන කාරණාව. මේ ඇත්ත වෙන එකක්, ත්‍රිලක්ෂණය මෙනෙහි කරන එක වෙන එකක්,** කියන කාරණාව පෙන්නන්න පිටකයෙන්ම. **එහෙම මෙනෙහි කරලා ඇත්ත දකින තැනට ගිහිල්ලා ඇත්ත දැකලා, කළකිරිලා, මිදෙනවා කියන සම්පූර්ණ ප්‍රතිපදාව තියෙයි.** එතකොට මේක සම්පූර්ණ සහේතුක වෙන විදිහට පෙන්නන්නේ.

මේ ඇත්ත ඒ ආකාරයෙන්ම අවබෝධ වුණොත්මයි ඒ කෙළේසය ගෙවෙන්නේ. දැන් රූපය බාහිරයි කියන කාරණාව ඔය පින්වතුන්ගේ නුවණටම පෙනුණ දවසට, ඔය පින්වතුන්ටම තේරෙනවා ආධ්‍යාත්මික කියලා බලන තැනත් බාහිර රූපයි කිව්වහම මම කෝ, මගෙ රූපය කෝ, කියන අදහසක් එයි. හොඳට නුවණින් බැලුවහම තමන්ට තමන්ගේ රූපය කියලා, යමක් පනවගන්න බැරි තැනකට එනකල් එනවා. එතකොට ඊට මෙහා මේ අනවබෝධය නිසා, දුක් විඳින ලෝකයක් ඔය පින්වතුන්ට පෙනෙයි, පංච උපාදානස්කන්ධ දුක, කියන එක. එතකොට ඔන්න ***බහිද්ධා වවත්තේති.***

මහාභූත පටලය මත විද්‍යාමාන වන උපාදාය රූප (වණ්ණ සටහන්)

ඊගාවට අපිට පෙනෙන මේ රූපය සවිඤ්ඤාණක, අවිඤ්ඤාණක කතාවක් නැහැ. ඇත්තටම යථාර්ථය ගත්තහම රූප වලට සවිඤ්ඤාණක, අවිඤ්ඤාණක කතා නැහැ යථාර්ථය. උපාදාය රූපයක් කියන තැන ගත්තහම සවිඤ්ඤාණක අවිඤ්ඤාණක කතාවක් නැහැ. මේ ටික පෙන්නන්න ඉස්සෙල්ලා මම රූපායතනයේ ලක්‍ෂණ ටික පෙන්වන්නම්.

අපිට පෙනෙන රූපායතනයක තියෙන ලක්‍ෂණ ටික තමයි 'මහා භූතයන්ගේ උපාදාය රූප' කියලා කියන කොට, 'උපාදාය' කියලා කියන්නේ, මම ඕකට මිම්මක් කිව්වේ, දැන් අපි ලොකු වතුර භාජනයක් අරගෙන මෙතනින් තිබ්බොත්, මේ ඉදිරියෙන් තියෙන මේසෙ ප්‍රතිබිම්බය වතුරට වැටෙන්නේ නැති වෙයිද? ආලෝකයත් තියෙනවා නම් වතුර භාජනය අපි තිබ්බොත් මේ වතුර තුළ, ළඟ තියෙන වස්තුවක ඡායාවක් පතිත වෙයි නේද? හොඳට බලන්න ඒ වතුර භාජනයේ පතිත වෙලා තියෙන ඡායා රූපය දිහා. ඒ ඡායා රූපයේ තියෙන්නේ වතුරද? නැහැ. එහෙනම් ඒ භාජනයද? නැහැ. දැන් වතුර භාජනයට ඡායා රූපයක් පතිත වෙලා තියෙයි, නමුත් වතුරවත්, භාජනයවත් ඒක නෙවෙයි. දැන් මේ ඡායා රූපය, ඡායාව අපිට ඇහැට පෙනෙනවද? පෙනෙනවා. නමුත් අල්ලන්න පුළුවන්ද? ඇල්ලුවොත් අපි අල්ලන්න අත දැම්මොත්? අත වතුරෙ හැපෙනවා මිසක, මොනම විදියටවත් අල්ලන්න පුළුවන් වෙයිද? බැහැ. හොඳයි ඔය පින්වතුන්ට මේ ඡායාව ඔසවලා ගත්ත හැකිද? ඕනෙනම් වතුර භාජනය ඔසවන්න පුළුවන් ඔසවන කොට ඡායාව එසවෙනවා වගේ පෙනෙයි, ඡායාව ඔසවලා ගන්න බැහැ. කවදාවත්ම බැහැ. ඔය ඡායාව තුළ තියෙනවද ඔය පින්වතුන්ගේ ජීවිතය වර්ණවත් කරන්න පුළුවන්, වාසනාව උදාකරලා දෙන්න පුළුවන් වස්තු තියෙන්න පුළුවන්ද ඒ ඡායාවේ? නිකම් හීනෙකින් දකින රූපයක් වගෙයි ඕක නේද? දකින්න විතරමමයි පුළුවන්, එහෙම නැත්නම් මොන විදියකට හෝ අවාසනාව, අප්‍රසන්න බව ගෙනත් දෙන හතුරු වූ රූප තියෙයිද? නැහැ එතකොට හරියටම චුට්ටක්වත් සැකයක් නැතුව, ඒ වතුරකට පතිත වුණු ඡායාවේ මිම්ම හොඳට හිතට ගන්න. ඒ මිම්මමයි මේ ඇහැට පෙනෙන රූපයන්ගේ තියෙන්නේ. උපාදාය රූප කියනකොට. එක දශමයක්වත් වෙනසක් නැහැ.

එතකොට අර ඡායාව වතුරෙ පතිත වෙලා තියෙනවා වගේ, මේ පෙනෙන රූප ඡායාව පඨවි ධාතුවේ පතිත වෙලා තියෙන්නේ. අර පෙනෙන දේ පෙනෙනවා, ඒ වගේම මේ පෙනෙන දේත් පෙනෙනවා, පෙනෙන දේ අල්ලන්න අත දැම්මොත් වතුරෙ අත හැපෙනවා වගේ, ආපෝ ධාතුවේ අත හැපෙනවා වගේ, මේ පෙනෙන දේ අල්ලන්න අත

දැම්මොත් පඨවි ධාතුවේ අත හැපෙනවා මිසක, කවදාවත් පෙනෙන දේ අහුවෙන්නේ නැහැ. ඔය පින්වතුන්ට මහාභූත ටික ඔසවන්න පුළුවන්, වතුර බේසම ඔසවන්න පුළුවන්, **නමුත් ඡායාව ඔසවන්න බැහැ. ඔය පින්වතුන්ට ඡායාව එසවෙනවා වගේ පෙනෙවා එතකොට මෙතන තියෙන මහාභූත ටික ඔසවන්න පුළුවන්, එතකොට ඔය පින්වතුන්ට දකින දේ එසවෙනවා වගේ පෙනෙයි. මෙතන තියෙන මහාභූත ටික ඉවත් කරන්න පුළුවන්. එතකොට පෙනෙන දේ ඈතට යනවා වගේ තේරෙයි. පෙනෙන දේ ඈතට යනවා වත්, ලඟට එනවා වත්, පෙනෙන දේ ඔසවනවා වත් පහත් කරනවා වත් නෙවෙයි ඒ එක්ක තියෙන මහාභූත ටිකේ චලිතයයි ඔය** වෙන්නේ, තේරුනා නේද?

නමුත් පෙනෙන රූපය අපිට පෙනුනට, **ඒ රූපය පතිත වෙලා තියෙන මහාභූතයන්ගේ චලිතය නිසා පෙනෙන වස්තුව දුරට යනවා, ලඟට එනවා, සෙලවෙනවා වගේ පෙනුනත්, පෙනෙන වස්තුව එහෙමමයි තියෙන්නේ.** ඒකට මොකුත් වෙලා නැහැ, ඒ එක්ක තියෙන මහාභූත ටිකේ චනලය කියන එක අපිට තේරෙන්නේ නැතිකම හින්දා පෙනෙන දේ යනවා, පෙනෙන දේ එනවා, පෙනෙන දේ ගන්න පුළුවන්, ඔසවන්න පුළුවන්, වගේ තැනකින් තමයි අපි ජීවත් වෙන්නේ. දැන් වතුර භාජනය අරගෙන අපි අහකට ගියොත් ඔන්න පෙනෙන දේ ටිකක් අහකට යනවා වගේ තේරෙයි, ඒ ඡායාව ළඟට ගත්තොත් පෙනෙන දේ ළඟට එනවා වගේ තේරෙයි. **නමුත් පෙනෙන දේ විතරක් වතුරෙන් වෙන් කරලා ඔසවන්න පුළුවන් වෙයිද?** කීයටවත් බැහැ.

ඒ නිසා උපාදාය රූපය කියන එක දකින්න මහාභූත නිසා, මහාභූත ඇසුරු කරගෙන වතුර නිසා, වතුර ඇසුරු කරගෙන මේ ඡායාව තියෙන්නේ. වතුරෙන් වෙන්ව මේ ඡායාව තියෙයිද? නැහැ ඒ කියන්නේ වතුර නෙවෙයි මේ පෙනෙන්නෙ ඡායාව, නමුත් වතුර නැතුව තියෙයිද? නැහැ.

ඒ වගේ මේ පෙනෙන 'වණ්ණ සටහන' මහාභූත නෙවෙයි, නමුත් මහාභූත නැතුව තියෙන්නේ නැහැ. මේ පෙනෙන ඡායාව කිසිම වෙලාවක ඔය පින්වතුන්ට ඔසවලා ගන්න බැහැ. කිසිම වෙලාවක දුරට යවන්න බැහැ. ළඟට ගන්න බැහැ. මොකුත් කරන්න බැහැ. ඔය පින්වතුන් ඒ රූපයේ යථා ස්වභාවය තත්වාකාරයෙන් නොදන්නා නිසා, පෙනෙන දේට ප්‍රතික්‍රියා දක්වන්න පුළුවන් වගේ තැනකින් ඉන්නේ, නමුත් ඔය පින්වතුන් මහාභූත එක්කයි මේ හැප්පෙන්නේ. ඔය පින්වතුන් සතර මහාධාතුව එක්කයි ජීවත් වෙන්නේ. සැප දුක් විඳින්නේ සතර මහාධාතුවෙන්, **මේ පෙනීම් මාත්‍රයක් විතරයි. නමුත් පෙනෙන දෙයින් සැප දුක් විඳිනවා වගේ තැනකින් රැවටිලා ඉන්නවා, අවිද්‍යාව කියන්නේ ඒකේ ඇත්ත ඇති හැටියෙන් නොදකිනවා කියන එකයි.**

එතකොට වතුර භාජනයකට පතිත වුණු රූපයක නිමිත්ත හොඳට හිතට ගන්න, ඒකම මිම්මක්, ඒ මට්ටමම මිම්මක්, මේ ඇහැට පෙනෙන හැම වස්තුවක්ම. ඔය පින්වතුන්ට මුළු ජීවිතයම සැපවත් වෙන රූප මේ තුළ තියෙනවා නෙවෙයි. ජීවිතයම කාළකණ්නි කරන අප්‍රසන්න රූප මේ තුළ තියෙනවා නෙවෙයි. ඒ රූපය නොදැකීම නිසා ඊට සමගාමීව අපේ මනසේ ප්‍රපංච, කෙළස් යෙදෙනවා. ප්‍රිය පුද්ගලයෝ, අප්‍රිය පුද්ගලයෝ කියන සංඥා අපේ මනසේ උපදින ආශ්‍රව ධර්‍ම. මේ ඇස් ඉදිරිපිටට එන්නේ, අර රූප මාත්‍රයක් විතරයි. ක්‍ෂණිකව ඒ එක්කම මනෝ විඥ්ඥාණය මට්ටමින් පුද්ගලයෙක්නේ, කෙනෙක්නේ කියන කෙළේසය අපේ හිතේ යෙදිලා. මේ කෙළේසය පිරිහෙන්නෙත් නැහැ, නූපන්න කෙළේසය උපදිනවා, උපන් කෙළේසය එන්න එන්න වැඩෙනවා, මේ ඇත්ත නොදකින්න නොදකින්න. මේ ඇත්ත දැක්කොත් පුද්ගලයෙක්, මනුස්සයෙක් කියලා උපන් කෙළේසයක් තියෙනවා නම් ඒක දුරුවෙනවා, නූපන් කෙළේසය නූපදින තත්වයට පත්වෙනවා. වෙන කිසිම ක්‍රමයක් නැහැ, මේ රූපය පිරිසිඳ දකිනවා ඇරෙන්න වෙන ගොඩයන්න.

එතකොට ඔන්න ඕක තමයි උපාදාය රූප කියලා කියන්නේ, විශේෂයෙන්ම දැන ගන්න ඕනේ මේ වර්‍ණ සටහන. මොකද ජීවිතයේ ගොඩාක් කෙළෙස් එකතු වෙන්නේ මේ ඇහෙන් දකින රූපය හරහායි. ඔන්න වර්‍ණ සටහන කියලා අපට හම්බ වෙන තැනක, උපාදාය රූපයක් කියනකොට, අර වතුර භාජනයක තියෙන ඡායා මට්ටමම දකින්න.

එකටම ඉපිද එකටම මියයන (නිරුද්ධවන) ආධ්‍යාත්මික සහ බාහිර ආයතනයෝ

ඊට පස්සෙ රූපය ***අවිජ්ජා සම්භූතං, කම්ම සම්භූතං, තණ්හා සම්භූතං, ආහාර සම්භූතංති වවත්ථේති.*** මෙන්න හොඳ කාරණාවක් බලන්න. දැන් අපි ගොඩක් දෙනෙකුට ප්‍රශ්නයක්නේ, ලෝකයා ආයතන ටික උපද්දවාගෙනයි පරිහරණය කරන්නේ කියලානේ මම හැමවෙලාවෙම මතක් කරන්නේ. නමුත් අපේ අදහස තියෙන්නේ, **රූප ලෝකයේ තියෙනවා තියෙන රූප අපි ඇහෙන් දකිනවා, කියලානේ නේද? රූප ලෝකයේ තියෙනවා තියෙන රූප අපි ඇහෙන් දකිනවා කියලා. අපි ඉපදෙන්න ඉස්සෙල්ලා මේ රූප තිබුණා. එතකොට තියෙන රූප බලමින් ඉන්නවා, අපි කම්වූ පරිදි මැරිලා යනවා, නමුත් අපි දකින රූප මෙහෙමම තියෙනවා කියලා.**

නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා 'මේ ආයතන ටික හටගත්ත දවසෙයි රූප ටික උපන්නේ, ආයතන ටික තියෙන කල් රූප ටික තියෙනවා, ආයතන ටික නැති වෙන කොට රූප නැති වෙනවා' කියලා, දැන් එතකොට හොඳ අදහසක්.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ රූප ටික හැදෙන්නේ අවිද්‍යාවෙන් කර්‍මයෙන්, තණ්හාවෙන්, ආහාරයෙන් කියලා. ඒ කියන්නේ මේ වටාපත, මේ කෝප්පය අවිද්‍යාවෙන්ද හැදිලා තියෙන්නේ? අපි හිතාගෙන ඉන්නේ මේ අපේ ජීවිතයට සම්බන්ධ නැතුව බාහිර භෞතික වස්තුවක් කියලානේ. ඒක අපි පිටකයෙන්ම ගනිමු, මේකට දැන් කව්රුහරි මොනවා හරි කිව්වොත්, මට නෙවෙයි ඒක දෝෂෙ කියන්නේ, පොතටයි හරිද? පටිසම්භිදාමග්ගයේ ඥාණ කථා වල දාසයවෙනි ගෝචර නානත්ව ඥාණය, ***රූපං අවිජ්ජා සම්භූතං වවත්ථේති*** - රූපය අවිද්‍යාවෙන් හැදුනු එකක්. ***රූපං කම්ම සම්භූතංති වවත්ථේති*** - රූපය කර්‍මයෙන් හැදුනු එකක්. ***රූපං තණ්හා සම්භූතංති වවත්ථේති*** - රූපය කියන්නේ තණ්හාවෙන් හැදුණු එකක්, ***රූපං ආහාර සම්භූතේති වවත්ථේති*** - රූපය ආහාරයෙන් හැදුණු එකක්.

මේ පෙනෙන රූප කොහොමද අවිද්‍යා, කර්ම, තණ්හා ආහාරයන්ගෙන් හැදුනේ. ඒකට නිමිත්තක් තමයි මොකක්ද, අපි මතක් කළා අවිද්‍යා, කර්ම, තණ්හාවෙන් තමයි විඥ්ඥාණය මවු කුසකට බැසගත්තේ. කන බොන ආහාරයෙන් තමයි, මහාභූත රූපය හැදුණේ. මේ දෙන්නා එකට එකතු වුණු නිසයි, ප්‍රසාද ටික පිහිටියේ. නාම-රූප වුණා කියන්නේ ප්‍රසාද ටික පිහිටියා. **ඒ ඇහෙන්ම මෙබඳු රූප සටහන් හදලා පෙන්වන හින්දා, ඇහෙන් නම් මෙබඳු රූප පෙන්වන්නේ, දැන් රූප ඇති වෙන්න තියෙන හේතු ටිකට කියන්න වෙන්නේ, ඇහැ හැදුණු හේතු ටිකමයි. මොකද මේ රූප අපිට මෙහෙම පෙනුනට, මෙබඳු රූප හැදෙන්න වෙන ක්‍රමයක් නැහැ.** මේ රූප, ඇහැ නිසයි පෙනෙන්නේ. ඇහැ නැත්නම් රූපයකින් ඔය පින්වතුන්ට සැප දුක් විඳින්න පුළුවන්ද? රූප තියෙනවා, මට පෙනෙන්නේ නැහැ කියලා කතාවක් තියෙයිද? **රූප තියෙනවා මට පෙනෙන්නේ නැහැ කියලා කියන්න හරි රූපයක අත්දැකීමක් තියෙන්න එපායැ නේද?** රූපය කියන කාරණාව, හැම වෙලාවෙම හම්බ වෙන්නේ ඇහැ මුල් කාරණාව කරගෙනමයි.

එතකොට ඇහැ කියන කාරණාවෙන් තමයි, මේ වර්‍ණ සටහනක් මෙබඳු රූපයක් උපද්දලා පෙන්වන්නේ. අපිට හම්බ වෙන, අපි සැපදුක් විඳින රූපයේ, ඇති වීම කියන්න වෙන්නේ අවිද්‍යාව, කර්ම, තණ්හා ආහාරයන්ගෙන් හට ගන්නවා කියලයි. මොකද ඇහැ හට ගත්තේ ඔය ටිකෙන් නම්, ඇහෙන් නම් මෙබඳු රූපයක් හදලා පෙන්වන්නේ. අපි කියමු දැන් ඇලුමිනියම්, යකඩ, වීදුරු ටික දාලා අපි කණ්නාඩියක් හදාගන්නවා රතු පාටට. රතු

පාට කණ්නාඩිය හැදෙන්න හේතු වුණේ මොකක්ද? වීදුරුවකුයි, රතු පාට ඉටිකොල කෑල්ලකුයි, යකඩ කෑලි ටිකකුයි කියලා කියන්නකෝ. ඒ රතු පාට කණ්නාඩියෙන් බලන කොට බාහිරේ රතු පාට වෙලා පෙනෙනවා නම්, දැන් බාහිර රතු පාට බව පෙනෙන්න තියෙන හේතු ටික මොකක්ද කියලා ඇහුවොත් ඔය පින්වතුන්ට කියන්න වෙන්නේ මොකක්ද? කණ්නාඩියේ තියෙන හේතු ටිකම මිසක, යකඩ කෑලි ටිකයි, ඉටි කොල ටිකයි, වීදුරු කෑල්ලයි, නිසා බාහිරය රතු පාට වෙලා තියෙනවා කියලා ඇහැ ආවරණය කරපු හේතු ටිකම කියන්න වෙනවා මිසක බාහිරයට, බාහිර රූපය රතු පාටයි කියලා වෙන ප්‍රත්‍යයක් තියෙයිද පෙන්වන්න? නැහැ. ඇයි ඒ? ඇහැට තමයි දාගත්තේ. නමුත් ඒකෙ කෘත්‍යය පෙනෙන්නේ බාහිරෙන් නේද? එතකොට බාහිර රතු පාට වුණේ බාහිරේ රතු පාට හින්දා නෙවෙයි. ඇහැ රතු පාට වුණු හින්දා. ඇහේ ආවරණය රතු පාට වුණු නිසා. ඇහේ ආවරණය රතු පාට වුණාහම ඒකෙන් ඇහැ රතු පාටටද පෙනෙන්නේ? නැහැ පෙනෙන රූපයයි රතු පාට වෙන්නේ.

එතකොට හොඳට දකින්න, ඇහේ මිම්ම රූපයට තියෙන මිම්ම. ඇහැ හැදිලා තියෙනවා නම් ප්‍රත්‍ය ටිකකින්, ඒ ටික තමයි රූපයට කියන්න තියෙන ප්‍රත්‍ය ටික. දැන් රතු පාට කණ්නාඩියෙන් බැලුවහම බාහිරේ රතු පාටට පෙනෙනවා නම්, බාහිර රතු පාට රූපයකට තියෙන හේතු ටිකක් ඔය පින්වතුන් කතා කරන්න ගියොත් ඒක මොන තරම් බොරුවක් වෙයිද? මොකද එහෙම එකක් නැහැ. ඒක රතු පාටට පෙනෙන්නේ තමන් ගාව තියෙන කණ්නාඩියේ පාටින්. එතකොට තමන් ගාව තියෙන ඒ කණ්නාඩිය හැදුණු පාට ටික මේකට කියන්න වෙනවා මිසක. වෙන ක්‍රමයක් තියෙයිද කියන්න, නැහැ, ඒ නිසා **රූපායතනයට කියන්න වෙන්නෙත් මොකක්ද? අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයන්ගෙන් හැදිලා තියෙන්නේ කියලා.**

එතකොට ඊළඟට දකින්න, තමන්ගේ ආයතන ටිකෙන්ම උපද්දපු ලෝකයක් තුළ තව සත්තු පුද්ගලයෝ ඉන්නවද කියලා හිතන්න. ඉන්න පුළුවන්ද කියලා? **අපිට හිතෙන්නේ බාහිර ලෝකයක් තියෙනවා කියන තැනකින් ගත්තොත් නම් සත්වයෝ පුද්ගලයෝ දකින්න පුළුවන්, දකිනවා කියන තැනකින් ඉන්න පුළුවන්. නමුත් දැන් පෙනෙන රූපායතනයෙන්ම තමන්ගේ ජීවිත ඉන්ද්‍රියෙන්, ජීවිතය තුළින් නම් ඉපැද්දුවේ, තමන්ගේ ජීවිතය තුළ තව සත්තු පුද්ගලයෝ ඉන්නවද? ඒකයි මේකෙ කෙළවරට යනකොට ඉතාම සියුම්, ශුන්‍යතා දර්ශනයක් බවටම පත්වෙනවා. තවම මේක තේරෙන්නේ නැත්තේ මේකෙ වටිනාකම, මේකෙ බරසාරකම අපිට තේරෙන්නේ නැත්තේ අපේ මනස ඉතාම රළු මට්ටමක තියෙන්නෙ. මේ මට්ටමට ආවහම ජීවිතයේ කෙළෙස් තියා දුක කියන එකේ ඡායා මාත්‍රයක්වත් රැඳෙන්න තැනක් ඉතුරු වෙන්නේ නැහැ මේ දර්ශණයෙන්. එයාගෙ ජීවිතය කියන්නේම ධම්තාවයක් වෙනවා.**

නමුත් එතෙන්ට එන්න තියෙන්නේ ඒ ඇත්ත ඇති හැටිය, ඔය තියෙන ස්වභාවය ඒ ආකාරයෙන්ම දැකලා මිසක වෙන ක්‍රමයක් නැහැ. එතකොට රූපය අවිද්‍යා, කර්‍ම, තණ්හා ආහාරයන්ගෙන් හැදුනේ කියලා කියන්නේ අන්න ඒ නිසයි. කණ්නාඩිය හැදෙන්න හේතු වුණේ ඉටිකොල, වීදුරු, යකඩ කෑලි ටිකක් නම් ඒ නිසා දාගත්ත කණ්නාඩිය රතු පාට වුණා නම්, රතු පාට කණ්නාඩියෙන් බලන කොට බාහිර වස්තු රතු පාටට පෙනුණා නම්, බාහිර වස්තු රතු පාට වෙලා පෙනෙන්න තියෙන හේතුව මොකක්ද කියලා ඇහුවොත්, බාහිර රතු රූපයක් හැදෙන්න හේතුව මොකක්ද කියලා ඇහුවොත්, කියන්න වෙන්නේ කණ්නාඩියේ තියෙන කෑලි ටික වගේ කියලා දකින්න.

ස්පර්ශ ආයතනයන්ගෙන් උපද්දවා පරිහරණය කරන පෙර නොතිබීමම හටගත් ලෝකය

ඊට පස්සේ, ***රූපං අභූත්වා සම්භූතං, භූත්වා න භවිස්සතී*** - රූපය කියලා කියන්නේ පෙර නොතිබීම හටගෙන, ඉතුරු නැතුවම නැති වෙන එකක්. එතකොට දැන් ඔය අපිට පෙනෙන මට්ටමේ රූප වලට නෙවෙයි ඕක කියන්නේ. ඔය වචනෙ අයිති. අපිට පෙනෙන මට්ටමේ රූප වලට නම් කියන්න වෙන්නේ, නැත්නම් ලෝකය තුළ නම් කියන්න වෙන්නේ, 'දකින්න පෙරත් තියෙනවා තියෙන දේම දකිනවා, දැක්කයින් පස්සෙත් තියෙනවා' කියන මට්ටම තමයි අපිට කියන්න, වෙන්නේ කතා කරන්න වෙන්නේ, අපි ඉන්නේ.

නමුත් පෙනෙන රූපය කියන එක වතුරට වැටුණු ඡායා මාත්‍රයක් කියන මට්ටමට නුවණ එන කෙනෙකුට, ඒක අල්ලන්නවත් බැහැ, ඔසවන්නවත් බැහැ, පෙනෙන දේ දුරට යන්නේ නැහැ. ළඟට ගන්න බැහැ, ඔසවන්න බැහැ කියන තැනකින් ගතිටික හොඳට තේරෙන කෙනෙකුට, **'පෙනෙන දේ උපද්දලා පෙන්වන්නේ ඇහෙන්' කියලා තේරෙන මට්ටමට ආවහම එයා දකිනවා 'දකින්න ඉස්සෙල්ලා මෙහෙම රූපයක් නැහැ. දකින වෙලාවේදිත් ඇහෙන් උපද්දලයි මෙහෙම රූපයක් පෙනෙන්නේ, අවස්ථාවට හටගෙන නැති වෙනවා'** කියලා පෙනෙනවා.

ඔන්න ඔය රූපායතනයේ ගතිටික හොඳට දකින්න. රූපායතනය හොඳට පිරිසිද දැක්කහම ඔය පින්වතුන් ඉබේමයි චක්ඛායතනයෙන් මිදෙන්නේ. **බාහිර වස්තු පිරිසිඳ දැකලා ආධ්‍යාත්මයෙන් මිදෙන්න පුළුවන්.** ඒ කියන්නේ ඔය පින්වතුන්ට තේරෙනවා

ඇහැ දකින්න බැහැ කියන එක නේද?

ඇත්ත ඇති සැටි නොදන්නා කම නිසා මංමුලාවූ අසරණ ලෝකයා

ඊට පස්සේ ඔය රූපය වගේම දකින්න ශබ්දයටත්. ශබ්දයටත් ඔය වචන ටිකමයි තියෙන්නේ. ශබ්දය ***බහිද්ධා වවත්ථෙති*** හොඳට තහවුරු කරගන්න, ස්ථාවර වෙන්න පිහිටලා හිටින්න, හොඳට තීරණය කරන්න. 'ශබ්දය කියන එක බාහිරමයි' කියලා ඒකෙන් කියනවා, ආධ්‍යාත්මික ශබ්ද නැහැ. දැන් අපිට අද, තමන් කතා කරන ශබ්දය, ආධ්‍යාත්මික ශබ්දය. අනෙත් ඒවා බාහිර ශබ්ද කියලනේ අපි හිතාගෙන ඉන්නේ. නමුත් **කනට සාපේක්‍ෂව මේ හැම ශබ්දයක්ම බාහිරමයි. ආයෙ ශබ්ද වල ආධ්‍යාත්මික ශබ්ද බාහිර ශබ්ද නැහැ.** එතකොට මම මෙහෙම කිව්වානේ, මට මෙහෙම කියවුණානේ, මට මෙහෙම ශබ්දයක් ඇහුනනේ කියලා මේ ශබ්දයට ආධ්‍යාත්මික ශබ්දයකින් විඳින්න තියෙන දුක් ටික නැහැ. අර අපි කිව්වේ ආධ්‍යාත්මික රූපයක් දැකලා මම කළුයි, මගෙ මුහුණ කැතයි කියලා විඳින්න තියෙන දුක් ටිකක් තියෙයි නම් ඒක එයාට නැහැනේ බාහිර රූපය දැක්කහම. ඒ වගේ මගෙ කටහඬ ලස්සන නැහැ, මට හොඳට කවි කියන්න බැහැ, මගෙ කටහඬ මිහිරි නැහැ, කියලා ඔය වගේ දුක් ටිකක් එනවා නම්, දැන් මේ 'මගෙ' කටහඬ නිසයි, ආධ්‍යාත්මික ශබ්ද නිසයි ඔය ප්‍රශ්නෙ ශබ්දය තමන්ගේ වුණු නිසයි. කටහඬ කියන එක තමන්ගේ වෙන්න බැහැ. වෙන්නේ නැහැ. ඒ කියන්නේ අපි දැක්කා කන ආධ්‍යාත්මික දෙයක්. නමුත් ශබ්දය කියන එක පරිබාහිර ජීවිතයක්, ගහක් කොලක් සුලඟට වැනෙන කොට ශබ්දයක් එනවා නම් ඒ ශබ්දය තුළ තමන්ගේ ජීවිතය තියෙයිද? නැහැ. එහෙනම්, මොන විදියටවත් ශබ්දය කියන එක තමන්ගේ ජීවිතය හා බැඳිලා නැහැ. ශබ්දය කියන එක බාහිරමයි.

මේක හරියට දැක්කහම, ඒ ටික පිරිසිඳ දැක්කහම දුක් ටික ගෙවෙන්නේ ඉබේමයි. දැන් ශබ්දයකින් දුක්වෙන්න තියෙන ඉඩ නැහැ. කී දෙනෙක් මොන විදිහට දුක් විඳිනවා ඇද්ද තමන්ගේ කටහඬ නරක නිසා. තමන්ගෙන් පිට වුණු වචන නිසා. තමන්ට කියවුණු දේවල් නිසා. කී දෙනෙක් වෙහෙසෙනවා ඇද්ද තමන්ගේ කටහඬ හදාගන්න. **මේවා ඔක්කොම කෙළෙස් නිසා ඇති වෙන කාරණා. කෙළෙස් නිසා මොන තරම් වෙහෙසකට පත්වෙනවද ලෝකය කියන එක බලන්න. මේ මුළු ලෝකයම කෙළෙස් නිසා පීඩා විඳින්නේ. කෙළෙස් කියන කොට වෙන මොකුත් නෙමෙයි සම්මා දිට්ඨි නැති කම, ඇත්ත ඇති හැටියේ නැති කම.**

එතකොට ආධ්‍යාත්මික බාහිර දෙකට බෙදන්න බැහැ, කියලා යම් කාලෙක දැක්කොත්, එයාට ශබ්දය කියන එක බාහිරමයි කියලා දකිනකොට, තමන්ගේ ශබ්දයෙන් සැපදුක් විඳිනවා කියන එකෙන් මිදෙනවා. ඔන්න ශබ්දය බාහිරයි කියලා දකිනවා. ඊට පස්සෙ ටේප් රෙකෝඩරයකින් (tape recorder) හෝ නැත්නම් මොනවා හරි පටියකින් තමන්ගේ ශබ්දය අහන්නත් බැහැ කියලා එයා දන්නවා. කොහොම ඇහුවත් ශබ්දය කියන එක බාහිරමයි. සජීවීව කතා කෙරුවත්, අජීවීව කතා කෙරුවත්, ශබ්දය කියෙන එක බාහිරමයි. එදාටයි ශබ්දය තුළ තමන් නැත්තේ. රූපය බාහිරමයි කියලා දැකපු දවසටයි, රූපය එක්ක තමන් නැත්තේ, රූපය තුළ තමන් නැත්තේ. ශබ්දය කියන එක බාහිරයි කියලා දැකපු දවසටයි ශබ්දය එක්ක තමන් නැත්තේ. තමන් ශබ්දය එක්ක නැත්තේ. එතකොටයි ශබ්ද තණ්හාව නැහැ කියලා කියන්නේ. අමුතුවෙන් තණ්හාවක් ඕනේ නැහැ, ඒ වස්තුව අත නොහැර ඒක එක්ක ජීවත්වෙන කම්ම තණ්හාව කියලා දකින්න.

දැන් රූප ශබ්දයකට වෙන අමුතුවෙන් තණ්හාවක් ඕනෙ නැහැ. ඒ ශබ්දය තුළ තමන්ගේ වෙලා, ශබ්දය තමන්ගෙ වෙලා ඉන්න කම්ම තණ්හාව. තමන්ගේ කියලා යමක් තියෙයි නම් ඒක තණ්හාව නෙවෙයිද? තමන් ඉඳීමම ජීවිතය, තණ්හාව. දැන් ඔය පින්වතුන්ට දරුවො ඉන්නවා, වාහන තියෙනවා, ගෙවල් දොරවල් තියෙනවා. ඕවා තියාගෙන ඉන්න කම්ම, සංයෝජන.

රහතන් වහන්සේලටත් දරුවො ඉන්නවා, වාහන තියෙනවා, ගෙවල් දොරවල් තියෙනවද? නැහැ. සංයෝජන නැහැ. **ඒ කියන්නේ මේ රළු මට්ටම. තව ඕවා අත හැරලා මනසින් ජීවත් වෙනවා කියන කොට ඒත් කෙළේසයක් තියෙනවා.** ඊට ටිකක් සියුම්ව. දැන් කෙළේසයත් තියෙනවා වස්තුත් තියෙන කොට ඔතන වස්තු කාම, ක්ලේශ කාම, දෙකම තියෙනවා. වස්තු අත හැරලා ඒ අරහයා තියෙන ආසාව නැති වෙලා නැහැ කැලේක හිටියත්, එතකොට ක්ලේශ කාමය තියෙනවා කියනවා, වස්තුයි, කෙළේසයයි දෙකම අත හැරුණු දවසට තමයි කාමයන්ගෙන් මිදුණා කියලා කියන්නේ. අපි ශබ්දයක් තියෙන කොට, ශබ්දය තුළ තමුනුත් ඉන්න කොට, වස්තු කාම, ක්ලේශ කාම දෙකේම ඉන්නෙ.

අපිට කාමය කිව්වහම, පරියාය සහ නිශ්පරියාය කියලා දෙකක් තියෙනවා මේ ශාසනයේ. පරියාය කියලා කියන්නේ එක ක්‍රමයකට. නිශ්පරියාය කියන්නෙ ඔක්කොම ටික අහුවෙන විදියට, ඒකට ප්‍රභේද නැහැ. අපි මෙහෙම කිව්වොත් ***සබ්බේ සත්තා මරිස්සන්ති*** කියලා, සියළුම සත්වයෝ මැරෙණවා කියලා කිව්වහම ඒක නිශ්පරියායක්. දැන් අමුතුවෙන් කියන්න ඕනෙ නැහැ මනුස්සයො ගැන දෙවියො ගැන, බ්‍රහ්මයො ගැන, තිරිසන් සත්තු ගැන. ඔක්කොම සත්තු මැරෙනවා. 'මනුස්සයො මැරෙණවා' කියලා

කිව්වොත්, දැන් මේ වෙලාවෙදි පරියායකින් කතා කරන්නෙ. මනුස්සයන්ගෙ මරණය ගැන විතරයි කතා කලේ. අනෙක් අය ගැන කතා කරන්නේ නැහැ මේ වෙලාවෙ. දෙවියොත් මැරෙණවා කියලා කිව්වොත් පරියායක් නේද? බ්‍රහ්මයෝ මැරෙණවා කියලා කිව්වොත්, ඒක පරියායක්. එතකොට දෙවියොත් මැරෙණවා, මනුස්සයොත් මැරෙණවා, බ්‍රහ්මයොත් මැරෙණවා, කියලා කිව්වහම පරියායක්. ඒ වගේ අපිට මොනවාම හරි දෙයක් ගැන පරියාය සහ නිශ්පරියාය කියන දෙකකින් කතා කෙරුව හැකි.

කාමය කියන කොට ගෙවල් දොරවල් ගැන, යාන වාහන ගැන, මොනවා හරි දෙයකින් කතා කරන කොට, පරියායකින්. ආයතන ටික තියාගෙන ඉන්නවා කියන කොට, නිශ්පරියායකින්. කාමය ඔක්කොම තියෙනවා කියන එක කියනවා. ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන ටික කෙනෙකුට තියෙනවා කියන කොට පංච කාමය තියෙනවා කියන එකට තව නිර්වචනයක්. මේ ටික කාම භූමියේ ඇසුරු වෙන්නේ. ඔය ටික තියෙනවා කියන්නේ, එයාට ගෙවල්, දොරවල්, යාන වාහන, ඉඩකඩම්, මිල මුදල්, කියලා, ඇහැට පෙනෙන දේ කනට, නාසයට, දිවට, ශරීරයට, හම්බ වෙන දේවල් වල එකක් දෙකක් විස්තර කරලා තමයි දරුවෝ ඉන්නවා, ගෙවල් දොරවල් තියෙනවා, යාන වාහන තියෙනවා, කියලා කිව්වේ. මේවා ඔක්කොම තියෙනවා කියන කොට මේ ආයතන ටික තියෙනවා කියන කොට, ඒවත් තියෙනවා, ඊට අමතරව තව යම්තාක් සංයෝජන තියෙනවා නම් ඒවත් තියෙනවා කියන එක කියනවා. කාම ලෝකයේ සංයෝජන තව නැති වෙලා නැහැ එයාට. ඒ කිව්වේ එයාට දරුවෝ නැති වෙන්න පුළුවන්. කෙනෙක් දරුවෙකුට ඇති වෙන විදිහේ සංයෝජන මෙයාට තවම දුරුවෙලා නැහැ.

මෙතන ප්‍රශ්නෙ තියෙන්නේ දරුවාද කාරෙකද කියන එක නෙවෙයි. **ද්‍රව්‍යයේ නෙවෙයි ප්‍රශ්නෙ තියෙන්නේ ඒ දරුවා හෝ කාරෙක හෝ පරිහරණය කරන කොට ඇති වෙන මානසික මට්ටමක් තියෙනවා නම් ඒකටයි කෙළෙසය කියන්නේ, සංයෝජනය කියන්නේ. දෝෂය තියෙන්නේ එතැන මිසක ද්‍රව්‍යයේ නෙවෙයි.** මේ ආයතන ටික ඇසුරු කරන කොට මෙයාගෙත් ඒ මට්ටම තියෙයි නම්, ඇහැට තියෙනවා නම්, එයා වාහනේට බැඳිලා තියෙන මට්ටමම මෙයාට ඇහැට තියෙයි නම් දෙන්නම එක තැනක ඉන්නේ. මොකද සංයෝජනය කියන එක නැති කරලා මේ ද්‍රව්‍ය ටික තිබුණාට ප්‍රශ්නයක් නැහැ.

දැන් සුද්ධෝදන රජ්ජුරුවෝ රහත් වුණොත් මාලිගාවේ ඉඳලා. නමුත් එයාට එකක්වත් කාම වුණේ නැහැනේ. හැබැයි හොඳට මතක තියාගන්න ඕනේ, එයා අත හැරියේ **ඇහැ, කන, දිව, නාසය, ශරීරය. ඒ ටික අත හැරිලා බාහිරය අතහැරලා තියෙනවා මිසක, අපි හිතාගෙන ඉන්න විදියට මේ ඇහැ, කන, දිව, නාසය, ශරීරය තියෙද්දි බාහිරය අත හරිනවා කියන තැනකින් කාමය අත හැරියා වෙන්නේ නැහැ. කියන එක දකින්න. ඇහැ,**

කන, දිව, නාසය, ශරීරය අත හරින්නේ නැතුව මම ඔතැනින් කාරෙක දරුවා ගෙවල් දොරවල් අත හැරියා කියලා, එවෙලෙට අත හරියි, නමුත් හෙට දවසෙදි, වෙන දවසකදි, වෙන තැනකදි, වෙන දෙයක් අත හරින්න තියෙන හේතුව අත හැරිලා නැහැ. නමුත් මම ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන තැනකින් අත හැරියොත්, ඔක්කොම ටික අත හැරෙනවා. ඒකයි නිශ්පරියාය කියලා කිව්වේ. මම ඇහැ කන, දිව, නාසය, ශරීරය කියන තැනකින් අත හැරියොත් නිශ්පරියායකින්ම, ඉතුරු නැතුවම 'කාමය' අත හැරියා.

ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන මට්ටමේ කාමයෙන් අත හරින්නේ මොකටද? රූපය තුළ තමන් නැති වෙන්න ඕනේ. ඒ කියන්නේ රූප බාහිරයි කියලා ඔය පින්වතුන් දකින්න. අපි මතක් කළා. **බාහිර සංයෝජන විතරයි තියෙන්නේ උද්ධම්භාගිය මට්ටමට, ආධ්‍යාත්මික සංයෝජන අත හැරුනොත් ඕරම්භාගිය සංයෝජන නැහැ. ශබ්දය තුළ තමන් නැති වුණොත් 'කාම භූමියක විපාකයක්' පනවන්න බැහැ. ලස්සන කට හඬකින් කෙනෙක් සැපවත් වෙනවා නම්, අමිහිරි කට හඬකින් කෙනෙක් දුක් වෙනවා නම් කෙනෙක් මේ සැපදුක් දෙකෙන්ම එතෙරයි,කට හඬින්ම අයින් වෙනවා නම්.** තමන්ගේ කටහඬ කියන තැනින් කෙනෙක් අයින් වෙනවා නම් ශබ්දය කියන එක බාහිරයි, කියලා ශබ්දය තමන්ගේ නොවෙන කොට, කෙනෙක් තමන්ගේ ශබ්දය මිහිරියි කියලා සතුටු වෙනවා නම්,තමන්ගේ ශබ්දය අමිහිරියි කියලා දුක් වෙනවා නම් ඒ සැපදුක් දෙකෙන්ම මෙයා මිදිලා.

දැන් සැප වේදනාව එක් අන්තයක් දුක් වේදනාව එක් අන්තයක් උපේක්ෂා වේදනාව මැදයි කියලා මෙතැනදි කියන්නෙ, කෙනෙක් තමන්ගේ ශබ්දය නිසා සැපවත් වෙනවා නම්, තමන්ගේ ශබ්දය නිසා දුක් වෙනවා නම් ඒ දෙන්නම කාමය නිසා සතුටු වෙන අය. ඒ දෙන්නම අන්තෙක ඉන්නේ. මෙතැනදි අන්තය අත හරින්න තියෙන්නේ ඒ පවතින ඇත්ත ඇති හැටි දැකලා. ඇත්ත ඇති හැටියෙ දැක්කහම ශබ්දය කියන එකෙන් තමන් නැති වෙන කොට, තමන් ශබ්දය එක්ක නැති වෙන කොට, ශබ්දය තමන් එක්ක නැති වෙනකොට, ශබ්දයෙන් මිදෙනවා. ශබ්දය කියන එක ධර්මතාවයක් මිසක, හේතු නිසා හටගෙන හේතු නැති වෙන කොට නැති වෙන ධර්මතාවයක් මිසක, ශබ්දය කියන එක තමන් නෙවෙයි. ශබ්දය කියලා බාහිර ධර්මතාවයක් තමන්ගේ කරගෙන අඬන්න සතුටු වෙන්න තරම් එයා මෝඩ නැහැ. අහක යන දේවල් අපි, මගේ කරගෙන. තමන්ගේ දෙයකට දුක් විඳිනවානම් ඇත්තටම ප්‍රශ්නයක් නැහැ. අහක යන දේවල් වලට දුක් විඳින එකයි බුදුරජාණන් වහන්සේ මෙතැනදි අත හරින්න කියන්නේ. මෝඩ කමකටයි දුක් විඳින්නේ කියන එකයි පෙන්වන්නේ.

ඇත්තටම මේ කය පුරාණ කර්මයෙන් හටගත්තා නම් කය තියෙන කල් ශීත උෂ්ණෙන් දුක් විඳින්න වෙයි. ඒක තව සාධාරණයි ඒ දුක. නමුත් අහක තියෙන බාහිර

වස්තු තමන්ගේ කරලා සැපදුක් විඳිනවා නම්, ඒක මෝඩකම. හොඳට මතක තියා ගන්න, වැඩි දුක තියෙන්නේ බොරුව තුළ. බාහිර දේවල් තමන්ගේ කරගත්ත නිසයි වැඩි දුකක් එන්නේ. ගුරු බර බහා තබන්න. අපි අන්තිමට බර අඩු කරගන්න කියලා අහක යන බරක් කරට අරගෙන තියෙන්නේ. බර අඩු වෙනවා නම් ඒත් කමක් නැහැ. ඒ කියන්නේ දැන් තමන්ට, ජීවිතයේ දුක ප්‍රශ්න ගැටළු අඩු කරවලා බර දුක අඩු කරගන්න, බර අඩු කරගන්න කියලා හිතාගෙනයි, මේ බර කරට අරගෙන තියෙන්නේ. බර කරට අරගත්තට බර වැඩි වෙලා මිසක, බර අඩු වෙන්නේ නැහැ. මට කතාවක් මතක් වුනා.

එක මනුස්සයෙක් ඉන්නවා, එයා ටිකක් මෝඩයි. එයාට කුඹුරක් තියෙනවා, මෙයා හරි ආදරෙයි කරත්තේ බඳින හරකටත්. මෙයා නගුලත් දාගෙන කරත්තෙ නැගලා කුඹුරට යනවා. මෙයාට හිතුනළු නගුල හරි බරයි ගොනාට කියලා, පව්නේ කියලා, මෙයා කරත්තෙ ඇතුළෙ හිටගෙන, නගුල කරට අරන් යනවළු. දැන් නගුල කරට අරගෙන කරත්තෙ ඇතුළෙ හිටගෙන යනකොට බලන්න ගොනාට ශේෂයක්වත් බර අඩු වෙලා තියෙනවද කියලා. අඩු වෙලා නැහැ. නමුත් මෙයාගෙ මෝඩකම නිසා අනවශ්‍ය බරක් මෙයා විඳින්නේ. දැන් මේ බර ගොනාට දැනෙන්නේ මෙයා හරහා. ඉස්සෙල්ලා මෙයාට චුට්ටක්වත් බර නැතුව නගුල පැත්තක, එයා පැත්තක, ගොනාට තිබුණ බර බරමයි, වෙනසක් වුණේ නැහැ. නමුත් ගොනාට බර අඩු කරන්න පුළුවන් කියලා මෙයා නගුල කරට ගත්තහම, ගොනාට බර අඩු වෙන්නෙත් නැහැ, දැන් අනවශ්‍ය බරක් තමන්ගෙ ජීවිතය හරහා ගිහිල්ලා. ඔය ටිකමනම් අපිත් කරලා තියෙන්නෙ, ඔය පින්වතුන් හිනාවෙනවා, අපි කොච්චර මෝඩද? එක දශම මාත්‍රයක් වත් අඩු නැතුව ඔය පින්වතුන්, අපි ඔය ටිකමයි කරලා තියෙන්නේ කියලා තේරුනොත්, මොන තරම් ලජ්ජා හිතෙයිද? ඇත්තටම දශමයක්වත් අඩු නැහැ.

බඩගින්න, පිපාසය වගේ අර ගොනාට දැනෙන බර ටික වගේ කර්ම විපාකයට ජීවිතේ ලැබුණු ටික. ඕක අඩු කරගන්න ඕනේ කියලා රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ කියලා බාහිර වස්තු ටිකකුත් උරුම කරගත්තේ, අර බර අඩු කරගන්න කියලා. ඒ බඩගින්න පිපාසය ඔය බර චුට්ටක්වත් අඩු වෙලත් නැහැ. දැන් පුද්ගලයා හරහා මේ ටිකේ බර අපි හරහායි යන්නේ. දරුවන්ගේ ගෙවල් දොරවල් වල ප්‍රශ්න කියලා දැන් වෙනම දුක් විඳින්නෙක් හරහා ඒත් අර දුක එහෙමම පවතිනවා. හරියටම අර විදියමයි තියෙන්නේ. වෙන චුට්ටක්වත් වෙනසක් නැහැ. ගෙවල් දොරවල්, දූ දරුවෝ, යාන වාහන, ඉඩකඩම්, කියලා ඕව ටික අත හැරුනා කියලා, නැත්නම් බාහිර ටික කරට ගත්තෙ නැහැ කියලා, කරට ගත්තත් නැතත් මේ තියෙන පිපාසය, පිපාසයම තමයි. බඩගින්න බඩගින්නම තමයි. මේ ජීවිතේ සැප සීතල උෂ්ණයක් දැනෙනවා නම් ඔච්චර තමයි ජීවිතයකට ඇත්ත, දුක. ඔය ටිකට ප්‍රතිකර්ම කරගන්න කියලා, මේ දේවල් කළා කියලා,

ඒකට ප්‍රතිකර්ම වෙලත් නැහැ. ඒ ටික එහෙමම විඳින්න වෙනවා. මහළු වෙනවා, ලෙඩ වෙනවා, මැරෙණවා, කියන ටික තියෙනවාමයි. ඒකට ප්‍රතිකර්ම කරගන්න කියලා තමයි, දුවා දරුවා හදා ගත්තේ, බැරි කාලෙදි සලකගන්න, ඔය වගේ කාරණා ටිකකින්. නමුත් අනවශ්‍ය පීඩනයක් අනවශ්‍ය බරක් තමන්ගේ ජීවිතය හරහා තවත් එකතු වෙලා තියෙනවා මිසක, බර අඩු වුණේ නැහැ.

ඉතින් ඒ නිසා හොඳට තේරුම් කරගන්න ඕනෙ, අර කරත්තෙ උඩ නැගලා නගුල කරේ තියාගත්ත මනුස්සයා වගේ වැඩක් අපි මේ කරලා තියෙන්නේ.

ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ ***භාරා හවේ පංචකන්ධා*** - මේ ස්කන්ධයෝ බරක්. ***භාරා හවේ ලොකෙ දුක්ඛං*** - මේ බර ගැනීම දුකක්, නගුල කරට ගත්ත එකයි දුක. ***භාර නික්ඛෙපනං සුඛං*** - බර බහා තබන්න, මේ නගුල පැත්තකින් තියන්න, ඒක සැපක්. මේක ගන්න එපා. ***භාරා හවේ ලොකෙ දුක්ඛං*** - බර ගැනීමයි දුක. මේ අහක යන ශබ්දය මගෙ කියලා ගන්න එපා. අහක යන රූපය, මෙහෙම බලලා මේක මගෙ රූපය, මේක අනුන්ගෙ රූපය, කියලා රූපායතනය තමන්ගෙ කියලා ගන්න එපා, ඒ ගත්තේ දුක ගත්තෙ. ශබ්දය, අහක තියෙන ශබ්දය, බාහිරමයි. ඒක ගන්න එපා මගෙ ශබ්දය කියලා. ඒකයි, ***භාර නික්ඛෙපනං සුඛං*** - බර බහා තැබීම සැපක්. බාහිර ශබ්දය, බාහිර ශබ්දය හැටියට දකින්න. එතකොට ඔය පින්වතුන්ට ශබ්දය නිසා එන දුක නැති වෙනවා.

ඊට පස්සේ ගන්ධයත් එහෙමයි. ගන්ධය ගත්තහම ***බහිද්ධා වවත්තේති*** - නාසයට සාපේක්ෂව ගන්ධය කියන එක බාහිරම එකක්. එතකොට ඒ බාහිර ගන්ධය කියන එක බාහිරම එකක්. එතකොට ඒ බාහිර ගන්ධය අපි දෙකට බෙදා ගෙන තියෙනවා මගෙ ගඳ, අනුන්ගෙ ගඳ කියලා. තමන්ගේ ගඳ නිසා තමන් කොච්චර දුක් විඳලා ඇද්ද? මගෙ කට ගඳ ගහනවා කියයි, මට කෙනෙක් ළඟට යන්න බැහැ කියයි, මේ විදියට තමන්ගේ ගඳ නිසා. මම දවස් ගනනකින් නාලා නැහැ කියයි, ඒ විදිහට තමන්ගේ ගඳ නිසා දුක් විඳිනවා. ඒ කියන්නේ නගුල කරට අරගෙන. අහක තිබුණු ගන්ධය, තමන්ගේ ගන්ධය කියලා දෙකට බෙදා ගත්තා කියන්නේ නගුල කරට ගත්තා. ***භාර නික්ඛෙපනං සුඛං*** - මේ නගුල බිමින් තියන්න, ගන්ධය බාහිරයි කියලා දකින්න එතකොට මෙයින් එන දුක නැති වෙනවා.

ඊට පස්සෙ රස. එතකොට තමන්ගෙ රස අනුන්ගෙ රස කියලා. ස්පර්ශය, තමන්ගෙ ස්පර්ශය, අනුන්ගෙ ස්පර්ශය කියලා දෙකට බෙදා ගෙන තියෙන්නේ, අපි අපේ

අත අතගෑවොත් මේක ආධ්‍යාත්මික ස්පර්ශය, බාහිර එකක් ඇල්ලුවොත් බාහිර ස්පර්ශය කියලා, ස්පර්ශයත් දෙකට බෙදාගෙන. එතකොට මනසත් බෙදාගෙන තියෙනවා. තමන් ගැන හිතනවා අනුන් ගැන හිතනවා කියලා, අපි ඒකත් බෙදාගෙන තියෙන්නේ. නමුත් හිතනවා කියන එක සිතට සාපේක්ෂව සිතුවිලිමයි ඒවා බාහිරමයි. මේ බාහිර ටික පිරිසිඳ නොදකින කම නිසයි, ආධ්‍යාත්මික ටිකක් අපිට හම්බ වෙන්නේ. බාහිර ටිකෙන් කොටසක් ආධ්‍යාත්මික කියලා මගේ කියලා ගත්තා කියන්නේ, නගුල කරේ තියා ගත්තා වගේ, දුක තමයි ගත්තේ. ඔය දුක බර බහා තබන්න ඔය පින්වතුන්ට වෙන කිසිම ක්‍රමයක් නැහැ. 'සම්මා දිට්ඨිය' ඇත්ත දැකීමෙන්ම මේ ටික අත හැරෙනවා මිසක. වෙන හීනෙකින්වත් හිතන්න එපා.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★

ඒ කියන්නේ මම ඇති කාලෙකදිවත්, නැති කාලෙකදිවත් මෙතැනදි එක කාරණාවක් ඔය පින්වතුන් ස්ථාවර වෙන්න. මම මේ දෝෂෙකට කියනවා නෙවෙයි. ඔන්න දැන් අපි මේ ටිකේ හොඳට පිහිටලා කතා කරනවා. ආයෙත් වෙන ක්‍රමයක් කතා කෙරුවහම කෙටි ක්‍රම හොයනවා. මේකට වඩා මේ ක්‍රමය කෙටිද කියලා ආයෙ බලනවා. අර ඔක්කොම අත හැරලා, ඒ කෙටි ක්‍රමය ටිකක් අධ්‍යනය කරන්න හදනවා. ආයෙත් දැන් ඒ ක්‍රමය අත් හැරලා ආයෙත් පරණ එක ටිකක් හොයනවා. ආයෙත් කව්රු හරි වෙන මොනවා හරි කිව්වොත්, මේක ඉක්මන් වගේ ටිකක් කියලා බලනවා. නමුත් එකක් තේරුම් ගන්න, මේ දර්ශනය මේ විදියට දකිනවා කියන එකේ කෙටි දිග ක්‍රම නැහැ. ඒක එහෙමමමයි. හැබැයි එතන පිහිටලා හිටින්න, එතෙන්ට එන්න කරන්න තියෙන වැඩ පිළිවෙලවල්වල කෙටි දිග කම් තියෙන්න පුළුවන්. ඒවා ගත්තට ප්‍රශ්නෙකුත් නැහැ. ඒ අනුව හොයාගෙන ගියාට ප්‍රශ්නෙකුත් නැහැ. නමුත් අවසාන දර්ශනය, සම්මා දිට්ඨිය කියන්නේ මෙතන. මේකෙ අඩු වැඩි නැහැ. බාහිර දේ, බාහිර දේ කියලා දකිනවා ඇරෙන්න ඕකෙ ආයෙ අඩු වැඩි කම් නැහැමයි.

ඊට පස්සේ, මෙතෙන්ට එන්න අපි චිත්ත සමථයක් ඇති කරගන්න ගියොත්, සමහර විට ඇත්තටම මම කතා කරන දේට වඩා, මේ ටික මම කතා කරන ටික නෙවේ හින්දා මේ, මේක බුදු දහම හින්දා, ඒ දර්ශනය හරහා අඩු වැඩිකම් හොයන්න එපා. පහසු දර්ශන හොයන්න එපා. රූපය බාහිරයි කියලා, ශබ්දය බාහිරයි කියලා දකිනවා කියන ඒ ඇත්තේ කෙටි ක්‍රම දිග ක්‍රම කියලා නැහැ. ඒ ඇත්ත ඇත්තමමයි. ඒ හින්දා ඕනෙවට වඩා ඒකෙ මෝඩ වෙන්න එපා. මේ සත්‍යය නම් සත්‍යයම තමයි. ඉක්මනට කෙටි සත්‍යය හොයාගන්නවා කියන ඒවා තියෙනවද? එහෙම ඒවා නැහැ. ඊට පස්සෙ **මෙතන ස්ථාවර වෙන්න ඔය පින්වතුන්ගේ මනස ආයෙ කිසි කෙනෙකුට, කිසි දේකට වෙනස් වෙන්නේ නැති,**

මෙතැන තමයි චතුරාර්ය සත්‍යය අවබෝධය කියන්නෙ. මේ ඇත්ත. මේක පිරිසිඳ දැකපු නිසා තමයි, සත්ව පුද්ගල සංඥාව තණ්හාව, නැත්නම් කෙළෙසය දුරු වෙන්නේ. කෙළෙසය දුරු වුණු නිසා තමයි දුක්ඛ නිරෝධය සාක්ෂාත් වෙන්නේ කියලා, එක අරමුණේ එකට තියෙන්නේ.

ඊට පස්සේ කෙටි ක්‍රම ඕනෙ තරම් ඇති. ඇත්තටම මම මේ පෙන්වන සිද්ධිවලට වඩා මම භාවනා කරන ක්‍රමයක් පෙන්නුවොත් ඊට වඩා සමහර විට බොහෝ පහසු ක්‍රම ලෝකයේ තව පෙන්වන ස්වාමීන් වහන්සේලා ඇති. ක්‍රම ඇති. වැරැද්දක් නැහැ, ඒවා හොයාගත්තට, ඒකෙ ගියාට, ඒක කරන්න සුදුසුයි. නමුත් මම කියන්නෙ, මේක නුවණින් හරියට දැනගෙන, මේ ක්‍රමය විතරයි **සත්‍යය කියන්නේ. මේ සත්‍යය අවබෝධ කරගන්න, නීවරණ ධර්ම දුරු කරගන්න මේක 'උපාය ධර්මයක්' මිසක ඒ උපාය ධර්මය තුල සත්‍යය තියෙනවා නෙවෙයි කියන නුවණ ඉස්සෙල්ලා තේරුම් ගන්න.** මේ සත්‍යය කියන එක ඒ අයුරින්ම අහලා තේරුම් ගත්තොත් මිසක, මේක මටවත් මේක අහන කෙනාටවත් ඕනෙ ඕනෙ විදියට ලෙහාගන්න පුළුවන් එකක් නෙවෙයි.

ඒ නිසා රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම කියන මේ ටික බාහිරයි කියලා හොඳට තේරුම් කරගන්න. රූප ටික මහාභූතයන්ගේ උපාදාය රූපයි කියන එක තේරුම් කරගන්න. මේ හැම එකක්ම අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයන්ගෙන් හැදිලා තියෙන්නේ. ශබ්දය අවිද්‍යා, කර්ම, තණ්හාවන්ගෙන් හැදිලා තියෙන්නෙ කියලා කියන්නෙ ඇයි? ඒ ටික හැදිලා තියෙන්නෙ, කන හැදිලා තියෙන්නෙ අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයන්ගෙන් නම්, ඒ කනින් අහන ශබ්දය, කර්මය. අපි කියමු, හොඳටම කන ඇහෙන්නෙ නැති කෙනෙකුට අපි ඉයර් ෆෝන් (ear phone) මැෂින් (machine) එකක් හදලා දැම්මොත්, මැෂින් එකෙන් ශබ්දෙ ඇහෙනවනම් එයාට කියන්න වෙන්නෙ, මෙයාට ශබ්ද ඇහෙන්න තියෙන හේතු ටික මොනවද කියලා, මැෂින් එකේ කෑලි ටිකම තමයි කියන්න වෙන්නෙ. ඇයි මැෂින් එක නැත්නම් ශබ්දෙ ඇහෙන්නෙ නැහැනේ. අපිට හිතෙන්නෙ ශබ්දෙ කියලා එකක් තියෙනවා, තියෙන ශබ්දෙ මැෂින් එක දාලා මේ කනින් අහනවා කියලයි, අපි හිතන්නෙ. නමුත් එහෙම එකක් නැහැ. අපි කිව්වෙ, රතු පාට කණ්ණාඩිය දාගෙන බාහිර බැලුවොත්, බාහිර රතු පාට එකක් තියෙනවා, අපි ඇහෙන් බාහිර රතු පාට බලනවද? නැහැ. අපි උපාය කරගත්තෙ ඇහැ රතු පාට කරගන්න. ඊට පස්සෙ රතු පාට ඇහෙන් බලපු හින්දා මේ රූපෙ රතු පාට වෙලා තියෙනවා. එතකොට රතු පාටට පෙනෙන රූපයත්, රූපෙ රතු පාට වෙන්න හේතුවත්, මොකක්ද කියලා ඇහුවොත් කියන්න වෙන්නෙ ඇහැ රතු පාට වුණු හැටි.

ඒ වගේ ආයතන ටික ඔක්කොම දකින්න. ආධ්‍යාත්මික ආයතන ටික ඇති වුණු හේතු ටික තමයි කියන්න වෙන්නෙ මේ බාහිර ආයතන ටික හම්බ වෙන කොට. ඒ නිසා

අවිද්‍යා, කර්‍ම, තණ්හා, ආහාරයන්ගෙන් හටගත්තෙ කියලා දකින්න. නැත්නම් මොකද ශබ්දය, ගහක, වාහනයක ශබ්දය ඇහෙන කොට ඒ ශබ්දය අවිද්‍යාවෙන්ද හැදුනේ? ගහක් කඩාගෙන වැටෙන ශබ්දයක් හුලඟක් හමන ශබ්දයක් ඇහුනොත් අවිද්‍යාවෙන්, කර්‍මයෙන්, ඔය ශබ්දය හැදුනෙ කියලා ඒකට කිව්ව හැකිද? බැහැ. කන හැදිලා තියෙන්නෙ අවිද්‍යාවෙන් හින්දා, ඒ කනින් ඇහෙන ශබ්දයක් හින්දා, කන නිසා ශබ්ද රූපය ඇහෙන නිසා, කිව්ව හැකියි ඒවා අවිද්‍යාවෙන්, කර්‍මයන්ගෙන් හැදුනෙ කියලා. එතකොට නාසය - ගන්ධය මේ ආයතන ටිකත් මේ විදියට දකින්න.

එතකොට, සමස්ථයක් වශයෙන් මේ රූප ටික පිරිසිඳ දැක්කහම, මම කිව්වා නේද කබලිංකාරාහාරයෙන් මිදෙනවා කියලා. ඕරම්භාගිය සංයෝජන නැහැ කියලා කිව්වේ. එයාගෙ කියලා රූපයක් නැහැ. ශබ්දයක් නැහැ. ගන්ධයක් නැහැ. රසයක් නැහැ. ස්පර්ශයක් නැහැ. නැතිනම් ආධ්‍යාත්මික තමන් කියලා පනවගන්න නිමිති මුකුත් නැහැ. ඊට පස්සේ පෙනෙනවා, ඇහෙනවා, දැනෙනවා දැනගන්නවා කියන ධර්‍මතා හතරකින් ජීවත් වෙනවා විතරයි, රූප ගැන. මොනම විදියකටවත් තමන් කියලා පනවගන්න දුක් විඳින කයක් ඇත්තෙමම නැහැ. එයා කබලිංකාරාහාරයේ 'මම' දකින්නේ නැහැ. 'මම' කබලිංකාරාහාරයේ දකින්නේ නැහැ. කබලිංකාරාහාරය මම නෙවෙයි, මගෙ නෙවෙයි, මගෙ ආත්මය නෙවෙයි, ***නේතං මම නේසො හමස්මි, නමේසො අත්තාති එව මෙතං යථා භූතං සම්මා පඤ්ඤාය දට්ඨබ්බං*** එසේ ඇත්ත ඇති හැටියෙන් නුවණින් දැක්ක යුතුයි කිව්වා නම්, ඒ විදියටම එයා මම හෝ මගෙ හෝ මගෙ ආත්මය හෝ නෙවෙයි කියලා දකිනවා. ආහාරය තුළ තමන් ඉන්නවා, තමන්ගෙ ආත්මය තියෙනවා, තමන්ගෙ කියලා එයා දකින්නේ නැහැ.

ඔන්න ඔය දැකීමට ආවහම ඒකට කියනවා **රූපය පිරිසිඳ දකිනවා** කියලා. රූපය පිරිසිඳ දැක්කහම ඉබේමයි කබලිංකාරාහාරයෙන් මිදෙන්නේ. අත පය හතරම තියෙන ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින හතර ඉරියව්වක් තියෙන ජීවිතයෙන් මිදෙනවා. ගුටිකන්න කයක් හම්බ වෙන්නේ නැහැ. අපි මෙහෙම රූපයක් බලන කොට පෙනෙන රූපෙට තව මොනවා හරි වැදුනොත් අපිට රිදෙනවද, තමන්ට වුණා කියලා හිතෙනවද, මේ ආධ්‍යාත්මික බාහිර කියලා කිසිම කතාවක් නැහැ. **මේ පෙනෙන රූපයට මොනවා හරි කරන්නත් බැහැ කාටවත්. පෙනෙන රූපෙට මොනවා හරි කරන්න පුළුවන්ද? බැහැ. අර වතුරෙ පතිත වෙලා තියෙන ඡායාවට මොකක් හරි කෙරුව හැකිද? වතුර ටිකට නම් ගලකින් ගහන්න පුළුවන්. නමුත් ඒ ඡායාරූපයට වදිනවද, නැහැ. ඒ වගේ ගලකින් වැදුනත්, කයයි පොට්ඨබ්බයයි නිසා මේ වේදනාව එනවා කියලා දකිනවා මිසක පෙනෙන දේ ඒකට ඇඳගන්නේ නැතුව ඉන්න තරම් එයා රූපය දන්නවා රූපය දකිනවා.**

ඇත්තටම මේ කතා කරන ටික ගැඹුරුයි. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නෙ, බුදු දහම කියලා කියන්නෙ,

පණ්ඩිතවේදනියෝ - පණ්ඩිතයන් විසින් දත යුතුයි.

අතක්කාවචරො - තර්කයට ගෝචර නැහැ.

ධූලං අනුං - ඒ අර්ථය ඉතාමත් සියුම්, ගැඹුරුයි.

දුරනවබෝධෝ - අවබෝධයට ඉතාමත් දුෂ්කරයි.

දුද්දස්සෝ - දකින්න අපහසුයි

කියලා සද්ධර්මයේ නම් ටිකක් තියෙයි. බලන්න මොන තරම් ඇත්තද කියලා. නමුත් අපිට සාමාන්‍යයෙන් අද දහම කියලා තේරෙන ලෝකයේ මට්ටම, ඔය තරම් කියන විදිහෙ අවබෝධය දුෂ්කරයි, දකින්න හරිම අපහසුයි, පණ්ඩිතයන් විසින්ම දැක්ක යුතුයි. තර්කයකින් පෙන්වන්න බැහැ වගේ, කිසිම තැනකින් හම්බ වෙන ටිකකින් හම්බ වෙන්නේ නැහැ. නමුත් මේ සිද්ධිය දිහා බලන්න, ඇත්තටම මේ පෙන්වන සිද්ධිය ඉතාමත් සියුම්. කිරි ටිකක් වතුරට දාලා මිශ්‍ර කරලා දුන්නහම වතුර ටික ඉතුරු කරලා කිරි ටික බොන්න පුළුවන් තරම් හැකියාවක් තියෙනවා කියලා කියනවා හංසයට.

මේ ශාසනයේ ප්‍රඥාවන්තයා පෙන්වන්නේ ඒ වගේ කියලා. මෙහෙම පෙනෙන අසත්‍යයෙන් සත්‍ය ක්ෂණිකව වෙන්කර ගන්න පුළුවන් ශබ්දය තමන්ගේ, තමන් සහ අනුන් කියලා දෙකට බෙදිලා පෙනෙන කොට ඒකෙන් වෙන්කරලා ක්ෂණිකව එයාට පුළුවන්කම තියෙනවා මේක බාහිරයි කියලා දකින්න. එතකොට මේ අර්ථය මොන තරම් සියුම්ද කියලා බලන්න. අර්ථය ඉතාමත් සියුම්. නමුත් අපේ මනස ගොඩාක් රළුයි. රළු දේකින් සියුම් දෙයක් ගෝචර කරගන්න බැරිවීම පුදුමයක් නෙවෙයි. අවකාශයේ සියුම් රූප ඇති, ඔය පින්වතුන්ගේ අත රළුයි අල්ලන්න පුළුවන් වෙයිද? බැහැ. අත හැපෙයිද? නැහැ. එතකොට මේ මට්ටමේ අත හැපෙන්නේ නැත්තේ හොඳක් හින්දා නෙවෙයි. ඒක යහපතක් හින්දා නෙවෙයි. ඒක රළු වැඩි හින්දා. ඔය පින්වතුන්ගේ අතත් අවකාශ මට්ටමට සියුම් වුණොත්, මේ අවකාශයෙ අත හැපෙයි, ගන්න බැරිවෙයි, අත ගෙනියන්න බැරිවෙයි. ඒ වගේ අද අපේ මනසෙ කෙළෙස් රළු වැඩියි. ඒ හින්දා ආධ්‍යාත්මික බාහිර ප්‍රභේදය හැපෙන්නේ නැහැ. බාහිරයි කියන තැන හැපෙන්නේ නැහැ. හැපිලා හිටින්නේ නැහැ ආධ්‍යාත්මික බාහිර කියලා බෙදිලා පවතින්නේ.

මනසේ රළු කම අඩු වුණොත් සියුම් වුණොත් ඉබේමයි පෙනෙන්නේ අපිට ආධ්‍යාත්මික බාහිර භේදයක් කියලා බෙදන්න බැහැ. බාහිරමයි කියන තැන ඉබේමයි හැපිලා හිටින්නේ.

ඒ නිසා හොඳට තේරුම් කරගන්න රූපවල ඇත්ත ඇති හැටියට දැකිය යුතු මට්ටමක් තියෙයි. ඒ මට්ටම **ඒ රූප පිරිසිඳ දැකීමෙන්ම, රූපයේ සත්‍යයේ ස්වභාවය සත්‍යය ආකාරයෙන්ම අවබෝධ වීමෙන්ම මිදෙන්න ඕනෙ කෙළේසයක් මිසක, වෙන ක්‍රම නැහැ,** කියලා හොඳට තේරුම් කරගන්න. ඔය ටික ඔහොම තව දුරටත් හිත වඩමින් කතා බහ කරන කොට ඕකෙ යම් මට්ටමක් නිශ්ඨාවකට නිසැක බවට එන්න පුළුවන්. තව ටිකක් හිත වඩමින් නීවරණ ධර්‍ම අඩු වෙන කොට මේක ඇත්තයි කියලා පිළිගන්න පුළුවන් මට්ටමට එනවා, තව ඉස්සරහට. එන්න එන්න කෙළෙස් අඩු වෙනවා, සත්‍යය අවබෝධ වෙනවා, කියලා කියන්නේ වෙන මොකුත් නෙවෙයි, දැන් අද පිළිගන්නත් බැරි මට්ටමකයි මේ ටික තියෙන්නේ.

නමුත් සීලයක පිහිටලා, සමථ කමටහනකින් හිත වඩමින් රළු මට්ටමට අපි විදර්ශනා කරන කොට මේ නීවරණ ධර්‍ම අඩු වෙන්න, අඩු වෙන්න ඔය පින්වතුන්ට මේක පිළිගන්න පුළුවන් මට්ටමට එනවා. තව දුරටත් මේ ටික කරන කොට ඔය පින්වතුන්ට ජීවිතයේ දකින්න පුළුවන් මට්ටමට එනවා. යම් දවසකදි නිසැකවම ඔය පින්වතුන්ට දකින්න පුළුවන් මට්ටමට ආවහම කියනවා 'සම්මා දිට්ඨි කියලා.' **'දිට්ඨි සම්පන්නයි' කියනවා. ඔය පින්වතුන්ට කවදාවත් තමන්ගේ කය දකින්නෙ නැතුව බාහිර රූපය, බාහිර කියලා සැක නැතුවම දකින්න පුළුවන් මට්ටමක් ආවොත් බය නැතුවම කියන්න පුළුවන් 'දිට්ඨි සම්පන්නයි' කියලා. හැබැයි එහෙම දැක්කත් හැම වෙලාවෙම පිහිටලා හිටින්නේ නැහැ. ආයෙත් අමතක වෙලා ආධ්‍යාත්මික බාහිර කියලා බෙදෙනවා. ඒකයි අශ්‍රුව කියන්නේ.**

තව දුරටත් මෙයා ප්‍රතිපදාව වඩන්න වඩන්න, මේ නොදැක ඉන්න කාලය අඩු වෙනවා, දකින කාලය වැඩි වෙනවා. ඔහොම ඔහොම කරන කොට තවත් ඕදාරික කාමරාග මට්ටමේ කෙළෙස් අඩු වෙනවා. මේ ඇත්ත දකින්න, දකින්න. යම් දවසක් තියෙනවා **රූපය බාහිරමයි කියලා පෙනෙන මට්ටමක්, මෙකෙ ආධ්‍යාත්මික රූපයක් දකින්න බැහැ කියන එක ජීවිතය වෙලා තියෙන දවසක් එනවා. එතකොට කියනවා 'අනාගාමී' කියලා.**

මේ දැකීමත් එක්ක තමයි, සම්මා දිට්ඨියත් එක්කයි තමන්ට කියන්න පුළුවන්, තමන්ගේ මනස **'අකෝප්‍යයි'**, කෙළෙස් දුරුවෙලා කියලා. එහෙම නැතුව හිතේ සමාධිය **රාග, ද්වේශ, මෝහ නැති පමණකින් තමන්ට කියන්න පුළුවන් කමක් නැහැ, මට කෙළෙස් නැහැ, යහපත් වෙලයි ඉන්නේ කියලා එහෙම කියන්න බැහැ. සම්මා දිට්ඨිය මතයි කියන්න පුළුවන්. මේ දර්ශනය මතයි කියන්න පුළුවන් මම දැන් කෙළෙසුන්ගෙන් මිදිලා කියලා.** කෙළෙස් ටික ටික අඩු වෙනවා කියලා මේ ඇත්ත දකිනවා කියන එක මත. මොකද අද දවසෙදි කෙළෙස් නැති වුණත් හෙට දවසෙදි කෙළෙස් ඇති වෙන්න තියෙන හේතුව තියෙන නිසා, කෙළෙස් නැති වුණු පමණකින් තමන් වැඩි දියුණු වෙලා කියලා කියන්නේ නැහැ මේ

ශාසනේ.

අපි නිකමට ගත්තොත් අසංඥ තලවල ඉන්න සත්වයෝ දිහා බලන්න කෙළෙස් නැති වෙනවා තියා කෙළෙස් ඇති වෙන්න සිතක්වත් නැහැනේ. නමුත් ආයෙත් මේ ලෝකයට එනවනේ, නේද? ඒ නිසා ඕනෙම කෙනෙකුට චිත්ත සමථයක් වැඩුවහම මේ ජීවිතයේ පැයක් දෙකක් නෙවෙයි, ජීවිතය පුරාම රාග සිත් මාත්‍රයක්වත් උපදින්නේ නැතුව ඉන්න පුළුවන්. තරහ පටිඝ සිත් මාත්‍රයක්වත් උපදින්නේ නැතුව ඉන්න පුළුවන්. මුළු ජීවිතය පුරාම. ජීවිතය පුරාම කවර කතාද? කල්ප අසූ හාරදහසක් යනකල් කියන මට්ටමට එනවා. ඒ ගියත් ආපහු එනවා.

ඒ නිසා තමන්ගේ මනස රාග, ද්වේශ, මෝහ ආදි කෙළෙස් නැති බවකින් කවදාවත් ස්ථාවර වෙන්න බැහැ, තමන් නිවැරදි දහමක ඉන්නවා කියලා. මොකද හොඳට දකින්න ඕනෙ, රාග විරාග චේතෝ විමුක්ති. සමථ කමටහනේ ලක්‍ෂණය මොකක්ද? රාග විරාග ස්වභාවයට පත් කරනවා. සමථයක තියෙන ලක්‍ෂණය තමයි ලෝභ ද්වේශ දෙකෙන් මනස දුරුකරන එක. හොඳට සමථ කමටහනක් වැඩුවහම සම්පූර්ණ රාගය හිටින්නේ නැහැ චුට්ටක්වත්. පටිඝය, අකමැත්ත, තරහව, ගැටීම හිටින්නේ නැහැ චුට්ටක්වත්. ඒකෙ උපරිමයට ගියහම කියනවා රාග-විරාග චේතෝ විමුක්තිය, රාගය විරාග ස්වභාවයට ගෙනියනවා, මේ චේතෝ විමුක්තියේ ස්වභාවය.

★ ★ ★

හැබැයි ප්‍රඥාවේ ලක්‍ෂණය මොකක්ද? ***අවිජ්ජා විරාග ප්‍රඥා විමුක්ති*** ප්‍රඥාවේ ස්වභාවය තමයි, අවිද්‍යාව විරාගයට යනවා. අවිද්‍යාව නැති කරනවා. ප්‍රඥාවේ ස්වභාවය තමයි මේ ඇත්ත දකින එක, තණ්හා විරාගයෙන් චේතෝ විමුක්තියක් ඇති වුණත් ඒ චේතෝ විමුක්තියට අකෝප්‍යයි කියන්නේ නැහැ කෝප්‍යයි, ආපහු එනවා. මේ චේතෝ විමුක්තිය ඇති කරගෙන අවිද්‍යා විරාග පඥා විමුක්තයකුත් ඇති කරගන්න ඕනේ. අවිද්‍යාව දුරු කරලා ප්‍රඥාවෙනුත් ආශ්‍රවයන්ගෙන් මිදෙන්න ඕනේ. එහෙම වුණොත් තමයි ඒ විමුක්තිය අකෝප්‍යයි කියලා කියන්නේ. වෙනස් වෙන්නෙ නැති ස්ථිර වූ සිතේ මිදීමක් කියලා කියන්නේ.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★

අපි කතා කරපු මේ රූපම තව හඳුනාගන්න ක්‍රම තියෙනවා අභිධර්මයේ, රූපය කියන්නේ හේතු නෙවෙයි, අහේතුකයි. රූපය කියන්නේ කවදාවත් ලෝභ, ද්වේශ, මෝහ හෝ අලෝභ, අද්වේශ, අමෝහ තියෙන්නේ නැහැ රූපයක. රූපය කියන්නේ කර්ම නෙවෙයි, කුසල අකුසල කර්ම නෙවෙයි. කර්ම රැස් කරන හේතුවක්ද නෙවෙයි. ඔය වගේ රූපයේ ගති තියෙනවා තව විස්තර කරන්න. ඕවත් දැනගත්තහම යුද්ධෙකට යනකොට ආයුධ වැඩි තරමට යුද්ධෙ පහසුයි. නමුත් බැහැ කියලා බැහැ. අපහසු වුණත් යන්න ඕනෙ. ඉතින් මේවා ඇත්තටම දැනගෙන ඉගෙන ගෙන තියෙන්න තියෙන්න කෙලෙස් දුරුවෙන්න පහසුයි. නමුත් ඒවා ඔක්කොම ඉගෙන ගෙනම යනවා කියන කාරණාවක් නැහැ. අනුමානෙට එක කාරණාවක් තමයි මට ඕනෙ.

අපි කරන්න යන්නේ සත්‍ය අවබෝධයක් කියලා තේරුම් ගන්න. සත්‍ය අවබෝධයක් කියන කොට මම මොන මොන විදියට හරි බලලා ආශ්‍රවක්ෂය වෙනවා කියන එකක් නැහැ. මම අනිත්‍යයි කියලා බැලුවා කියලා ආශ්‍රවක්ෂය වෙන්නේ නැහැ. මම අනිත්‍යයි කියලා බැලුවහම මගෙ මනස තුළ තියෙන නීවරණ ධර්ම දුරු වෙනවා. නමුත් පවතින ඇත්තක් තියෙයි නම් ඒ ඇත්ත මට ඕනෙ විදියට බලනවා කියලවත්, මට අඩු වැඩි කරලා බලනවා කියලාවත්, කෙටි පාරකින් ගිහිල්ලා බලනවා කියලවත්, එහෙම ඒවා නැහැ.

ඒ නිසා ඉස්සෙල්ලා සත්‍යය කියන එක දැනගන්න. මෙන්න මේ සත්‍යය අවබෝධ වුණු දවසටයි ආශ්‍රවක්ෂය වෙන්නේ, තණ්හාව නැති වෙන්නෙ. එදාටයි සියලු ජරා මරණ දුක්ඛ නිරෝධයක් වෙන්නේ, කියන එකත් දැනගන්න. ඇත්ත ඇති හැටිය දැක්කහම, තණ්හාව දුරු වෙනවා. තණ්හාවගේ දුරු වීමයි, අජරාමර බව කියලා කියන්නේ. ජරා මරණ නැති වෙන්නේ. ඒ ධර්මතා තුන ලැබෙන විදියට කටයුතු කිරීමමයි මාර්ගය කියන්නේ කියලා ආර්ය අෂ්ටාංගික මාර්ගය, ලෝකෝත්තර මාර්ගය පිරිසිදුව දැන ගන්න, දැක ගන්න.

ඊට පස්සේ සම්මා දිට්ඨිය, දැන ගත්ත ටික දැක ගන්න, උත්සහවත් වෙන්න ඕනෙ. ඕකට තමයි අපි භාවනා කරනවා කියලා කියන්නේ. ඊට පස්සේ තමයි භාවනා කරන්න තියෙන්නේ.

දැන් තමයි සීලය ගැන සමාධිය ගැන විදර්ශනාව ගැන ඉගෙන ගන්න ඕනේ. ඉගෙන ගෙන ඒක කරන්නට ඕනේ. **පස්සේ කෙළවරට යනකොට මේ කරන ටිකත්, අහගත්ත ටිකත් ඔක්කොම අත හැරෙනවා අතෙන්ට ඇවිල්ලා.** හැබැයි එතෙන්ට එන්න වෙන ක්‍රමයක් නැහැ, මේ ටික නැතුව මේ රථ හතෙන් තමයි අතෙන්ට යන්න තියෙන්නෙ. නමුත් ඒ නගරයට ගිහිල්ලා රථ හතම අත හරින්න වෙනවා, අනු පිළිවෙලට. මේ හරහා එකින් එක,

එකින් එක ශීල විසුද්ධි, චිත්ත විසුද්ධි, දිට්ඨි විසුද්ධි කියලා මේවා හරහා තමයි එන්න තියෙන්නේ මෙතෙන්ට. නමුත් ඒ ඥාණ දර්ශනය කියන එක, නැත්නම් විමුක්තිය කියන එක මේ හතම නෙවෙයි. මේ සම්මා දිට්ඨිය කියන එක, ඇත්ත ඇති හැටියේ දකිනවා කියන තැනට එන්න 'උපකාරක ධර්මතා ටික' දර්ශනය නෙවෙයි.

අපි මේ දර්ශනය ගැන, රූප ගැන කතා කළ නිසා ඔය රූප ඔක්කොම දැන ගත්ත නිසා සම්පිණ්ඩනය කරලා තව දුරටත් මම අන්ත අත හැරලා **මධ්‍යම ප්‍රතිපදාව** ඇති වෙන විදියට ජීවිතයෙන් දර්ශනාත්මකව පෙන්වන්නම්. දකිනවා කියන තැන මෙහෙම මෙහෙම අන්ත තියෙනවා, මෙන්න මේවයි අන්ත කියන්නෙ. මේ අන්ත අත හැරෙන විදියට මෙන්න මේ විදියට අපි දැකිය යුතුයි. ඔය ඔක්කොම එකතු කළාම අපිට හම්බ වෙනවා දකිනවා අහනවා කියන තැන දර්ශනයක්. ඔන්න ඔය දර්ශනය කෙටියෙන් ඉගෙන ගනිමු. මොකද ඔය දර්ශනය ඉගෙන ගන්නෙම එහෙම කියන්නෙම රූප ටිකේ ඔය ස්වභාවය අනාත්ම ස්වභාවය තියෙන නිසයි, දැක්ක නිසයි. ඉදිරියේදී ඔය විදියට අපි දැකිය යුතු දර්ශනය කතා කරලා ඒකට යන ප්‍රතිපදාව ගැනත් කතා කරමු.

ලෝකෝත්තර සම්මා දිට්ඨිය
(මහා සළායතනික සූත්‍රය ඇසුරෙන්)

අද දවසෙදිත් ලෝකය ඇත්ත ඇති සැටියෙ දකින්න අවශ්‍යය ඒ ස්කන්ධ ධාතු ආයතනයන්ගේ යථාභූත ස්වභාවය ගැන අපි කතා කරමු. නමුත්, අද ඉස්සර වගේ නෙවෙයි. ඒ කියන්නේ, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා රත්තරන් විතරක් තියෙන කාලෙදි වෙළඳපොලට ගිහිල්ලා රත්තරන් ගන්න ගොඩක් හිතන්න ඕනෙ නැහැ. පරීක්ෂා කරන්න ඕනෙ නැහැ. හැමතැනම තියෙන්නේ පිරිසිදු රත්තරන් නිසා කොතැනින් කොහොම ලැබුණත් නියම රත්තරන් ලබා ගන්න පුළුවන්.

නමුත් යම් කාලෙකදී රත්තරන් වගේ දෙයක් ලෝකයට පහළ වෙනවා. අපි ඔය ඉමිටේෂන් කියලා කියන්නේ. ඒ කාලෙදි රත්තරන් ගන්න යන කෙනා ටිකක් පරීක්ෂාකාරී වෙන්න වෙනවා කියලා පෙන්වනවා. ඒ රත්තරන් ගන්න යනකොට ඒක උලච්චි කරලා ගල ගාලා බලලා හොඳට පරීක්ෂා කරලා තමයි ගන්න වෙන්නෙ, මොකද රත්තරන් වගේ දේවලුත් තියෙනවා.

ඉතින් ඒ නිසා, ධර්මයේ සඳහන් වෙන්නේ සද්ධර්මය විතරක් ලෝකයේ තියෙන කාලෙදි, අමුතු උත්සාහයක් ඕනෙ නැහැ, කොතැනින් ගියත් ඒ නියම සසර දුක් ගෙවන

සද්ධර්මයම ලැබෙනවා. ඒකෙදි සද්ධර්මය කියන්නේ මොකක්ද කියලවත් හිතන්න උවමනාවක් නැහැ. අහගත්ත අහගත්ත හැම තැනම (රත්තරන් වගේ) හැම තැනම අනාශ්‍රව චේතෝ විමුක්ති, ප්‍රඥා විමුක්ති උපදවා ගන්න පුළුවන් ධර්මයමයි තියෙන්නේ.

නමුත් කාලයාගේ ඇවෑමෙන් මේ ශාසනය තුළත් ධර්මය වගේ එකක් පහළවෙන කාලයක් තියෙනවා. ඒ වෙලාවෙදි ධර්මය හොයන කෙනා, අර රත්තරන් ගන්න යන කෙනා ටිකක් බලන්න වෙනවා පරීක්ෂා කරලා වගේ, ධර්මය වගේ එකක් ලෝකයේ පහළ වුණාහම, ධර්මය හොයන්න, අවබෝධ කරන්න, ගවේෂණය කරන්න යන කෙනා ටිකක් පරීක්ෂාකාරී වෙන්න වෙනවා. ටිකක් හොයලා නුවණින් තම තමන්ටත් බලන්න වෙනවා, මේක ධර්මයමද කියලා.

ඉතින් එබඳු පරිසරයක් අද පවතින නිසා, මොකද 'සද්ධර්මය වගේ' එකකුත් තියෙන නිසා, සද්ධර්මයත් තියෙනවා, සද්ධර්මය වගේ එකකුත් තියෙන නිසා, ලෝකයාට හොයාගන්න අමාරුයි. අපි කෙටියෙන් කිව්වොත් නිවන් දකින මාර්ග, භාවනා ක්‍රම, දේශනා බොහෝ තියෙනවා, ඉතින් හරි එක මොකක්ද කියන කාරණාව අපට තේරුම් කර ගන්න පහසුවෙන නිසා. මොකද, පුද්ගලයන් දිහා බලලා කවදාවත් අපිට මේක හරි හෝ වැරදියි කියලා තීරණය කරන්න බැහැ. හරි දේ මෙන්න මේකයි කියලා යම් පමණකට හෝ, නැත්නම් සැබවින්ම හෝ අපට විශ්වාස කරන්න තියෙන එකම සාක්ෂිය තමයි බුදුරජාණන් වහන්සේ දේශනා කළ පිරිසිදු ධර්මය, ත්‍රිපිටක ධර්මය. ඒ ත්‍රිපිටක ධර්මය තුළ තියෙන ආකාරයට ගැලපෙනවද කියලා බලලා, ගැලපෙනවා නම් තමයි අපට ගන්න වෙන්නේ. ඉතින් ඒ විදිහට පරීක්ෂා කරලා තමයි අපට මේක ගන්න වෙන්නේ.

ඉතින්, අද ඒ නොයෙක් ක්‍රම තියෙනකොට, ඒකෙ නිවැරදි ක්‍රමය හොයාගන්න වෙනවා අපට. ඉතින් අද දවසෙදිත් මම මේ සූත්‍රය මාතෘකා කළේ මේ තුළින් මේ පින්වතුන්ට බය නැතුව, සැක නැතුව මේකයි නිවැරදි ක්‍රමය කියලා නිශ්ඨාවකට පත්වෙන්න පුළුවන් පරියායක් මේකෙ පෙන්වනවා. ඒ ටික පෙන්නුවොත් වඩා හොඳයි කියලා මට මතක් වුණා, මොකද එහෙමත් කරලා මම අර ධර්මතා ටික (ස්කන්ධ, ධාතු ආයතන) මතක් කළහම ඔය පින්වතුන්ට හොඳට ඒකෙ ශ්‍රද්ධාව පිහිටලා හිටින්න පුළුවන්. එහෙම නැත්නම් මම කියනවා සම්මා දිට්ඨිය කියන්නේ, චතුරාර්ය සත්‍යය අවබෝධ වෙන්නේ මේ ඇත්ත ඇති හැටියෙ, මේ ස්කන්ධ ධාතූන්ගේ ඇත්ත ඇති හැටියෙ දැකීමටමයි කියලා මම මතක් කරනවා. නමුත් තවම ඔය පින්වතුන්ට තවම ඒක මගෙ වචනෙකින්නෙ තියෙන්නේ. නමුත් පිටකය තුළින්ම ඔය පින්වතුන්ට සාක්ෂියක් වශයෙන් ආවොත් ඇත්තටම එහෙනම් සම්මා දිට්ඨිය කියන්නේ, චතුරාර්ය සත්‍යය, ආර්ය අෂ්ටාංගික මාර්ගය කියන්නේ මෙන්න මේ ධර්මතා ටිකමයි නේද එහෙනම්, මේ ටික

දැකීමමයි නේද කියලා මගෙ වචනෙ පැත්තකින් තබලා පිටකය තුළ මෙහෙම තියෙනවානේ කියන තැනකින් ඔය පින්වතුන්ට ජීවිතේට දැක්මක් එකතු කර ගන්න පුළුවන්. එතකොට ශ්‍රද්ධාව ඔය පින්වතුන්ට පිහිටන්නේ මම ගැන හෝ දේශනාව ගැන නෙවෙයි පිටකය ගැන, පිටකය තුළ මෙහෙම තියෙනවානේ. එතකොට ඔය පින්වතුන්ට බනින්න වෙන්නෙත් මට නෙවෙයි, බනිනවා නම් වැරදියි කියලා පිටකයටයි බනින්න වෙන්නේ. මොකද මම පෙන්වන්නේ පිටකය තුළ තියෙන දේනේ.

එතකොට එහෙම වුණාහම අපට කිසිම සැකයක් නැතුව ඉතුරු ටික කරගෙන යන්න, දහම් මාර්ගය වඩාගන්න පුළුවන්. ඒ නිසා මම අද මේ සූත්‍රය දේශනා කරන්නම්. මේක ටිකක් දිගයි, දිගටත් වඩා ගොඩාක් ගැඹුරු, ඒ වගේම ගොඩාක් ධර්ම කරුණු තියෙන සූත්‍රයක්. මේකෙනුත් අපට විශාල අවබෝධයක් ඇති වෙනවා. ඒ හින්දා හැම දෙනාම සසර ගෙවා ගන්න කොහොම හරි මේ දේශනාව අපේ ජීවිතයට උපකාරී ධර්මයක් වේවා, කියන කළණ සිතින් යුතුවම හැමදෙනාම ශ්‍රවණය කරන්නට ඕනේ. මේ සූත්‍රය තුළින් මේ පින්වතුන්ට සැක නැතිව, බය නැතුව, මෙන්න මේක තමයි නිවැරදිම එහෙනම් ක්‍රමය කියලා නිෂ්ඨාවකට පත්වෙන්න පුළුවන් පරියායක් මේකෙ පෙන්වනවා.

මේ සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට දේශනා කළේ සැවැත් නුවර ජේතවනාරාමයේ ඉන්න කාලේ. එක්තරා අවස්ථාවක බුදුරජාණන් වහන්සේ භික්ෂූන්වහන්සේලාට 'මහණෙනි' කියලා ආමන්ත්‍රණය කළා. භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට 'භාග්‍යවතුන් වහන්ස' කියලා ප්‍රති උත්තර දුන්නහම භාග්‍යවතුන් වහන්සේ දේශනා කරනවා 'මහණෙනි, මහා සළායතනික නම් වූ ධම්ම පරියාය, නැත්නම් දහම් ක්‍රමය මම නුඹලාට දේශනා කරනවා. ඒක මනාකොට අහන්න' කියලා. භික්ෂූන් වහන්සේලාත් 'එහෙමයි භාග්‍යවතුන් වහන්ස' කියලා ප්‍රතිඋත්තර දුන්නා. භාග්‍යවතුන් වහන්සේ මෙහෙම දේශනා කරනවා,

✶ දුක සහ දුක්ඛ සමුදය

චක්ඛුං භික්ඛවේ අජානං අපස්සං යථාභූතං, රූපෙ - අජානං අපස්සං යථාභූතං, - චක්ඛු විඤ්ඤාණං අජානං අපස්සං යථාභූතං - චක්ඛුසම්ඵස්සං අජානං අපස්සං යථාභූතං - යංපිදං චක්ඛු සම්ඵස්ස පච්චයා උප්පජ්ජති වේදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛම සුඛං වා තම්පි අජානං අපස්සං

යථාභූතං .... තස්ස සාරත්තස්ස, සංයුත්තස්ස, සම්මූළ්හස්ස අස්සාදානුපස්සිනෝ විහරති* - *ආයතිං පඤ්චූපාදනක්ඛන්ධා උපචයං ගච්ඡන්ති* - *තස්ස තණ්හාචස්ස පොනොභවිකා නන්දිරාග සහගතා තත්‍රතත්‍රාභි නන්දිනී සා චස්ස පවඩ්ඪති* - *තස්ස කායිකාපි දරථා පවඩ්ඪන්ති, චෙතසික දරතා පවඩ්ඪන්ති* - *කායිකාපි සංතාපා පවඩ්ඪන්ති* - *චෛතසිකාපි සංතාපා පවඩ්ඪන්ති, කායිකාපි පරිලාහො පවඩ්ඪන්ති* - *චෛතසිකාපි පරිලාහා පවඩ්ඪන්ති* - *සො කාය දුක්ඛංපි චෙතොසික දුක්ඛම්පි පටිසංවෙදේති.

මේ ටික මම පාලියෙන් මතක් කළේ. ඒ ටික සිංහලෙන් මම කියන්නම්. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, 'මහණෙනි, ඇහේ ඇති හැටි - චක්ඛු කියලා කියන්නෙ ඇහැට ***චක්ඛුං භික්ඛවෙ අජානං අපස්සං යථාභූතං*** - ඇහේ ඇත්ත ඇති හැටිය නොදන්නේ නොදක්නේ, හොඳට බලාගන්න, රූපයන්ගේ ඇත්ත ඇති හැටිය නොදන්නේ නොදකින්නේ, චක්ඛු විඤ්ඤාණය කියන ධර්මයේ ඇත්ත ඇති හැටිය නොදන්නේ නොදකින්නේ, චක්ඛු සමඵස්සය කියන ධර්මතාවයේ ඇත්ත ඇති හැටිය නොදන්නේ නොදකින්නේ, චක්ඛු සම්ඵස්සයෙන් උපන්න සැප හෝ දුක් හෝ 'නොදුක්' නොසුව (කියලා කිව්වේ උපේක්ෂා සහගත), වේදනාවක් උපදීනම්, ඒ වේදනාවන්ගේ ඇත්ත ඇති හැටිය නොදන්නේ නොදකින්නේ, ඔන්න ඔය ටිකේ ඇත්ත ඇති හැටිය නොදැක්කොත් වෙන දේ මොකක්ද එයා ***චක්ඛුස්මිං සාරජ්ජති*** - ඇහේ ඇලෙනවා, ඇහේ සතුටුවෙනවා. ***රූපා සාරජ්ජති*** - රූපයේ සතුටු වෙනවා. ***චක්ඛු විඤ්ඤාණස්මිං සාරජ්ජති*** - ***චක්ඛු විඤ්ඤාණයේ සතුටු වෙනවා. චක්ඛු සම්ඵස්ස සාරජ්ජති*** - ***චක්ඛු සම්ඵස්ස පච්චයා උප්පජ්ජති වේදයිතං සුඛංවා දුක්ඛවො අදුක්ඛම සුඛංවා තම්පි සාරජ්ජති***

එතකොට හොඳ කරුණක් පෙන්වනවා. ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය, චක්ඛු සම්ඵස්සය, චක්ඛු සම්ඵස්සයෙන් උපන්න සැප හෝ දුක් හෝ නොදුක් නොසුව වේදනාව කියන ධර්මතාවයන්ගේ ඇත්ත ඇති හැටිය නොදන්නවා කියන කරුණ, නොදන්නවා කියන ධර්මතාවය යම් තැනක ඇද්ද, එපමණකින්ම එයා ඇහේ ඇලුණු කෙනෙක්, ඇහේ සතුටු වෙන කෙනෙක්, රූපයේ ඇලුණු කෙනෙක්, රූපයේ සතුටු වෙන කෙනෙක්, ඇහැ, රූපය, චක්ඛු විඤ්ඤාණය කියන මේ ධර්මතාවයන්ගේ ඇලීම සතුටුවීම නැති නොකළ කෙනෙක් යන ගණයට යනවා.

මේකෙ හරි වටිනා, ගැඹුරු කරුණු ටිකක් පෙන්වනවා, ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය, චක්ඛු සම්ඵස්සය, චක්ඛු සම්ඵස්සයෙන් උපන්න වේදනාවන්ගේ ඇත්ත ඇති හැටිය නොදන්නේ නොදක්නේ එහි සතුටු වෙනවා, නැත්නම් එහි ඇලෙනවා කියන ධර්මතාවය වෙනවා. එහි සතුටු වෙනකොට මොකද වෙන්නේ, එයා ඇහේ, රූපයේ චක්ඛු විඤ්ඤාණයේ බැඳෙනවා - ***සංයුත්තස්ස*** වෙනවා, බැඳීමෙන් මොකද වෙන්නේ ***සමූලස්සස*** - සිහි මුලාවට පැමිණෙනවා, සිහි මුලාවට පත් වුණාහම මොකද වෙන්නෙ ***ආස්සාදානුපස්සිනෝ විහරති*** - ආස්වාදය අනුව බලමින් වාසය කරනවා කියන ටික වෙන්නේ ඉබේමයි. ඊට පස්සේ, ආස්වාදය අනුව බලමින් වාසය කරන කොට තියෙන අවාසිය මොකක්ද ***ආයතිං පඤ්චූපාදානක්ඛන්ධා උපචයං ගච්ඡන්ති*** - පංච උපාදානස්කන්ධය රැස් වෙනවා, එතකොට ඒ විතරක් නෙවෙයි ***තණ්හා චස්ස පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී*** - ගිය ගිය තැන සතුටු වෙන, ඒ ඒ තැන සතුටෙන් ඇලෙන පුනර්භවය පිණිස පවතින තණ්හාවක් තියෙනවා නම් ***සා චස්ස පවඩ්ඪති*** - ඔහුට ඒ තණ්හාව වැඩෙනවා. ඒ විතරක් නෙවෙයි ***තස්ස කායිකාපි දරතා පවඩ්ඪන්ති*** - මේ කයේ දරතකම වැඩෙනවා, සිතේ දරතකම, රළුකම, ඕදාරිකකම එන්න එන්න වැඩෙනවා. ***කායිකාපි සන්තාපා පවඩ්ඪන්ති*** - කයේ තැවීම වැඩෙනවා, සිතේ තැවීම වැඩෙනවා. ***කායිකාපි පරිලාහෝ පවඩ්ඪන්ති චේතසික පරිලාහෝ පවඩ්ඪන්ති*** - කයේ දැවීම සිතේ දැවීම වැඩෙනවා. කෙටියෙන් කිව්වොත් ***කායික දුක්ඛම්පි, චෙතොසික දුක්ඛම්පි පටිසංවේදි*** - සිතින් කයින් දුක් විඳින පුද්ගලයෙක් වෙලා.

එතකොට මේ දැන් මතක් කළේ සිතින් කයින් දුක් විඳිනවා කියන එක, **මේක තමයි දුක. මේ දුක ඇති වෙන ක්‍රමය, දුක්ඛ සමුදය. මෙතැන තියෙන්නේ සත්‍යය දෙකක්, දුකයි දුක්ඛ සමුදයයි කියන දෙක තව පිරියායකින් ගත්තහම.**

ඇහෙන් අපි රූපයක් බලනවා කියන මෙන්න මේ කාරණාව කරන අවස්ථාවේදි, ඇහැට රූපයක් පෙනෙන කොට, ඇහෙන් රූපයක් බලනවා කියන තැනදි, අපි රූප බලන ක්‍රියාව කරන කොට, ඒ අපි බලනවා නැත්නම් අපිට පෙනෙනවා කියන තැන, ඇහැ කියන ධර්මතාවයේ ඇත්ත ඇති හැටියෙ අපි නොදන්නවා නම්, නොදකිනවා නම්, ඒ ඇහෙන් පෙනෙන රූපයන්ගේ ඇත්ත නොදන්නවා නම් නොදකිනවා නම්, ඒ රූප දැනගන්න චක්ඛු විඤ්ඤාණය කියන සිතේ යථාභූත ස්වභාවය ඇත්ත ඇති හැටිය නොදන්නවා නම් නොදකිනවා නම්, ඒ චක්ඛු සම්ඵස්සය කියන්නේ කුමන ධර්මයක්ද කියන කාරණාව

නොදන්නවා නම් නොදකිනවා නම්, එයින් උපන්න යම් වේදනාවක් තියෙනවා නම් සැප වෙන්න පුළුවන්, දුක්වෙන්න පුළුවන්, උපේක්ෂා සහගත වෙන්න පුළුවන්. ඒ වේදනාවන්ගේ ඇත්ත ඇති හැටිය නොදන්නවා නම් නොදකිනවා නම්, ඉබේමයි ඇහේ සතුටු වෙනවා, රූපයේ සතුටු වෙනවා, චක්ඛු විඤ්ඤාණයේ සතුටු වෙනවා, චක්ඛු සම්පස්සයේ සතුටු වෙනවා, එයින් උපන්න වේදනාවේ සතුටු වෙනවා, කියන ටික වෙන්නේ.

ඒ කියන්නේ ඇහැ තමන්ගේ මිතුරෙක්, පෙනෙන රූපය තමන්ගේ මිතුරෙක්, චක්ඛු විඤ්ඤාණය තමන්ගේ මිතුරෙක්, චක්ඛු සම්ඵස්සය තමන්ගේ මිතුරෙක් කියන හැඟීම ඉතුරු වෙනවා එයාට. එයින්, ඒකේ ආදීනවයක්, ඒකෙ දෝෂයක් එහෙම එයාට පෙනෙන්නේ නැහැ. ඇහැ, රූපය, චක්ඛු විඤ්ඤාණය කියන මේ ටික තමන්ට හිතෛෂි කෙනෙක්, තමන්ට ප්‍රිය කෙනෙක්, තමන්ට යහපත කරලා දෙන කෙනෙක් හැටියට තමයි පෙනෙන්නේ. ඒකයි ඒකෙන් සතුටු වෙනවා කියලා කිව්වේ. ඒ ඒ ධර්මයන්ගේ ඇත්ත නොපෙනෙන කොට, එයාට ඇහැ කියන එක ප්‍රියවුවක්, ඇහෙන් පෙනෙන රූප එයාට බොහොම හිතෛෂී, ප්‍රිය වූ රූප තියෙනවා. එයාට කළණ කමින් ඉන්න, කළණ කමින් පවතින වස්තු හැටියටයි මේවා පෙනෙන්නේ. ඒකයි ***සාරජ්ජති*** කියලා කිව්වේ, සතුටු වෙනවා ඒවායේ.

සතුටු වෙනවා කියලා කියන කොට අපි මේ කෑ ගහලා, හූ කියලා, අත්පුඩි ගහලා නටන මට්ටම දකින්න ඕනෙ නැහැ. නමුත් ඔය පින්වතුන්ට අයහපතක් දුකක් ගෙනත් දෙන, ආදීනවයක් ජීවිතයට එකතුවෙන ධර්මයක් හැටියට නොපෙනී ඔය පින්වතුන්ගේ ජීවිතයට යහපතක්, සැපක්, සැනසිල්ලක් ළඟා කරගන්න, ළඟා කරලා දෙන ධර්මතාවයක් හැටියට පෙනෙනවා කියන මට්ටම දකින්න ***සාරජ්ජති*** කියන කොට, සතුටු වෙනවා කියන කොට.

ඒ මට්ටමට ඇහැ ගැන, රූපය ගැන, මේ පෙනෙන අරමුණු ගැන අපේ මනස පවතින කොට වෙන්නේ මොකක්ද, අපි ඒකෙ බැඳෙනවා. මගෙ ඇහැ, මගෙ දරුවෝ, මගෙ ගෙවල් දොරවල්, මගේ යාන වාහන, මගෙ ඉඩකඩම් කියලා ඒ ඇහේ, රූපයන්ගේ, චක්ඛු විඤ්ඤාණයේ එයින් උපදින වේදනාවේ බැඳෙනවා කියන කාරණාව වෙනවා, ඒක නවත්වන්න බැහැ. බැඳුනොත් සිහිමුලාවට පත්වෙනවා. එතකොට ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණ කියන මේ ධර්මතාවයන්ගේ ඇත්ත ඇති හැටි මොන විදියටවත් නොපෙනෙන තත්වයට පත්වෙනවා. සිහිය කියන එක, නුවණ කියන එක මුලා වෙලා. මුලා වෙනවා කියලා කියන කොට දැන් තියෙන්නේ වෙන විදියකට අපේ සිහිය. එතකොට ***ආස්වාදානුපස්සී විහාරති*** - ආස්වාදය අනුව බලමින් වාසය කරනවා කියන චරිතයක් ගොඩනැගිලා. හැම වෙලාවෙම එයාට, එයා හිතන්නේ, එයාට හිතෙන්නේ,

එයාට පෙනෙන්නේ මේ ධර්මයන්ගෙන් තමන්ට ප්‍රයෝජනයක් තියෙනවා, ප්‍රයෝජනයක් ගන්න පුළුවන්, වැඩක් ගන්න පුළුවන් කියන ධර්මතා හැටියටමයි එයාට පෙනෙන්නේ.

එතකොට මේවා එකක්වත් හිතලා කරන්න ඕනෙ නැහැ. ***ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණ*** කියන මේ ධර්මයන්ගේ ඇත්ත ඇති හැටිය නොදන්නවා කියන එකම ධර්මතාවය වෙද්දි, අනාත්මයි කියලා කියන්නේ. ඒකෙ සතුටු වෙනවා කියලා කියන කොට, අර අභිනන්දති, අභිවදති, අජ්ඣොසායතිට්ඨති කියලා කියන්නේ. එතකොට මේ ධර්මයන්ගෙන් සතුටු වෙනවා කියන කාරණාව වෙනවයි කියන එක තියෙනවා ඇත්ත නොදකින කොට. සතුටු වුණොත් ඒ වස්තූන්ගේ බැඳෙනවයි කියන කාරණාව තියෙනවා. බැඳුනොත් ඒ ධර්මයන්ගේ තමන්ගේ සිහිය මුලාවෙනවයි කියන කාරණාව තියෙනවා. කරන්නේ මොකක්ද, කියන්නේ මොකක්ද කියලා තමන්වත් එතකොට දන්නේ නැහැ. සිහිමුලා වුණු කෙනෙක්, උමතු වුණු කෙනෙක් උමතුවෙන් කියවනවා කරනවා වගේ, ඒ මුලාවුණු සිහියෙන්මයි හැම වෙලේම කියන්නේ කරන්නේ. ඒ කියන්නේ ආස්වාදයක්ම දකිනවා මිසක මේ ධර්මයන්ගේ සැපයක්ම, සොම්නස් ස්වභාවයක්ම, යහපත් ස්වභාවයක්ම දකිනවා මිසක, ඊට එහා දකින්න යමක් ඉඩ නැහැ. ඒක හිතලා කරනවා නෙවෙයි සිහිමුලා වුණොත් ආස්වාදය අනුවම බලනවා, ආස්වාදයක්ම ඒකෙ පෙනෙනවා කියන එක ධර්මතාවයක්.

හොඳට බලන්න බුදු හාමුදුරුවො කියපු හින්දා නෙවෙයි, පොතේ තියෙන හින්දා නෙවෙයි, ඔය පින්වතුන්ගේ ජීවිතයේ ඔය ටික වෙලා නැද්ද කියලා. ඇහේ, රූපයේ, චක්ඛු විඤ්ඤාණය කියන ටිකේ ඇත්ත ඔය පින්වතුන් දකිනවද? නැහැ. නොදකින කොට ඇහැ, රූපය, චක්ඛු විඤ්ඤාණය කියන ටිකේ සතුටු වෙන්නේ නැද්ද? ඇහෙන් බලලා ප්‍රියවෙන, සතුටු වෙන රූප නැද්ද? ඔය පින්වතුන් ඇහෙන් දකින රූප වලට මම, මගේ, කියලා බැඳිලා නැද්ද? මගෙ දරුවා, මගේ ගෙදර, මගේ අම්මා, මගේ තාත්තා, මගේ අත පය, මගේ ඇස්, කන් කියලා බැඳිලා නැද්ද? බැඳිලා තියෙනවා.

බැඳිලද නැද්ද කියලා අපිට හොඳට බලාගන්න පුළුවන්. මම කියන්නේ, තිරිසන්ගත සතෙක් දම්වැලකින් හරි මොකකින් හරි බැන්දොත් ඒ සතාට ගොඩක් දුර යන්න පුළුවන්ද? බැහැ. ඇයි ඒ? බැඳලා හින්දා, ඒ දම්වැලේ දුරට විතරයි යන්න පුළුවන්, ඊට එහා යන්න බැහැ. ඔය පින්වතුන්ට මම කිව්වොත් මහණ වෙමු අද කියලා, පුළුවන්ද? බැහැ නේද? ඇයි බැරි. දරුවෝ ඉන්නවා, ගෙවල් දොරවල් තියෙනවා එක පාරට දම්වැල පෙන්වනවා නේද? එච්චර ඕනෙ නැහැ, කොහාට හරි ගිහිල්ලා, පිටරටක ඕනෙත් නැහැ, මේ රටේම මාස තුන හතරක් පැත්තකට වෙලා භාවනා කරන්න, මෙච්චරයි සසරට, ජීවිතේට ඉතුරු වෙන්නේ කිව්වොත් පුළුවන්ද ඒකවත් කරන්න. ඒකත් බැහැ, අපහසුයි.

ඇයි ඒ? බැරි වෙලා හරි ඒක කරනවා නම් දම්වැල පොඩ්ඩක් බුරුල් කරලා එන්න ඕනේ. ලෙහෙලා නෙවෙයි, මාස තුනකට. ඒ කියන්නේ දම්වැල තව පොඩ්ඩක් දික් කරගෙන එන්න ඕනේ. ඒ කියන්නේ තව කාට හරි පවරලා, නිවාඩු දාලා කියලා කියන්නේ, එතෙන්ට යනකල් දම්වැල දික් කරගෙන ඉඳියි. එතැනින් එහාට යන්න බැහැ. දම්වැල කෙටිකරලා බැඳලා තියෙන්නේ, පොඩ්ඩක් දම්වැල දික් කරගත්තා මිසක ඒකද ලෙහා ගත්තා නෙවෙයි. තුන් මාසෙකට හරි, අවුරුද්දකට හරි පුළුවන් කියලා කියන්නේ, ඒ දම්වැල ලෙහා ගත්තා කියලද හිතන්නේ? නැහැ. ගහමුලට ආපහු ගිහිල්ලා ලණු කෑල්ල ටිකක් දික් කරගන්නවා. දැන් තව පොඩ්ඩක් දුරට ගියහැකි. හැබැයි බැඳුම ලෙහිලා නැහැ. ඒ මොකද? බැඳිලා.

අද බලන්න ඇත්ත නොදකින හින්දා, ඇත්ත නොදකින කම තියෙනවා. මේ ධර්මයන් තමන්ට සතුට ගෙන දෙන ධර්මයන් කියලා තමන්ට පෙනෙනවා. ඒ හින්දා මේවයේ බැඳුණු බව තමන්ට පෙනෙනවා නේද? බැඳිලා ඉන්න කොට තමන්ගේ සිහිමුලා වෙලා තියෙන්නේ. එතකොට කියනවා විපරීතයි සංඥාව. සිහි මුලා වීමේ ලක්‍ෂණය තමයි එයාගෙ හැඳිනීම විපරීතයි. ඒ කියන්නේ පවතින දේට වඩා සම්පූර්ණයෙන්ම විකෘතියි.

විකෘතියි කියන්නේ අනිත්‍ය දේ නිත්‍ය හැටියට පෙනෙන්නේ. දුක් දේ සැප හැටියට පෙනෙන්නේ අනාත්ම දේ ආත්ම හැටියට, අසුභ දේ සුභ හැටියට පෙනෙන්නේ. දැන් ඔන්න සිහි මුලා වෙලා. එතකොට සම්පූර්ණ විකෘතියි මනස. ඒ කියන්නේ සිදුවෙන දේට අනෙක් පැත්තක් පෙනෙන්නේ. නිත්‍යයි, සුභයි, ආත්මයි, සැපයි කියලාමයි පෙනෙන්නේ. ඒ මොකද? සිහි මුලා වුණු එකේ ලක්‍ෂණය.

ඒ විදියට පෙනෙන කොට ආස්වාදය අනුවම බලනවා කියන කාරණාව ඉබේම නිර්මාණය වෙලා. නිත්‍යයි, සැපයි, ආත්මයි, සුභයි කියලා පෙනෙන කොට එයා හිතන්නෙත්, කියන්නෙත්, කරන්නෙත් මේවා ආස්වාදයෙන් සටිත වුණු මනසකින්මයි. ආස්වාදය අනුව බලනවා, මේ ධර්මයන්ගේ ආස්වාදයක්ම දකින ජීවිතයක් ගොඩනැගිලා කියන කාරණාව ඉබේම වෙලා. බුදු හාමුදුරුවො කියපු හින්දා නෙවෙයි, පොතේ තියෙන හින්දා නෙවෙයි මම කියන හින්දා නෙවෙයි, ඔය පින්වතුන්ගේ ජීවිතයේ ඔය ටික සැබෑවටම නැද්ද? තියෙනවා. එතකොට බලන්න ***ස්වක්ඛාතෝ භගවතා ධම්මෝ*** බුදුරජාණන් වහන්සේගේ ධර්මය මොන තරම් ඇත්තද කියලා.

පංච උපාදානස්කන්ධය උපචයට ගොස් ලෝකය මැවෙන හැටි

ඔය මට්ටමට ඔහොම වුණාහම තියෙන දෝෂය මොකක්ද, ඊට පස්සේ බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ? මොකක්ද කියලා බලමු අපි පෙළම, ආස්වාදය අනුව බලන කොට මොකද වෙන්නේ ***ආයතිං පඤ්චුපාදානක්ඛන්ධා උපචං ගච්ඡති*** - පංච උපාදානස්කන්ධය රැස්වීමට යනවා. පංච උපාදානස්කන්ධයට අපි කෙටියෙන් තව නමක් කියනවා මොකක්ද? දුක කියලා. ජාති, ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස කියන ***සංඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා*** - එතකොට පංච උපාදානස්කන්ධය නැවත නැවත රැස් වෙනකොට රැස් වෙලා තියෙන්නේ මොනවද?, ජරා, මරණ, ශෝක, පරිදේව. අපි බලමු කොහොමද පංච උපාදානස්කන්ධය රැස් වෙන්නෙ මොකේටද පංච උපාදානස්කන්ධය රැස් වෙනවා කියලා කියන්නේ කියලා. ඒක අපි බලන්න ඕනේ.

දැන් ඔන්න හොඳට මතක තියාගන්න, **මේ ධර්මයන්ගේ යථාභූත ස්වභාවය නොදන්නේ නොදකින්නේ දන්නේ නැහැ, දකින්නේ නැහැ කියන එකම ධර්මතාවය වෙද්දි, ඔච්චරයි වෙන්න ඕනේ, අනිත් අර කියපු ධර්මතාවයන් එකින් එකට ඉබේම වෙලා. ආයෙ පුද්ගලයෙක් කරනවා නෙවෙයි, හේතුඵල දහමක්.** ඒ ධර්මයන්ගේ සතුටු වෙනවා කියන එක, සතුටු වෙනකොට ඇලෙනවා කියන එක, ඇලීමෙන් බැඳෙනවා කියන එක, බැඳීමෙන් සිහි මුලා වෙනවා කියන එක, සිහිමුලා වුණු කෙනා ආස්වාදය අනුව බලමින් වාසය කරනවා කියන ජීවිතයක් ඔන්න දැන් හැදිලා ඉබේම. කරලා නෙවෙයි, එකින් එකට එකින් එකට. හේතු ප්‍රත්‍යයි කියලා කියන්නේ, ඇත්ත නොදකිනවා කියන්නේ, මේ ධර්මයන්ගේ ඇලෙනවා කියන එක වෙලා. ඇලුනොත් බැඳෙනවා කියන එක වෙලා. බැඳුනොත් සිහිමුලා වෙනවා කියන එක වෙලා. සිහිමුලා වුණොත් ආස්වාදය අනුව බලනවා කියන ධර්මතාවය වෙලා. එකින් එකට අපිව ගෙනල්ලා අන්තිමට 'ලෝකය ආස්වාදයෙන් යුක්තව මෙනෙහි කරන ජීවිතයක් හැදෙනවා' කියන ටික වෙලා අපි දන්නෙම නැතුව.

ඔය හැමදෙයක්ම ඔය විදියට ආවහම එකතු වුණාහම ඔකෙ තියෙන නරකම සිද්ධි ටික ඔය ටික නෙවෙයි, ඕකෙ ඇතිවෙන ප්‍රතිඵලය. ඒ තමයි ***ආයතිං පඤ්චුපාදානක්ඛන්ධා උපචයං ගච්ඡති*** - නැවත පංච උපාදානස්කන්ධය උපචයට යනවා කියන එක.

පංච උපාදානස්කන්ධය කියන්නේ අපි දන්නවා රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන මේ ධර්මතා. ඒක අපේ ජීවිතයෙන් ස්කන්ධ වලින් නෙවෙයි අපේ ජීවිතයෙන් දකිමු. ඒ කිව්වේ දැන් ඔය වගේ මානසික මට්ටමක් තුළ ඉඳගෙන ඇහෙන් යම් රූපයක් බැලුවොත්, බලන බලන හැම රූපයම ඇති බවට තමන්ට එකතු වෙනවා, තමන්ගේ ජීවිතයට.

අපි දැන් ඕකට මෙහෙම කියමු. දැන් කවදාවත් නොගිය පැත්තක්, නොදැක්ක පැත්තක් ඔය පින්වතුන්ට සිහි කරන්න, හිතන්න පුළුවන්ද? බැහැ. අපි මෙහෙම කියමු. දැන් මේ පන්සලේම, මම අර ඉන්න කාමරේ මොන මොනවද තියෙන බඩු කියලා ඔය පින්වතුන්ට කිව්ව හැකිද මෙතැන ඉඳලා? පුළුවන්ද, බැහැ. හොඳයි දැන් ගිහිල්ලා බලලා ආයෙත් මෙතැනින් ඉඳගත්තහම, ඉබේම ඔක්කොම ටික තියෙයි නේද කාමරේ තියෙන ටික. දැන් ඔය පින්වතුන් හිතන්නේ කාමරේ තියන ටික අපිට තේරෙනවා කියලා. ඉතින් කාමරේ තියෙන ටික තේරෙනවා නම් දැනුත් තේරෙන්න එපායැ. බැලුවට පස්සෙ විතරක් තේරෙන්නේ කොහොමද? මම කියන එක තේරෙනවද?

දැන් ඔය පින්වතුන්ට පුළුවන්ද මම ඉන්න කාමරේ ඇඳ උඩ මොනවද තියෙන්නේ, ඇඳ යට මොනවද තියෙන්නේ, වට පිටාවෙ තියෙන්නේ මොනවද කියලා කියන්න? බැහැ. **හොඳයි ඊට පස්සේ ඔය පින්වතුන් කාමරයට යනවා. යනවා කියලා කිව්වේ ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය, චක්ඛු සම්ඵස්සය, චක්ඛු සම්ඵස්සයෙන් උපන්න වේදනාව, ඔය ධර්මතා ටික උපන්නා. ස්කන්ධ පංචකයක් උපන්නා කියන එකයි දැක්කා කියලා කියන්නේ. අපි දකිනවා කියන තැනක 'පංච උපාදානස්කන්ධයක්'. දැන් බලලා ආවට පස්සේ ඒ පංච උපාදානස්කන්ධය අස්වෙන්නේ නැහැ, ඉපිද නිරුද්ධ වෙන්නේ නැහැ. රැස් වෙනවා කියලා කියන්නේ ඇති බවට හිටිනවා.** දැකලා ඇවිල්ලා මෙතැන ඉඳගෙන ඉන්නකොට මම ඇහුවොත් ඔය පින්වතුන්ගෙන් මගෙ කාමරේ මොනවද තියෙන්නේ කියලා, පුළුවන්ද කියන්න, පුළුවන්. ඔය පින්වතුන්ට හිතෙන්නේ කාමරේ තියෙන දේම කියනවා වගේ කියලයි. නමුත් අපි තේරුම් ගන්න ඕනේ, කාමරේ තියෙන දේ ඉස්සෙල්ලා කියන්න බැරි වුණා නම්, දැන් කියන්න පුළුවන් නම්, එහෙනම් අපි රැස් කරගත්ත එක කියනවා මිසක, තියෙන එක කියනවා නෙවෙයි, නේද?

ඒ වගේ දැන් ඔය පින්වතුන්ට පුළුවන් නේද ගෙදර තියෙන බඩු භාණ්ඩ තියෙන තැන මෙතැන ඉඳලා කියන්න. හිතන්න කොච්චර දේවල් රැස්වෙලා තියෙනවද කියලා. මේ නගරෙ ගැන, රට ගැන පලාත් ගැන, ලංකාව ගැන, දෙමව්පියෝ ගැන, ඥාතීන් ගැන ජීවිතේ පටන් ගත්ත දවසෙ ඉඳලා, කොච්චර දේවල් ඔය පින්වතුන්ට සිහිකරලා, හිතලා කියන්න පුළුවන්ද නේද? ඔය පින්වතුන් දන්නවද ඒ හැම ස්කන්ධයක්ම ඉපිද නිරුද්ධ

වෙද්දි, ඒ අරමුණු හම්බ වෙන හැම තැනකදිම අපි අරමුණු එක්ක සම්බන්ධ වුණේ අර ඉස්සෙල්ලා කියපු වැරදි මානසික මට්ටමකින්. ඒ ටිකේ ප්‍රතිඵලය තමයි, ඇති බවට අපේ ජීවිතයට එකතු වුණා. දැන් ඔය පින්වතුන්ගේ ජීවිතයට ජරා මරණ දුක ලැබෙන්නේ ඔය එකතු වුණු ටික හරහා. මවු මළ දුක, පියා මළ දුක. මොකද ඒකට ජීවත්ව ඉන්න ඕනෙ නැහැ. මව්පියො දෙන්නා නැති වුණාත් ඔය දුක එනවා. මොකද පංචඋපාදානස්කන්ධය රැස්වෙලා තියෙන්නේ ඔය පින්වතුන් ළඟ නිසා.

ඒ ආහාරයෙන් හැදුණ රූපය විපරිණාම වෙන්න පුළුවන්. නමුත් අම්මා, තාත්තා, දුවා, පුතා කියන නෑදෑයො ටික හරහා ජරා, මරණ රැස් වෙලා තියෙන්නේ පංච උපාදානස්කන්ධයකින්. අපි ළඟ තියෙන්නේ. ඒ නිසා 'අපි ගාව ඉන්න' අම්මා තාත්තා මැරෙණ්නේ නැහැ. ඇයි ඒ? ඒ ආහාරයෙන් හැදුණු ස්කන්ධ ටික නිරුද්ධ වුණාත් අද බැරිද අපේ තාත්තා කියලා ඒ රූපය ලෝකයෙ නැහැ, නමුත් සිහි කරලා තාත්තා ගැන අඬන්න බැරිද අපිට? පුළුවන්. පියා මළ දුකට අපි කියමු දුක් විඳිනවා නම් ඒ දුක පංච උපාදානස්කන්ධ දුකක් නේද? එතකොට දැන් ඒ පංච උපාදානස්කන්ධය රැස් වුණු නිසා නෙවෙයිද? තාම ඔය පින්වතුන් මහළු වෙලා නැහැ. මම වයසට ගිහිල්ලා, මට සලකන්න කෙනෙක් නැති වෙයි කියලා දැන් දුක් වෙන්න බැරිද? පුළුවන්. මහළු බවේ දුක් විඳින්න පුළුවන් පංච උපාදානස්කන්ධයක් නිසා. තමන් මැරිලත් නැහැ. මැරෙයි කියලත් දුක් විඳින්න පුළුවන්.

මම මේ කිව්වේ ඇත්ත ඇති හැටියෙ නොදකින කොට, ඔය මානසික මට්ටම ඔය විදියට තියෙන කොට තියෙන දෝෂෙ තමයි දකින දකින දකින දකින හැම එකක්ම එකතු වෙනවා. ඉතුරු වෙනවා. දැන් මොකුත් කාමරේ ඇතුළෙ තියෙන දේවල් සිහිකරන්න බැහැ. මම ඉන්න කාමරේට ගිහිල්ලා බලලා මෙතැනින් ඇවිල්ලා ඉඳගත්තොත් ඔන්න ඒ ටික ඇති බවට තියෙයි. 'තමන් හිතන්නේ එතැන තියෙන දේයි, එතැන තියෙන්නේ තමන් හිතන දේයි' කියලා තවත් රවට්ටලත් පෙන්වනවා.

නමුත් දැන් ආයෙ අනිත් ස්වාමීන් වහන්සේ ඉන්න කාමරේ තියෙන දේවල් කියන්න බැහැ. ඊට පස්සෙ දෙවෙනි සැරේ ඒ ස්වාමීන් වහන්සේ ඉන්න කාමරේට යනවා. ගිහිල්ලා ඒකෙ තියෙන ඒවා බලලා එනවා. දැන් ඉඳගත්තහම ඒ කාමරේ තියෙන ඒවත් කිව්ව හැකි. ඔය පින්වතුන් බලන්න ජීවිතේට එක එක දේවල් රැස්වෙන හැටි තේරෙනවද කියලා. නමුත් දැන් අනිත් ස්වාමීන් වහන්සේ ඉන්න කාමරේ තියෙන දේවල් කියන්න බැහැ. ඊට පස්සේ ඒ ස්වාමීන් වහන්සේ ඉන්න කාමරේටත් ගිහිල්ලා බලනවා ඇඳ උඩ, ඇඳ යට තියෙන දේවල්, හොඳට නිමිති ගත්තා. ඔය කළේ මොකක්ද? ඇහැ, රූප, චක්ඛු විඤ්ඤානය කියන මේ ස්කන්ධ පංචකය උපද්දපු එක. ඒ ස්කන්ධ ටික නිරුද්ධ වෙනවා

පෙනෙන්නේ නැහැ. ආපහු ආවහම දැකපු දේවල් ඇති බවට හිටිනවා.

දැන් එකින් එක, එකින් එක තමන්ගේ ජීවිතයේ නිමිති වැඩි වුණු හැටි, නිමිති රැස් වුණු හැටි තේරුනාද?

ඔය විදියට පුංචි කාලේ ඉඳලා මේ වෙනකොට යම්තාක් දෙයක් මතක තියාගන්න පුළුවන් නම් ඔය පින්වතුන් දකින්න මේ අවිද්‍යා ප්‍රත්‍යය. තියෙන දේවල් එකක්වත් නෙවෙයි. දැන් ඔය පින්වතුන්ට යම්තාක් දේ සිහිකරන්න පුළුවන් නම් ඒ සිහිකරන හැම දෙයක්ම මොනවද මේ? පංච උපාදානස්කන්ධයක්මයි.

අපි පංච උපාදානස්කන්ධයකමයි හැසිරෙන්නේ. පංච උපාදානස්කන්ධ ලෝකය කියන කොට භෞතික කියන සිද්ධියක් දකින්න එපා. නමුත් අවස්ථාවට භෞතිකවත් හම්බ වෙනවා. නමුත් පංච උපාදානස්කන්ධයක් රැස් වෙනවා කියන කොට කොහෙද මේ රැස් වෙන්නේ පංච උපාදානස්කන්ධ ලෝකය? අවිද්‍යාව තුළ අපේ මනසෙ තියෙන්නේ. භවය කියලා කිව්වේ ඔතෙන්ට.

ඔන්න ඒ ස්කන්ධයන්ගේ, ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණයේ ඇත්ත නොදැක්කහම ඒකෙ තියෙන දෝෂෙ තමයි මොකක්ද? ඇහැ රූප චක්ඛු විඤ්ඤාණයේ ඇලෙනවා කියන කම ඇති කරලා. ඇලුනොත් තියෙන දෝෂෙ එයා ඒ ඒ වැඩේ කරලා ඉවර වෙනවා, නමුත් කෙළවරට එනකොට අපි ලොකු වධකාගාරෙක කොටු වෙලා. ඇත්ත නොදකින කොට ඒ වගේ ඇලෙනවා. ඇහැ, රූපයේ, චක්ඛු විඤ්ඤාණයේ ඇලුනොත් ඒවයේ බැඳෙනවා. බැඳුනොත් සිහි මුලාවෙනවා. නිත්‍යයි සැපයි, ආත්මයි කියලා විපරීතව පෙනෙන්නේ එහෙම සිහි මුලාවුනොත්, විපරීතව පෙනුනොත් ඒකෙ ආස්වාදය අනුවයි බලන්නේ හැම වෙලාවෙම, ආස්වාදය අනුව බලනවා කියන මට්ටමක් තිබුණොත්, 'දැක්කොත්, දැකපු දේ ඉතුරු වෙනවා.' ඇහුවොත් අහපු දේ ඉතුරු වෙනවා. ගඳ සුවඳ බැලුවොත් බලපු දේ ඉතුරු වෙනවා. තේරුනා නේද? ස්පර්ශ ආයතන හයෙන් යමක් යමක් ඇසුරු කළොත් ඒ ඒ දේ ඔක්කොම ජීවිත අත්දැකීමක් වෙලා ඉතුරු වෙනවා.

ඉතුරු වුණොත් මොකද තියෙන දෝෂෙ? එතකොට අපිට පෙනෙන්නේ 'තියෙන දේ හම්බ වෙනවා හම්බ වෙන දේ තියෙනවා, තියෙන දේ පරිහරණය කරනවා' කියන මනසක්. හොඳට ගුටිකන්න පුළුවන් ලෝකයක් එහෙම පිටින්ම මැවෙන අද යම් බඳු මනසක්ද, එබඳු මනසක් හැදිලා ඇති.

රැස් වුණහම, 'තියෙන කොට', තියෙන දේ හම්බ නොවී නැති දෙයක් හම්බ වෙන්න පුළුවන්ද? දැන් ඔය පින්වතුන්ට මෙහෙම ඉද්දිත් පංච උපාදානස්කන්ධය උපචයට

ගියහම, රැස් වුණහම තියෙනවනේ 'කාමරේ'. එහෙම වුණොත් 'තියෙන කාමරේම හම්බ වෙනවා' තියෙන දෙයක්ම දකිනවා, ආපහු එනකොට දැකපු දේ තියෙනවා' කියන එක වලක්වන්න බැහැ. ඒක දකින්න. එතකොට දැන් අපිට 'තියෙන දේම හම්බ වෙනවා, හම්බ වුණු දේ තියෙනවා' කියන මානසික මට්ටමක් හම්බ වෙන්නේ, හම්බ වෙනවා නේද එහෙම? එහෙම නුණොත් තමයි පුදුමේ.

දැන් පංච උපාදානස්කන්ධය උපචයට යද්දි, රැස් වෙද්දි 'පෙර නොතිබියි හටගන්නේ, ඉතුරු නැතුව නැති වෙනවා, උපද්දලයි පෙනෙන්නේ' කියන එක පෙනුනොත් තමයි පුදුමේ. ඇයි මෙච්චර රැස් වෙද්දි, රැස්වුණු ටික හම්බ වෙනවා මිසක අස්වුණු එකත් හම්බ වෙන්න පුළුවන්ද අපිට? බැහැ. තේරුනාද මම කියන එක.

රැස් වුණොත් රැස් වුණු කාරණාව තුළම හැසිරෙන්න වෙනවා මිසක, ඊට පරිබාහිර දෙයක් තුළ හැසිරෙන්න බැහැ. අපිට යම් යම් දේවල් තියෙනවා නම්, 'තියෙන දේවල් හම්බ වෙනවා, ආපහු හම්බ වුණු දේවල් තියෙනවා' කියන මානසික මට්ටම මිසක, ඊට එහායින් යමක් වෙන්න බැහැ.

එතකොට පංච උපාදානස්කන්ධ උපචයට ගියොත්, රැස් වීමට ගියොත්, පංච උපාදානස්කන්ධය රැස් වෙනවා කියන එක තේරෙනවා නේද? ඔය විදිහේ චරිතයක් අර ආස්වාදය අනුව බලන කොට පංච උපාදානස්කන්ධය උපචයට යනවා, රැස් වෙනවා කියන එක නවත්වන්න බැහැ. දැන් මොකුත් කරන්න බැහැ. මේක පෙළක්, පෙළ දහමක්, න්‍යායක්. මේ ධර්මතාවය වෙන්නේ මෙහෙම වෙනවා, මේ ධර්මතාවය වෙන්නේ මෙහෙම වෙනවා කියලා, කෙළවර දක්වාම තියෙනවා. දැන් තේරුම් ගන්න විතරයි ඔය පින්වතුන්ට පුළුවන්. නවත්වන්න බැහැ එකක්වත් ඔතැනින්. එතකොට පංච උපාදානස්කන්ධය රැස් වෙනවා. රැස් වුණොත් ලෝකය නිර්මාණය වෙලා.

පංච උපාදානස්කන්ධ ලෝකය කියලා කිව්වේ, අතීතය තියෙන, අනාගතය තියෙන, වර්තමානය තියෙන, අතීත, අනාගත, වර්තමාන කියන තුන් කාලයෙන් යුක්ත, 'තමන්' සහ 'බාහිර' කියලා බෙදීමකින් යුක්ත, මේ ලෝකය කියලා එකක් මැවෙනවා. අම්මා, තාත්තා, දුවා, පුතා, ඥාති, හිතෛෂීන්, කාර්, බස්, වාහන, රන් රිදී, මුතු, මැණික් ඔක්කොම තියෙනවා. ඔක්කොම පංච උපාදානස්කන්ධ ලෝකයේ තියෙන්නේ.

ඔය මට්ටමේ තියෙන කොට සිදු වෙන දෝෂෙ මොකක්ද, පංච උපාදානස්කන්ධය උපචයට යනකොට දැන් එයාට තියෙනවා මොනවද, මම කිව්වේ ලෝකය ඔක්කොම තියෙනවා. අතීතය නිරුද්ධ වෙලා නැහැ. දැකපු ඒවත් තියෙනවා. ලබාගන්න අනාගතයක් නොවුණාට න-ආගත වුණාට, එයාට තවම නොවුණා නෙවෙයි, එයාට

තියෙනවා හෙට දවසෙදි ගිහිල්ලා බලන්න, හෙට දවසෙදි දකින්න පුළුවන් ඒවා අද නිර්මාණය වෙලා තියෙනවා. හරියට නිම්මානරතිය වගේ. නිර්මාණය කරගෙන රතිය ලබන හින්දනේ, තමන්ට සතුටු වෙන්න පුළුවන් හින්දනේ නිම්මානරතිය කියන්නේ දෙවියන්ට. එයාට එච්චර ආශ්චර්යයක් තියෙනවා. ඕන ඕන විදියට සතුටු වෙන්න පුළුවන්. තමන් කැමති දේ තමන්ට නිර්මාණය කරගන්න පුළුවන්.

අපිට අනාගත කියන වචනෙ කිව්වට 'න-අනාගත' - තාම ආවෙ නැහැ කියලා, ආවෙ නැති වුණාට, අපි අරගෙන තියෙනවා. ඒ කියන්නේ අද දවසෙදි පුළුවන් හෙට දවසෙ වස්තූන්ගෙන් සතුටු වෙන්න. අපි පුදුම හැකියාවක් ඇති අය කියලා මම හැමදාම කියන්නේ. ඒ කියන්නේ නූපන්න දේවල් අරභයා අද සතුටු වෙන්න පුළුවන් හැකියාවක් තියෙයි. හෙට දවසෙදි අහවල් කෙනාව බලන්න යනවා කියලා, ගිහිල්ලා හම්බ වෙන එක ගැන සතුටු වෙන්න පුළුවන් අද, පුළුවන් නේද? ඒ වගේ අතීත, අනාගත, වර්තමාන කියලා, තමන් ඉන්නවා, තමන්ගේ දුවා පුතා, ඥාති, හිතෛෂීන් කියලා අනුනුත් ඉන්නවා කියලා දෙකට බෙදිලත් හම්බ වෙනවා. ඒ තුළ රන්, රිදී, මුතු, මැණික්, යාන, වාහන, ඉඩ කඩම් මිල මුදල් කියලා මෙන්න මේ කාරණා ඔක්කොම එකට එකතු කරලා මේ පංච උපාදානස්කන්ධය රැස් වෙන කොට ලෝකයක් හැදෙනවා. ඕකට කියනවා පංච උපාදානස්කන්ධ ලෝකය කියලා.

ඔහොම තිබුණහම ඊළඟට තියෙන පාඩුව මොකක්ද? ***පඤ්චුපාදානක්ඛන්ධා උපචයං ගච්ඡන්ති*** පංච උපාදානස්කන්ධය රැස් වීමට යනවා. දැන් රැස් වුණහම දකින්න ඕනෙ මොනවද, පංච උපාදානස්කන්ධ ලෝකයක් තියෙනවා අපිට. හිනා වෙන්න පුළුවන්, ක්‍රීඩා කරන්න පුළුවන්, සතුටු වෙන්න පුළුවන්, රණ්ඩු වෙන්න පුළුවන්, ගහගන්න පුළුවන්, ලෝකය කිව්වහම කිසි දෙයක් අඩු නැහැ. ඔක්කොම ටික තියෙනවා. හැබැයි හොඳට දකින්න, මේ පංච උපාදානස්කන්ධ ලෝකය තුළ. පංච උපාදානස්කන්ධය රැස් වුණ කාරණාව කියන එක දකින්න මේකෙන්. මොකද තවම ඔය පින්වතුන් දකින්නේ බාහිර භෞතික වස්තූන්. වස්තූන් තුළ තියෙන ජරා, මරණ තියෙන ලෝකයක් නේ. අපි දැක්කා ලෝකය කියන එක, පංච උපාදානස්කන්ධය කියන එක, රැස් වුණු එකක් මනසෙ තිබුණෙ. ඔය ඔක්කොම ලෝකය, අපි හිතන හිතන යම්තාක් වස්තු තියෙන්නේ ඔය මනසේ.

එතකොට ඔහොම තිබුණොත් වෙන්නේ මොකක්ද? ***තණ්හා චස්ස පොනොභවිකා නන්දිරාග සහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී සා වඩ්ඪති*** තණ්හාව වැඩෙනවා. ගිය ගිය තැන සතුටුවෙන, ඒ ඒ තැන සතුටින් ඇලෙන, පුනර්භවය පිණිසත් පවතින, තණ්හාව වැඩෙනවා. ඒ කිව්වේ මේ තණ්හාවේ ස්වභාවය තමයි ඒ ඒ තැන සතුටු

වෙන, ගෙදර ගියොත් ඔන්න එතැන සතුටු වෙනවා. අම්මලා බලන්න ගියහම එතැන සතුටු වෙනවා. කොතැනකට හරි, කොතැනකට හරි ගියොත් ඒ ඒ තැන සතුටු වෙනවා. ඒ ඒ තැන සතුටු වුණොත් ඇලෙනවා. ඒ විතරක් නෙවෙයි නැවත පුනර්භවය පිණිසත් පවතිනවා කියන තණ්හාව වැඩෙනවා. ඇයි ඒ? එයාට රත්තරන් හම්බ වෙන කොට, රත්තරන් වලට කැමති වෙන්නෙ නැද්ද? රිදී හම්බ වෙන කොට, ගෙවල් හම්බ වෙන කොට, යාන වාහන හම්බ වෙන කොට, මිල මුදල් හම්බ වෙන කොට, තමන් ඉන්න කොට, දුවා දරුවො ඉන්න කොට, සතුටු වෙන්නේ නැද්ද? පංච උපාදානස්කන්ධය රැස් වුණහම තියෙන කාරණාව තමයි තණ්හාව ඇති වෙනවා කියන එක නවත්වන්න බැහැ. දරුවෝ ගෙවල් දොරවල්, යාන වාහන, ඉඩකඩම්, මිල මුදල් තමන් සන්තකයේ තියෙන කොට ඒවට කැමැත්ත. ඇති වෙනවා කියන එක වලක්වන්න පුළුවන්ද? බැහැ.

ඒකයි, තණ්හාව කියන එක වැඩෙනවා කියන කාරණාවක් වෙලා. ඒ ඒ තැන සතුටු වෙන, ඒ ඒ තැන සතුටු වුණොත් ඇලෙනවා මේ තණ්හාවේ ලක්ෂණය. තව ඒ විතරක් නෙවෙයි, එයා තවත් එකක් කරනවා ***පොනො භවිකා*** පුනර්භවය පිණිසත් පවතිනවා, නැවත ප්‍රතිසන්ධිය පිණිසත් පවතිනවා මේ තණ්හාව. ඒ ඒ තැන ඇති වෙන, ඒ ඒ තැන සතුටු වෙන, ඒ ඒ තැන සතුටින් ඇලෙන, පුනර්භවයක් පිණිස පවතින තණ්හාව කියන කොට ඔය තණ්හාවට නම් දෙකක් තියෙනවා. මම මේවා කියන්නේ ඔය පින්වතුන් ඇත්තටම මේවා දැනගත යුතු නිසා. ඔය තණ්හාව නම් කරනවා 'වට්ටමූලික තණ්හාව' සහ 'සමුදාචාර තණ්හාව' කියලා දෙයාකාරයකින්. සමුදාචාර තණ්හාව තමයි ඒ ඒ තැන සතුටුවෙන, ඒ ඒ තැන සතුටින් ඇලෙන කියලා කිව්වේ. ඒ තණ්හාව අපි නම් කරනවා. රූප තණ්හා, ශබ්ද තණ්හා, ගන්ධ තණ්හා, රස තණ්හා, පොට්ඨබ්බ තණ්හා, ධම්ම තණ්හා කියලා. ***පොනොභවිකා***, පුනර්භවය පිණිස පවතින තණ්හාව කියන එකට කියනවා වට්ටමූලික තණ්හාව කියලා. ඒකට ධර්මයේ පෙන්වනවා කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා කියලා. මේ දෙයාකාර තණ්හාවම වැඩෙනවා එකම කාරණාවක් තුළින්.

පංච උපාදානස්කන්ධය රැස් වෙනවා කියලා කියන්නේ, එයාට ගෙවල් තියෙනවා, යාන වාහන තියෙනවා, ඉඩකඩම් තියෙනවා, මිල මුදල් තියෙනවා, දූ දරුවෝ ඉන්නවා කියන එක දකින්න. එහෙම තියෙද්දි, 'ඒවයේ සතුටු වෙනවා සහ ඒවා නිසා ප්‍රතිසන්ධියට යන්න වෙනවා කියන හේතු කාරණාව මනසේ හැදිලා, තණ්හාව කියන එක ඇති වෙනවා' කියන එක දකින්න.

ඔන්න දැන් දුකයි, දුක්ඛ සමුදයයි දෙක හොඳට හදාගෙන. ඒ කියන්නේ ජරා මරණ දුකට ලෝකයත් හදාගෙන, එබඳුම ලෝකයක් නැවත හදා ගන්න තියෙන හේතුවත් හදාගෙන තියෙනවා. දුක සහ දුක්ඛ සමුදය කියන ධර්මතා දෙක මනසේ උපදවා ගත්ත

එයාගේ ජීවිතයේ විස්තර ටිකක් තියෙනවා. ඒ විස්තර ටික තමයි මොකක්ද? ***කායිකාපි දරතා පවඩ්ඪති*** - මේ කය හැම වෙලාවෙම දරතයි, රළුයි. ඒ කයේ රළුකම, දරත කම එන්න එන්න වැඩෙනවා. ***චෛතසික දරතා පවඩ්ඪති*** - සිතේ දරත කම, රළු කම වැඩෙනවා. ඊට පස්සේ කයේ නිතරම තෙහෙට්ටු ගතිය, කයේ තැවීම, හිතේ තැවෙන කම, කයෙනුයි සිතිනුයි තැවෙන කම කියන ධර්මතා දෙක එයාට ලැබිලා තියෙනවා. නිතරම කයේ දැවීම, හිතේ දැවීම කියන ධර්මතා දෙක, කුමන කුමන කාරණාවක් නිසා හෝ කයේ දැවීම සහ හිතේ දැවීම කියන කාරණා දෙක ඇති වෙලා තියෙනවා. කෙටියෙන් එකතු කරලා කැටි කරලා ගත්තහම ***කායික දුක්ඛම්පි, චෛතසික දුක්ඛම්පි පටිසංවේදෙති*** සිතින්ද, කයින්ද දුක් විඳින්නෙක් වෙලා. දුක හදාගත්තහම දුක් විඳින්නෙක් නොවී සැප විඳින්නෙක් වෙනවයැ නේද?

එතකොට, සිතින්ද, කයින්ද දුක් විඳින්නෙක් වෙනවා කියන මේ තැන නතර කරන්න මැද මොකුත්ම නැහැ. අඛණ්ඩවම තියෙනවා. කොතැන ඉඳලද? දැන් අපි අනු පිළිවෙලින් ආවා, මේ ධර්මයන්ගේ ***අජානං අපස්සං යථා භූතං*** - යථා භූත ස්වභාවය නොදන්නේ, නොදක්නේ, ***චක්ඛුස්මිං සාරජ්ජති*** - ඇහේ ඇලෙනවා. ***සාරත්තස්ස සංයුක්තස්ස*** - ඇලුනොත් බැඳෙනවා. ***සංයුත්තස්ස සම්මූල්ලස්ස*** - එතකොට බැඳුනොත් සිහි මුලා වෙනවා. ***සමූලස්ස ආස්වාදිනානුපස්සි විහරථි*** සිහිමුලා වුණොත් ආස්වාදය අනුව බලමින් වාසය කරන්නෙක් වෙනවා. මේවා එකින් එක දැන් වෙලා. ආස්වාදය අනුව බලමින් වාසය කරන්නෙක් වෙනකොට වෙන්නේ මොකක්ද, පංච උපාදානස්කන්ධය රැස් වෙනවා. පංච උපාදානස්කන්ධය රැස් වුණොත් තණ්හාව වැඩෙනවා. දරුවට තණ්හාව කියයි, ගෙවල් වලට තණ්හාව කියයි, රත්තරන් වලට, රිදී වලට එක එක පංච උපාදානස්කන්ධ එකතු වෙන්න, එකතු වෙන්න තණ්හාව ටිකක් එකතු වෙනවා. තණ්හාව පොඩ්ඩක් වැඩෙනවා. පංච උපාදානස්කන්ධයේ එකක් එකතු වෙනකොට තණ්හාව පොඩ්ඩක් වැඩෙනවා. ඔය පින්වතුන්ට කාරණා දහයක් එකතු වෙනකොට තණ්හාව දහ ගුණයකින් වැඩිලා. දහ ආකාරයකට. එකලොස්වෙනි කාරණාවක් එකතු වෙනකොට කැමති තව එකක් එකතු වෙලා. මේවා එකතු වෙනකොට තණ්හාව වැඩෙනවා කියලා දකින්න.

තණ්හාව වැඩුනොත් මොකද වෙන්නෙ? දැන් ඉබේමයි. මරණයට ගෙනියන ගවයෙක් හැටියට තමන්ව තීරණය වෙලා වගේ, මේ ජරා මරණ දුකට තියෙන කාරණා ටිකත් තියාගෙන ඔය ටික වෙද්දි දැන් හොඳට තමන්ව තීරණය වෙලත් ඉවරයි, මොකටද,

ආපහු සසරට පුනර්භවය පිණිස යන්නෙක් කියන කාරණාවකින් ලියවිලා තීරණය වෙලා ඉවරයි. ඇයි ඒ, පුනර්භවය පිණිස පවතින තණ්හාව දැන් තියෙයි නේ නේද? දැන් මොකුත් ඔහෙ මැද හාරන්න බැහැ. ඊට පස්සේ මෙලොවමත් දුක් විඳලා, ඒ කියන්නේ ජරා මරණ රැස්කරගෙන, ප්‍රතිසන්ධියට යන්නත් හේතුවකුත් හදාගෙන ඉන්න මෙයාගෙ දැන් ජීවිතය බැලුවොත්, රළු කයක් ඇති, රළු හිතක් ඇති. ඒ කියන්නේ, රළු කයක් කියලා කිව්වේ, රළු හිතක් කියලා කිව්වේ. තණ්හා කරන, රැස්වුණු පංච උපාදානස්කන්ධ කොටුවෙ මොනව හරි දෙයක් ගන්න ආවොත් කපන්න හරි කොටන්න හරි තරම් පුළුවන් කෙනෙක් මෙයා. නොගහ ඉඳියි කියලා හිතෙයිද?

රහතන් වහන්සේ නමකට පුළුවන්ද ඒ තරම් රළු වෙන්න? ඔය පින්වතුන්ට අද බැහැ. හොඳයි කාටද සහතික වෙන්න පුළුවන් ඔය පින්වතුන්ගෙ ඔය පංච උපාදානස්කන්ධ කොටුවෙ තියෙන මොනවම හරි දෙයක් ගන්න ආවොත්, වචනෙකින්වත් බනින්නේ නැති වෙයි කියලා කියන්න පුළුවන් කවුද ඉන්නේ. රළු නැහැ කියලා කියනවා මම එහෙම කෙනෙකුට. ඉස්සෙල්ලා බලනවා ටිකක් තදින් කතා කරලා යවන්න, ගන්න කෙනාට. බැරි වුණොත් තව ටිකක් රළු වෙන්න වෙනවා, ටිකක් පරුෂ වචනයෙන් කතා කරනවා. ඒකත් බැරි වුණොත් පොඩි ලීයක්, කෝටුවක් අරගෙන බලනවා. බැරිම තැන කඩුවක්, කිනිස්සක්, පිස්තෝලයක් හරි ගන්නවා නේද? අපි අනුක්‍රමයෙන් රළු වෙන්නේ නැති වෙයිද? රළු වෙනවා. එතකොට සිතිනුත්, මරණ්න ඕනේ කපන්න ඕනේ, කොටන්න ඕනේ කියලා අද හිතෙන්නේ නැහැ. මම කියන්නේ නැහැ ඔය පින්වතුන් කරනවා කියලා. අද හිතෙන්නේ නැහැ. නමුත් දැනගන්න එහෙම හිතෙන්න පුළුවන් හේතුව ඔය පින්වතුන් ළඟ තියෙනවා. ඒකයි මේ ***කායිකාපි දරතා පවඩ්ඪන්ති, චෛතසිකාපි දරතා පවඩ්ඪන්ති*** කියලා කියන්නේ.

උදාහරණයක් අපි ගනිමු, හැබැයි මේවා මම කිව්වොත් ඔය පින්වතුන් හිතයි හාමුදුරුවෝ නිකම් අව කැපෙන කතා කියන්නේ කියලා. නමුත් ඇත්ත වෙන්න පුළුවන්. අපි කියමු මොකද **පුත්තාවත්තු මනුස්සානං** - මනුස්සයන්ට තියෙන වස්තුව තමයි දරුවෝ කියන්නෙ. අපි අනෙක් ඒවා ඔක්කොම පැත්තකට දාමු. හදිස්සියේ දරුවෙකුට කරදරයක් කරන්න ආවා තව කවුරු හරි මනුස්සයෙක්. ඔය පින්වතුන් නිකම් ඉන්නවද? ඉන්න පුළුවන් වෙයිද? බලන්න රළු කම එන්නේ නැති වෙයිද? මම කියන්නේ මොනවාම හරි දෙයකට සාපේක්ෂව වෙන්න පුළුවන්නෙ. ඒකට පුළුවන්කම තියෙනවානේ.

දැන් 'තණ්හාව තිබුණොත් දරත ජීවිතයක් තියෙන්නේ එයාට' කියන එක නවත්වන්න බැහැ. නතර වෙන්නේ නැහැ. නමුත් රහතන් වහන්සේ නමක් තමන්ගෙ

ජීවිතය කෑලි කෑලි කැපුවත් දරත වෙයිද? රළු වෙයිද? නැහැ. එතකොට ***කායිකාපි දරතා පවඩ්ඩන්ති චෙතසික දරතා පවඩ්ඩති*** කයේ රළු කම, සිතේ රළු කම ඇති වෙනවා.

එහෙම රළු මට්ටමකින් ඉන්න කෙනා ***කායික සන්තාපා පවඩ්ඩති චෙතසික සන්තාපා පවඩ්ඩති*** - කවුරු මොන විදියට කිව්වත් මේක නොවී තියෙන්නේ නැහැ. ඔය පින්වතුන්ට සිතුවිලි පහළ වෙනවාමයි වෙන්න ඕනේ. ඒ කියන්නේ යම් සිතුවිල්ලක් පහළ වෙනකොට 'අපරාදෙ මම මේක කිව්වේ, කෙරුවේ' කියන දේවල් මතක් වුණු විතර්ක තමන්ගේ මනසේ පහළ වෙනවාමයි. ඒක නවත්වන්න බැහැ. එතකොට කයේ තෙහෙට්ටුව කියන එක, වෙහෙස කියන එක ඇති වෙනවාමයි, ඒක නවත්වන්න බැහැ. ***කායික සංතාපා චිත්ත සංතාපා පවඩ්ඩති.***

කායිකාපි පරිලාහො චිත්ත පරිලාහො පවඩ්ඩන්ති - කයේ දැවීම සිතේ දැවීම ඇති වෙනවා. යම් සිතුවිල්ලක් සිහි කරන කොට තමන්ගේ බඩ පපුවම තමන්ට පිච්චිලා යනවා නම්, එබඳු සිතුවිලි උපදිනවා කියන එක නවත්වන්න බැහැ. ඒවා වෙන්නම ඕනේ, මේ සාස්තරේ හරි නම්. හරිද? ඒ වගේ මානසික මට්ටමක් අනිවාර්යයෙන් ඔය පින්වතුන්ට තියෙන්නම ඕනේ. ඒක තමයි ***චෙතසිකාපි පරිලාහො පවඩ්ඩන්ති*** - කියලා කියන්නේ. ඊට පස්සේ කයේ දැවිල්ල කියන එක ඇති වෙන්නම ඕනේ. ඔය ටික වෙනකොට සිතින්ද කයින්ද ***කායික දුක්ඛම්පි චෙතසික දුක්ඛම්පි පටිසංවේදෙති*** - සිතින්ද කයින්ද දුක් විඳින්නෙක් වෙලා කියන ටිකක් වෙලා. අඳුනකින් බැලුවා වගේ කියලා තියෙනවා නේද හරියටම බුදු රජාණන් වහන්සේ ඔක්කොම ටික.

දැන් මට කියන්න ඕන කාරණා ටික තමයි ඔය පින්වතුන්ට සිතින්ද කයින්ද දුක් විඳින්නෙක් කියන තැන නිර්මාණය වුණහම, මේ දම්වැල් පුරුක අමුණලා තියෙන්නේ ඊගාව පුරුකට, මේ දම්වැල් පුරුක අමුණලා තියෙන්නේ ඊගාව එකට. මෙහෙම එකින් එකට එකින් එකට තියෙන්නේ. මේ කෙළවරින්, මැදින් කිසිම දෙයක්, මොකුත් කරන්න බැහැ අපිට. අපි දුක් විඳින්නේ මෙන්න මෙහෙමයි කියන එක දැනගන්න පුළුවන්. පංච උපාදානස්කන්ධය නවත්වන්නවත්, තණ්හාව නැති කරනවාවත් කියලා ඔහෙන් මොකුත් කතා බැහැ. අනිත්‍ය බලනවා.. මොන විදියට වත් කරන්නට බැහැ. ඒක න්‍යායක්. මගේ අදහසක් නෙවෙයි. මම මේ පෙළමයි කියාගෙන ආවේ ඔය පින්වතුන්ට මේ ඇත්ත ඇති හැටියේ නොදන්නේ නොදකින්නේ නම් මෙහෙම වෙනවා, මේ ටික නොදකින්නේ නම් මෙහෙම වෙනවා, මේ ටික වෙන්නේ නම් මෙහෙම වෙනවා කියලා මේ අනුපිළිවෙලක් තියෙයි.

කෙටියෙන් ගත්තහම, දුක සහ දුක්ඛ සමුදය බුදුරජාණන් වහන්සේ විස්තර කරන හැටි ***අවිජ්ජා පච්චයා*** - මේ ධර්මයන්ගේ ඇත්ත ඇති හැටියෙ නොදන්නාකම කියලා කිව්වේ අවිද්‍යාව. අවිද්‍යාව මුල් කරගෙනයි දුක සහ දුක ඇති කරන හේතුව ඇති වෙන්නේ කියන කාරණාවයි තව පැත්තකින් මතක් කළේ. දැන් ඒ ටික තේරුනා නේද?

ඔය දැන් මම මතක් කළේ දුක සහ දුක්ඛ සමුදය ඇති වෙලා දුක් විඳින පුද්ගලයෙක් ලෝකයේ ඇති වෙන හැටි. අපි මෙහෙම හිතින් කයින් දුක් විඳිනවා නම්, අපි පුද්ගල භාවයක් ඇති කරගත්තට මම කියලා තියෙනවා හේතුඵල දහම. එහෙනම් හිතින් කයින් දුක් වෙන්න, දුක ලැබෙන්න පවතින ධර්මතාවයක් තියෙන්න ඕනෙ. ඒ ධර්මතාවයයි බුදු හාමුදුරුවො පෙන්නුවේ. මෙන්න මෙහෙමයි ඔය පින්වතුන්ට දුක එන්නේ, මෙන්න මෙහෙමයි ඔය පින්වතුන් දුක් විඳින්නේ, මෙන්න මෙහෙමයි තණ්හාව ඇති වුණේ. මෙන්න මෙහෙමයි තණ්හාව ඇති වෙන්නේ කියන එක පෙන්වනවා.

එතකොට ඔය පින්වතුන්ට තේරෙනවා ඔය මගින් නවත්වන්න බැහැ තණ්හාව කියන එක. මගදි නවත්වන්න බැහැ දුක කියන එක. මෙතැනින් නැවැත්තුවට මේ උපත පටන් අරන් තියෙන්නේ ගොඩාක් එහායින්. අපි මෙතැනින් වැහුවා කියලා එයා නතර වෙන්නේ නැහැ, වෙන තැනකින් ගලයි නේද?

එතකොට ඒ විදියට දැන් ඔය ඇහැ මුල් කාරණාව කරගෙන විතරනෙ අපි කිව්වේ, දේශනා කළේ. ඊට පස්සෙ ***සෝතං භික්ඛවෙ අජානං අපස්සං යථා භූතං - සද්දා භික්ඛවෙ අජානං අපස්සං යථාභූතං - සොත විඤ්ඤාණං භික්ඛවෙ අජානං අපස්සං යථා භූතං - සොත සම්ඵස්සං භික්ඛවෙ අජානං අපස්සං යථාභූතං - සොත සම්ඵස්ස පච්චයා උප්පජ්ජති වේදයිතං සුඛංවා දුක්ඛංවා අදුක්ඛම සුඛංවා තම්පි අජානං අපස්සං යථාභූතං - සෝතස්මිං සාරජ්ජති, සද්දා සාරජ්ජති, සොත විඤ්ඤාණං සාරජ්ජති, සොත සම්ඵස්සෙ සාරජ්ජති, සොත සම්ඵස්ස පච්චයා උප්පජ්ජති වේදයිතං සුඛංවා දුක්ඛංවා අදුක්ඛම සුඛංවා තම්පි සාරජ්ජති*** - ඒකෙදිත් සතුටු වුණොත් ***සංයුත්තස්ස*** - ඇලුනොත් බැඳෙනවා. බැඳුනොත් ***සමූලස්ස*** - මුලා වෙනවා. මුලා වුණොත් ආස්වාදය අනුව බලමින් වාසය කරන්නෙක් වෙනවා. ආස්වාදය අනුව වාසය කරන්නෙක් වුණොත් පංච උපාදානස්කන්ධය රැස්වෙනවා. ඒ කිව්වේ අහපු ශබ්දය ඉතුරු වෙනවා. කළින් 'බලපු රූපය ' ඉතුරු වෙනවා කළින් පරියායෙදි. දැන් මේකෙදි 'අහපු ශබ්දය' ඉතුරු වෙනවා.

අහපු ශබ්දය ඉතුරු වුණොත් මොකද වෙන්නේ, තණ්හාව වැඩෙනවා. ඒ පරියාය ඒ විදියට යනවා.

ඊට පස්සෙ ඒ විදියටම දකින්න. ***සොතං භික්ඛවේ. අජානං අපස්සං යථාභූතං, ගන්ධා භික්ඛවෙ අජානං අපස්සං යථාභූතං*** - කියලා නාසය කියන පරියායෙන් ඔය ටික දැක්කම හැම ගඳ සුවඳක්ම ඉතුරු වෙනවා. දිවෙහි යථාභූත ස්වභාවය නොදන්නා, නොදකින කොට හැම රසයක්ම ඉතුරු වෙනවා. කයේ ඇත්ත නොදන්න කොට හැම ස්පර්ශයක්ම ඉතුරු වෙනවා. කයත් ඉතුරු වෙනවා. සිතේ ඇත්ත නොදකින කොට හිතන හිතන හැම දෙයක්ම ඉතුරු වෙනවා.

ඔය පින්වතුන් මොනවා හරි දෙයක් හිතන්නකො 'හිතන ඒවා තියෙනවා තියෙන ඒවා හිතනවා' නෙවෙයිද කියලා බලන්න. හිතන හිතන එක ඇත්ත වෙනවා. අන්තිමට ගත්තහම පෙනීමෙන් විතරක් නෙවෙයි ඔය පංච උපාදානස්කන්ධය රැස්වෙන්නේ. පෙනෙනවා, ඇහෙනවා, කියන ඔක්කොම පංච උපාදානස්කන්ධය. වතුර වගේ අතරක් නැතුව ලෝකයක් බිහි නොවුණොත් තමයි පුදුමේ.

ආයතන හයෙන් ගන්න ගන්න අරමුණක් ගානේ, ගන්න ගන්න හැම අරමුණකම ඇති බවට අපේ මනසේ නිමිති හිටියහම, මෙහෙම ජීවත් වෙනවා පුදුමයි කියලා හිතෙයි නේද? මනසේ, එච්චරට අසීමිත මනසක් නිසා මෙහෙම කරන්න පුළුවන් කම තියෙන්නේ. එතකොට ඒ නිසයි අපට බය නැතුව හැසිරෙන්න පුළුවන්. මේ තරම් විෂය ක්ෂේත්‍රයක් එක්ක ලෝකයක් හැදිලා තියෙන්නේ ඔය නිසයි. එතකොට මේ විදියට ස්පර්ශ ආයතන හයෙන්ම දකින්න.

✶ නිරෝධය සහ මාර්ගය

දැන් අපි බලමු. දැන් ඔය ටික අපි කිව්වෙ දුකයි සමුදයයි දෙක ගැන නේ. දැන් නිරෝධයයි මාර්ගයයි දෙක ගැන. මෙන්න මේ ටිකේ තමයි බොහොම කාරණා ටිකක් තියෙන්නේ. නමුත් අර ටික නොවටිනවා නෙවෙයි. ඒ ටික තේරුම් ගත්තොත් තමයි අපිට වෙලා තියෙන සිද්ධිය සහ ඒකට හේතු ටිකත්, මොනවා හරි දෙයක් කරලා ගොඩ ගන්න බැහැ කියන එකත් හම්බ වෙන්නේ.

ඊට පස්සේ දැන් බුදුරජාණන් වහන්සේ දේශණා කරනවා ***චක්ඛුංචකො***

භික්ඛවේ ජානං පස්සං යථාභූතං - රූපෙ ජානං පස්සං යථාභූතං - චක්ඛු විඤ්ඤාණං ජානං පස්සං යථාභූතං, චක්ඛු සම්ඵස්සං ජානං පස්සං යථාභූතං - යම්පිදං චක්ඛු සම්ඵස්ස පච්චයා සුඛංවා දුක්ඛංවා අදුක්ඛම සුඛවො තම්පි ජානං පස්සං යථාභූතං - චක්ඛුස්මිං, නසාරජ්ජති, රූපෙසු න සාරජ්ජති, චක්ඛු විඤ්ඤාණෙ න සාරජ්ජති, චක්ඛු සම්ඵස්සෙ න සාරජ්ජති, චක්ඛු සම්ඵස්ස පච්චයා උප්පජ්ජති වේදයිතං සුඛංවා දුක්ඛං වා අදුක්ඛම සුඛංවා තම්පි නසාරජ්ජති, තස්ස, අසාරතස්ස අසංයුතස්ස, අසම්මූලස්ස, ආදීනවානුපස්සිනො විහරති. ආයතිං පඤ්චුපාදානක්ඛන්ධා අපචයං ගච්ජති. තණ්හාචස්ස පොනො භවිකා නන්දිරාග සහගතා තත්‍රතත්‍රාභිනන්දනී සා චස්ස පහීයතී. තස්ස කායිකාපි දරතාපි පහීයන්තී, චෙතසිකාපි දරතාපි පහීයන්තී, කායිකාපි සන්තාපා පහීයන්තී, චෙතසිකාපි සන්තාපා පහීයන්තී, කායිකාපි පරිලාහො පහීයන්තී, චෙතසිකාපි පරිලාහො පහීයන්තී. සො කාය සුඛම්පි චෙතසික සුඛම්පි පටිසංවේදී. - එයා සිතින්ද කයින්ද දෙකෙන්ම සැප විඳිනවා. එක දෙයයි බුදු රජාණන් වහන්සේ දේශනා කරන්නේ. ***චක්ඛුං භික්ඛවෙ ජානං පස්සං යථාභූතං*** ඇහේ ඇත්ත ඇති හැටිය දන්නවා නම් දකිනවා නම්, රූපයන්ගේ ඇත්ත ඇති හැටිය දන්නවා නම් දකිනවා නම්, චක්කු විඤ්ඤාණයේ ඇත්ත ඇති හැටිය දන්නවා නම් දකිනවා නම්. චක්ඛු සම්ඵස්සයේ ඇත්ත ඇති හැටියේ දන්නවා නම් දකිනවා නම්, චක්ඛු සම්ඵස්සයෙන් ඇතිවන වේදනා සුව හෝ දුක් හෝ නොදුක් සුව වේදනාවක් තියෙයි නම්, ඒ ධර්මයන්ගේ ඇත්ත ඇති හැටිය දන්නවා නම් දකිනවා නම් එයා ඇහේ ඇලුනෙ නැහැ.

- රූපයේ, චක්ඛු විඤ්ඤාණයේ, චක්ඛු සම්ඵස්සයෙන් උපන්න සැප හෝ දුක් හෝ උපේක්ෂා සහගත වේදනාවක් වෙයි නම් එහි ඇලුනෙ නැහැ.
- 'නොඇලුනේ' නිසා එයා ' නොබැඳුනේ ' වෙනවා ***අසංයුත්තස්ස*** වෙනවා.
- නොබැඳුනේ, එහි මුලා නොවුවෙක් වෙනවා. ***අසම්මූලස්ස*** වෙනවා.
  ඒ කියන්නේ එයාට නිත්‍යයි, සැපයි, ආත්මයි කියලා පෙනෙනවා වෙනුවට අනිත්‍යයි, දුකයි, අනාත්මයි කියලා පෙනෙන්නේ. එතකොට එයාට ආස්වාදය වෙනුවට ආදීනවයක්ම පෙනෙනවා.
- එහෙම වුණාහම පංච උපාදානස්කන්ධය අපචයට යනවා, රැස්

වෙන්නේ නැහැ. පංචඋපාදානස්කන්ධය පිරිහීමට යනවා, නැති වීමට යනවා, ගෙවීමට යනවා.

- **තණ්හා තස්ස** තණ්හාව ටික ටික ප්‍රහාණය වෙනවා. කයේ දරත බව, සිතේ දරත බව නැති වෙලා යනවා. කයේ තැවීම සිතේ තැවීම නැති වෙලා යනවා, කයේ දැවීම සිතේ දැවීම නැති වෙලා යනවා.
- සිටුදැම්යේම කායිකව, චෛතසිකව සැපයක්ම විඳිනවා, දැන් අර ඉස්සෙල්ලා කියපු ටික ඔක්කොම අනිත් පැත්තට හැරෙනවා.

මම ඉස්සෙල්ලා වැරදි පැත්ත විස්තර කරපු ටික තියෙනවනේ, ඒ ටිකම හොඳ පැත්තට බලා ගන්න. ඒ කිව්වේ මේ ධර්මතාවයන්ගේ ඇත්ත ඇති හැටියේ දකිනකොට ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණයේ වේවා එකකවත් සතුටු වෙන්නෙත් නැහැ, ඇලෙන්නෙත් නැහැ. ඒ කියන්නේ බැඳිලා නැහැ. මහණ වෙනවා නම්, ඔව් මහණ වෙමු, මාස තුනකට භාවනා කරමුද හය මාසෙකට භාවනා කරන්න එන්නම් කිව්ව හැකියි. ඇයි මෙහෙ දම්වැල් නැහැනේ, බැඳිලා නැහැ. ඕනෙ තරම් නිදහස තියෙනවා. බැඳිලා නැහැ. ඒ හින්දා සිහි මුලා වෙලා නැහැ. ඒ කියන්නේ එයාට අනිත්‍ය දේ අනිත්‍යයි, දුක් දේ දුකයි, අනාත්ම දේ අනාත්මයි, අසුභ දේ අසුභයි කියලා පෙනෙනවා. ඒ නිසා එයා ආස්වාදයෙන් නෙවෙයි බලන්නේ, ආදීනවයකින් එයා ලෝකය දකින්නේ. එහෙම දකින කොට තියෙන ආනිශංස පක්ෂය මොකක්ද? පංච උපාදානස්කන්ධය අපචයට යනවා, **දිට්ඨේ දිට්ඨ මත්තං**, දැකපු දේ දැකීමක් විතරයි එයාට. දකින්න පෙර තිබුණා නෙවෙයි, දැක්කයින් පස්සේ තියෙනවා නෙවෙයි, අවස්ථාවට හටගන නැති වෙනවා. දැකපු දේ නැති වෙනවා මිසක ආයෙත් 'ඇති හැටියට' සිහි කරන්න බැහැ. සිහි කරන්න පුළුවන්. සිහි කරනකොට දැකපු දේ සිහි කරන්නෙ කියලා සිහි කරන්නේ මගේම මනස නේද? කියලා අහුවෙනවා එයාට.

දැන් බලලා ඇවිල්ලා ඔය පින්වතුන් දැකපු දේ සිහි කරනකොට කුටිය සිහි කරනවා කියලා 'මම මගේ මනසම සිහි කරනවා නේ' කියලා අහුවෙනවා මිසක, සිය සැරයක් සිහි කෙරුවත්, ඔය පින්වතුන්ට කුටිය සිහි කරගන්න බැරිවෙනවා. දැන් නේ කාමරේ ඇතුළ සිහි කරගන්න පුළුවන් ඔය පින්වතුන්ට දැන් දැකලා එනවා, ඇවිල්ලා කාමරේ ඇතුළ සිහි කරනවා කියලා සිහි කරන කොට, දැන් ඔය පින්වතුන්ට කාමරේ ඇතුළම සිහි කෙරුවා කියලයි වෙන්නේ. අපචයට යනකොට 'දැකපු දේ ඉවරයි', තමන් හොඳට දන්නවා සිහි කරන්න පුළුවන්, කාමරේ සිහි කරනවා කියලා සිහි කළේ මම මගේම සිතුවිලි ටික සිහි කරගත්තා නේද, මනසම සිහි කරගත්තා නේද කියන එකම ප්‍රකටයි. එයාට මොනම විදියටවත් කාමරේ සිහිකරගන්න බැහැමයි. ඒකෙන් දන්නවා එයා දැකපු දේ නිරුද්ධමමයි කියලා. තේරුනාද?

ආයතනයන්ගේ යථාභූත ස්වභාවය පිරිසිඳ දකින විට අපචයට යන 'පංච උපාදානස්කන්ධය'

එතකොට ඒ විදිහට ගත්තහම පංච උපාදානස්කන්ධය අපචයට යනවා. හොයාගෙන, 'තියෙනවා, තියෙනවා' කියලා යන්න කාරණා නැහැ. ජීවිතයට එකතු වෙලා නැහැ බොහෝ දේ. එකින් එක දකින දකින දේවල් නැති වෙනවා කියලා කියන්නේ තණ්හාව තමයි පිරිහීමට යන්නේ. එයාට ගෙවල් දොරවල් ඉඩකඩම්, යාන, වාහන, දුවා, දරුවෝ රැස්වෙලා නැහැ. ඒ හින්දා ඒවට තියෙන අරමුණුත් නැහැ.

හැබැයි හොඳට මතක තියා ගන්න ඔය මට්ටම එන්නේ නිකම් නෙවෙයි, මේ **ජානං පස්සතං** - කියන කෙනාට එතකොට ඔතන තියෙනවා ලොකු වැඩ කොටසක් ඒ **ජානං පස්සං** - කියන්නේ නිකම් නෙවෙයි. එතැන හරි ගියොත් මෙහෙ විශාල වැඩ කොටසක් කරලා තියෙනවා. ඒකයි මම කියන්නේ මෙතැන නිකම් තැනකුත් නෙවෙයි, වැරද්දත් එහෙමයි. වැරැද්ද සුළු පටු නැහැ. ඒ නිසයි මෙච්චර ජීවිතයක් හදලා තියෙන්නේ. නිවැරැද්දත් සුළු පටු නැහැ ඒ නිසයි මේ වගේ ජරා මරණ සසරකින්මත් මුදවන්නේ.

ඒ නිසා ඔන්න තණ්හාව දුරු වෙනවා. තණ්හාව දුරු වුණාහම එයාට නැහැ මරාගෙන, කපාගෙන, කොටාගෙන හරි බේරගන්න දේවල් එයාට ඉතුරු වෙලා නැහැ. ඒ හින්දා කපන්න කොටන්න කියලා එන කෙනාටත් සුවපත් වේවා කියලා කියන්න තරම් මේ කය මෘදුයි, ඒ සිත මෘදුයිද, දරත කමක් නැහැ. එයාට තැවෙන්න, කයින්වත් සිතින්වත් තැවෙන්න දේවල් නැහැ මොකුත්. අසීමිත ශූන්‍යතාවයක මනස පවතින්නේ.

දැවෙන්න දේවලුත් නැහැ, පිච්චෙන්න දේවලුත් නැහැ. එයාට මව් මැරුණා, පියා මැරුණා, සහෝදරයා මැරුණා කියලා පණිවුඩ එන්න මොකුත් එහෙ තියලා නැහැ. එහෙම ආවත් ඒක සෝත සම්ඵස්සයෙන් උපන්න ශබ්ද මාත්‍රයක් වෙනවා මිසක එයාට, මැරුණ කෙනෙක්ගේ පණිවුඩයක් තමන්ට ඇහෙන්නේ නැහැ, තමන් මැරුණ කෙනෙක්ගේ පණිවිඩයක් අහගත්තොත් මිසක. ඒ කිව්වේ මොකක්ද? දන්නවද අද ඥාතියෙක් මැරුණ ශබ්දය 'අහගෙනයි' අපි දුක් විඳින්නේ 'ඇහිලා' නෙමෙයි. ඒ කියන්නේ මම මොනවා හරි වචනයක් කතා කළොත් අපිට කනට ලැබෙන්නේ සෝත විඤ්ඤාණයෙන් ශබ්ද මාත්‍රයක් විතරයි. ඒ ශබ්දය උදව් කරගෙන අපි අහවල් ඥාතියා මැරුණා කියලා නේද කියන්නේ? 'මැරුණා නේද' කියලා තමන්ම හිතනවා, හිතනකොට අපිට හිතෙන්නේ තමන් 'මැරුණ

පණිවිඩය කනින් අහගන්න ලැබුණා' වගේ කියලා. කනට ඇහෙන්නේ ශබ්ද මාත්‍රයක් විතරයි.

ඒකයි, මේ ආයතන ටික පිරිසිඳ දකින කොට ඔය පින්වතුන්ට මේ ඔක්කොම රහස් ටික හම්බ වෙනවා. අද අපිට දුක් විඳින්න වෙලා තියෙන්නේ ඔය රහස් ටික හින්දයි. අපිට කයෙන්, හිතෙන් දුක් විඳින්න තියෙන හේතු ටික සම්පූර්ණම නැති වෙනවා. එයාට කායික දරත, චෛතසික දරත, කයින් දුක් විඳින ඒවා, සිතින් දුක් විඳින ඒවා නැහැ. කයෙන්ද හිතින්ද සැප විඳින්නෙක් කියන ගණයට යනවා.

ඔය ඔක්කොම යහපත දැන් වෙලා තියෙනවා, අන්තිමට නිර්මාණය වෙලා ජරා මරණ දුක නැති වෙලා, තණ්හාව ඒ ඒ තැන ඇලෙන ඒ ඒ තැන සතුටුවෙන ප්‍රතිසන්ධිය පිණිසත් යන තණ්හාවක් තියෙනවා නම් ඒකත් ප්‍රහීන වෙලා, දුක සහ සමුදය කියන දෙකම නිරුද්ධ වෙලා, දෙකින්ම මිදිලා, සැප විඳින පුද්ගලයෙක් නිර්මාණය වෙලා තියෙනවා. ඕකට කියනවා නිරෝධයයි, මාර්ගයයි දෙක කියලා.

මේ ධර්මතා දෙපැත්තෙ කෙළවරවල් දෙක ගත්තම පොඩි කාරණා දෙකයි තියෙන්නේ, ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණ කියන මේ ධර්මතාවයන්ගේ යථාභූත ස්වභාවය ***අජානං අපස්සං යථාභූතං*** - ඇත්ත ඇති හැටියෙ නොදන්න කොට නොදකින කොට ලෝකයක් ගොඩ නැගිලා, ජරා මරණ ඇතිවෙලා, දුක් විඳින්නෙක් වෙනවා කියන ටික ඉබේම වෙලා. ඇහැ, රූප චක්ඛු විඤ්ඤාණය, චක්ඛු සම්ඵස්සය, චක්ඛු සම්ඵස්සයෙන් උපන් වේදනාව කියන ධර්මතා ටිකේ යථාභූත ස්වභාවය දන්නේ, දකින්නේ කියන තැන එනකොට ජරා මරණ පංච උපාදානස්කන්ධ දුකත් නිරුද්ධ වෙලා, තණ්හාවත් නිරුද්ධ වෙලා, හිතින්ද කයින්ද සැප විඳින්නෙක් වෙලා, හිතද කයද සැප සහගත ධර්මතාවයකින් යුක්ත වෙලා.

ඔන්න ලෝකයේ දුක සහ සැප කියන ධර්මතා දෙක හම්බ වෙන තැන් දෙකක් කිව්වා. මේ ධර්මයන්ගේ ඇත්ත ඇති හැටිය දැනීම සහ නොදැනීම කියන තැන.

එතකොට දැන් ඔය ඇහැ මුල් කාරණාව කරගෙන ඇත්ත ඇති හැටියේ දන්නවා නම් දකිනවා නම්, ඇහේ, රූපයේ චක්ඛු විඤ්ඤාණයේ ඇලෙන්නේ නැහැ, බැඳෙන්නේ නැහැ, සිහිමුලා වෙන්නේ නැහැ, ආදීනව අනුව දකිමින් වාසය කරනවා, පංච උපාදානස්කන්ධය අපචයට යනවා. තණ්හාව ප්‍රහීන වෙනවා කියන ධර්මතා ටිකක් වෙනවා. ඒ ඇහැ මුල් කාරණාව කරගෙන.

යථාභූත දැක්මෙන් වැඩෙන ලෝකෝත්තර දර්ශනය (ආර්ය අෂ්ටාංගික මාර්ගය)

දැන් අපි බලමු බුදුරජාණන් වහන්සේ තව ටිකක් පෙන්වනවා. මේ ඇහැ රූප චක්ඛු විඤ්ඤාණ, චක්ඛු සම්ඵස්සය, චක්ඛු සම්ඵස්සයෙන් උපන් වේදනාවක් සැප හෝ දුක් හෝ උපේක්ෂාවක් කියලා තිබුණානම්, එහි ***ජානං පස්සං යථාභූතං*** - යථාභූත ස්වභාවය දන්නවා නම්, දකිනවා නම්නෙ එහෙම වෙන්නේ, නේද? බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා. ***යා යථාභූතස්ස දිට්ඨි*** - ඒ යථාභූත දැක්මක් තියෙනවා නම් ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණයන්ගේ යථාභූත දැක්මක් තියෙයි නම්, ***සාස්සහොති සම්මා දිට්ඨි*** - ඒක එයාගෙ සම්මා දිට්ඨියයි. මේ ලෝකෝත්තර දර්ශනයක් මම පෙන්වන්නේ. ***යො යථා භූතස්ස සංකප්පෝ, ස්වාස්සහෝති සම්මා සංකප්පො*** - ඒ යථාභූත ස්වභාවය දකින්න යම් කල්පනාවක් එයාගෙ තියෙයි නම් ඒ සම්මා සංකප්පයයි. ***යෝ යථාභූතස්ස වායාමො ස්වාස්සහෝති සම්මා වායාමො.*** ඒ යථාභූත ස්වභාවය දකින්න යම් උත්සාහයක් තියෙයි නම් ඒ එයාගෙ සම්මා වායාමයයි. ***යා යථාභූතස්ස සති ස්වාස්සහෝති සම්මා සති***-ඒ යථාභූත ස්වභාවය දකින යම් සිහියක් තියෙයි නම් ඒ එයාගෙ සම්මා සතියයි - ***යො යථාභූතස්ස සමාධි ස්වාස්සහෝති සම්මා සමාධි*** - යම් මේ යථාභූත ස්වභාවය දකින්න යම් චිත්ත එකග්ගතාවයක් තියෙයි නම් ඒ එයාගෙ සම්මා සමාධියයි. ***පුබ්බේව කො පනස්ස කාය කම්මං වචී කම්මං, ආජීව පරිසුද්ධෝ හොති*** කලින්ම කාය කර්ම, වචී කර්ම, ආජීවය පිරිසිදුයි. ඒ කියන්නේ සීලයක පිහිටලා නේ දැන් මේ ටික කරන්නේ. ***ඒව මස්සායං අරියො අට්ඨංගිකො මග්ගො භාවනා පරිපූරිං ගච්ඡති*** - මෙන්න මෙහෙම එයාට ආර්ය අෂ්ටාංගික මාර්ගය භාවනා වශයෙන් පිරීමට යනවා.

එතකොට හොඳට දකින්න, ආර්ය අෂ්ටාංගික මාර්ග වල් ගොඩක් නැහැ. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා දිට්ඨි කියලා කියන්නේ, යථාභූත ඥාණ දර්ශනය කියලා කියන්නේ, මේ ලෝකයේ ඇත්ත ඇති හැටියේ පවතින ධර්මය, ඇත්ත ඇති හැටියෙන් දැකීම මිසක, ඒ දැකීමටම මේ ආයතන ටිකෙන් මිදෙන මනසක් හැදෙනවා මිසක, වෙන අමුතු දෙයක් වෙලා නැහැ. ඒ නිසා, මේ ආයතනයන්ගේ ඇත්ත ඇති හැටිය නොදැන, නොදැක ගොඩයන්න ක්‍රමයක් නැහැ.

ඊට පස්සේ ඒ ඇත්ත ඇති හැටියෙ දැනගන්නවා, දැකගන්නවා කියන එක කාගෙන් හරි සත්පුරුෂ ඇසුරෙන්, බුදුරජාණන් වහන්සේගෙන් හෝ තථාගතයන් වහන්සේගේ ධර්මය අහලා දේශනා කරන ශ්‍රාවකයාණන් වහන්සේ නමකගෙන් හෝ අහගන්නේ නැතුව, සීලයක පිහිටලා, සමථ කමටහනක් වඩලා, අනිත්‍ය, දුක්ඛ, අනාත්ම විදියට හෝ භාවනා කරලා ඔය පින්වතුන් තනියම අවබෝධ කරගත්තොත්, ඔය පින්වතුන්ට කියන්න වෙනවා 'පච්චේක බුද්ධ' කියලා නැත්නම් 'සම්මා සම්බුද්ධ' කියලා. මොකද, හිත වැඩුවා කියලා මේක එහෙම අවබෝධ වෙන්නේ නැහැ. මේ පණිවුඩය අහගන්නම ඕනේ. ඒ අහගත්තහමයි අහගැනීමටම, ශ්‍රැතමය ඥාණයටම, බාගයක් කෙළෙස් දුරුවෙනවා. ඔය පින්වතුන්ට කරගෙන යන්න පුළුවන් මට්ටමේ කෙළේසයක් විතරක් ඇති වෙනවා මේ ටික හරියට තේරෙනකොට. ඔය පින්වතුන්ට මේ ටික හරියට නොතේරෙන කොට ගෙඩිපිටින්ම කෙළස් පොදියකයි ඉන්නේ. ඒ හින්දයි ඔය පින්වතුන්ට කරන්නත් බැරි.

ඔය පින්වතුන්ට යමක් කරගෙන යන්න, භාවනා කරගෙන යන්න මනස ඔරොත්තු දෙන මට්ටමකටවත් එන්න ඕනේ. ඒක එනවා එක දවසකින් දෙකකින් නෙවෙයි, මේ ධර්මය හරියට ක්‍රමානුකූලව අහගෙන ටික ටික ටික කාලයක් මේ ඔක්කොම පරාසය පිරිසිදු වුණොත්.

මම කියනවට නෙවෙයි, ඔය පින්වතුන්ට පෙනෙන්නේ නැහැ. නමුත් ඔය පින්වතුන්ට තේරෙන මට්ටමක් ආවොත් මේ හැම එකකම, ඔය තේරෙන මට්ටම කියන එකත් ලෙහෙසි මට්ටමක් නෙවෙයි, බොහෝම තියුණු නුවණක් ඒකත්. ඒ වෙනකොට පෞද්ගලිකව තනියම නැගිටින්න පුළුවන් හයිය ඔය පින්වතුන්ට තියෙනවා. ඒ කියන්නේ ඒක දකින මට්ටමට ප්‍රතිපදාව වඩාගන්න පුළුවන් මට්ටමේ මානසික මට්ටමක් සෘජුවම ඔය පින්වතුන්ට ඇති වෙනවා. ඒ වගේ මට්ටමක් හදාගෙන භාවනා කරන කෙනාටයි මේක දකින්න පුළුවන්. තව තියෙනවා ඒ සූත්‍රයේ,

බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා. ***ඒව මස්සායං අරියො අටඨංගිකො මග්ගො භාවනා පරිපූරිං ගච්ඡති*** මෙහෙම ඔහුට ආර්ය අෂ්ටාංගික මාර්ගය භාවනා වශයෙන් පිරීමට යනවා. ***තස්ස ඒවං ඉමං අරියං අට්ඨංගිකං මග්ගං භාවයතා*** ඔහු මේ විදිහට ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන කොට ***චත්තාරොප සතිපට්ඨානා භාවනා පරිපූරිං ගච්ඡති*** සතර සතිපට්ඨානයත් එයාට පිරීමට යනවා. ***චත්තාරොච සම්මපධානා භාවනා පරිපූරිං ගච්ඡති, චත්තාරොපි ඉද්ධිපාදා***

පරිපූරිං ගච්ඡති, පංචපි ඉන්ද්‍රියානි භාවනා පරිපූරිං ගච්ඡති, පංචපි බලානි භාවනා පරිපූරිං ගච්ඡති, සත්ත බොජ්ජංගා භාවනා පරිපූරිං ගච්ඡති සතර සතිපට්ඨානය, සතර සම්‍යක්ප්‍රධාන, සතර ඍද්ධිපාද, පංච ඉන්ද්‍රිය, පංච බල, සප්ත බොජ්ඣංග කියන සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන්ගේ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන කොට මේ ධර්මතා ටික පිරීමට යනවා. එතකොට ***තස්ස ඉමේ ද්වේ ධම්මා යුග නන්ධා වත්තති*** එයා ගාව මේ ධර්මතා දෙකක් හැම වෙලාවෙම මාරුවෙන් මාරුවට පවතිනවා මොකක්ද ***සමතෝච විපස්සනා - සමථ, විපස්සනා*** කියන ධර්මතා දෙක. මේවා ඔක්කොම වෙන්නෙත්, මේ මාර්ගය වැඩෙනවා. අර දැන් දුක්ඛ නිරෝධය සාක්ෂාත් වුණු හැටි. ඒ කියන්නේ ***කායිකාභි සුඛම්පි, චෙතසිකාපි සුඛම්පි පටිසංවේදෙති*** කිව්වේ දුක නැති කරලා සැප විඳිනවා කියපු තැන. ඒක වෙනවා අර ඇත්ත දකින කොට.

දැන් ඇත්ත දකිනකොට මෙතැන ගොඩනැගිලා තියෙන සිද්ධාන්ත ටික මේ කියන්නේ. කෙනෙක් ඇත්ත දකිනවා කියලා මෙහෙන් ඇත්ත දකින්න හදන කොට, එයාගෙ ආධ්‍යාත්මික පැත්තෙන් මෙන්න මෙහෙම සිද්ධි ටිකක් වෙලා කියලා මේ කියන්නේ.

- ඒ ඇත්ත දකිනවා කියන එකයි එයාගෙ සම්මා දිට්ඨිය.
- ඒ ඇත්ත බලන්න කල්පනා කරනවා කියන එකයි සම්මා සංකප්පය
- ඇත්ත බලන්න උත්සාහවත් වෙනවා කියන එකයි සම්මා වායාමය
- ඇත්ත බලන්න සිහිකරනවා කියන එකයි සම්මා සතිය
- ඇත්ත බලන්න සිතේ එකඟකම පවත්වන එකයි මේ වෙලාවෙදි මෙයා ළඟ තියෙන සම්මා සමාධිය
- මෙයා පිහිටලා තියෙන්නේ වාචා, කම්මන්ත, ආජීව කියන ධර්මතා ටිකේ

ඊට පස්සේ එයා ඔය විදිහට ඇත්ත ඇති හැටියට බලන්න හදනවා නම්, ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි එයාට වැඩෙන්නේ.

- එහෙම ඇත්ත ඇති හැටිය බලනකොට ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩෙනවා කියන්නේ නැවත නැවත මෙහෙම බලන කොට සතර සතිපට්ඨානය, සම්‍යක්ප්‍රධාන...

මේවා දැන් එකක්වත් ගන්න ඕනෙ නැහැ 'මම කොහොමද සතර සතිපට්ඨානය වඩන්නේ, සම්‍යක්ප්‍රධානය වඩන්නේ, පංච බල වඩන්නේ, සප්ත බොජ්ඣංග වඩන්නේ, මේවා එකක්වත් ඕනෙ නැහැ.

මේවා වෙනවා.

- ඒ එක්කම, මෙයා මෙහෙම කරන කොට මෙයාගෙ සන්තකයේ තියෙනවා මොකක්ද ධර්මතා දෙකක්, සමථ විදර්ශනා යුගනන්ද්ධ පවතිනවා. ඒ කියන්නේ නුවණින් මෙනෙහි කිරීමක් තියෙයි නම් ඒ එයාගෙ විදර්ශනාව. යම් චිත්ත සමථයක් තියෙයි නම්, වායාම සති සමාධියක් තියෙයි නම්, ඒ එයාගෙ සමථයයි.
- සම්මා දිට්ඨි, සම්මා සංකප්පයක් තියෙයි නම් ඒ එයාගෙ විදර්ශනාව.
- වායාම, සති, සමාධියක් තියෙයි නම් ඒ සමාධිය.
- සීලයේ පිහිටලා තියෙනවා, වාචා, කම්මන්ත, ආජීවය පිරිසිදුයි

එතකොට සීල, සමාධි, ප්‍රඥා කියලත් කියනවා. නැත්නම් සීලයක පිහිටලා සමථ විදර්ශනා වඩනවා කියලත් කියනවා.

මේ ලෝකෝත්තර මට්ටම. මේකෙන් තේරුම් ගන්න ඕනෙ තව පැත්තක් තියෙයි. සතර සතිපට්ඨාන, සතර සම්‍යක්ප්‍රධාන, පංච ඉන්ද්‍රිය, පංච බල, සප්ත බොජ්ඣංග කියන මේ ධර්මතා ටික ලෞකිකවත් තියෙනවා. මේ දැන් ඔක්කොම මතක් කරන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගය මුල් වෙලා වැඩෙන මේ ධර්මතා ටික, ලෝකෝත්තර ධර්මතා.

සතර සතිපට්ඨානය, ලෞකික සතර සතිපට්ඨානය සහ ලෝකෝත්තර සතර සතිපට්ඨානය කියලා දෙකට බෙදෙනවා. ඒකයි මේ ගොඩාක් පැටලෙන්නේ.

දැන් කායානුපස්සනාව කියලා අපි කතා කළා කොටසක්. ඒක පූර්වභාග ප්‍රතිපදාව. ඒත් සතර සතිපට්ඨානය. දැන් මෙතැනදි සතර සතිපට්ඨානය කියලා මොකක්ද පෙන්නුවේ? ඒ සම්මා දිට්ඨිය දකින්න යම් සිහියක් යොදයි නම් ඒ සම්මා සතිය. මේකෙ වෙනස්කම් ටිකක් මම කියලා දෙන්නම්. මේ ටික මේ ලෝකෝත්තරම දර්ශනය. එතකොට මේ විදිහට කරන කොට සමථ විදර්ශනා යුගනන්ද්ධ වැඩෙනවා. එහෙම වෙනකොට **යේ ධම්මා අභිඤ්ඤා පරිඤ්ඤෙය්‍යා තේ ධම්මේ අභිඤ්ඤා පරිජානාති** යම් ධර්මයක් අවබෝධයෙන් පිරිසිඳ දත යුතු නම්, ඒ ධර්මය එයා අවබෝධයෙන්ම පිරිසිඳ දකිනවා. මෙහෙම කරන කොට යම් ධර්මයක් අවබෝධයෙන් පිරිසිඳ දත යුතු නම්, ඒ ධර්මය එයා අවබෝධයෙන්ම පිරිසිඳ දකිනවා.

යෙ ධම්මා අභිඤ්ඤා පහාතබ්බා, තෙ ධම්මා අභිඤ්ඤා පහාතබ්බා - යම් ධර්මයක් අවබෝධයෙන් දුරුකටයුතු නම්, එයා ඒ ධර්මය අවබෝධයෙන්ම දුරු කරනවා.

යෙ ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා තෙ ධම්මෙ අභිඤ්ඤා භාවෙති - යම් ධර්මයක් අවබෝධයෙන් වැඩිය යුතු නම්, එයා ඒ ධර්මය අවබෝධයෙන්ම වඩනවා.

යෙ ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බා තෙ ධම්මේ අභිඤ්ඤා සච්ඡිකරොති - යම් ධර්මයක් අවබෝධයෙන් සාක්ෂාත් කටයුතු නම්, එයා ඒ ධර්මය අවබෝධයෙන්ම සාක්ෂාත් කරනවා.

කොයි කෙනා ගැනද කියන්නෙ මේ? **ජානං පස්සං යථාභූතං චක්ඛුං භික්ඛවෙ ජානං පස්සං යථාභූතං** කියන කෙනා. එයා ඒ ටික කරන කොට වෙන සිද්ධි මේ ඔක්කොම කියන්නේ. එතකොට බුදුරජාණන් වහන්සේ තව දුරටත් අහනවා, **කථං මේ භික්ඛවෙ ධම්මා අභිඤ්ඤා පරිඤ්ඤෙය්‍යා** කුමන ධර්මයක්ද අවබෝධයෙන්ම පිරිසිඳ දැක්ක යුතුයි කියලා කිව්වේ? මෙයා අවබෝධයෙන්ම, පිරිසිඳ දකින, අවබෝධයෙන්ම පිරිසිඳ දැක්ක යුතුයි කියලා කියපු ඒ ධර්මය මොකක්ද? **පඤ්චුපාදානක්ඛන්ධා තිස්ස වචනීයං** - පංච උපාදානස්කන්ධයට නමක්. **සෙය්‍යථීදං රූප උපාදානක්ඛන්ධො, වේදනා උපාදානක්ඛන්ධො, සංඥා උපාදානක්ඛන්ධො, සංඛාර උපාදානක්ඛන්ධො, විඤ්ඤාණ උපාදානක්ඛන්ධො ඉමේ ධම්මා අභිඤ්ඤා පරිඤ්ඤා** - මෙන්න මේ ධර්මය අවබෝධයෙන් පිරිසිඳ දත යුතුයි.

මෙහෙම කරන කෙනා ඒ පංච උපාදානස්කන්ධය අවබෝධයෙන්ම පිරිසිඳ දකිනවා. දැන් අමුතුවෙන් වෙන මුකුත් ඕනෙ නැහැ. මොකද මෙතැන තියෙනවා ඒ ටික. **කථමොච භික්ඛවෙ ධම්මා අභිඤ්ඤා පහාතබ්බා** - කුමන ධර්මයක්ද අවබෝධයෙන්ම ප්‍රහානය කළ යුත්තේ? **අවිජ්ජාච භව තණ්හා ඉමෙ ධම්මා අභිඤ්ඤා පහාතබ්බා** - කුමන ධර්මයක්ද අවබෝධයෙන් ප්‍රහානය කළ යුත්තේ - අවිජ්ජා, භව, තණ්හා කියන මූල ක්ලේශ දෙක. ඒ අවිජ්ජා, භව, තණ්හා කියන මූල ක්ලේශ දෙක අවබෝධයෙන්ම එයා ප්‍රහානය කරනවා.

කථමෙච භික්ඛවෙ ධම්මා අභිඤ්ඤාච භාවෙ තබ්බා - කුමන ධර්මයක්ද අවබෝධයෙන්ම වැඩිය යුතු? **සමථොච විපස්සනා, ඉමෙ ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා** - සමථයයි විදර්ශනාවයි. මෙයා අවබෝධයෙන්ම ඒ ධර්මතා වඩනවා.

කථමෙච භික්ඛවෙ ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බා - ***විජ්ජාච විමුත්ති*** - ***ඉමෙ ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බා*** - කුමන ධර්මයක්ද අවබෝධයෙන් සාක්ෂාත් කට යුත්තේ විද්‍යා සහ විමුක්ති.

ත්‍රි විද්‍යා, අෂ්ට විද්‍යා, පංච අභිඤ්ඤා කියලා විද්‍යාවන් තියෙනවනෙ. ඒ විද්‍යාවන්, අනිමිත්ත, ශූන්‍යත, අප්පණිහිත, ආකාසඤ්ඤයතන, විඤ්ඤාවයතන, ආකිංචඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන කියන චේතො විමුක්ති තියෙයි. මෙන්න මේ චේතො විමුක්ති. මේ විද්‍යා, මේ විමුක්ති කියන මේ දෙක සාක්ෂාත් කට යුතුයි නම්, එයා අවබෝධයෙන්ම ඒවා සාක්ෂාත් කර ගන්නවා.

කවුද එහෙම කරන්නේ? ***චක්ඛුං භික්ඛවෙ ජානං පස්සං යථාභූතං*** ඇහැ පිළිබඳව ඇත්ත ඇති හැටියෙ දකින කෙනා. එයා ඇත්ත ඇති හැටියෙ දකින කොට

- ඒ මොහොතෙදි ආර්ය අෂ්ටාංගික මාර්ගය මෙතැන තියෙනවා.
- ආර්ය අෂ්ටාංගික මාර්ගය භාවනා වශයෙන් පිරීමට යනවා.
- එහෙම පිරෙන කොට සත්තිස් බෝධිපාක්ෂික ධර්ම පිරෙනවා.
- එහෙම සත්තිස් බෝධිපාක්ෂිත ධර්ම පිරෙනවා කියන්නේ සමථ විදර්ශනා ධර්මතා දෙකක් එතැන පවතිනවා.
- ඒ විදිහට කරන කොට එයා දුක පිරිසිඳ දකිනවා, සමුදය දුරු කරනවා, නිරෝධය සාක්ෂාත් කරනවා, මග වැඩුවා,

  කියන කාරණා ටිකක් කරනවා කියලා පෙන්වනවා මේ ටිකේදි.

ඊට පස්සේ, ඔය විදිහටම - දැන් අපි ඇහැ මුල් කාරණාව කරගෙන නේ පෙන්නුවේ. ඒ කියන්නේ පෙනෙන රූපයේ ඇත්ත ඇති හැටියෙ දකින කොට ලෝකෝත්තර සම්මා දිට්ඨිය උපදින හැටි මේ පෙන්නුවේ.

✶ ✶ ✶

සෝතං භික්ඛවේ ජානං පස්සං කියලා ඔය විස්තර, එතකොට ***සද්දා භික්ඛවෙ ජානං පස්සං යථාභූතං, සෝත විඤ්ඤාණං භික්ඛවෙ ජානං පස්සං යථාභූතං, සෝත

සම්ඵස්සො ජානං පස්සං යථාභූතං, සොත සම්ඵස්ස පච්චයා උප්පජ්ජති වේදයිතං සුඛංවා දුක්ඛංවා අදුක්ඛම සුඛංවා තම්පි ජානං පස්සං යථාභූතං*** කියලා, කන ගැන, ශබ්දය ගැන, සෝත විඤ්ඤාණය ගැන, සෝත සම්ඵස්ස ගැන, සෝත සම්ඵස්සයෙන් උපන් සැප හෝ දුක් හෝ නොදුක්නොසුව වේදනා වේ නම් ඒ ගැන, ඇත්ත ඇති හැටියේ දන්නේ දක්නේ කනේ, ශබ්දයේ සතුටු වෙන්නේ නැහැ. ඒ හින්දා බැඳෙන්නේ නැහැ. බැඳෙන්නේ නැති හින්දා රැවටෙන්නේ නැහැ. රැවටෙන්නේ නැති හින්දා ආදීනව දන්නවා ඒ හින්දා අහපු දේ රැස් වෙන්නේ නැහැ. ඒ හින්දා තණ්හාව ප්‍රහීණ වෙනවා. ඒ හින්දා දරදඬු වෙන්න, දරත වෙන්න හිතක් කයකුත් නැහැ, තැවෙන්න හිතක් කයකුත් නැහැ. දැවෙන්න හිතක් කයකුත් නැහැ. කයෙන්ද සිතෙන්ද සැප විඳිනවා. දැන් සැප සහගතවත් ජීවත් වෙනවා. දුකට යන්න තියෙන හේතු ටිකත් නැහැ. ඒ විතරක් නෙවෙයි, 'මේ ටික නිර්මාණය වෙන්න කළේ මොකක්ද? ඇත්ත දකිනවා' කියලා මෙන්න මේ වගේ ධර්මතා ටිකක් තමන් තුළ ගොඩ නැගෙනවා.

✶ චතුරාර්ය සත්‍යය අවබෝධය

ඇත්ත දකිනවා කියන කොට සම්මා දිට්ඨිය. ඔක්කොම ටික දකින්න ආර්ය අෂ්ටාංගික මාර්ගය. ආර්ය අෂ්ටාංගික මාර්ගය තියෙනවා කියන්නේ, භාවනා වශයෙන් පිරීමට යනකොට මේ දර්ශනය නැවත නැවත වඩනකොට, සත්තිස් බෝධිපාක්ෂික ධර්ම පිරෙනවා. සත්තිස් බෝධිපාක්ෂික ධර්ම පිරෙනවා කියන්නේ සමථ විදර්ශනා කියන ධර්මතා දෙක වැඩෙනවා. ඒ ධර්මතා දෙක වැඩෙනවා කියන කොට මොකද වෙන්නේ, **චතුරාර්ය සත්‍යය** අවබෝධ වෙනවා. ***දුක පරිඤ්ඤෙය්‍යයි, සමුදය පහාතබ්බා යි, නිරෝධය සච්චිකාතබ්බා යි, මාර්ගය භාවේතබ්බා යි*** කියන ටික අනුපිළිවෙලින් වෙලා.

ඊට පස්සේ පෙන්නනවා, මොනවද පිරිසිඳ දත යුත්තේ, පංච උපාදානස්කන්ධය. ඒක පිරිසිඳ දැකලා, ප්‍රහානය කළ යුත්තේ මොකක්ද, අවිද්‍යා, භව, තණ්හා ඒ දෙක ප්‍රහාණය කරලා, සාක්ෂාත් කළ යුත්තේ මොකක්ද, විද්‍යා, විමුක්ති දෙක එයා සාක්ෂාත් කරලා, වැඩිය යුත්තේ මොකක්ද, සමථ විදර්ශනා දෙක වඩලා.

මේ ටික ඉවර වෙනකොට එයාට කියන්න පුළුවන් ***ඛිනා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්ථාය පජානාති*** කියලා. ඒ කියන්නේ, මම

කළ යුත්ත කළා. යමක් කිරීම සඳහා මේ ශාසනයේ බ්‍රහ්මචරියාවෙ හැසිරුනා නම්, සිල් රැක්කා නම් යමක් සඳහා, යමක් සඳහා සමාධි වැඩුවා නම්, යමක් සඳහා විදර්ශනා භාවනා කළා නම්, මම දැන් ඒ කරපු ටික කරලා අවසානයි. මත්තෙ මට ආයෙ කරන්න දෙයක් නැහැ. ආයෙ මම ඉපදෙන්නෙත් නැහැ. ඉපදීම නැති කිරීම පිණිස යමක් කට යුතු නම් ඒකත් කරලා ඉවරයි. **වුසිතං බ්‍රහ්මචරියං** - ඒ කියන්නේ ප්‍රතිපදාවත් මගෙ අවසන්, මගෙ ඉපදීමත් නැති වුණා. මතු මට කළ යුත්තක් නැහැ කියන ඥාණ දර්ශනය ඇතුව, ලෝකයාගේ යහපත වෙනුවෙන් ජීවත් වෙනවා. විවේකයෙන් ජීවත් වෙනවා. එතෙන්ට කියනවා අපි රහතන් වහන්සේ කියලා.

එතකොට, මම මේ ටික ගත්තේ, පෞද්ගලික අදහස් වලින් තොරව ඔය පින්වතුන්ට උත්තරයක් හම්බ වෙනවා මේවයින්. ඒ කියන්නේ ඇත්තටම නිවන් දකිනවා කියන්නේ මොනවා හරි දෙයක් කිරීම නෙවෙයි, සත්‍යය අවබෝධයක් අපට තියෙන්නේ.

සත්‍යය කියලා කියන්නේ යථාභූත - යථා කියලා කියන්නේ 'යම් සේ වුද, යම් සේ පවතීද', භූත කියලා කියන්නේ 'වූ'. අභූතයෙන් චෝදනා කරන්න එපා කියන්නේ, අභූත කියන්නේ 'නොවූ', නොවූ දේකින්' - නොවූ දේකින් මට බනින්න එපා කියලා. භූත කියන්නෙ 'වූ' කියන එක. යථාභූත කියන්නේ 'යම් සේ වූද' ඇහැ යම් සේ වූද, නැත්නම් යම් සේ පවතීද, ඒ විදිහටම දකින්න. ***ජානං, පස්සං යථාභූතං*** - දැන ගන්න, දැක ගන්න, ඇහැ දැන ගන්න, දැක ගන්න, යම් සේ පවතීද, එසේම.

අද මට ඇහැ පෙනෙන හැටියට නෙමෙයි, තව කාටවත් පෙනෙන හැටියට නෙමෙයි, මනුස්සයන්ට ඇහැ ගැන පෙනෙන හැටියට නෙමෙයි, දෙවියන්ට ඇහැ ගැන පෙනෙන හැටියට නෙමෙයි, බ්‍රහ්මයන්ට ඇහැ ගැන පෙනෙන හැටියට නෙමෙයි, ඇහේ පවතින හැටි.

රූප තියෙනවා, දැන් මනුස්සයන්ට පෙනෙන රූප වෙනස් දෙවියන්ට පෙනෙන රූප වෙනස් බ්‍රහ්මයන්ට පෙනෙන රූප වෙනස් එක එක්කෙනාගෙ මට්ටම් වලට, එක එක්කෙනාට පෙනෙන රූප ගැන නෙවෙයි, රූපයේ තියෙනවනෙ ඇත්තක්, යථාභූත ස්වභාවයක් ඒ 'වූ ස්වභාවය' - එතකොට දෙවියන්ට අයිතිත් නැහැ. මනුස්සයන්ට අයිති එකක්වත්, බ්‍රහ්මයන්ට අයිති රූපයක්වත් බලනවා නෙමෙයි, රූපයේ ඇත්තක් කියලා එකක් තියෙයි. ඒ 'රූපයේ' ඇත්ත, ඒකයි සත්‍යය අවබෝධයක් කියන්නේ. ඒ රූපයේ ඇත්ත ඇති හැටියෙ දකින්න කියන සිද්ධි ටිකක් තියෙනවා.

දැන් මේක නොදන්නාකම නිසා ඇති වුණු ප්‍රතිඵල ටික සහ ජීවිතය ගැන කියන්න ඕනෙ නැහැ, සාක්ෂි 'අපි' ඒකට අපට තියෙන්නේ 'මේ අපි' කියලා අත ඔසවන්න විතරයි.

එතකොට, දන්නා, දකිනාකම කියන තැන ගත්තහම අපි දැනගෙන තියෙනවා, අපි මෙහෙම කළහම මේ අද අපේ ජීවිතයට හාත්පසින්ම අනිත් පැත්තක් වෙනවා. මනුස්සයෙක් වෙනුවට, දෙවියෙක් වෙනුවට, බ්‍රහ්මයෙක් වෙනුවට, මනුස්සයෙකුත් නෙමෙයි එයා, දෙවියෙකුත් නෙවෙයි එයා, බ්‍රහ්මයෙකුත් නෙවෙයි, තිරිසන්ගත සතෙකුත් නෙවෙයි, යකෙකුත් නෙවෙයි, පෙරේතයෙක් - භූතයෙකුත් නෙවෙයි, තිස් එක් තලයේ කිසිම කෙනෙක් නෙවෙයි. මොකද ඒ ඒ කෙනාගෙ මට්ටමේ දැක්මක් හෝ කෙළේසයක් මෙයා ළඟ නැහැ.

යම් මට්ටමේ කෙළේසයක් නිසා, යම් මට්ටමේ ස්කන්ධයක් රූපයක් නිසා නම් මනුස්සයෙක් කිව්වේ, ඒ ටික මෙයාට නැත්නම්?අපි මනුස්සකම දුරු නොවුණු ඇහින් අපි එයාට මනුස්සයෙක් කිව්වට, එයා මනුස්සකමෙන් මිදිලා. යම්කිසි කෙළේසයකට, යම්කිසි ස්කන්ධයක් නිසා කෙනෙකුට දෙවියෙක් කියයි නම්, ඒ ස්කන්ධ ටික, ඒ කෙළෙස් ටික එයා ළඟ නැත්නම්? ඒ විදිහට ගත්තහම එයා කාටවත් නෙවෙයි, කවුරුත් නෙවෙයි.

අපි දැනට හඳුන්වමු රහතන් වහන්සේ කියලා, ඒකද 'කෙනෙක්' හැටියට අපියි හිතන්නේ. එයාට කියන්න තියෙන දේ තමයි 'ධම්ම'. ඒ ජීවිතයේ ඇත්ත තමයි 'ධම්ම' කියන එක. ධර්මතාවය යම්සේද ජීවිතය එසේයි. ධම්ම වෙනවා කියලා කියන්නේ.

එතකොට මෙන්න මේ තැනට ආවහම මත්තේ කට යුත්තක් නැහැ, අජරාමරයි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ඉපදීම නැත්නම්, ජරාව කොහෙන් පනවන්නද? ජරාව නැත්නම් මරණය කොහෙන් පනවන්නද? මරණය නැත්නම් කෝප්‍යවීම - වෙනස් වීම කොහෙන් පනවන්නද? අකෝප්‍යය මුණිතෙම ශාන්තව හැසිරෙනවා' කියලා. මොකද ඒ ටික මම කිව්වේ, දැන් ගොඩක් දෙනෙක් හිතන්නේ 'ඉපදෙන්නේ නැහැ, මහළු වෙන්නේ නැහැ, මැරෙණ්නේ නැහැ, මේව ඔක්කොම මරණෙන් පස්සේ' කියලා නේ. යම්කිසි කෙනෙක් උපදින්නේ නැත්නම් යම් තැනක උපදින්නේ නැත්නම්, කොහෙන් එයා මහළු වෙන්නද කියලා අහනවා. ඉපදුනේ නැත්නම් මහළු බව පෙනෙයිද? මහළු වෙන්නේ නැත්නම් කොහෙන් මැරෙණ්නද කියලා අහනවා. මැරෙණ්නේ නැත්නම් කොහෙන් එයා වෙනස් වෙයිද කියලා අහනවා. ඒ කියන්නේ, විටෙක මහළු කෙනෙක් කියපු කෙනා, ආයෙ විටෙක පොඩි ළමයෙක් කියලා නේ. ආයෙත් පොඩි ළමයෙක් කියපු කෙනා තරුණයෙක් වෙලා, තරුණයෙක් කියපු කෙනා මහළු වෙලා.

මේ 'කෝප්‍ය වෙනවා' කියන්නේ නිතරම වෙනස් වෙනවා. අරමුණක් අරමුණක්

ගානෙත් එහෙමයි, ජීවිතෙත් එහෙමයි. මරණයක් නැත්නම් කෝප්‍ය බවක් නැහැ කියනවා. කෝප්‍ය කියන්නේ වෙනස් වීමක් නැහැ. වෙනස් වීමක් නැත්නම් එයාට 'මුනි' කියලා කියනවා. අන්න එයා ශාන්තව ලෝකයේ හැසිරෙනවා කියනවා. අජරාමර වුණු කෙනා ශාන්තව ලෝකයේ හැසිරෙනවා කියනවා. මොකද අපි මරණයෙන් පස්සෙ දෙයක් ගැන හිතන නිසයි මම ඔය ටික කිව්වේ. ඉතින්, මේකෙදි දැන් අපට උත්තරේ හම්බ වුණානේ 'ඇත්ත ඇති හැටියෙ දැක්කහම' මෙහෙම වෙනවා කියලා නේද? එතකොට, ඇත්ත ඇති හැටියෙ දැක්කහම ලෝකයේ කාටවත් කිසිම දේකින් පනවන්න බැරි 'රහතන් වහන්සේ නමක්' කියලා අපි ව්‍යවහාර කරන ජීවිතයක් ගොඩ නැගෙනවා. කිසි කෙනෙකුගෙන් ගුටි කන්නෙවත් කිසි කෙනෙකුට ගහන්නෙවත් නැති ජීවිතයක්. ඒ මේ ලෝකයේ ඇත්ත ඇති හැටියෙ දැක්කහම.

✶ ✶ ✶

දැන් අපට උත්තරේ හම්බ වුණා. අපි ඊට පස්සෙ උත්සාහවත් වෙමු එහෙනම් ඇත්ත ඇති හැටියේ බලන්න. බලන්න නෙමෙයි, බලන්න බැහැ. 'ඇත්ත ඇති හැටියේ ***ජානං***' ඒකයි මෙතැන ***ජානං, පස්සං*** කියලා දෙකක් තියෙනවා. ***ජානං*** කියන්නේ දැනගන්නවා. ***පස්සං*** කියන්නේ දකිනවා කියන එක. ***ජානං පස්සං යථාභූතං*** කියන්නේ ඇත්ත ඇති හැටිය දන්නවා, දකිනවා. මොකේද? ***චක්ඛු*** - ඇහේ, ***රූපා*** - රූපයන්ගේ. ***චක්ඛු විඤ්ඤාණං*** - චක්ඛු විඤ්ඤාණයේ, ***චක්ඛු සම්ඵස්ස*** - චක්ඛු සම්ඵස්සයේ, ***චක්ඛු සම්ඵස්ස පච්චයා උප්පජ්ජති වේදයිතං සුඛංවා, දුක්ඛංවා අදුක්ඛම සුඛංවා තම්පි*** ඇහේ, රූපයන්ගේ, චක්ඛු විඤ්ඤාණයේ, චක්ඛු සම්ඵස්සයේ, චක්ඛු සම්ඵස්සයෙන් උපන්න සැප, දුක්, උපේක්ෂා කියන වේදනාවන්ගේ ඇත්ත ඇති හැටියෙ දන්නවා නම්, දකිනවා නම්, ඒකටයි සම්මා දිට්ඨි කිව්වේ. ඒ ටිකටයි මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩෙනවා, බොජ්ඣංග ධර්ම වැඩෙනවා, සමථ විදර්ශනා වැඩෙනවා, දුක පිරිසිඳ දැකලා සමුදය ප්‍රහාණය කරලා, නිරෝධය සාක්ෂාත් කරලා, මග වැඩුවා යන ගනයට යනවා කියන මේ ධර්මතා ටිකත් වෙනවා. පංච උපාදානස්කන්ධය අපචයට යනවා. තණ්හාව ප්‍රහාණය වෙනවා. සිතින්ද කයින්ද සැප විඳින්නෙකුත් වෙනවා කියන ධර්මතා ටික වෙනවා කියන ටිකයි මතක් කළේ.

එතකොට මම එතැනදි මතක් කළේ, මේ වගේ ***අජානං-අපස්සං,*** ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණ කියන ටිකේ ඇත්ත ඇති හැටියේ නොදන්නේ, නොදක්නේ, කියලා

කියන්නේ මොකක්ද කියල ඒකට ඕනෙ නැහැනේ සාක්ෂියක් කියලයි මම කිව්වේ. මොකද අපිව පෙන්නන්න පුළුවන්නේ 'මේ අපි' කියලා.

එතකොට ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණයන්ගේ ඇත්ත ඇති හැටිය දැනගන්න ඕනේ. ඔය ධර්මයන්ගේ ඇත්ත ඇති හැටියෙ අහලා දැනගත්තට පස්සේ, ***'ජානං'*** තියෙනවා නමුත් ***'පස්සං'*** නැහැ. දන්නවා නමුත් තාම දකින්නේ නැහැ.

ඊට පස්සේ තමයි අපට සීල, සමාධි, ප්‍රඥා කියලා ත්‍රිශික්ෂාවක් වඩන්න වෙන්නේ. දැන් දැන ගත්ත දේ දැකගන්න ඕනේ. ඒ සඳහා සීල, සමාධි, ප්‍රඥා කියලා ලෞකිකවත් තියෙනවා ප්‍රතිපදාවක්. ඕකට කියනවා 'මග්ගාරම්මණ' කියලා. සතර සතිපට්ඨානය, සතර සම්‍යක්ප්‍රධාන, සතර ඍද්ධිපාද, පංච ඉන්ද්‍රිය, පංච බල, සප්ත බොජ්ජංග කියලා මේ ඔක්කොම ධර්මතා ටික ආර්ය අෂ්ටාංගික මාර්ගය දක්වා එනවා.

ඊට පස්සේ, ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩනකොට, ආයෙත් සතර සතිපට්ඨානය, මේ ටික ඔක්කොම පිරෙනවා කියන ටිකක් වෙනවා.

මේ ධර්මතා ටික අනුක්‍රමයෙන් කරගෙන කරගෙන ඇවිල්ලා කෙතැන දක්වාද තියෙන්නේ - ආර්ය අෂ්ටාංගික මාර්ගයට.

ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන කොට, දැන් ලෝකෝත්තර මට්ටමේ සතර සතිපට්ඨානය, සම්‍යක් ප්‍රධාන මේ ටික පිරිලා, අර්ය අෂ්ටාංගික මාර්ගය ඇතුළෙ කියලා කියන්නේ ඇත්ත දැක්කට, දැකපු ගමන්ම පිරුණෙ නැහැනෙ.

අපි කියමු සෝවාන් මාර්ගයෙන් දැක්කහම අර්හත්වය කියලා තැනක් ඉතුරු වුණා කියන්නේ, ලෝකෝතර දර්ශනය නිසා පිරෙන්න ඕනෙ ටිකක් තියෙනවා දැන්, ඒ ටික.

සෝවාන් වෙලා රහත් වෙනවා කියලා කියන්නේ නිකම් නෙමෙයි, ඒ සම්මා දිට්ඨිය එන්න එන්න වැඩෙනවා. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩෙනවා.

ඒ ලෝකෝත්තර මාර්ගය වඩන කොට සතර සතිපට්ඨානය, සතර සම්‍යක් ප්‍රධාන, සතර ඍද්ධිපාද, පංච ඉන්ද්‍රිය, පංච බල, සප්ත බොජ්ජංග කියන ටික පිරුණාහම තමයි ආර්ය අෂ්ටාංගික මාර්ගය පිරුණා වෙන්නේ. එතකොට රහත්.

මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ආරම්භය (සෝවාන්) මේ අවසානය (අර්හත්වය) අර මුලින් සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් කියන ටිකමයි තියෙන්නේ මෙතෙන්ට එන්නත් මේ දර්ශනයම වැඩුවහම, ආර්ය අෂ්ටාංගික මාර්ගය කියන එක ඇතුළෙන් පිරෙන්න ඕනෙ.

අපි කියමු ලයිට් කණු දහයක් තියෙනවා නම්, අටක් පහුකරගෙන ඇවිල්ලා, නවවෙනි ලයිට් කණුව ළඟ පොඩ්ඩක් පහු කරපු ගමන්ම දහය නෙවෙයිනේ. දැන් ඒක දහය දක්වා පුරවන්න ඕනෙ නේ අපි. ඒ වගේ ආර්ය අෂ්ටාංගික මාර්ගය කියන එක ආරම්භ වුණු ගමන්ම ඔක්කොම සම්පූර්ණ නැහැ.

මේ එකින් එක, සතර සතිපට්ඨානය, සතර සම්‍යක්ප්‍රධාන, සතර ඍද්ධිපාද, පංච ඉන්ද්‍රිය, පංච බල, සප්ත බොජ්ජංග කියලා, මේවා වඩලා ආර්ය අෂ්ටාංගික මාර්ගය කියලා එකක් හටගත්ත ගමන්ම, ආර්ය අෂ්ටාංගික මාර්ගය සම්පූර්ණ නැහැ. දැන් ආර්ය අෂ්ටාංගික මාර්ගය කියන එක පුරවන්න වෙනවා. ඒක පුරවන්නත් ඒ කාරණා. ඒකයි මේ සූත්‍රයෙන් මතක් කළේ.

එතකොට, අපි පූර්වභාග ප්‍රතිපදාව වඩන්න ඉස්සරවෙලා අනිවාර්යයෙන්ම මේ ටික අපි දැනගෙන ඉන්න ඕනේ. එහෙම දැනගත්තට පස්සෙ, මම අද ගොඩාක් වෙලාවට මතක් කරන ටිකක් තමයි මේ ඇත්ත ඇති හැටියෙ පවතින ධර්මය දැනගෙන භාවනා නොකරන කෙනෙක් වටිනවා, මේ ටික නොදැන කරන කෙනෙකුට වඩා. යම් පමණක සත්‍යයක් එයාගෙ මනසෙත් තියෙනවා, අනිත් කෙනා මොනතරම් උත්සාහවත් වුණත් තාම මනස තියෙන්නේ සත්‍යය නොදන්නාකම තුළ. මෙයාට ඉඩ ලැබුණ දවසක මෙයා හරි දේමත් ලබා ගන්නවා. එහෙම නොලැබුණත් මේ සත්‍යය දැනගත්ත පමණකින්ම, එපමණකින්ම එයා ජීවිතයට බොහෝ යහපතක් කරගෙන, බොහෝ කාලයක් සසරට සැනසිල්ලක් කරගෙන තියෙනවා. අනිත් කෙනාගෙ අවිද්‍යාව හෙල්ලිලාවත් නැහැ මොනවා කළත්.

ඒ නිසා යමක් නොදැන කරනවට වඩා, දැනගෙන නොකර ඉන්න එක වටිනවා කියන්න නෙවෙයි, දැන ගැනීම වඩාත් වටිනවා කියන එකයි මතක් කළේ.

මේ ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණ, චක්ඛු සම්ඵස්ස, ඕවයේ ඇත්ත ඇති හැටියෙ දැක්කහම ඔය පින්වතුන්ගේ ඇත්තටම බර ගොඩාක් අඩු කරනවා. ඊට පස්සෙ ඔය පින්වතුන් බය වෙන්න එපා. පොඩි දර්ශනයක් විතරයි අල්ලලා දෙන්නේ අපට. මේ ඔක්කොම දැනගත්තහම. ඒ තුළිනුත් කරගෙන යන්න පුළුවන් මට්ටමේ, එකක්. ඇහෙන් දකිනකොටම, මෙහෙම සිහි නුවණට අල්ලගන්න පුළුවන් දර්ශනයක් විතරයි ඉතුරු වෙන්නේ අන්තිමට.

ආයෙ මෙහෙම පෙනෙනකොටම. මේ ඇහැ බලන්න ඕනේ, රූපය බලන්න ඕනේ, මේ චක්ඛු විඤ්ඤාණය කියන හිත බලන්න ඕනේ, ස්පර්ශය බලන්න ඕනේ, වේදනාව

බලන්න ඕනේ, එකක් එකක් ගානෙ කියලා එකක් නැහැ. ඉස්සෙල්ලා ඒවයේ තියෙන ඇත්ත ඇති හැටියෙන් දැනගෙන තියෙන්න ඕනේ. එතකොට තමයි ඒවායේ පුද්ගල හෝ සත්ව හෝ ආත්ම හෝ කියන සංකල්පය එයාගෙන් මිදෙන්නේ. ඒවයේ තියෙන රළු, බරකම අඩු වෙන්නේ ඒවා දැන ගත්තහම.

ඊට පස්සේ දකින මට්ටමට ගන්න, බලන්න ඔය ඔක්කොම ඕනෙ වෙන්නේ නැහැ. බොහොම කෙටි තැනකින් තමයි වෙන්නේ.

ඒ හින්දා ඒකට බය වෙන්නත් එපා. නමුත් මේ දැන ගන්න ටික දැනගත යුතුමයි. එහෙම දැන ගත්තහමයි, ඔය පින්වතුන් කවදාවත් රැවටන්නෙත් නැහැ. රවට්ටන්නත් බැහැ. දැනගත්ත ටික ඔය පින්වතුන්ට නැති වෙන්නෙත් නැහැ.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ලෝකයේ යම්කිසි දුකක්, උපද්‍රවයක්, බයක් තියෙනවා නම් ඒ බාලයා කරාමයි ඇති වෙන්නේ. පණ්ඩිතයාට ඇතිවෙන දුකකුත් නැහැ, බයකුත් නැහැ. උපද්‍රවයකුත් නැහැ. ඒ නිසා විමසා බලා කටයුතු කරලා පණ්ඩිතයෙක් වෙන්න කියනවා. ආනන්ද හාමුදුරුවෝ අහනවා 'ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කොහොම විමසා බලා කටයුතු කළොත්ද පණ්ඩිතයෙක් වෙන්නේ?' 'ආනන්ද, ස්කන්ධ වශයෙන්, ධාතු වශයෙන්, ආයතන වශයෙන්, පටිච්ච සමුප්පාද වශයෙන්' කියලා පෙන්වනවා.

එතකොට ඔය පින්වතුන් ස්කන්ධ වශයෙන්, ධාතු වශයෙන් ආයතන වශයෙන්, පටිච්ච සමුප්පාද වශයෙන් විමසා බලන්න ඉගෙන ගෙන තියෙන්න ඕනේ. ඉගෙන ගත්තොත් තමයි ඔය පින්වතුන්ට විමසන්න පුළුවන් වෙන්නෙ.

මම මොනවා හරි දෙයක් කිව්වා කියලා, ඔය පින්වතුන් මොනවා හරි දෙයක් කළා කියලා, ස්කන්ධ ධාතු ආයතනයන්ගේ යථාභූත ස්වභාවය විමසන නුවණ ඔය පින්වතුන්ට එන්නේ නැහැ. මම සත්පුරුෂ ධර්මයේ පිහිටලා, සත්පුරුෂකම කරනවා කියලා කියන්නේ, ඔය පින්වතුන්ට 'හිතවන එක නෙවෙයි, 'හිතවන්න හදන එක, නිවන් දක්වන්න හදන එක' නෙවෙයි. ඒ කියන්නේ කවන්න හදන්න ඕනෙ නැහැ බත් ටික බෙදලා දෙන්න විතරයි ඕනේ.

ඒ කියන්නේ ඔය පින්වතුන්ට 'හිතන්න, හිතන හැටි' කියලා දුන්නා නම් ඇති. නොකෙරෙන දෙයක් කරවන්න හදනවා, ඒ කියන්නේ මම හිත ඇතුළට රිංගලා, හිතවන්නත් හදනවා වගේ එකක් නේ මේ කරන්න හදන්නේ. දැන් කට්ටියත් හැබැයි ඒකට පුරුදු වෙලා. ඒක හරි පහසු වැඩේ නෙ. ඒ කියන්නේ හාමුදුරුවො භාවනා කරවයි, කියන

තැනකින් ඉන්නේ. නමුත් එහෙම බැහැ. මම මේ කාටවත් දෝෂයක් කියනවා නෙමෙයි, මම කියන්නේ, ඇත්ත. ඒ කියන්නේ මම කිව්වොත් 'ඔබතුමා පැයක් ඉඳගෙන භාවනා කරන්න, නැගිටින්නවත් බැහැ' කියලා, ඇත්තටම මේ වෙලාවෙ ඉඳගෙන අරමුණ අල්ලාගන්නවත් බැහැ. ඒ තරම් අපහසු වෙන්න පුළුවන්. නමුත් ඔබතුමාට හිටගත්තොත් හෝ සක්මන් කළොත්, බොහොම පහසුවෙන් සති නිමිත්ත අල්ලාගෙන නුවණින් මෙනෙහි කරන්න පුළුවන්කමක් තියෙන්න පුළුවන් නේද. එතකොට කෙනා කෙනා පමණ දැන ගන්න ඕනෙ.

හැබැයි ඉතින් එහෙමවත් නොකරනවා නම් අර විදිහට හරි කරවන එක වටිනවා. ඒ කියන්නේ පොඩි ළමයි ඉස්පිරිතාලෙට ගියහම කැමැත්තෙන් බෙහෙත් විදින්න දෙන්නේ නැත්නම්, තුවාලෙට බෙහෙත් දාන්න දෙන්නේ නැත්නම්, අල්ලලා හරි බෙහෙත් දාන්න වෙනවනේ, නේද? කෙනෙක් නුවණක් තියෙනවා නම්, මේ තුවාලෙට බෙහෙත් දැම්මේ නැත්නම් මගෙ කකුලම තමයි කුණු වෙන්නේ කියලා, රිදුනත් ඉවසාගෙන ඉන්නවා. එහෙම දෙන්නේ නැතිනම් බලෙන් හරි අල්ලලා, අතපය බැඳලා හරි බෙහෙත් දාන්න වෙනවා.

ඒ වගේ කෙනෙක් භාවනා කියල දුන්නහම කැමැත්තෙන් හරි භාවනා කරනවා නම් ඒක ගොඩාක්ම හොඳයි. ඉතින් යම්කිසි කෙනෙක් නොකරනවා නම් බලෙන්ම හරි කරවනවා වගේ, මේ පැය නැගිටින්න බැහැ, ඉඳගෙනම කරන්න ඕනේ කියලා හරි කරවන්න වෙනවා. ඉතින් ඒක දකින්න දඬුවමක් කියලා. මේක හොඳ දෙයක් නෙවෙයි, බලෙන් අල්ලලා බෙහෙත් කරන එකක් කියලා දකින්න.

ඒ හින්දා බලෙන් අල්ලලා බෙහෙත් කරන කල් ඉන්නේ නැතුව, බෙහෙත කැමැත්තෙන්ම විද ගත්තොත් තමන්ටත් වෙහෙස අඩුයි, අනුන්ටත් වෙහෙස අඩුයි කියන තැනකිනුත් තේරුම් අරගෙන ඉදිරියේදි මෙයින් ප්‍රයෝජන ගන්න උත්සාහවත් වෙන්න කියලා මතක් කරනවා.

ලෝකෝත්තර නුවණකටම හසුවන,
ක්‍ෂණමාත්‍රයකට ඉපිද නිරුද්ධ වන ලෝකය

මේ ලෝකයේ යථාභූත ස්වභාවය (මහා සළායතනික සූත්‍රයේ පෙන්නන විදිහට) නොදන්නා, නොදකිනකම නිසායි සියළුම දුක් දොම්නස් ඇති වෙන්නෙත්, නැවත දුක ඇති කරන හේතුව ඇති වෙන්නෙත්, කියලා අහගෙන, මේ ලෝකයේ පවතින යථාභූත

ස්වභාවය ***ජානං පස්සං යථා භූතං*** ඒ යථාභූත ස්වභාවය දන්නවා නම් දකිනවා නම්, සියළුම දුක් දොම්නස් වලින් මිදිලා, නැවත දුක හටගන්න තියෙන හේතුවත් නැති කරලා, සුව සොම්නස් සහගත ජීවිතයක් පරිහරණය කරන්න පුළුවන් කියන න්‍යාය ධර්මය අහගත්තා. ඊට අනුව මේ ලෝකයේ යථාභූත ස්වභාවය කියන්නේ මොකක්ද කියන මාතෘකාව ඔස්සේ අපි කතා කළා.

ලෝකය කියන කොට ධර්මයේ පෙන්නන්නේ 'පංච උපාදානස්කන්ධ ලෝකය'. එතකොට එයින්ද පංච උපාදානස්කන්ධ ලෝකයේ කාම ධාතුව, කාම භූමිය අනුව ගිය, ඇසුරු කරන සත්වයන්ට බෙහෙවින් ඇසුරුවෙන ස්කන්ධයක් වෙන්නේ **'රූපස්කන්ධය'.** ඒ නිසා රූපස්කන්ධය පිරිසිඳ දැක්කොත් කබලිංකාරාහාරය පිරිසිඳ දැක්කා වෙනවා. එහෙම වුණොත් කාම භූමියට නැවත එන්න තියෙන හේතුවත් නැති වෙනවා කියලා ධර්මයේ සඳහන් වෙනවා සංයුක්ත නිකායේ, ආහාර වග්ගයේ, ආහාර සූත්‍රයේ. ඒ නිසා අපි රූප උපාදානස්කන්ධය පිරිසිඳ දකින්න, ඇත්ත ඇති හැටියේ දකින්න අවශ්‍ය, ඒ රූප ටික ගැනත් කෙටියෙන් කතා කළා.

ආධ්‍යාත්මික ආයතනයන්ගේ අපිට හම්බ වෙන මට්ටම නෙමෙයි, අපිට මොන විදිහට හම්බ වුණත්, පවතින යථා ස්වභාවය අපි කථා කළා. ඊට පස්සේ අපි බාහිර රූප ශබ්ද අරමුණු ගැනත් කථා කළා. මම මතක් කළා, හැමදාම අපිට මේ හැම රූපයක්ම එකක් එකක් ගානේ බලන්න ඕනේ නැහැ, මෙනෙහි කරන්න ඕනේ නැහැ, මේ ටික දැන ගත්තහම, ඉගෙන ගත්තහම කෙටි දර්ශනයක් අපිට හබ්බ වෙනවා කියලා. මම ඒ දර්ශනයත් මතක් කරන්නම්.

මේ දර්ශනය තමයි 'සම්මා දිට්ඨිය' කියලා කියන්නේ, හැබැයි ඒ සම්මා දිට්ඨිය දකින්න යන මාවත, නැත්නම් සීල, සමාධි, ප්‍රඥා කියන ත්‍රිශික්‍ෂාව, පූර්වභාග ප්‍රතිපදාව වෙන එකක්. ඒ පූර්වභාග ප්‍රතිපදාවටයි අනිත්‍ය, දුක්ඛ, අනාත්ම කියන ත්‍රිලක්‍ෂණය අයිති වෙන්නේ මිසක, මේ දර්ශනයට නෙමෙයි කියලා මතක් කළා. මම ඒ ටික සහේතුකව පිටකය තුළින් පෙන්නන්නම්.

අපි මුලින්ම නුවණින් බලමු, මේ ස්කන්ධ ටික, රූපස්කන්ධය මේ විදිහට දැක්කහම, රූප අරභයා අපට කෙටි දර්ශනයක් හම්බ වෙනවා කියලා මම මතක් කළා නේ. මොකක්ද ඒ දර්ශනය? ඒ තමයි ***යං කිංචි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං*** - යමක් හේතූන්ගෙන් හටගන්නවා නම් හේතු නිරෝධයෙන් නිරුද්ධ වෙනවා කියලා කියන පරියායේ පිහිටලා, අපි ඇහෙන් දකින රූප, කනෙන් අහන ශබ්ද, නාසයට දැනෙන ගන්ධ, දිවට දැනෙන රස, කයට දැනෙන ස්පර්ශ, ඒ අනුව ගිය සිතුවිලි. මොකද

මේ පංචායතනයට නැඹුරු වෙලා උපදින මනායතනයත් කාමයි. ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන ස්පර්ශ ආයතන හය සිහිකරමින් ඒ ස්පර්ශ ආයතන හයෙන් ගත්ත අරමුණු වලට නැමී පවතින මනෝ විඤ්ඤාණයටත් කියනවා කාමාවචරයි කියලා. මොකද එතනත් අපට රූප සංඥාවමයි ඇසුරු වෙන්නේ, රූපයකුයි තියෙන්නේ.

මෙන්න මේ ටික අපි පිරිසිඳ දකින්න ඕනේ දර්ශනයක්. ඒකට කියනවා **දිට්ඨේ දිට්ඨ මත්තං, සුතේ සුත මත්තං, මුතේ මුත මත්තං, විඤ්ඤාතේ විඤ්ඤාත මත්තං** කියලා. ඔය ස්කන්ධ ටික පිරිසිඳ දැක්කහම, කෙළවරට යනකොට නුවණින් අපිට මේ පෙනෙන රූපය ගැන හොඳ අවබෝධයක් ලැබෙනවා, දකින්න න්‍යායක් ලැබෙනවා.

මොකද මෙතැනදි, අපි වෙන වෙනම ඇහැ ගැන ඉගෙන ගත්තාට, ඇහෙන් පෙනෙන රූප ගැන ඉගෙන ගත්තාට, චක්ඛු විඤ්ඤාණය කියන ධර්මතාවයක් ගැන කථා කළාට, චක්ඛු සම්ඵස්සය ගැන කථා කළාට, චක්ඛු සම්ඵස්සයෙන් උපන්න වේදනාව ගැන කථා කළාට, අපි ඇහෙන් මෙහෙම රූපයක් බලන කොට, මේ ස්කන්ධ ටික ඔක්කොම තියෙනවා. ඇහැත් වැයවෙලා, චක්ඛු විඤ්ඤාණය නැමැති හිතත් වැය වෙලා, චක්ඛු සම්ඵස්සයත් වැය වෙලා, එයින් උපන්න වේදනාවත් යෙදිලා, ඔක්කොම ටික යෙදිලා, වැය වෙලා අපිට පෙනෙන්නේ රූපයක් විතරයි. ඇහැට පෙනෙන වර්ණ සටහනක් විතරයි. වෙන රූපයක් පෙනෙන වෙලාවට ආධ්‍යාත්මික පැත්ත, නාමධර්ම, සිතුවිලි මොකුත් පෙනෙන්නේ නැහැ.

- අපිට පෙනෙන රූපය ඇති දෙයක් වුණොත්, ඒ වෙලාවෙදි ඒ වේදනාවත්, සංඥාවත්, සංඛාරයත්, විඤ්ඤාණයත් ඇති දෙයක් යන ගණයට යනවා.

- අපිට පෙනෙන රූපය ආත්ම හැටියට පෙනෙන කොට, ඒ රූපය පෙන්නන්න උදව් වුණු ඉතුරු ධර්මතාත් ඉබේමයි ආස්වාද ගණයට ගිහිල්ලා තියෙන්නේ.

- අපි පෙනෙන රූපයට තණ්හා කරනකොට ඉබේමයි ඇහැටත් තණ්හා කරලා, චක්ඛු විඤ්ඤාණයටත් තණ්හා කරලා, චක්ඛු සම්ඵස්සයටත් තණ්හා කරලා, එයින් උපන්න වේදනාවටත් තණ්හා කළා කියන පරියායට යන්නේ.

- පෙනෙන රූපයේ අනිත්‍ය දකිනකොට, එයා ඇහෙත් අනිත්‍ය

දකිනවා, සිතෙත් අනිත්‍ය දකිනවා, ස්පර්ශයේත්, වේදනාවේත් අනිත්‍ය දකිනවා.

- පෙනෙන රූපය අනාත්මයි කියලා දකිනකොට, ඒ එක්ක පවතින අනෙක් ධර්මතා ටිකේත් අනාත්මය දකිනවා.

මොකද, කිසිම වෙලාවක, ඇහැ මුල් කාරණාව කරගෙන අරමුණු ගන්න මේ ක්‍රමයෙදි, ඒ ඔක්කොම යෙදිලා, වැයවෙලා අපිට රූපයක් හම්බ වෙනවා මිසක, ඉන් පරිබාහිර වෙන කිසිම දෙයක් දන්නේ නැහැ. ඒවා ආධ්‍යාත්මික පැත්තේ යෙදිලා තියෙන්නේ.

ඔය විදිහමයි, කනෙන් ශබ්දයක් අහනකොට, ඒ ශබ්ද රූපය උපද්දන්න හේතු වුණු හිතක්, කනක් තියෙනවා නම්, සෝත විඤ්ඤාණය නැමැති හිතක් තියෙයි නම්, සෝත සම්ඵස්සය, එයින් උපන්න වේදනාවක් තියෙයි නම්, ඒ ඔක්කොම යෙදිලා, වැයවෙලා අපිට ඇහෙන්නේ ශබ්දයක්. ඒ ශබ්දය නිත්‍යයි, සැපයි, ආත්මයි වෙන කොට, අර ඔක්කොම නාමධර්ම ටිකත් ඉබේමයි නිත්‍යයි, සැපයි ආත්මයි වෙන්නේ.

පෙනෙන ශබ්දය අනාත්ම වෙනකොට, අනිත්‍ය දෙයක් වෙනකොට, දුක් දෙයක් වෙනකොට, ඒ ශබ්දය ඇති කරන්න හේතු වුණු නාමධර්ම ටිකෙත් එයා අනිත්‍ය දැක්කා, දුක් වශයෙන් දැක්කා, අනාත්ම වශයෙන් දැක්කා යන ගණයට යනවා.

ඒ නිසා අපිට ඇහැට පෙනෙන රූපය, කනට ඇහෙන ශබ්දය කියන මේ අරමුණු ටිකේ ඇත්ත තේරුම් ගත්තහම හරි. ඉස්සෙල්ලා එකක් එකක් ගානේ ආයතන දැනගෙන තියෙන්න ඕනේ. එතකොට අපට අරමුණක් පෙනෙන තැනක, පෙනෙනවා කියන ධර්මතාවයේත් ඇත්ත දකිනවා නම්, ඒකට උදව් වෙලා තියෙන වස්තූන්ගේ ඇත්තක් දැකලා තියෙන්න ඕනේ. ඔක්කොම යෙදිලා, එබඳු වූ යථාර්ථයෙන් යුක්ත ධර්මතා යෙදිලා, මෙහෙම රූපයක් පෙනෙන්නේ කියන ඇත්තත් තියෙනවා.

එතකොට, මේ පෙනෙන රූපයේ කෙටි දර්ශනය තමයි ඇහැට රූපයක් පෙනෙනකොට, එයාට පෙනෙන්න ඕනේ ඇස් ඉදිරිපිටට එන්නේ, ඇහෙන් දැක ගන්න පුළුවන්කම තියෙන්නේ වර්ණ සටහන් මාත්‍රයක් විතරමයි කියන කාරණාව. අර බිත්තියක ඇඳපු චිත්‍රය බඳු වර්ණ සටහන් මාත්‍රයක් විතරයි ඇහැට පෙනෙන්නේ, එතකොට නුවණ තියෙන්න ඕනේ, කුමන හෝ අරමුණක් පෙනෙද්දි, දකින්න පෙර ඒ පෙනෙන වර්ණ සටහන තිබුණා නෙවෙයි. දැක්කට පස්සේ ඒ වර්ණ සටහන තියෙනවා නෙවෙයි. අවස්ථාවටද තමන්ගේ ඇහෙන් උපද්දලයි මේ වර්ණ සටහන පෙන්නන්නේ, එතකොට වර්තමානයේදිත් තියෙන එකක් ඇසුරු කරන්න බැහැ. තමන්ම හදාගෙනයි පෙනෙන්නේ කියන කාරණාවක්

එනවා. තිබුණා නෙවෙයි, තියෙනවා නෙවෙයි, අවස්ථාවට උපදවාගෙන පරිහරණය කරන්නේ කියන දර්ශනයක් එනවා.

ඒ නිසා ***යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං*** කියලා කියන්නේ. ***යං කිඤ්චි සමුදය ධම්මං*** - කියලා යමක් සමුදය ස්වභාවයෙන් හේතූන්ගෙන් හටගන්නවා නම් කියන කොට, එතැනදි කියනවා තිබිලා ආපු එකක් නෙමෙයි කියන එක කියනවා. 'හේතූන්ගෙන් හටගත්තා' කියන කොට ඒ ධර්මතාවය, ඒ වස්තුව නොවන හේතු රාශියක් එකතු කරගෙන අවස්ථාවටයි හැදෙන්නේ කියන එක කියනවා.

මම කලිනුත් කියලා තියෙන ධර්මතාවයක් මතක් කරන්නේ, දැන් තේ එකක් ගත්තොත් හේතූන්ගෙන් හටගන්නේ කියනකොට, තේ එක නොවන හේතු ටිකක් නිසායි ඒක හටගන්නේ කියන එක මම මතක් කරලා තියෙනවා. සීනි, තේ කොළ, උණු වතුර කියන හේතු ටික නිසා හට ගත්තේ කියන කොට, තේ එකක් තිබිලා ආව නොවෙයි කොහේවත්. ඒ වගේ 'තිබුණු රූපයක්' පෙනෙනවා නෙවෙයි. ඇහැ නිසා, හිත නිසා, මහාභූත ටික නිසා අපිට මෙහෙම පෙනෙනවා කියන කොට, 'පෙනෙන දේ නොවන ධර්මතා රාශියක් එකතු වෙලායි අපිට මෙහෙම පෙනෙන්නේ' කියන ටිකක් තියෙනවා. එතකොට, පෙනෙන දේ 'පෙනීම් මාත්‍රයක්' විතරයි, ඒකද පෙනෙන්නේ වර්ණ සටහනක් විතරයි කියන ටික දකින්න ඕනේ. දැන් තවම දකින්නේ නැහැ. මෙන්න, මේ මට්ටම දැක්කොත් තමයි ඉතුරු නැතුවම නැති වෙනවා කියන නුවණකට එන්නේ. හැබැයි මේ දර්ශනය අපිට අයිති නැහැ. ලෝකයේ කෙනෙකුට අයිති නැහැ. මේ දර්ශනයට කියනවා 'ලෝකෝත්තර' කියලා. ලෝකයෙන් එතෙර වෙනවා. ලෝකය සම්පූර්ණයෙන් නිරුද්ධ වෙනවා මේ දර්ශනයට.

අපිට අයිති 'දකින්න පෙර තිබුණා, තියෙන දෙයක්ම දකිනවා, දැක්කයින් පස්සෙත් ඒක තියෙනවා' කියන මට්ටම තමයි ලෝකයේ කෙනෙකුට අයිති. එතකොට, ලෝකයේ කෙනෙකුට අර කියපු දර්ශනය හිතා ගන්නවත් බැහැ. ඒ කියන්නෙ ලෝකයේ කෙනෙකුට ලෝකෝත්තර නුවණක් තවම නැහැ කියන එකයි. දකින්න පෙර තිබුණා නෙවෙයි, දැක්කායින් පස්සේ තියෙනවා නෙවෙයි, අවස්ථාවටද තියෙන දෙයක් දකිනවා නෙවෙයි, උපද්දවාගෙනයි පරිහරණය කරන්නේ' කියන මට්ටම තමයි යථාභූත ස්වභාවය. එතකොට වර්තමානයේ ඇත්ත දකින්නත් ඕනේ මොකක්ද, පෙනෙනකොට **'වර්ණ සටහන් මාත්‍රයක්'** විතරයි කියනකම තියෙන්න ඕනේ, චිත්‍රයක් විතරමමයි.

තිට්ඨන්ති චිත්‍රානි තථේව ලොකේ - ලෝකයේ චිත්‍ර තියෙනවා, ***සංකප්ප රාගෝ පුරිසස්ස කාමෝ*** - කාමය කියලා කියන්නේ, රාග වශයෙන් සහ සංකල්ප වශයෙන් පුද්ගලයා තුළ ඇති වෙන ධර්මතාවයටයි කාමය කියලා කියන්නේ.

ඒ කියන්නේ, ඉදිරියෙන්, ඇස් ඉදිරිපිටට එන්නේම වර්ණ සටහන් මාත්‍රයක් විතරයි. එහෙම වර්ණ සටහන් මාත්‍රයක් එද්දි, ඒ චිත්‍රය 'දෙයක්, කෙනෙක්, කාරණාවක්' කියලා වටිනාකමක් එක්ක දැනෙනවා නම්, ඒ අපි මනසින් උපද්දපු, සිහිකරපු ටිකක්.

අපි මෙහෙම හිතමු, සල්ලි කොලයක් කියන්නෙ කඩදාසියක් නේ, යථාර්ථය චිත්‍ර ටිකක්. අපි කිවුවොත් දැන් ඩොලර් පනහේ කොලේකුයි ඩොලර් සියයේ කොලේකුයි, අපි වටිනාකම් බලන්නේ නැතුව කොලේ දිහා බලන්න, කඩදාසියක්, චිත්‍ර ටිකක් නේ තියෙන්නේ. පොඩි ළමයෙකුට ඒකෙ වටිනාකමක් තේරෙන්නේ නැහැනේ. ඒක තමයි ඇත්ත. ඒ ටික දකින කොටම, අපේ මනස දිහා බලන්න, ඩොලර් සීයයේ කොලේ වටිනවා, පනහේ කොලේට වඩා කියලා අපිට වටිනාකමක් තේරෙනවා නේද? එතකොට ඇහැට පෙනෙන කොට කොයි චිත්‍රයත් එකයි. නමුත් මනසින් තමයි අපිට ඒ වටිනාකම ක්‍ෂණිකව උපන්නේ, උපද්දවා ගන්නේ. ඒ වගේ ඇහැට පෙනෙන මේ චිත්‍ර අරභයා වටිනාකමක් එන්නේ අපිට එහෙම ආවහම අපි ඒ පෙනෙන අරමුණේ ඇලිලා, බැඳිලා ඉන්න නිසා, දැකපු දේ ඉතුරු වෙන්නේ. අපි කලිනුත් කතා කළා ඇත්ත නොදකින කොට ඒකේ ඇලිලා බැඳිලා, ඒක ඇති බවට ඉතුරු වෙනවා කියලා.

එතකොට කෙටි දර්ශනය තමයි, වර්ණ සටහනක් කියලා දකින කොට එයාට පෙනෙන්න ඕනේ රන්, රිදී, මුතු, මැණික්, ගෙවල් දොරවල්, යාන වාහන, ඉඩකඩම්, මිල මුදල්, කියලා යම්තාක් දේ ඇත්ද, ඔක්කොම 'පංච උපාදානස්කන්ධ ලෝකයක්' අපේ මනසෙන් ගොඩ නගා ගත්ත, සංකල්පමය වටිනාකම් ටිකක් තියෙන්නේ. ඒ හැම එකක්ම ඇසුරු වෙන්නෙ අපේ මනස තුළ, මනෝ විඤ්ඤාණයෙන් දැනගන්න ටිකක්.

එතකොට යම් දවසකදි, ඇහැට රූපයක් පෙනෙනකොට, පෙනෙන රූපය තුළ තමන්ට ඇලෙන්න, බැඳෙන්න, ගැටෙන්න කිසිදු දෙයක් නැතුව, ඇස් ඉදිරිපිටට වර්ණ සටහන් මාත්‍රයක්, චිත්‍ර මාත්‍රයක් විතරක් එනවා කියන ගතිය විතරක් නම් තේරෙන්නේ, ඒකත් දකින්න පෙර තිබුණා නෙවෙයි, අපි වතුරක් ළඟට ගිහින් එබෙන්න පෙර අපේ ඡායාව තිබුණා නෙවෙයි, එතැනින් අහකට යනකොටම ඡායාව තියෙනවා නෙවෙයි, තිබුණ ඡායාවක් දකිනවාත් නෙවෙයි, අපි එබුණා කියන්නේ අපි හදාගෙනමයි ඡායාව බලන්නේ. ඔය මිම්ම වෙන්න ඕනේ, බාහිර රූපය හම්බ වෙන කොට, ආධ්‍යාත්මික පැත්තෙන්, නැත්නම් ඇහැ නමැති ධර්මතාවය නිසාම උපන්න එකක්, ඒකද බලන්න පෙර තිබුණා නෙවෙයි, බැලුවට පස්සේ තියෙනවා නෙවෙයි, කියන දර්ශනය එළඹ සිටියොත්, ඒක තමයි යථාභූත ස්වභාවය.

ඔය දර්ශනය ළඟා කරගන්න පහසු වෙන්න තමයි අනිත් ආයතන ටිකේ ගති ටිකත් අපි බැලිය යුත්තේ. ඇත්ත ඇති හැටිය ඉගෙන ගත යුත්තේ

✶ ✶ ✶

ඊට පස්සේ ශබ්දය කියන කාරණාවත් එහෙමයි. ශබ්දයක් අහන්න පෙර තිබුණා නෙවෙයි, ඇහුනායින් පස්සේ තියෙනවා නෙවෙයි, අවස්ථාවට කන නිසා ශබ්දය කියන එක උපද්දලා අපිට දැනෙන්නේ. ඒකෙදිද, 'ශබ්ද රූපය' කියන එකට, ශබ්දයට වාහනවල ශබ්ද, කුරුල්ලන්ගේ ශබ්ද, කියලා ශබ්ද වලට කුරුල්ලෝ, වාහන එහෙම නැහැ. එහෙම නැතුව, 'ශබ්ද මාත්‍රය' දකින්න පුළුවන් වෙන්න ඕනේ. ඒ ශබ්දයේ ඇත්ත නොදන්නාකම නිසා තමන් තුළ කුරුල්ලො සිහි වෙලා, වාහන සිහි වෙලා, මේ තියෙන්නේ ශබ්දයට සමගාමීව. එතකොට, අපිට ඇහෙන ශබ්ද නම් ඇහෙන්න පෙර තිබුණා. වාහන ශබ්දයක් ඇහුනොත්, අපිට ඇහෙන්න පෙරත්, ඒ ශබ්දය තියෙනවා, වාහන ශබ්දෙ තියෙනවා. තියෙන ශබ්දෙකුයි ඇහුනෙ, ඇහුනායින් පස්සෙත් තියෙනවා කියලා, ශබ්දය ආපු වාහනේ බලන්නත් අපට පුළුවන්. නමුත් යථාර්ථය, ශබ්ද රූපය පිරිසිඳ දැක්කහම, යථාභූත ස්වභාවය දැක්කහම, එයා දන්නවා, කන නිසායි ශබ්දය ඇහෙන්නේ. එතකොට, ඇහෙන්න පෙර තිබුණා නෙවෙයි, ඇහුනායින් පස්සේ තියෙනවා නෙවෙයි, අවස්ථාවට හටගෙන නැති වෙනවා.

✶ ✶ ✶

ඊට පස්සේ, දිවට රසක් දැනෙන කොටත් එහෙමයි. රස කියන එක අපට තියෙන රසයක් තමයි, කේක් කෑලි, නැත්නම් සීනි වල තියෙන රසය තමයි එන්නේ කියලා, හැම වෙලේම අපට ඒ රසය තියෙනවා. තියෙන රසය තමයි අපි විඳින්නේ, විඳින රසය තියෙනවා කියලා. නමුත් ඇත්ත තමයි, රස වලට සීනි නැහැ. රස වලට අඹ ගෙඩි නැහැ. ඔය වගේ රස වලට ද්‍රව්‍ය කාරණා නැතුව 'රස රූපයක්' විතරයි තියෙන්නේ. ඒකද දිව නිසා උපද්දපු එකක්. රස විඳින්න පෙර තිබුණා නෙවෙයි, වින්ඳායින් පස්සේ තියෙනවා නෙවෙයි.

✶ ✶ ✶

ඒ වගේ නාසයට දැනෙන ගන්ධයත්, කයට ගැටෙන පොට්ඨබ්බයත්, හිතට සිහිවෙන අරමුණුත් ඔය විදිහට දැන ගන්න.

ඕකට මම කෙටි උපමාවක් මතක් කළා. මම එන්න දවස් කීපයකට කලින් සේනාසනයේ සිදු වුණු සිද්ධියක් ගැන.

අපේ සේනාසනයේ ඉන්නවා ස්වාමීන් වහන්සේ නමක් පිළිකාවක් හැදිලා, දැන් හොඳයි. නමුත් කරන්ට් (current) එක අල්ලලා. මූණ දෙපැත්තම කරන්ට් එක ඇල්ලුවට පස්සේ කිසිම කෑමක රස දැනෙන්නේ නැහැ. ඒ කියන්නේ ලුණු බෝතලයක් දාලා දුන්නත් ප්‍රශ්නයක් නැහැ. කොහොඹ කොල යුෂ කෝප්පයක් දුන්නත් ප්‍රශ්නයක් නැහැ. දැන් ඒ කෑම ටිකම අපි ගත්තහම අපට රස දැනෙනවා දැන් මේ ස්වාමීන් වහන්සේට රස දැනෙන්නේ නැහැ. දැන් තමන්ගේ ආධ්‍යාත්මික ආයතනයේ සම්බන්ධයක් නැතුව බාහිර තියෙන රස නම් දැනෙන්නේ, එක්කෙනෙකුට රස නොදැනෙන්නත්, එක්කෙනෙකුට රස දැනෙන්නත්, හේතුව මොකක්ද? දැන් අර පිළිකාවට කරන්ට් එක ඇල්ලුවහම, බෙහෙත් කළහම, ස්නායු ටික මැරිලා තියෙන්නේ. ඒ කියන්නේ දැන් දිව නැහැ. එතකොට හොඳට බලන්න, තමන්ගෙ දිව නැති හින්දා රස රූපයක් එයාට නැහැ. දැන් ඒ ස්වාමීන් වහන්සේට රස රූපයකින් සැප දුක් විඳින්න ඉඩ නැහැ. ඒ රස රූපයකින් සැප දුක් විඳින්න ඉඩ නැති වුණේ දිව නැති හින්දා මිසක, මහාභූත නැති හින්දා, බාහිර වස්තු නැති හින්දා නෙවෙයි. බාහිර වස්තු තිබුණත්, කෙනා කෙනා සැප දුක් විඳින්නේ තම තමන්ගේ ආයතනයෙන්මයි. එතකොට හොඳට තේරෙනවා දිව නිසා රස ඉපැද්දුවහම, ඒ උපද්දපු රසයයි ආපසු හිතෙන් විඳින්නේ.

ඔය මිනුමම ගන්න, එක ආයතනයක විතරක් යථාර්ථය පොදු වෙන්නෙ නැහැ අපට නොපෙනුනාට, හැම ආයතනයකම ඇත්ත ඕකමමයි. ඒක හොඳට සිහි කරන්න. දැන් ඒ ස්වාමීන් වහන්සේට ලුණු කෝප්පයක් වැක්කෙරුවත් තේරෙන්නේ නැත්නම්, අපට ලුණු ටිකක් වැටුනොත් කෑව හැකිද? කන්න අමාරුයි නේ? එතකොට ඒ රස නිසා අපි සැප දුක් විඳිනවා. අපි හිතාගෙන ඉන්නේ ඇත්තටම බාහිර තියෙන වස්තුවකින් සැප දුක් විඳින්නේ කියලා. හැමදාම අපිට ඒ බාහිර වස්තුව හම්බ වෙන හේතුව ආධ්‍යාත්මිකයි කියලා පෙනෙන්නේ නැහැ.

අපි කියමු දිව තාවකාලිකව නැති වෙන්න හේතුව කර්මය. පුරාණ කර්මය, මොකද ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන්නේ කර්මජ රූප. ඒ කර්මය නැති වෙන කොට, වෙනස් වෙන කොට ඔන්න දිව නැති වෙනවා. ඒ හින්දා තාවකාලිකව, රසකින් සැපදුක් විඳින්න තියෙන හේතු නැහැ. ආයෙත් කර්මය ඉවර වෙන කොට ඔන්න දිව හැදෙයි. දිව හැදුනොත් අන්න එතන රස තියෙනවා.

එතකොට මේ ආයතන ටික ඔක්කොම එහෙමයි. මේ ස්වාමීන් වහන්සේගේ දිවේ සෛල ටික වර්ධනය වෙලා, ඒ කියන්නේ දිව ප්‍රකෘති තත්වයට ඇවිල්ලා, රස හම්බ වුනොත්, රස වින්දොත්, දැන් තමන් පැණි රසයි, ලුණු රසයි කියලා තමන්ට සැප දුක් විඳින රස, තිබුණු එකක්ද, තමන්ගෙ දිවෙන් උපද්දපු එකක්ද තමන්ට හම්බ වෙන්නේ? ඒ කියන්නේ බාහිර දෙයක් නෙමෙයි, කෙනා කෙනාට බලන්න. තමන් උපද්දපු දේකුයි සැප දුක් විඳින්නේ නේද? ඔන්න එතකොට ඒ රසයෙන් සැපදුක් විඳින්න දිව කියන එක ඕනේ. දිව කියන එක උදව් වෙලා තමයි රූප හදලා තියෙන්නේ.

ඔය විදිහට බැලුවහම, ඒකයි මේ රසට කියන්නේ, තිබුණු එකක් නෙවෙයි, තියෙන එකකුත් නෙවෙයි. තිබුණු එකක් නම්, තියෙන එකක් නම්, දිව නැති වුණාත් තියෙන්න ඕනෙ නේ. තිබුණු එකක් නෙවෙයි. තියෙන එකකුත් නෙවෙයි. දිව නිසා හදලා නම් රස පෙන්නන්නේ, එහෙම හදපු රසයකින් නම් අපි සැප දුක් අපි විඳින්නේ, දිව නිරුද්ධ වෙනකොට, නැත්නම් සිත අහකට යන කොට, අර රසය කියන එක ඉතුරු නැතුව නැති වෙනවා.

මොකද, බාහිර තිබුණ රසයක් අපි වින්දා නම්, ඕක අපට කියන්න බැහැ. රස විඳින්න පෙර තිබුණා නෙවෙයි, වින්දායින් පස්සේ තියෙනවා නෙවෙයි කියන එක කියන්න බැහැ. එහෙනම් කියන්න වෙන්නේ, තියෙන රසය වින්දා, වින්ද රසය තියෙනවා කියලයි. නමුත් දිව නිසා උපද්දපු රසයකින් නම් අපි සැප දුක් විඳින්නේ, අපට කියන්න සුදුසුමයි 'රස විඳින්න පෙර තිබුණා නෙවෙයි, රස වින්දායින් පස්සේ තියෙනවා නෙවෙයි, අවස්ථාවටද තියෙන එකක් නෙවෙයි, උපද්දවාගෙනයි විඳින්නේ කියන ටික. ඕක තමයි ඇත්ත.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★

ඔය මට්ටමට ආවහම සම්පූර්ණ 'ශූන්‍යතාවයක්' **ඒ කියන්නේ තමන්ම මවපු ලෝකය තුළ, ආයතනයන්ට මැවුණු ලෝකය තුළ තවත් සත්වයෝ, පුද්ගලයෝ ඉන්නවා නෙවෙයි** කියන එක හොඳට තියෙනවා. දැන් අපට වෙන්නේ තියෙන ලෝකයක් හම්බ වෙනවා කියන එක හින්දනේ මේ සත්වයෝ, පුද්ගලයෝ ඉන්නවා කියන එක එන්නේ. එතකොට, ඔන්න ඔය මට්ටමේ දර්ශනයක් තියෙනවා, ඔන්න ඕකට තමයි යථාභූත ස්වභාවය කියලා කියන්නේ. **ආධ්‍යාත්මික ආයතන ටිකත් බලලා, රූප ටිකත් බලලා, බාහිර රූප ටිකෙත් ඇත්ත තේරුම් ගත්තහම,** හොඳට තේරෙනවා, මේවා අවිද්‍යා, කර්ම, තණ්හා ආහාරයන්ගෙන් හැදුනේ කියලා. යථාර්ථය බැලුවහම ඇහැ, කන, දිව, නාසය, ශරීරයත්

පෙන්නනවා, ඊට පස්සේ ඒවයින් උපද්දපු රූප ටිකත් අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාරයන්ගෙන් හැදුනෙ කියලා පෙන්නනවා.

කෙටියෙන් ඔය ටික ඉගෙන ගෙන එනකොට දර්ශනයක් අපට හම්බ වෙනවා 'අතීතයේ ඉඳලා ආපු එකකුත් නෙවෙයි, අනාගතයට යන එකකුත් නෙවෙයි, වර්තමානයක හටගෙන නැති වෙනවා' - ***යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං*** කියලා දර්ශනයක් එනවා.

ඔන්න ඔය ටික තමයි අපි ඔය ඉගෙන ගත්ත, කථා කළ රූප වල යථාර්ථය, කෙළවරටම ලැබෙන ඇත්ත. ඕකට කියනවා යථාභූත ස්වභාවය කියලා.

මහා සළායතනික සූත්‍රයේ අපට පෙන්නුවානේ, ***අජානං අපස්සං යථාභූතං*** - යථාභූත ස්වභාවය නොදන්න, නොදකින නිසායි ඒකෙ ඇලෙන්නේ, බැඳෙන්නේ, සිහි මුලා වෙන්නේ, ඒ නිසායි ආස්වාදයෙන් බලන්නේ, එහෙම වුණොත් තමයි දැකපු දේ ඇති බවට ඉතුරු වෙන්නේ, පංචඋපාදානස්කන්ධය රැස් වෙන්නේ. එහෙම වුණොත් තමයි තණ්හාව වැඩෙන්නේ. එහෙම වුණොත් තමයි දුක් විඳින්නෙක් වෙන්නේ කියලා පෙන්නුවා නේද?

★ ★ ★ ★ ★ ★ ★ ★ ★

ඊට පස්සේ ඒක අනික් පැත්තට යනවා සම්පූර්ණයෙන්ම. ***ජානං පස්සං යථා භූතං*** - මේ විදිහට ඇත්ත ඇති හැටියෙ දකින කොට වෙන්නේ මොකක්ද? ඇලෙන්නේ නැහැ. ඇලෙන්නේ නැති වුණහම බැඳෙන්නේ නැහැ. බැඳෙන්නේ නැත්නම් සිහි මුලාවෙන්නේ නැහැ. එහෙම වුණොත් ආදීනව දකින්න පුළුවන්. එහෙම දැක්කොත් මොකද වෙන්නේ? පංච උපාදානස්කන්ධය අපචයට යනවා. රැස් වෙන්නේ නැහැ. දැකපු දේ ඉතුරු වෙන්නේ නැහැ. නිරුද්ධයි. අහපු දේ ඉතුරු වෙන්නේ නැහැ, නිරුද්ධයි.

ඒකයි, හටගෙන නැති වෙනවා කියන මට්ටමට - ***යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං*** - කියන දර්ශනය කියන්නේ, දර්ශනය අයිති ඔතෙන්ට. ඔතෙන්ට තමයි **විරජං වීතමලං ධම්ම චක්ඛුං** - කෙළෙස් රජස් නැති කෙළෙස් මල නැති පිරිසිදු දහම් ඇස, කියලා කියන්නේ ඔතෙන්ට. එතන සම්පූර්ණ පිරිසිදුයි. ඉතුරු වෙන්නේ නැහැ කිසිම වෙලාවක. එහෙම වුණොත් පංච උපාදානස්කන්ධය අපචයට යනවා. ඒ විතරක් නෙමෙයි නැවත ප්‍රතිසන්ධියට යන්න, තණ්හාවට නිමිති හිටින්නේ නැහැ. තණ්හාව ප්‍රහීණ වෙනවා. දුක් දොම්නස් දෙක මේ ජීවිතයේම විඳින කෙනෙක් වෙන්නේ නැහැ. සැප විඳින්නෙක් වෙනවා, කියන ටික ඔක්කොම වෙලා.

ඔය දර්ශනය හාත්පස එළඹ සිටින තැනට කියනවා, අනුපාදා පරිනිර්වාණය. ඔය දර්ශනයට අනුපාදා පරිනිර්වාණය කියනවා නෙවෙයි. ඕකට තමයි යථාභූත ඥාණ දර්ශනය කියන්නේ. ඒ ඇත්ත දැක්කහම කළකිරිලා, නොඇලිලා, මිදෙනවා කියන එකට වෙන වැඩ සටහනක් ඕනේ නැහැ. ඉබේම වෙනවා. ආස්‍රවයන්ගෙන් හිත මිදෙනවා, කෙළසුන්ගෙන් හිත මිදෙනවා, ලෝකයෙන් මිදෙනවා කියන එක වෙන්නේ ඉබේමයි. එතකොට රහතන් වහන්සේ කියලා කියනවා.

මම හැමවෙලේම මතක් කළේ ඕක තමයි 'සම්මා දිට්ඨිය'. ඔතැන තමයි 'නිෂ්ඨාව' ඔතැන දක්වා විතරයි අපිට කරන්න පුළුවන්. අපිට කරන්න තියෙන්නේ. එතැනින් පස්සේ මිදෙනවා කියන ටිකත්, ඉතුරු ස්කන්ධ ටික නිරුද්ධ වෙලා පිරිනිවන් පානවා කියන ටිකත් සිදුවෙන ධර්මතා. ඒවා කරගන්න බැහැ, කරන්න බැහැ, වෙන්න ඕනේ ඒවා 'වෙනවා'. එතකොට මෙන්න මේ සම්මා දිට්ඨිය සම්පාදනය කරගන්න තැනට අපට කටයුතු කළ හැකියි.

ඔන්න දැන් ඕක තමයි නිවන් දකිනවා කියනකොට ඇත්ත. මේ දර්ශනයට කියන්න වෙනවා තව වචනයක්, මොකක්ද 'නිවන' කියලා. මේ දර්ශනය නිවන හින්දා නෙවෙයි, දැන් මේ දර්ශනය තමයි, ස්කන්ධයෝ පිරිසිඳ දකිනවා, දුක පිරිසිඳ දැක්කා දුක්වූ පංච උපාදානස්කන්ධයෝ පිරිසිඳ දැක්කා කියනවා. දකින කොට, අවිද්‍යා, තණ්හා කියන කෙළෙස් ටික ප්‍රහානය වෙනවා. ඒ කියන්නේ, **මේ ආයතන ටික පිරිසිඳ දැක්කහම, ඒවා තියෙන දේවල් හැටියට, පුද්ගලයෙක්ගේ දේවල්, කෙනෙක්ගේ දේවල් කියන කෙළේසයය දුරු වෙනවා, දුරු වුණහම, ඒ කෙළස් ටික නිසා පුද්ගලයෙක්ගේ දේවල්, සත්වයෙක්ගේ දේවල්, ඇති දේවල් නිසා එන දුක නැති වෙනවා.**

ඒ විදිහට කටයුතු කරන එකම - 'මාර්ගය' කියලා, මේ දුක පිරිසිඳ දකින කොටම සමුදය දුරු වෙනවා, දුක්ඛ නිරෝධය සාක්ෂාත් වෙනවා, මඟ වැඩෙනවා කියන ධර්මතා හතරම එකට තියෙනවා, ඔය යථාභූත ඥාණ දර්ශනයේ පිහිටන කොට.

දුක පිරිසිඳ දකිනවා කියන වචනය කියන්න පුළුවන් ඔතෙන්ට විතරයි. ඔතැනට තමයි දුක පරිඣේදයියයි කියලා කව්වේ, ඔන්න ඔය මට්ටම දකින එකට. අපිට අද දවසෙදි දුක කියලා යමක් තියෙයි නම්, ඒ දුක ආපු රූපය පිරිසිඳ දකින්න. දුක කියන එක පිරිසිඳ දකින මට්ටමට ආවහම, ඒ රූපය අරභයා තියෙන කෙළෙස් ටික සම්පූර්ණයෙන් ප්‍රහානය වෙනවා. පුද්ගලභාවයක්, සත්වභාවයක් තියෙනවා නම්, නිත්‍ය සංඥාවක්, ආත්ම සංඥාවක්, සුභ සංඥාවක්, සුඛ සංඥාවක් තියෙයි නම්, මේවා ඔක්කොම ප්‍රහානය වෙනවා.

එතකොට, නිත්‍ය සංඥා, ආත්ම සංඥා, සුභ සංඥා, සුඛ සංඥාවල් නිසා එන දුක් ටික නැහැ **කෙනෙක් නැති වීමෙන්, කෙනෙක් මැරීමෙන්, පුද්ගලයෙක් මැරීමෙන් එන දුක් ටික නැහැ. දුක්ඛ නිරෝධය සාක්ෂාත් වෙනවා මේ ජීවිතයේම.**

ඔතෙන්ට තමයි චතුරාර්ය සත්‍යය අවබෝධ වෙනවා, සම්මා දිට්ඨිය කියලා කිව්වේ. එතකොට සසර ගමන අවසන්. මතු කට යුත්තක් නැහැ කියන තැනට එනවා.

★ ලෝකයෙන් එතෙර වීමට ඉවහල්වන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ධර්මතාවයෝ

දැන් ඔය ටික අපි දන්නවා, අපි දැනගත්තා, දැනගත්තට අපිට තවම පෙනෙන්නේ නැහැ. ඔය මට්ටම අපේ මනසේ එළඹ සිටින්නේ නැහැ. දැන් ඔතෙන්ට යන්න අපට ගමන් මාර්ගයක් ඕනේ, නේද? ඒකට තමයි **'භාවනාව'** කියලා කියන්නේ. දැන් ඔහොම ඉගෙන ගත්ත කෙනාටයි භාවනාව කියලා එකක් තියෙන්නේ.

එතෙන්දි, සීල, සමාධි, ප්‍රඥා කියලා ත්‍රිශික්ෂාවක් එකතු වෙනවා. අර කතා කරපු ටිකට 'පිරිසිදු ලෝකෝත්තර මාර්ගය' කියලා කියන්නේ, 'ලෝකෝත්තර ඥාණ දර්ශනය' කියලා කියන්නේ. ඒ ලෝකෝත්තර ඥාණය එල්බගෙන, බලාගෙන, අරමුණු කරගෙන, ඊට මෙහා උපදින ධර්මතා ටිකට කියනවා 'පූර්වභාග ප්‍රතිපදාව' කියලා. ඒකත් සීල, සමාධි, ප්‍රඥාමයි. හැබැයි මේකට කියනවා 'මග්ගාරම්මන' කියලා. මාර්ගය අරමුණු කරගෙන තියෙන්නේ.

මෙතැනදිත් අපි හිතලා සිල්වත් වෙන්න ඕනේ. අර ලෝකෝත්තර දර්ශනයෙදි සීල, සමාධි, ප්‍රඥා තියෙයි. හැබැයි එතැනදි හිතලා සිල්වත් වෙන්න ඕනේ නැහැ. දර්ශනයට සීලය එනවා. හිතලා සමාධි ගන්න ඕනේ නැහැ. සමාධි වඩන්න ඕනේ නැහැ. දර්ශනයට සමාධිය එනවා. සම්මා දිට්ඨිය තියෙන කොට. ඊට අනුව ඉතුරු අංග හතම එතැන උපදිනවා. එච්චරට ප්‍රබලයි එතැන.

නමුත් ඒ දර්ශනය තියෙන තැනකදි එතෙන්ට එන්න, ඊට මෙහා දැන් ඔය ටික දැනගෙන, ඔය ටික තමා සන්තක කර ගන්න, දකින තැනට යන්න, අපිට ප්‍රතිපදාවක් තියෙනවා.

අපි කියමු, **ජානං පස්සං**, - දැන් මේ පින්වතුන් ගිහිල්ලා නැත්නම් ලංකාවේ ලැබුනෝරුව ආරණ්‍යය කියලා සේනාසනයක් තියෙනවා. ඒක මෙන්න මෙහෙමයි, මෙහෙමයි කියලා මම විස්තර ටිකක් කිවුවොත්, ඔය පින්වතුන් දැන් **ජානං** - දන්නවා. කලින් මේ ටික මගෙන් අහගත්තේ නැත්නම්, ***අජානං, අපස්සං*** - දන්නෙත් නැහැ, දැකලත් නැහැ. දැන් මම කිවුවොත් මෙහෙම මෙහෙම සේනාසනයක් තියෙනවා කියලා, ඔය පින්වතුන් දැන් **ජානං** - දන්නවා. නමුත් ***අපස්සං*** - දකින්නේ නැහැ. ඊට පස්සේ ඔය පින්වතුන්ට තියෙනවා, කොහොමද එතෙන්ට යන්නේ කියලා අහගන්න. අහගත්තත් පෙනෙන්නේ නැහැ. ඊට පස්සේ **ඔය පින්වතුන් යන්න ඕනේ. ගියහම පෙනෙනවා, පෙනුනහම, ඒ පෙනීම නිසා සිතීම, කීම්, කිරීම් කරන්නේ ඔය පින්වතුන් මිසක, මගෙන් දැන ගත්ත දේ උදව් වෙන්නේ නැහැ. අත හැරෙනවා** එතෙන්ට යන කල්ම, මගෙ දැනුමෙන් තමයි යන්නේ.

ඒ වගේ, අපට කල්‍යාණ මිත්‍ර උදව්ව උපකාරය ඕනේ **ජානං, පස්සං**, දැන ගන්නත්, ඒක දකින තැනට යනකල්ම ප්‍රතිපදාවටත්. දකින තැනට ගියාට පස්සේ, මේ ලෝකයේ ඇත්ත මෙන්න මේකයි, මෙතෙන්ට ආවහම දුක නැති වෙනවා කියලා ඔය පින්වතුන් කියන්නේ, බුදුරජාණන් වහන්සේ කියපු හින්දාවත් නෙමෙයි. තව කාගෙන්වත් අහලවත් නෙමෙයි. එදාට ඔය පින්වතුන්ගේ දර්ශනයමයි කියන්නේ. මොකද එයා සත්‍යය අවබෝධයක් කරගත්ත නිසා. ඇත්ත ඇති හැටියෙ අවබෝධ වුණා එයාට, ඒ නිසා.

එතකොට, එතෙන්ට යනකල් මෙහා ටිකේදි සීලය හිතලා ගන්නට ඕනේ. පන්සිල් හරි පෝය අටසිල් හරි. හිතලා සමාධි වඩන්නට ඕනේ. හිතලා විදර්ශනා කරන්නට ඕනේ.

'විදර්ශනාව' කියන කොට මෙතෙනදි අයිති වෙන්නේ ලෞකික ඥාණයක්. අනිත්‍ය වශයෙන් හෝ දුක් වශයෙන් හෝ අනාත්ම වශයෙන් හෝ මෙනෙහි කරන්න ඕනෙ, මෙන්න මේ ටිකේදි. අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, අනාත්ම වශයෙන්, අසුභ වශයෙන්.. ඒකද, අනිත්‍යයි-දුකයි වශයෙන්, දුකයි-අනිත්‍යයි වශයෙන්, අනාත්මයි-දුකයි වශයෙන්, අනිත්‍යයි-අනාත්මයි වශයෙන්, මෙහෙම මාරුවෙන් මාරුවට කරන්න පුළුවන් මේ ත්‍රිලක්ෂණය. මේ ත්‍රිලක්ෂණය කියලා කියන්නේ, මේකට 'නිවන් මග' කියන්නේ. මේ හරහා නැතුව යන්න ක්‍රමයක් නැහැ. මේකට 'විමුක්ති මුඛ' කියලත් කියනවා. **ලෝකයේ කිසිම කෙනෙක් මේ ධර්මතා තුන නැතිනම් කවදාවත් ලෝකය අතහරින්න කැමති වෙන්නේ නැහැ. ලෝකය අනිත්‍ය දෙයක්, දුක් දෙයක්, අනාත්ම දෙයක් කියලා දැක්කොත් තමයි ලෝකයෙන් එතෙර වෙන්න කැමති වෙන්නේ. එහෙම කෙනාටයි හිත සමාධි වෙන්නේ, නීවරණ ධර්ම දුරු වෙන්නේ.** එහෙම කෙනාටයි මේ ඇත්ත දකින්න පුළුවන් වෙන්නේ.

එතකොට, මම ඔය පින්වතුන්ට මතක් කළා, **මේ දර්ශනය කියන එක අනිත්‍ය, දුක්ඛ, අනාත්ම කියන මට්ටම නෙමෙයි කියන එක. මේ ඇත්ත, ඇති හැටියෙ පවතිනවා කියන එක දර්ශනයක්. ඒකට ආගමක්, පක්ෂයක්, පන්තියක්, භේදයක් නැහැ.**

දැන් ඉන්දියාවේ ක්‍රිෂ්ණ මූර්ති ගන්න එයා කතා කරන දේ දර්ශනයක් දකින්න. ඒක ආගමක් අදහන්න දෙයක්, වන්දනා කරන්න දෙයක් එහෙම නෙමෙයි. නුවණින් ඕනෙම කෙනෙකුට දකින්න පුළුවන්. ඒකට පක්ෂයක්, පන්තියක්, කුලයක්, භේදයක් නැහැ.

ඒ වගේ බුදු දහමේ මෙන්න මේ කොටස මනෝ විද්‍යාවක්. දර්ශනයක්. ඉතාමත් සියුම්, ඉතාමත් තියුණු, ඉතාමත් ගැඹුරු දර්ශනයක්. ඕකට ආගමක්, පක්ෂයක්, පන්තියක්, කුලයක්, භේදයක් මුකුත් නැහැ. කාටත් එකයි **ඕනෙම කෙනෙකුට, ආගම් රාමුවකින් තොරව, කෙනෙකුට, ඕනෙම ආගමක, තමන්ගේ ආගම අතහරින්නේ නැතුව, තමන්ගේ ශාස්තෘවරයා ශාස්තෘවරයාම කරගෙන තියෙද්දි, කැමති නම් මේ දර්ශනය බලන්න කියන්න. බැලුවට පස්සේ එයාට ඒක ඇත්තයි, එයා ඒක පිළිගන්නවා. පිළිගැනීමටම බෞද්ධයෙක් වෙනවා. එයිට මෙහා අදහන්නවත් ඕනේ නැහැ, දර්ශනයක් මේක.**

එතකොට එතෙන්ට එන්න තියෙන මාර්ගයේදි තමයි අනිත්‍ය වශයෙන් දුක් වශයෙන්, අනාත්ම වශයෙන් බැලිය යුත්තේ. මෙනෙහි කළ යුත්තේ, අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් බලනකොට, අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් පෙනෙනවා. ඒ පෙනීම මේ යථා භූත ස්වභාවය නෙමෙයි. අපි ළඟ තියෙන නිත්‍යයි, සැපයි, ආත්මයි, සුභයි කියන විපල්ලාසය, කෙළෙසය ගෙවා ගන්නයි අපි අනිත්‍යයි, දුකයි, අනාත්මයි, අසුභයි කියලා බැලුවේ. **අනිත්‍යයි, දුකයි, අනාත්මයි, අසුභයි කියලා දැකපු හින්දයි අපි ඒවයේ ඇලුනේ නැත්තේ.** ඇලුනේ නැති හින්දා ඒ මට්ටමේදි තමයි නීවරණයන් ගෙන් හිත මිදෙන්නේ. කෙළෙසුන්ගෙන් හිත මිදෙන්න, ඒ මට්ටමෙන් මිදෙන හින්දායි හිත සමාධි වෙන්නේ, හිත සමාධි වුණහම යථාභූත ස්වභාවයම පෙනෙනවා. ඒ පෙනීමට තමයි 'අනුශයම' නැති වෙන්නේ.

මම ඒක මේ පින්වතුන්ට මගෙ අදහසක් හැටියට නෙමෙයි. පිටකයේ තියෙන අර්ථයයි කියලා පෙනෙන්න, මම පිටකයත් අරගෙන ආවා. අපි පෙළ දහමම කථා කරමු. එතකොට ඔය පින්වතුන්ට මේක තවත් සහේතුක වෙයි.

මොකද අද, ලෝකයේ ගොඩාක් කථා කරන්නේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම කියන මේ ත්‍රිලක්ෂණයමයි දකින්න බලන්න තියෙන්නේ, අන්තිමට ඕක දකින්නමයි තියෙන්නේ කියන එකනේ. අපි මෙහෙම බලමු. මේක තියෙන්නේ ත්‍රිපිටක ධර්මයේ, ඛුද්දක නිකායේ පටිසම්භිදා මග්ගයේ, 19 වෙනි ඥාණය, විස්තර කරන තැනදි ගොඩක් තැන්වල තියෙනවා, මම මේ එක තැනක් උපුටලා ගත්තේ. ධම්ම නානත්ව ඥාණය. මේකෙදි, උඩ

කොටස අතහැරලා මම මතක් කරන්නම්.

නව පාමොජ්ජ මූලිකා ධම්මා - ප්‍රමෝදය මුල් කරගෙන ඇති ධර්මතා නවයක් තියෙනවා ඒක ඇති වෙන හැටි පෙන්වනවා.

✶ ✶ ✶

අනිච්චතො මනසිකරොන්තො - ඔන්න අනිත්‍යයි කියලා මෙනෙහි කරන කොට, ***අනිච්චතො මනසිකරොන්තො පාමොජ්ජං ජායති*** - අනිත්‍යයි කියලා මෙනෙහි කරනකොට, ප්‍රමෝදය උපදිනවා. ***පමුදිතස්ස පීති ජායතී*** - ප්‍රමෝදය නිසා ප්‍රීතිය උපදිනවා, ***ප්‍රීති මනස්ස කායො පස්සම්භති*** - ප්‍රීතිය ඇති කල්හි කය සංසිඳෙනවා. ***පස්සද්ධ කායො සුඛං වෙදේති*** - කය සන්සිඳුනහම කයෙන් සැප විඳිනවා. ***සුඛිනො චිත්තං සමාධියති*** - සැප ඇත්තහුගේ හිත සමාධි වෙනවා. ***සමාහිතෙ චිත්තේ යථාභූතං ජානාති,*** පස්සාති - හිත සමාධි වුණහම යථා භූත ස්වභාවය දන්නවා, දකිනවා. අන්න අපි කිව්වා නේ ***ජානං පස්සං යථා භූතං*** කියලා. ඉතින් ඕක නොදන්න නිසානේ අපි ආවේ, ***අජානං අපස්සං යථා භූතං*** හින්දා නේ අපි සසරට ආවේ.

එතකොට, ***සමාහිතෙ චිත්තෙ*** - හිත සමාධි වුණහම ***යථාභූතං ජානාති පස්සාති*** ඔන්න දන්නවා, දකිනවා. දැන් අපි ඉගෙන ගත්ත යථාභූත ස්වභාවය, ඒ හිත සමාධි වීමටයි දන්නේ, දකින්නේ. ***යථාභූතං ජානං පස්සං නිබ්බින්දති*** ඇත්ත ඇති හැටියේ දන්නේ, දකින්නේ කළකිරෙනවා. ***නිබ්බිදා විරජ්ජති*** කළකිරීමෙන් නොඇලෙනවා. ***විරාගා විමුච්ජති*** - නො ඇලීමෙන් මිදෙනවා. විමුක්තිය දක්වා පෙන්නනවා. මිදුණහම, මිදුණා කියන ප්‍රත්‍යවේක්ෂා නුවණක් පහළ වෙනවා. ඒකට තමයි අපි අර කියන්නේ, ***ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං*** - ජාතිය ක්ෂය විය. දැන් බ්‍රහ්මචරියාව ඉවරයි. ඒ කියන්නේ භාවනා කරලා දැන් ඉවරයි මතු කට යුත්තක් නැහැ. කළ යුත්ත කළා කියලා 'අරිහත් ඵල ප්‍රත්‍යවේක්ෂා ඥාණය' උපදිනවා.

දැන් ඔය පින්වතුන්ට මම මෙතැනදී මතක් කළේ අනිත්‍යයි කියලා මෙනෙහි කිරීම නිසා අනුපිළිවෙලින්, නීවරණ ධර්ම දුරු වෙලා, හිත සමාධි වෙලා, දැන් ඔය අනිත්‍යයි කියලා බලන්නත් අපි සමථයක් උදව් කරගෙන හිත සමාධි කරනවා, 'ඒ සමාධිය නෙමෙයි මේ' දැන් මේ සීලය තුළත් පුද්ගලයා ඉන්නවා. මේ සමාධිය වඩන එක තුළත් පුද්ගලයා ඉන්නවා. මේ අනිත්‍යයි, දුකයි, අනාත්මයි කියලා මෙනෙහි කරන ක්‍රියාව තුළත් පුද්ගලයා ඉන්නවා. තවම මේවා පුද්ගලභාවයෙන් වෙන්නේ.

මේ ටික කරනකොට, නීවරණ ධර්ම දුරු වෙනවා, නීවරණ ධර්ම දුරු වුණහම ප්‍රමෝදය එනවා. ඔය ටික කළහම ප්‍රමෝදය කියන තැනටයි එන්නේ. ප්‍රමෝදය කියන තැනදී, ප්‍රමෝදය නිසා, නීවරණ ධර්ම දුරු වුණු නිසා ප්‍රමෝදය මිසක, ප්‍රමෝදය අරගත්ත එකක් නෙවෙයි. පුද්ගලයා නැහැ හේතු ප්‍රත්‍යයයි ප්‍රමෝදය. ප්‍රමෝදය නිසා ප්‍රීතිය - හේතු ප්‍රත්‍යයි. ප්‍රීතිය නිසා පස්සද්ධිය-හේතු ප්‍රත්‍යයි. පස්සද්ධිය නිසා සැපය-හේතු ප්‍රත්‍යයි. සැපය නිසා සමාධිය-හේතු ප්‍රත්‍යයි, සමාධිය නිසා මේ ඥාණ දර්ශනය. ඇත්ත දැක්කා.

හැබැයි, හිත වඩන ඔක්කොම අය ඇත්ත දකින්නේ නැහැ. ඒකයි, හොඳට මතක තියාගන්න ඕනේ, ***ජානං පස්සං*** - දන්න දේ දකිනවා. එතකොට මේ ටික ඉස්සෙල්ලා ඉගෙන ගෙන තියෙන්න ඕනේ. මෙයාගේ ආරම්භයක් තියෙනවා එතකොට. **ආරම්භයේ ඉඳලා මේ ඥාණ දර්ශනය ඝටිතවයි මේ සීල, සමාධි, ප්‍රඥා තියෙන්නේ.**

ඒ කියන්නේ, 'මෙහෙම ධර්මතාවයක් දකින්නයි යන්නේ' කියන කාරණාව තියෙනවා මුල ඉඳලා. මෙයා හිත වඩන ගානේ, සමාධිය වඩන ගානේ, විදර්ශනා කරන ගානේ, අළුත්වැඩියා වෙන්නේ අර දර්ශනය.

එතකොට, අපි මෙතැන ඉඳලා 'ඇඩිලේඩ්' වලට යන්න ඕනේ කියලා යනකොට, අතරමගදී මොනවා හරි දේවල් ගස්, ගොඩනැගිලි පෙනෙන්න පුළුවන්. පෙනුනට, තමන් දන්නවා, පාරට ආවෙ මේවා බලන්න නෙවෙයි නේ. අහවල් තැනටයි යන්න ඕනේ කියන එකට. එතකොට ඒ දේවල් දැක්කා කියලා, ඒ දේවල් එක්ක ගනුදෙනු කළා කියලා තමන් නතර වෙන්නේ නැහැ.

ඒ වගේ, සීලය නිසා, සමාධිය නිසා, විදර්ශනාව නිසා යම් යම් ගති වෙනස්කම් තමන්ට ඇති වෙන්න පුළුවන්. නමුත් ඇති වුණා කියලා ඒකෙ සතුටු වෙන්නේ හෝ එතැන නතර වෙන්නේ හෝ දැන් මම යමක් කර ගත්තා කියලා එහෙම ඉන්නේ නැහැ. මොකද ඒ යන්න ආපු ගමන් මාර්ගයෙ ඇති වුණු යම් යම් සංසිද්ධි ටිකක් විතරයි. තමන් දන්නවා මේ වගේ තැනකටයි යන්න ආවේ, තවම එතෙන්ට ගියේ නැහැ කියලා, නේද?

එතකොට, ඔන්න දැන් අනිත්‍යයි කියලා මෙනෙහි කිරීමෙන්, ඇත්ත දැකලා, ආශ්‍රවයන්ගෙන් මිදෙන්න පෙන්නුවානේ. දැන් ඔය පින්වතුන් දෙපොළක් දැක්කා නේද මෙතෙන්දි ***අනිච්චතො මනසිකරොන්තො පාමොජ්ජං ජායති*** - අනිත්‍යයි කියලා මෙනෙහි කරන නිසායි ප්‍රමෝදය ඇති වුණේ. ඊට පස්සෙනේ හිත සමාධි වෙලා ඇත්ත දැක්කේ. ***යථාභූතං ජානං පස්සං කියලා සමාහිතේ චිත්තේ යථාභූතං ජානං පස්සං*** හිත සමාධි කල්හි, ***යථා භූතං ජානං පස්සං*** - ඇත්ත ඇති හැටියෙ දකිනවා.

අර සූත්‍රයෙ පෙන්නුවා නේ - ***ජානං පස්සං යථාභූතං, චක්ඛුං භික්ඛවේ ජානං පස්සං යථාභූතං, රූපා භික්ඛවෙ ජානං පස්සං යථාභූතං*** කියලා පෙන්නුවානේ ඒ යථාභූතයම මිසක මේ කිව්වේ, වෙන එකක් එහෙම නෙවෙයි. එතකොට, ඒ ඇහේ ඇත්ත ඇති සැටියේ දන්නවා, දකිනවා කියන තැනටයි ආශ්‍රවයන් ගෙවෙන්නේ. මගෙ අදහසක් කියනවා නෙමෙයි කියන එකයි මේ කියන්නේ.

✶ ✶ ✶

ඊට පස්සේ ආපහු පෙන්නනවා - ***දුක්ඛතො මනසිකරොන්නො - අක්ඛතො මනසිකරොන්තා පාමොජ්ජං ජායති පමුදිතස්ස පීති ජායති, පීති මනස්ස කායං පස්සම්භති, පස්සද්ධ කායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති, සමාහිතෙ චිත්තේ යථාභූතං ජානාති පස්සති. යථාභූතං ජානං පස්සං නිබ්බින්දති, නිබ්බිද්දි විරජ්ජති, විරාගා විමුච්චති.***

දුකයි කියලා මෙනෙහි කරන කොට ප්‍රමෝදය උපදිනවා. ඉස්සෙල්ලා අනිත්‍යයි කියලා මෙනෙහි කරනකොට, දැන් දුකයි කියලා මෙනෙහි කරන කොට ප්‍රමෝදය උපදිනවා. ප්‍රමෝදය නිසා ප්‍රීතිය, ප්‍රීතිය නිසා පස්සද්ධිය, පස්සද්ධිය නිසා සැපය, සැපය නිසා සමාධිය, සමාධිය නිසා ඔන්න ඇත්ත ඇති හැටියෙ පෙනෙනවා.

එකම වැවකට බහින්න තොටු පොලවල් රාශියක්. **සම්මා දිට්ඨිය, ඇත්ත දකිනවා කියලා එකම තැනට එන්න පාරවල් ගොඩයි.** නමුත් වැව් ගොඩක් නැහැ. ඇත්තවල් ගොඩක් නැහැ, සත්‍යවල් ගොඩක් නැහැ, දකින්න තියෙන ඇත්තවල් ගොඩක් නැහැ, කොයි පැත්තකින්, කොයි පාරකින් ආවත් දකින්න තියෙන ඇත්ත එකයි. ඒ ඇත්ත දැකීම නිසා ආශ්‍රව දුරුවෙනවා මිසක, ආශ්‍රව දුරු වෙලා දුක්ඛ නිරෝධය සාක්ෂාත් වෙනවා මිසක,

වෙන ක්‍රමයක් නැහැ. ඒකට කිව්වේ චතුරාර්ය සත්‍යය අවබෝධ වුණා කියලා. මේ මාර්ගය වඩන එකට කියනවා චතුරාර්ය සත්‍යය අවබෝධ වෙනවා කියලා, මොකද මාර්ගය විතරනෙ ඔතන. දැන් ඕකෙ මොකක්ද චතුරාර්ය සත්‍යය කියලා තියෙන්නේ. මේ ටික කළහම චතුරාර්ය සත්‍යය අවබෝධ වෙනවා කියලා කියන්නේ, දුක පිරිසිඳ දකිනවා, සමුදය දුරු වෙනවා, නිරෝධය සාක්ෂාත් වෙනවා, මග වැඩෙනවා, කියන කාරණා හතර වෙනවා අර ඇත්ත දකිනකොට. එතකොට මත්තේ කළ යුත්තක් නැහැ.

✶ ✶ ✶

ඉස්සෙල්ලා අනිත්‍ය වශයෙන් මෙනෙහි කරමින්, ඊට පස්සේ දුක් වශයෙන් මෙනෙහි කිරීමෙන්, දැන් ***අනත්තතෝ මනසිකරොන්තෝ පාමොජ්ජං ජායති*** - අනාත්මයි කියලා මෙනෙහි කරනකොට ප්‍රමෝදය ඇති වෙනවා. ඊට පස්සේ එකක් එකක් ගානෙත් තියෙනවා.

රූපං අනිච්චතො මනසිකරොන්තො පාමොජ්ජං ජායති, රූපං දුක්ඛතො මනසිකරොන්තො පාමොජ්ජං ජායති, රූපං අනත්තතො මනසිකරොන්තො පාමොජ්ජං ජායති වේදනා අනිච්චතො මනසිකරොන්තො පාමොජ්ජං ජායති, වේදනා දුක්ඛතො මනසිකරොන්තො පාමොජ්ජං ජායති, වේදනා අනත්තතො මනසිකරොන්තො පාමොජ්ජං ජායති ... කියලා එකින් එක, එකින් එක. ආපසු ඇහැම වුණත් ගන්න පුළුවන්. ඇහැ අනිත්‍යයි කියලා මෙනෙහි කරනවා, ඇහැ දුකයි කියලා මෙනෙහි කරනවා, ඇහැ අනාත්මයි කියලා මෙනෙහි කරනවා, එතකොට ප්‍රමෝදය ඇති වෙනවා. ප්‍රමෝදය නිසා ප්‍රීතිය, ප්‍රීතිය නිසා පස්සද්ධිය, පස්සද්ධිය නිසා සැපය, සැපය නිසා හිත සමාධි වීම, සමාධිය නිසා ඇහේම ඇත්ත දකිනවා, කියලා යථාභූතයට එනවා.

එතකොට මම මෙතෙන්දි මතක් කළේ මේ පින්වතුන්ට, අපි ඉස්සෙල්ලා ඇත්ත දැනගන්න ඕනෙමයි. මේ ඇත්තෙදි ආයෙ අඩු කරන්නවත්, වැඩි කරන්නවත්, මටවත් තව කාටවත් ඕනෙ විදිහට වෙනස් කර කර, හරව හරවා, හිතුන හිතුන විදිහේ, හිතුන හිතුන පැති වලින් බලනවා කියලා එකක් නැහැ. සත්‍යය සත්‍යයමයි.

නමුත් ඔය සත්‍යය දකින තැනට එන්න මාර්ග, ක්‍රම බොහෝ ඇති. විදර්ශනාව ගත්තොත් කෙනෙකුට අසුභ වශයෙන් මෙනෙහි කරන්න පුළුවන්. අසුභ වශයෙන් මෙනෙහි කරන කොට, ***පාමොජ්ජං ජායති*** - ප්‍රමෝදය උපදිනවා, ප්‍රමෝදය නිසා ප්‍රීතිය. මේ

නීවරණ ධර්ම ටික දුරු කරන තැනට විතරයි ඔය ටික තියෙන්නේ. ඔය පූර්වභාග ප්‍රතිපදාව තියෙන්නේ. එතකොට, සීලයක පිහිටන්න. සමථ කමටහනකින් සමාධි වඩමින් අනිත්‍ය වශයෙන්, රූපය හෝ වේදනාව හෝ සංඥාව හෝ සංඛාරය හෝ විඤ්ඤාණය හෝ, කුමන ධර්මතාවයක් හෝ අනිත්‍ය වශයෙන් හෝ දුක් වශයෙන් හෝ අනාත්ම වශයෙන් හෝ අසුභ වශයෙන් හෝ මෙනෙහි කළොත්, එහෙම මෙනෙහි කර කර හිත වඩනවා, හිත වඩමින් මෙනෙහි කරනවා. සීලයක පිහිටලා ඉන්නවා පිහිටලා ඉඳගෙන සමථ කමටහනකින් හිත වඩමින් අනිත්‍ය දුක්ඛ, අනාත්ම වශයෙන් මෙනෙහි කරනවා.

මේ විදිහට මාරුවෙන් මාරුවට නුවණින් මෙනෙහි කරමින් විදර්ශනා කරනවා. විදර්ශනා කරමින් සමථ කමටහනක් වඩනවා. මේ ටික කරන කොට ටික ටික ටික ටික රළු මට්ටමේ කෙළෙස්, ගෙවල් දොරවල්, දූ දරුවෝ, ඥාති හිතෛෂීන් කියලා, ඕවා ටික ටික කැපි කැපි කැපි කැපි ස්කන්ධයන් ටික ටික පිරිසිඳ දැකලා, නීවරණ ධර්ම දුරුවෙන මට්ටමක් එනවා.

එහෙම වෙනකොට, තමන්ගේ මනස සුවපත් වෙනවා දැකලා, නීවරණ ධර්ම ඇලීම් ගැටීම් තමන්ගේ මනසේ නැහැ කියලා තමන්ම දකින කොට තමන්ට ප්‍රමෝදය කියන එක උපදිනවා. ඒ ප්‍රමෝදය නිසාම ප්‍රීතිය, ප්‍රීතිය නිසාම පස්සද්ධිය කියලා දැන් ධර්මතා ටිකක් විතරයි.

මෙතන්දි, සීල, සමාධි, ප්‍රඥා කියන මේ ධර්මතා ටික විතරයි උත්සාහයෙන් කළ යුත්තේ, මෙහෙම කරන කෙනා, ප්‍රමෝදය ලැබේවා කියලා ප්‍රාර්ථනාවක් ඕනේ නැහැ කියනවා. ඕකෙදි පෙන්නනවා 'චේතනා කරණීයෙන් තොරයි' මේ ධර්මය. 'චේතනා කරණායෙන්' කියන්නේ 'සිතීමෙන් තොරයි' , 'මට මේ ධර්මතාවය ලැබේවා' කියලා ප්‍රාර්ථනා කරන්න ඕනෙ නැහැ. උත්සාහයෙන් ලබා ගන්න පුළුවන් එකකුත් නෙවෙයි. ප්‍රමෝදය කියන එක ගන්න පුළුවන් එකකුත් නෙවෙයි. හැබැයි ප්‍රමෝදය ලැබෙන වැඩ පිළිවෙලක ඉන්න පුළුවන් සීලයක පිහිටලා, සමථ කමටහනක් වඩමින්, නුවණින් මෙනෙහි කරන ටික විතරයි අපට කරන්න පුළුවන්.

සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො, චිත්තං පඤ්ඤංච භාවයං - සීලයක පිහිටලා, නුවණැති කෙනෙක් සමථ විදර්ශනා වඩයි නම් එතකොට මේ විදිහට කටයුතු කරන්න පුළුවන්.

මේ ටික කරන කොට, නීවරණ ධර්ම තමයි දුරු වෙන්නේ, නීවරණ ධර්ම දුරු වෙන්න, දුරු වෙන්න, තමන් තුළ මේ ඇලීම් අඩු වෙනවා. බැඳීම් අඩු වෙනවා. ඇලීම් බැඳීම් අඩු වෙන කොට, ඊට සමගාමීව පවතින ගැටීම අඩු වෙනවා. දොම්නස, කායික,

මානසික දුක, ටික ටික ටික ටික තුනී වෙලා යනවා. **නීවරණ ධර්ම අඩු වෙන්න, අඩු වෙන්න 'පුද්ගලයා' කියන තැන බොහොම ලිහිල් වෙනවා. මේ වගේ රළු මට්ටමක් හිටින්නේ නැහැ.**

එතකොට, තමන් සුවපත් වුණා කියලා දකිනකොට තාම පුද්ගලභාවය තියෙනවා, පුද්ගලයා තමයි සුවපත් වෙලා ඉන්නේ මෙතෙන්දි, නරක දේ වෙනුවට හොඳ දේ තියෙනවා. **හැබැයි තවමත් 'කෙනා' ඉන්නවා. මොකද, අනිත්‍යයි කියලා 'බලපු නිසා' ඒකෙ ප්‍රතිඵල ටිකක් එතකොට 'බලන්නා' ඉන්නවා ඉබේම.** ඒක නැති කරන්න බැහැ මේ මට්ටමේදි? දුකයි කියලා බලපු නිසායි, බලන්නා ඉන්නවා මේ ටිකේ එතකොට, මේ විදිහට කළහම රළු මට්ටමේ නීවරණ ධර්ම අඩු වෙනවා. ඊට පස්සේ සියුම් මට්ටමේ කෙළෙස් උපදිනවා.

තව දුරටත් කරන කොට ඒ මට්ටම අඩු වෙනවා. ඊට පස්සේ, අපි කියනවා ඔය **උපචාර මට්ටමේ සමාධි** කියලා.

ඊට පස්සේ ඒ මට්ටමේ සමාධිය එක්ක තියෙන කෙළේසයක් උපදිනවා. ඒකෙදිත් අපට කරන්න බොහෝ දේ නැහැ. එකම ටිකයි කරන්න තියෙන්නේ. අර ටිකම ආපහු, ඒ හම්බ වෙන ගතියක් තියෙනවා නම්, ඒක කරන කොට ඇති වුණු ප්‍රතිඵලයක් තියෙනවා නම්, ඒක නොසලකා හැරලා, නොබලා, මේ ටික කරපු නිසානේ මේ ටික ඇති වුණේ. තමන් කරපු ටිකම අප්‍රමාදීව කරගෙන යන එකයි තියෙන්නේ. හම්බ වෙන කිසිම ප්‍රතිඵලයක් දිහා බලන්න එපා.

මේ ටික කරගෙන යනකොට නීවරණ ධර්මම දුරු වෙනවා. නීවරණ චිත්තය ගෙවෙනවා කියලා තැනක් තියෙනවා. (එදාට මේවා කල් ඇතුව කියන්න බැහැ මොකද ඊට පස්සේ ඒකටත් සංඥා සංකල්ප මවා ගන්නවා. ඊට පස්සේ එතැන අල්ලාගන්න හදනවා ඉස්සෙල්ලා. ඒ හින්දා මම මොකුත් කියන්නේ නැහැ.) මේ ටික කරගෙන යමු. ප්‍රතිපදාව ගැන විතරක් නිසැක වෙන්න කියලා මම කියන්නේ මෙහෙම තැනකටයි යන්න තියෙන්නේ, කරන්න තියෙන්නේ, කියන තැන තේරුම් ගන්න.

එතකොට දැන් අපි ඉගෙන ගෙන තියෙනවා ඇත්ත ඇති හැටියේ කියන්නේ මෙයයි කියලා. ඔන්න ඔය ටික දකින තැනට යන්න, සත්‍යය අවබෝධ කරගන්නයි යන්නේ. මොකක සත්‍යයද? **රූපයේ ඇත්ත ඇති හැටියේ දකින්නයි යන්නේ. වේදනාවේ ඇත්ත ඇති හැටියේ දකින්නයි යන්නේ. සංඥාව, සංඛාර, විඤ්ඤාණ කියන මේ ටික පිරිසිඳ දකින්න, ඇත්ත ඇති හැටියේ දකින්නයි යන්නේ, ඔච්චරයි. වෙන අමුතු දෙයක් කරන්න නෙමෙයි.** ඒක දැකපු දවසට, ඒ ධර්මයන්ගේ ඇත්ත දැක්කහම, ආස්‍රවයන්ගෙන් හිත මිදෙනවා, කෙළෙසුන්ගෙන් හිත මිදෙනවා, සමුදය දුරු වෙනවා, කියන ටික වෙනවා.

ශ්‍රැතමයේ ඥාණයෙන් උපදවාගත් 'නිවන් මග'

එතකොට, දැන් ප්‍රතිපදාව අපිට දෙකක්. දෙකක් කියන්නේ යථාභූත ස්වභාවයක් තියෙයි නම්, ඒ යථාභූත ස්වභාවය ඒ ආකාරයෙන් දකින එකට කියනවා ලෝකෝත්තර සම්මා දිට්ඨි. මගෙ අදහසක් නෙමෙයි. අපි අර සූත්‍රයේ (මහා සළායතනික සූත්‍රය) කතා කළා නේ. ඒ යථාභූත දැක්මක් තියෙනවා නම් ඒ සම්මා දිට්ඨිය. යථාභූතය අරභයා යම් කල්පනාවක් තියෙනවා නම් ඒ සම්මා සංකප්පයි කියලා පෙන්නුවා නේ, නේද? එතකොට ඒ යථාභූත ස්වභාවය, මේ වැඩ පිළිවෙලේ අපට හම්බ වුණේ කොතනින්ද අනිත්‍ය කියන තැනින්ද දුකයි, අනාත්මයි කියන තැනින්ද යථාභූත ස්වභාවය හම්බ වුණේ? නැහැ.

අනිත්‍යයි, දුකයි, අනාත්මයි කියන ටික කළාට පස්සේ නීවරණ ධර්ම දුරු වීමෙන් ප්‍රමෝදය ඇති වෙනවා. ප්‍රමෝදයෙන් ප්‍රීතිය, ප්‍රීතියෙන් පස්සද්ධිය, පස්සද්ධියෙන් සැපය, සැපය නිසා සමාධිය. අන්න ඒ සමාධියටයි අපට මේ ඇත්ත හම්බ වෙන්නේ කියලා පෙන්නුවා. ඒ ඇත්ත හම්බ වුණාට පස්සේ, කළකිරිලා, නොඇලිලා මිදෙනවා කියන එකට ප්‍රාර්ථනා ඕනේ නැහැ. ඒකයි, මේවා **චේතනා කරණීයෙන්** තොරයි.

මේ විදිහට කටයුතු කරනකොට, ප්‍රමෝදය උපදීවා කියලා චේතනා කරන්න ඕනේ නැහැ කියනවා. ප්‍රමෝදය තියෙන කෙනාට, මට ප්‍රීතිය උපදීවා කියලා චේතනා නොකටයුතුයි කියනවා, හිතන්නවත් ඕනේ නැහැ. ප්‍රීතිය තියෙන කෙනාට පස්සද්ධිය කියන්නේ මොකක්ද, ඒක ගන්නේ කොහොමද, මොන විදිහටද ඒක කරන්නේ කියලා චේතනා කරණීයෙන් තොරයි, හිතන්න ඕනේ නැහැ. පස්සද්ධිය තිබුණොත්, සැපය කියන්නේ මොකක්ද, කොහොමද ඔය සැපය ගන්නේ, කොහොමද ඒ සඳහා සූදානම් වෙන්නේ කියලා ඕනේ නැහැ සැපය කියන එක වෙනවා. සැපය තියෙන කෙනාට දැන් සමාධිය කියන්නේ මොකක්ද, කොහොමද සමාධි ගන්නේ, සමාධි උපදවාගන්නේ කොහොමද, ඒකට කමටහන මොකක්ද, ඒවා ඕනේ නැහැ. සැපය තියෙන කෙනාට, සැප ඇත්තහුගේ හිත සමාධි වෙනවා. සමාධි තියෙන කෙනාට ඇත්ත ඇති හැටියේ දකීවා කියලා චේතනා කරණීයෙන් තොරයි.

මොකද මේ ටික 'ශ්‍රැතමය ඥාණය තියෙන කෙනාගේ ගමන් මඟ', ඒ කියන්නේ, කෙනෙක්ට නිකම් නෙමෙයිනේ මාර්ගය හම්බ වුණේ. දුක පිරිසිඳ දකින හැටි අහගෙන, සමුදය දුරු කරන හැටි අහගෙන, නිරෝධය සාක්ෂාත් කරන හැටි අහගත්ත නිසා, මග වඩන හැටි අහගත්ත නිසායි මේ ටික ලැබුණේ. ඒ කෙනාට මිසක මේ ප්‍රතිපදාව හම්බ වුණේ, මේ ශාසනයේ චුට්ටක්වත් අහපු නැති කෙනෙකුටද? නැහැ එයා භාවනා කරනවා

කියන එකක් උපන්නේම **මේ දර්ශනය නිසයි. මේ දර්ශනය නැත්නම්, භාවනා කරනවා කියලා, කියන එකම විහිළුවක්.**

ඒ කිව්වේ, ඉස්සෙල්ලා ලිපිනය අතට අරගෙනයිනේ පාරට බහින්න වෙන්නේ, නේද? ලිපිනයක් නැතුව පාරට බැහැලා යනවා නම්, යනකොට ලිපිනය හම්බ වෙයි කියලා, කාගෙ ලිපිනයද? කොහේ ලිපිනයක්ද? අපි කිව්වේ එතකොට 'පිස්සු නෙමෙයිද' කියලානේ. ඒ වගේ, දකින්න ඕනේ දේ, බලන්න ඕනේ දේ මොකක්ද කියලා ඉස්සෙල්ලා ලිපිනය දන්නේ නැතුව පාරට බහිනවා වගේ එකක් නෙමෙයිද, අපි සීලයක පිහිටලා බුදුගුණ, අසුභය, මරණය, මෛත්‍රිය කියලා සමථ කමටහන් වඩනවා, අනිත්‍යයි, දුකයි, අනාත්මයි කියලා රූපයන්ගේ අනිත්‍ය දුක්ඛ අනාත්ම මෙනෙහි කරනවා. මේ කරලා කොහාටද යන්නේ මොකටද යන්නේ, මොකක් දකින්නද යන්නේ? මොකුත් උත්තර නැහැ. නිවන් දකින්න කියනවා. පාරට බැහැලා යනවා, කොහෙහරි තැනක් තියනවා. අපි 'මෙල්බර්න්' යන්න කියලා කියනවා. තියෙන්නේ කෙහේද, යන්නේ කොහොමද, කොතැනින්ද හැරෙන්න ඕනේ? මුකුත් නැහැ. කොහොම හරි තැනකට ගියා කියලා අපිට ඕනෙ තැනට යැවෙනවද? එහෙම යැවෙන්නේ නැහැ. එතකොට යන කෙනා හරියට ඉස්සෙල්ලා නිවැරදිව තැන සහ ලිපිනය අතට අරගෙන පාරට බහින්න ඕනේ. එහෙම නැතුව පාරට බහින අයට කියනවා 'ඔළුව හැරුනු අතේ යනවා' කියලා. 'හිස හැරුනු අතේ යනවා' කියලා කියනවා.

ඒ වගේ, මේ ලිපිනය වගේ තමයි සම්මා දිට්ඨිය. වෙන මුකුත්ම ඔය පින්වතුන් සැක හිතන්න එපා. **මේ චතුරාර්ය සත්‍යය අවබෝධය කියලා කිව්වේ ඔය සම්මා දිට්ඨියට, යථාභූත ස්වභාවයට, සත්‍යය අවබෝධයට.** ඔතෙන්ට තමයි චතුරාර්ය සත්‍යය අවබෝධ වෙනවා කියලා කියන්නේ. දුක පිරිසිඳ දකිනවා. **ඔය දර්ශනය නිසා තමයි ක්ලේශ අනුශයම දුරු වෙන්නේ.** ඒ නිසා තමයි සියළුම දුක් දොම්නස් වලින් නිදහස් වෙන්නේ. ආශ්‍රවයන්ගෙන් මිදෙන්නේ. මාර්ගය වැඩිලා ඉවරයි කියන තැනට එන්නේ.

එතකොට චතුරාර්ය සත්‍යය කියන එක දකින මට්ටම කියන්නේ ඔන්න ඔය යථාභූත කියන තැන. ඒකයි අපි හැම කෙනෙකුටම මේ මට්ටමේදි චතුරාර්ය සත්‍යය අවබෝධ වෙනවා කියලා එකක් නැහැ.

එතකොට, ඔන්න ඒ දර්ශනය තියාගෙන, අපි දැන් සීලයක පිහිටලා සමථ විදර්ශනා වඩනවා. වඩනකොට, **සමථය වඩන නිසාත් සමාධියේ වෙනස්කම් දැනෙනවා** අපට, කය සැහැල්ලු වෙනවා, සන්සිඳෙනවා, අරමුණු සන්සිඳෙනවා, රාගය අඩුවෙනවා, ද්වේශය අඩුවෙනවා, ඊට පස්සේ අරමුණු වල අඩුකම නිසා ශුන්‍යතාවය දැනෙනවා. **එක**

තැනක ඉඳගෙන ඉන්නකල් එහෙම වුණාට ආපහු නැගිටලා බලන කොට ආයෙත් තියෙයි. ඒකයි මේ මට්ටමේදි ඒක ඔරොත්තු දෙන්නේ නැහැ.

ඒ නිසා මේ ටික කරන්න ඕනෙ ආයතන ටික අරගෙන හැසිරෙද්දිත් ඇලෙන්නේ ගැටෙන්නේ නැති මට්ටමට එන්න පුළුවන් මට්ටමටම තියෙන්න ඕනෙ. එක තැනක හිටියත් එහෙමයි. ආයතන ටික අරගෙන යද්දිත් එහෙමයි. අනිත්‍යයි, දුකයි, අනාත්මයි කියන එකම පෙනෙන මට්ටමට, ඇලෙන්නේ ගැටෙන්නේ නැති මට්ටමට ආවහමයි නීවරණ ධර්ම දුරු වෙන්නේ.

එතකොට නීවරණ චිත්තයම නැහැ. එයාට මේ භාවනාව වෙන එකක්, ජීවිතය වෙන එකක් නෙමෙයි.

ඊතාක්, **නීවරණ සහිත නිසාමයි, එයාට භාවනාව වෙන එකක් වුණේම නීවරණ වලින්. නීවරණ ටිකේ කෘත්‍යය තමයි, 'ජීවිතය වෙන එකක් කළා, භාවනාව කියන එක වෙන එකක් කළා.'**

නීවරණ ධර්ම දුරු වුණහම, දෙකක් නැහැ, වැඩ කළත් එකයි, ඉඳගෙන හිටියත් එකයි, භාවනා කරනවා කියලා අමුතු එකක් නැහැ. හැම වෙලාවෙම ඇත්ත තුළම මනස ඉන්නේ. ඒ මට්ටමේ. ලෝකය තුළ ඇත්ත. එතකොට තමයි නීවරණ ධර්ම දුරු වෙන්නේ.

දැන් අපි, කොහොමද අනිත්‍යය වශයෙන් මෙනෙහි කරන්නේ, කොහොමද දුක් වශයෙන් මෙනෙහි කරන්නේ, කොහොමද අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නේ, මෙනෙහි කරන ටික කොහොමද උපදින්නේ කියන ටිකත් බලමු.

ඔය දැන් දැනගත්ත ඇත්ත පැත්තකින් තියන්න. දැන් ඇත්ත දැනගත්තා. ඔය ටික දකින තැනට යන්නයි දැන් අපේ උත්සාහය.

★ නීවරණ චිත්තයෙන් මිදීමට යොදාගන්නා සමථ භාවනාවට කමටහන්

එතකොට සීලයක, පන්සිල් හරි, අටසිල් හරි සීලයක පිහිටියා. දැන්, සීලයක පිහිටලා අපි චිත්ත සමථයක් ඇති වෙන කමටහනක් වඩනවා. ඒකෙද, චිත්ත සමථය ඇති වෙන කමටහන් වලදි අපි ඒක තේරුම් ගන්නට ඕනේ, එක තැනක ඉඳගෙන ඉන්න කොට

වැඩි වෙලාවක් කරන්න පුළුවන්, වැඩි වේගයෙන් චිත්ත ඒකග්‍රතාවයක් ඇති වෙන කමටහනක් අපි තෝරා ගන්නවා.

ඊට පස්සේ, ආයතන පරිහරණය කරද්දී, නීවරණ ධර්ම අළුතෙන් එන්නේ නැති විදිහට හිත රැකගෙන කරන්න පුළුවන් කමටහනක් ඉගෙන ගන්න ඕනේ. **සබ්බත්තික භාවනා** සහ **පරිහාරිය භාවනා** කියලා දෙකට බෙදාගන්නවා ඒ නිසා.

- අපි කියමු එක තැනක ඉඳගෙන ඉන්නකොට, චිත්ත සමථය සඳහා ආනාපානසති භාවනාව උදව් කර ගන්නවා. එතකොට, ආන-අපාන කියලා ආශ්වාස ප්‍රශ්වාසය අරභයා සිහිය යොමු කරන එක. හැමදාම මම මතක් කරලා තියෙනවා නාසිකාග්‍රයේ වේවා, මුඛ නිමිත්තේ වේවා තොල් දෙක ගාව හෝ නාසය ළඟ හිත තබාගන්නවා. තොල් දෙක ගාව හෝ නාසය ළඟ හිත තබාගෙන ඒ නිමිත්ත ගැන දැනුම් ඇතුවම ඉඳගෙන, අශ්වාසය ප්‍රශ්වාසය නුවණින් දන්නවා. අශ්වාසය අනුව හිත ගෙනියන්නත් එපා, ප්‍රශ්වාසය අනුව හිත ගෙනියන්නත් එපා. සති නිමිත්තේ, (නාසය ළඟ) දැනුම තියෙද්දිම අශ්වාසය ගැන සිත පවත්වන්න, ප්‍රශ්වාසය ගැන සිත පවත්වන්න. අශ්වාස ප්‍රශ්වාසයෙන් බැහැරට යන්නේ නැති වෙන්න හොඳට අශ්වාසය ප්‍රශ්වාසය අත් විඳින්න. අත් විඳින්න කියන්නේ අශ්වාසය ප්‍රශ්වාසය ගැන හිතන්නෙ නැහැ.

- ඔන්න දැන් ආශ්වාසය හොඳට දිගයි බව තේරෙනවා නම් දිගට යනකොට, දිගයි නම් දිගයි බව හොඳට තේරෙනවා. ඒ අශ්වාසය තුළම ඉන්නවා. දිගට හුස්ම රැල්ල යනකොට ප්‍රශ්වාසය හොඳට දිගයි කියලා තේරෙනවා. මෙනෙහි කරනවා නෙවෙයි. දැනුම් සහිතව ඉන්නවා - ***පටිසංවේදි.*** හොඳට දැනුම් සහිතව ඉන්නවා. හැබැයි තොල් දෙක ගාව, නාසය ගාව හිත තබාගෙන ඉන්නේ. හිත තබාගෙන ඉන්නකොට පූර්ණ අවධානයෙන් ඉන්නවා, (ඒ හුස්ම රැල්ලට පූර්ණ අවධානයෙන්), වෙන කිසි දෙයකට මනස යොමු නොකොට ඒ සඳහාම අවධානයෙන් ඉන්නවා කියලා කියන්න තියෙන ක්‍රමය තමයි ඔය. අශ්වාසය කෙටි වෙන්න පුළුවන්, කෙටි බව හොඳට දැන් දන්නවා, ප්‍රශ්වාසය කෙටි වෙන්න පුළුවන්, කෙටි බව හොඳට දන්නවා කියලා ඒ 'නිමිත්ත පූර්ණව අත් විඳිමින්, හාත්පස වටලාගත්ත සිතින් අල්ලගෙන' ඉන්න කියන එකක් කියන්නේ.

එතකොට සති නිමිත්තට හිත තියාගෙන අශ්වාස, ප්‍රශ්වාසයේ ඔය මට්ටමේ ඔය විදියට දැනුම් සහිතව ඉන්න කෙනාට, යටින් හොරෙන්, තමන්ට හොරෙන් ඇතුළුවෙන්න ඉතා කුඩා නිමිත්තකටවත් බැහැ, විතර්කයකටවත් බැහැ. ඒකයි ඔතැනදි ටිකක් දක්ෂ වෙන්න ඕනේ. ***නාහං භික්ඛවේ මුට්ඨස්සතිස්ස, අසම්පජානස්ස ආනාපානසති භාවනං වදාමි.*** 'සිහි මුලා වුණු, නුවණ නැති කෙනාට මම ආනාපාන සතිය කියන්නේ

නැහැ' කිව්වේ, එයා ඉතාමත් තියුණුව, තීව්‍රව මේ සිහිය යොදාගන්න දක්ෂ වෙන්න ඕනේ. සති නිමිත්තේ හිත තියාගෙන, හොඳට තමන් තමන්ට උපේක්ෂා වෙන්න. ඒ නිමිත්තටම හිත තියාගන්න උත්සාහවත් වෙන්නට ඕනේ, ඒක නුවණින්ම බලලා. ඊට පස්සේ හොඳට නුවණක් තියෙන්නට ඕනේ, සති නිමිත්තෙත් දැනුම් සහිතව, අශ්වාස ප්‍රාශ්වාසයේත් පූර්ණ වැටහීම් සහිතවත් ඉන්නවා. දෙකෙන් එකකටවත් පෞද්ගලික වෙන්න දෙන්නෙත් නැහැ, දෙකෙන් එකකින්වත් තොර වෙන්න දෙන්නෙත් නැතිව. අශ්වාස ප්‍රශ්වාස දැනුමෙන් තොරව සති නිමිත්තේ විතරක් ඉන්නෙත් නැහැ, සති නිමිත්තේ දැනුමෙන් තොරව ආශ්වාස ප්‍රශ්වාසයේ විතරක් ඉන්නෙත් නැහැ, මේ දෙකෙන්ම තොරව වෙන විතර්කයක ඉන්න දෙන්නෙත් නැහැ කියන තැනකින් එයා දක්ෂ වෙන්න ඕනේ.

හැබැයි ඒක සියුම්. ඉතාමත් සියුම්. අපහසුයි. ඒ වගේමයි ප්‍රතිඵලය. අනිත් හැම කමටහනකටම වඩා ඉතාමත්ම වේගයෙන් (ඉතාමත්ම වේගයෙන්), ඔය හිතේ හිතේ කතාකරන ගතිය ඉතාමත්ම වේගයෙන් අඩුවෙනවා. ඒ කියන්නේ එක දවසක් හරියටම කරන කොට, එක දවසින්ම තමන්ගේ මනස අනිත් අතට හැරිලා පෙන්වන මට්ටමට ඔය කමටහන ප්‍රතිඵලයි. ඒ කමටහනේ නියම ගතිය අපිට අල්ලගන්න බැරිකමයි ගොඩක් දෙනෙකුට මට තේරෙනවා තියෙන්නේ. ඔය කියපු කමටහනේ නියම සැබෑ ස්වරූපයට හිත තියන්න පුළුවන් නම් ඒක ඉතාමත්ම වේගයි, එක තැනක පල්වෙන්නේ නැහැ.

- එතකොට ආනාපාන සතිය වඩන කොට ඔය විදියට අත් විඳින්න උත්සාහවත් වෙන්න. නාසය ගැන හෝ තොල්දෙක ගැන විතරක් දැනුම තියෙනවා, (ආශ්වාස ප්‍රශ්වාසය නොතේරෙන විදියට) කියන එකත් අතහරිනවා. සති නිමිත්ත ගැන දැනුම නැහැ, ආශ්වාස ප්‍රශ්වාසය ගැන විතරක් දැනුම තියෙනවා, සති නිමිත්ත නැතුව කියන එකත් අත හරිනවා. මේ දෙක ගැනම දැනුම නැතුව බාහිර දෙයක් සිහි කර කර ඉන්නවා කියන එකත් අත හරිනවා. සති නිමිත්තයි ආශ්වාස ප්‍රශ්වාස වෙන බවයි කියන එකයි දෙකම වැටහෙනවා. එතකොට ආශ්වාස ප්‍රශ්වාසය අනුව යන්න එපා කියලා කියන්න ඕනෙම නැහැ. වෙන්නේ නැහැ. මේ දෙක එකට තියෙන කොට වෙන්නේ නැහැ. (ඉබේමයි වෙන්නේ නැත්තේ) එතකොට එහෙමද ඉඳිමින්, ආශ්වාස ප්‍රශ්වාසයට පූර්ණව අවධානයෙන් යුක්තව ඉන්න. ඔය විදියට කරමු.

- ඔහොම ටිකක් වෙලා ඉන්න හැදුවත් ආයෙත් පරණ පුරුද්දට අහකට යනවා. අපහසුයි ඒ වෙලාවෙදි වෙන මොකුත් මෙනෙහි කර කර ඉන්න එපා. ආපහු සිහි කරලා, නුවණ ඇතුව, 'නැහැ මේ වෙලාවෙදි ආයෙත් හොඳට ඉන්නවා කොහෙවත් යන්න දෙන්නේ නැතුව' කියලා ***චිත්තං පග්ගාහති පජාහති*** - හිත දැඩිකරගෙන ආයෙත් අර විදියට අශ්වාස ප්‍රශ්වාසයේ ඉන්නවා. ආයෙත් විනාඩියක් දෙකක් ඉන්න කොට ආයෙත්

අතහැරෙයි. ආයෙත් ගන්නවා. මේ විදියට හිත අහකට යන්න යන්න, ආයෙත් මතක් කර කර ගන්නවා. ආයෙත් අහකට යනකොට මතක් කර කර ගන්නවා. මේ විදියට උත්සාහවත් වෙනවා. උත්සාහවත් වෙනකොට, ටික ටික ටික ටික ඉන්න පුළුවන්කම වර්ධනය වෙනවා. හරියට, නිවැරදි ක්‍රමයකට, නිවැරදිව ඉන්න පුළුවන්කම, (සිත වෙන අතකට ගන්නේ නැතුව ඉන්න පුළුවන්කම) ටික ටික වර්ධනය වෙනවා.

- ඊට පස්සෙ එහෙම ගොඩාක් වෙලා ඉන්නේ නැහැ. එතකොට එපා වෙනවා ***චිත්තං*** සිත සැඟවෙනවා, කුසීතෙට යනවා. එහෙම ටිකක් වෙලා උත්සාහවත් වෙලා, නැගිටලා, වෙහෙසිලා හිතා මතාම, (තව භාවනා කරන්න පුළුවන්කම තියෙද්දිම නැගිටින්න. නැගිටලා ටිකක් සක්මන් කරන්න. සක්මන් කරන වෙලාවෙදි. නැත්නම් මොනවා හරි කරන කොට, මේ භාවනාව දැන් පුරුදුවෙන්න). ගෙදර දොරේදි නම් වලං පිඟන් හෝදනවා, ගේ අතුගානවා, රෙදි සෝදනවා, ඕනෙම දෙයක් කරන්න පුළුවන්. හැබැයි ඒ ටික කරද්දි දැන් අනාපාන සතිය වගේ සියුම් කමටහනක් නැහැ. හැබැයි උපායක් කරනවා. මොකක්ද බුදුගුණ හෝ අසුභය හෝ මරණය හෝ මෛත්‍රිය හෝ කියලා මේ කමටහන්වලින් එකක් හිත ඇතුළෙ තබාගෙන මුමුණ මුමුණ තමයි කරන්නේ. ඒකෙන් ලොකු රැකවරණයක් තියෙනවා. ***බුද්ධානුස්සති මෙත්තාච, ඉත්තේවා චතුරාරක්ඛා භික්ඛු භාවේ සීලවා*** - සිල්වතා එයාගේ ආරක්ෂාවට මේ හතර වඩනවා.

එයාගේ ආරක්ෂාව කියලා කියන්නේ අමනුස්සයෝ ගහයි, යක්කු පෙරේතයෝ එයි කියන එකෙන් නෙවෙයි, අනාරක්ෂිතයි කියලා කියන්නේ. රාග, ද්වේශ, මෝහයන්ගෙන් මිසක තමන්ට අනාරක්ෂිත බව සැලසුනේ, වෙන එකකින්වත් නෙවෙයි. තමන් රකින සීලයක් තියෙනවා නම් එයාව ආරක්ෂා කරලා දෙන්නේ රාග, ද්වේශ, මෝහ දුරුවුණු මනසකින්. එතකොට රාග, ද්වේශ, මෝහයන්ට වැඩෙන්න නොදී, සීලය කැඩෙන්න නොදී, සිල්වතාගේ සිල්වත් බව ආරක්ෂා කරලා දෙනවා. කෙළෙස් උපදින එක ආරක්ෂා කරලා දෙනවා.

ඒ නිසා වැඩ කටයුතු කරද්දි, ගොඩාක් බැරි නම් 'සියළු සත්වයෝ නිදුක් වෙත්වා! නිරෝගි වෙත්වා! සුවපත් වෙත්වා!' කියන ටික අඛණ්ඩව සිතන්න හුරුවෙන්න. නැත්නම් මේ ශරීරයේ තියෙන ඇත්ත බල බලා හිතන්න හුරුවෙන්න. එහෙමත් නැත්නම් බුදුරජාණන් වහන්සේගේ අනන්ත බුදුගුණ, (ගොඩාක් හිතන්න බැරිනම් එක වචනයක් හරි) ගන්නවා ***සෝ භගවා ඉතිපි අරහං*** මේ භාග්‍යවතුන් වහන්සේ අරහං නම් වන සේක. මේ භාග්‍යවතුන් වහන්සේට අරහං කියලා කියනවනෙ, නැත්නම් බුදුරජාණන් වහන්සේ අරහං නම් වන සේක. එක වචනයක් හරි මුමුණ මුමුණ ඉන්නවා. මේකෙන් ලොකු

වැඩක් කරනවා. හැම වෙලාවෙම බාහිර වස්තු හම්බ වෙන කොට නීවරණ මනසකින් අපි හැම වෙලාවෙම ඒ වස්තු එක්ක සම්බන්ධ වෙලා තියෙන්නේ. මේ වෙලාවේදි අතර මැද සම්බාධකයක් පනවලා තියෙනවා, රූපයෙන් ආවරණීය ධර්ම තමන්ටම නොඑන්නත්, ආවරණීය ධර්ම සිහිවෙලා රූපයට යන්නත් නොහැකි වෙන විදිහටත්. වර්තමානයේදි ලොකු ආරක්ෂාවක් තියෙනවා, රැකවරණයක්. ඒ නිසා වැඩ කටයුතු කරද්දි ඔය විදියට මෙනෙහි කරමින් වැඩ කටයුතු කරන්න.

- එහෙම නැතිනම් තව තියෙනවා ‘චතුධාතු වවත්ථාන’ කියලා කමටහනක්. මේක ටිකක් සියුම්. අපි කියමු දැන් භාවනා කරන කොට (මේක බොහොම හොඳයි සක්මන් භාවනාවට), මේක හොඳට හුරුවෙනවා. **අපි අඩිය තියන කොට, (ඇහැට පෙනෙන කිසිම දෙයක් මිම්මක් වශයෙන් නොගෙන, කකුලෙන් අඩිය තියන කොට), කකුල, පොළව මේවා වර්ණ සටහන් මාත්‍රයක් විතරයි දැන්. පෙනෙන දේ අඩිය තියන්න බැහැ. අඩිය තියන දේ පෙනෙන්නේ නැහැ. ඕක තමයි ඇත්ත, යථාභූත ස්වභාවය (පෙනෙන දේ අඩිය තියන්න බැහැ).**

ඒ ඇත්ත සිහිවෙන්නත් එක්ක, කෙළෙස් නූපදින්නත් එක්ක, කකුල මෙහෙම තියනකොට, පොළොවේ හැපෙන තදවෙන ගතිය තේරෙනවා නේද? ඇහැට පෙනෙන මිම්ම ඒකට ගන්නේ නැතුව, හරියට නුවණින් අර ස්පර්ශයට හිත යොමු කරලා, ‘පඨවි’ කියලා හිතන්න ඕනේ. පඨවි පඨවි පඨවි කියලා හිතනවා. **ඒ කියන්නේ මේ තද ස්වභාවය දැනෙනකම මිසක, (ඒ පඨවි කියන කොට තද ස්වභාවය කියලා කකුල පෙනෙන්න හෝ පොළොව පෙනෙන්න කියලා ගන්න එපා. ඒක ඇහැට පෙනෙන වර්ණ සටහනක්) ඔය පෙනෙන රූපය තුළ පඨවි නැහැ. ඒ පෙනීමේ සීමාවෙන් ඔබ්බට ගිහිල්ලා (අර දැනෙන සංවේදිකම, ස්පර්ශ ස්වභාවයක් විතරයි) කිසිම රූපයක් නැහැ එතකොට එයාට.** තේරුනාද මම කියන එක? ඔය ‘චතු ධාතු’ කමටහන එපමණ ප්‍රඥා ගෝචර ධර්මයක්, **ඒ ගතිය විතරක් හිතට හසුවෙන විදිහට පඨවි, පඨවි කියලා හිතනවා.** හිතමින් එහාට මෙහාට යනවා. එහෙම නැත්නම් හිත කොහාටවත් යන්න දෙන්නේ නැහැ කියලා සති නිමිත්ත තුළ, නාසය හෝ තොල්දෙක ගාව හිත තබාගෙන, හිත මෙතැනින් වෙනස් වෙන්න නොදී තබාගෙන යනවා කියන තැනකින් සක්මන් කරන්න පුළුවන්.

එතකොට ඔන්න ඔය විදිහට හෝ නැත්නම් අර විදිහේ මනසිකාරයකින් හිත රැකගෙන වැඩ කටයුතු කරනවා. මේ දෙකින්ම වෙන්නේ සමථ කමටහන්.

✶ සමථ, විදර්ශනා යුගනන්දව

ඊට පස්සේ අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, අනාත්ම වශයෙන් මෙනෙහි කරන්න හුරුවෙන්න ඕනේ. අනිත්‍යය වශයෙන්, දුක් වශයෙන්, අනාත්ම වශයෙන් මෙනෙහි කරන කොට, **අනිත්‍යය වශයෙන් මෙනෙහි කරන එක** ගැන මම ටිකක් කියන්නම්. අපිට ඒක රළු මට්ටමටත් පුළුවන්. නමුත් මේ නීවරණ ධර්ම දුරු වෙන්න සියුම් මට්ටමේ කමටහනක් මම මතක් කරන්නම්.

- අපි එක තැනක ඉඳගෙන ඉන්න කොට ආනාපාන සති කමටහනට නාසිකාග්‍රයේ හෝ තොල් දෙක ගාව හිත තබාගෙන සිහියෙන් ඉන්නවා.

- ඒ විදියට ආනාපාන සතිය වඩලා ටිකක් වෙලා, උවමනාවෙන් ඒක නතර කරලා, සිතට උපදින උපදින උපදින අරමුණු දිහා හොඳ අවධානයෙන් ඉන්නවා. ඉඳලා උපදින උපදින විතර්කයන්ගේ අනිත්‍යය බලනවා.

එතකොට මොනවා හරි දෙයක් දැනෙනවා නම්, රළු රූප මට්ටමේ මතක් වෙන දෙයක් වෙන්නත් පුළුවන්, සමහර විට මතක් වෙන්නේ නැහැ, හිතට දැනෙන මට්ටම වෙන්නත් පුළුවන්. අපි මෙහෙම ඇස් දෙක වහගෙන හිටියොත් කිසිම දෙයක් මතක් වෙන්නේ නැහැ. නමුත් දැන් ඉස්සරහ කට්ටිය ඉන්නවා. පිටිපස්සේ බිත්තියක් තියෙනවා කියලා ‘හිතට දැනෙන මට්ටම්’ ගත්තොත් එයා ස්ථිරවම දන්නවා මේවත් විතර්ක කියලා.

- ඒ එකින් එකට ඒ රූප වලට හිත තබලා මේද චිත්තජද රූපයක්, මේද මනෝ ස්පර්ශය නිසා හටගත්තේ, මනෝ ස්පර්ශය නැති වෙනකොට නැති වෙනවා නේද කියලා, මෙහෙම එකක් එකක් එකක් ගානේ අනිත්‍යය බලනවා.

- අනිත්‍ය බලලා ආයෙත් ආනාපාන සතිය වඩනවා. ආනාපාන සතිය වඩලා උපදින උපදින හැම විතර්කයක්ම අනිත්‍යය වශයෙන් බලනවා.

කෙනෙක් **මනෝමයෙන් ඔය විදියට බලනවා නම් අනිත්‍යය, බොහෝම වේගවත්. නීවරණ ධර්ම දුරු කරන්න. හිත සමාධි වෙන්න වේගවත්.**

- ඊට පස්සේ බාහිර භෞතික වස්තූන්ගේ විපරිනාම ස්වභාවය, වෙනස් වෙන ස්වභාවයක් නුවණින් හිතුවට කමක් නැහැ අනිත්‍යයි කියලා. ප්‍රශ්නයක් නැහැ.

ඔය විදියට අනිත්‍යයි කියලා බලන කොට, උපදින උපදින හැම අරමුණක්ම අනිත්‍යයි කියලා බලනකොට, ඒ වණී සටහන පෙනෙන කොට, පෙනීමට සමගාමීව මනසින් උපදින ගෙවල් දොරවල්, යාන වාහන, ඉඩකඩම් කියලා මේ කෙළෙස් ගුලිය තමයි එන්න එන්න එන්න එන්න අඩු වෙන්නේ. නීවරණ ධර්ම අඩු වෙනවා කියලා කියන්නේ ඔය ටික අඩු වෙනවා.

- ඒකයි ***සබ්බේ සංඛාරා අනිච්චාති, යදා පඤ්ඤාය පස්සති*** - කියලා කිව්වේ, හිතට උපදින උපදින සියළුම විතර්ක ඔය පින්වතුන්ට අනිත්‍යයි කියලා දකින්න පුළුවන් නම් ***අථ නිබ්බින්දති දුක්ඛෙ*** - කියලා කිව්වේ, මේ ගෙවල් දොරවල්, යාන වාහන, ඉඩකඩම්, මිල මුදල් කියන මේ ටික ඔක්කොම, මනසේ තියෙන ධර්මතා අඩුවෙලා මේ 'පෙනෙන දේ, දැනගන්න දේ නෙවෙයි' කියන එකට ටික ටික ටික නුවණ එනවා.

- **එතකොට ඇස් ඉදිරිපිටට රූප එද්දි ඒ අරහයා තමන් තුළ උපදින්න, සිහිවෙන්න 'ආවරණීය ධර්ම' නැහැ. නීවරණ ධර්ම උපදින්නේ නැති මට්ටමට එනවා. මොකද, නීවරණ කියන එක මනෝ විඤ්ඤාණය අනුව ගිය ධර්මශුද්ධතාවයක් මිසක මේ පංචායතනයට අයිති එකක් නෙවෙයි.**

- **මේ විදහට කරන කොට ඔන්න නීවරණ ධර්ම දුරුවෙලා කය සම්පූර්ණයෙන් සැහැල්ලු වෙලා,ප්‍රමෝදය ඇති වෙනවා. මේ කය සැහැල්ලු වීම අර ප්‍රමෝදය, ප්‍රීතියෙන් පස්සෙ ඇති වෙන පස්සද්ධිය එහෙම නෙවෙයි.** මේ විදියට බලන කොටත් ප්‍රීතියක් දැනෙනවා, පස්සද්ධියක් දැනෙනවා, අරමුණු නැති ශූන්‍යතාවයක් දැනෙනවා. **මෙහෙම කරපු නිසා ඇති වුණු ගති ටිකක් තේරෙයි. නමුත් ඒවා අරහයා ඔය පින්වතුන් මායිම්වත් නොකට යුතුයි.** යන ගමන යන්න.

- **නීවරණ ධර්ම නැහැ කියලා තමන් තුළ තියෙන සාක්ෂිය තමයි එක තැන ඉඳගෙන ඉන්න කොට කිසිවක් නොහිතෙන කම නිසා නෙවෙයි. ඇහෙන් බලද්දිත් තමන්ට මේ සිහිනුවණ ඉදිරිපත් වෙනවා ඇලීම් ගැටීම් දෙකට එන්නේ නැහැ මනසින්. ආයතන ටික පරිහරණය කරද්දිත්, එක තැනක ඉද්දිත් මනස සමානමයි. නීවරණ ධර්ම එන්නේ නැහැ.**

ඒ නාවත් තවම මේ කෙළවර නෙවෙයි. තාම අනුශය දුරුවෙලා නැහැ. දැන් කෙළෙස් නැහැ, නමුත් අනුශය තව දුරුවෙලා නැහැ. කෙළෙස් සහ කෙළෙස් අනුශය කියන්නේ දෙකක්. මේ මට්ටමේ දැන් කෙළෙස් නැහැ. අලෝභ, අද්වේශ, අමෝහය තියෙනවා, කුසලයක් තියෙනවා, නීවරණ නැහැ.

- ආයතන පරිහරණය කරද්දිත් තමන්ට ඒ දකින අහන අරමුණු අනිත්‍යයි කියන ගතියෙන්ම සිහිවෙනවා, ඒ නුවණම ඉදිරිපත් වෙනවා මිසක මේ පරියායෙන්, කෙනෙක් පුද්ගලයෙක් ඇත්ත වෙලා ඇලෙන්න ගැටෙන්න තියෙන ඉඩ නැහැ. මොකද එයාට හොඳට තේරෙනවා මේ පෙනෙන දේට සමගාමීව කෙනා, පුද්ගලයා කියන එක සිහිවෙන්නේ තමන්ගේ මනසින් කියලා මේ සිතුවිලි පැත්ත හොඳට ප්‍රකටයි දැන්.

- උපදින උපදින ඉතා සියුම් විතර්කය පවා, දැන් මෙහෙම පෙනෙන කොටම වටාපත කියලා හිතුනා නම් අපිට 'පෙනෙන දේ අනෙකක්, මනසින් මේක හිතුනෙ' කියලා නොදන්නා කම නිසයි මේ වටාපත කියලා හිතාගෙන ඉන්නේ. ඔය පින්වතුන්ට පෙනෙන මට්ටමක් ආවොත්, **ඇහැට පෙනෙනවත් එක්කම වටාපත කියලා හිතෙන්නේ තමන්ටයි කියන මට්ටමක් ආවොත්, ඔය පින්වතුන් කවදාවත් මේක වටාපත කියලා බලනවද අල්ලනවද? වෙන්නේ නැහැ. වටාපතක් එක්ක ඇලෙන්න ගැටෙන්න තියෙන හේතු ටික නැති වෙනවා.**

- **මේ උපදින උපදින හැම විතර්කයකම අනිත්‍යය බලාගෙන බලාගෙන යනකොට ඉතාමත් සියුම් විතර්කය පවා එනකොට ප්‍රකටයි. එකපාරට අනිත්‍යය බලන්න පුළුවන්.**

- **ඔය මට්ටමට එනකොට. මෙහෙ, මනායතනයේ උපදින දේකින් සිහිකරගෙන පංචායතනයේ ඇලෙන්න ගැටෙන්න තියෙන හේතු ටික තමන් ළඟ නැහැ කියලා දකිනවා.**

ඒ කියන්නේ මේ රූපය දකින කොටම, 'කෙනෙක්' කියන අදහස උපදිනකොට, 'බාහිර කෙනෙකුට' කැමති වෙන්න හෝ අකමැති වෙන්න තියෙන ඉඩ අතහැරෙනවා. ඔය මට්ටමටම එනවා.

- හැබැයි එතැනදි දක්ෂ වෙන්න ඕනේ ඉතාමත්ම සියුම් මට්ටම දක්වාම මේ අනිත්‍යය කියන, මනසිකාරය යන්න ඕනෙ. මේ රළු මට්ටම නෙවෙයි. ඕකට කියනවා 'චිත්තානු පරිවර්තන විතර්ක' කියලා, සිත අනුව පෙරලෙන විතර්ක තියෙනවා.

ඒවා නුවණින්මයි බලන්න ඕනේ.

ඒ කියන්නේ හැම මට්ටමකම පොඩ්ඩක් දුරට යනකොට හිතෙන ගතිය නතර වෙනවා. දැන් ආනාපාන සතිය වගේ කරගෙන යනකොට, ඔය ගෙවල් දොරවල්, යාන වාහන, ඉඩ කඩම්, කියලා අතීතයේ කළ කී දේවල් වේගයෙන් හිතෙනකම තියෙනවනේ, ඔය රළු මට්ටමේ විතර්ක. ඕක නතර වෙනවා.

- ඊට පස්සේ ප්‍රකට වෙනවා හිත අනුවම පෙරලෙන සියුම් විතර්ක. ඒවා හඳුනගන්න, අනිත්‍යය බලන්න තමුන් දක්ෂ වෙන්න ඕනේ.

අර මම කිව්වේ දැන් 'සිහිවෙන ගතිය' නැති වුණාට, දැන් තමන්ගේ වටපිටාව ඇති බවට හම්බ වෙන, ඇස් දෙක වහගත්තත් හම්බ වෙන්න පුළුවන්. එතකොට තමන් එකපාරට දැනගන්න ඕනේ මේ බාහිර තියෙන දේවල් පෙනෙනවා නෙවෙයි, 'බාහිර ඇති දෙවල් හැටියට හිතේම තියෙන සියුම් විතර්ක හිතේ හැපිලා තියෙන්නේ' කියලා දැනගෙන, හිතේ තියෙන විතර්කයක් හැටියට අනිත්‍යය බලන්න පුළුවන් කම තියෙන්න ඕනේ. (දැන් **මෙහෙම ඇහැ වහගත්තහම මෙහෙම වටපිටාව ඇති බවට තේරෙනවා කියන්නේ ඒ සියුම් විතර්ක. ඔහොම කරන කොට ඒකත් මැකෙනවා)**

- ඒ ටික මැකෙන කොට තමන්ගේ ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන ටික පෙනෙනවා. දැන් තමන් මෙතෙනදි යන්න පහසු, යථාභූත ස්වභාවය ඉගෙන ගෙන තියෙනවා, කවදාවත් ඇහැ පෙනෙන්න බැහැ, ඇහැ දැකලා නැහැ. කන, දිව, නාසය, ශරීරය දැකලා නැහැ. බාහිර රූපයක් දැකලා ඇහැ, කන, දිව, නාසය, ශරීරය මෙහෙමයි කියන මිම්මක් තියෙන්නේ කියලා අපි ඉගෙනගෙන තිබුණා. දැන් එතකොට හොඳට දන්නවා ඇස් දෙක මෙහෙම වහගෙන බලනකොට, ඇහැ, කන, දිව, නාසය, ශරීරය, මුහුණ පෙනෙන කොට මේ ඔක්කොම මනෝ විතර්කයි කියන එකට එයාට ක්ෂණිකව සාක්ෂි ටික ඉපදෙනවා.

- ඒ ටිකෙත් අනිත්‍යය බලනවා. එතකොට පුද්ගලයෙක්, කයක් කියලා තමන්ට චුට්ටක්වත් ඉතුරු වෙන්නේ නැහැ. 'විතර්ක මාත්‍රයක් විතරයි' කියන මට්ටමක් එනවා.

- ඔය මට්ටමෙත් අනිත්‍යය බලන කොට, ඊටත් ඔබ්බටත් ආයේ බලනවා, ඔන්න ඔය මට්ටමට ගියහමයි නීවරණ ධර්ම දුරු වෙන්නේ. එතකොට තමයි ප්‍රමෝදය කියන එක දැනෙන්නේ. එතකොට ඉඳගෙන ඉද්දි විතරක් නෙවෙයි, නැගිටලා ගියත්, මෙහෙම ඉඳගෙන ඉද්දි මම කියන හැඟීම දැනෙන කොට හිතට, මේ කයට ඇදෙන්නේ

නැති විදිහට 'මම කියන එක මනසෙ තියෙන විතර්කයක්' කියලා ඇස් දෙක ඇරලා ඔහොම ඉඳගෙන ඉන්නකොටම මම කියන විතර්කය අල්ලගන්න පුළුවන්, අල්ලගෙන අනිත්‍ය බලන්න පුළුවන් මට්ටමට එනවා.

දැන් ඔහොම ඉන්න කොට ඔය පින්වතුන්ට තමන් කියලා තේරෙනවනේ නේද? ඒ තේරෙන එක අපි හිතාගෙන ඉන්නේ කය කියලනේ. එතකොට කය හා සම්මිශ්‍ර නොවී, කය හා යෙදෙන්නේ නැතුව, ඉඳගෙන ඉද්දිත් (අර පෙන්නන්නේ 'අස්ලොමක් සියක් වර පලනවටත් වඩා සියුම් කියලා මේ දහම.' එච්චරට සියුම් ඒක. එතකොට ඒ මට්ටමට ආවහමයි) මෙහෙම ඉන්නකොට, තමන්ව තේරෙන කොට, තමන් කියලා තේරෙන, පෙනෙන මේ ගතිය සිතේ තියෙන විතර්කයක් කියලා බලලා, ඇස් දෙක ඇරගෙන මේ කතා කර කර ඉද්දි අනිත්‍යය බලන්න පුළුවන් මට්ටමකට එනවා.

- **ඔන්න ඔය මට්ටමකට ආවහම තමයි 'ඉතාමත් සුබුම චිත්තානු පරිවර්තන විතර්කයෝ දන්නවා' කියලා කියන්නේ. ඔය මට්ටමට ආවහම තමයි, ඒ තුළත් තව දක්ෂ වෙන කොට තමයි මේ නීවරණ චිත්තය ගෙවෙන්නේ.** එයා හරියට රළු මට්ටමේ ප්‍රකට ප්‍රකට හැම රූපයක්ම අත නොහැර අනිත්‍යය බල, බල යන කොට, ඊගාවට ප්‍රකට වෙන, පහළ වෙන රූප ටිකත් පැහැදිළියි එයාට.

- ඒ මට්ටම අහුවෙන කොට රළු ටික අත හැරෙනවා. ඊට සියුම් මට්ටමක් ප්‍රකට වෙනවා. එතකොට ඒක පැහැදිළියි එයාට. ඔහොම ගිහිල්ලා අද අප්‍රකට, ඉතාමත් සියුම් රූප තියෙනවා, අද මේ රළු මට්ටමේ ප්‍රකට රූප වගේ ප්‍රකටව පෙනෙන මට්ටමට එනවා. අද අපිට හිතාගන්නවත් බැරි මට්ටමේ සියුම් රූප, මේ ඕදාරික මට්ටම අත හැරෙද්දි ප්‍රකට වෙලා පෙනෙනවා.

- ඔන්න ඒ මට්ටමේදිත් සමථ කමටහනකින් හිත වඩ වඩ ඒ මට්ටමේ නිමිතිවල අනිත්‍යය බලනවා. එතකොට නීවරණ චිත්තයෙන් මිදෙනවා. නීවරණ චිත්තයෙන් මිදෙන කොට ' මේ පෙනෙන සංඥාවම' වෙනස් වෙනවා. ඇහැට පෙනෙන මේ ඕදාරික මිම්මම අත හැරෙනවා. මේ අහසයි තමනුයි දෙන්නෙක් නොවන මට්ටමට යනවා.

ඒක හොයාගන්න පුළුවන් එතෙන්ට යනකොට. මේ ප්‍රතිපදාව මෙහෙ වෙනස් නැත්නම්,ඔය මගදි මොකුත් අමුතුවෙන් කරන්න දේවල් නැහැ. අවශ්‍ය වෙන්නේ ඇතිවන ප්‍රතිඵලයේ බැසගන්නේ නැතුව, ප්‍රතිඵලය ඇත්ත කරගන්නේ නැතුව තමන් කරගෙන යන වැඩ කටයුතු කරගෙන යන එක විතරයි.

- ඒ වෙලාවෙදි එයා දක්ෂ වෙන්න ඕනේ, රූප කියන කොට දැන් සැහැල්ලුයි, හිස්බවක් ශූන්‍යතාවයක් කියන කොට මේකද චිත්තජ රූපයක්, හිතෙන් උපද්දපු එකක්. දැන් සැහැල්ලුයි කියලා හිතෙනවානම් ඒකෙත් අනිත්‍යය බලන්න පුළුවන්. දැන් හිස් බවක් දැනෙනවා නේද, මොකුත් නැති කියලා හිතෙන කොට ඒකෙත් අනිත්‍යය බලන්න පුළුවන් වෙන්න ඕනේ.

අපි අත තියෙන තියන තියන තැනට ගැහුවොත් තමයි එයා අත අතහරින්නේ නේද? ඕදාරික මට්ටමේ රූප අත හරිනකොට, ඒ මට්ටමේ සියුම් ධර්මතා එනකොට එයද පිළිගත්තොත් ඒකත් අල්ලගෙන ඉන්නවා.

- එහෙම කළාම තමයි නීවරණ ධර්ම දුරුවෙන්නේ කියලා අල්ලන්න මොකුත්ම නැති වෙනවා. එතකොට ඔන්න නීවරණයන්ගෙන් හිත මිදෙනවා.

- මිදුනහම තමයි ප්‍රමෝදය කියන එක එන්නේ.

ඒ ප්‍රමෝදය කියන්නේ එයාගෙ මුළු ජීවිතයම, (නැත්නම් අපි නිකමට කිව්වොත් ඔය පින්වතුන්ට ගෙදර දොරේ වැය පක්ෂය වැඩියි, අය පක්ෂය අඩුයි, ඒ නිසා ණය තුරුස් වෙලා ලෙඩරෝග හැදිලා මහා කණගාටුවෙන්, වටේට ණය වෙලා ඉන්න වෙලාවක, කෝටි ගණනක ලොතරැයියක් ඇදුනොත්, ඔදවැඩුනු බවක්, සතුටක්, ප්‍රීතියක් තියෙයි නේද හැම වෙලාවෙම? අන්න ඒවගේ, ඊට සමාන කළොත් ඒකත් වැරදියි, ඊටත් වඩා සතසහශ්‍ර ගුණයකින්) හැම වෙලාවෙම නිතැතින්, උද්දේක, දවල්ක, රැයක කියලා නැහැ, වැඩ කරද්දි, නොකරද්දි, නිදාගෙන ඉද්දි එහෙම වෙනසක් නැතුව සතුටු ගතියක්, ඔදවැඩුනු ගතියක්, පිනා යන ගතියක්, ප්‍රමුදිත ගතියක් හිතේ ඇති වෙනවා.

මේ දහමෙන් යුක්තව, දහම නිසා, 'දහම තමා සන්තකව තියෙනවා, කෙළෙස් තමා සන්තක නැහැ' කියලා දකිනවා ඒ නිසාම බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා නීවරණ ධර්ම තමන් කෙරෙහිලා නොදකින ඔහුට පස් ආකාරයකින් මේ ප්‍රමෝදය උපදිනවා කියලා.

හිරේ වැටුනු කෙනෙක් හිරෙන් නිදහස් වුණා කියලා දැක්කහම,

ණයක් ගත්ත කෙනෙක් ණයෙන් නිදහස් වුණා කියලා දැක්කහම,

අනුන් යටතේ වැඩ කරන කෙනෙක් වැඩකාරකමෙන් නිදහස් වුණා කියලා දැක්කහම,

දැඩි ගිලන් වුණු රෝගී කෙනෙක් පහුකාලෙක ඒ රෝගයෙන් නිදහස් වුණා කියලා දැක්කහම,

ආහාරපාන නැතුව කාන්තාරයේ අතරමං වෙලා ඉන්න කෙනෙක් කෑම බීම තියෙන ක්ෂේම භූමියකට ළගා වුණා කියලා දැක්කහම,

යම් සේ සතුටු වෙයිද, අන්න ඒ වගේ සතුටු වෙනවා. එයා නීවරණ චිත්තය දකිනවා හිරය වගේ, ණය බරෙන් යුක්ත ජීවිතය වගේ, වැඩකාරකම වගේ, දැඩි රෝගී කමක් වගේ, කාන්තාරයක ඉන්න කෙනෙක් වගේ. නීවරණයන්ගෙන් මිදුණු තමන්ගේ මනස දකිනවා අන්න අර ධර්මයන්ගෙන් මිදුණු කෙනෙක් වගේ. ලෝකයාව දකිනවා හිරේක ඉන්න කෙනෙක්, ලෙඩ රෝගීව ඉන්න කෙනෙක්, ණය තුරුස් ගොඩක ඉන්න කෙනෙක්, වැඩකාරකමක ඉන්න කෙනෙක් කාන්තාරයක අතරමං වුණු කෙනෙක් වගේ (නීවරණ චිත්තයෙන් යුක්ත කෙනාව දකිනවා). මොන තරම් සැහැල්ලුවක්ද නිදහසක්ද කියලා තමන්වත් දකිනවා. එහෙම තමන් ඇලිල බැඳිලා කියලා නොදකින කොට, (තමන් නිදහස් වෙලා කියලා දකිනකොට) ප්‍රමෝදය කියන එකට ප්‍රාර්ථනා ඕනේ නැහැ.

ඊට පස්සේ අර චක්‍රය ඉබේමයි, ප්‍රමෝදය නිසා ප්‍රීතිය, ප්‍රීතිය නිසා පස්සද්ධිය කියන ටික. එදාට ***යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං*** දකින්න පෙර තිබුණා නෙවෙයි, දැක්කයින් පස්සේ තියෙනවා නෙවෙයි, අවස්ථාවට ආයතන ටිකෙන් උපද්දවපු දේකුයි පෙනෙන්නේ කියන දර්ශනය 'පෙනෙන මට්ටමටම' එනවා.

ඕකෙදි මෙහෙම කාරණාවක් දකින්න. සීලයක පිහිටලා, හිත වඩමින් නීවරණ ධර්ම දුරු කරන කොට, නීවරණ ධර්මයන්ගෙත් තියෙනවා එක එක මට්ටම්. මොකද අවිද්‍යාව නීවරණයක් කොට තියෙනවා. මේ නීවරණ ධර්මයන්ගේ රළු මට්ටම් අඩු වෙනකොට **ඒ මට්ටමට ප්‍රමෝදය ඇවිල්ලා, ඒ මට්ටමේ පස්සද්ධිය, මේ සැපය නිසා ඇත්ත දකිනවා කියන එකේ යම් මට්ටමක් පැහැදිලිවීමකුත් තියෙනවා. ඔහොම ඔහොම ඔහොම ඇවිල්ලා, යම් දවසකදි නීවරණ චිත්තය කියන කොට, 'අවිද්‍යාව නීවරණයක් කොට, අවිද්‍යාව කියන කාරණාව දුරුවෙන කම නිසාම පස්සද්ධිය ඇති වෙනවා' කියන තැන දක්වාම මේ කාරණාව.**

★ ★ ★ ★ ★ ★ ★ ★ ★

ඊට පස්සේ, ***දුක්ඛතෝ මනසිකරොන්තෝ.*** ඔය විදියටම, අපි මුලින් කිව්වා වගේ සීලයක පිහිටලා එක තැන ඉඳිමින් හෝ වැඩකටයුතු කරමින් සමථ කමටහනක් වඩනවා, නුවණින් 'දුකයි' කියලා මෙනෙහි කරනවා.

- දුකයි කියලා මෙනෙහි කරන කොට ඒකෙදි උපායශීලි වෙන්නට ඕනේ. ඒ කියන්නේ ඒ දුක්ඛ සංඥාවෙන් බේරුණු එකම වස්තුවක්වත් තමන්ට නැහැ. තමන්ට මනෝමයෙන් සිහිවෙන, (අර අපි අනිත්‍යයි කියලා බැලුවෙ උපදින උපදින හැම විතර්කයක්ම) ඒ වගේ උපදින, උපදින හැම විතර්කයක්ම දුක්ඛ සංඥාවෙන් බලනවා.

ඒ කිව්වේ, (එයා මෙහෙම මෙනෙහි කරනවා). දැන් හදිස්සියේ සතුරෙක් අපෙන් පලිගන්න ඕනෙ වුණාහම මිතුරු වේශයෙන් ඇවිල්ලා. (එයාට ගහන්න බනින්න පුළුවන් පහසු ස්ථානයකට) අපිව රවට්ටලා අරගෙන යනවනේ. අපි ඉන්න වටපිටාවේ ඉඳගෙන ගහන්න බනින්න බැරි නම්, රවට්ටලා අපිව ගෙනියන්න පුළුවන්නේ. ඒ වගේ මේ රූපය, දුවා පුතා ඥාතියා, රන් රිදී, මිල මුදල් කියලා මිතුරෙක් හැටියට පෙනී ඉඳලා ජරා, මරණ, දුක දක්වා අපිට අරගෙන යන කෘත්‍යය කරනවා, වැඩේ කරනවා නේද කියලා, අපිට ප්‍රිය මනාපයෙන් එන රූපයත් දුක්ඛ සංඥාවෙන් බලන්න පුළුවන් වෙන්න ඕනේ.

- අපිට ප්‍රිය අමනාප රූපය, දුක්වූ රූපය, දුකයි කියන සංඥාවෙන්ම දුකයි, තේරුනාද මම කියන එක.

ඒ කියන්නේ දැන් අපිට පෙනෙන මේ පොත (අපිට බලන්න පුළුවන්) පොතක් හැටියට ලස්සනට පෙනිලා මම මේකට ඇලිලා බැඳිලා හිටියොත්, මේ හේතුවෙන්ම ආපහු අපි සසරට වැටෙනවා. අපි කියමු මේ පොත මරණාසන්න මොහොතෙදි මේ නිමිත්ත කර්ම නිමිත්තක් හැටියට එලඹුනොත්, ඒ කර්මය නිසා අපි ප්‍රතිසන්ධි වශයෙන් ගියොත්, එතැන යම්තාක් මෙබඳු ඉපදීම, ලෙඩවීම, මහළු වීම, මරණය වගේ යම්තාක් දුකක් තියෙයි නම් ඒ දුක ඇති වෙන්නේ ඉපදුණු නිසා. ඉපදෙන්න හේතුව කර්ම නිමිත්ත. එබඳුවූ කර්ම නිමිත්තක් හැටියට හදන්න පුළුවන් කම මේකට තියෙනවා. එතකොට යථාර්ථය ගත්තහම, 'ඒ නිසයි මේ ජරා මරණ, දුක' කියලා චක්‍රාකාරව බලන්න පුළුවන්කම තියෙන්න ඕනේ.

- ඒ වගේම, අනන්ත සංසාරෙ අපි මේ හම්බ වෙන වස්තූන්ට තණ්හා කරපු නිසා කොච්චර දුක් විඳින්න ඇද්ද කියලා මේ සංවේගය ඇති වෙන හැටියට දුක්ඛ සංඥාවෙන් බැලුවට කමක් නැහැ. ඒකේ දෝෂයක් නැහැ. තමන් දක්ෂ වෙන්න ඕනේ 'උපදින උපදින හැම විතර්කයක්ම දුකයි' කියන කාරණාවෙන් දකින්න. ඒ කියන්නේ, මේ ධර්මයන්ට හිත බැඳුනොත්, මේ ධර්මයන්ගේ සතුටු වුණොත්, මේ ධර්මයන්ගේ ඇත්ත නොදැක්කොත්, සසර හිටියොත්, ඉපදීම, ලෙඩවීම, මහළු බව, මරණය මේ ඔක්කොම ධර්මතා ඇති වෙනවා නම්, මේ රූපයට කියන්න වෙනවා ජාතිය ස්වභාව කොට, ජරාව ස්වභාවකොට, මරණය ස්වභාවකොට ඇති ධර්ම කියලා. ඒ කියන්නේ අපේ ඉපදීම,

ලෙඩවීම, මහළු බව, මරණය ගෙනත් දෙන්න පුළුවන් ධර්ම කියලා මෙනෙහි කරන්න පුළුවන්. ඒ වගේ උපදින උපදින විතර්ක දුක්ඛ සංඥාවෙන් බලන්න.

- ඊට පස්සෙ ඇහැට පෙනෙන ආයතන ටික ඇසුරු කරනකොටත්, ඇහැට පෙනෙන රූප, කනට ඇහෙන ශබ්ද, ආදී අරමුණු ඇසුරු කරන කොටත් දුකයි කියන සංඥාවෙන් බලන්න. මෙහෙම කරන කොට ඔන්න නීවරණ ධර්ම දුරු වෙනවා.

- ඊට පස්සෙ ආයෙත් නීවරණ ධර්ම දුරුවුණු නිසා ප්‍රමෝදය, ප්‍රමෝදය නිසා ප්‍රීතිය, ප්‍රීතිය නිසා පස්සද්ධිය නිසා සැපය කියන මේ ධර්මතා ටික.

✶ ✶ ✶

තව තියෙනවා අපි මුලින් කිව්ව විදිහටම සීලයක පිහිටලා එක තැනක ඉඳගෙන ඉන්නකොට වෙනම සමථ කමටහනකුත්, වැඩ කටයුතු කරද්දි වෙනම සමථ කමටහනකුත් ඇති කරගන්නවා.

ඒක උදව් කරගෙන 'අනාත්ම සංඥාවෙන්' බලනවා. අනාත්ම සංඥාවෙන් කියන්නේ හිතට පහළවෙන පහළවෙන හැම රූප නිමිත්තකම සත්ව පුද්ගල හැඟීම තියෙනවනේ. ඒ සත්ව පුද්ගල හැඟීම දුරුවෙන විදියට එතන පවතින ධර්මතාවය. 'නාමරූප ධර්මතාවයක්' හැටියට නුවණින් බලනවා.

- මම ඉස්සර මතක් කරන්නේ, යාළුවෙක් නම්, යාළුවා කියලා අපිට පුද්ගල සංඥාවක් තියෙන්නේ. ඒ යාළුවා කියපු තැන රූපය හිතෙන් අල්ලගන්නවා හොඳට. අපි කියමු සමන් කියලා, මොකද අපට ප්‍රඥප්තියත් එක්කමයි එන්නේ. සමන් කියන කොට අපට රූ සටහනක් පෙනෙනවා. දැන් ඒ අරමුණ හිතෙන් අල්ල ගන්නවා. සමන්ගෙ රූපය සිහි කරලා හිතෙන් අල්ලගෙන හොඳට නුවණින් බලනවා, එතැනද තියෙන්නේ කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, ලේ, නහර කියලා බලන කොට, පුද්ගලයා ඈඳෙන්නේ නැති විදියට බලන්න ඕනේ. ඒ කිව්වේ, දැන් අපි කෙස් ටිකක් කපලා අහකට දැම්මොත් කෙස් කියලා පෙනෙනවා, නමුත් පුද්ගලයා පෙනෙන්නේ නැහැනේ. ලොම් ටිකක් හූරලා අපි අහකට දැම්මොත් මේක ලොම් කියලා පෙනෙයි, නමුත් පුද්ගලයා පෙනෙන්නේ නැහැනේ. ඒ වගේ ශරීරයේ යම් යම් කොටසක් අහකට දැම්මොත් ඒ කොටස අපිට පෙනෙයි, පුද්ගලයා පෙනෙන්නේ නැහැනේ. මොකද තවම ලොම් කියන තැනක පිරිසිඳ නොදකිනවා කියලා මෝඩ කමක් ඇති. නමුත් ලොම් ටික පුද්ගලයෙක්ගේ වෙලා එන

කෙළෙසය දැන් අපි අයින් කරන්නේ. ලොම් ටික කියන තැන පිරිසිඳම දකින එක තමයි යථාභූතයෙන් කරන්නේ. තවම මේ මට්ටමේදි අතන තියෙන මෝහයත් අයින් කරන්න යන්න එපා. ඒක බැහැ. ඒක කරන්නේ කෙළවරේදි.

- එතකොට දැන් ඒ වගේ, ශරීරයෙන් අහකට වැටුණු කෙස් ටිකක්, කෙස් ටිකක් විදිහට පෙනෙනවා, පුද්ගලයා නොපෙනෙනවා වගේ, පුද්ගලයට ඈඳෙන්නේ නැති විදියට, යාළුවා කියන රූ සටහන හිතින් අල්ල ගත්තට, මෙනෙහි කරද්දි රූපෙට, කෙනාට, ඈඳෙන්නේ නැති විදියට, (දැන් මේ රූපය යාළුවාගේ නෙවෙයි, මේ රූපයේ තියෙන්නේ කෙස්. කෙස් කියන කොට කෙස් කියන ගතිය, පුද්ගලයා අහුවෙන්නේ නැති විදියට කෙස් කියන ගතියට හොඳට හිත තබන්න). ලොම්, නිය, දත්, හම්, මස්, නහර කියලා අනුපිළිවෙලින් හරි, ප්‍රකට ප්‍රකට කොටස් හරි බලන්න.

- බලලා කන බොන ආහාරය නිසා මේ රූපය හැදෙනවා නේද කියලා බලන්න. දැන්, සමන් කියලයි මුලින් අල්ලාගත්තේ. එහෙම බලපු තැන, මෙතැනද තියෙන්නේ කෙස්, ලොම්, නිය, දත්, හම්, මස්, නහර, ඇට මිදුලු ... ඔන්න භෞතික කොටස් ටික, කන බොන ආහාරය නිසයි මේ කොටස් හැදිලා තියෙන්නේ කියලා බලනවා. එතකොට දැන් මේ හැම කොටසක්ම හේතු ප්‍රත්‍යයි.

හැබැයි තවම ඒ වුණාට (කෙස්, ලොම්, නිය, දත් .. කියන කොටස් ටිකෙන් යුක්තයි, කන බොන ආහාරයෙන් තමයි හැදිලා තියෙන්නේ කියලා බැලුවට) මේ රූපයේ යෑමක් පෙනෙනවා, ආපහු ඒමක් පෙනෙනවා, කතා බහ කිරීමක් පෙනෙනවනේ. ඒ නිසා තව පුද්ගල සංඥාව වැඩි වෙන්න හේතුයි. ඒ නිසා තව ටිකක් නුවණින් බලනවා. මේ රූපය කෙස්, ලොම්, නිය, දත්, හම්, මස්, නහරින් යුක්තයි, කන බොන ආහාරයෙන් හැදිලා තියෙන්නේ, මෙබඳු වූ කය ඇසුරු කරගෙන ප්‍රතිසන්ධි වශයෙන් පැමිණි විඤ්ඤාණය මේ කයේ ඇසුරු වෙනවා, ඒ නිසයි මේ කය සවිඤ්ඤාණක.

ඒ කියන්නේ කන බොන ආහාර, (බත්, පාන්, කව්පි, මුං ඇට) කියන ටිකට හැඟීම් දැනීමක් නැහැ, මේ මේසෙ වගේ. එබඳු ආහාරය නිසා නම් මේ ශරීරයේ කෙස්, ලොම්, නිය, දත්, හම්, මස්, නහර හැදුනේ (කන බොන ආහාරය නිසා නම්) ඒ එක කොටසකටවත් හැඟීම් දැනීම් නැහැ. හැබැයි ඒ ආහාරයෙන් හැදුනු මේ කය ඇසුරු කරගෙන ප්‍රතිසන්ධි වශයෙන් පැමිණි විඤ්ඤාණය තියෙනවා.

- එතකොට එයා දන්නවා. ඒ කය ඇසුරු කරගෙන පවතින හිතටයි මේ හැඟීම් දැනීම් දැනෙන්නේ. එතකොට හොඳට දන්නවා කවදාවත් මේ අත අල්ලන්න බැහැ. ඒ කියන්නේ අතට දැනෙනවා නෙවෙයි. අත කියන රූපය හැදිලා තියෙන්නේ හම්,

මස්, ලේ, නහර වලින් කියලා දන්නවා, (කන බොන ආහාරයෙන් හැදෙන්නේ) ඒ කය ඇසුරු කරගෙන ප්‍රතිසන්ධි වශයෙන් පැමිණි විඤ්ඤාණය ඇසුරු වෙනවා. ඒ කයටයි කය ඇසුරු කරගෙන පවතින හිතටයි මේ දැනෙන්නේ, ඒ නිසයි මේ හැඟීම් දැනීම් දැනෙන්නේ කියලත් බලනවා.

- ඊට පස්සේ කය ඇසුරු කරගෙන ප්‍රතිසන්ධි වශයෙන් පැමිණි විඤ්ඤාණය ඇසුරු වෙනවා. ඒ හිත නිසයි මේ කයේ ඉදිරියට යෑම් ආපසු ඒම් වෙන්නේ. කන බොන ආහාරයෙන් යුක්ත මේ ශරීරයට මිම්ම තමයි මළ මිනිය. එතකොට එබඳු වූ මේ කය ඉදිරියට අරගෙන යන්නේ, ආපහු අරගෙන එන්නේ හිතෙන් උපද්දපු වායෝ ධාතුවේ බලයෙන්. 'චිත්ත කිරිය වායෝ' කියලා කියනවා ඊට පස්සේ බලනවා මේ කය ඇසුරු කරගෙන පවතින හිතටයි රූප පෙනෙන්නේ, මේ කය ඇසුරු කරගෙන පවතින හිතටයි ශබ්ද ඇහෙන්නේ කියලා හොඳට බලනවා. කවදාවත් පෙනෙන ඇහෙන දේ කයට ඉතුරු කරන්න එපා.

අපි මෙහෙම කිව්වොත්, දැන් මම මේ පුටුවේ ඉඳගෙන ඉන්නවා. පුටුව උපකාර වෙලා තියෙන්නේ මොකටද? මට ඉඳගෙන ඉන්න. පුටුවේ ඉන්න මම ඔය පින්වතුන්ව දකිනවා. දැන් පුටුවටත් පෙනෙනවාද? නැහැ. එතකොට පුටුවයි ඔය පින්වතුන් අතරයි තියෙන සම්බන්ධය මොකක්ද? මොකුත් නැහැ. පුටුව උපකාරයි මට ඉඳගෙන ඉන්න, පුටුවේ ඉඳගෙන ඉන්න මම ඔය පින්වතුන්ව දකිනවා, එහෙම නේද? මේ පුටුවට කිසිම අරමුණු වල පෙනීමක් එහෙම, දැකීමක් එහෙම වෙනවද? එහෙම සම්බන්ධයක් තියෙයිද? නැහැ.මේ පුටුව වගේමයි, අවිඤ්ඤාණකමයි, අචේතනිකමයි, මේ විදිහමයි භෞතික තත්වය, කන බොන ආහාරයෙන් හැදුනු මේ රූපය මේ විදිහමයි කියලා දකින්න.

- පුටුව උඩ මම ඉඳගෙන ඉන්නවා වගේ කය ඇසුරු කරගෙන මේ සිත පවතිනවා. ඒ කය ඇසුරු කරගෙන පවතින හිතෙනුයි මේ රූප දකින්නේ. ඒ හිතට කියනවා චක්ඛු විඤ්ඤාණය කියලා. මේ රූප දකින එකට කයේ කිසිම සම්බන්ධයක් නැහැ. ඒ හින්දා ඉඳගෙන ඉන්න මට රූප පෙනෙනවා කියලා මේ 'පෙනෙන දේට කය මිම්මක් හැටියට තබන්න එපා.' ඕක තමයි මේ කෙළෙසය වැඩිවෙන්න තියෙන ලොකුම හේතුව.

කය කන බොන ආහාරයෙන් හැදිලා තියෙන්නේ, හම්, මස්, ලේ, නහර වලින් යුක්තයි. කය ඇසුරු කරගෙන පවතින හිත, දැන් කයෙන් කරලා තියෙන උපරිම වැඩේ මොකක්ද, හිතට නවාතැන් දීලා. නවාතැනක් විතරයි. මේක ගෙයක්, විඤ්ඤාණයට ගෘහයක්. අපි අව්වට වැස්සට නොතෙමී ඉන්න මේ ගෙයක් හදාගත්තා වගේ, ගේ අපිද?

නැහැ.

ඒ වගේ **කර්මයෙන් තමාට ඉන්න ගෙයක් හදාගත්තහම ඒ ගේ තමන් නෙවෙයි. ඇත්තටම පුද්ගලයා, සත්වයා, කෙනා කෙනා කියලා අපිට කතා කරනවා නම් කරන්න වෙන්නේ මේ චිත්ත චෛතසික ටිකට. ඒකත් අනාත්මයි.** (නමුත් දැනට, ඕදාරික මට්ටම, රූපයට සාපේක්ෂව මේ ගේ නවාතැනක් විතරයි. තමන්මයි හදා ගත්තේ) මේ විඤ්ඤාණය ප්‍රතිසන්ධි වශයෙන් මහාභූත රූපය ඇසුරු කරමින් ඉඳලා, තමන්ට ඕනෙ හැඩයට තමන්ට ඕනෙ විදියට, තමන්ගේ සිතුවිලි වලටයි මේ රූපය හදාගත්තේ.

අපි කෙනා කෙනාට ඕනෙ විදියට නේ අපි අපේ ගේ හදාගන්නේ, නේද? ඒ විදියට මෙයා මෙයාට ඕනෙ විදිහට තමයි මේ ගේ හදාගත්තේ, කර්මානුරූපව. දැන් ඒ ගේ, මේ සිතට නවාතැනක් විතරයි. ඒ ගේ නතරවෙලා ඉන්න අපි ජනේලෙන් එළිය පැත්ත බලනවා, දොරෙන් එළිය පැත්ත බලනවා වගේ, ඇහැ, කන, දිව, නාසය, ශරීරය, කියන්නේ කවුළු හයක් මේ ගෙයි, ජනෙල් හයක්. මේ ජනෙල් වලින් එළියට ඔලුව දාලා, රූප, ශබ්ද, බලනවා, අහනවා වගේ තමයි මේ විඤ්ඤාණයෙන් තමයි, කය ඇසුර කරගෙන පවතින හිතෙන් තමයි මේ වැඩ කරන්නේ හැම වෙලාවෙම.

කයේ පිහිටලා ඉන්න, කය ඇසුරු කරගෙන පවතින හිතටයි රූප පෙනෙන්නේ කියලා බලනවා. කයට පෙනෙන දේ කිසි මිම්මක් නැහැ.

එතකොට මෙහෙම ඉන්නකොට අපිට බලන්න පුළුවන් වෙන්න ඕනේ, මේ 'ඉදිරියෙන් ඉන්න කෙනා බලාගෙන ඉන්නවා' කියලා කයට ඇඟිල්ල දික් කරන්නේ නැතුව, කන බොන ආහාරයෙන් යුක්තයි රූපය. (ඔන්න දැන් රූපෙට පෙනෙන්නේ නැහැ මොකුත්ම) **කය ඇසුරු කරගෙන පවතින හිතෙන් දැන් මේ රූප නිමිත්ත අරගෙන ඉන්නවා කියලා හොඳට පෙනෙනවා. එතකොට 'බලන්නා' ඉතුරු වෙන්නේ නැහැ** එයාට. 'මොකද මා දිහා බලන්නේ? කියලා රණ්ඩුවෙන්න පුළුවන්ද? **ඇයි දැන් කයට පෙනෙන්නේ නැත්නම්, පෙනෙන හිත අවස්ථාවට හටගෙන නිරුද්ධ වෙනවා නම් කා එක්කද රණ්ඩු කරන්නේ?** මේ කයයි, පෙනෙන හිතයි දෙන්නා එකට එකතු කරලා පුද්ගලයෙක් හැටියට හිතාගෙන නේ බලන්නේ.

- එතකොට මේ කයේ අනාත්ම ස්වභාවය හොඳට පිහිටනවා, කය ඇසුරු කරගෙන පවතින නාමධර්ම ටිකත් බලන්න. එහෙම බලන කොට කය ඇසුරු කරගෙන පවතින හිතටයි ශබ්ද ඇහෙන්නේ. තව ටිකක් ඕනෙ නම් තමන් නුවණින් තර්කානුකූලවත් හිතලා බලනවා, ඇත්තටම කෙනෙක් මැරුණා කියලා කියන්නේ,

විඤ්ඤාණය නිරුද්ධ වුණු එකනේ. එදාට රූප පෙනෙන්නේ නැහැ, ශබ්ද ඇහෙන්නේ නැහැ, ගඳ සුවඳ දැනෙන්නේ නැහැ. එදාට මේ හැඟීම් දැනීම් නැහැ. යන්න එන්න බැහැ. එහෙනම් ඇත්ත තමයි, අදත් හිත නිසා තමයි මේ දේවල් වෙලා තියෙන්නේ කියලා තවත් ඕනෙ නම් ටිකක් හිතට අල්ලලා දෙනවා.

එතකොට තමන්ට මේ කය කියන එක, සම්පූර්ණ හිතට නවාතැනක් දුන්නු කෘත්‍යයක් විතරක් කරන, ගෙයක් විතරක් වුණු බාහිර වස්තුවක් විතරක් වෙනවා. ඒ කය ඇසුරු කරගෙන පවතින හිත නිසා යෑම් ඊම් ආදී ක්‍රියා ටිකක් කෙරෙනවා. මේ කය නාමධර්ම ටිකට උපකාර ලබලා දීලා තියෙනවා. කයේ පිහිටලා ලබපු සිත මේ වගේ ක්‍රියාකාරකම් ටිකක් කරනවා. මේ නාම-රූප දෙකේ තත්වාකාරය නොදන්නා කම නිසා, නොදකින කම නිසා මේ ආත්ම සංඥාවක් ඇති වෙලා තියෙනවා නේද කියලා තමන්ට තේරෙනවා.

- එතකොට **කයේ අනාත්ම ස්වභාවය, කය ආහාර නැමැති හේතූන්ගෙන් හටගත්ත එකක්, ඒ නිසා හේතුප්‍රත්‍යයයි. මෙතන තියෙන හිත අවිද්‍යා කර්ම තණ්හා කියන හේතූන්ගෙන් හටගත්ත එකක්, ඒ නිසා හේතුප්‍රත්‍යයයි. මේ හිතයි කයයි දෙක ඵලයක්. දෙපැත්තකින් හේතූන් දෙකක් නිසා පැමිණි ඵල දෙකක්. ඒ දෙකේ ඔවුනොවුන්ට සම්බන්ධීව ඇති ක්‍රියාකාරීත්වය පිරිසිඳ නොදන්නා කම නිසයි මේ පුද්ගල භාවය තියෙන්නේ.** එතකොට අපි කයේ ස්වභාවයේ පිහිටනවා,

තවත් තහවුරු මදිනම් කය ඇසුරු කරගෙන ඉන්න නාමධර්ම ටිකත් බලනවා. බලලා එතකොට මෙන්න මේ නාම-රූප දෙක තියෙන තැනක ඇත්ත නොදන්නා කම නිසා මේ යාළුවා කියන අදහස ඇති වුණා කියලා බලන්න ඕනේ ඔය විදියට බලනවා.

- ආයෙත් ආනාපාන සතිය වඩනවා, ආයෙත් ඊගාවට සත්ව පුද්ගලභාවයට සිහිවෙන තව අරමුණක් ගන්නවා. එක අරමුණක් බලද්දි තව සත්ව පුද්ගල හැඟීම් එන්න පුළුවන්. මේ බල බලා ඉන්න එක අත හැරලා අනිත් ඒවා අල්ලගන්න යන්න එපා. ඒවා නොසලකා හැරලා බලපු එකම විනාඩි දහයක්, පැය භාගයක්, පැයක් ගෙවලා හරි, ඒකේ පුද්ගලභාවය ඉවරවෙන තැන දක්වාම හෙමින්, විවේකයෙන්, බලලම අවසන් කරනවා.

- ඊට පස්සේ තව සත්ව පුද්ගල භාවයට සිහිවෙන අම්මා හරි තාත්තා හරි, දුව පුතා හරි සිහිවෙන එකක් ගන්න. අරගෙන ඒකෙත් ආහාරයෙන් හැදුනු කයත් කයේ ස්වභාවයත් වෙනම බලනවා. කය ඇසුරු කරගෙන පවතින හිත වෙනම බලනවා. හේතුප්‍රත්‍යයි. ඒ කය ඇසුරු කරගෙන පවතින හිතින් කරන වැඩ ටිකත් බලනවා. මේ

ධර්මතාවය නොදන්නා නිසා පුද්ගල සංඥාවක්, කෙනෙක් කියන අදහසක් ඇසුරු වෙනවා නේද කියන එක දකිනවා. මේ හිතවත්, මේ කයවත්, මේ හිතයි කයයි දෙකෙන් එකක්වත්, මේ දෘෂ්ටිය නෙවෙයි. වස්තුව දෘෂ්ටිය නෙවෙයි, දෘෂ්ටිය වස්තුව නෙවෙයි. **වස්තු නිසා දෘෂ්ටි.** වස්තූන්ගේ තත්වාකාරය නොදන්නා කම නිසා.

- ඊට පස්සේ ඒ විදියටම තමන් කියන තැනත් බලනවා. කන බොන බත්, පාන්, කව්පි, මුං ඇට දිහා හොඳට බලනවා. ඒවා සත්ව පුද්ගල කොටස් නෙවෙයි. ඒ නිසා මේ ශරීරයේ තියෙන හැම කොටසක්ම හැදිලා තියෙන හැටි හොඳට බලනවා. එබඳු කය ඇසුරු කරගෙන ප්‍රතිසන්ධි වශයෙන් පැමිණි විඤ්ඤාණය මෙතැන ඇසුරු වෙනවා. කය ඇසුරු කරගෙන පවතින හිතටයි මේ රූප පෙනෙන්නේ.

දැන් හොඳට දන්නවා මේ කය ඇසුරු කරගෙන පවතින හිතටයි රූප පෙනෙන්නේ. මේ කයට පෙනෙනවාවත් පෙනෙන දේ කයට සම්බන්ධයක්වත් එහෙම නෙවෙයි. මේ නාම-රූප දෙක නොදන්නාකම නිසා මම කියන දෘෂ්ටියක් ඇති වෙලා තියෙනවා නේද? එයද හේතුප්‍රත්‍යයි.

- කය මම කියලා බලන්නෙත් නැහැ, කය මම නෙවෙයි කියලා බලන්නෙත් නැහැ. හිත මම කියලා බලන්නෙත් නැහැ, මම නෙවෙයි කියලා බලන්නෙත් නැහැ. හිතයි කයයි දෙකේ ඇත්ත නොදන්නා කම නිසා 'මම' කියන දෘෂ්ටියක් ඇති වෙලා තියෙනවා. ඒ අවිද්‍යා ප්‍රත්‍යයෙන්.

- ඔය විදියට ටික ටික හිතනවා, හිත හිත අර සමථ කමටහන වඩනවා. ඒ විදියට අනාත්ම සංඥාවෙන් බලනවා.

සමාධිගත සිතකට අරමුණු වන
යථාභූත ඥාණ දර්ශනය

දැන් ඔහොම බලනකොට, බලනකොට පුද්ගල සංඥාව ටික ටික ගෙවෙනවා. ගෙවෙන කොට ඇලීම් ගැටීම් දෙක නැති වෙනවා. නීවරණ ටික නැති වෙනවා. ඒ නීවරණ නැති වුණු නිසා හිත ප්‍රමෝදයට පත් වෙනවා. ප්‍රමෝදය නිසා පස්සද්ධිය, පස්සද්ධිය නිසා සැපය. **එදාට ඇත්ත ඇතිහැටියේ දකිනවා.**

මෙතැනදි අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බලන කාළේදි රළු කයක් හම්බ වුණා. ඕදාරික කයක් හම්බ වුණා. රළු ඕදාරික කයක තමයි අනිත්‍ය, දුක්ඛ, අනාත්ම අපි බැලුවේ.

ඊට පස්සේ ඒ ටික වඩන කොට **නීවරණ ධර්ම දුරුවෙලා හිත සමාධි වුණහම, යථාභූත ඥාණ දර්ශනය එන්නේ රළු කයකින් නෙවෙයි. දිට්ඨ, සුත, මුත, විඤ්ඤාත කියන දකින, අහන, දැනෙන, දැනගන්න කියන මේ අරමුණක් අරමුණක් ගානෙ ඇත්ත දකින එකයි එන්නේ.**

එතකොට තමයි ***යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං*** කියන ස්පර්ශ ආයතන හයම පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුව නැති වෙනවා කියන එක දකින්න පුළුවන් මට්ටමට එන්නේ.

ඒ නිසයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ 'මේ අනිත්‍යයි කියලා මෙනෙහි කරන කොට ප්‍රමෝදය ඇති වෙනවා, දුකයි කියලා මෙනෙහි කරන කොට ප්‍රමෝදය ඇති වෙනවා. අනාත්මයි කියලා මෙනෙහි කරනකොට ප්‍රමෝදය ඇති වෙනවා' ඒකෙදි රූපය අනිත්‍යයි දුකයි අනාත්මයි කියලා මෙනෙහි කරන්න පුළුවන්, වේදනාව අනිත්‍යයි, දුකයි, අනාත්මයි කියලා මෙනෙහි කරන්න පුළුවන්, සංඥාව අනිත්‍යයි, දුකයි, අනාත්මයි කියලා මෙනෙහි කරන්න පුළුවන්. සංඛාරය, විඤ්ඤාණය මේ විදියට මෙනෙහි කරන්න පුළුවන්. නැත්නම් ඇහැ, කන, දිව, නාසය, ශරීරය, මේ එකින් එක, එකින් එක ඕනෙ විදිහකට බලන්න පුළුවන්.

බලලා කොයි විදිහකින් ගත්තත් අන්තිමට එන්නේ නීවරණ ධර්ම දුරුකරනවා කියන ටික විතරයි අපට කරන්න පුළුවන්. ඒ නිසා වැඩෙන්න ඕන ධර්මතා ටික තියෙනවා.

එතකොට මෙන්න මේ විදියට නිවැරදිව අපි ක්‍රමය දැනගෙන ගියොත්, අපිට ඇත්තටම මේ ජීවිතයේදීම මේ සත්‍යය අවබෝධ කරගන්න පුළුවන්. මේ නිවන් දකිනවා කියලා කිව්වේ සත්‍යය අවබෝධයක්. බුදුරජාණන් වහන්සේ පහළ වුණත් නැතත් මේ ලෝකයේ පවතින ඇත්තක් කියලා එකක් තියෙනවා. ලෝකය කියන කොට පංච උපාදානස්කන්ධ ලෝකය. ඇත්තක් කියලා එකක් තියෙනවා. ඒ ඇත්ත නොදන්නා කම නිසයි වැරදි දැකීම. සත්ව පුද්ගල සංඥාව. ඒ වැරදි දැකීම නිසයි, මේ දිට්ඨිය නිසයි මේ තණ්හාව, මානය කියන කෙළෙස් ඇති වෙලා තියෙන්නේ. ඒ තණ්හා, මාන කියන කෙළෙස් ටික නිසයි නැවත ආපසු සසරට යන්නේ. ආයෙත් එතැන ඇත්ත ඇති සැටිය නොදකින නිසා වැරදි දැකීම, වැරදි දැකීම නිසයි ආයෙත් තණ්හා, මාන, දිට්ඨි කෙළේසය, ආයෙත් කෙළේසය නිසා සසර, මේ ගමනේ කෙළවරක් නැහැ.

මේ ගමනෙ යම් දවසකදි ඇත්ත ඇති හැටියේ දැක්කොත් වැරදි දැකීම නැහැ. එතකොට සත්ව පුද්ගලභාවයෙන් උපදින තණ්හා, මාන, කෙළෙස් නැහැ. කෙළෙස් නැත්නම් නැවත මේ ස්කන්ධයන්ගේ පහළ වීමක්, ඉපදීමක් නැහැ. නැවත භවයට යන්න තියෙන හේතු ටික නැති කරලා,ඇත්ත ඇති හැටියේ දන්නාවූ, දක්නාවූ තැනින් ජීවත් වෙනවා.

✶ ක්ලේශ පරිනිර්වාණයෙන් උපන් ස්කන්ධ පරිනිර්වාණය

එතකොට ඇත්ත ඇති හැටියේ දන්නාවූ දක්නාවූ නුවණක් එක්ක පවතින ඇත්තක් තිබුණා නම්, ඒ ටිකත් ආයු සන්තතිය නැති වෙන කොට නැති වෙනවා. නැවත යන්න තියෙන හේතුව කලින්ම නැති කරලා, පහණක් නිවුනා වගේ නිවෙනවා.

ඇත්ත ඇති හැටිය දන්නා වූ දක්නා වූ නුවණකින්, ඇත්ත ඇති හැටිය පවතින ධර්මතාවය තුළ ජීවත් වෙන එකට කියනවා 'දැකලා, වැරදි දැකීමෙන් මිදිලා, තණ්හා, මාන, දිට්ඨි කියන කෙළෙසයන්ගෙන් මිදිලා, සත්ව පුද්ගල හැඟීමෙන් මිදිලා, සත්ව පුද්ගල දුකෙනුත් මිදිලා ජීවත් වෙන ටිකට කියනවා **සෝපදිශේෂ නිබ්බාන** කියලා. නැත්නම් **ක්ලේශ පරිනිර්වාණය** කියනවා. කෙළෙස් ටිකයි නැති වුණේ කෙළෙස් ටික නිසා එන දුකද නැති වුණා.

ඇත්ත ඇති හැටිය දන්නාවූ, දක්නාවූ නුවණක් සමඟ පවතින 'ඇත්ත ඇති හැටිය වූ ස්කන්ධ ටික', පුරාණ කර්ම ප්‍රත්‍යයෙන් හටගත්තේ. ඒ ටිකේ ආයු සන්තතියක් තියෙයි. ***ඛිනං පුරාණං*** කියලා කිව්වේ පුරාණ කර්මය ක්ෂය වෙනවා කියලා අපි මැරෙණවා කියන තැන, නැත්නම් පිරිනිවන් පානවා. මේ ආයුෂය ගෙවිලා ඒ ස්කන්ධ ටිකත් නිරුද්ධ වෙනවා. එදාට කියනවා. **අනුපදිශේෂ නිබ්බාන** කියලා. ස්කන්ධයෝද ශේෂයක්වත් ඉතිරි නැතිව නිරුද්ධ වෙනවා. අනුපාදා පරිනිර්වාණය, මෙතෙන්ට කියනවා පංච උපාදානස්කන්ධ දුකෙන් මිදුණා. මෙතනදි ස්කන්ධ දුකෙන් මිදෙනවා. **ස්කන්ධ පරිනිර්වාණය**.

කෙළෙස් සහ ස්කන්ධ කියන දෙකකින් අපි දුක් විඳිනවා. මුලින් කෙළෙස් ටික නැති කිරීමෙන් දුකෙන් මිදෙනවා, (එක්තරා දුක් කොටසකින් මිදෙනවා) ඊට පස්සේ ස්කන්ධ ටිකෙන්ද මිදිලා ස්කන්ධ ටිකෙන් එන දුකෙන්ද මිදෙනවා. එතකොට දුක්ඛ නිරෝධය සාක්ෂාත් කළා කියනවා.

කෙළෙස් ටික නැති කිරීමෙන් සත්වයෙක් ඉපදීම නිසා, ලෙඩවීම නිසා, මහළුවෙන නිසා, මරණය නිසා ***තේසං තේසං සත්තානං තම්හි තම්හි සත්ව නිකායේ*** කියලා පෙන්නපු තැනකින් උපදින දුකෙන් මිදෙනවා. ස්කන්ධ ටික නැතිවෙන දවසෙදි ***තේසං තේසං ධම්මානං ජරා ජීරණතා*** කියලා.

'ඒ ඒ ධර්මයන්ගේ ජරා ජීරණතාවයක් තියෙනවා. ස්කන්ධ පරිහරණයේ දුකක් තියෙනවා. කය කෙළවර කොට, දිවි කෙළවර කොට ඇති දුකක් තියෙනවා. ඒ දුකෙන්ද මිදෙනවා.

ඒ නිසා මේ නිවන දෙයාකාරයකින් අර්ථ දක්වනවා, සෝපදිශේෂ නිබ්බාන සහ අනුපදිශේෂ නිබ්බාන කියලා. 'නිබ්බාන' කියලා කිව්වේ වෙන මොකුත් නෙමෙයි 'අජරාමර බව', ජරා මරණ නැහැ.

සත්වයෙක් පුද්ගලයෙක්ගේ ජරා මරණයෙන් මිදෙනවා මේ රූපය පිරිසිඳ දැකලා, සත්ව පුද්ගල දෘෂ්ඨිය දුරුවෙන කොට, සත්ව පුද්ගල භාවයෙන් එන දුකෙන් එයා මිදෙනවා. දරුවා මැරුණු නිසා, අම්මා තාත්තා මැරුණු නිසා, තමන් ලෙඩ වුණු නිසා තමන් මැරුණු නිසා එන දුක් ටිකෙන් මිදෙනවා. මොකද සතර මහාධාතු ලෙඩවුණෝ, මැරුණෝ කියලා අඬනවයැ නේද?

නමුත් සතර මහා ධාතුවේ විපරිනාම බවක් තියෙනවා නම්, ඒ නිසා යම් වෙහෙසක් තියෙනවා නම් බොහොම ටිකයි ඒ වෙහෙස. ඒ විපරිනාම බව නිසා අපහසු කම් එන්න පුළුවන්. ඒකට කියනවා ***තේසං තේසං ධම්මානං ජරා ජීරණතා*** කියලා. **ඒ ධර්මතාවයක්. දැන් පුද්ගලයෙක් නැහැ, සත්වයෙක් නැහැ. ඒ ස්කන්ධයන්ගේ හැටි. ඒ වේදනාවේ හැටි, ඒ ටික විඳින්න වෙනවා.**

ඊට පස්සේ ඒ ටිකත් නැති වෙනවා. කෙළෙස් නැති කරපු නිසා මතු ගමනකුත් නැහැ. සියළුම ආකාරයෙන් දුකේ නිරෝධයට 'නිවනයි' කියලා කියනවා. ඒකයි දැන් 'ලෝකයාට මරණය' වෙන තැන, 'ජීවිතයේ සදාතනිකම සැනසිල්ල පූර්ණ වශයෙන්ම අත් විඳින තැන, ජීවිතයේ වාසනාවන්තම අවස්ථාව' වෙනවා එයාට, මේ මරණය, නැත්නම් ස්කන්ධ ටික නැතිවීම. ඇයි පංච උපාදානස්කන්ධ දුක, ජරා මරණ දුක, සත්ව පුද්ගලභාවයෙන් එන දුකෙන් මිදුණාත්, තව දිවි කෙළවර කොට ඇති, කය කෙළවර කොට ඇති දුකක් තියෙනවනේ. මෙයාට මරණයක් නෙවෙයි, මේ ස්කන්ධයන්ගේ නැතිවීම මෙයාට මංගල කාරණාවක් වෙනවා. අමෘතයක් වෙනවා.

ඊකනේ අපි වෙසක් එක සමරන්නේ බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල කියලා. ඉපදීම, බුද්ධත්වයට පත්වීම, පිරිනිවන් පෑම, අපිට මංගල කාරණාවක් නෙවෙයි. මොකද බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑම අපිට මංගල කාරණාවක්ද? ඉපදීම, බුදුවීම අපිට මංගල කාරණාවක්. බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑමත් අපිට මංගල කාරණාවක්ද? නැහැ. ඒ නිසා මේ අපේ තෙමඟුල නෙවෙයි, 'බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල.'

ඉපදීමත් බුදුරජාණන් වහන්සේට මංගල කාරණාවක්, ඉපදුණු නිසයි සසර ගමන නතර කරගන්න පුළුවන් වුණේ. බුද්ධත්වයට පත් වීමක් බුදුරජාණන් වහන්සේට මංගල කාරණාවක්, පිරිනිවන් පෑමත් බුදුරජාණන් වහන්සේට මංගල කාරණාවක්. සියළුම දුකෙන් නිදහස් වුණු මොහොත. ඒ නිසා 'බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල' සමරනවා අපි. අපිත් මෙහෙම වෙන්න ඕනේ, මෙහෙම කරගන්න ඕනේ කියන තැනකින්.

ඒ වගේ කෙනෙක් පිරිනිවන් පානවා කියන්නේ, ජීවිතේ උතුම්ම කාරණාවක් ඉතින් ඒ උතුම්ම මංගල කාරණාව මේ ජීවිතයේදීම සාක්ෂාත් කරගන්න මේ පින්වතුන්ටත් මේ දේශනාව හේතු උපනිශ්‍රයම වේවා!.

අන්ත වලින් මිදී මැදද නොතැවරී, සැබෑමවු 'තණ්හාව' ඉක්මවීම
(මජ්කෙඩ සූත්‍රය ඇසුරෙන්)

පින්වතුනි, අපේ බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ ඉන්න කාලේ, එක්තරා සිටු යුවලක් හිටියා. මේ සිටු යුවලට හිටියා දරුවො දෙන්නෙක්. ලොකු පුතාගේ නම තිස්ස. යාන්තම් මේ ලොකු පුතා අවුරුදු දාහතරක් පහළොවක් වගේ වෙන කාලේ වෙනකොට, ඒ දෙමව්පියො දෙන්නම හදිස්සියේ රෝගයක් හැදිලා මරණාසන්න මොහොතට පත්වුනා. ඒ මරණාසන්න අවස්ථාවෙදි ලොකු පුතාව ළඟට කතා කරලා කියනවා, 'අනේ පුතේ, සමහර විටෙක තව නොබෝ දවසකින් අපි කළුරිය කරන්න පුළුවන්, මේ මල්ලිට අපි නැති පාඩුව දැනෙන්නට නොදී මල්ලිව හොඳින් බලාගන්න' කියලා අවවාද කරලා, නොබෝ දවසකින් මේ දෙමව්පියො දෙන්නා කළුරිය කලා.

ඊට පස්සෙ ඒ තිස්ස මොකද කරන්නෙ, තමන්ගේ ඉගෙනීම් කටයුතු හැම දෙයක්ම පැත්තකින් තබලා, අර මල්ලිව යහපත් කෙනෙක් කරන්න, මල්ලිට දුකක් නොදී ජීවත් කරවන්න ඕනෙ නිසා, මල්ලි වෙනුවෙන් ජීවිතය කැප කලා. මේ විදියට කටයුතු කරලා ටිකක් වැඩිහිටි බවට පත් වුනාට පස්සෙ, අයියා දෙමව්පියන්ට වුනු පොරොන්දුව නිසා තමන් ගැනවත් බලන්නෙ නැතුව, මල්ලිට ආවාහ විවාහ කටයුත්තක් කරලා දීලා, තමන් සතු දේපල වස්තුවෙන් බාගයකුත් මල්ලිට දුන්නා. මේ කාලෙ බොහෝ සෙයින් සෙනඟ පුරුදු වෙලා හිටියා සැවැත් නුවර ජේතවනාරාමයට ගිහිල්ලා බුදුරජාණන් වහන්සේගෙන් බණ අහන්න සවසට. ඒ බණ අහන පිරිසත් එක්ක මේ තිස්සත් යන්න පුරුදු වෙලා හිටියා.

කාලයක් යනකොට මේ තිස්සට තේරුනා, මේ සසරෙ ඇති දුක් සහගත බව, සසරෙ ඇති භයානක කම තේරිලා දවසක් ධර්ම දේශණාවෙන් පස්සෙ ඔක්කොම උදවිය

යනකල් ඉඳලා අන්තිමට බුදුරජාණන් වහන්සේ ළඟට ගිහිල්ලා කියනවා, 'ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මට පැවිදිවෙන්න ඕනෙ, මාව පැවිදි කරවන්න' කියලා. ඒ වෙලාවෙදි බුදුරජාණන් වහන්සේ මතක් කරනවා 'තිස්ස, අවසරයකින් තොරව කෙනෙක්ව පැවිදි කරන්න තහනම්. ඔබට අවසර අරගෙන එන්න කව්රු හරි ඉන්නවද? 'ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මට කව්රුත් නැහැ, නමුත් එක මල්ලි කෙනෙක් නම් ඉන්නවා'. 'එහෙනම් තිස්ස ගිහින් මල්ලිට කියලා එන්න මහණ වෙන්න ඕනෙ බව'.

ඒ පාර 'හොඳයි' කියලා මෙයා ගෙදර ගිහිල්ලා මල්ලිට කියනවා 'මල්ලි මට මහණ වෙන්න ඕනෙ, ඒකට අවසර දෙන්න' කියලා. ඒ පාර මේ මල්ලි නොයෙක් කරුණු කියලා අඬනවා, 'අනේ අයියෙ අම්මා නැති මට අම්මා වුනෙත් අයියා, තාත්තා නැති මට තාත්තා වුනෙත් අයියා, නෑදැයෙක් සහෝදරයෙක් නැති මට නෑදෑයෙක් සහෝදරයෙක් වුනෙත් අයියා, අනේ අයියේ යන්න එපා' කියලා නැවත නැවත කාරණා කියන කොට, අයියා කියනවා 'මට පුළුවන් විදියට ජීවිතයේ හැම දෙයක්ම අඩුපාඩුවක් නොකර මම මල්ලිව බලා ගත්තා, ඒ කරපු උපකාර වලට මට උපකාරයක් කරනවනම් මට මහණ වෙන්න යන්න අවසර දෙන්න' කියලා. එහෙම කිව්වහම කොහොම හරි මල්ලි අකමැත්තෙන් නමුත් කැමැත්ත දුන්නා. ඊට පස්සෙ මේ තිස්ස ගිහිල්ලා ජේතවනාරාමයේ ඉන්න බුදුරජාණන් වහන්සේ ළඟට ගිහින් මහණ වුනා. මහණ වෙලා බොහොම වත් සපන් ස්වාමීන් වහන්සේ නමක් හැටියට බණ භාවනා කරනවා.

නමුත් දන්නා හඳුනන අය නිතරම මේ තිස්ස හාමුදුරුවන්ව හම්බ වෙන්න එනවා. මේක කරදරයක් නිසා තිස්ස හාමුදුරුවො සැවැත් නුවරට ටිකක් ඈතට ගිහිල්ලා එක්තරා පිටිසර ගමකට ගිහිල්ලා ඒ ගමේ කැලෑවක තියෙන ගල්ලෙනක වාසය කරනවා. පිණ්ඩපාතෙ කරගෙන ඇවිල්ලා අප්‍රමාදීව රෑ දවල් දෙකේ භාවනා කරමින් ජීවත් වෙනවා. ඒ වෙලාවෙදි අර තිස්සගෙ මල්ලිගෙ බිරිඳ කල්පනා කරනවා, 'තිස්ස මහණ වුණ එකෙන් නම් අපිට වුනේ හරිම යහපතක් තමයි, මොකද එයා මහණ වුණ නිසා එයාගෙ දේපලත් අපිට ඔක්කොම අයිති වුනා. බැරිවීමකින් හරි පැවිද්දෙ කළකිරිලා ආවොත් මේවා ආපහු එයාට දෙන්න වෙනවා. ඒ හින්දා ආපහු එන්න බැරි විදියක් කරන්න ඕනෙ' කියලා, අර මල්ලිටත් නොතේරෙන විදියට රහසින් මොකද කරන්නෙ, හොරු කණ්ඩායමක් ගෙන්නගෙන හොරුන්ට අල්ලස් දීලා, මුදලක් දීලා, 'මෙතන මුදලක් තියෙනවා, මේ ටිකයි තියෙන්නෙ, තව ඔයිට වඩා ලොකු මුදලක් දෙනවා, අහවල් ගමේ අහවල් ගල්ලෙනේ ඉන්නවා හාමුදුරු නමක්, ඒ හාමුදුරු නමව මරලා එන්න' කියලා කිව්වා.

ඒ පාර මේ හොරු කණ්ඩායම, අර තිස්ස හාමුදුරුවො ඉන්න ගල්ලෙනට ආවා, හාමුදුරුවන්ව මරන්න කියලා. එනකොටත් හාමුදුරුවො සක්මන් මලුවෙ සක්මන් භාවනාව

කරමින් ඉන්නවා. මේ වෙලාවෙදි හොරු වටකර ගත්තහම, උන්වහන්සේ අහනවා 'ඇයි උපාසකවරුනි' කියලා 'අපි ආවෙ ඔබවහන්සේව මරන්න'. 'මාව මරන්නෙ ඇයි? මාව මැරුවම ඔයගොල්ලන්ට තියෙන යහපත මොකක්ද' 'ඔබවහන්සේව මැරුවහම අපිට විශාල මුදලක් හම්බ වෙනවා' 'හොඳයි එහෙමනම්, මට එක දවසක් ජීවිතය දෙන්න, අද මාව මරන්නෙ නැතුව හෙට මරණ්න' ඒ වෙලාවෙදි හොර නායකයා කියනවා 'හාමුදුරු නමක් වුනත් තියෙන කපටිකම බලන්න, අද මරණ්නෙ නැතුව හෙට මරණ්න කියලා කියන්නෙ මේ පැනලා යන්නද කොහෙද, එහෙම නෙවෙයි දැන්මම මරණ්න ඕනෙ' කියලා කඩුව උස්සලා ගන්නකොට, 'මරණ්න එපා මම පැනලා නොයන බවට ඇපයක් වෙන්නම්' ඊට පස්සෙ කියනවා, 'මේ මහ කැලේ ඔබට ඇප වෙන්නෙ කව්ද?' මේ වෙලාවෙදි තිස්ස හාමුදුරුවො සක්මන කෙළවර ඉඳගෙන, මහා විශාල කළු ගලක් අරගෙන දෑත ඔසවලා මේ කකුල් දෙකට ගහලා, කලවෙ ඇට දෙක බිඳගන්නවා. 'ඇවැත්නි, පැනලා නොයන බවට මේ ඇපය ඇද්ද' කියලා අහනවා. හාමුදුරුවන්ගේ මේ ක්‍රියාව දැකලා සංවේගයට පත් වුණු හොරු පවා 'අනේ ස්වාමීනී අපට සමාවෙන්න' කියලා වැඳලා ගියා.

මම මේකෙන් මතක් කළේ පින්වතුනි, එදා ඒ තිස්ස හාමුදුරුවො දැනගෙන හිටියා, ඒ මේ අත දුවන සැරිසරන සංසාරෙ හිටියොත් කකුල් වල ඇට කැඩෙන වාරවල් කියන්න බැරි බව දැනගෙන හිටියා. එවගේම වැදෙන කඩු කිණිසි පහරවල් මෙච්චරයි කියන එක සසරෙ හිටියොත් ගණන් කරන්න බැරි තරම් කියලා දැනගෙන හිටියා. ජීවිතය කියන එක මෙන්න මෙච්චරයි දුක කියලා නිමා කරන්න බැහැ, මනින්න බැහැ කියලා තිස්ස හාමුදුරුවො දැනගෙන හිටියා. ඒ තිස්ස හාමුදුරුවො දැනගත්තා 'ඉතින් මම ජීවිතය රකින්න, දහම අතහැරලා ජීවිතය රකින්න හරි කියන අදහසින් දහම අත හැරියොත්, ආපසු මේ සසරෙට වැටෙනවා. ඉතින් මගෙ මේ එක ජීවිතයක කකුල් දෙක කැඩුනට කමක් නැහැ, මට අප්‍රමාදීව මේ දහමේ හැසිරගන්න පුළුවන් වුනොත්, මුළු සසරකදීම කකුල් කැඩෙන එකෙන් මම බේරෙනවා නේද' කියලා හිතුවා. එහෙම හිතලා මේ කකුල් දෙක ඒ විදියට කලවා ඇට බිඳගෙන ඒ වේදනාවම අරමුණු කරගෙන භාවනා කරලා පහුවදා උදේ සිව්පිළිසිඹියාපත් මහ රහතන් වහන්සේ නමක් හැටියට අරහත්වයට පත් වෙලා පිරිනිවන් පෑවා කියලා ධර්මයේ සඳහන් වෙනවා.

පින්වතුනි, මේ දුවන්නන් වාලෙ දුවන සමාජයට නම් මේ දහමේ වටිනාකමක් තේරෙන්නේ නැහැ. ජීවිතයක යථාර්ථය තේරෙන්නේ නැහැ.

ආහාර පාන සොයා ගැනීම, එවගේම නිදාගන්න තැනක් හොයලා නිදාගන්න එක, තමන්ගේ ජීවිතයට බයක් දුකක් එනකොට ඒකට රැකවරණයක් හොයන එක, මෛථුන ධර්මය කියන මේ කාරණා හතර තිරිසන් ගත සතාටත් මනුස්සයටත් දෙන්නටම

එකයි. තිරිසන්ගත සතෙක් වුනාම එයත් ආහාර පාන හොයා ගන්නවා, කොතනක හරි වැටිලා නිදා ගන්නවා, කව්රු හරි ගහන්න හරි මොකක් හරි උපද්‍රවයක් කරදරයක් එනකොට ඒ බයෙන් බේරෙන්න එයත් දුවනවා, එයත් තමන්ගේ වර්ගයා බෝ කිරීම සඳහා ඒ පැවැත්මෙන් යුක්තව ඉන්නවා. මනුස්සයත් තිරිසන්ගත සතාත් අතර වෙනසක් නැහැ මේ ධර්මතා දෙකෙන්. **ධම්මෙන තෙසං මධිකො විසේසං.** මනුස්සයෙක් නම් මනුස්සකමේ වටිනාකම වෙනස්කම වෙන්නෙ ධර්මයෙන් යුක්ත වුනොත්. **ධම්මේන හීනං පසූ විසේසං** ධර්මයෙන් හීන පුද්ගලයා අර කාරණා හතරට විතරක් සීමා වෙනවා, තිරිසන්ගත සතා වගේයි කියලා.

මේ දීර්ඝ සංසාරෙදි හිටියොත් ඔය ධර්මතා හතර විතරයි කරන්නෙ මනුස්ස ජීවිතයෙන් වෙන වැඩක් ගන්නෙ නැහැ. ගන්නෙ නැතුව හිටියොත් මේ සසරෙන් දුකට පත්වෙනවා කියලා දැනගත්ත නිසා තිස්ස හාමුදුරුවෝ එදා ඒ විදියට ධර්මයට ජීවිතය කැප කරලා, ධර්මය කෙරෙහි විශ්වාසය තියලා, ධර්මයෙන් ජය ගත්තා. බොහෝ දෙනෙක් පින්වතුනි, අර තිරිසන්ගත සතුන්ටත් සීමා වුණු ධර්මතා හතරට විතරක් සීමාවෙලා දුවන්නන් වාලෙ දුවන සමාජ රටාවකට එකතු වෙලා ඔහේ දුවනවා. නමුත් ඒ අතීත උත්තමයන්ගේ චරිත කතා තුළින්, ජීවිත කතා තුළින් යමක් හිතන්න හුරුවෙන හිතන්න පුළුවන් මනසකට බොහෝම වටිනා යමක් කියනවා.

මනුස්සයෙක් කියලා කියන්නේ, ***මනං උස්සතිතී මනුස්සෝ*** උසස් මනසක් තියෙන නිසා මනුස්සයා කියනවා. උසස් මනසක් තියෙන කෙනෙක්ගේ ස්වභාවය තමයි, ජීවිතයේ ඇත්ත ඇති හැටිය දකින්න උත්සහවත් වෙන එක. මෙතැනදි අපි බුදුරජාණන් වහන්සේ කිසිම වෙලාවක ලෝකයට නැති දෙයක් කියනවා නෙවෙයි. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නෙ 'ඇත්ත ඇති හැටියෙ දකින්න'. ඇත්ත ඇති හැටිය බලන්න ගියොත් පින්වතුනී ජීවිතයෙ හම්බ වෙන්නෙ හැම තැනකම එකම විදියෙ දුක්ඛ දායක ස්වභාවයක්. ඒ තිස්ස හාමුදුරුවන්ගේ කතාවෙන් වගේ දේකින් පෙනෙනවා, අතීත මහෝත්තමයන් වහන්සේලා ධර්මයේ වටිනාකම කොච්චරක්ද කියලා දැනගෙන හිටියද, ඒ ධර්මයේ වටිනාකම දන්න හින්දම ජීවිතය ගැනවත් බැලුවෙ නැතුව, ජීවිතය පූජා කලා ධර්මය වෙනුවෙන්.

ඒ නිසා පින්වතුනි, අපිත් කවදාහරි දවසක මේ සසරින් මිදෙන්නේ අපේ මිම්මත් ඔන්න ඔය මට්ටමට ආපු දවසටයි. අපි චූටි කරුණෙදි ඉස්සෙල්ලාම කරන්නේ දහම අත හරින එක. ගෙවල් දොරවල් වල, නැත්නම් මේ ජීවිතයේ අපේ ජීවිතයට ප්‍රශ්නයක් එනකොට, ඒ ප්‍රශ්න ටික ජීවිතය කරගන්නවා දහම අතහරිනවා.

නමුත් ධර්මයේ සඳහන් වෙන්නේ, ***ධනං චජෙ අංගං රක්ඛමානො, අංගං චජෙ ජීවිත රක්ඛමානො - ධනං අංගං ජීවිතං චජෙ ධම්ම මනුස්ස රන්තො*** මේ ලෝකයා ධනය අත හරිනවලු තමන්ගේ අංග ප්‍රත්‍ය රැකගන්න. වකුගඩුවක් නරක් වුනොත් ඇහැක් නරක් වුනොත් අතක් පයක් නරක් වුනොත් ඒකට බෙහෙත් කරගන්න හෝ ඒ අංග ප්‍රත්‍ය රැකගන්න තමන්ගේ තියෙන මුළු ධනස්කන්ධයම හෝ ලෝකයා වියදම් කරනවා. ***ධනං චජෙ අංගං රක්ඛමානො අංගං චජෙ ජීවිත රක්ඛමානො*** අංග ප්‍රත්‍ය රකින්න ධනය අත් හරිනවලු ශරීරයේ නොයෙක් නොයෙක් කොටස් අත හරිනව ජීවිතය රැක ගන්න. කකුල කපලා අයින් කළේ නැතිනම් මේක කුණුවෙලා උඩුදුවලා මැරෙයි කියලා කකුල් අයින් කරනවා ජීවත් වෙන්න. අත අයින් කරනවා ජීවත් වෙන්න.

ධනං අංගං ජීවිතං චජෙ ධම්ම මනුස්ස රන්තො ධර්මයේ යථාස්වභාවය දන්න කෙනා ධනයයි, අංගයි, ජීවිතයයි කියන තුනම අතහරිනවලු මේ උතුම් ධර්මය අභියසදි.

ඉතින් මේ පින්වතුන්ටත් මතක් කරන්නේ, පින්වතුනි, ටිකක් ජීවිතය ගැන හිතන්න. හැමදාම අපිට මේ මට්ටමවත් හම්බ වෙන්නෙ නැහැ. අපිට මේ හම්බ වුණු වෙලාවෙදි වටිනාකම තේරුම්ගන්න. සමහර විටෙක දහමෙ වටිනාකම තේරෙනවා අපිට, එතකොට දහම අවබෝධ කරගන්න වටපිටාව අත හැරිලා. දහම අවබෝධ කරගන්න වටපිටාව අපිට තියෙනවා, එතකොට වටිනාකම තේරෙන්නේ නැහැ. කෙනෙකුට දහම අවබෝධ කරගන්න පුළුවන් වටපිටාව තියෙද්දි, මේකෙ වටිනාකම තේරුනොත් තමයි මේකෙන් ප්‍රයෝජනයක් ගන්න පුළුවන්. පින්වතුනි, අද අපිට මොනවද තියෙන්නෙ කියලා බලන්න යථාර්ථය අනුව බලනකොට. එදා බුදුරජාණන් වහන්සේ ඉන්න කාලෙ රජවරු රජකම් අත හැරියා සිටුවරු සිටුකම් අත හැරියා. මේ සද්ධර්මය හම්බ වෙද්දි.

අපි මෙහෙම කියමු, මේ ලෝකෙ තියෙන ලොකු නිලයක් තමයි රජකම, ජනාධිපති කම කියමුකෝ. ඒ වගේම හැම කෙනෙකුගෙන්ම පූජා සත්කාර ලැබෙන ලොකු නිලතලයක් රජකම කියන එක. යම්කිසි කෙනෙකුට රජ කෙනෙකුට දැඩි රෝගයක් හැදෙනවා. රටේම ඉන්න වෙදවරු ගෙනල්ලා වෙදකම් කරනවා කරනවා කියනවා, මේ රෝගය සුවකරන්න බැහැ. ඒක වෙදමහත්තයෙක් ඇවිල්ලා කියනවා හොඳයි, ඒකාන්තයෙන් රජතුමෙනී ඔබතුමා මැරෙණවාමයි, රෝගීයි. මේ රජකම අත හැරලා අහවල් කැලේට ගිහිල්ලා අහවල් ගස්වල පොතු කකා හිටියොත් නම් ජීවත් වෙන්න පුළුවන් කිව්වොත්, මේ රජකම අත හරින්නෙ නැද්ද? අත හරිනවා.

මොකද ලෝකයට නොමැරීම වටිනවා ඊට වඩා, මරණයට බයයි. නොමැරීම වටිනවා ඊට වඩා ලෝකයට, නොමැරී ඉන්න. ඒත් හොඳට මතක තියාගන්න, ඒත් නොමැරී

ඉන්න නෙවෙයි, මරණය ටිකක් කල්දා ගන්න. ඒත් මැරෙණවා, මරණය කල්දාගන්න එකත් වටිනවා ලෝකයට රජකමට වඩා. එතකොට ඒ එක ජීවිතයකදී මරණය කල් දාගෙන සදාතනික අජරාමර බව හමුවෙද්දි අපිට මොනවද කරන්න බැරි, කියලා බලන්න. මේ බව තේරුම් කරගත්තා එදා බුදුරජාණන් වහන්සේගේ කාලෙදි බොහෝ දෙනෙක්. රජවරු රජකම් අත හැරියා. සිටුවරු සිටුකම් අත හැරියා. මහා ධනය තියෙන රාජ මහා අමාත්‍යවරු තමන්ගෙ ධනය අත හැරියා. හරියට අළුයම හෙලු කෙල පිඩක් වගේ.

අනුරුද්ධ මහ රහතන් වහන්සේ ගැන අහලා ඇති ඔය පින්වතුන්, මම පොඩි කතාවක් කියන්නම්.

මේ අනුරුද්ධ මහාරහතන් වහන්සේ කියන්නෙ මහානාම කියන ශාක්‍ය රජ්ජුරුවන්ගෙ මල්ලි. මේ අනුරුද්ධ කුමාරයා මොනතරම් සැපවත්ද කියනවනම්, යාළුවො ටික එකතු වුණාහම එක්කෙනෙක් කියනවා බත් එන්නෙ කොහෙන්ද කියලා ඇහුවම මේසෙ උඩ තියෙන රන්තැලිය පෙන්වනවා, එයා දන්නෙ එච්චරයි. එයා දැකලා තියෙන්නෙ එච්චරයි. කුඹුරක් කරනවා, වී වලින් බත් එනවා, ඕවා මොකුත් දන්නෙ නැහැ. මේවා එක එක්කෙනා කතා වෙනවා.

මේ අනුරුද්ධ කුමාරයා නැහැයි කියන වචනය දන්නෙ නැහැ. මෙයා සසරෙදි ගොඩාක් පින් කරලා පාරමිතා පුරලා තියෙනවා, මට නැහැයි කියන වචනය අහන්න නොලැබේවා කියලා.

ඉතින් දවසක් පුංචි කාලේ මෙයා හරි ආසයි කැවුම් කන්න. අම්මා මෙයාට කැවුම් හදලා දෙනවා. යාළුවො එකතු වුණාහම කැවුම් වලට ඔට්ටු අල්ලලා සෙල්ලම් කරනවා. දවසක් මේ අනුරුද්ධ කුමාරයා සෙල්ලම් කරන කරන කැවුම් ටික පරාදයි. දැන් සෙල්ලම් කරලා පරාද වෙනකොට දුවලා ගිහිල්ලා අම්මගෙන් කැවුම් ටිකක් ඉල්ල ගන්නවා. ආයෙත් අරගෙන එනවා, ඒ ටිකත් පරාදයි. ඔහොම ඔහොම ගියාම කැවුම් ඉවර වුණා. ඊට පස්සෙ ඉල්ලන්න ගියාම අම්මා කියනවා, පුතේ කැවුම් නැහැනෙ කියලා. අම්මේ නැහැ කියන්නේ මොකක්ද, කියලා අහනවා. දැන් නැහැ කියන එක දන්නෙ නැහැ මෙයා. ජීවිතයේ එහෙම එකක් දන්නෙ නැහැ, දැකලා නැහැ, අහලා නැහැ. දැන් ඉතින් නැහැ කියන එක පෙන්වන්න විදියක් නැහැනෙ. අම්මා මොකද කරන්නෙ, යටින් තැටියක් තියලා උඩින් හිස් තැටියකින් වහලා, ඇරියහම නැහැ කියන්නෙ මෙන්න මේකයි කියලා පෙන්වවින හිස් භාජනය දුන්නා අතට.

මේ සිද්ධිය බලාගෙන හිටියා උඩ ඉන්න දෙවිවරු. නැහැ කියන වචනෙ මෙයාට

අහන්න සැලැස්සුවොත් අපේ හිත හත් කඩකට පැලෙයි. මෙයාගෙ පින, කුසලය එච්චරට බලවත්. මේ සඳහා මොනවා හරි නොකළොත් කියලා දෙවිවරු මොකද කෙරුවෙ, ක්ෂණිකව කැවුම් මැව්වා ඇතුලට. ඉතින් අම්මා අර පියන ඇරලා, මෙන්න මේකටයි පුතේ කැවුම් නැහැ කියන්නෙ කියලා පෙන්නනකොට කැවුම් ගොඩාක් අරගෙන කාළා බැලුවා හරි රහයි, දැන් දිව්‍ය ඕජස් තියෙන කැවුම්නේ. හරිම රහයි. ඊට පස්සෙ ගිහිල්ලා ඔන්න සෙල්ලම් කරනවා, හැමදාම කියන්නෙ අම්මෙ මට නැති කැවුම් දෙන්න. එදා ඉඳලා හැමදාම වෙන මොකුත් එපා, නැති කැවුම් දෙන්න නැති කැවුම් දෙන්න කියලා. ඉතින් අම්මා මොකද කරන්නෙ, මගෙ පුතා හරිම පින්වන්තයි කියලා දන්න නිසා අර වගේ හිස් තැටියක තියලා තව හිස් තැටියකින් වහලා දෙනවා.

මම මේකෙන් මතක් කළේ, නැහැයි කියන වචනය අහලා තිබුණේ නැහැ.

එබඳු උත්තමයො පවා මේ ධර්මය හම්බ වෙද්දි ඒ සැප ඔක්කොම අත හැරියා. අත හැරලා මුළු ලෝකයක්ම දුකයි කියන මේ ගහක් යට සොහොනේ මිනි ඔතලා තිබුණු පාංසකූල සිවුරක් අරගෙන පොරවගෙන, කබලක් අතට අරගෙන ගෙයක් ගෙයක් ගානෙ බත් හිඟා කෑවෙ, ඒ ධර්මය වෙනුවෙන් බත් හිඟා කෑම වටිනවා ලෝකයේ රන්තැලියෙ රජකම අනුභව කරනවට වඩා, එයා රජකම නෙවෙයි අනුභව කරන්නෙ ජරා මරණයි කියලා දන්නවා. පින්වතුනි, අපිත් කවදාහරි දවසක මේ සැප අනුභව කරනවා කියන මනස මකලා අපි මේ දුකයි ගිහි ගෙදර ඉඳගෙන අනුභව කරන්නේ කියන කම ටිකක් හරි දැකලා, මේ දහමට ලංවුනොත් විතරයි, මේ දුක් සහගත සසරෙන් එතෙර වෙන්නෙ. ඒ නිසා මස් කඩේට මරණ්න ගෙනියන හරක් පස්සෙ ගිය හරකෙකුත් මැරුණාලු. මැරෙණ්න වුණාලු. ඒ වගේ දුවන්නම් වාලේ දුවන ලෝකය අනුව ගියොත් අපිත් මරණයට පත්වෙනවා මිසක අපි මිදෙන්නෙ නැහැ. ඒ නිසා පොඩ්ඩක් විවේක බුද්ධියෙන් හිතලා මේ දහම තේරුම් ගන්න, මනුස්සයෙක් වුණු ජීවිතයේ මේ ධර්මය තේරුම් කරගන්න උත්සහවත් වෙන්න ඕනෙ.

ඉතිං මම අද දවසෙදි මතක් කළේ, ස්වභාවයෙන්ම මේ සූත්‍රවල අර්ථය ටිකක් ගැඹුරුයි. මම මතක් කළා ධර්මය ගැඹුරු නැහැ, අපි දුර්වලයි. අපිට තේරෙන්නෙ නැත්තෙ ධර්මය ගැඹුරු නිසා නෙවෙයි, ඒ ගැඹුරු දහම තේරුම් කරගන්න තරම් අපි දියුණු වෙලා නැහැ. ඒ තමන්ගෙ දුර්වල කමත් තේරුම් අරගෙන තමන් කොහොම හරි මේ දහම තේරුම් කරගන්න පුළුවන් මනසක් හදාගෙන, මනසකට අරගෙන, මේ දුක් සහගත සසරෙන් එතෙර වෙන්න ඕනෙ. එබඳුවූ යහපත උදෙසා අපි මේ දහමෙ අර්ථය ටිකක් සම්මර්ශනය කරලා බලමු.

එදා මේ මජ්ඣෙඩ සූත්‍රය සාකච්ඡා කළේ ස්වාමීන් වහන්සේලා බරණැස් නුවර

ඉසිපතනාරාමයේ බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්න කාලෙදී.

එදා භික්ෂූන් වහන්සේලා ඒ පිණ්ඩපාතෙන් පස්සේ දම් සභා මණ්ඩපයේ එකතු වෙලා ධම් සාකච්ඡා කරන කොට තමයි, මේ කතාව ඇති වුණේ. අන්ත දෙක දැකලා මැද තැවරෙන්නේ නැතුව, තණ්හාව ඉක්මවපු කෙනාට මහා පුරුෂයා කියලා කියනවා, අන්ත දෙක මොකක්ද? කොහොමද මැද තැවරෙන්නේ නැතුව ඉන්නේ? කොහොමද මහා පුරුෂයෙක් වෙන්නේ? කියලා අහනකොට තමයි, එක ස්වාමීන් වහන්සේ නමක් මතක් කළේ, **ස්පර්ශය කියන එක එක අන්තයක් ස්පර්ශ සමුදය කියන එක එක අන්තයක් ස්පර්ශ නිරෝධය මැදයි.** මෙන්න මේ විදියට හිටියොත් තණ්හාව නැති වෙනවා. ඔහොම ඉඳලා තණ්හාව නැති කරපු කෙනාටයි මහා පුරුෂයා කියලා කියන්නේ.

අතීතය එක අන්තයක් අනාගතය දෙවෙනි අන්තයයි, වර්තමානය මැදයි

ඊට පස්සේ එතන හිටපු තව ස්වාමීන් වහන්සේ නමක් කියනවා, **අතීතය එක් අන්තයක් අනාගතය එක් අන්තයක් පච්චුප්පන්නං මජ්ඣෙ - වර්තමානය මැදයි.** මෙන්න මේ අතීතය අනුව යන්නෙත් නැතුව, අනාගතය අනුව යන්නෙත් නැතුව වර්තමානයක මනස තියාගෙන හිටියොත් මෙන්න මෙයාට තණ්හාව ඉක්මවන්න පුළුවන්. සිබ්බනිය ඉක්මෙනවා, නැත්නම් තණ්හාව නැති වෙනවා. සිබ්බනිය කියලා කියන්නෙ තණ්හාවට. අන්න එයාට මහා පුරුෂයා කියලා කියනවා.

මහා පුරුෂයා වෙන්නේ, මහා පුරුෂයා කියලා කියන්නේ, තණ්හාව නැති කරපු කෙනාට. සිබ්බනිය අත හැරගත්ත කෙනාට. සිබ්බනිය කියන්නේ ගෙතුම. සංසාරේ නැවත නැවත ගොතවමින් ඉන්නේ තණ්හාව නිසා. ඒ නිසා තණ්හාවට කියන තව නමක් සිබ්බනිය කියලා. එතකොට මේ තණ්හාව නැති කළොත් තමයි මහා පුරුෂයා වෙන්නේ. තණ්හාව නැති කරන්න පුළුවන් කොහොමද? අතීත අන්තයටත් යන්නෙ නැතුව, අනාගත අන්තයටත් යන්නෙ නැතුව, වර්තමානයක හිටියොත් තමයි තණ්හාව නැති කරන්න පුළුවන්.

එතකොට දැන් අපි තණ්හාව නැති කරන්න කියලා කවුරුවත් අමුතුවෙන් උත්සාහවත් වෙන්න ඕනේ නැහැ. මහා පුරුෂයෙක් වෙන්න, ශ්‍රේෂ්ඨ උත්තමයෙක් වෙන්න, අමුතුවෙන් ඕනේ නැහැ. තණ්හාව නැති වුණොත් ශ්‍රේෂ්ඨ උත්තමයෙක් වෙනවා. මහා පුරුෂයෙක් වෙනවා. තණ්හාව නැති කරන්න අපිට බැහැ තණ්හාව නැති කරන්න

අමුතුවෙන් උත්සාහවත් වෙන්න ඕනේ නැහැ. අපිට පුළුවන් නම්, අතීත අන්තයත්, අනාගත අන්තයත් කියන අන්ත දෙක දැකලා, ඒ අන්ත දෙකම ඇසුරු නොකර වර්තමානයක ජීවත් වෙන්න පුළුවන්නම්, අපි ගාව තියෙන්න ඕනෙ ඔන්න ඔතෙන්ට තියෙන දර්ශනය විතරයි.

වර්තමානයක අපි ජීවත්වෙන කොට, ඒ සිද්ධිය තුළින් තණ්හාව අත හැරෙනවා. තණ්හාව නැති කරන්න බැහැ පුද්ගලභාවයකින්, තණ්හාව නැති වෙනවා කොහොමද, අතීත අන්තය, අනාගත අන්තය කියන අන්ත දෙක අත හැරලා වර්තමානයක අපිට ඉන්න පුළුවන්නම්. මෙන්න මේ වර්තමානයක හිටියොත්, තණ්හාව නැති වෙනවා. තණ්හාව නැති වුණොත් මහා පුරුෂයා වෙනවා.

එතකොට අපි තේරුම් කරගන්න ඕනේ, අතීත අන්තය කියන්නේ මොකක්ද, අනාගත අන්තය කියන්නේ මොකක්ද, වර්තමානයක ඉන්නේ කොහොමද කියන කාරණාව තේරුම් කරගන්න ඕනෙ. මොකද දැන් බොහෝ විටෙක අතීත අන්තය කියලා අපි හිතන්නේ, අතීතයේ අපි කළ කී දේවල් සිහිපත් කරනකොට මේ අතීත අන්තය. ඒ වගේම හෙට දවසෙදී හරි, තව ටිකකින් හරි, අනාගතයෙදී හරි යමක් කරන්න අපි හිතනවා නම් නූපන්න දෙයක් ඉපැද්ද වීම පිණිස කටයුතු කරමින් සිටිනවා නම් මේ අනාගත අන්තයි කියලා. අපි හිතන්නේ. වර්තමානයක ඉන්නවා නම් මැදයි කියලා. නමුත් මේ එන අර්ථය ඊට වඩා ගොඩාක් ගැඹුරුයි.

ඔහොම මධ්‍යම ප්‍රතිපදාව වුණොත්, කිරිබොන පුංචිම ළමයෙක් දිහා බලන්න. මේ පුංචි ළමයටත් තියෙනවද තමන් කළ කී දේවල්, අතීතය අනුව සිහිකරන්න, නැහැ. එහෙනම් මම මෙහෙම මෙහෙම කරන්න ඕනේ, හෙට මෙහෙ යන්න ඕනේ කියලා අනාගතය ගැන කරන්න දේවල් තියෙනවද පුංචි ළමයට, නැහැ. ඒ අන්ත දෙක, අතීත අනාගත අන්ත දෙක නැත්නම්, එහෙනම් වර්තමානයක වෙන්න ඕනෙ නේ. එහෙනම් පුංචි ළමයත් ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන කෙනෙක්. එයත් තණ්හාව නැති කරපු කෙනෙක්, එයත් මහා පුරුෂයෙක්, එයත් රහතන් වහන්සේ කෙනෙක් වෙන්න ඕනේ. එහෙනම් ඒ දරුවා කළුරිය කළොත් කෙලින්ම රහත් වෙන්න ඕනේ. එහෙම වෙනවද, නැහැ. වෙන්නේ නැත්නම් ඒ කියන්නේ එහෙනම් මොකක් හරි අඩුවක් තියෙනවා. එහෙනම් ඔය කිව්වට ඔතැන නෙමෙයි, ඔහොම එකක් නෙමෙයි මධ්‍යම ප්‍රතිපදාව කියන්නේ.

දැන් පුංචි දරුවා අතීතය ගැන හිතන්නේ නැහැනේ, අනාගතය ගැන හිතන්නේ නැහැනේ. නමුත් වර්තමානයක ඉන්නවා. හැබැයි ඒ වර්තමානයක ඉන්නවා කියලා කියන්නේ අපියි. නමුත් ඔතැන තියෙන දෝෂෙ මොකක්ද? අන්ත අත හැරුනොත් විතරමයි මධ්‍යම ප්‍රතිපදාව වෙන්නේ. මධ්‍යම ප්‍රතිපදාවේ හිටියොත්, නැත්නම් වර්තමානයක

හිටියොත් අන්ත අතහැරෙනවා, අතීත අන්තය අනාගත අන්තය අත හැරෙනවා. අතීත අන්තය අනාගත අන්තය අත හැරුනොත් වර්තමානයක ඉන්නවා.

වර්තමානයක ඉන්න ඉස්සරවෙලා අපි දත යුතුයි, අතීත අන්තය කියන එක මොන තරම් දුරට නියෝජනය වෙනවද කියන එක. අනාගත අන්තය ගොඩ නැගෙන්නේ මොනවගේ තැනකින්ද, මොන වගේ වටපිටාවක් තුළින්ද කියන එක දත යුතුයි. අන්න එතකොටයි අපි දන්නේ, මම මෙහෙම හිටියත් තාම අන්තෙක නේද ඉන්නේ කියලා. එතකොට අපි දන්නවා අපේ ප්‍රතිපදාව හරි ගිහිල්ලා නැහැ තවම, වැරදියි කියලා දන්නවා. මම මෙහෙම හිටියොත් අනාගත අන්තයේ නේද ඉන්නේ, තමා දන්නවා. එහෙනම් අපි රැවටෙන්නේ නැහැ. මම මුලින් මතක් කළා, අපි සත්‍යය අවබෝධ කරගන්න යන්න නම්, ඇත්ත දකින්න නම්, ඉස්සෙල්ලා ඇත්ත දැනගෙන තියෙන්න ඕනේ. අපි හොයන කෙනාගෙ විස්තර ඉස්සෙල්ලා දැනගෙන තියෙන්න ඕනේ. එතකොට අපි දහමක් හොයන අය නම්, ඇත්තටම දහමක් නම් ඕනේ, අපි හොයන දහම මොකක්ද කියන එක අපි දැනගෙන තියෙන්න ඕනේ.

එතකොට අපි ටිකක් සම්මර්ශණය කරලා බලමු අතීත අන්තය, අනාගත අන්තය කියන කාරණාව මොනතරම් දුරට ව්‍යාප්ත වෙලා තියෙනවද, නියෝජනය වෙලා තියෙනවද කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා,

නායං භික්ඛුවෙ කායො තුම්හාකං, නාපි අඤ්ඤෙසං, පූරාණං මිදං
භික්ඛවෙ කම්මං අභිසංචේතයිතං වෙදයිතං දට්ඨබ්බං..

'මහණෙනි! මේ කය නුඹලාගේත් නෙවෙයි, වෙන කෙනෙකුගේත් නෙවෙයි. මේ චේතනාවෙන් පිළියෙල වුණු, පුරාණ කර්ම ප්‍රත්‍යයෙන් හටගත්ත, වේදනාවට වස්තුවක් කොට දකින්න මේ ආයතන ටික'

එතකොට දැන් අතීත අන්තය කියන කොට හොඳට දකින්න ඕනේ මේ ***චක්ඛුං භික්ඛවේ පූරාණං කම්මං*** - ඇහැ කියන එක පුරාණ කර්මයක්. එතකොට චක්ඛු විඤ්ඤාණය, ඇහැට පෙනෙන රූප. **ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය කියලා අපිට පෙනෙන තැන ගන්න. මේ පුරාණ කර්ම ප්‍රත්‍යයෙන් හටගත්ත ටික. පුරාණ අන්තය ඇසුරු වෙනවා** ඔන්න ඔතෙන්ට එනකල්. කෙනෙක් අතීතය අනුව, තමන් කරපු කියපු දේවල් හිත හිතා ඉන්නවා නම්, ඒ විතරක් නෙවෙයි, ඒකත් අයිතියි අතීතයට. අතීත ප්‍රත්‍යයකින් අතීත හේතුවකින් හටගෙන තියෙන යමක් තියෙනවා නම් ඒ ටිකත් අයිති අතීතයට.

පෙර අවිද්‍යා කර්මයෙන් නම් හටගත්තේ මේ විඤ්ඤාණ, නාම-රූප, සළායතන,

ඵස්ස, වේදනා කියන ටික, මේ ටිකට හේතු හැටියට පෙන්නුවොත්, අපිට පෙන්වන්න වෙන්නේ මොකක්ද, අතීතය. අපි ඇහැ පරිහරණය කරනවා කියන්නේ, පුරාණය කනවා. පුරාණය පරිහරණය කරනවා නේද? එතකොට කන, නාසය, දිව, ශරීරය පරිහරණය කරනවා කියන්නේ පුරාණය පරිහරණය කරනවා නෙවෙයිද අපි, එහෙනම් මෙතැන කෙනෙකුට ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන මේ ටික ඇසුරු කරගෙන ඉන්නවා කියලා කියන්නේ, අතීත අන්තයකයි එයා ඉන්නේ.

දැන් අර කුඩා ළමයා කියන කොට එයා තාම අතීත අන්තය අත හැරලා නැහැ, අතීත අන්තයේ එයා ඉන්නේ. එතෙන්ට වර්තමානය කියන්නේ නැහැ. එතකොට **අපි දකින්නේ අර හිතෙන් සිහිකරන සිද්ධිය විතරයි අතීත කියලා. නමුත් ඒකත් අයිතියි, ඒ විතරක් නෙවෙයි, අතීත ප්‍රත්‍යයකින්, අතීත හේතුවකින් හටගත්තාවූ ටික තාම ඇසුරු වෙන්නේ, ඇසුරු කරනවා නම් අතීතය ඇසුරු කරනවා වෙනවා.**

තව පැත්තකින් ගත්තොත්, අපිට රූපයක් පෙනෙනවා කියන මට්ටම දකින්න, මේ ටික මොකක්ද අතීතය පෙනෙන මට්ටම අතීතය. ශබ්දයක් ඇහෙනවා කියන මට්ටම දක්වා ඉපදිලා තියෙන්නේ ඔක්කොම අතීතයකින්, හේතු ටිකකින්. අතීතය කියන එක නියෝජනය වෙනවා ශබ්දයක් ඇහෙනවා කියන තැන දක්වා. මේ කනට තියෙන එකම නෑදෑයා තමයි මොකක්ද, පෙර අවිද්‍යා, සංඛාරා, විඤ්ඤාණ කියන පිටිපස්සට තියෙන හේතු ටිකක් තියෙනවා. නාසය, දිව, ශරීරය කියන මේ ටික ඔක්කොම අතීතය.

මේක හැබැයි මෙහෙම කිව්වත් ගොඩාක් ගැඹුරුයි මෙතැන. අතීත ධර්මයන්ගේ ලක්ෂණය තමයි කිසිම වෙලාවක තමන්ට කියන්න, කරන්න, හිතන්න බැහැ. අතීත හේතුව අතීත අන්තය අපි ඇසුරු කරමින්මයි දැන් මේ ඉන්නේ. අතීත අන්තය ඇහැ තියෙනවා, රූප තියෙනවා, චක්ඛු විඤ්ඤාණය තියෙනවා. කන තියෙනවා, ශබ්දය තියෙනවා, සෝත විඤ්ඤාණය තියෙනවා කියන මේ දැනුම දකින්න, මේ දැනුමෙන් මේ ටික පරිහරණය කරන බවින්ම දකින්න, අතීත අන්තය අත නොහැරයි අපි ඉන්නේ.

එතකොට අනාගත අන්තය දකින්න, මේ ඇහැ අරභයා හෝ රූපය අරභයා හෝ චක්ඛු විඤ්ඤාණය අරභයා තණ්හාවක් ඇති වෙනවා නම්, අළුතෙන් රාග, ද්වේශ, මෝහයක් ඇති කරගන්නවා නම් මේ ටික දකින්න, අනාගත අන්තය. අනාගතය කියලා අපි හිතන ටික විතරක් නෙවෙයි, **යම් හේතුවක් තියෙනවා නම් අනාගතයේ ඵල උපදවන, ඵලය ඉපදිලා නැති වුණාට, ඵලය උපදවන හේතුව තියෙනවා නම් අනාගතයේ, ඒකට කියනවා අනාගත අන්තය කියලා.** කෙනෙකුට ***යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං*** - **යමක් හේතු ප්‍රත්‍යයෙන් හටගෙන හේතු නැති වෙන කොට නැති වෙනවා කියන**

දර්ශනයක් තිබුණොත් විතරයි වර්තමානයක ඉන්නේ.

තියෙන දෙයක් පරිහරණය කරන කොට, අපි කියමු 'ගෙදර තියෙනවා' කියලා යනකොට ඔය පින්වතුන් අතීතය නෙවෙයිද මේ පරිහරණය කරන්නේ. තියෙන ගෙදරට නේ ගියේ. ගෙට ඇතුල් වෙනකොටම ඔය පින්වතුන් අතීතයයි පරිහරණය කරන්නේ. එතනින් එනකොට, ඊට පස්සේ අනාගතයයි පරිහරණය කරන්නේ. ගෙදර ඉන්නවා, අපි ආපහු බැහැරට යන්නේ, අනාගතයෙදි දැන් ඔතෙන්ට වෙලා ඉන්නේ, මට යන්න ගෙදරක් තියෙනවා කියන තැනකින්. ඔය එතකොට අනාගත අන්තය අතහැරලා නැහැ. ගෙදරට යනකොට තියෙන ගෙදරකටයි ආවේ, ආවට පස්සේ ආපු ගෙදර තියෙනවා කියන තැනක ඉන්නේ. **මොකද අතීත අන්තයමයි කරකවලා අනාගත අන්තය දෙන්නේ අපිට. අතීත අන්තය අතහැරුනේ නැත්නම්, අනාගතය අතහැරෙන්නේ නැහැ. අනාගතය අතහැරුනේ නැත්නම් අතීත අන්තය අතහැරෙන්නේ නැහැ.**

ඒ කිව්වේ, දැන් මෙතෙන්ට සාපේක්ෂව බලන්න, ගෙදර හිටපු අවස්ථාව දැන් අතීතය වෙලානේ. නමුත් අතීතය අත නොහැර පින්වතුන් මේ ඉන්නේ අතීත අන්තයේ, 'ගෙදර තියෙනවා' කියන එක. ඒකම, මෙතෙන්ට සාපේක්ෂව ගෙදර තියෙනවා කියන අතීතයම තමයි ඔය පින්වතුන්ට අනාගතය හදලා දෙන්නේ. මට යන්න ගෙයකුත් තියෙනවා කියන තැනකින් ඉන්නේ. එකම අරමුණ තමයි දෙපැත්තට යෙදෙන්නේ අපිට, නේද?

හරියට වර්තමානයක ඉන්නවා නම් අතීත අන්තයත් අනාගත අන්තයත් දෙකම අත හැරෙන්න ඕනේ. ඒ කියන්නේ 'තිබුණත් නෙවෙයි, තියෙනවත් නෙවෙයි' කියන ටික අත හැරෙන්න ඕනේ. හිතෙන් විතරක් අතීතය සිහිකරලා, අනාගතය සිහි කලා කියන තැනකින් විතරක් නෙවෙයි අපි. **අතීත, අනාගත කියන අන්ත දෙකට වැටුනේ. ජීවිතය තුලින්ම අතීත, අනාගත කියන අන්ත දෙකෙයි අපි ඉන්නේ. වර්තමානයක ඉන්නවා නම් මේ ජීවිතය තුළින්ම යෙදෙන්න ඕනේ. ඒ කියන්නේ තියෙන දෙයක් පරිහරණය කරන්නත් බැහැ, පරිහරණය කරපු දෙයක් තියෙන්නත් බැහැ.**

මම අර මතක් කරන්නේ, අපි වතුරකට එබුනොත් අපේ ඡායාව වතුරෙ වැටෙනවා. අන්න අපි දන්නවා අපි එබුණ හින්දමයි මේ වතුරට ඡායාව වැටුනේ කියලා. දැන් තිබුණ එකක් පරිහරණය කරන්නේ නැහැ ඔන්න දැන් අතීත අන්තය නැහැ. අපි එතැනින් අහකට යනකොටම, දැකපු ඡායාව නැති වෙනවා කියලා දකිනකොට, දැන් අනාගත අන්තය නැහැ. දැන් අන්ත දෙක අතහැරලා වර්තමානයේ ඉන්නවා. එතකොට දර්ශනය, එතකොට නුවණ යෙදෙන්න ඕනේ. 'මේ එබුණ හින්දමයි හටගත්තේ, එබීම නැති

වෙන කොටම නැති වෙනවා' කියලා. ඒ විදියට මේ මුළු ලෝකයේම හැම අරමුණක්ම ඔය විදියට වුණොත් තමයි අපි වර්තමානයක ඉන්නේ.

තියෙන දේවල් හම්බ වෙන කල්, හම්බ වුණු දේවල් තියෙන කල් ඔය පින්වතුන් දකින්න මේ අන්ත දෙක මාරු කර කර ඉන්නේ අපි. ඒ මොඩකම තුළ ඉඳගෙන උපේක්ෂාවෙන් වර්තමානෙක ඉන්නවා කියලා කිව්වට, අපි වර්තමානය කියන තැනත් අතීත සංඥාව ඇසුරු වෙනවා. මේ දර්ශනය තුළින් වර්තමානයකට එන්න ඕනෙ මිසක, 'පුද්ගලයෙකුට' වර්තමානයේ ඉන්න බැහැ.

මොකද එහෙම වුණොත්, දැන් තිරිසන්ගත සත්තුත් ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩනවා කියලා කියන්න වෙනවා. ඇයි තිරිසන්ගත සත්තුත් අතීතය ගැන හිතන්නේ නැහැ, අනාගතය ගැන හිතන්නේ නැහැ, ඔය තියෙන තණ කොල ටිකක් කකා යනවා මිසක, වර්තමානයක ඉන්නේ. දැන් ගවයෙක් වගේ සතෙක් ගන්න, නමුත් එහෙම වෙන්නේ නැහැ. ඊට පස්සේ තව ඔය ලේ, මුත්‍රා පරීක්ෂා කරන ලැබ් (lab) වල ඉන්න අයත් හරි ඉක්මනට මිදෙනවා. ඇයි ඒ, මොකුත් හිත හිතා ඉන්න බැහැ. මේ පෙනෙන දේ, හොඳට වර්තමානය බලාගෙන තමයි ඉන්න වෙන්නේ එයාට. සියුම්ව එක එක ඒවා හිතන්නේ නැතුව, අර පොඩි කැමරා වලින් නේ බලන්නේ.

එතකොට මම මෙතැනදි මතක් කළේ අතීත අන්තය කියන කොට ඔය අපි දන්න විදිහට නෙවෙයි තීරණය කළ යුත්තේ. අතීත අන්තය කියන එකේ තව ලක්ෂණයක් මම මතක් කරන්නම්. තව ගැඹුරට යනවා කියලා මම කිව්වේ **අතීතයේ හටගත්ත දේ අපේ ජීවිතය වෙලා තියෙන්නේ. එතකොට ඒ ජීවිතය වුණු දේ දැනුම් සහිතව ඉන්නවා කියන්නේ, අතීත අන්තය ඇසුරු වෙනවා. අතීත අන්තය ඇසුරු වෙන එකමයි අනාගත අන්තය ඇසුරු කරනවා කියන්නේ.** මම ඒ ටික පැහැදිළි කරලා දෙන්නම්. ගෙදර තියෙනවා කියලා මෙතැන ඉන්න කොට, ගෙදර තියෙනවා කියන අතීත දැනුමමයි අපිට අනාගතය හැදුවේ. අතීතය යම්සේද අනාගතය එසේයි. අනාගතය යම්සේද අතීතය එසේයි, අනාගතය තිබුණොත් අතීතය තියෙනවා, අතීතය තිබුණොත් අනාගතය තියෙනවා, මේ දෙන්නා නැති වුණොත් වර්තමානය තියෙනවා, වර්තමානයක හිටියොත් මේ දෙන්නා නැති වෙනවා, කියන සිද්ධිය වෙන්නේ. ඒකෙදි **අතීතයේ නිමිති නැතිව ඔය පින්වතුන් හිටියොත් අනාගතයට නිමිති නැහැ. මේ අන්ත දෙක නැති වුණොත් ඔය පින්වතුන් අනිමිත්තයි කියන තැනක තමයි, වර්තමානයක ඉන්නේ.**

මම ඒකට උපමාවක් මතක් කරන්නේ, දැන් මේ ඇහේ ස්වභාවය, **අතීතයෙන් හටගත්ත ඇහේ ස්වභාවය තමයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. කවදාවත් ඇහේ**

කියන එක දකින්න පුළුවන් එකක් නෙවෙයි. ඇහැ කියන එක පෙනෙන එකක් නෙවෙයි. ඕකට මම උපමාවක් ගන්නේ අවුරුදු පහ හයක පුංචි ළමයෙක් ගත්තොත්, මේ ළමයටත් හදවත, වකුගඩු කියලා තියෙනවානේ. නමුත් මේ ළමයා දන්නවද, මට හදවත කියලා එකක් තියෙනවා, වකුගඩුව කියලා එකක් තියෙනවා කියන එක පොඩි ළමයා දන්නවද? හදවත කියන එක අනිත්‍යයි, වකුගඩු කියන එක අනිත්‍යයි කියන එකවත් බලන්න දන්නවද? නැහැ. එතකොට හදවත කියලා එකක් නැහැ, වකුගඩුව කියලා එකක් නැහැ කියලා දන්නවද? හදවත කියන එක වකුගඩුව කියන එක, තිබුණොත් තමයි ඒක තියෙනවා හෝ නැහැ හෝ කියන්න වෙන්නේ. වකුගඩුවම නැති වුණොත්, හදවතම නැත්නම් එයාට, ඒ අරභයා තියෙනවා හෝ නැහැ හෝ කියන කතාවක් එයාගෙ ලෝකයේ නැහැ. දැන් කිසිම නිමිත්තක් නැහැ නේද එයාට.

ඔන්න පොඩි ළමයාට නිමිත්තක් නැති වුණාට ජීවිතයේ එහෙම එකක් නැද්ද? එහෙම එකක් තියෙනවා, **ඒක ජීවිතය වෙලා, ජීවිතයෙන් යෙදිලා, නමුත් එයා ඒක දන්නේ නැහැ. තමන් නොදන්නවා නම් ඒකෙන් තමන් දුක් විඳිනවද, එයා දුක් විඳින්නේ නැහැ. පුරාණ කර්මයේ ලක්‍ෂණය ඔන්න ඕක.** ඔය පොඩි ළමයා ටිකක් ලොකු වෙනකොට මිනියක් කපන එකක් දිහා බලලා හරි, පත්තරේකින් බලලා හරි, වීඩියෝ පටයක් දිහා බලලා හරි, මේක තමයි හදවත කියන්නේ, හදවතේ කපාට මෙහෙම තියෙනවා, මේ තමයි වකුගඩුව, මේ තමයි වකුගඩුවේ හරස් කඩ, දැන් වෛද්‍ය සිද්ධිය කරනවා මේ ඉගෙන ගන්නවා දැන්.

දැන් ඔන්න හොඳට වකුගඩුව ගැන, හදවත ගැන හිතන්න පුළුවන්, කියන්න පුළුවන්, කරන්න පුළුවන්, තව කෙනෙකුට උගන්වන්නත් පුළුවන්. දැන් එයාගෙ ලෝකයේ වකුගඩු තියෙනවා. දැන් එයා හිතාගෙන ඉන්නේ 'මගේ දැනුම යම්සේද, වකුගඩුව එසේයි. වකුගඩුව යම්සේද, දැනුම එසේයි' කියලා. ඒ කියන්නේ **මේ තියෙන වකුගඩුව ගැන තමයි මම දන්නේ, මම දන්න වකුගඩුවයි තියෙන්නේ කියලා. දැන් ඔය දැනුම නැති කාලෙත් ඔය වකුගඩුව තිබුණා. මොකුත් ප්‍රශ්ණයක් නැහැ. දැන් ඉතින් වකුගඩුවක් ගැන දුක් විඳින්න ඕනෙ ටික නැද්ද මෙයාට. වකුගඩුව නරක් වුණා කියලා දුක් විඳින්නත් පුළුවන්, වකුගඩුව තියෙනවා කියලා සතුටු වෙන්නත් පුළුවන්. සැප දුක් දෙක තමයි දැන් මේ උපන්නේ මෙයාට.**

දැන් ඔය අළුතෙන් තියෙන දැනුම නැති කාලෙත් මේ වකුගඩුව, හදවත තිබුණා ජීවිතය වෙලා, නමුත් දන්නේ නැහැ. ඔය අළුතෙන් වකුගඩුව ගැන ආපු දැනුම කියන්නේ මේ තියෙන වකුගඩුව නෙවෙයි. මේ තියෙන එක නැති වුණාහම අළුතෙන් හදවතක්, වකුගඩුවක් හදාගන්න තියෙන ටික, කියන එක දැනගන්න මේ 'මනෝමයෙන්' ඔය දැනගත්ත ටික.

එතකොට අතීත අන්තය ඇසුරු වෙනවා කියලා කියන්නේ අර පුංචි ළමයා හිටපු තැන වගේ. දැන් වකුගඩුව හදවත තියෙනවා. නමුත් එයා දන්නේ නැහැ. ලොකුවෙන කොට මේ මගේ වකුගඩුව, මේ මගේ හදවත කියලා දැනුම යම් සේද වකුගඩුව එසේයි, වකුගඩුව යම්සේද දැනුම එසේයි කියලා අපි 'හිතින් දැනුමක් හදා ගත්තනේ වකුගඩුව ගැන'. දැන් ඔන්න අතීත අන්තය අල්ලගෙන ඉන්නේ. ඒකම තමයි අනාගතයේ වකුගඩුවක් හදාගන්න දැනුමක් අපිට හැදිලා තියෙන්නේ. ගෙදර තියෙනවා කියලා දැන් ඉන්නේ, ඔය ඉන්න දැනුමම නේ ඔය පින්වතුන්ට අනාගතයට ගෙදර කියලා හැදෙන්නේ. දැන් මේ වකුගඩුව මට තියෙනවා කියන එකකින් ඔය පින්වතුන් අතීත අන්තය අල්ලගෙන හිටියොත් ඔය තියෙන වකුගඩුවම තමයි හොයාගෙන යන්නේ, අනාගත අන්තය.

ඒ කිව්වේ, දැන් වකුගඩුව කිව්ව එකේ 'පුරාණ කර්‍මයෙන් හටගත්ත' කියන එකේ අර්ථය තමයි තමන්ට නිමිති නැති බව. අතීත අන්තය අපිට ඇසුරු වෙනවා කියන කොට මනෝමයෙන්, ඒ කියන්නේ මනසින් අතීතයේ හටගත්ත දේවල් ගැන දැනුම් ඇතුවයි ඉන්නේ අපි එතකොට. අතීත අන්තය දැන් අල්ලගෙන ඉන්නේ. අතීත අන්තය අල්ලගෙන හිටියොත් තියෙන දේ තමයි, අනාගතය හට නොගෙන තියෙන්නේ නැහැ. අනාගත අන්තයටත් යනවා කියන එක. **මේ අන්ත දෙකෙන් මිදුනොත් වර්තමානයක ශුන්‍යතාවයක් අපිට තියෙන්නේ, අපි දන්නේ නැහැ කියන තැනකට එනවා. එතකොට වර්තමානය මැදයි කියන කොට අනිමිත්ත බවට, ශුන්‍යත බවටම මේ දර්ශනය යනවා.**

ඔය පින්වතුන් අහලා ඇති අනිමිත්ත චේතෝ විමුක්තිය, ශුන්‍යත චේතෝ විමුක්තිය. ඒ කියන්නේ වර්තමානයක හිටියොත් නිවනම ලැබෙනවා. ගංගා යමුනා, සරබු, මහී වගේ ගංගා ගැන කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ගංගාවන් පෙර දිගට හැරිලා, පෙරදිගට නැමිලා, පෙර දිගට බරවෙලා පවතිනවා. මහණෙනි, ඒ වගේ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය නිවනට හැරිලා, නිවනට නැමිලා, නිවනට බරවෙලා, පවතින්නේ. **යම්කිසි කෙනෙක් අතීත අන්තයත්, අනාගත අන්තයත් කියන අන්ත දෙකක් තියෙන කොට, වර්තමානයක හිටියොත් නිවනටම නැඹුරු වෙලයි තියෙන්නේ එයාගෙ මනස. ලෝකය ශුන්‍යතාවයකට යනවා, ලෝකයේ නිමිති නැති වෙනවා එයාට.**

කෙටියෙන් අපි ඕක ගනිමු දැන් තේරෙන මට්ටමට. **ඇහැට පෙනෙන මට්ටම දකින්න, පෙනෙනවා කියන මේ සිද්ධියම දකින්න අතීත අන්තය, පෙනෙන දේ අරභයා හිතනවා නම්, කියනවා නම්, කරනවා නම් මොනවා හරි, හොඳට වේවා නරකට වේවා පෙනෙන දේ අරභයා හිතුවොත්, කිව්වොත්, කෙරුවොත් ඒක අනාගත අන්තය කියලා දකින්න.**

ලෝකයාට පුළුවන් මේ අන්ත දෙක ඇතුළෙ ඉන්න මිසක, ලෝකය තියෙන්නේ

මේ අන්ත දෙක තුළ මිසක, වර්තමානයක නැහැ. ඒකෙන් මම පෙන්නුවේ ලෝකයා වර්තමානයයි කියන එක තුළත් තියෙන්නේ අතීතයයි කියන එක දකින්න කියන එකකින් කිව්වේ. ඒ කියන්නේ ලෝකයා, මෙහෙම පෙනෙන දේ තුළ ඉන්න පුළුවන්, නේද?. පෙනෙනවා කියන දේ නිර්මාණය වෙලා තියෙන්නේ අතීත හේතුවකින් නම් **පෙනෙනවා කියන දේ තුළ එයා වර්තමාන කියලා හිතාගෙන හිටියත්, ඉන්නේ අතීතය තුළයි කියන එක දකින්න. පෙනෙන බවම නිර්මාණය වෙලා තියෙන තැනට කියනවා අතීතය ඇසුරුවෙනවා කියලා, ඔතෙන්ට එනකල්ම. එයා එතකොට අතීත හේතු ටිකේ ඉන්නේ. පෙනෙන දේ අරභයා හිතනවා නම්, කියනවා නම්, කරනවා නම් මේවා නව කර්ම, අළුත් ඒවා. මේවා අනාගතයට ඵලයක් උපදින්න තියෙන හේතු ටික. එතකොට අනාගත අන්තයකයි මේ ඉන්නේ.**

කනට යම් ශබ්දයක් ඇහෙනවා නම් ඇහෙන මට්ටමට දකින්න අතීත අන්තය. ඇහෙන දේ අරභයා හිතනවා නම්, කියනවා නම්, කරනවා නම් ඒක අනාගත අන්තය. නාසයට ගඳ සුවඳ දැනෙනවා නම් දැනෙන මට්ටම දකින්න අතීත අන්තය. එතකොට මේ ගඳ සුවඳ දැනෙන මට්ටම අතීත අන්තය කියපු කාරණාව තේරෙනවා නේද, මොකක් හින්දද කිව්වේ කියලා. එතකොට ඔන්න අතීත අන්තය කියන කොට අපේ නුවණ යන්න ඕනේ ඒ තැන දක්වාම. ඒ කියන්නේ කාපු බීපු දේ සිහිකරන සිද්ධිය විතරක් නෙවෙයි අතීතය, මේ සිද්ධියත් අතීතය කියන එක.

මොකද අපි හැම වෙලාවෙම අතීත සංඥාවයි පරිහරණය කරන්නේ. මේකට බිත්තිය කියන්න, මේකට ඔරලෝසුව කියන්න, අපි දැන් ඉගෙන ගත්තා නෙවෙයි නේ නේද, ඉගෙන ගත්තේ කවදද, එහෙනම් ඔරලෝසුව දිහා බලනකොට බිත්තිය දිහා බලනකොට අතීතය ඇසුරු කරනවා නෙවෙයිද මේ?. අතීතය ඇසුරු කරනවා. වර්තමානය කියලා අපි හිතන තැනද අතීත සංඥාව පරිහරණය කරනවා. එතකොට දිවට රස දැනෙන තැන ඉඳලා කාපු බීපු දේවල් සිහිකරන තැන දක්වාම, කියපු කරපු දේවල් සිහිකරන තැන දක්වාම අතීතය. වර්තමානයේදි හිතන කරන දේවල් අනාගතය. කයට ගැටෙන මට්ටම අතීතය, ගැටෙන දේ අරභයා කුමන හරි විදිහකට මොනම හරි විදිහකට හිතනවා නම්, කියනවා නම්, කරනවා නම්, **හිතන්න, කියන්න, කරන්න, පුළුවන් වුණේ චේතනාව නිසයි. ඒකම කම්.**

ඒ වගේම මනෝ ස්පර්ශය කියන තැන. දහම් සිතුවිල්ලක් පහළ වෙන තැනම අතීත අන්තය. ඒ අරභයා නැවත හිතනවා නම්, කියනවා නම්, කරනවා නම් ඒක අනාගත අන්තය. ගෙදර කියලා සිහිවෙන අවස්ථාවම, අතීත අන්තය. ගෙදර කියන එක ගැන තව විස්තර ටිකක් දැනගන්න පුළුවන් නම්, අනාගත අන්තය. අම්මා, දරුවා කියලා සිහිවෙන අවස්ථාවම, අතීත අන්තය. දරුවා ගැන මෙහෙම මෙහෙම කරන්න ඕනේ කියලා සිතන

ටික, ගෙදර ගිහිල්ලා මෙහෙම මෙහෙම කරන්න ඕනේ කියලා හිතන ටික, අනාගත අන්තය.

එතකොට මුළු තුන් ලෝකයම **කමාවචර, රූපාවචර, අරූපාවචර** කියන **තුන් ලෝකයම** ඉන්නේ මේ අන්ත දෙකේ. ඒ නිසයි, අන්ත දෙකේ ඉන්න හින්දයි, අන්ත දෙක අත හැරලා මැද නැති හින්දයි, තණ්හාව ඉක්මවෙන්නේ නැත්තේ එයාට. මේ අන්ත දෙකේ ඉන්නකොට ඇති වෙන්නේ තණ්හාවයි. තණ්හාව ඇති වෙන කොට මහා පුරුෂයා කියන්නෙ නැහැ. හීන පුරුෂයා කියලා කියන්නෙ. එතකොට කෙනෙකුට පුළුවන් නම් මේ අන්ත දෙක හඳුනාගෙන මැද ඉන්න, එයාට තණ්හාව ඉක්මවෙනවා.

තණ්හාව නැති කරන්න හදන අපි ඉස්සෙල්ලා දැනගෙන ඉන්න ඕනේ තණ්හාව ඇති වෙලා තියෙන ප්‍රදේශය මොකක්ද කියලා. මැද ඉන්න කියලා උත්සාහවත් වෙන කොට මොකක් හරි මධ්‍යම ප්‍රතිපදාවක හිටියට හරියන්නේ නැහැ. ඒ කියන්නේ මම යනවා 'ඇඩිලේඩ්' වලට කියලා හිතාගෙන අපි හිතුවට පාර තියෙන්නේ 'සිඩ්නි' වලට නම්, අපි හිතුවට වැඩක් නැහැ. ඒ පාර තියෙන්නේ එහෙම නම්, අපි හිතුවට යැවෙන්නේ මෙහාට. දැන් මෙහෙම කළාට තණ්හාව නැති වෙනවා කියලා හිතාගෙන හිටියට අපි, ඒ පාර තියෙන්නේ තණ්හාව පවතින විදිහට නම්, තණ්හාව නැති වෙන්නේ නැහැ.

දැන් කොහොමද අපි ඇහැට පෙනෙන අවස්ථාව අතීතය නම්, පෙනෙන දේ අරභයා හොඳට හිතුවත්, නරකට හිතුවත්, මොන විදියට හිතුවත් ඒක අනාගත අන්තය. දැන් කොහොමද අපි මේ ප්‍රශ්නෙන් මිදෙන්නේ?

ඒ කියන්නේ දැන් ඔය අන්ත දෙක ඇසුරු වෙන්නේ නැති වුණොත් නේ මධ්‍යම වෙන්නේ. මධ්‍යම වුණොත් නේ මේ අන්ත දෙක ඇසුරු නොවෙන්නේ. එහෙම වුණොත් නේ තණ්හාව නැති වෙන්නේ. කොහොමද අන්ත දෙක ඇසුරු නොවෙන්නේ? අපිට ඥාණ දර්ශනයක් තියෙන්න ඕනේ, අතීතයෙන් හටගත්ත, අතීත අන්තය ඇසුරු වෙන ලක්‍ෂණය දකින්න කෙලින්ම රූපයක් පෙනෙනවා කියන මට්ටම. ශබ්දයක් ඇහෙනවා කියන මට්ටම. එතකොට **රූපයක් පෙනෙනවා කියන මට්ටම අපිට උපදින්නේ ඉතුරු ස්කන්ධ ටික ඔක්කොම ඒ අනුව ගිහිල්ලා. ශබ්දයක් ඇහෙනවා කියන එක අපිට තේරෙන්නේ ඉතුරු ස්කන්ධ ටික ඔක්කොම ඒ අනුව ගිහිල්ලා.** දැන් මෙතැනදි ක්‍රම දෙකකට තියෙනවා මේක කරන්න.

රූපය පෙනෙන අවස්ථාව අතීත අන්තය, පෙනෙන රූපය අරභයා හිතුවොත්, කෙරුවොත්, කිව්වොත් අනාගත අන්තය. ඒ හින්දා **පෙනෙන අවස්ථාව උපදින කොටම පෙනෙන රූපය අරභයා හිතන්නේ නැතුව, රූපයත් රූපය ඇති වුණේ මෙහෙමයි, නැති වුණේ**

මෙහෙමයි කියලා (රූපයට හිතන්නේ නැතුව, රූපය අල්ලගන්නේ නැතුව) රූපය ඇති වුණු සහ නැති වුණු හැටි බලන්න. අනෙක් පැත්තට නුවණ ගන්න. **එතකොට රූපය අල්ලගෙන නැති හින්දා අපි රූපය අන්තයේ නැහැ. එහෙම වුණහම රූපය අරභයා හිතනවා, කරනවා, කියනවා කියන එකක් වෙන්නේ නැහැ. රූපය ඇති වෙන හා නැති වෙන හැටි බැලුවා මිසක රූපයට හිතුවේ නැහැ අපි.**

දැන් මේ පෙනෙන රූපය, මේ මනුස්සයෙක් කියලා හිතන එකෙයි, රූපය කියන එක ඇති වෙන්නේ මෙහෙමයි, නැති වෙන්නේ මෙහෙමයි කියන එකෙයි, අතර වෙනසක් තියෙනවා. **දැන් මෙතැනදි රූපයම බලමින් සිටියොත් ඔන්න අතීත අන්තයේ. දැන් රූපය පෙනෙන කොටම මේ පෙනෙනවා කියන සිද්ධිය ඇති වෙන්න හේතු ටික අපිට බලන්න පුළුවන් වුණොත්, මේ ඇහෙන් බලන නිසාමයි මෙහෙම පෙනෙන්නේ කියන තැනක අපි හිටියොත් ඥාණ දර්ශනයකින්, එතකොට පෙනෙනවා කියන සිද්ධිය ඇති වෙන හැටියකින් ඉන්නවා මිසක අපි, පෙනෙන දේ තුළ අල්ලගෙන ඉන්නවා නෙවෙයි. මේකෙ ප්‍රධානම දේ තමයි, ඇහැට පෙනෙන දේ අරභයා සෘජුවම අහුවෙන්න දෙන්න එපා, කියන එකක් මේ කියන්නේ.**

ජලය වගේ පෙනෙන කොට මිරිඟුව තියෙන තැනක, ඕකෙදි මම් අර උපමාවක් කියනවා, වතුරකට තිරිසන්ගත සතෙක් එබුණොත් එයා වතුර වල අයිනට ගිය හින්දනේ එයාගේ ඡායාව පෙනෙන්නේ. හොඳට බලන්න, මේ එබුණු හින්දම පෙනෙනවා නේද කියන නුවණ නැති වුණොත්, එතැනින් අයින් වෙනකොටම මේක නැති වෙනවා නේද කියන නුවණ නැති වුණොත්, වෙන්නේ මොකක්ද? **කෙළින්ම වතුරෙ පෙනෙන ඡායාව දැඩිව අහුවෙනවා. ඔන්න දැන් අතීතයේ හටගත්ත දේ අල්ලගෙන ඉන්නේ එතකොට,** හොඳට මේ උපමාවෙන් බලන්න. තව සතෙක් ඉන්නවා කියන එකක ඉන්නේ. අතීත අන්තයේ හිටියොත් වෙන පාඩුව තමයි පැත්තකට යන කොට, දැකපු සතා ඉන්නවා කියලා අනාගතය බලන්න යනවා කියන අන්තය හදලා තියෙන්නේ. ඉන්න සතාව බලාගෙන ඉන්න කොට, පැත්තකට ගිහිල්ලා දැකපු කෙනා ඉන්නවා ආපහු බලන්න යන්න පුළුවන් කියලා ඉන්න කොට මෙයා ඉන්නේ අන්ත දෙකේ නේ, තේරුණාද කියන එක. මේ උපමාවෙන් තේරුම් ගන්න, ඒ කියන්නේ, මෙහෙම ධර්මතාවයක් නැති වුණාට මෙයා ඉන්නේ අතීත අන්තෙක. **අන්තය කියන එක මනසින් හදාගෙන.** ඒ කියන්නේ හිටපු කෙනෙක්ම නේ දකින්නේ මෙයා දැන්. මේ වතුරෙ තව සතෙක් ඉන්නවා කියන තැනකයි ඉන්නේ. තව එක්කෙනෙක් ඉන්නවා, තව ඉන්න කෙනෙක්වයි බලමින් ඉන්නේ, මෙයා එන්න කලින් කෙනෙක් හිටියා කියන අදහසයි තියෙන්නේ. ඒකනේ එහෙම කෙනෙක් ඉන්නෙ. එහෙම හිටියොත් අනාගත අන්තයේ.

ඔන්න දැන් ඒ අතීත අන්තයත්, අනාගත අන්තයත් කියන අන්ත දෙක නිර්මාණය වුණේ වතුරෙ ඉන්න බල්ලා කියන එක අහුවුණු එකත්, පැත්තකට ගියාට පස්සේ ආපහු

බලන්න යන්න පුළුවන් ගතියකින් බල්ලෙක් ඉන්න එකත් කියන කාරණා දෙක තුළනේ. ඒ කියන්නේ දෙකම එයාට ඇති වුණේ 'මම මේ එබුණ හින්දම නේද මේක හටගත්තේ, එබීම නැති වෙන කොටම නැති වෙනවා නේද' කියන පිටිපස්සට තියෙන නුවණ නැති වුණු නිසා නේද එයාට මෙහෙම වුණේ කියන එක බලන්න.

එතකොට ඒ සතාට වුණු දේ තමයි මේ අරමුණෝ අපිට වෙලා තියෙන්නේ. වතුරට එබුණහම තව සතෙක් ඉන්නවා කියලා පෙනෙනවා වගේ, තව අය ඉන්නවා කියලයි දැන් අපිට පෙනිලා තියෙන්නේ. තේරෙනවද? දැන් මේ පෙනෙනවා කියලා හිටියහම, අර සතා පැත්තකට ගියහම, දැකපු සතා ඉන්නවා කියලා පෙනෙනවා වගේ, පැත්තකට ගියහම අපි දැකපු අය ඉන්නවා කියන එක හිටිනවා. දැන් අපි මේ ඉන්නේ අතීත අන්ත, අනාගත අන්ත කියන දෙකේ.

නමුත් වතුර ගාවට අපි ගියහම අපි දන්නවා, අපි මේ එබෙන හින්දා නේද අපේ ඡායාව වැටෙන්නේ, අපි අහකට යන කොට අපේ ඡායාව නැති වෙනවා නේද, කියන දැනුමක් ඇතුව මෙහෙ බලාගෙන ඉන්න කොට වෙලා තියෙන්නේ, මේ තදින් අහුවෙලා නැහැ. ඒ කියන්නේ අපි දැන් අතීතය නෙවෙයි පරිහරණය කරන්නේ. දැන් තියෙන හේතුවකට ඇති වුණු රූපයක් තමයි අපි පරිහරණය කරන්නේ, නුවණකින්.

දැන් අතීත දෙයක් නෙවෙයි පරිහරණය කරන්නේ නුවණින්, මේ එබුණු හින්දමනේ මේ ඡායාව හටගත්තේ, මෙතැනින් යනකොටම නැති වෙනවනේ කියලා පිටිපස්සට තියෙන හේතු නිසා උපන්න දෙයක්, හේතු නැති වෙන කොට නැති වෙනවා නේද කියලා බලනවා. **යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං** මේ පෙනෙනවා කියන සිද්ධියේ ඇති වීම නැති වීම දකිමින් ඉන්නේ අපි. මේකෙ තියෙන ලක්ෂණය තමයි, 'තියෙන එකක්' දකින්නේ නැහැ. හේතුන්ගෙන් හටගත්ත එකකුයි අපි මේ දකින්නේ දැන්. තියෙන එකක් නෙවෙයි, අතීත අන්තයේ නෙවෙයි. ඒ කියන්නේ වතුරට එබෙනකොටම අපි දන්නවා එබුණු නිසා හටගත්තා කියන කොට, තිබුණා කියන අදහස අතහැරෙනවා අපිට. එතකොට වෙන්නේ පැත්තකට යනකොටම දැකපු එක නැති වෙනවා. මොකද, මෙතන උපාදාන සහිතව නොහිටපු නිසා.

ඒ වගේ අපිට මේ පෙනෙන අරමුණොත්, අරමුණක් පෙනෙන කොට පෙනෙන දේ ඇති වෙන හේතුවයි, මේ හේතුව නැති වෙන කොට නැති වෙනවා කියලා බලන්න පුළුවන් වුණොත්, මේක අහුවෙලා නැහැ.

ඒකමයි මම හැමදාම කියන්නේ මිරිඟුව දිහා බලන කොට ජලය පෙනුණා වගේ, දැන් මිරිඟුව දිහා බලනකොට ජලය වගේ පෙනෙනවා, අපි දන්නවා පෙනෙන දේ

තියෙනවා නෙවෙයි. එහෙම දෙයක් පෙනෙන්නේ, **මිරිඟුව තියෙන තැනක ජලය වගේ පෙනෙන්නේ ඇයි? මේ ඇහැ නිසා. මේ ඇහැ නිසයි මෙහෙම පෙනෙන්නේ. එතකොට ඇහැ? ඇහැ කියන එක මේ නාම-රූප නිසා, මේ කය සවිඤ්ඤාණක වුණු නිසා. කය සවිඤ්ඤාණක වුණේ? හිත ප්‍රතිසන්ධි වශයෙන් ආපුනිසා. ඇයි හිත ප්‍රතිසන්ධි වශයෙන් ආවේ? කර්ම නිසා. කර්මය? අවිද්‍යාව නිසා** කියලා මේ කාරණා ටික තේරෙනවා.

එතකොට ඒකෙන් අන්තිමට පෙන්වනවා, අපිට මේ පෙනෙන්නේ තියෙන දේ නෙවෙයි. මේ පටිච්ච සමුප්පාදය තේරෙන කොට කියනවා 'මේ ආයතන ටික උපද්දලයි පරිහරණය කරන්නේ' කියන එක ඔය පින්වතුන් දැක්කොත්, හරියට පොකුණට එබුණු හින්දා පෙනෙනවා කියන තැනකින්. එතකොට මෙහෙම අල්ලගෙන ඉන්න ගතිය නැහැ. මෙහෙම අල්ලගෙන විඳින ජීවිතයක්, මෙහෙම දෙයක් තියෙනවා නෙවෙයිනේ, මේ හේතු ටිකෙන් නේ උපන්නේ.

හැබැයි හේතුටික ඇති වීම නැති වීම නොදකින හැම වෙලාවකම ඔය පින්වතුන්ට අහුවෙලා ඇති මෙහෙම. මේ පෙනෙන රූපය. තිරිසන්ගත සතාට වතුරට එබුණු නිසාමයි පෙනෙන්නේ කියන එක, දකින්න අමතක වෙන හැම තැනකම ඡායාවෙ තව සතෙක් දකියි. ඒක ඇත්ත වේයි. බුරයි, බුරලා පනියි උඟුව හපන්න. එතකොට බලන්න කොච්චර ඇත්ත වෙලාද කියන එක. බොරුව ඇත්ත වෙලා. ඇත්ත නොදකින කොට බොරුව කොච්චර ඇත්ත වෙනවද කියන එක පෙනෙනවා, ඒ සතා හිතෙන් හිතන එක මොන තරම් දැඩිවෙලාද කියන එක පෙනෙනවා බුරන එක. බුරන එක මොනතරම් ආත්ම වෙලා ද කියන එක පෙනෙනවා හපන්න පනින එක, නේද?

ඒ වගේ මේ ඇත්ත නොපෙනෙන කොට බොරුව ඇත්ත වෙලා මේ කෙනා ගැන බනින්න ගහන්න හිතන එකත්, හිතන කෙනොට බනින එකත්, පෙනෙන කෙනාට ගහන්න පනින එකත්, කියන කොට බොරුව කොයිතරම් ඇත්ත වෙලාද කියලා බලන්න. පොකුණෙ ඡායාව, ඡායාවක් කියන එක නොදැන ඒක ඇත්ත වෙලා, ඒ ඡායාවට බුරන ඒ සතාත්, ඒ ඡායාව හපාකන්න පනින සතාත්, මේ පෙනෙන දේ ඇත්ත වෙලා ඉන්න කෙනාට හිතින් බනින මමත්, ඉන්න කෙනාට වචනෙන් බනින මමත්, ඉන්න කෙනාට ගහන්න පනින මමත්, අතර වෙනසක් නැහැ. පොකුණෙ තියෙන ඡායාවට පනින සතාත්, ඉන්න කෙනාට ගහන්න හදන මමත් අතර වෙනසක් නැහැ. එකම සිද්ධිය තියෙන්නේ. මොකද මේ අන්ත දෙක තියෙන්නෙම **රාග, ද්වේශ, මෝහ** ඇති වෙන විදිහට. එතකොට මහා පුරුෂයා කියන්නේ නැහැ. සුනඛයෙක්ගේ ගානට ගිහිල්ලා තියෙන්නේ එතකොට.

හොඳට බලන්න ඔය පින්වතුන් ඇත්තටම මම කිව්ව හින්දා නෙවෙයි, මෙහෙම

වෙනවද? මෙහෙම වුණේ ඇයි? මෙයාට මෙහෙම වුණා නම්, මෙහෙම දැක්හම මෙහෙම නොවෙනවා නම් හේතුව මොකක්ද කියලා. ඒ වගේ ඒ අරමුණේම අපි අනිත් පැත්තට දකින නිසා, අපි ඒ ඡායාව ඡායාවක් හැටියට දකින නිසා, ඒකද හේතූන්ගෙන් හටගත්ත නිසා, තියෙන එකක් හැටියට දකින්නේ නැහැ. අතීතය ඇසුරු කරන්නෙ නැහැ. අනාගතයට හොයාගෙන යන්නේ නැහැ. ඒ හින්දා අපි ඒකට බනින්නෙත් නැහැ. වර්තමානයක හිටියහම තියෙන ලක්‍ෂණය තමයි ඒක ඇත්ත නෙවෙයි.

අපි වතුරෙ තියෙන ඡායාව අරහයා මේ ඡායාව නම් හොඳයි නේද, ලස්සනයි නේද, කැතයි කියලා හිතන්නෙවත් නැහැ. ඒක එක්ක කතා කරන්නෙවත් නැහැ. ඒකට ගහන්න හදන්නෙත් නැහැ. එහෙම වුනොත් පිස්සු කියලා හිතනවා එයාට. කෙනෙක් කෙරුවොත් ඇත්ත දකිනකොට හිතෙනවා බොරුව කියන්නේ පිස්සු කියලා. දැන් පිස්සු හින්දා පිස්සු බව තේරෙන්නේ නැහැ. දැන් මේ ඇත්ත කියලා හිතාගෙන ඉන්නේ. ඇත්ත දැකපු දවසට තේරෙයි මේ පිස්සු කියලා.

දැන් මේ අරමුණොත් ඔය සිද්ධියමයි තියෙන්නේ. මේ අරමුණොත් මේ හේතු ටික නිසයි මේ ලෝකයේ පෙනෙන බව ඇති වෙලා තියෙන්නේ. ඒකයි, ලෝකය උපදින හැටි නොදන්නා නිසා නැහැයි කියලා හිතාගෙන ඉන්නේ. ලෝකය නැති වෙන හැටි නොදන්නා නිසා තියෙනවා කියලා හිතාගෙන ඉන්නේ.

කෙනෙක් ලෝකය උපදින හැටි දන්නවා නම් නැහැ කියන්නේ නැහැ. ලෝකය නැති වෙන හැටි දන්නවා නම් තියෙනවා කියන්නේ නැහැ. කෙනෙක් තියෙනවා කියලා බැඳෙන්නේ හෝ නැහැ කියලා දුක් වෙන්නේ හෝ මේ ඇති වෙන සහ නැති වෙන හැටි නොදැන, තමන් තුළ මේ ලෝකය ඇති වෙන හැටි සහ නැති වෙන හැටි නොදැන, මේ අන්ත දෙකේ ඉන්න හින්දා.

ඔය උපමාවෙන් ඔය විදිහට දකින්න ඔය අන්ත දෙකම ආයතන හයම. මේ මජ්කෙඩ සූත්‍රයෙන් පෙන්වනවා යම් කිසි කෙනෙක් මේ අන්ත දෙකටම නොපැමිණ මධ්‍යම ප්‍රතිපදාවේ, ඒ කියන්නේ අතීත අන්තයක් අතහැරලා, අනාගත අන්තයක් අතහැරලා, වර්තමානයක හිටියොත් කියන එකෙන් කියනවා, පෙනෙන දේටත් නැඹුරු නොවී පෙනෙන දේ ගැන හිතන්නෙත් නැතුව, කියන ටික අතහැරලා, වර්තමානය කියන කොටම පෙනෙන දේ ඇති වෙන්නේ කොහොමද, නැති වෙන්නේ කොහොමද කියලා බලනවා. පෙනෙන දේ ඇති වෙන්නේ කොහොමද නැති වෙන්නේ කොහොමද කියලා බලන එක පෙනෙන දේට හිතනවා නෙවෙයි. (පෙනෙන දේ ඇති වෙන හා නැති වෙන හැටි නොදන්නා කොටයි පෙනෙන දේ ඇත්ත වෙන්නේ. එතකොටයි ඒකට හිතන්නේ, කියන්නේ, කරන්නේ) මෙන්න මේ විදියට හිටියොත් තණ්හාව ඉක්මවෙනවා. එයා මහා පුරුෂයා කියලා අර ස්වාමීන් වහන්සේ මතක් කරනවා. ඒ ස්වාමීන් වහන්සේ ආපු මාර්ගය ක්‍රමය ඕක නිසා. ආර්ය

අෂ්ටාංගික මාර්ගය වඩලාමයි සසර දුක නැති කරගන්න පුළුවන් වෙන්නේ.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★

අපි කතා කලානේ, අතීතය එක් අන්තයක් අනාගතය එක් අන්තයක් වර්තමානය මැදයි කියලා අපි දන්න පමණකින්. දැන් අපි වර්තමානයක ඉන්නවා කියලා කියමු. දැන් අපි හිතාගෙන ඉන්නේ හරි. නමුත්, ඊට පස්සේ දැන් අනෙක් ක්‍රමයකට හිත තියලා බලනවා, **රූපය එක අන්තයක්, නාමය එක අන්තයක් විඤ්ඤාණය මැදයි.** නාමය හෝ රූපය හෝ දෙකින් එකක් හෝ අහුවෙලා නම්, එතකොට වර්තමානය වුණත් හරියන්නේ නැහැ නේද කියන තැන අපිට එනවා. දැන් අතීතය අත හැරලා අනාගතය අත හැරලා වර්තමානයක හිටියොත් හරි කියලා, එතැනදි අපිට පෙනෙනවා. නමුත් ඊළඟ පරියායෙන් බලන කොට එහෙම වර්තමානයේ ඉන්න කොට රූපය අහුවෙන්නත් බැහැ, නාමය අහුවෙන්නත් බැහැ, නමුත් මම වර්තමානයක හිටියට මේ රූපය කියන එකෙන් මිදිලා නැතුව, රූපය කියන තැනක නේ මගෙ මනස තියෙන්නේ. එහෙනම් මම ඉන්න තැන දෝෂයක් තියෙනවා නේද, කියලා බලාගන්න අපිට පුළුවන්.

තව පැත්තකින් අපි කියමු, **සක්කාය එක් අන්තයක්, සක්කාය සමුදය එක් අන්තයක් සක්කාය නිරෝධය මැදයි** කියලා.සක්කාය කියන්නේ පංච උපාදානස්කන්ධය. ඉතින් මම වර්තමානයක හිටියත් තවම මම පංච උපාදානස්කන්ධයකනේ ඉන්නේ. එහෙනම් මේක හරියන්නෙත් නැහැ නේද, කියලා අපිට බලාගන්න පුළුවන්.

ඒ නිසා අපිට මෙන්න මේ මජ්ඣෙ සූත්‍රයේ වටිනාකම මෙන්න මෙච්චරයි කියලා කියන්න බැහැ. අපිට කොතැනක හරි, යන්තම් හරි මේ මාර්ගයේ පැටලීමක් තිබුණොත්, නොගැලපීමක් තිබුණොත් ඒක අපිට හොඳට පෙන්වනවා, හරියට කැඩපතක් වගේ. ඒ නිසා මේ මජ්ඣෙ සූත්‍රය බොහෝම වටිනා එකක් හැමදෙනාම පුළුවන් තරම් ඉගෙන ගෙන ඒකෙ අර්ථය හොයාගන්න. ඊට පස්සෙ අපිට වාහනයක් පිටිපස්සට ගන්න කොට බලාගන්න තියෙන කැඩපතක් වගේ, අපිට යන්න තියෙන ගමන් මග බලාගන්න තියෙන කැඩපතක් කියලා කිව්වත් කමක් නැහැ?

තව විදියකින්, අපි කරන දේ ඒකාන්තයෙන් විමුක්තිය පිණිස පවතිනවද නැද්ද කියන එක හඳුනගන්න පුළුවන්. මොකද මොනවා හරි දෙයක් කළාට කොහොම හරි නිවෙන්නේ නැහැ. හැමතැනටම මොකක් හරි මාර්ගීයකින් යන්න බැහැ, ඊට අදාල පාරක්

තියෙනවා.

අපි හැම කෙනෙක්ම අනන්ත සංසාරෙ ගොඩාක් ඒ මේ අත දුවපු ඇවිදපු අය. ඉතින් මේ අවස්ථාවෙදි, මේ බුද්ධෝත්පාද කාලයේ මනුස්සයෙක් වුණු වෙලාවෙදි, මොන විදියකට හරි අපිට මාර්ගීය වැරදුනොත් කව්රු නිසා හෝ, පාරෙ යනකොට අපි පාරෙ මැද්දෙන් ගියොත් වාහන ඇවිල්ලා ඇඟේ හැප්පුනොත් මැරෙණ්න වෙන්නේ අපිට. ඉතින් අපි පාරෙ අයිනෙන් යන්නේ, නමුත් වාහන ඇවිල්ලා ඇඟේ හැප්පුනොත්, ඒත් මැරෙණ්න වෙන්නේ අපිට. අපේ වරදක් නැතුව හැප්පුනොත් මැරෙණ්න වෙන්නේ අපිට, අපේ වැරද්දක් තිබුනත් මැරෙණ්න වෙන්නේ අපිට, ඒ හින්දා පරිස්සම් වෙන්න වෙනවා. ඒ නිසා අපේ වැරැද්දක් නැහැ, අනෙක් කෙනා කියපු හින්දයි මම මේක කළේ කියලා සමාවක් නැහැ, ඒත් අන්තිමට මැරෙණ්න වෙලා තියෙන්නේ අපිටමයි. ඒ වගේ වැරදිලා තියෙන්නේ අපිට. ඒ බවත් හොඳට මතක තියාගෙන හැමදෙනාම මේ දහම ටිකක් විචාරශීලීව නුවණින් කටයුතු කරන්න. එහෙම වුණොත් අපිට කවදාවත් වරදින්නේ නැහැ, අපේ මිදීම හදාගන්න පුළුවන්. ඒ සඳහා අපි පොඩ්ඩක් බලමු කොහොමද කියලා.

සැප වේදනාව එක් අන්තයක් දුක් වේදනාව දෙවෙනි අන්තයයි, උපේක්ෂා වේදනාව මැදයි

එදා එතැන හිටපු අනෙක් ස්වාමීන්වහන්සේ නමක් මතක් කළා ඒ බුදුරජාණන් වහන්සේ ***සො උභන්තෙ විදිත්වාන, මජ්ඣෙ මන්තාන ලිප්පති, තං බ්‍රෑමි මහා පුරිසොති සො'ධ සිබ්බනි මජ්ජගා*** කියලා පෙන්නපු ඒ ගාථාවේ අර්ථය මට මෙන්න මේ විදියට තේරෙනවා. මොකක්ද යම්කිසි කෙනෙක් **මේ සැප වේදනාව එක් අන්තයක්, දුක් වේදනාව දෙවෙනි අන්තයයි, උපේක්ෂා වේදනාව මැදයි.** තණ්හාව තමයි මේ සත්වයා නැවත නැවත ගොතවන්නේ, නැවත නැවත සසරට බැඳලා දාන්නේ, ඒ හින්දා සිබ්බනිය කියලා කියන්නේ තණ්හාව, ගෙතුම. මේ සැප වේදනාව කියන අන්තයටත් පැමිණෙන්නේ නැතුව, දුක් වේදනාව කියන අන්තයටත් පැමිණෙන්නේ නැතුව උපේක්ෂා වේදනාවේ ඉඳලා, මෙන්න මේ තණ්හාව යම්කිසි කෙනෙක් අයින්කර ගත්තොත්, අන්න ඒ කෙනාට මහා පුරුෂයා කියලා කියන්න පුළුවන් කියලා, මේ ස්වාමීන් වහන්සේ මතක් කලා.

එතකොට අපි දැන් සැප වේදනාව අන්තයක් වෙන්නේ ඇයි, දුක් වේදනාව අන්තයක් වෙන්නෙ කොහොමද, උපේක්ෂා වේදනාව මැද වෙන්නේ කොහොමද, කියලා

අපි පොඩ්ඩක් බලමු.

මෙතැනදි සැප වේදනාව කියනකොට ගන්න සුඛ, සෝමනස්ස දෙකම අයිතියි සැප වේදනාව කියන එකට. සුඛ කියලා කියන්නේ, සැප කියලා කියන්නේ කය මුල් කරගෙන ඇති වෙන සැපයට. හිතේ සතුටු ස්වභාවයට කියනවා, හිතේ සැපවත් බවට කියනවා සෝමනස්ස කියලා. එතකොට සුඛ, සෝමනස්ස කියලා කියන්නේ කයයි, සිතයි දෙකේ සැප සහගත බව. මේ දෙක එක අන්තයක්. දුක්ඛ කියලා කියන්නේ කය මුල් කරගෙන ඇති වෙන අපහසු කමට. හිත මුල් කරගෙන තියෙන අපහසු කමට කියනවා දෝමනස්ස කියලා. දුක්ඛ, දෝමනස්ස කියලා කියන්නේ හිත කය දෙක මුල් කරගෙන ඇති වෙන අපහසු කමට. එතකොට ඒක දෙවෙනි අන්තය, උපේක්ෂා වේදනාව මැදයි.

දැන් අපි මෙහෙම කිව්වොත්, අපි ගත්තොත් දැන් අපිට මේ අවකාශය වගේ බලන්න පුළුවන්. බලනකොට අපිට විතරක් නෙවෙයි මේ ශාසනයෙන් බැහැර කෙනෙකුට වුණත් බලන්න පුළුවන්, එයාට ලොකු සැපක් එන්නේ නැහැ. ලොකු දුකක් එන්නෙත් නැහැ, උපේක්ෂා වේදනාවක් තියෙන්නේ. එතකොට මේ උපේක්ෂා වේදනාව ආර්ය අෂ්ටාංගික මාර්ගය නම්, මේ සාසනයෙන් බැහැරත් ආර්ය අෂ්ටාංගික මාර්ගයක් තියෙනවා. යටත් පිරිසෙයින් තිරිසන්ගත සත්තුත් ආර්ය අෂ්ටංගික මාර්ගය වඩනවා, ඇයි? උපේක්ෂා සහගත සිත් පහළ වෙනවා ඒ සතුන්ටත්. කොහොම හරි උපේක්ෂාවක් ගැන නෙවෙයි මේ ශාසනයේ මතක් කරන්නේ.

ඊළඟට සැප වේදනාව අන්තයක් වෙනවා නම්, මම මතක් කළා සුද්ධෝදන රජ්ජුරුවෝ රජ මාලිගාවෙ හිටියේ රහත් වෙනකල්. නමුත් කාම සුඛල්ලිකානු යෝගය, නැත්නම් සැප වේදනාව ප්‍රශ්නයක් වුණේ නැහැ. අපි අහලා තියෙනවා තිස්ස හාමුදුරුවන්ගේ කතාව, කකුලේ කලවා ඇට බිඳගෙන භාවනා කළා. නමුත් දුක් වේදනාව අන්තයක් වුණේ නැහැ. අපි අහලා තියෙනවා කාශ්‍යප මහා රහතන්වහන්සේට. ***කච්චිතේ කස්සප ඛමණීයං කච්චි යාපනීයං දුක්ඛා වේදනා අභික්කමන්තො පටික්කමන්ති***

එතකොට කාශ්‍යප මහරහතන් වහන්සේට පවා, චුන්ද මහා රහතන් වහන්සේට, බුදුරජාණන් වහන්සේට පවා, කෲර වූ කටුක වූ තීව්‍ර වූ දුක් වේදනා ඇති වෙලා තියෙනවා. නමුත් මෙතැනදි අපි බලන්න ඕනේ, මේක හරි සූක්ෂම සිද්ධියක්. අපිට හිතෙන්නේ මේ සැප වේදනාව අන්තයක්. දුක් වේදනාව අන්තයක්. එහෙම සැප වේදනාව හෝ දුක් වේදනාව හෝ උපේක්ෂා වේදනාව හෝ කියන සිද්ධියෙන් අන්තය පනවනවා නම් රහතන් වහන්සේලාත් අන්ත වල ඉන්නේ. සැප වේදනාවට හේතුවුණු ස්පර්ශයක් ඇති වුණොත්, මේ කයට බුදුරජාණන් වහන්සේටත් සැප වේදනාවක් ඇති වෙයි නේද? එහෙම වුණොත්

බුදුරජාණන් වහන්සේත් තාම අන්තයක ඉන්නවා. අන්තවලට වැටි වැටි යනවා නම් තණ්හාව ඉක්මෙවුවා කියන්න පුළුවන්ද? බැහැ. එහෙම වුණොත් මහා පුරුෂයා කියන්න පුළුවන්ද? එහෙනම් ඒ මොහොතටවත් මහා පුරුෂයා කියලා කියන්න බැරි වෙයි.

එතකොට, මේකෙ අර්ථය ඔය විදියට නොගත යුතුයි. අපිට බැලූ බැල්මට තියෙන දේ නෙවෙයි. ඊට පස්සේ මේකෙන් විද්‍යාමාන වෙන අර්ථය. මේක පෙළ, පරියාප්තිය. පරියාප්ති ගත අර්ථය නැත්නම් අර්ථය ඊට වෙනස් එකක්. ඒ අර්ථය අනුවයි, ***අත්ථ මඤ්ඤාය, ධම්ම මඤ්ඤාය ධම්මානුධම්ම පටිපන්නො හොති*** - ධර්මය දැනගෙන, අර්ථය දැන ගත්තහමයි ධර්මානුධම්ම ප්‍රතිපත්තිය එන්නේ. මේ ධර්මය කියලා ධර්මය තුළින් ඔය පින්වතුන් ප්‍රතිපත්තියේ හැසිරෙන්න ගියොත් තමයි ප්‍රශ්නේ ඇති වෙන්නේ. දැන් ඔය පින්වතුන් සැප වේදනාව එක් අන්තයක්, දුක් වේදනාව එක් අන්තයක්, උපේක්ෂා වේදනාව මැදයි කියලා ඒ අනුව තමයි හැසිරෙන්න හදන්නේ. කෙළින්ම පරියාප්තියට තමයි ඔය පින්වතුන් ප්‍රතිපත්තිය ගන්න හදන්නේ. නමුත් පරියාප්තියේ, පරියාප්ති අර්ථය කියලා තියෙනවා. සූත්‍ර අර්ථය කියලා එකක් තියෙනවා. මේක ධර්මය, මේ ධර්මයේ තියෙන අර්ථය තේරුම් කර ගන්න ඕනේ. මේකෙන් කියන්නේ මොකක්ද? ඔය අද අපි කරන ක්‍රම වලට කියනවා 'ව්‍යංජන ඡායාවෙන්' අර්ථ ගන්නවා කියලා. ඒ කියන්නේ වචනය ඇහුණු පමණකින් අපි ඒකට අදහසක් ඇති කරගන්නවා. නමුත් නියම අර්ථය හිතාගන්නේ නැහැ.

අත්ථි භික්ඛවේ අත්ථ හිතාය පටිපන්නා පුද්ගලා - බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ආත්ම සුවය පිණිස පිළිපන්න පුද්ගලයෝ ඉන්නවා. තමාව රැකීම පිණිස පිළිපන්න පුද්ගලයෝ ඉන්නවා. ආත්ම සුවය පිණිස පිළිපන්න පුද්ගලයෝ ඉන්නවා නම්, ඒකාන්තයෙන්ම ආත්මයක් තියෙනවා තමයි. මේ කියලා තියෙන්නේ බුදු රජාණන් වහන්සේ කියලා, අපි ඒ වචනෙන් අර්ථෙ ගන්නවා. එතකොට සම්පූර්ණ අනාත්ම දර්ශනය අත හැරෙනවා.

ඔය වචනය දිහා බලලා අර්ථ ගන්න එකට කියනවා ව්‍යංජන ඡායාවෙන් අර්ථ ගන්නවා කියලා. එතකොට ඒ වගේ අපිට වෙන්නේ සූත්‍රයක අර්ථය, සූත්‍රයට අනුව පිළිපදින්න ගියාම ව්‍යංජන ඡායාවෙන් අර්ථ ගත්තා වෙනවා. එතකොට සැප වේදනාව එන්නේ නැතුව, දුක් වේදනාව එන්නේ නැතුව, උපේක්ෂා වේදනාවේ ඉන්න පුළුවන් වෙයිද අපිට? කවදාවත් ජීවිතේ ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන්න බැරි වෙයි ඔය පින්වතුන්ට. පුළුවන්ද? එහෙම නම් එක්කො එවෙලේම කළුරිය කරන්න වෙනවා. නමුත් එතකොට ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන කෙනෙක් වෙන්නේ නැහැ. ඇයි නිකමට හරි කටුවක් ඇනුණොත් කෙලින්ම ප්‍රතිපදාව ඉවරවෙයි. භාවනා කර කර ඉන්නකොට දුක් වේදනාව

එක අන්තයක් නේ. අපි එතනින් නේ ගන්නේ.

එතකොට මේ ලෝකයේ ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන කෙනෙක්, වඩපු කෙනෙක්, ජීවත්වෙන කෙනෙකුට කරන්න පුළුවන් එකක් ලැබෙන්නේ නැති වෙයි. නමුත් මෙතැනදි මේ කාරණාවල අර්ථය තේරුම් කරගන්න ඕනේ. මේවා හරි වටිනවා. මේ කාරණා නොදන්න කොට තමයි අපිව රවට්ටන්න පුළුවන්. අපි රැවටෙන්නේ. එතකොට දැන් සැප වේදනාව එක් අන්තයක් වෙන්නේ කොහොමද, දුක් වේදනාව එක් අන්තයක් වෙන්නේ කොහොමද, කියන කාරණාව අපි තේරුම් කර ගනිමු.

සැප වේදනාව කියන කොට දකින්න, සැප වේදනාව උප්පත්ති ස්ථාන වශයෙන් හය ආකාරයි. සැප වේදනාවට හේතුවු රූප ස්පර්ශය නිසා සැප වේදනාව ඇති වෙනවා. ශබ්ද ස්පර්ශය නිසා, ඝාන ස්පර්ශය නිසා, ජිව්හා ස්පර්ශය නිසා, කාය ස්පර්ශය නිසා, මනෝ ස්පර්ශය නිසා සැප වේදනාව හටගන්නවා. ඕක සැප වේදනාව. එතකොට දුක් වේදනාවට හේතු වූ චක්ඛු සම්ඵස්ස නිසා, සෝත සම්ඵස්ස, ඝාන සම්ඵස්ස, ජිව්හා සම්ඵස්ස, කාය සම්ඵස්ස නිසා දුක් වේදනාව උපදිනවා. ඕක දුක් වේදනාව. දුක් වේදනාව හෝ සැප වේදනාව කියන කාරණා ඉපදීම අන්ත නෙවෙයි.

අපි කිව්වොත් පුද්ගලයෙකුට, මේ දෙන්නෙක් ඉන්නවා, මෙයාගෙ අන්තය ගන්නත් එපා, මෙයාගෙ අන්තය ගන්නත් එපා, මැදින් යන්න, කිව්වොත් මේ දෙන්නා ඉඳීමම අන්තද අපිට? මම අන්තයක් ගත්තා වෙනවද දෙන්නෙක් ඉන්නකොට. අපි කියමු **මෙයාගෙ අන්තයත් ගන්න එපා, මෙයාගෙ අන්තයත් ගන්න එපා, මට මැද්දෙන් යන්න කියලා කිව්වොත්, මේ දෙන්නා ඉඳීමද අන්ත වෙන්නේ. මම මෙයා ගාවට ගියොත් අන්තයකට ගියා මිසක, මම නොගියොත් අන්තයක් වෙනවද? ඒ දෙන්නගේ ජීවිත් වීමම අන්තයක්ද? ඒ දෙන්නගේ ඉපදීමම, පැවැත්මම, ජීවත් වීමම අන්තය වෙනවද?** නැහැනෙ. ඒ දෙන්නා ගාවට මම ගියොත් නේද අන්තෙකට ගියා වෙන්නේ.

ඒ වගේ සැප වේදනාවට හේතු ස්පර්ශ නිසා සැප වේදනාව උපදිනවා කියන එක ධර්මතාවයක්. කෙනෙක් සැපයේ සැපවත් වෙනවා නම් අන්න එයා සැප වේදනාව අන්තය අරගෙන. **සැප වේදනාවේ අන්තය අනුව ගියා කියලා කියන්න තියෙන හොඳම සාක්ෂිය තමයි ඔය පින්වතුන්ට සතුටක් ඇවිල්ලා ඇති, ඔය පින්වතුන් ඒකෙ සැපවත් වෙලා ඇති, පින්වතුන්ට මිහිරක් දැනිලා ඇති ඒ සැපයේ. දුක් වේදනාව අනුව ගිහිල්ලා කියන්න තියෙන එකම සාක්ෂිය තමයි ඔය පින්වතුන් දුක් වෙලා ඇති, ශෝකයක් ඇවිල්ලා ඇති, දොම්නසක් ඇවිල්ලා ඇති.** සැප වේදනාවට හේතු ස්පර්ශය නිසා සැප වේදනාව උපදිනවා. නමුත් ඒ සැපයේ අන්තයට ගිහිල්ලා නැත්නම්, සැපය අනුව අපේ මනස

ගිහිල්ලා නැත්නම්, අපි ඒකෙන් සතුටු වෙන්නේ නැහැ. සතුටක් නැහැ. සැපයේ අපි උපේක්ෂායි. දුක් වේදනාවට හේතු ස්පර්ශය නිසා දුක් වේදනාව එනවා. ඒත් දුක් වේදනාව අනුව අපි ගිහිල්ලා නැත්නම්, දුක් වේදනාවට අනුව අපේ මනස පිහිටලා නැත්නම්, ඒ දුක් වේදනාවෙදි අපි දුක් වෙන්නේ නැහැ. දුක එන්නේ නැහැ අපිට. අපි උපේක්ෂයි.

රහතන්වහන්සේ නමකට කියනවා. ***ඡළඞ්ග සමන්නාගත උපේක්ඛා,*** රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ ධම්ම මේ හය පොළේම උපේක්ෂායි. ***ඵුට්ඨස්ස ලෝක ධම්මෙහි චිත්තං යස්ස න කම්පති අසෝකං විරජං ඛෙමං එතං මංගල මුත්තමං*** අට ලෝ දහමින් කම්පා වෙන්නේ නැහැ. ලාභ-අලාභ, යස-අයස, නින්දා-ප්‍රසංසා, සැප-දුක් මේ එකකින්වත් කම්පා වෙන්නේ නැහැ. ඇයි ඒ කම්පා වෙන්නේ නැත්තේ? සැපවත් වෙනවා නම් කම්පා වෙලා ද නැද්ද? **සැපයේ කෙනෙක් සතුටු වෙනවා නම් කම්පා වෙලා. දුකේ දුක් වෙනවා නම් කම්පා වෙලා.** සැප වේදනාව අනුව යනවා. **අන්තෙකට යනවා කියලා කිව්වේ එයා අට ලෝ දහමින් කම්පා වෙනවා කියන එක.** දුක් වේදනාව අනුව පවතිනවා කියලා කියන්නේ අට ලෝ දහමින් කම්පා වෙනවා. **මධ්‍යම ප්‍රතිපදාවේ ඉන්න කෙනා අට ලෝ දහමින් කම්පා වෙන්නේ නැහැ** කියන එකට තව කාරණාවක් මේ.

එතකොට හොඳට දකින්න, සැප වේදනාව එක් අන්තයක් දුක් වේදනාව එක් අන්තයක්, හොඳට තේරුම් කර ගන්න. එතකොට, **උපේක්ෂාව මැදයි කියලා කිව්වේ සැප වේදනාවෙදිත්, දුක් වේදනාවෙදිත්, උපේක්ෂා වේදනාවෙදිත් උපේක්ෂාවෙන ඥාණ දර්ශණයකින් පින්වතුන් ඉන්නවා නම්, එයා සැපයේත් උපේක්ෂායි, දුකේත් උපේක්ෂායි, උපේක්ෂාවේත් උපේක්ෂායි.** මෙන්න මෙයා මධ්‍යම ප්‍රතිපදාවේ ඉන්නවා. මොකද මේ සැපයි කියන පැත්තට එයාගේ ඇලීමක්, බැඳීමක්, ගැටීමක් නැති නිසා, දුකයි කියන පැත්තට වැඩි ඇලීමක්, බැඳීමක් ගැටීමකුත් නැති නිසා, එහෙම මනසට උපේක්ෂාවෙදිත් ඇලීමක්, බැඳීමක්, ගැටීමක් නැති නිසා, නියම උපේක්ෂාව කියන එක තියෙන්නේ එතකොටයි.

ඒ නිසා යම් කිසි කෙනෙක් සැප වේදනාව කියන එක හේතු ප්‍රත්‍යයි, මේ මේ මේ හේතු ටික නිසයි හටගන්නේ, ඒ හේතු ටික නැති වෙන කොට නැති වෙනවා නේද කියන ඥාණ දර්ශනය දැකලා, සැපයේ සැපවත් නොවෙන මනසක් හැදිලා තියෙනවා නම් ඔන්න දකින්න ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ඉන්නවා. දුක් වේදනාව ඇති වෙන්න තියෙන හේතු ටික නිසා දුක් වේදනාව උපදින්න පුළුවන්. දුක් වේදනාව හේතු ප්‍රත්‍යයයි. ඒ හේතු ටික නැති වෙන කොට දුක් වේදනාව නැති වෙනවා කියලා දැකපු නිසා, දකින නිසා, ඒකේ ගැටෙන්නේ නැතුව ඉන්නවා. දුකෙත් උපේක්ෂායි. උපේක්ෂා වේදනාවට හේතු වූ ස්පර්ශය නිසා හටගත්ත උපේක්ෂා වේදනාව, හේතු නිරුද්ධ වෙනකොට නිරුද්ධයි කියලා දකින

නිසා උපේක්‍ෂාවෙත් උපේක්‍ෂායි.

මෙයාට අමුතුවෙන් උපේක්‍ෂාව කියලා ඉන්න එකක් ඕනේ නැහැ, ජීවිතේ හැම තැනකම උපේක්‍ෂායි, දැන් සැප අන්තයක් මෙයාගෙ නැහැ. දුක් අන්තෙට වැටිලත් නැහැ. දුක කියන එක ධර්මතාවයක්, ප්‍රත්‍ය නිසා උපදිනවා, නිරුද්ධ වෙනවා. ඒක කෙනෙක්ගේ නෙවෙයි. ඒ සැපය 'මම' කරගෙන සතුටු වෙන්නේ හෝ ඒ සැපය 'තමන්ගේ' කරගෙන දුක්වෙනවා කියන කාරණාවක් නැහැ. සැපයේත්, දුකේත් දෙකේම උපේක්‍ෂායි. මෙන්න මේ විදියට මනස තියාගන්න පුළුවන් වුණොත්, මෙන්න මේ විදියට කෙනෙක් හිත හසුරුවා ගත්තොත් අන්න තණ්හාව ඉක්මෙනවා.

දැන් සැපයේ සැපවත් කියන කොට, සැපවත් වෙන කෙනෙකුට ඇති වෙන ලෝභය ඇති වෙන්න මෙයාට හේතු නැහැ. මේ සැපේත් උපේක්‍ෂායි. ඒකෙ පටිච්ච සමුප්පන්න බව දන්නවා. දුකේ දුක්වෙලා කෙනෙකුට පටිඝය ඇති වෙන කොට ඒක ඇති වෙන්න මෙයාට හේතු නැහැ. ඇයි? දුකේ පටිච්ච සමුප්පන්න බව දන්නවා. දුකේ උපේක්‍ෂායි. උපේක්‍ෂා වේදනාවේ පටිච්ච සමුප්පන්න බව දන්න නිසා, උපේක්‍ෂා වේදනාවේ ඇත්ත නොදකින බව, මෝහයක් හිටින්න ඉඩ නැහැ. අන්තිමට සැප වේදනාව දුක් වේදනාව උපේක්‍ෂා වේදනාව කියන තුන් වේදනාවම දන්නවා කියලා මෙයාට කියන්නේ, රාග, ද්වේශ, මෝහ කියන අකුසල් ටික කෙළෙස් ටික තමයි අත හැරෙන්නේ.

එතකොට මෙන්න මේ විදියට හිටියොත් මේ සිබ්බනිය අත හැරෙනවා. තණ්හාව ගෙවෙන කල්ම ඔය විදියට ඉඳලා, තණ්හාව ගෙවුණාට පස්සේ අමුතුවෙන් මෙහෙම ඉන්න ඕනේ නැහැ. මේ ප්‍රතිපදාව, සිබ්බනිය, ගෙවෙන කල්ම ඉන්න ඕනේ, මේක කරන්න ඕනේ. සිබ්බනිය ගෙවුණාහම, **තණ්හාව දුරුවුණු දවසට අමුතුවෙන් මත්තේ කළ යුත්තක් නැහැ. මේ දර්ශනය ස්ථාවර වෙනවා, මේ දර්ශනය ජීවිතය වෙනවා. කළ යුත්ත කරලා ඉවරයි. අන්න එයාට මහා පුරුෂයා කියලා කියනවා.**

ඔන්න ඔයවගේ අර්ථයක් දකින නිසා, ඔය වගේ ප්‍රතිපදාවකින් එදා ආස්‍රවක්‍ෂය කරගත්ත නිසා, අර ස්වාමීන් වහන්සේ මතක් කළා තමන් ආව පරියාය. සැප වේදනාව එක් අන්තයක්, දුක් වේදනාව එක් අන්තයක්, උපේක්‍ෂා වේදනාව මැදයි, එහෙම ඉඳලා මේ තණ්හාව නැති කළොත් එයාටයි මහා පුරුෂයා කියලා කියන්නේ.

නාමය එක් අන්තයක් රූපය එක් අන්තයක්, විඤ්ඤාණය මැදයි

ඊට පස්සේ, එතන ඉන්න තව ස්වාමීන් වහන්සේ නමක් මතක් කලා **රූපය එක් අන්තයක්, නාමය එක් අන්තයක් 'විඤ්ඤාණං මජ්ඣෙ' විඤ්ඤාණය මැදයි.** එතකොට මෙතැනදි අපි තේරුම් කරගන්න ඕනේ, රූපය අන්තයක් වෙන්නේ කොහොමද, නාමය අන්තයක් වෙන්නේ කොහොමද? කියන කාරණාව. මොන විදිහට ඉන්න කෙනාද රූපය අන්තයට ගියා වෙන්නේ, මොන විදියට ඉන්න කෙනාද නාමය අන්තයට ගියා වෙන්නේ.

මෙතැනදි දැකිය යුතුයි රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන මේ ස්කන්ධ පංචකයේ, ඇහැ-රූප, කන-ශබ්ද, නාසය-ගන්ධ, දිව-රස, කය- පොට්ඨබ්බ, කියන මෙන්න මේ පස් පොළේ රූප දහයක් ඇසුරු වෙනවා. කෙනෙකුට ඇහෙන් බලනකොට මේ පෙනෙන්නේ රූපය කියන අදහස නම් තියෙන්නේ, ශබ්දය අහන කොට ඇහෙන ශබ්ද රූපය, ගන්ධ රූපය, රස රූපය කියන අදහස නම් තියෙන්නේ මෙයා රූපය අන්තයෙයි. තවම රූපයෙන් මිදිලා එහෙම නැහැ. එතකොට කෙනෙකුට හිතින්, හිතට යම් යම් දේවල් තේරෙන කොට, සිහිවෙන කොට ඒ විඤ්ඤාණය ධම්මායතනය අනුව පිහිටලා තියෙන්නේ. සිහිවෙන දේවල් ඇත්ත වෙනවා නම්, ඇත්ත වෙලා නම් ඉන්නේ මෙයා නාමධර්ම අනුව ගිහිල්ලා තියෙන්නේ. මොකද හිතට පෙනෙන දේවල්, වේදනා, සංඥා, සංඛාර කියන චෛතසික ටිකට තමයි ධම්මායතනය කියලා කියන්නේ. ධම්ම ආයතනය කියලා කියන්නේ නොයෙක් නොයෙක් දහම් ස්වභාවයන්, ඒ කියන්නේ ගෙවල්, දොරවල්, කල කී දේවල්, එකින් එක එකින් එක හිතට සිහිවෙන ලක්‍ෂණායට තමයි, ස්වභාවයට තමයි 'ධම්ම' කියලා කියන්නේ. ඒ සිද්ධිය ඇත්ත වෙනවා නම්, **මේ සිහි කරන සිහි කරන දේ ඇත්ත වෙනවා නම්, ඒක ඇත්ත වුණා කියලා කියන්න තියෙන ලක්‍ෂණය තමයි, ඒ වගේ දේවල් බාහිරේ තියෙනවා, බාහිරේ ඉන්නවා, හිටපු තිබුණු දේවලුයි සිහිවෙන්නේ කියන මට්ටම තියෙනවා නම් අපිට ඒ තමයි අපි ධම්මායතනය අනුව ඉන්නේ.**

පංචායතනය පරිහරණය කරද්දි රූපය නොඉක්මවා, ශබ්දය නොඉක්මවා, ගන්ධය නොඉක්මවා රසය නොඉක්මවා, ස්පර්ශය නොඉක්මවා පොට්ඨබ්බය නොඉක්මවා පවතිනවා නම් රූපය අන්තයේ. හිතෙන් සිහි කරනකොට ධම්මාරම්මණ නොඉක්මවා පවතිනවා නම් නාමය අන්තයේ. විඤ්ඤාණං මජ්ඣෙ කෙනෙකුට මේ රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම කියන මෙන්න මේ කාරණා ටික අනුව යන්නේ නැතුව, මේ හිත මැදයි කියන කාරණාවකට එන්න වෙනවා. හිත මැදයි කියන කාරණාව කියන්නේ, අපි ඔන්න

කිව්වොත් දැන් අපි මෙහෙම හිටගෙන ඉන්නකොට, අපි වටේට වැටක් තියෙනවා නම් ඔය වැට අපි අල්ලාගෙන, කොතැනක හරි අල්ලගෙන හිටියොත්, අපි දැන් එක තැනක් අල්ලගෙන ඉන්නේ. හිටගෙන ඉන්නවා, නමුත් අත්දෙක බැඳගෙන නම් එතකොට තමයි අපි අල්ලන්නේ නැතුව ඉන්නවා කියන්නේ. දැන් මේ හිටගෙන ඉන්න අපිට රූපය තියෙනවා කියන්නේ, මේ වැට අල්ලගෙන ඉන්නවා වගේ. මෙහෙම ඉන්න අපිට ශබ්දයක් ඇහෙනවා කියන්නේ මේ වැට අල්ලගෙන ඉන්නවා වගේ. ගන්ධයක් දැනෙනවා කියන්නේ වැට අල්ලගෙන ඉන්නවා. රසක් දැනෙනවා කියන්නේ වැට අල්ලගෙන ඉන්නවා. ස්පර්ශයක් දැනෙනවා කියන්නේ වැට අල්ලගෙන ඉන්නවා. හිතට යම් ධම්මාරම්මණයක් සිහිවෙනකොට ඒකට අනුව නැඹුරුවෙලා ඉන්නවා කියන්නේ වැට අල්ලගෙන ඉන්නවා.

වැට තියෙද්දි, අපි අපිටම නැඹුරුවෙලා අත්දෙක බැඳගෙන ඉන්නවා වගේ, රූපයක් පෙනෙන කොට, පෙනෙනවා කියන සිද්ධිය ඇති වෙන සහ නැති වෙන හැටි බලනවා, පෙනෙන දේට නැඹුරු වෙන්නේ නැහැ. තමන් තුළම මේ චිත්ත, චෛතසික ධර්ම ඉපිද නිරුද්ධ වෙන ලක්ෂණයක් අපිට හම්බ වෙන්න ඕනේ.

මම ඒ ගැන මතක් කළා. හිතයි කයයි දෙක (නාම-රූප දෙක) උපකාරයි ඇහැ හැදෙන්න. ඇහැ උපකාරයි මෙහෙම රූපයක් හැදෙන්න. මේ දෙන්න උපකාරයි ආපහු හිත හැදෙන්න, කියන සිද්ධියකින් තමයි අපිට මේ දේ පෙනෙන්නේ. මේ කාරණා ටිකෙන් කියනවා තමන් තුළම තියෙන හේතු ටිකක් නිසා ලෝකය උපදිනවා. ඒ හේතු ටික නිරුද්ධ වෙනකොට නිරුද්ධ වෙනවා. එතකොට ඇහැට රූපයක් පෙනෙන්න තියෙන හේතු ටික නිසා පෙනෙනවා. දකින්න පෙර තිබුණා නෙවෙයි, දැක්කයින් පසේසේ තියෙනවා නෙවෙයි, මේ ඇහෙන් බලන නිසයි මෙහෙම පෙනෙන්නේ කියන දර්ශනයක් ඕනේ. එතකොට තමන්ගේ ජීවිතය මේ තියෙන්නේ, හටගෙන නිරුද්ධ වෙනවා කියන තැනකට.

තව පැත්තකින් ගත්තොත්, ඇහෙන් රූප බලන්න, ඇහැ පරිහරණය කරන්න, තියෙන රූපයක් බලනවා කියන අදහස මැකෙන විදියට. රූපයක් පෙනෙනවා කියන අදහස මැකෙන විදියට. මෙහෙම රූපයක් පෙනනවා කියන දේ හැදිලා තියෙන්නේ මෙහෙම නේද, මේ ඇහැ නිසා නේද මෙහෙම යමක් පෙනෙන්නේ, ඇහැ හැදුණේ මෙහෙම සිද්ධියක් නිසා නේද, නාම-රූප නිසා නේද, මෙහෙම වුණේ ප්‍රතිසන්ධියෙන් ආපු නිසා නේද? කියලා මේ ***අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාරා පච්චයා විඤ්ඤාණං*** කියන පටිච්ච සමුප්පාද සිද්ධිය දකින්න වෙනවා.

එතකොට තමන් තුළයි ඉන්නේ අපි. ***විඤ්ඤාණං මජ්කෙඩ*** කියන්නේ මේ හිත ඇති වුණු සහ නැති වුණු හැටි. **මේ ආයතන ටික ඇති වෙන සහ නැති වෙන හැටි දකින**

කොට අපි රූපය කියන එක අහුවෙන්නේ නැති විදිහට ඉන්නේ. ඔය දේ තේරුම් ගන්න අමාරු හින්දා තමයි මම අර කෙටි ක්‍රම කියන්නේ පවතින දේ අනෙකක්, පෙනෙන දේ අනෙකක් කියලා මොකද ඒවද තව පිරිසිදු මදි, මම ඔය කියන ඒවා. නමුත් දැනට මොකද මේ පැත්ත බලාගෙනයි තව ඒ වගේ දෙයක් වුණත් ඥාණ දර්ශනය යෙදෙන්නේ. බාහිරය බලාගෙන, මේකෙ යෙදෙන්නම බැහැ ආධ්‍යාත්මික සිද්ධියක්. අන්තිමට මුළු ලෝකය තුළින්ම අපිට හම්බ වෙන්නේ චිත්ත, චෛතසික ධර්මයන්ගේ ඉපිද නිරුද්ධ වෙන දර්ශනයක්. නමුත් ඒ හිත ඇතුළෙ රැවටිලා නම්, හිත ඇතුළෙ ලෝකය බෙදිලා නම්, මේ රූපය, මේ ශබ්දය, මේ ගන්ධයයි කියන තැනකින් ඒ මෝඩකම ලෙහාගන්න වෙනවා, ටික ටික ටික ටික. එහෙම සිද්ධියක් මේ තියෙන්නේ අන්තිමට.

එතකොට කෙටියෙන් ගත්තොත් රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ටබ්බ කියන ටික අහුවෙන මට්ටම දකින්න රූපය අන්තය. සිතට සිහිවෙන ධර්මාරම්මණ ඇත්ත වෙලා, ගෙවල් දොරවල් යම් යම් බඩු භාණ්ඩ පෙනෙනවා නම් හිතට, ඒක නාමය අන්තය කියලා දකින්න.රූපය අන්තය නොගෙන ***විඤ්ඤාණං මජ්කෙඩ*** වෙන්නේ කොහොමද? පෙනෙනවා කියන රූපය, පෙනෙනවා කියන සිද්ධිය ඇති වෙන්නේ මෙහෙමයි, නැති වෙන්නේ මෙහෙමයි කියන තැනට නුවණ ආවොත්, එතැනට කියනවා රූපය අන්තයට ගිහිල්ලා නැහැ එයා. රූපය ඇති වෙන හා නැති වෙන හැටි දන්නවා. නුවණක් තියෙන්නේ. ප්‍රඥාවක් තියෙනවා එතකොට එයාට, එතැන ප්‍රඥාව යෙදෙන්නේ. ශබ්දය එහෙමයි, රසය එහෙමයි, ගන්ධය එහෙමයි, ස්පර්ශය එහෙමයි. ධර්මාරම්මණ එහෙමයි කියලා ධර්මාරම්මණ ඇති වෙන්නේ මෙහෙමයි, නැති වෙන්නේ මෙහෙමයි කියලා දන්නවා. මෙන්න මේ විදියට ඒ ඒ අරමුණු ඇති වෙන, නැති වෙන දර්ශනය තුළ ඉන්න කොට මෙයා රූප අන්තය හෝ නාම අන්තය කියන ටික අරගෙන නැහැ.

මොකද රූපයක් හම්බ වෙන කොට එතැන තියෙන්නේ වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නම්, අපිට ප්‍රකට නැහැ. ඒවා ටික වැයවෙලා කෙළින්ම රූපයයි හම්බ වෙන්නේ. ඒ හින්දා මේ විදියට හම්බ වෙන තැනදි රූපෙ අන්තය හෝ නාම අන්තය කියන එක බෙදෙන්නේ අපිට හම්බවෙන මට්ටම. අපිට **රූපය කියලා එකක් හම්බ වෙන මට්ටමෙන් කෙනෙක් මිදෙන්න උත්සාහවත් වෙනකොට, එයා රූපය අන්තය අතහැරලා. අපිට නාමධර්ම කියලා හම්බවෙන, ඒ කියන්නේ ගෙවල් දොරවල් කියලා අපිට සිහිවෙන මට්ටම නාමධර්ම ටික අවබෝධ කරගෙන, ඒකෙ පටිච්ච සමුප්පන්නතාවය බැලුවම නාමය අන්තයෙන් මිදිලා.** මේ නාමධර්ම ටිකට හිත බැඳිලා තියෙන්නේ අපිට, ගෙවල් දොරවල් ඉඩකඩම් කියලා හිතට සිහිවෙනවා කියන මට්ටමක. ඒ හිතට සිහිවෙනවා කියන ටිකෙන් අපි බේරෙන කොට, එතැන නොරැවටෙන කොට, ඒ නාමධර්ම ටිකෙයි අපි නොරැවටිලා තියෙන්නේ. ඒ නිසා ඒ විදියට හිතලා හිටියොත් මේ තණ්හාව ඉක්මවන්න පුළුවන් කියලා, ඒ ස්වාමීන්

වහන්සේලා මතක් කලා.

ආධ්‍යාත්මික ආයතන එක් අන්තයක් බාහිර ආයතන දෙවෙනි අන්තයයි, විඤ්ඤාණය මැදයි

ඊට පස්සෙ එතන හිටපු තව ස්වාමීන් වහන්සේ නමක් මතක් කරනවා, **ආධ්‍යාත්මික ආයතන එක අන්තයක් බාහිර ආයතන දෙවෙනි අන්තයයි, විඤ්ඤාණය මැදයි කියලා.** එතකොට කෙනෙකුට, ඇහැ, කන, දිව, නාසය, ශරීරය, මනස කියන මෙන්න මේ ආයතන ටික, එක අන්තයක්. රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම කියන ආයතන ටික බාහිර අන්තය. කොයි වෙලාවක හරි කොහොම හරි, මේ ආධ්‍යාත්මික බාහිර කියන අන්ත දෙකේ එකක හරි හිටියොත්, අපි විදර්ශනා කරන්න කියලා හරි, අන්තෙක ඉඳගෙන මිදෙන්න හදනවා. පෙනෙන්නෙ රූපයක් කියන තැනකට හම්බ වෙනවා. ඒ රූපය ඇතුලෙ නම් අපි අනිත්‍ය බලන්නෙ, අන්තෙකයි අපේ නුවණ යෙදිලා තියෙන්නෙ. ඕකට කියනවා සාසව ප්‍රඥා කියලා. ලෝකය තුල යෙදෙන ප්‍රඥාවට කියනවා සාසව ප්‍රඥා කියලා. ඇහෙන ශබ්දය කියන එක, අන්තයක්. මේ ශබ්දයේ අනිත්‍ය බලන්න නම් බලන්න කියලා නම් හරි අපි යෙදිලා තියෙන්නෙ, අපේ ඒ ප්‍රඥාව සාසවයි. අනාස්‍රව නැහැ.

ඊට පස්සෙ තව පැත්තකින් ගත්තොත් රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම මේ අරමුණු හම්බ වෙන වෙලාවෙදි රූපය අනුව අපේ මනස පිහිටලා, ශබ්දය අනුව මනස පිහිටලා, ගන්ධය අනුව මනස පිහිටලා, රසය අනුව මනස පිහිටලා, නම් ඔන්න අපි රූප අන්තයෙ ඉන්නෙ. බාහිර ආයතන අන්තයෙ ඉන්නෙ. ඊට පස්සෙ, ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන එක අන්තෙ වෙන්නෙ, හතර ඉරියව්වෙම ඉඳගෙන, හිටගෙන, නිදාගෙන ඇවිදින ඉන්න අපිට ඇහැක් තියෙනවා කියන මට්ටම තේරෙනවානම්, දැනෙනවානම්, ඔය මානසික මට්ටම දකින්න ඔය පින්වතුන් ඇහැ කියන අන්තෙකයි ඉන්නෙ. ඇහැ නැති වෙලා නැහැ. ඇහැ තියාගෙනයි ඔය පින්වතුන් ඉන්නෙ. ඉඳගෙන, හිටගෙන, නිදාගෙන ඇවිදින හතර ඉරියව්වෙම හැසිරෙන, අපිට මේ කන තියෙනවා කියන මට්ටමක ඉඳගෙන නම් නාසය, දිව, ශරීරය තියෙනවා කියන මට්ටමක නම් ඔය පින්වතුන් ඉන්නෙ, දකින්න ඔය පින්වතුන් ආධ්‍යාත්මික ආයතන වලින් මිදිලා නැහැ, මේ ආධ්‍යාත්මික ආයතන ටික අල්ලගෙනයි ඉන්නෙ කියලා දකින්න.

ඊට පස්සෙ **විඤ්ඤාණං මජ්ඣෙ** කෙනෙකුට ඇහැ කියන එකත් අහුවෙන්නෙ නැතුව රූපය කියන එකත් හිතට අහුවෙන්නෙ නැතුව, නැත්නම් ඇහැ කියන එකත් ඇති

වෙන හැටි දන්නවා, රූපය කියන එකත් ඇති වෙන හැටි දන්නවා, රූපය කියන එක මේ මේ ප්‍රත්‍ය නිසා හටගෙන නැති වෙනවා කියන නුවණ එනවානම්, ඇහැ කියන එක සිහි කරනකොට, ඇහැ කියන ප්‍රත්‍ය ඇති වෙන හේතුව හටගන නිරුද්ධ වෙනවා කියලා දකිනවනම්, මෙන්න මෙපමණකිනුත් එයා ඇහැ කියන අන්තෙනුත් රූපය කියන අන්තෙනුත් මිදෙනවා.

අපි නිකමට කියමු. අද අපි හිතාගෙන ඉන්නෙ ඇහැ, කන, දිව, නාසය, ශරීරය ගන්න, අපි හිතාගෙන ඉන්නෙ ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින හතර ඉරියව්වක් පරිහරණය කරන ඇහැක් තියෙනවා කියලනේ. දැන් අපි මේ අන්තයෙන් මිදෙන්න ඕනෙ. ඇහැ කියන අන්තයෙන් අපි මිදෙන්න නම්, මිදුනොත් තමයි අපි මධ්‍යම ප්‍රතිපදාවෙ ඉන්නෙ. ඔන්න දැන් රූපය අපිට අහුවෙන්නෙ නැහැ. අපිට දැන් ඇහැ තියෙනවා කියලා කොයි මොහොතක හරි ඇහැ ගැන දැනුම එන මොහොතෙදි, ඒ ඇහැ ඇති වුණු සහ නැති වුණු හැටි බලන්න. ඇහැ ඇති වුණු සහ නැති වුණු හැටි කියන කොට, අපි කරන ලොකු වරද තමයි, ස්ථිරව තියෙන ඇහැක් සිහිකර ගන්නවා. කොයි වෙලාවක හෝ කොතනකදි හෝ තමන් තුළ ඇහැ හෝ ඇහැ යන ප්‍රඥප්තිය හෝ ඇහැ යන දැනුම හෝ ඇති වුනාද ඒ ඇහැ උපන්නා. හොඳට දකින්න. ඇහැ අන්තයක් වෙන්නෙ, අර වකුගඩුව හදවත කතාවෙන් මම පෙන්නුවා එදා, අපිට රූප පෙනෙන, යම් ඇහැක් තියෙනවනම්, දැනගත්තත් නැතත් එයාගෙ කෘත්‍ය ටික කරනවාමයි. අපි මේ ඇහේ අන්තය ගන්නෙ මනසින්. අර සැප වේදනාවෙ අන්තය ගන්නෙ අපි හිතෙන්. දුක් වේදනාවෙ අන්තය ගන්නෙ හිතෙන්. රූපය අන්තය ගන්නෙ හිතෙන්. නාමය අන්තය ගන්නෙ හිතෙන්. හිතෙන් කියලා කියන්නෙ, දෙවනුවයි. හොඳට මේ හැම එකකම මතක තියාගන්න.

රූපය මෙහෙම පෙනෙන කොට පෙනෙන රූපයට අනුව නැඹුරු වෙන එකයි රූපය අන්තය ගත්තා කියන්නෙ. ඒ පෙනුන රූපය ඇති වුනේ මෙහෙම නේද, කියලා හිතනවා නම් අපි රූපය අන්තය අනුව ගියෙ නැහැ. හිතට ධර්මාරම්මණ පහළ වෙනකොට ඒක නාමය අන්තෙ. ඒක ඇත්ත වුණොත් තමයි, හිතින් ඊට අනුව නැඹුරු වුනොත් තමයි, ඒකෙ අන්තෙ ගත්තෙ. ඒ සිද්ධිය ඇති වුනේ මෙහෙමයි නැති වෙන්නෙ මෙහෙමයි කියලා නුවණින් බලනවනම් අපි ඒ අන්තෙට ගියෙ නැහැ. එතකොට ඥාණ දර්ශණයක්. අර සැප වේදනාව දුක් වේදනාව කියපු විදියටම බලන්න.

ඒ වගේ, මෙතනදි ආධ්‍යාත්මික ආයතනවල අන්තෙ ගත්තා කියලා කියන්නෙ, අපි කියමු, කණ්නාඩියෙන් බැලුවහම රූපයක් පෙනෙනවා. දැන් ඒක දකින කොටම මේ මගේ ඇහැයි දකින්නෙ කියලා, නැත්නම් මේ ඇහැයි පෙනෙන්නෙ කියන අදහස අපිට

තියෙනවා කියන්නෙ, අපි අන්තෙ. හිතට සිහිවෙන කොටම මේ ඇහැ ගැනයි හිතුනෙ කියලා ඒක ඇත්ත කරගන්න කොටයි අපි අන්තෙ. නැත්නම් හිතට සිහි වෙනකොටම ඇහැ කියලා සිහිවෙන සිද්ධිය සිහිවෙනවනම්, මේ මනසක්, ධම්මාරම්මණක්, මනෝ විඤ්ඤාණයක් නිසා, ඇහැ ගැන අදහස ඇති වුනා නේද කියලා, ඇහැ කියන අන්තෙකට යන්නෙ නැහැ. ඇහැ කියන අදහස ඇති වුණු එකේ ඇති වීම නැති වීම බලනවා අපි. පත්තරේක කඩදාසියක තියෙනකොට ඒක දකිනකොටම මේ ඇහැනෙ කියන අදහසක් එක්කම ක්ෂණිකව, මේ අපේ ඇහැයි, ඇහැ ගැනයි මේ තියෙන්නෙ කියන අදහසට එනවා අපි.

මේ අන්ත ටික ගන්නෙ අපි හිතෙන්. හිතෙන් කියන්නෙ මේ ඔක්කොම මනසින් තමයි දෘෂ්ඨි වශයෙන් තමයි, මේ අන්ත වලට යන්නෙ අපි. එතකොට පත්තරේක තියෙන කොට, අපිට වෙනදා තියෙන ඇහැ, ඇහැ හැටියට දකින්නෙ නැතුව මෙතනද මේ වර්ණ සටහනක් නේද, කියලා දකින්න පුළුවන් නම්, කර්ණනාඩියක තියෙන කොට මේ වර්ණ සටහනක් නේද කියලා දකින්න පුළුවන් නම්, හිතෙන් සිහිකරන කොට මේ හිතට සිහි වුණු දෙයක් නේද කියලා බලනවනම්, අපිට ඇහැ කියලා අන්තයක් අහුවෙන්නෙ නැහැ. අපි හිතාගෙන ඉන්න ඇහෙන් අපි මිදෙනවා. එතකොට පවතින ඇහැක් තියෙනවනම්, ඒක ප්‍රත්‍යයෙන් හටගෙන නැති වෙනවා කියන තැනකට එයි, ඒකෙ අන්තෙ ගන්න විදියක් නැහැ. හැම වෙලාවෙම පුරාණ කර්මයෙන් හටගත්ත රූප පෙන්වන ලක්ෂණයෙන් යුක්ත ඇහැක් තියෙනවනම් ඒ ඇහැ අපි දන්නෙ නැහැ. අපි නොදන්නා තැනක ඉඳලා රූප පෙන්වන කෘත්‍යය වෙනවා. ඒ අන්තය හැම වෙලාවෙම ගන්නෙ, ඇහැ තියෙනවා කියන මේ දෘෂ්ඨිය හිතෙන් හදාගත්ත ඇහැක් එක්කයි අපි එතෙන්ට යන්නෙ. ඇහැ අනුව යන්නෙ නැත්තෙ, ඇහැ කියන අන්තයට ආධ්‍යාත්මික අන්තයට යන්නෙ හැම වෙලාවෙම අපේ හිතේ තියෙනවා, මේ ඇහැ, මේ කන, මේ නාසය, මෙන්න මෙහෙමයි දිව, මෙන්න මෙහෙමයි ශරීරය කියලා කොටස් ටිකක් අපේ හිතේ. ඔන්න ඔය ටික තමයි, හැම වෙලාවෙම මේ අන්ත ඇසුරු කරන ටික.

දැන් රූප, ශබ්ද, ගන්ධ, රස, ඒ කියන්නෙ අපේ හිතේ හැම හැඩයක් ගැනම රූප තියෙනවා. දැන් අපි නිකමට කියමු, ඔය පින්වතුන් රෝස මල් වලට කැමතියි කියනවා. ඔය කැමති රෝස මල, කොහේ තියෙන රෝස මලද කියන්නකො දැන්. රෝස මල් වලට කැමති වෙලා. මොන ෆාම් (Farm) එකේ තියෙන රෝස මල් වලටද කැමති? නැත්නම් ලංකාවෙ තියෙන රෝස මල්වලටද? අපි රෝස මල්වලට කැමතියි, කැමතියි කියනවා. අර ගොඩනැගිල්ලට නගින්න ඉනිමගක් හැදුවා, ගොඩනැගිල්ලෙ උස දන්නෙ නැතුව වගේ, ඔය පින්වතුන් රෝස මල් වලට කැමතියි, කැමතියි කියනවා. දැන් රූප තියෙනවා අපිට. නමුත් විමසලා බැලුවොත් අපි මනෝමයෙන් ජීවත් වෙන්නෙ, මේ ඔක්කොම අය. පින්වතුන්

කැමති නම් රෝස මල් වලට, ඒකයි ඔය දැන් රූප අන්තෙ ගන්න තියෙන ටික ඔය. ඔය ටිකේ තමයි හම්බ වෙනකොට ඔය තියෙන ටික තමයි රෝස මල කියලා දාන්නෙ අපි. දැන් රෝස මල් වලට කව්රු හරි කැමතියි කියනවා නම්, නැත්නම් මම හාවෙකුට කැමතියි, ගිරවෙකුට කැමතියි කියන කොට, ඔය ඉන්න හාවා, ඔය ඉන්න ගිරවා, ඔය කියන රෝස මල, කොතනද තියෙන්නෙ, කොහෙද ඉන්නෙ කියන්න. ඉන්න තැනකුත්, තියෙන තැනකුත් දන්නේ නැහැ, නමුත් එහෙම තියෙන රෝස මලට කැමතියි කියලා එකකුත් තියෙනවද? මොකක්ද ඒ කතාවෙ තේරුම එතකොට නේද? අපි රෝස මලකටත් කැමතියි, නමුත් ඒ මල තියෙන තැන දන්නෙත් නැහැ. අපි මුවෙකුට කැමතියි, ඉන්න තැන දන්නෙත් නැහැ. දැන්නම් සිහිකර ගනියි සමහරවිට, සත්තු වත්තක් වගේ. නමුත් ඒ සත්තු වත්තෙත් දැන් කොතැනද ඉන්නෙ ඒ සතා. හොඳට බලන්න මේ ලෝකයම ජීවත් වෙන්නෙ මනෝමයෙන් නෙවෙයිද කියලා.

ඔය වගේ හැම දෙයක්ම, ගස් කොළන් වලට කැමතියි කියයි, ගෙවල් දොරවල් වලට කැමතියි කියයි, යාන වාහන වලට කැමතියි කියයි, අන්තිමට සිහිකරලා බැලුවොත්, මේවා තියෙන තැනක් නැහැ. ඒ වගේ ඇහැ, කන, දිව, නාසය, ශරීරයත් එහෙමයි. මගේ ඇහැට මම කැමතියි කියයි. ඒක තියෙන තැනවත් දන්නෙ නැහැ. 'ඇහැ' එහෙම එකක් නැහැ දැන්. දැන් අපි හිතාගෙන ඉන්න රෝස මලට කැමතියි කිව්වානම්, එහෙම එකක් කොහෙවත් ඉපදිලාවත් නැහැ නෙ. තියෙනවද? නැහැ. ගියොත් හම්බ වෙනවා මිසක, අපි හිතාගෙන ඉන්න රෝස මලක් තියෙනවද කොහෙවත් දැන්? නැහැ. ඔයවගේ තමයි හැම දෙයක්ම. ඔය මනෝමයෙන් හිතාගෙන ඉන්නේ. එතකොට අන්තය කියන එක උපදින්නේ, ඒ ඒ මාධ්‍යයත් ඒ හිතේ තියෙන ගති ටිකත් එක්කයි.

තව පැත්තකින් කෙටියෙන් ගත්තොත් යම් දවසකදි, මේ ඇහැ පරිහරණය කරන කොට, පෙනෙනවා කියන සිද්ධිය ඇති වෙන හා නැති වෙන හැටි නුවණ එළඹ සිටින මට්ටමක් ආවොත්, ශබ්දයක් ඇහෙනවා කියන සිද්ධියට ඔය පින්වතුන්ගේ නුවණ යෙදිලා තිබුණොත් ජීවිතය වෙලා, හරියට මිරිඟුව දිහා බලන කොට ජලය වගේ පෙනුනට, ඒකෙ අපේ නුවණ යෙදිලා තියෙනවා පෙනෙනවා කියන දේ ඇති වුණු හැටි. අපි බලපු නිසාම මෙහෙම පෙනෙනවා කියන තැනකින් අපේ නුවණ යෙදිලා, ඒ නිසා විදර්ශනා කරන්න ඕනෙ නැහැ. ඒක අපේ ජීවිතය වෙලා.

ඔන්න ඔය මට්ටමට ඔය පින්වතුන් ආව දවසට, මේ ඇහෙන් රූප බලනවා කියන එක ජීවිතය වුණ දවසට විදර්ශනා කරන්න ඕනෙ නැහැ. එදාට ඔය පින්වතුන් මේ රූප අන්තයේ නැහැ. බාහිර අන්ත ටිකේ නැහැ. ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින හතර ඉරියව්වෙම ඔය පින්වතුන්ට ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන ටිකත් නැති

වුණොත් සිහි කරන්නවත් මේ මගේ ඇහැයි කියන ටිකත්, අන්න එදාට ඔය පින්වතුන් ආධ්‍යාත්මික ආයතනවල නැහැ. එදාට මධ්‍යම ප්‍රතිපදාවෙ දුක්ඛ නිරෝධයක, දුක් නැහැ. ආධ්‍යාත්මික ආයතන වලිනුත් මිදිලා. බාහිර ආයතන වලිනුත් මිදිලා. මිදුනා නම් මිදුනු දෙයින් දුක එන්න බැහැ. තියෙන දෙයිනුයි දුක එන්නෙ. එතකොට කොහොමවත් රූප වලට ඇස් වලට මේ එකකටවත් තණ්හාව තියන එක හිටින්නෙ නැහැ. ඔන්න ඔය වගේ තැනක ඉඳලා හිටියොත් තණ්හාව නැති වෙනවා එයාට මහා පුරුෂයා කියලා කියනවා. ඔය විදියට ඉඳලා ඉඳලා හුරු වුනහම ඒ හුරුවෙන් ජීවත් වෙන තැන තමයි රහතන් වහන්සේ කියලා කියන්නෙ. එතකොට මේ විදියට දකින්න ආධ්‍යාත්මික ආයතන ටිකයි බාහිර ආයතන ටිකයි.

සක්කාය එක අන්තයක් සක්කාය සමුදය දෙවෙනි අන්තයයි, සක්කාය නිරෝධය මැදයි

ඊට පස්සෙ **සක්කාය එක අන්තයක් සක්කාය සමුදය දෙවෙනි අන්තයයි, සක්කාය නිරෝධය මැදයි.** මෙතනදි සක්කාය කියන කොට දකින්න ඕනෙ පංච උපාදානස්කන්ධය. රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සංඥා උපාදානස්කන්ධය, සංඛාර උපාදානස්කන්ධය, විඥ්ඥාණ උපාදානස්කන්ධය. මේ ටිකට කියනවා සක්කාය කියලා. ඉස්සෙල්ලා අර ස්වාමීන් වහන්සේ තමන් ඉගෙන ගත්ත ආධ්‍යාත්මික බාහිර ආයතනයන් අරභයා අන්තයන්ට යන්නෙ නැතුව, මැද ඉඳලා තණ්හාව නැමැති සිබ්බනිය ඉක්මවලා, මහා පුරුෂයෙක් වෙන්න පුළුවන් කියලා ඒ පරියාය කිව්වහම, ඊලඟ ස්වාමීන් වහන්සේ මතක් කරනවා, සක්කාය කියන්නෙ එක් අන්තයක්, සක්කාය සමුදය දෙවෙනි අන්තයයි, සක්කාය නිරෝධය මැදයි.

මම සක්කායට කෙටි පරියායකින් වචනයක් කියන්නම්. සක්කායට තව නමක්, කාම භූමිය, රූප භූමිය, අරූප භූමිය කියන තුන් භූමිය. දැන් ඒකෙ ඉතුරු අය නැහැ. ඒ වචනෙ මම තනි වචනයෙන් කිව්වෙ. ඒකෙ කර්‍ම සිත්ය, විපාක සිත්ය, ක්‍රියා සිත්ය, මේ හොඳ ඒවය, නරක ඒවය, මොකුත් කතාවක් නැහැ. ලොකු, කුඩා, පණ්ඩිත, නුවණැති ඒ කතා මොකුත් නැහැ. කෙලින්ම කාමාවචර ඔක්කොම සක්කාය අනුව ගිය ධර්‍මයෝ. රූපාවචර, රූප භූමිය, රූප ධාතු ඔක්කොම සක්කාය අනුව ගිය ධර්‍මයෝ. අරූපාවචර, අරූප භූමිය, අරූප ධාතු, ඒ මොන වචනෙකින් කිව්වත් ඒ ඔක්කොම සක්කාය අනුව ගිය ධර්‍මයෝ. තව පැත්තකින් ගත්තහම ත්‍රයි භූමික ධර්‍මයෝ. තුන් භූමිය අනුව ගිය සියළු ධර්‍මයෝ. සියළු ස්කන්ධ, සියළු ධාතු, සියළු ආයතන, සියළු ඉන්ද්‍රිය, මේවා සක්කාය අනුව

ගිය ධර්‍මයෝ. සියළුම රූප, වේදනා, සංඥා, සංඛාර, විඥ්ඥාණ, ස්කන්ධ, ධාතු, ආයතන. මේ ඔක්කෝටම කියනවා තුන් භූමිය අනුව ගිය මේවා සක්කාය කියලා.

මේ සක්කායට තව නමක් තමයි දුක. දුක්ඛ සත්‍ය කියලා කියන්නෙ. පංච උපාදානස්කන්ධ දුක්ඛ. මේ තුන් භූමියේ කොතනක හිටියත් එක තැනක් හරි අල්ලගෙන හිටියත් අන්තයක්. සක්කාය අන්තයක්. ඊට පස්සෙ, සක්කාය සමුදය දෙවෙනි අන්තයයි. සක්කාය සමුදය කිව්වෙ තණ්හාව. සක්කාය හැදෙන, දුක හැදෙන, ලෝකය හැදෙන, අන්තයට කියනවා තණ්හාව. සක්කාය සමුදය දෙවෙනි අන්තයයි. එතකොට ඒකෙදි අපේ ජීවිතයෙන් අපි දැක්කොත්, අපිට රූපයක් පෙනෙනවා කියන තැනක නිකම්ම රූපයක් පෙනෙන්නෙ නැහැ. ඒ රූපය පෙනෙන්නෙ, ඒ අනුව ගිය ඒ අනුව වැයවුණු තව නාම ධර්‍ම තියනවා වේදනා, සංඥා, සංඛාර, විඥ්ඥාණ කියලා. මේ රූප, වේදනා, සංඥා, සංඛාර, විඥ්ඥාණ කියන ධර්‍මතා පහක්ම තියෙනවා එක අරමුණේ. පෙර පසු වෙලා එක එක හටගන්නෙ නැහැ. හටගන්න කොට ස්කන්ධ පංචකයම එකටයි තියෙන්නෙ, එකටයි නිරුද්ධ වෙන්නෙ, හටගන්න මොහොතෙදි.

එතකොට මේ අවස්ථාවේදි මේවා වෙන් වෙන් වෙන් කරලා වෙනම අවබෝධ කරගන්න පුළුවන් නුවණින්, දැනගන්න පුළුවන් නුවණින්, නුවණකට විතරයි ඉඩ තියෙන්නෙ. නුවණට අවකාශය අවශ්‍ය නැති නිසා. අවකාශය උදව්වෙන කිසිම දෙයකට මෙන්න මෙතන ඉඩක් නැහැ. ඒ කිව්වෙ වෙන් කරන්න බැහැ, මෙන්න මෙහෙමයි තියෙන්නෙ කියලා දක්වන්න බැහැ වෙන් කරලා. නුවණකට විතරයි තියෙන්නෙ. එතකොට කෙනෙකුට ඒ ඒ සිද්ධියෙන් මම මතක් කළේ. අපි රූපයේ අනිත්‍ය බැලුවට රූපයෙන් මිදෙන්න බැලුවට නාමධර්‍ම පෙනෙන්නෙ නැහැනේ, අපි ඒවයින් මිදෙන්න බැලුවෙ නැහැනේ කියන කතාවක් ඕනෙ නැහැ. මොකද එකට එක සිද්ධියක් වෙන්න, ඔවුනොවුන් උපකාර කරලා එක මොහොතෙ නම් තියෙන්නෙ, ඒ අරමුණේ රූපයේ අනිත්‍ය බැලුවත් එයා ඒ වෙලාවෙ තියෙන වේදනාවෙ, සංඥාවෙ, සංඛාරයේ, විඥ්ඥාණයේත් අනිත්‍ය බලලයි තියෙන්නෙ. එතකොට වේදනාවෙ අනිත්‍ය බැලුවොත් ඒ එක්ක තියෙන රූපෙත්, සංඥාවෙත්, සංඛාරයේත්, විඥ්ඥාණයේත් අනිත්‍ය බලලා තියෙන්නෙ. සංඥාවේ බැලුවොත් රූපයෙත්, වේදනාවෙත්, සංඛාරයෙත් විඥ්ඥාණයේත් අනිත්‍ය බලලා තියෙන්නෙ. සංඛාරයේ අනිත්‍ය බැලුවොත් රූපයෙත්, වේදනාවෙත්, සංඥාවෙත්, විඥ්ඥාණයේත් අනිත්‍ය බලලා තියෙන්නෙ. විඥ්ඥාණයේ අනිත්‍ය බැලුවොත් ඒ එක්ක තියෙන රූපයේත්, වේදනාවෙත්, සංඥාවෙත්, සංඛාරයේත් අනිත්‍ය බලලා තියෙන්නෙ.

ඒ නිසා සක්කාය කියන කොට හොඳට දකින්න, මේ පංච උපාදානස්කන්ධය කියන එක. එතකොට මේ පංච උපාදානස්කන්ධය ගත්තහම, අපිට යමක් පෙනෙනවා

කියන තැන එක එක්කෙනාගෙ කෘත්‍ය ටිකක් තියෙනවා. අපි කාඩ්බෝඩ් වලින් වෙනම අතක් කපනවා. වෙනම ඇඟක් කපනවා, වෙනම ඔලුවක් කපනවා, වෙනම කකුල් ටිකක් කපනවා. දැන් කාඩ් බෝඩ් කෑලි වෙන වෙනම ටිකක් කපලා ඔක්කොම එකට එකතු කරනවා. එකතු කෙරුවහම අපිට මිනිහෙක් පෙනෙයි. දැන් මනුස්සයෙක් පෙනෙන්න මෙයාගෙන් කෙරෙන්න ඕනෙ කෘත්‍ය ටික එයා කෙරුවා, අතේ කෑල්ලක් දාලා. ඔළුව කෑල්ල එයාගෙන් කෙරෙන්න ඕනෙ කෘත්‍ය ටික කරනවා. ඇඟ කෑල්ල එයාගෙන් කෙරෙන්න තියෙන කෘත්‍ය ටික කරනවා. ඔක්කෝගෙම තම තමන්ගෙ කොටස් ටික එකතු වුණාට පස්සේ එතන නිර්මාණය වෙනවා අපිට මොකක්ද, 'මනුස්සයෙක්'.

ඒ වගේ රූපයෙන් කෙරෙන්න ඕන ටික එයා කරලා. ඇහෙන් කෙරෙන්න ඕන ටික එයා කරලා. හිතෙන් කෙරෙන්න ඕන ටික එයා කළහම, වේදනා කියන චෛතසික ටිකෙන් ඒ ටික කළහම, සංඥා කියන චෛතසික ටිකෙන් එයා කළහම, චේතනා කියන චෛතසික ටිකෙන් එයා කළහම, අපිට මෙහෙම රූපයක් පෙනෙනවා. මේ කෑලි ටික වෙන් වෙන් වෙන් වෙන් කළොත් මේ සිද්ධිය හම්බ වෙන්නෙ නැහැ. එතකොට අපිට රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන මේ ස්කන්ධ පංචකයෙන් තමයි 'පෙනෙනවා' කියන සිද්ධිය තියෙන තැනක අපිට කියන්න වෙන්නෙ, පංච උපාදානස්කන්ධයක් කියලා. මේ ස්කන්ධ ටික ඇති වෙන සහ නැති වෙන හැටි බලලා තමයි පංච උපාදානස්කන්ධයේ ඇති වීම නැති වීම බලන්න වෙන්නෙ. එතකොට ඒකෙ ඇතුලෙ පහුරු ගාලා බලන්න හම්බ වෙන්නෙ නැහැ කවදාවත්. පංච උපාදානස්කන්ධයේ ඇති වීම සහ නැති වීම කියන කාරණා ටික අපිට බලන්න වෙනවා. මෙතනදි සක්කාය කියන කාරණාව ගැනයි මම විස්තර කළේ. සක්කාය කියන්නෙ පංච උපාදානස්කන්ධය.

කෙටියෙන් ගත්තහම, ඇහැට රූපයක් පෙනෙනවා කියන මට්ටම, ඇහැ පරිහරණය කරද්දි රූපය නොඉක්මවා පවතින රූපය පෙනෙන මට්ටම දකින්න සක්කාය. කනින් ශබ්දයක් අහන කොට ශබ්දය ඇහෙන අවස්ථාවේදි ශබ්දය අහන බව ශබ්දය නොඉක්මවා පවතින මනස දකින්න සක්කාය. දිවට දැනෙන කොට ඒ රසය හමුවෙන මට්ටම දකින්න සක්කාය. ඊට පස්සෙ ගන්ධය, කයට ගැටෙන දේ, සිතට සිතුවිලි සිහිවෙන මට්ටම දකින්න සක්කාය. පෙනෙන රූපය අරභයා කැමැත්ත අකමැත්ත අපිට ඇති වෙනවා නම් කෙළෙස් ටික, පෙනෙන දේ අරභයා ඇති වෙන කෙළෙස් ටික තමයි සක්කාය සමුදය. ඇහෙන ශබ්දය අරභයා ඇතිවෙන කෙළෙස් ටික තමයි සක්කාය සමුදය. ගන්ධය, රසය, ස්පර්ශය, අරභයා ඇති වෙන කෙළේසයක් තියෙනවනම්, තණ්හාවක් තියෙනවනම් මේකට කියනවා සක්කාය සමුදය කියලා.

ඊට පස්සෙ සක්කාය නිරෝධය මැදයි. සක්කාය නිරෝධය කියන කොට අපිට

අදහසක් ඇති වෙන්න පුළුවන්, රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ මේ කිසිම දෙයක් අහුවෙන්නෙ නැතුව, අහුවෙන්නෙ නැති විදියට, හිස් ස්වභාවයට හිත තියාගෙන ඉන්න පුළුවන් නම්, හිස් බව අරමුණු කරනවනම්, මෙන්න මෙතන තමයි සක්කාය නිරෝධය. සක්කාය නිරෝධයට හුරු කරනවා, ස්කන්ධ නැති තැන කියලා හිතෙන්න පුළුවන්. නමුත් ඔහොම අර්ථයකින් නෙවෙයි මම මේ කියන්නෙ. නමුත් එතනද සක්කාය. එහෙම හිස් බවක් තේරෙනවනම් මොකද සංඛතය කියලා කියන්නෙ, සංඛත ඔක්කොම ඇති දේ මතම විතරක් පදනම් වෙලා තියෙනවා නෙවෙයි. ඇති බවයි නැති බවයි දෙකම සංඛත. අපි හිතාගෙන ඉන්නෙ, තියෙන දේවල් තමා හේතුන්ගෙන් හටගත්ත දේවල් කියලා. නැති බවත් හේතූන්ගෙන් හට ගන්නවා. ඇති බවයි නැති බවයි දෙකම හේතූන්ගෙන් හටගන්න දේවල්. ඒ නිසා ඒ නැති බවද සංඛත වෙනවා.

ගහක් තියෙනවනම්, ගහ කපලා කොටලා විනාශ කරලා දැන් ගහ නැහැ කිව්වොත්, ගහේ නැති බව බැලුවොත් ඒ නැති බව සංඛතයි. ආයෙත් ගහ ඇති වුනහම අර නැති බව නැති වෙනවා. දැන් බඩගින්න කියන එක, බඩගින්න නැති බව සංඛත නිසයි, ඒ නැති බවේ ඇති වීම හේතු ප්‍රත්‍ය වෙලා තියෙන්නෙ. එතකොට බඩගින්න තියෙනවනම් කෑම කෑවොත් බඩගින්න නැති වෙනවා. දැන් බඩගිනි නැහැ. දැන් නැති වුනාට ඒ නැති වුණු එක ඇති වෙලා තියෙන්නෙ, කාපු නිසා. කෑවා කියන ආහාර ටික වැයවෙනවා කියන හේතුව වෙනස් වෙනකොට, නැති බව නැති වෙනවා. ආයෙත් බඩගිනි වෙනවා.

ඒ වගේ ඇති බව විතරක් නෙවෙයි නැති බවත් ඇති බවත් දෙකම සංඛතයි. එතකොට කිසිම දෙයක් නැහැ කියන තැනත් අපිට තියෙන්නෙ, සක්කාය. පංච උපාදානස්කන්ධය.

එතකොට සක්කාය නිරෝධය කියන එකෙන් මතක් කරන්නෙ මම, කිසිම දෙයක් නැති කම නෙවෙයි. මේ ආයතන ටික පරිහරණය කරද්දිම, පංච උපාදානස්කන්ධය නූපදින විදියට, පංච උපාදානස්කන්ධය නොහටගන්න විදියට, පංච උපාදානස්කන්ධය නිරුද්ධ වෙන විදියට, හිත තියන්න. ඒකටයි සක්කාය නිරෝධය කියලා කියන්නෙ. ඇහෙන් මෙහෙම බලනකොට වෙනදා රූපයක් නම් බැලුවෙ, දැන් රූපය කියන කොට රූපය අහුනොවෙන විදියට නුවණින් මේ දර්ශනය බලන්නෙ. ආධ්‍යාත්මික පැත්තට නැඹුරු වෙලා. එතන තියෙන හේතුටික නිසාම උපන්නා, ඒ හේතු ටික නැති වෙනකොට නැති වෙනවා කියලා බලන කොට, මෙහෙම බලන දර්ශනයට, බාහිර රූපයක් තියෙනවා කියන ලක්ෂණය මෙයාගෙන් නිරුද්ධ වෙලා. ඒ වගේ රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, අර මම කියන්නෙ එකම මිරිඟුවේ තිරිසන්ගත සතා වතුර තියෙනවා කියලා සැපදුක් විඳිද්දි, එයා දකින අරමුණම අපි ඇහෙන් බලපු නිසයි ජලය වගේ පෙනෙන්නෙ, පෙනෙන දේ

තියෙනවා නෙවෙයි කියලා අපි නුවණකින් බලන නිසා, අර සතාගේ මට්ටමේ රූපෙකුත් සතාගෙ මට්ටමේ දුකත් අපිට නිරුද්ධ වෙලානේ. තිරිසන්ගත සතාට බාහිර වතුරක් තියෙනවා කියන මට්ටමකුයි, ඒ මට්ටම ඇත්ත වෙලා ඒ මට්ටමට රැවටෙන ගතියක් රැවටිලා දුක එන ගතියක් තියෙනවනම් ඒ ටික අපිට නිරුද්ධයිනේ. ඒ වගේ මේ ලෝකය පෙනෙන කොට ලෝකයාට හම්බ වෙන මට්ටම නිරුද්ධ වෙන විදියට, අද අපිට හම්බ වෙන මට්ටම නිරුද්ධ වෙන විදියට හිත තියන එකටයි, දුක්ඛ නිරෝධය කියලා කියන්නෙ. සක්කාය නිරෝධය කියලා කියන්නෙ.

ඒකයි සක්කාය එක අන්තයක් කියලා කිව්වේ, මේ ලෝකය අපි වෙනදා දකින විදියට රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ මේවා පරිහරණය කරන එක, එක අන්තයක්. ඒක දුක්ඛ අන්තය, දුකේ ඉන්නෙ. ඒවා අරභයා තණ්හාව ඇති වෙන විදියට ඉන්නවා නම් මේ දෙවෙනි අන්තය, මේ සමුදය සත්‍යය. ඒ කියන්නෙ දුක්ඛ සත්‍යයයි සමුදය සත්‍යයයි කියන දෙකම අත හරින්න කියන එක තව පැත්තකින් කියන්නෙ. මේ දුක්ඛ සත්‍යය තුළ, නිරෝධ සත්‍යය, මාර්ග සත්‍යය නැහැ. සක්කාය කියන එක දුක්ඛ සත්‍යය නම් සක්කාය තුළ දුක්ඛ සත්‍යය තුළ මාර්ග සත්‍යය බලන්නනේ අපි මේ හදන්නේ දැන්. ඒකයි දැන් පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය බලනවා කියලා, අපිට ඕනෙ, දුක්ඛ සත්‍යය තුල මාර්ග සත්‍යයක් බලන්න වෙන්නෙ. නමුත් මෙතනදි කියන්නෙ නියම මාර්ග සත්‍යයේ ලක්ෂණය නම් දුක්ඛ සත්‍යය අන්තයක්, සමුදය සත්‍යය අන්තයක්, මේ අන්ත දෙක අහුවෙන්නෙ නැහැ. මාර්ග සත්‍යය කියන්නෙ මේ අන්ත දෙකම අහුනොවෙන විදියටයි හිත තබන්න ඕනෙ කියන එකක් තව පැත්තකින් කියන්නෙ. ***පංච උපාදානස්කන්ධ දුක්ඛා*** නේ, පංච උපාදානස්කන්ධය දුක්ඛ සත්‍යයට අයිතියි නේද? ඒක මාර්ග සත්‍යයද? එහෙනම් තණ්හාව කියන්නෙ සක්කාය සමුදය. ඒකත් දුක්ඛ සමුදය නෙවෙයිද? තණ්හාව කියන්නෙ, සමුදය සත්‍යය. මේ දුක්ඛ සත්‍යයයි සමුදය සත්‍යයයි දෙකටම තමයි, සක්කාය එක අන්තයක් සක්කාය සමුදය එක අන්තයක් කියලා කියන්නේ. මේ හැම අන්ත ටිකේම තියෙන්නෙ ඔය සත්‍ය දෙක. ස්පර්ශ අන්තය කියනකොට දුක්ඛ සත්‍යය. ස්පර්ශ සමුදය අන්තය කියන කොට සමුදය සත්‍යය. එතකොට අතීත අන්තය කියන කොට දුක්ඛ සත්‍යය, අනාගත අන්තය කියන කොට සමුදය සත්‍යය, ඔය විදියට තියෙන්නෙ මේ අන්ත දෙක.

අන්තිමට දුක්ඛ සත්‍යයයි සමුදය සත්‍යයයි කියන දෙකම ලෝකයේ. දුක්ඛ සත්‍යයට වැටුණොත් දුක් විඳිනවා, සමුදය සත්‍යයට වැටුණොත් නැවත දුක ඇති වෙන්න හේතුව හැදෙනවා. එතකොට දුක නිරුද්ධ කරන්න නම් මේ අන්ත දෙකට නොපැමිණ ඉන්න ඕනෙ, දුක නැති වෙන්න නම්. එහෙම ඉඳලා ඉඳලා ඉඳලා එහෙම ඉන්න පුරුදු ජීවිතය වුණාහම තමයි දුක්ඛ නිරෝධය සාක්ෂාත් කළා. දුක නැතුව ඉන්න ක්‍රමය පුරුදුවෙන එකට තමයි මාර්ගය කියන්නෙ, පුරුදුයි දැන් එයාට එහෙම ඉන්න පුළුවන් දැන්. දුක්

වෙන්නෙත් නැතුව දුක ඇති වෙන්න හේතු හදාගන්නෙත් නැතුව ඉන්න පුරුදුවෙන එකට තමයි මේ කියන්නෙ මැද කියලා. මධ්‍යම ප්‍රතිපදාව පුරුදුකරලා කරලා කරලා හැමදාම පුරුදු කරන්න ඕනෙ නැහැ. පුරුදු වුණ දවසක් තියෙයි. දැන් එයාට ජීවිතයේ ඉබේම පුරුදුයි එහෙම. නමුත් මොන විදියට තිබුණත් අපිට මේ කෙලෙස් වශයෙන් මේ අරමුණ එක්ක යන එක පුරුදු වෙලානේ තියෙන්නෙ දැන්. ඉබේම ඉන්නෙ එහෙමනෙ. ඒක අනිත් පැත්තට කරකවලා දැන් පුරුදුයි. එතකොට කියනවා දුක්ඛ නිරෝධය සාක්ෂාත් කළා. ඇයි දුක්ඛ නිරෝධය කියන්නෙ, දුකට වැටිලා දුක් විඳින්නෙත් නැහැ. දුක ඇති කරවන හේතුව නැති වෙලා ගින්දා මත්තෙ දුක් විඳින්නෙත් නැහැ කියන තැනකින්.

ඒ නිසා මේ දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාව, නිරෝධයත් මාර්ගයක් කියලා කියන්නෙ. එතකොට ඒ නිරෝධය දුක්ඛ සත්‍යය ඇතුලේ හෝ සමුදය සත්‍යය ඇතුළේ තිබුණොත් පුළුවන්ද මේ වැඩය කරන්න දුක්ඛ සත්‍යය තුළ ඉඳගෙන දුක නැති කරන්න පුරුදුවෙන්න පුළුවන්ද? මේක දුක්ඛ සත්‍යය, මේක සමුදය සත්‍යය, දැන් මේ කරන්නෙ දුක්ඛ සත්‍යය අහුවෙන්නත් දෙන්නෙ නැතුව, සමුදය සත්‍යයත් අහුවෙන්නත් දෙන්නෙ නැතුව, මනස පුරුදු කරන එක මේ දර්ශනයෙන් කරන්නෙ. එතකොට එහෙනම් මේ දර්ශනයට අහුවුණොත්, දුක්ඛ සත්‍යය කියන එක අන්තයක්, සමුදය සත්‍යය අන්තයක්. අන්තය කියන්නෙ ඒකෙ ඉන්න කෙනාට දුක් විඳින්න වෙනවා, දුක නිරුද්ධ වෙන්නෙ නැහැ. දුක නැති වෙන්නෙ නැහැ. මේ ආර්ය අෂ්ඨාංගික මාර්ගය නැත්නම් මේ මධ්‍යම ප්‍රතිපදාව තමයි දුක නැති වෙන්නෙ. මොකක්ද මේ දුක කියන අන්තෙට යන්නෙත් නැතුව දුක ඇති වෙන අන්තයේ ඉන්නෙත් නැත්නම් දුක කියන එක නිරුද්ධ වෙනවා, කියන කාරණාවක් තව පැත්තකින් කියන්නෙ.

එතකොට තව පැත්තකින් අපි ගත්තොත් හැම වෙලාවෙම, දැන් චිත්ත වීදි ගැන දන්නවා නම් සක්කාය කියන එක දකින්න චිත්ත විදියක චක්ඛු විඤ්ඤාණය වගේ මට්ටම. චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය, ඝාන විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය කියන මට්ටම. එතකොට සක්කාය සමුදය දකින්න ජවන් කියන මට්ටමට එනකොට. කෙනෙකුට සක්කාය නිරෝධය මැදයි කියන කොට චක්ඛු විඤ්ඤාණය උපදිනවා කියලා කියන්නෙ, නැත්නම් රූපයක් පෙනෙනවා කියන අවස්ථාව ඇති වුණේ මෙහෙමයි නේද නැති වෙන්නෙ මෙහෙමයි නේද කියලා බලන්න. එතකොට රූපය ගැන හිතනවා, කියනවා, කරනවා කියන එකක් නැහැ එයාට. දැන් අපිට රූපය පෙනෙනවා කියන සිද්ධිය ගැන නොදන්න කොට ඇත්ත, පේන දේට හොඳට හෝ නරකට හෝ අපි හිතනවා. කෙනෙකුට පුළුවන් නම් පෙනෙන දේට හිතන්නෙ නැතුව, පෙනෙන දේ ඇති වුණ සහ නැති වුණ හැටි බලන්න.

උදාහරණයක් හැටියට කිව්වොත් ඔන්න දැන් වතුරකින් නෙළුම් මලක් පිපිලා උඩට ඇවිත් තියෙනවා. මලේ අපිට පෙනෙන උඩට ඇවිල්ලා තියෙන කොටසකුයි යටට කොටසකුයි දෙකක් තියෙනවනේ. අපි හැම වෙලාවෙම කරන්නෙ, උඩට තියෙන කොටස තමයි ගන්නෙ. මේක නෙළුම් මලක් රෝස පාටයි හරිම සුවඳයි කියලා ඔය ටිකනේ හිතන්නෙ. මල තමයි අල්ලගෙන, එතකොට මල ගැන හොඳ හෝ නරක හෝ කියලා විස්තරයක් එන්නෙ. මල දකිනකොටම, මේ දිග බටයක් තියෙන නිසා ඒ බටෙත් කටු කටු කටු තියෙන්නෙ, මේ මුල නිසයි මේ මල හැදිලා තියෙන්නෙ, මේ මුල නැති වුණාහම මේ මල නැති වෙනවා නේද කියලා බැලුවොත්, මලට ඇලෙන්න කරන්න වෙලාවක් නැහැ මට. ඒ නෙළුම් මලට තියෙන හේතු ටිකටයි යන්නෙ මම. ඒ මලම උදව් කරගෙන මම යට පැත්තට යනවා, අනිත් කෙනා මේ පැත්තෙන් මලේ නැට්ට කැඩුවහම මල නැති වෙනවා කියන ඔය පැත්ත ගැන නුවණ නැහැ, මල දැක්කහම මල හොඳයි ලස්සනයි කියන තැන ඉන්න කොට එයා ඉන්නෙ මේ මලේ ඇලෙන්න ගැටෙන්න පුළුවන් මට්ටමක. මම මල හොඳ නරක වශයෙන් විනිශ්චය කරලා නැහැ. මල ඇති වෙන සහ නැති වෙන එකක්, මලේ අනිත්‍යතාවය තමයි මට පෙනෙන්නෙ දැන්.

ඒ වගේ විදර්ශනා ඥාණය කියන්නෙ මේ මලක් පිපුණා වගේ තමයි, මට මේ පෙනෙනවා කියන සිද්ධිය. ලෝකයා ඔක්කොම ඇහැට පෙනෙන දේ විතරක් විශ්වාස කරනවා, පෙනෙනවා, වතුරෙන් උඩ පෙනෙන මල විතරක් අල්ල ගන්නවා වගේ. පෙනෙන දේ ගැන තමයි හිතන්නෙ, කියන්නෙ, කරන්නෙ. දැන් විදර්ශනා ඥාණය කියන්නෙ, නෙළුම් මලේ වතුරෙන් උඩ තියෙන මල පෙනුනට ඒක ඇති වුණු නැට්ටයි ඒ ටිකයි නුවණින් තමයි බලන්න වෙන්නෙ, ඇහැට පෙනෙන්නෙ නැහැ. නේද? ඒ වගේ දැන් මේ පෙනෙනවා කියන එක ඇති වෙන්න තියෙන හේතු ටික මගෙ ඇහැට පෙනෙන්නෙ නැහැ. මල පෙනෙනවා වගේ තමයි දැන්. නුවණින් තමයි බලන්න වෙන්නෙ මේ රූපය කියන එක ඇති වෙන්නෙ මේ මේ හේතු ටික නිසා නේද? නැති වෙන්නෙ මෙහෙම නේද කියලා බලන කොට, මට දැන් මේ රූපයේ ඇලෙන්න ගැටෙන්න වෙලාවක් නැහැ. වෙලාවක් නැහැ කියන්නෙ. ඊට අනුව රූපය අනුව මගෙ මනස පිහිටලා නැහැ. පෙනෙන්නෙ රූපය ඇති වෙන සහ නැති වෙන හැටි.

මේ විදියට රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම කියන ටිකේ, ආයතන හය පරිහරණය කරන වෙලාවෙදි ඒ ඒ ආයතන ඇති වුණු සහ නැති වුණු හැටි බලනවා නම් මෙතෙන්ට කියනවා, සක්කාය නිරෝධයට බලනවා කියලා. මොකද සක්කාය කියන එකේ ප්‍රමාදීව වාසය කළොත් තමයි, සක්කාය සමුදය ඇති වෙන්නෙ. මල කියන එක හිතින් අල්ල ගත්තහම තමයි සක්කාය. එතකොට තමයි මල හොඳයිනේ හරි ෂෝක්නෙ කියලා දෙවනුවට කැමැත්තකට එන්නෙ. පළවෙනියෙන්ම මල හම්බවෙන කොට මේ මල

ඇති වෙලා තියෙන්නෙ මෙහෙමයි කියලා මම මේකෙ යටට ගියත්, මම මේක ඇති වෙන හා නැති වෙන හැටියෙන් ඉන්නෙ. දැන් තියෙන මලේ මේ හේතුව කැඩුණාහම, මේ නැට්ට නිසා මල හටගන්නවා, මේ නැට්ට නැති වෙන කොට මේක නැති වෙනවා නේද කියලා ඇත්තකුත් දකිනවා. නැවත මලක් හදා ගන්න තියෙන හේතුව හැදෙන්නෙත් නැහැ මට එතකොට, ෂා මල හොඳයිනේ මට තියෙනවනම් මේ වගේ එකක් කියලා තණ්හාව ඇති වෙන්නෙත් නැහැ. තණ්හාව ඇති නොවුණු නිසා වෙන මලක් ඇති වෙන්නෙත් නැහැ. මෙතනද මේ ආයුෂ තියෙන කොට තියෙන එකත් තිබිලා ඒක නැති වෙනකොට මේක නැති වෙනවා. එතකොට කියනවා මේ මල නැති වෙන විදියට එයා ඉන්නවා. මොකද තියෙන එකෙත් හේතු නිසා හටගෙන හේතු නැති වෙන කොට නැති වෙනවා කියලා නුවණින් හිටියා, එතකොට ඇත්ත බලන්න. මෙහෙම බලන්න ගිය නිසාම නැවත මලක් හැදෙන්න තියෙන හේතු ටික නැති වෙලා.

ඒ වගේ මේ රූප, ශබ්ද, ගන්ධ, රස වුණත් අපි ඒ අරමුණ නුවණින් සම්මර්ශණය කරන කොට වෙන්නෙ, නැවත රූප, ශබ්ද, ගන්ධ, රස නැත්නම් ලෝකය හැදෙන්න තියෙන හේතුව, තණ්හාව නැති වෙනවා. මේ හේතු නිසා හටගත්ත හේතු නැති වෙන කොට නැති වෙනවා කියලා බලපු ඇත්තම සාක්ෂාත් වෙනවා, අපි යනකොට. අනෙක් පැත්ත බලනකොට මේ ටික අත හැරෙනවා.

ඉතින් මෙතනදි ඒ ස්වාමීන් වහන්සේ මතක් කලේ ඔන්න ඔය වගේ දර්ශනයක් දැකපු නිසා සක්කාය එක් අන්තයක් සක්කාය සමුදය එක් අන්තයක් සක්කාය නිරෝධය මැදයි. සක්කාය නිරෝධය කියන කොට හැම වෙලාවෙම මම මතක් කළේ, ලෝකයේ රූප, ශබ්ද, ගන්ධ, රස ප්‍රත්‍යයෙන් හටගත්ත සක්කාය, ප්‍රත්‍ය නිරුද්ධ වෙනකොට නිරුද්ධ වෙනවා කියන එකත් තියෙනවා. ඒ සිද්ධියටම මතු හටගන්නා හේතුවත් නැති වෙලා. පවතින එකත් නැති වෙලා මතු නූපදින එකත් නැති වෙනවා කියන ධර්මතා දෙකම වුණාහම තමයි සක්කාය නිරෝධය කියන්නෙ. එහෙම නැතුව කිසිම අරමුණක් නැති හිස් බවක් අල්ලගන්න සිද්ධියකින් නෙවෙයි, තේරුනාද? ඊට පස්සෙ තියෙන එකත් නැති වෙලා මතු නූපදින එකත් කියන ලක්ෂණය ගිහිල්ලා ගිහිල්ලා මතු නූපදිනවා කියනකොට මරණින් පස්සෙ දකින්න එපා. මේ සක්කාය හමුනොවන විදියටම හිත තියන්න පුළුවන් මට්ටමම උපදිනවා මෙයා ගෙනිහිල්ලා අපිව. මේ ආයතන ටිකේදිම.

දැන් අපිට හිතෙන්නෙ මෙහෙම කරගෙන කරගෙන ගියාම මරණින් පස්සෙ කියලනේ, මරණින් පස්සෙ නෙවෙයි දැන්. රූපය හම්බ වෙනවා කියන මේ ලෝකයගෙ මට්ටමින් මිදිලා තමන් තුලම ලෝකය හටගෙන නිරුද්ධ වෙනවා කියන දර්ශනයක් උපදින තැනකටම ගෙනියනවා. රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම කියන මට්ටම අපි තුළ

නූපදින බවට සකස් කරනවා. 'ඛීනා ජාති' ජාතිය ක්ෂය විය. මේ පංච උපාදානස්කන්ධයාගේ ඉපදීමම නැති වෙන දවසක් එනවා.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★

ඉතින් බුදු දහම ටිකක් ගැඹුරුයි. එදා ඒ ස්වාමීන් වහන්සේ මෙන්න මේ අන්තයක් මතක් කළහම දැන් මේ ස්වාමීන් වහන්සේලා අතර ප්‍රශ්නයක් ඇති වුණා. දැන් කව්රු දේශනා කළ ක්‍රමයද හරි? මොන ක්‍රමයද හරි? ඊට පස්සෙ කතා කෙරුවා. දැන් එක එක්කෙනා තම තමන්ට පුළුවන් විදියට මධ්‍යම ප්‍රතිපදාව එක එක්කෙනා කිව්වා. අපි බුදුරජාණන් වහන්සේ ලඟට ගිහිල්ලා අහමු. බුදුරජාණන් වහන්සේ යම් විදියකට නම් දේශනා කරන්නෙ, ඒ විදියට අපි ඒක පිළිගනිමු කියලා බුදුරජාණන් වහන්සේ ලඟට ගිහිල්ලා කියනවා, අපි අතරෙ මෙහෙම කතා සල්ලාපයක් ඇති වෙලා එක එක ස්වාමීන් වහන්සේලා එක එක විදියට මතක් කළා. භාග්‍යවතුන් වහන්ස මෙතනදි කාගේ භාෂිතයද සුභාෂිත? කව්රු දේශනා කළ දේද හරි කියලා. ඊට පස්සෙ කියනවා මහණෙනි, ඔය හැමදෙනාම දේශනා කළ භාෂිතය, සුභාෂිතයක් හැම දෙනාගෙම වචනෙ හරි. එතකුදු වුවත් මම **ස්පර්ශය එක් අන්තයක් ස්පර්ශ සමුදය එක් අන්තයක් ස්පර්ශ නිරෝධය මැදයි** කියපු තැන අවධාරණය කරනවා කියලා. එදා දේශනා කළ ගාථාවේදි මම කිව්වෙ මේ ටික මුල් කරගෙනයි, හිතේ තියාගෙනයි කියලා බුදුරජාණන් වහන්සේ මතක් කරනවා. එතනදි බුදුරජාණන් වහන්සේගේ වචනය හැමෝම සතුටින් අනුමෝදන් වෙනවා.

මෙතනදි මම මතක් කළේ, මේ මධ්‍යම ප්‍රතිපදාව කියන කොට එක තැනකින් අපි අන්ත අත හැරලා මධ්‍යම ප්‍රතිපදාවට ඇවිල්ලා හිටියොත්, අනික් කිසිදු අන්තයකටත් හිතින් ගලපනකොට අහුනොවී තියෙන්න ඕනෙ. ඒ හැම සිද්ධියකින්ම අන්තිමට එක දෙයයි කියන්නෙ, **කණ්නාඩියට එබෙන කොට පීවත් වෙන විදියට පීවත් වෙන්න කියන එකයි කියන්නෙ.** බාහිර ඡායාව දිහා බලලා ඒකෙන් වැඩක් නොගන්නවත් නෙවෙයි, වැඩක් ගන්නවා, වැඩක් ගත්ත ඒකෙ ඇලිලා ගැටිලා නැහැ. ඒක ඇත්ත වෙලා නැහැ. ජීවත් වෙන්න උපකාරීව විතරයි. එහෙ බලන්නෙ මෙහෙ බලාගන්න උවමනාවෙන් ඒ වගේ ලෝකයේ මෙහෙ කටයුතු කරන්නෙ මෙහෙ පැවැත්මට හිත තියාගෙන කියන එකක් බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නෙ අන්තිමට.

අපි අද ඉන්නෙ පලගැටියො වගේ, රූපෙට පැනපු ගමන්, ශබ්දෙට පැනපු ගමන්, ගන්ධයට පැනපු ගමන්, කෙළින්ම විඤ්ඤාණය පිහිටන විදියට. මේ හැම කාරණාවකින්ම කියන්නෙ සීලයක පිහිටන්න කියලා කියන්නෙ. චිත්ත සමථයක් වඩාගන්න

කියලා කියන්නෙ. මෙහෙට පනින වේගය අඩු කරගන්න මේ හැම දෙයක්ම කරන්නෙ. අපි හුරුවෙලා තියෙන්නෙ, ඕඝය කියලා කියන්නෙ. ඕඝය කියන්නෙ බාහිරයටම ගහගෙන යන ගතිය. යෝග කියන්නෙ බාහිරයෙ තියෙනවා කියන යොදවන ගතිය. ග්‍රන්ථ කියලා කියන්නෙ බාහිර තියෙනවමයි කියලා යෙදෙනවා. කාම ඕඝ, කාම යෝග, කාම ග්‍රන්ථ, කාම ආස්‍රව කියලා කියන්නෙ, මෙහෙ තියෙනවා, තියෙනවා, තියෙනවා කියන හුරුවමයි තියෙන්නෙ.

මේ කෙළෙස් කියන්නෙ වෙන මොකුත් නෙවෙයි, මේ ගති, ගති ටික. යෙදෙනවා, ගෙතෙනවා, හුරුව කියන ඔය ගති ටිකට තමයි කාම ඕඝ, කාම යෝග, කාම ග්‍රන්ථ කිය කියා නැවත නැවත, නැවත නැවත අපි මේ කියන කාරණා ටික තියෙන්නේ ඕවයේ. එතකොට ඒ නිසා හැම කෙනෙක්ම අපි අනෙක් පැත්තට බලනවා කියන කොට මෙයාට කාම ඕඝය නැහැ, කාම යෝගය නැහැ, කාම ග්‍රන්ථය නැහැ, මේ හුරුවට නිරුද්ධව ඉන්නෙ. ඔක්කොම කෙළෙස් ටික කැපෙනවා. ඒකයි දැන් කෙළෙස් ටික එක එක නැති කරන්න ඕනෙ නැහැ, ආර්ය අෂ්ඨාංගික මාර්ගය වඩන කොට ඔක්කොම ටික අත හැරෙනවනේ නේද?

ඉතින් මේ මජ්ඣෙ සූත්‍රය කියන ටික අපි තේරුම් කර ගත්තහම මේකෙ තව ගොඩාක් සියුම් තැන් තියෙනවා, ගොඩාක් සූක්ෂම තැන් තියෙනවා. අපිට නිවන් මග තියෙනවද නැද්ද, නිවන් මග අපි වඩනවද නැද්ද, ටික ටික හරි හුරුකරනවද නැද්ද, කියන එක තේරුම් කර ගන්න පුළුවන්. මේ හැමෝම අනිවාර්යයෙන්ම මේ අන්ත ටික ඔක්කොම දැන ගන්න ඕනෙ, අන්ත ටික ඔක්කොම අත හරින්න ඕනෙ කියන එකක් නැහැ. මේ පරියායෙන් තියෙන්නෙ ඒ නිසයි. තම තමන්ට පහසු විදියකට කුමන හෝ පහසු විදියකට අපි කියමුකෝ, තව පැත්තකින් ගත්තහම, සක්කාය එක අන්තයක් සක්කාය සමුදය එක අන්තයක්. නැත්නම් කුමන හෝ අන්තයක්, අතීත අන්තයටත් නැතුව අනාගත අන්තයටත් නැතුව වර්තමානය මැදයි, කියන කුමන හෝ න්‍යායක් තෝරාගෙන මේ විදියට ඉන්නවා කියන තැනකින් තමන් දහම තෝරා ගන්නවා. ඊට පස්සෙ එතන මනස තියෙන විදියට ටික ටික ධර්ම සම්මර්ශණය කරනවා. ආපහු සමථ කමටහනකින් ටික ටික හිත වඩනවා. ඒ දෙකට උපකාර පිණිස සීලයක පිහිටලා තියෙනවා. කාලයක් යනකොට සීලයක පිහිටලා හිත වඩ වඩ මේ විදියට නුවණින් බලනකොට තව තවත් හිත වැඩෙනවා.

සතර මහාධාතුවෙහි සැරිසරන 'භූත'

කථං පන භික්ඛවෙ ජානතො කතං පස්සතො ඉමස්මිං සවිඤ්ඤාණකේ කායේ බහිද්ධා ච සබ්බ නිමිත්තේසු අහංකාර මමිංකාර මානානුසයො නහොති

ධර්මශ්‍රවනාභිලාශී ශ්‍රද්ධා බුද්ධි සම්පන්න කාරුණික පින්වතුනි,

අද දවසෙදි අපි උත්සාහවත් වෙන්නට ඕනෙ මේ සද්ධර්මය අවබෝධ කරගන්නට. මෙතැනදි නැවත ටිකක් මතක් කරනවා, අද අපිට අපේ අම්මා, තාත්තා, දුවා, පුතා, ගෙවල් දොරවල්, යාන, වාහන මේවා අත හැරගන්නවා කියන එක අපහසුයි. අපි හිතන්නේ මේවා තියෙන නිසා අපේ හිත් බැඳිලා තියෙනවා කියලා. පින්වතුනි, මේ හිතේ හැටි. මේ අම්මා, අප්පච්චි, දුවා, පුතා හින්දම අපිට මේ අය ගැන මෙච්චර ආදරේ හිතිලා නෙවෙයි, මේ හිතේ ගතිය. පෙර ජීවිතයේ අම්මා කෙනෙක්, තාත්තා කෙනෙක්, දුවෙක්, පුතෙක් හිටියා නම් මේ මිම්මටමයි එතනත් බැඳිලා හිටියේ.

මෙතැන අතහැරලා (කැමති වුණත් නැති වුණත් අත හැරෙනවා) යම් තැනකදි ආයෙත් ආත්ම භාවයක් ලැබුවොත්, එතැනත් ඒ අම්මටත් තාත්තටත් දුවා පුතාටත් හිත බැඳෙන්නේ මේ විදියටමයි.

තත්‍ර තත්‍රාභි නන්දනී ඒ ඒ තැන ඇලෙන ගතියයි මේ සිතේ ලක්ෂණය. ඉතින් මෙන්න මේ බව තේරුම් අරගෙන, ලෝකයේ මේ දුවන්නන් වාලේ දුවන සමාජ රටාවට එකතු වෙලා දුවන්නේ නැතුව, මේ මනුස්ස ජීවිතයෙන් බුද්ධෝත්පාද කාලයෙන් ප්‍රයෝජනයක් ගන්න හැම දෙනාම උත්සාහවත් වෙන්න කියන එකත් මතක් කරනවා. මේ මාරයාගේ ඡායාව, රාක්ෂයාගෙ සෙවනැල්ල වැටිලා තියෙන වෙලාවක්. අවිද්‍යාව නැමැති ධර්මතාවන්ගේ ඇස් අන්ධ වෙලා තියෙන වෙලාවක්. ඉතින් මෙතැනදි අපිට පෙනෙන්නේ,

අපිට පෙන්නන්නේ සසර දික් කරන පැත්තෙ යහපත් කමමයි. එබඳුවූ වටපිටාවක, අපි දක්ෂ වුණොත් විතරමමයි, ඒකට හරහට හිතලා අනෙක් පැත්තට එන්න පුළුවන්.

බුදුරජාණන් වහන්සේ පෙන්වන්නේ මේ සසරින් එතෙර වෙන්න කටයුතු කරන්නෙක් හරියට, මහ විශාල ඕඝයකට, සැඩ පහරකට වැටුණු කෙනෙක්, ප්‍රති විරුද්ධ වතුරෙ උඩ අතට පිහිනන්නා වගේ වැඩක් කියලා. ලෝකයාගෙ හිත් සම්පූර්ණ සතුටු කරලා, ලෝකයාගේ අනුමැතිය අරගෙන, ආදරෙන් කව්රුවත් කවදාවත් සසරින් එතෙර වුණේ නැහැ. බෝසතානන් වහන්සේටත්, සුද්ධෝදන රජතුමාත් අනෙක් හැම දෙනාමත් යන්න එපා, යන්න එපා කියද්දි ගියා මිසක, 'අනේ එහෙනම් ගිහිල්ලා බුද්ධත්වයට පත්වෙලා අපිවත් ගොඩගන්නකෝ' කියලා කව්රුවත් කිව්වේ නැහැ. ඒක තමයි මේ ලෝකයේ හැටි.

ඒ නිසා මම මේ ටික මතක් කළේ, නුවණක් තියෙන ඔය පින්වතුන්ගෙ යුතුකමක්, අපිත් බේරිලා, මෙබඳුම ගැටයකට අනිත් අයත් හසුවෙලා ඉන්නෙ කියන එක තේරුම් අරගෙන, ඒ අයවත් බේරගන්න කටයුතු කරන්න ඕනේ කියන අදහස ඇති කරගන්න. එහෙම ඇති කරගත්තොත්. අපිට මේ ජීවිතයෙන්, සසරින් එතෙර වෙන්න පුළුවන්. ඊට අවශ්‍ය **මූලික වටපිටාව හැමදෙයක්ම ලැබිලා තියෙනවා. ඒ නිසා 'අප්‍රමාදීව කටයුතු කරන්න'** කියන ටික මතක් කරලා, මම මාතෘකා කළ ධර්මීය පොඩ්ඩක් විස්තර කරන්නම්.

පින්වතුනි, එක්තරා අවස්ථාවකදි ස්වාමීන් වහන්සේ නමක් ඇවිල්ලා භාග්‍යවතුන් වහන්සේගෙන් අහනවා,

කතං පන භන්තේ ජානතෝ කතං පස්සතෝ - ඉමස්මිං සවිඤ්ඤාණකේ කායේ බහිද්ධා ච සබ්බ නිමිත්තේසු අහංකාර මමිංකාර මානානුසයො නහොති - ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, දන්නා වූ, කෙසේ දක්නා වූ කෙනාටද ***ඉමස්මිං සවිඤ්ඤාණකේ කායේ*** මේ මම කියලා, අපි කෙනා කෙනා මම කියලා කියන, මේ සවිඤ්ඤාණක කයේ ***බහිද්ධා ච සබ්බ නිමිත්තේසු*** බාහිර සියළු නිමිති වලත් ***අහංකාර*** කියලා කියන්නේ, 'මම' කියලා කියන ***මමංකාර*** කියලා කියන්නේ 'මගෙ' කියලා කියන එක. මම කියලා කියන, මගෙ කියලා කියන, මාන අනුසය නැති වෙන්නෙ, ස්වාමීනී කොහොම දන්න, කොහොම දකින කෙනාටද මම, මගෙ කියලා දකින මේ මානය නැති කරන්න පුළුවන් වෙන්නේ? කොහොම දැනගත්තොත්, කොහොම දැක්කොත්ද? කියලා ප්‍රශ්නයක් අහනවා.

ඒ වෙලාවෙදි භාග්‍යවතුන් වහන්සේ ඒ ස්වාමීන් වහන්සේට දේශනා කරනවා. ***යං කිඤ්චි භික්ඛු රූපං අතීත අනාගත පච්චුප්පන්නං වා, අජ්ඣත්තං වා, බහිද්ධා වා, ඕළාරිකං වා. සුඛුමං වා, හීනං වා ප්‍රනීතං වා, යං දූරේ සන්තිකේ වා සබ්බං රූපං නේතං මම, නේසො හමස්මි, නමේසෝ අත්තාති, ඒව මේවං යථාභූතං සම්මපඤ්ඤාය දිට්ඨබ්බං***

මහණ, අතීතය අනුව ගියාවූද, අනාගතයේ පහළ වන්නාවූද, වර්තමානයේ ඇසුරු කරන්නාවූද, තමා යැයි කියලා කියන මේ ජීවිතය වේවා, බාහිර වේවා, ඒවගේම ඕදාරික - රළු මට්ටමේ වේවා, ඉතා සියුම් මට්ටමේ වේවා, එහෙම නම් ලෝකයා හීන යයි සම්මත වේවා ලෝකයා ප්‍රනීත යයි සම්මත වේවා, තමා ළඟ තියෙන වේවා, දුර තියෙන වේවා, යම්තාක් රූප තියෙයි නම් **ඔය වගේ එකළොස් පොළක් පෙන්නුවා, ඔය ඔක්කොම, අපිට රූප කියලා යමක් හම්බ වෙනවා නම් අපේ ජීවිතයකට ඔය එකළොස්පොළ හරහායි හම්බ වෙලා තියෙන්නේ, වෙන තැනක් නැහැ.** අපිට යම්තාක් රූප හම්බවුණා නම්, යම්තාක් රූප ඇසුරු කළානම් ඔය කියපු එකළොස් ආකාර ස්ථාන එකළොහක් මිසක, වෙන තැනක් නැහැ. ඔය එකළොස් පොළේ, එකළොස් ස්ථානයන්ගේම අපි ඇසුරු කළ, අපිට හම්බ වුනා යයි කියන්න පුළුවන් යම්තාක් රූප තියෙයි නම්, ඒ රූප වල එකක්වත් මම හෝ මගෙ හෝ මගෙ ආත්මය නෙවෙයි' කියලා - ***යථා භූතං සම්මපඤ්ඤාය දට්ඨබ්බං*** ඇත්ත ඇතිහැටියේ නුවණින් දැකිය යුතුයි. ***නේතං මම*** කියලා කියන්නෙ මගෙ නෙවෙයි කියන එක. ***නේසෝ හමස්මිං*** කියලා මම නෙවෙයි කියන එක. ***නෙමේසෝ අත්තානි*** කියලා කියන්නේ මගේ ආත්මය නෙවෙයි කියන එක. මම නෙවෙයි, මගෙ නෙවෙයි, මගෙ ආත්මය නෙවෙයි, හැම රූපයක්ම මම කියලා ගන්න පුළුවන් ඒවත් නෙවෙයි, මගෙ කියලා ගන්න පුළුවන් ඒවත් නෙවෙයි, මගෙ ආත්මය කියලා ගන්න පුළුවන් ඒවත් නෙවෙයි කියලා, හොඳට ඇත්ත ඇති හැටියේ ඒ රූපයන්ගේ දකින්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

මෙන්න මෙහෙම දකින කෙනාට, **මේ එකළොස් පොල් හැම රූපයක්ම මම හෝ මගෙ හෝ මගෙ ආත්මය හෝ කියලා ගන්න බැරිනම්, දකින්න බැරි නම්, පෙනෙන්නේ නැත්නම්, අන්න ඒ මට්ටමට මනස ගත්ත කෙනාට, කෙනාගෙ, මම සහ මගෙ කියන මාන අනුසය දුරුවෙනවා කියලා පෙන්නුවා.**

එතකොට ඔය විදියටම වේදනාව ගැන, සංඥාව ගැන. සංඛාරය ගැන, විඤ්ඤාණය ගැනත් තියෙයි.

කාම භූමිය අනුව ගිය සත්වයන්ට බෙහෙවින් ඇසුරු වන 'රූපස්කන්ධය'

දැනට මම රූපය ගැන ටිකක් පෙන්වන්නම්

මෙතැනදි මේ එකළොස් ආකාරයකට ප්‍රභේද කරලා, එක් රූපයක් තථාගතයන් වහන්සේ පෙන්නුවා. එකළොස් තැනක තියෙන රූපය කෙටි කරලා, කැටි කරලා තමයි, **'රූපස්කන්ධය'.** කියලා පෙන්නුවේ. එතකොට මෙතැනදි අපි පදගතාර්ථයත් දැන ගන්නටත් ඕනෙ, ඒ අර්ථ පදයන්ගෙන් පෙන්වන සූත්‍ර අර්ථය දැන ගන්නටත් ඕනෙ. එතකොට තමයි අපිට හරියටම මේ හැම රූපෙකින්ම මෙන්න මේ කාරණාවයි අන්තිමට පෙන්නුවේ කියන අර්ථය උපදින්නේ. ඒ අර්ථය බලාගෙනයි අපේ ප්‍රතිපදාව ගොඩනැගෙන්නේ.

පදගත අර්ථයන් කියලා කිව්වේ. දැන් මේ රූපය පෙන්නපු එකොළොස් පොළක් තිබුණානේ. අතීත රූප, අනාගත රූප, වර්තමාන රූප, ආධ්‍යාත්මික රූප, බාහිර රූප කියලා එකළොස් පොළක් තිබුණානේ,

ඒ ඒ වචනයට අනුවත් අර්ථයක් තියෙනවා. හැබැයි ඒක මේ මූලික අර්ථය නෙවෙයි, සූත්‍ර අර්ථය නෙවෙයි.

ඒ කියන්නේ අතීත රූප කියන්නෙ මොනවද කියලා පද ව්‍යංජනයක් තියෙයි නම්, ඒ පදව්‍යංජනයන්ට අර්ථයක් තියෙනවා 'මෙන්න මේකටයි, මෙන්න මෙහෙම රූප වලටයි, අතීත රූප කියන්නේ' කියලා පෙන්නන්න. ඕකට කියනවා ඒ 'පදයට අර්ථය' මේ පද එකොළහින්ම අර්ථයක් දැන ගන්න ඕනෙ.

රූපස්කන්ධය

1. අතීත
2. අනාගත
3. වර්තමාන
4. ආධ්‍යාත්මික
5. බාහිර
6. ඕදාරික (රළු)
7. සුඛුම (සියුම්)
8. හීන
9. ප්‍රනීත
10. දුර
11. ළඟ

සටහන 2

ඊට පස්සෙ ඔය දෙකම එකට එකතු කරලා කියනවා 'අර්ථ පද' කියලා.

මේ ඔක්කෝගෙන්ම එකට එකතු කරලා කැටි කරලා පෙන්වන්න හදන, ඉගෙන ගන්න හදන එක කාරණාවක් උපදිනවා. ඒ මොකක්ද මේ හැම රූපයක්ම 'මම නෙවෙයි, මගෙ නෙවෙයි, මගෙ ආත්මය නෙවෙයි කියන්නෙ ඇයි මොකක්ද? කියලා ප්‍රශ්නයක් එනවා ඒකට උත්තරයක් හම්බ වුනහම ඒක තමයි මේකෙ සූත්‍ර අර්ථය. එතැන බලාගෙනයි ප්‍රතිපදාව තියෙන්නේ.

ඒ නිසා මම ඉස්සෙල්ලා කෙටියෙන් පදගත අර්ථයන් ටික පෙන්වන්නම්.

'අතීත රූප' කියලා කියන්නේ, ඉපිද නිරුද්ධ වුණු, හටගෙන නැති වුණු, ක්‍ෂය වුණු, වැය වුණු, අතීතය අනුව ගිය මේ මොහොතට ටිකකට ඉස්සෙල්ලා ඉඳලා අපිට, යම්කිසි ඇහෙන් හෝ කනින් හෝ දිවෙන් හෝ නාසයෙන් හෝ සිතින් හෝ යම් කිසි රූප ඇසුරු කළා නම්, ඒවා නැවත හිතින් හිතන්න පුළුවන් නම්, හිතලා වර්තමානයේ සැපදුක් විඳින මට්ටමකට රූප සිහි කරන්න පුළුවන් නම් නිරුද්ධ වුණු, ඒ හැම රූපවලටම කියනවා, අතීත රූප කියලා.

හොඳට මතක තබාගන්න මේ අතීත රූප අපිට ඇසුරු වෙන්නේ මනෝ විඤ්ඤාණ මට්ටමෙන් විතරමමයි. වෙන කිසිම තැනකින් අතීත රූප ඇසුරු වෙන්නේ නැහැ.

'අනාගත රූප' කියලා කියන්නේ, තව ටිකකින් හෝ හෙට හෝ කවදාහරි දවසක රූපයක් බලන්න හෝ ශබ්දයක් අහන්න හෝ ගඳ සුවඳක් ලබන්න හෝ ස්පර්ශයක් ලබන්න හෝ කුමන ආකාරයකට හෝ රූපයක් ගැන රූපයක් උපදවන්න, රූපයක් ලබාගන්න, රූපයක් හටගන්වන්න, කල්පනා කර කර ඉන්නවා නම් හිතනවා නම්, ඒකට කියනවා, අනාගත රූප කියලා. 'න-ආගත' ආවේ නැහැ තවම, නොපැමිණි, රූප වලට කියනවා අනාගත රූප කියලා. එතකොට තවම හට නොගත්ත රූප තියෙනවා නම් ඒවා තමයි, අනාගත රූප. හෙට අපි චිත්‍රපටියක් බලන්න යනවා. කෙනෙක් බලන්න යනවා කියලා කියන කොට අපි අරමුණු වෙන රූප තියෙනවා නම් ඒවා අනාගත රූප. එතකොට හෙට අපි සංගීත සංදර්ශනයක් බලන්න යනවා කියලා හිත හිතා ඉන්නවානම් ඒ අනාගත රූප.

එතකොට මේ අනාගත රූපත් ඔක්කෝම අපිට ඇසුරු වෙන්නේ මනෝ විඤ්ඤාණ මට්ටමෙන් විතරයි. මේ දෙකම බොරු (අතීත, අනාගත) එකක් මැරිලා, එකක් ඉපදිලා නැහැ. හැබැයි අපි වැඩිමනක්ම ඉන්නේ ඔය දෙකේ.

ප්‍රකෘතියේ වර්තමානයේ 'සැබවින්ම තියෙන හිතේ' අපේ මනස නැහැ. එතකොට අපේ මුළු ජීවිතයම, මුළු ආත්ම භාවයම, මේ ආදරය, බැඳීම, වටිනාකම් ටික ඔක්කොම තියෙන්නේ ඔය දෙපැත්තේ. එතකොට **අපේ මුළු ජීවිතයම තියෙන්නේ, අපේ මුළු ලෝකයම තියෙන්නේ, අපේ මුළු පැවැත්මම තියෙන්නේ 'බොරුවක්' මතයි කියලා තේරුම් කරගන්න. සංකල්පයක් මතයි කියලා තේරුම් කරගන්න. මොකද? මැරුණු සහ නූපන්න කියන ධර්මතාවයක් තුළනෙ අපි ජීවත් වෙන්නේ.**

එතකොට **'පච්චුප්පන්න රූප'** කියලා කියන්නේ, වර්තමාන, මේ දැන් අපිට හම්බවෙන රූප. විශේෂයෙන්, ඇහෙන් රූප දකිනවා, කනෙන් ශබ්ද අහනවා, නාසයෙන් ගඳ සුවඳ, දිවෙන් රස, කයෙන් ස්පර්ශය ලබනවා කියන ටික පිරිසිදුම වර්තමානය. ඊට අනුව, සමගාමීව උපදින මනෝ විඤ්ඤාණයක් තියෙයි නම් ඒකත් වර්තමානය. මේවා පච්චුප්පන්න රූප.

'ආධ්‍යාත්මික රූප' කියලා කියනවා ඇහැ, කන, දිව, නාසය, ශරීරය. මෙන්න මේ වගේ දේවල් වලට කියනවා ආධ්‍යාත්මික රූප කියලා.

'බාහිර රූප' කියලා කියනවා, ***පරසන්තානං වා පර පුග්ගලානං*** වා කියන තැනක ඉඳලා, තව රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධම්ම කියලා කියන ඒවා මේවා ඔක්කොම බාහිර රූප.

ඊට පස්සේ **'ඕදාරික රූප'** කියලා කියන්නේ රළු, හසුවෙන, ගැටෙන - ගැටීම් කෘත්‍යක් කෙරෙන රූප වලට කියනවා ඕදාරික රූප, රළු රූප කියලා. ඇහැ - රූප, කන - ශබ්ද, නාසය - ගන්ධය, දිව - රස, කය - පොට්ඨබ්බය කියන මේ දහය ගන්න මේවා රළු රූප.

ඊට පස්සෙ තව තියෙනවා **'සුඛුම රූප'.** සුඛුම රූප කියලා කියන්නේ ගැටීමක් සිද්ධ වෙන්නෙ නැති දකින්නත් බැරි, අනිදස්සන - අප්පටිඝ, දකින්නෙත් නැහැ. ගැටෙන්නෙත් නැහැ. දකින්නත් බැරි, ගැටෙන්නෙත් නැති රූප තියෙනවා, ඒවට කියනවා සුඛුම රූප කියලා. ඒවා ධම්මායතනය පරියාපන්නයි. අපි ඉත්ථි ඉන්ද්‍රිය, පුරුෂ ඉන්ද්‍රිය, ජීවිත ඉන්ද්‍රිය ආකාශ රූප, ලහුතා රූප, මුදිතා රූප, කම්මඤ්ඤතා රූප කියලා කතා කරන රූප තියෙන්නෙ, මෙන්න මේවා ඉතාමත් සුඛුම රූප. සියුම් රූප සූක්ෂම රූප.

මෙන්න මේ රූප ටිකේ තේරුම තේරුම් ගත්තත් අපිට, අපි ගාව තියෙන මෝඩකම් බොහෝ සීඝ්‍රයෙන් දුරු වෙනවා

ඒ කියන්නේ, අපි නිකමට හිතමු, දැන් ඉත්ථි ඉන්ද්‍රිය රූපය, පුරුෂ ඉන්ද්‍රිය රූපය, කියන එක කවදාවත් ගැටෙන්නේ නැහැ. ස්ත්‍රියෙක්ව හෝ පුරුෂයෙක්ව අල්ලන්න එහෙම නැහැ. ස්ත්‍රියෙක්ව හෝ පුරුෂයෙක්ව අල්ලන්න එහෙම බැහැ. ඒකයි මේ ධර්මය ගොඩාක් ගැඹුරුයි. අපි කතා කරන, අපි හිතාගෙන ඉන්න දේට වඩා, මේක සුඛුමයි කියලා කියන්නේ මේ අවබෝධයත් ඉතාම දුෂ්කරයි.

ඇස් ඉදිරිපිටට අපිට හම්බ වෙන්නේ වර්ණ සටහනක්. මේ වර්ණ සටහනක් හම්බ වෙනකොට පුරුෂ ආකාරයක්, පුරුෂ ස්වභාවයක් දැනෙන්නේ කෙනා කෙනාගෙ සිතට. ඔය සුඛුම රූප හැමවෙලාවෙම මනෝ විඤ්ඤාණයෙන් විතරයි විඤ්ඤෙදයිය, දැන ගන්න පුළුවන්. **ඔය සුඛුම රූප ඉත්ථි ඉන්ද්‍රිය, පුරුෂ ඉන්ද්‍රිය කියන රූපයන්ගේ රූප ස්වභාවය රූප ටික මනෝ විඤ්ඤාණ කියන සිතකට මිසක, කවදාවත් චක්ඛු විඤ්ඤාණ ආදි සිතකට හසුවෙන්නේ නැහැ.**

අපි කෙටියෙන් මතක් කළොත්, මළ මිනියක් වගේ ගන්න. දැන් අපිට මළ මිනියක් දිහා බලලා කියන්න පුළුවන්, මේ ස්ත්‍රියෙක් මේ පුරුෂයෙක් කියලා නේද? අපි දන්න විදියට නමුත් ඔය මළ මිනියක කර්මජ රූප එකක්වත් නැහැ. ඉත්ථි ඉන්ද්‍රිය, පුරුෂ ඉන්ද්‍රිය කියන ඉන්ද්‍රිය. ඉත්ථිභාවය, පුරුෂභාවය කියන භාව රූප නිරුද්ධයි. ඒවා නැහැ. හැබැයි ඒ රූපයට අනුව හැදුණු සතර මහාධාතු රූපයයි, ඔය ඉතුරු වෙලා තියෙන්නේ. එහෙම නැතුව ඒ ඉන්ද්‍රිය සුඛුමයි කියලා කියන්නේ, ධම්මායතනය පරියාපන්නයි කියලා කියන්නේ හිතේ තියෙන කර්ම ගති වලටයි, මේ මහාභූත ටික රාශි වෙලා තියෙන්නේ. **එතකොට හිතේ තමයි මේ පුරුෂ ආකාර, පුරුෂ නිමිත්ත, පුරුෂ ගති, කියන මේ ස්වභාවය මහාභූතයන් තුළ එබඳු ආකාරයට පෙනෙන විදියට මහාභූත ටික රාශි කරන්න පුළුවන්කම තියෙන්නේ, ඒ මනෝ විඤ්ඤාණ මට්ටමේ තියෙන ඉන්ද්‍රිය රූපෙට විතරයි.**

ඇත්තටම බොහෝම අපහසුයි මේ අර්ථය ගන්න. ඒකයි මේ ධර්මය ගොඩාක් ගැඹුරුයි කියලා කියන්නේ. හැබැයි හොඳට මතක තබා ගන්න ඕනේ, මේ එකොළොස් ආකාර රූපයක් තියෙනවා, මේ රූපය කියපු තැන පිරිසිඳ දැකපු දවසටමයි අපි රූපය පිරිසිඳ දකිනවා කියන කාරණාව කියන්න වෙන්නේ. රූපය පිරිසිඳ දැක්කොත් විතරමමයි 'ඕරම්භාගිය සංයෝජන' දුරු වෙන්නේ. කබලිංකාරාහාරය පිරිසිඳ දැක්කා වෙන්නේ. වෙන මොන කාරණාවක් කෙරුවත් වෙන උපායක් නැහැ, මේ සිද්ධාන්තයට. ඒ දුක පිරිසිඳ දකිනවා, මේ රූපය පිරිසිඳ දකිනවා කියන තැනින් මිසක, මේ කාමභූමියෙන් ගොඩ යන්න වෙන උපායක් නැහැ. ඒ නිසා මේ ටිකේ අර්ථය කොහොම හරි සියුම්ව අපි තේරුම් ගන්න උත්සහවත් වෙන්න ඕනේ. එහෙම නොතේරෙන නිසයි අපිට තව ප්‍රතිකර්ම ටිකක් තියෙන්නේ සීල, සමාධි, ප්‍රඥා කියලා මේවා අමාරු නිසයි.

මම ඕකට තව අදහසක් කියන්නේ, තල් ගෙඩියක්, පොල් ගෙඩියක් වගේ ගත්තොත් ඒ බීජය පොළවෙ යට කළොත්, පොළවෙ තියෙන ඕජා සාරය උදව්කරගෙන අතු ඉති බෙදෙන්නේ නැතුව ගහක් හැදෙනවා. අතු ඉති බෙදෙන්නේ නැතුව ගහක් හැදීමේ හැකියාව, පොළවෙ තියෙන ඕජා සාරයේ තිබුණ හැකියාවක් එහෙම නෙවෙයි. ඒ හැකියාව තිබුණෙ බීජයේ. මේ බීජ ගතිය තිබුණු නිසා, බීජ ගතියෙ හැකියාවට මහාභූත ටික රාශි වුණු එකයි අපිට ඔය පෙනෙන්නේ මිසක, ඒ බීජ ගතිය නැහැ ඒ ගහේ. ගහ කියන එක බීජයක් නෙවෙයි. බීජයක් නිසා හටගත්ත ඵලයක්. ඒ බීජය තුළයි තිබුණෙ, ගහ මෙහෙම හදන්න ඕනෙ කියලා ගතියක් ඒ හැදෙන ගහ බීජය නෙවෙයි. තේරුනාද?

ඉතාමත් ඇහැට නොපෙනෙන මට්ටමේ ඇටයක් තමයි, නුග ඇටේ කියලා කියන්නේ. ඔය පින්වතුන් දැකලා ඇති එක ගෙඩියක් ඇතුලෙ අර සියුම් ඇට ගොඩාක් තියෙන්නේ. ඒක චූටි ඇටයක්. හරි අචින්ත්‍යය මේ ධර්මතාවය. ඔය චූටි ඇටේ, ගෙඩියක් ඇතුලේ චූටි චූටි ඇට ගොඩාක් තිබුණාට ඔක්කොම පැල වෙන්නෙ නැහැ. කෝටි ලක්ෂයකට එකක් තමයි පැලවෙන්නෙ. නුග ගෙඩියක් පොඩි කරලා බලන්න වෙලාවක. අබ ඇටේකින් දහයෙන් පංගුවකටත් වඩා පොඩියි ඒ නුග ඇටය. ඔය ඇටේ පොළවෙ වැටුණාහම පොළොව තියෙන ඕජා සාරය අරගෙන ඔය චූටි ඇටේ මහ විශාල අතු ඉති බෙදලා හදන්න ඕනෙ ගතිය, අර බීජයේ තියෙනවනේ. හිතාගන්න පුළුවන්ද අපිට. පොළවෙ පස් ටිකේ තිබුණ හැකියාවක් හින්දා නෙවෙයි, අතු ඉති බෙදිලා මහා විශාල වෘක්ෂයක් වුණේ. මෙබඳු විදියට මහාභූත ටික හදන්න පුළුවන් හැකියාව තිබුණේ බීජයේ. ඒ තිබුණු බීජ ගතියෙ තිබුණු හැකියාවටයි, අතු ඉති බෙදිලා කියලා අපි කතා කරන විදියට මහාභූත ටික රාශි වුණේ. අපි අතු ඉති ගිය ගහක් කියලා කතා කරන කොට, බීජ ගතිය නිසා මහාභූත ටික අවකාශ ධාතුවේ රාශි වුණු ආකාරය ඔය තියෙන්නේ.

ඒ වගේ, **කම්මං කෙත්තං, විඤ්ඤාණං බීජං** කියලා කියන්නේ මේ කර්ම සිත නැමැති බීජයේ' තමයි මේ මහාභූත ටික හදන්න පුළුවන් ගති ටික තියෙන්නේ. ස්ත්‍රියක් කියලා හිතෙන විදිහට, අපිට අර තල් ගහක්, නුග ගහක් කියලා පෙනුණාට, ඒ ගතිය හදන්න පුළුවන්, ඒ තරම් ලොකු රූපයක් හදන්න පුළුවන්, ඒ විදිහට හදන්න පුළුවන් ගතිය තිබුණේ අර බීජයේ.

ඒ වගේ, මේ කර්ම සිතේ, කර්ම සිතෙන්ම මෙහෙයවීම ලබලා ආපු ප්‍රතිසන්ධි සිතේ, මවු කුසට බැස ගත්ත සිතේයි මේ රූපය, ස්ත්‍රියක් හැටියට පෙනෙන, පුරුෂයෙක් හැටියට පෙනෙන, රැවුල් ඇතුව, රැවුල් නැතුව හැදෙන විදිහට කියලා, හැදෙන රූප ටික හදන්න ඕනෙ ගති ටික තියෙන්නේ. සුඛුම රූප කියලා කිව්වේ, මේ මහාභූත ටික හදන්න හේතු වෙන, අර හිතේ තියෙන ගති ටිකටයි ඔය සුඛුම රූප කිව්වේ. අර තල් ගහ, නුග ගහක්

හදන්න හේතු වන අර සියුම් ඇටේ තුළ අතු ඉති යන්නෙ නැතුව හැදෙන්න ඕනෙ කියලා ගතියක්, අතු ඉති බෙදලා හදන්න ඕනෙ කියලා ගතියක් බීජය තුළ තිබුණා නම්, අන්න ඒ මට්ටමේ බීජය තුළ තිබුණ ඒ ගතියටයි සුඛුම රූපය කිව්වේ.

ඒ රූපය නිසා හැදුණු අතු ඉති නැති ලොකු ගහට, අතු ඉති බෙදිලා හැදුණු ගහට, ඕදාරික රූපය කිව්වා.

ඒ නිසා, මේ සිතේ තියෙන කර්මජ ගතිය තේරුම් ගන්න, අපට හිතට මෙහෙම ස්ත්‍රියෙක්, පුරුෂයෙක් කියලා තේරුනාට, අපි හිතාගෙන ඉන්නේ බාහිර ස්ත්‍රීන් ඉන්නවා, පුරුෂයො ඉන්නවා කියලා අපි රැවටෙන්නේ මේ රූප ටික පිරිසිඳ නොදකින නිසා.

මෙබඳු වූ සිතක පවතින කර්මජ ගති ටිකක්, සුඛුම රූපයක ප්‍රතිඵලයක් නේද, මහාභූත ටික අවකාශ ධාතුවෙ මේ විදිහට රාශිවෙන එක, ලෝකයාට ස්ත්‍රියක්, පුරුෂයෙක් කියලා හඳුනාගන්න පුළුවන් විදිහට. ලෝකයා හඳුනාගන්නෙ ස්ත්‍රී රූපය, පුරුෂ රූපය 'නිසා' හටගත්ත වස්තුවයි.

ඒ කියන්නේ අර බීජය නිසා හටගත්ත වස්තුවටයි තාල වර්ගයේ ගහක් කියලා කිව්වේ. නමුත් තාල වර්ගයේ කියන කාරණාව තියෙන්නේ අර බීජයට. ඒක තේරුම් ගන්න. ඒ වගේ මනුස්සයෙක් කියලා, ස්ත්‍රියක් කියලා, පුරුෂයෙක් කියලා, අපි බලන්නේ 'ස්ත්‍රීකම, පුරුෂකම නිසා රාශි වුණු රූපෙටයි. නමුත් 'ස්ත්‍රීකම, පුරුෂකම හදන රූපය' තියෙන්නේ මේ විඤ්ඤාණය ඇසුරු කරගෙන.

මේ ටික මම මේ මතක් කරන්නේ, මේ ටික තේරුම් ගත්ත දවසටයි ඔය පින්වතුන් බාහිර භෞතිකයට ඇඟිල්ල දික්කරන්නේ නැහැ ස්ත්‍රියෙක්, පුරුෂයෙක් කියලා.

මේ රූපවල අවබෝධය තේරෙනකොටම, උපාදාය රූප ටික තේරෙනවා කියන්නෙම, මේ ආත්මභාවය මේ විදිහට පවත්වන මෝහයයි අඩුවෙන්නේ අපිට. මේ ධර්මය මේ විදිහටම තේරුම් ගැනීමෙන්ම මිසක, රූප කලාප කඩල කඩලා බලලා, අනිත්‍ය බලලා කවදාවත්ම අවබෝධ වෙන ඒවා නෙමෙයි. මොකද ඕවයේ රූප කලාප කඩන්න බැහැ. ඒකයි ***යථා භූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං*** ඇත්ත ඇති හැටියෙ නුවණින් දකින්න තමයි තියෙන්නේ. ඒකයි, ***දුක්ඛ සත්‍යය පරිඤ්ඤෙය්‍යයි*** දුක පිරිසිඳ දකින්න ඕන මිසක තියෙන්නේ, දුක කඩලා බලන්න නෙමෙයි. දුක්ඛ සත්‍යය කඩලා කඩලා බැලිය යුතුයි කියලා තියෙයිද? ඒ නිසයි මම මතක් කළේ, දුක කියන එකේ යථාභූත ස්වභාවය තේරෙන කොට මෝහය අයින්වෙන විදිහට තියෙන්නේ.

අපිට සත්වයෙක්, පුද්ගලයෙක්, ස්ත්‍රියෙක්, පුරුෂයෙක් කියලා ඇතිවෙන තණ්හාවක් තියෙනවා නම්, ඔය තණ්හාව දුරු වෙන්නේ මේ දුක පිරිසිඳ දකින තරමට. ස්කන්ධ ටික පිරිසිඳ දකින තරමටයි අපිට පුද්ගල භාවය දුරු වෙන්නේ.

ඒ නිසා තල් ගහට, නුග ගහට කිව්වා අපි ඕදාරික රූප කියලා. තල් ගහ හදන්න, නුග ගහ හදන්න බීජය තුළ, ඇහැටවත් පෙනෙන්නේ නැති මොන විදිහකටවත් ඒවා පෙනෙන්නේ නැහැ ඒ ගතිය. ගතියක්, ස්වභාවයක් විතරයි එබඳු ස්වභාවයකින් ඒ ගහ හැදුවා නම්, එ 'ස්වභාව වූ රූපයට' කිව්වා 'සුඛුමයි' කියලා.

ඒ විදිහට, මේ ධම්මායතනය පරියාපන්න රූප කියලා කියන ටික, තව පැත්තකින් අපි ගත්තොත්, අපි නිකමට කියමු, මේ ශරීරයේ මෘදු බවක් තියෙනවා, මේ මෘදු බව කියන එක, හිත නිසයි තියෙන්නේ. හිත නිසා කයෙන් ප්‍රකටවෙන එකක්. විඤ්ඤාණය නිරුද්ධ වෙලා පැය තුන හතරක් ගියහම ඔය පින්වතුන්ට මේවා නමන්න පුළුවන්ද කියලා බලන්නකො. මේවා කඩන්න වෙයි ඒකට කියනවා කම්මඤ්ඤ බව කියලා. කම්මඤ්ඤතා රූපය කියලා කියන්නේ නමන්න කඩන්න පුළුවන් බව. ඒකත් හිත නිසා.

මැරුණු කෙනෙකුගෙ මේ නාසය මේ මුහුණ එහෙම පොඩ්ඩක් ඔබලා බලන්න. ඔය පින්වතුන් කරලා නැතුව ඇති. හරි පුදුම හිතෙයි. මේ මේසය ඔබන්න පුළුවන් වෙයිද ඇඟිල්ලෙන්. ඒ විදිහමයි. අපිට ඇහෙන් පෙනුනට, අපි හිතාගෙන ඉන්න විදිහෙ මෙහෙම රූප නැහැ ඒ රූපයේ. ඕනෙ වෙලාවක ගිහිල්ලා බලන්න, විඤ්ඤාණය නිරුද්ධ වෙලා තියෙන මිනියක. අපි ඒවා පරීක්ෂා නොකරන නිසයි තවම 'මැරුණු මිහිහෙක්' අපට ඉන්නේ. ඒ රූප ටික, යථාභූතව තියෙන රූප ටිකට විතරක් නුවණ යන්නෙ නැතුව, ගෙඩි පිටින්ම තියෙන රූප ටික ඉන්නේ අපි ඒවා දන්නේ නැති හින්දයි. පුළුවන් නම් ඔබලා බලන්න. මේ ලෑල්ල ඔබන්න පුළුවන් නම් ඔය පින්වතුන්ට ඒ රූපත් ඔබන්න පුළුවන්. ඒ විදිහම වෙනවා. මේකට කියනවා 'මුදුතා රූපය' කියලා.

ඊට පස්සෙ මෘදු බව කියන එක. මේකත් හිත නිසයි. නමුත් මේ මෘදු බව කියන එක අපි අද දකින්නේ රූපයෙන්. නමුත් රූපය තුළ මෘදු බව ඇති කරලා තියෙන්නේ සිතෙන්. ඒ ගතිය තියෙන්නේ හිතේ.

ඒකයි මේවා ධම්මායතනය පරියාපන්න රූප කියලා කියන්නේ සිතේ තියෙන සිතුවිලි ටික කයෙන් ප්‍රකටයි. ඒකයි, වේදනා, සංඥා, සංඛාර පස්සද්ධි, කාය පස්සද්ධි, කියලා කියන්නේ සිත සියුම් වෙනකොට කය සියුම්. සිතුවිලි සන්සිඳෙනකොට කය සන්සිඳෙනවා කියන තැනකින් තියෙන්නේ.

අපි හිතාගෙන ඉන්න විදිහේ මහ කයක් අපි පරිහරණය කරන්නේ නැහැ. කයට බහාලා සිතුවිලි ටිකේ වේගයෙන් කය පරිහරණය කරන්නේ. සිතුවිලි ටිකම මිසක පරිහරණය කරන්නෙ, සිතුවිලි ටික වෙනම පරිහරණය කරන්න මාධ්‍යයක් මේ කය. **විඤ්ඤාණ පස්සද්ධි** - **චිත්ත පස්සද්ධි** - හිත සන්සිඳෙන්නේ විඤ්ඤාණය සන්සිඳුනොත්. රූප ශබ්ද, ගන්ධ, මේවා දැනගන්නවා කියන මට්ටම තමයි සිතක පැවැත්ම. සිතේ තියෙන සිතුවිලි ටික තමයි කයක පැවැත්ම. අපි මේ සිතුවිලි ටික කයට බහාලා සිතුවිලි ටිකේ බලයෙන් කය ජීවත් කරවන නිසා ඒ සිතේ තියෙන රූප ටික කයෙන් ප්‍රකට නිසා. ඒ රූප ටිකට කියනවා ධම්මායතනය පරියාපන්න රූප කියලා. ඕවා සුඛම රූප. මම මේ ටික මතක් කළේ ඔය අවබෝධ්‍ය අපට එන්නටම ඕනේ. ඕවට කියනවා සුඛුම රූප කියලා.

ඊට පස්සේ ***හීනංවා පනීතංවා*** තව ලෝකයා අවමන් කරන, නින්දා කරන, අපහස කරන, අවඥද්ඥා සහගතව බලන, කැත යයි සම්මත රූප තියෙනවනේ, ඒවට කියනවා **'හීන රූප'** කියලා. බොහෝ දුරට දුක් වේදනාවක් උපදින රූප ගන්නකෝ. මේවා ගන්න, හීන රූප කියලා.

ඊට පස්සෙ සැප වේදනා උපදින රූප තියෙනවනේ. ලෝකයා කව්රුත් ප්‍රිය කරන, ප්‍රසංසා කරන, කැමති වෙන රූප තියෙනවනේ. මේ රූප වලට කියනවා **'ප්‍රිය රූප'** කියලා. ප්‍රනීත රූප කියලා.

ඊට පස්සෙ ***යං දූරේ සන්තිකේවා,*** යම් රූප තියෙනවා නම්, දුර, ළඟ. ඒ ඒ වස්තූන්ට උපාදාය උපාදාය. ඒ ඒ වස්තූන්ට අනුව දුර, ළඟ ගත යුතුයි. අපි තමන් කියන මේ ජීවිතයට සාපේක්ෂාව ළඟම රූප ටික වෙන්න පුළුවන් මේ අහල පහළ. ඊට වඩා ළඟයි ඊට මෙහා තියෙන දේවල්. ඊට වඩා ලඟයි ඊටත් මෙහා තියෙන දේවල්. මේ මේ විදියට දුර ළඟ කියන එක දකින්න. තම තමන්ට සාපේක්ෂව ඒවා '**දුර රූප**' සහ '**ළඟ රූප**'.

දැන් මම මේ රූප ටිකක් මම විස්තර කළානේ. ඔය තමයි ඔය රූප වල තියෙන වචන වල ඇත්ත. දැන් මේ රූප ටික ඔක්කොම එකට එකතු කරලා ඔය එක එක විදියට පෙන්වපු යම්තාක් රූප තිබුණා නම්, ඔය හැම රූපයක්ම 'මම නෙවෙයි, මගෙ නෙවෙයි, මගෙ ආත්මය නෙවෙයි' කියලා අපි දකින්න ඕනේ. එදාටයි මම කියලා කියන සවිඤ්ඤාණක කයේ මම කියන හැඟීමත්, බාහිර සියළු නිමිති වල මගේ කියන හැඟීමත්, අහංකාර, මමංකාර කියලා මේ දෙයාකාරයෙන් පවතින මාන අනුසය ගෙවෙන්නෙ.

එහෙනම් ඒ එකළොස් ආකාර රූපය, මම නෙවෙයි, මගෙ නෙවෙයි, මගෙ ආත්මය නෙවෙයි කියලා දැක්ක යුතු නම්, එහෙනම් කෙසේද දැක්ක යුත්තෙ? මම නෙවෙයි

මගෙ නෙවෙයි මගෙ ආත්මය නෙවෙයි කියලා දැක්ක යුතුයි. එතකොට මම නෙවෙයි, මගෙ නෙවෙයි, මගෙ ආත්මය නෙවෙයි නම්, එහෙනම් කොහොමද ඒ රූපය, අපි මොන විදියටද එහෙනම් දැකිය යුත්තේ?

චත්තාරෝච මහාභූතා චතුන්නංච මහාභූතානං උපාදාය රූපං

මේ හැම රූපයක්ම මේ යම් තාක් අපේ ජීවිතයේ රූප ඇසුරු වුණු එකළොස් පොළ තමයි පෙන්නුවේ. ඔය එකළොස් පොළේ යම්තාක් රූප ඇසුරු කලාපනම්, ඕනෙ නම් අපි, පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියලා සතර මහා ධාතුව හෝ ඒ නිසා උපන්න උපාදාය රූපයක් ඇසුරු කරලා ඇති, එච්චරමයි.

එතකොට සතර මහා ධාතු සහ උපාදාය රූපයක් විතරමමයි තියෙන්නේ. ඒ රූපය, රූපය වූ පරිදි පිරිසිඳ නොදන්නාකම නොදකිනකම නිසා, මම, මගේ, මගෙ ආත්මයයි, කියන අවිද්‍යා ප්‍රත්‍යයෙන්, මිච්ඡා දිට්ටියක් හැදිලා තියෙනවා. මේ රූප මගෙ අම්මා, මගෙ දුවා, මගෙ පුතා, මගෙ ඥාතීන්, මගෙ මිත්‍රයින් කියලාත්. මම අහවල් තැනට ගියා, අහවල් තැන හිටියා කියලා, මම අහවල් දේ කරන්න යනවා, මම දැන් ඉන්නවා කියලා මේ විදියට මේ රූප මම සහ මගෙ වෙලා තියෙන්නේ.

රූපය කියන එකේ තත්වූ පරිදි නොදන්නා නොදකිනකම නිසා, රූපය කියන එකේ යථාභූත ස්වභාවය - ඇත්ත, යථා කියලා කියන්නේ යම් සේ වූද, යම් සේ පවතීද, එසේ ඇත්ත ඇති හැටිය. අපි කෙනා කෙනා දැන ගන්න හැටියට නෙවෙයි, අපි කෙනා කෙනා දැන ගත්තත්, දැන නොගත්තත් පවතින විදිහක් තියනවා රූපයන්ගේ. පවතින ආකාරයක් තියෙනවා. ඒ පවතින ස්වභාවය, පවතින ආකාරය, පවතින ආකාරයෙන් දකිනකමට කිව්වා 'සම්මා දිට්ඨි' කියලා.

එතකොට, මෙන්න මේ ටික ඔය පින්වතුන් හොඳට තේරුම් ගන්න ඕනේ. ඒ **රූපයේ ඇත්ත ඇති හැටියේ පවතින ඇත්තක් තියෙයි නම්, ඒ ඇත්ත ආයේ කඩලා බලන්නවත්, බිඳලා බලන්නවත්, ඔබලා බලන්නවත් බැහැ. පවතින ආකාරයට අපිට මොකුත් කරන්න බැහැ.** රූප කලාප කඩලා කඩලා බලනවා කියලා හෝ කුඩු කරලා බලනවා කියලා හෝ ඒ මොකුත් බැහැ. පවතින එක පවතින ආකාරයෙන් දකින එක විතරමයි ඕන වෙන්නෙ. දකින එක විතරමයි කරන්න පුළුවන්. ඒ දැකීමටයි 'සම්මා දිට්ඨි' කිව්වෙ. හැබැයි ඒ දැකීම ඇති කරගන්න පුළුවන් මානසික මට්ටමක් හදාගන්න, නීවරණ ධර්ම දුරු කරගන්න, පූර්ව භාග ප්‍රතිපදාවේදී නම් අපිට රූප කඩන්න වෙයි, කුඩු කරන්න වෙයි, පොලන්න වෙයි. ඒක මේ යථාභූත ඥාණය එහෙම නෙවෙයි, ඒක තේරුම් ගන්න. මේ කොටස් කොටස් වශයෙන් බලන්න වෙයි. රූප කලාප බිඳි බිඳි යනවා කියලා ඕනෙනම්

බලන්න වෙයි. ඒ සම්මා දිට්ඨිය හෝ ඒ රූපයේ ඇත්ත බලනවා හෝ නෙවෙයි. ඒක මේ ඇත්ත දකින තැනට මනස ගන්න, නීවරණ ධර්ම දුරු කරගන්න, දරන එක්තරා උපායක්.

ස්කන්ධ ටික, යථාභූත ස්වභාවයක් තථාගතයන් වහන්සේ ඇති කල්හිත් නැති කල්හිත් පැවතුණු ඇත්තක් තියෙනවා මේ රූපෙ. ඒ ඇත්ත ඒ ලෙසින්ම අවබෝධ කරගෙන ලෝකෙට දේශනා කරන එක මිසක තථාගතයන් වහන්සේ කළේ, තථාගතයන් වහන්සේගේ අදහසක්වත් දැක්වූවා නෙවෙයි. ඒ නිසයි අදද බුදුදහම සන්දිට්ඨිකයි, අකාලිකයි, ඒහි පස්සිකයි කියලා කියන්න පුළුවන්. මොකද අදද එහෙමනම් බුදු දහම දැක්කා කියලවත් දකින්න ගියොත්, බුදුරජාණන් වහන්සේගේ ධර්මය අවබෝධ වුණා කියලා අවබෝධ කරන්න ගියොත්, තියෙන්නෙ වෙන මොකුත් නෙවෙයි. අදද මේ රූපයේ පවතින ඇත්ත දකින්න. බුදුරජාණන් වහන්සේ කළෙත් ඒ ටික. කරන්න කියලා පෙන්නුවෙත් ලෝකෙට ඒ ටික. එතකොට ඒ වස්තු ඒ රූප මට තව කෙනෙකුට ඕන ඕන විදියට වෙනස් කරලා වෙනස් විදියකට අවබෝධ කරගන්නවා කියලා එකක් නැහැ. ඒවා ස්වභාවයේ පවතින ආකාරයක් තියෙනවා.

අර මම කිව්වෙ ඒකයි, මේ ඉස්සෙල්ලා පදගත අර්ථයන් ටික දකින්න. මේ එකොළොස් පළේ තියෙන රූප ටික දකින්න. ඕවත් අර්ථ. ඔය සූත්‍ර අර්ථයට මම නෙවෙයි, මගෙ නෙවෙයි, මගෙ ආත්මය නෙවෙයි කියන අර්ථ අවබෝධයට පදගත අර්ථය ලඟටම තියෙන කාරණාව කියලා දකින්න. ඒ ඒ පදයන්ගේ අර්ථය පෙන්නීම උපකාරයි සූත්‍ර අර්ථය, නැත්නම් මේ එකොළොස් පළේම තියෙන වස්තූන්ගේ ඇත්ත මේකයි කියන ඇත්ත දකින්න. ඒ ඇත්ත උපකාරයි අපි තුළ 'මාර්ග ඵල' නැමැති අර්ථ අවබෝධය සඳහා 'ප්‍රතිපදාව' සඳහා

එතකොට මෙතනදි අපි මේ එකොළොස් ආකාර රූපයක් ගැන කතා කළේ බුදුරජාණන් වහන්සේ පෙන්නුවේ, ඔය ඔක්කොම රූප ටික එකට එකතු කරලා කැටි කරලා, මම නෙවෙයි, මගේ නෙවෙයි, මගෙ ආත්මය නෙවෙයි කියලා දැක්ක යුතුයි කියලා ඔය සූත්‍රයෙන් පෙන්නුවා. නමුත් මේ සූත්‍රයෙන් මම නෙවෙයි, මගෙ නෙවෙයි, මගෙ ආත්මය නෙවෙයි කියලා දැක්ක යුතුයි කියලා පෙන්නුවට, එහෙනම් මෙහෙමයි දැක්ක යුත්තේ කියලා පෙන්නුවද අපිට? නැහැ. එහෙනම් කොහොමද අපි මෙහෙම දකින්න එපා නම් කොහොමද දැක්ක යුත්තෙ?

බුදුරජාණන් වහන්සේ විශේෂයෙන් අභිධර්මයේ කියන කාරණාවෙන් පෙන්නන්නෙම, මෙන්න මේ රූපයේ කියන එකේ ඇත්ත ටික. මෙන්න මෙහෙමයි බැලිය යුත්තෙ, මෙන්න මෙහෙමයි දැක්ක යුත්තෙ කියන එකයි, අභිධර්මයේ 'රූප කාණ්ඩ' කියන එකෙන් පෙන්වන්නෙ. මම, මගෙ, මගෙ ආත්මය කියලා දකින්න එපා, කියලා පෙන්නුවානම්

බුදුරජාණන් වහන්සේ, හරි එපා. එහෙනම් කොහොමද දැකිය යුත්තෙ කියන කොට, මෙහෙමයි දැකිය යුත්තෙ කියන ටික බුදුරජාණන් වහන්සේ පෙන්නපු තැන් ටික මෙතෙන්ට අරගන්න. අභිධර්ම පිටකේ තියෙනවා, තව පැත්තකින් මම අර මතක් කරන්නෙ විභංග ප්‍රකරනයේ තියෙනවා, ඥාණ විභංග කියලා ඔය දෙතැස්සෑ ඥාණයම කුළු ගන්වලා, ඒකෙදි ඔය ගෝචර නානත්ව ඥාණය, වස්තු නානත්ව ඥාණය කියලා ආධ්‍යාත්මික වස්තු ගැන, ඒ කියන්නෙ ඇහැ, කන, දිව, නාසය, ශරීරය ගැන, ගෝචර ධර්මයෝ රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධර්ම කියන තැන, ධර්මායතනය අනුව ගිය රූපයි කියලා රූප එකොළොස් පළක් අපේ ජීවිතයේ ඇසුරු වෙනවා. ඒ රූප ගැන පෙන්නලා තියෙයි. මෙන්න මෙහෙම දකින්න කියලා. එකොළොස් පළක තියෙන රූප ටික ඔක්කොම එකතු කරලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ***චත්තාරෝච මහාභූත චතුන්නංච මහාභූතානං, උපාදාය රූපං, සබ්බං රූප*** සියළුම රූප කියලා තියෙනවනම් සතර මහාධාතු සහ උපාදාය රූපයි කියලා පෙන්වනවා.

ඊට පස්සෙ සතර මහාධාතු කියන්නෙ මොකක්ද, ඒකෙ ලක්‍ෂණ මොනවද? උපාදාය රූප කියන්නෙ මොකක්ද, ඒකෙ ලක්‍ෂණ මොනවද? කියලා හොඳට ඉගෙන ගන්න. ඔය පින්වතුන් ඔය ටික ඉගෙන ගන්න යනකොට ඉගෙන ගන්න වෙන්නෙ ඉබේමයි අභිධර්මය. අපි අභිධර්මය ඉගෙන ගන්න ඕනෙ නැහැ. ඔය පින්වතුන්ට පුළුවන් නම් සතර මහාධාතුව කියන්නෙ මෙන්න මේකයි, උපාදාය රූප කියන්නෙ මෙන්න මේ ටිකටයි කියන එක දේශනාවකින් අහගෙන ඔය පින්වතුන් ඉගෙන ගෙන තියෙන්නෙ, අභිධර්මය. එදා බුදුරජාණන් වහන්සේගේ කාලයේ දේශනාවක් අහනකොට මාර්ගඵල ලැබුවා නම් අභිධර්මය කියලා එකක් ඕනෙ වුණේ නැහැ. ඕනවුණේ නැත්තෙ මොකද, දේශනා කරන දේශකයාණන් වහන්සේගේ මනසෙ තිබුණා, ඒ ධර්මය මෙයාට ඒ ටික කෙටි කරලා කැටි කරලා එතනින්ම අල්ලලා දෙන්න පුළුවන්කම තිබුණා.

අද මම මේ දේශනාවෙන් ඔය පින්වතුන්ට කිව්වෙ, අභිධර්මය. දැන් වෙන අභිධර්මයක් එහෙම නැහැ. එතකොට අමුතුවෙන් අභිධර්මය ඉගෙන ගන්න අමුතුවෙන් පන්ති යන්න ඕනෙ නැහැ. අභිධර්මය ඉගෙන ගන්න පන්ති යන්න ඕනෙ, මේ අර්ථය දේශනා කරන තැන් දේශනාවන් ඇහෙන්නෙ නැත්නම්. මොකද මේ ධර්මය අවබෝධ කරගන්න ක්‍රම කිහිපයක් තියෙනවා.

එකක් සද්ධර්මය ශ්‍රවණය තුළ.
එකක් තමන් අහගත්ත ටිකට අනුව අර්ථය නැවත නැවත මෙනෙහි කිරීම.
තව එකක් තියෙනවා ප්‍රශ්න ඇසීමෙන්, විසඳීම.
තව එකක් තියෙනවා ධර්ම දේශනා කිරීම.
තව ක්‍රමයක් තියෙනවා, ඉගෙන ගැනීමෙන්.

ඔය ඉගෙන ගන්නවා කියන එක මේ ධර්මය අවබෝධ කරගන්න තියෙන ක්‍රම කිහිපයෙන් එකක්. ඒ නිසා අභිධර්මය ඉගෙනගත යුතුමයි කියලා නැහැ. ඉගෙන ගෙනත් අර්ථය ගොනු කරගන්නවා කියන ක්‍රමයකුත් තියෙයි. මම මෙතනදි මතක් කළේ, මම නෙවෙයි, මගෙ නෙවෙයි, මගෙ ආත්මය නෙවෙයි කියලා දකින්න තියෙන්නෙ, 'මම, මගෙ, මගෙ ආත්මයයි කියලා දකින්න එපා' කියන එකයි බුදුරජාණන් වහන්සේ පෙන්නුවෙ මේ හැම රූපයක්ම. මෙහෙම දැක්කෙ නැත්නම් තියෙන වාසිය තමයි මොකක්ද අහංකාර, මමංකාර කියන මාන අනුසය නැති වෙනවා. **මාන අනුසය නැති වුණා කියන්නෙ 'රහත් වුණා' කියන එකට තව අනවර්ත වචනයක්.**

කෙනෙක් මානය නැසුවා කියලා කියන්නෙ, රහතන් වහන්සේ නමකට විතරයි මාන අනුසය නැත්තෙ. මත්තේ කළ යුත්තක් නැහැ. ඛීනාශ්‍රව රහතන්වහන්සේ නමක් කියන තැනට තව වචනයක් මොකක්ද, මම, මගේ කියන මාන අනුසය නැති කෙරුවා කියන තැන. එතකොට මාන අනුසය නැති කළොත් තමයි මතු කළ යුත්තක් නැහැ, කළ යුත්ත කළා කියන අරිහත් තත්වයට පත්වෙන්න පුළුවන්. ඒ මාන අනුසය නැති කරන්න පුළුවන් වෙන්නේ හැම රූපයක්ම මම, මගෙ, මගෙ ආත්මය කියලා නොදකින්න ඕනෙ.

හොඳයි මම, මගෙ, මගෙ ආත්මය කියලා නොදකින්න නම් එයා දකින්න ඕනෙ මොකක්ද හැම රූපයක්ම මහාභූත සහ උපාදාය රූපයි. මෙච්චර කල් මනුස්සයෝ කියලා අපි කතා කරපු අපි මනෝමයෙන් හරි හිතපු අපි ඇසුරු කරපු හැම රූපයක්ම දෙවියො ගැන, බ්‍රහ්මයො ගැන, නිරිසත්වයො ගැන, දේවල්, කාරණා, ඉඩකඩම්, දූ දරුවො කියලා කතා කරපු යම්තාක් වපිසරියක් තියෙයි නම් ඔය ඔක්කොම ටික අයිතියි ඔය එකොළොස් පළට. ඔය එකොළොස් පළේ තියෙන ඔක්කොම රූප ටික ආයෙ කෙනෙක්වත් කෙනෙක්ගෙවත්, පුද්ගලයෙක්වත්, පුද්ගලයෙකුගෙවත් නෙවෙයි මහාභූත සහ උපාදාය රූපයි කියලා, ඒ රූප ටිකේ යථාර්ථය දැක්මෙන්ම තමන්ට දැනෙනවා. බුදුරජාණන් වහන්සේ කිව්ව හින්දා නෙවෙයි. තව හාමුදුරුවො නමක් දේශනා කරන හින්දා නෙවෙයි. කල්‍යාණ මිත්‍ර ඇසුරෙන්, සද්ධර්ම ශ්‍රවණයෙන් ඒක මෙනෙහි කරලා බලාගන්න හැටි අහගත්තා. කරගෙන කරගෙන යන කොට වර්ණ රූපය කියන්නෙ මොකක්ද උපාදාය කිව්වෙ ඇයි කියලා ඊට අනුව අපිට පෙනෙන මට්ටමට එනකොට, මේ රූප මහාභූත සහ උපාදාය රූප කියන ටික පෙනෙන මට්ටමට එනකොට, මේවා මම නෙවෙයි, මගෙ නෙවෙයි, මගෙ ආත්මය නෙවෙයි කියලා කියන්නෙ ඔය පින්වතුන් මිසක, බුදුහාමුදුරුවො නෙවෙයි.

එතකොට එදාටයි තමන්ට මේ කෙළෙස් දුරුවෙන්නෙ. මේ හැම පළකම රන්, රිදී, මුතු, මැණික් තියෙනවා, ගෙවල් දොරවල් යාන වාහන තිබුණා. දෙවියො, මනුස්සයෝ

භූතයෝ හිටියා කියන කාරණාව වැරදියි කියන කාරණාව කියන්නෙ ඔය පින්වතුනුයි එදාට, බුදුහාමුදුරුවො නෙවෙයි. මොකද ඒ සම්මා දිට්ඨි කියලා කිව්වෙ යම් රූපයක් තියෙයි නම් රූපයේ යථාර්ථයක් තියෙනවා නම් ඒ රූපයේ ඇත්ත ඇති හැටියෙ අවබෝධ කළා. ඒ නිසා සම්මා දිට්ඨි කිව්වා.

විශේෂයෙන් දැනගන්න, අපි නිවන් දකිනවා කියලා කියන්නේ සත්‍ය අවබෝධයක්. ඇත්ත ඇති හැටියෙ අවබෝධ කර ගැනීමක් මිසක තවත් බොරුවක් කරන එකක් හෝ තව විහිළුවක් කරන එකක් නෙවෙයි.

ඒ සත්‍ය කියන එක ගත්තහම හැමදාම, හැමතැනම, හැමෝටම එකයි. ආයෙ දෙවියන්ට වෙනස් එකක්, මනුස්සයන්ට වෙන එකක්, බ්‍රහ්මයන්ට තව එකක්, තව ආගමක කෙනෙක්ට තව එකක් එහෙම නැහැ. එන්න ඇවිල්ලා බලන්න කියලා කියන්න පුළුවන් කම තියෙන්නෙ ඔය ඇත්තෙදි, ඔය ඇත්ත කොතනත් එකයි.

එතකොට දැනට සිතෙහි කොනක තබා ගන්න. මේ මැරෙණ, ඉපදෙන සංසාරෙ භයානකම භූමිය තමයි 'කාම භූමිය' මොකද සතර අපාය ඇසුරු වෙන තැන. මේ සතර අපාය ඇසුරුවන කාම භූමියෙනුත් දුක් සහගත කබලිංකාරාහාරයෙන් යැපෙන මේ රූපෙනුත් කවදාමහරි දවසක මිදෙනවානම් මිදෙන්න වෙන්නෙ, මේ එකොළොස් තැනක පෙන්නපු හැම රූපයක්ම අපි දැනගත්ත සහ දන්න විදියට පුද්ගල, දේවල්, කාරණා නෙවෙයි, සතර මහා ධාතුවේ උපාදාය රූපයි කියන අනාත්මවූ ධර්මතා ටිකක් සහ රූප ටිකකුයි තිබ්ලා තියෙන්නේ කියන ඇත්ත දැකපු දවසටයි කියන එක සිතේ කොනක තබා ගන්න. තවම ඔය පින්වතුන්ට පෙනෙන්නෙ නැහැ. ඒ හින්දයි මම ඔය පින්වතුන්ට මතක් කළේ, සිතේ කොනක තබාගන්න කියලා. මේක තමයි ඇත්ත.

හැබැයි ඔය ඇත්තෙදි ඔය ඇත්ත කඩ කඩා බලන්න බැහැ. මොකද ඔය ඉත්ථි ඉන්ද්‍රිය රූපෙක, රූප කලාප බිඳි බිඳි යනවා කියන ඕවා නැහැ. රූප වෙනස් වෙනවා කියන එක නැහැ. එහෙම බලන්න බැහැ. එතකොට මේ මහාභූත සහ උපාදාය රූපයි කියන ටික පිරිසිඳ දැක්ක යුතුයි කියන ඇත්ත හිතේ කොනක තබාගෙන, ටික ටික උත්සහවත් වෙන්න. සද්ධර්ම ශ්‍රවණය තුලින්, කළ්‍යාණ මිත්‍ර ඇසුරකින්, මහාභූත කියන්නෙ මොකක්ද, උපාදාය රූප කියන්නෙ මොකක්ද ඒකෙ ලක්‍ෂණ මොනවද? කියලා අවබෝධය ඇති කරගන්න ටික ටික උත්සහවත් වෙන්න, හෙමින්. ඒ දැනුම පැත්තක තියාගන්නවා, ඒ දැනුම ඇති කරගන්න හිමින්, වේගවත්ව නෙවෙයි. බොහෝම හිමින්, අහිංසකව, උත්සහවත් වෙනවා. මොකද ඒකට හේතුව එක පාරටම කවදාවත් කරන්න බැහැ, මේ මට්ටමේදි.

මේක අහිංසකව මේ විදියට කරන ගමන් ඉතාමත් උවමනාවෙන් වේගයෙන් උත්සහයෙන්, මෙහෙන් ඔය පින්වතුන් වෙන වැඩක් කරන්න ඕනෙ. මොකක්ද ඒ තමයි **සීලයක පිහිටලා, සමථ කමටහනකින් හිත වඩමින් විදර්ශනා කළ යුතුයි. ඒ විදර්ශනා ඥාණය කියන එක මේ ඇත්ත ඇති හැටියෙ බලන්න හදන එක නෙවෙයි. මේවා ලෞකිකයි.** මේක අනිත්‍ය වශයෙන් බලන්න පුළුවන් දුක් වශයෙන් බලන්න පුළුවන්, අනාත්ම වශයන් බලන්න පුළුවන්. ඔය ඕනෙම විදියකට බලන්න පුළුවන් මෙන්න මේ නුවණට රූප කඩ කඩා බලන්න, කුඩු කරලා බලන්න, බිඳලා බලන්න රෝල් කරලා බලන්න අඹරලා බලන්න ඕන විදියකට බලන්නත් පුළුවන්. බලන්නත් ඕනෙ. ඒ බලන එක, මේ ඇත්ත ඇති හැටියෙ බලනවා කියලා රූප පිරිසිඳ දකින්න කරන උත්සහයක් නෙවෙයි. එතෙන්ට මනස ගන්න නීවරණ අඩුකර ගන්නයි මේ ටික තියෙන්නෙ.

අපි නිකමට කියමු පීරිසියක් පෙනෙනවා. දැන් මම හිතින් හිතනවා, පෙනෙන්නෙ හොඳටම පීරිසිය, මේකෙ තියෙන රූප කලාප කලාප කලාප කලාප එකතු වෙලා නේද මේ පීරිසියක් හැදිලා තියෙන්නෙ. රූප කලාප කලාප කලාප කලාප නැති වෙනකොට පීරිසිය කියන එක නැති වෙනවා නේද? අනේ මේ රූපය අනිත්‍යයි නේද? කියලා හිතන්න. ඊට පස්සෙ මෙහෙම බලද්දිත් මේකෙ රූප කලාප කලාප වෙනස් වෙවී යනවා ඉස්සෙල්ලා තිබුණ එක නෙවෙයි දැන් මේ තියෙන්නෙ කියලා හිතන්න ඕනෙ. මේ හිතනවා කියන එකෙන් ඔය පින්වතුන් දන්නවද ආධ්‍යාත්මික පැත්තෙන් ලොකු ආවරණයක් කරලා තියෙනවා. අලුතෙන් මේ පීරිසිය බොහොම හොඳයි ලස්සනයි කියලා අල්ලගෙන නීවරණ ධර්ම ඇති කරගන්න එක වළක්වලා ඒකටත්. හැබැයි ඒක අර සම්මා දිට්ඨිය නෙවෙයි, ඒකට යන්න තියෙන මගක්.

ඒ විදියට ඕන විදියකට හිතන්න. යමක් යහපත්ද කුසල්ද හොඳද ඒ විදියට හිතනවා, ඒකට උපකාර පිණිස සමථ කමටහනක් වඩනවා, ඒකට උපකාර සීලයක පිහිටනවා. සීලයක පිහිටලා සමථ කමටහනක් වඩමින් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් හිතනවා. හැබැයි බුදු දහමේ යථාර්ථය අනුව දන්න දේ අනුව බුදු හාමුදුරුවො, ඒ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ත්‍රිලක්‍ෂණයත් මෙහෙම අරමුණක් අරමුණක් ගානෙ පැනෙව්වෙ නැහැ. බුදුරජාණන් වහන්සේ බොහෝ දුරට පෙන්නුවෙ, මේ සවිඤ්ඤාණක කය හරහා බලන්නයි.

සතර සතිපට්ඨානය හොඳට බලන්න, මේ කය ගැන පෙන්නලා ***බහිද්ධාවා කායේ කායානු පස්සී විහරති*** කියලා බාහිර රූප පෙන්වන්නෙ නැහැ. ***පරසන්තානංවා පරපුද්ගලානංවා*** කියලා සත්ව පුද්ගලභාවයෙන් යුක්ත මේ ඕදාරික රූප ටික පෙන්වන්නෙ. මේ සවිඤ්ඤාණක කයේ බාහිර සත්ව පුද්ගලභාවයෙන් යුක්ත රූපයේ, බාහිර සවිඤ්ඤාණක කයේ, මෙතන තියෙන නාම-රූප ධර්මයෝ බලලා අනාත්මයි

කියලා හැටියට හෝ කන බොන ආහාර පානයෙන් හැදෙන්නෙ, චිත්ත චෛතසික ටික නිසයි පවතින්නෙ කියලා, ඒ හේතු නැති වෙන කොට නැති වෙනවා කියලා හෝ අනේ මේ ජීවිතය ජීවත් කරවනවා කියන්නෙ කවන්න ඕනෙ, පොවන්න ඕනෙ, නාවන්න ඕනෙ, අන්දවන්න ඕනෙ පළඳවන්න ඕනෙ, ලෙඩෙක්ව පෝෂණය කරනවා වගෙයි නේද මේ, මේ දුකට උපස්ථාන කරනවා නේද කියලා දුක්ඛ සංඥාවෙන් හිතලා නිතර නිතර ඔය පින්වතුන්ට හිතන්න පුළුවන්නම්, මේ කය කයක්, පුද්ගලයෙක් කියලා නොපෙනෙයි, දුක කියලා පෙනෙයි.

එහෙම දකින්න දකින්න නීවරණ ධර්ම අඩුවෙනවා. වැඩිය එපා මුහුණ සෝදන ගානෙ, බාත් රූම් (bath room) එකට යන ගානේ, ඇත්තටම හිතන්න පුළුවන් නම් හරියට මළමිනියකට උපස්ථාන කරනවා වගෙයි හරියට. දත් මද්දවන්න ඕනෙ, මූණ සෝදවන්න ඕනෙ, කබ කඩන්න ඕනෙ, සොටු සූරන්න ඕනෙ, මල මුත්‍රා අයින් කරවන්න ඕනෙ, මොන තරම් උපස්ථානයක් උපකාරයක් කරලාද මේක මේ විදියට පෙන්නලා මේ ලෝකෙට ඉදිරිපත් කරලා තියෙන්නෙ, මේ විදියට ලෝකයාගෙන් නින්දා අපහස නොඑන විදියට විදියට තබාගන්න දරන මේ උත්සාහයම දුකක් නේද කියලා, බලන්න. ඇත්තටම හිතන්න පුදුම කෙළෙසයක් අඩුවෙයි ඔය පින්වතුන්ට. අපි එහෙම නැතුව මෙහෙ පුද්ගලභාවය එහෙම තියෙද්දි බාහිර හැම දෙයක්ම නැති වෙන කොට, දුකයි නේද දුකයි නේද කියලා බැලුවට, මේ කෙළෙසය හිඳෙන්නෙ නැහැ. ඒ හින්දා අනිත් හැම තැනකමත් දකින්න, මේ විදියට පෙනෙන රූප තිබුණට ඒ හැම තැනකම එතන එතන දුක පෝෂණය කරලා. දුකෙන් මිදෙන්න උත්සහවත් වෙනවා, මේ විදියට පෙනෙන මට්ටමට මේ රූපයේ එළියට දාන්න මොන තරම් එතනත් වෙහෙසිලා තියෙනවද කියන කාරණාව තේරුම් ගන්න. එතකොට අර ඕනෑවට වඩා වටිනාකම පෙනෙන්නෙ නැහැ. මේ පෙනෙන මට්ටමින් බොහොම හොඳයි සැපයි කියලා රැවටෙන ගතිය, හිටින්නෙ නැහැ. අපි හොඳට දන්නවා මේ කොණ්ඩෙ පීරලා, තෙල් ගාලා, පවුඩර් දාලා මේ එළියට දාලා තිබ්බට මේ තරම් උත්සහයක් යොදපු එකක ප්‍රතිඵලයක් මේ. ඒත් තව ටිකකින් ඕක කිළුටු වෙනවා.

අනිත්‍ය කියන එක ඔය පින්වතුන්ට තේරුම් ගන්න හොඳටම පුළුවන් එහෙම. දුකයි කියලා බලනකොට අනිත්‍ය පෙනෙනවා, අනිත්‍ය බලන කොට දුකත් පෙනෙයි. ඔය විදියට ඔහොම හිතන්න. ඔහොම මෙනෙහි කරන්න. මේකට ඉඳගෙන ඇස් වහගෙන පැය ගණන් ඉන්න ඕනෙ නැහැ. වැඩ පළේ යද්දියි කමටහන් ටික හොඳට හම්බ වෙන්නෙ. පාර දෙපැත්තෙ මේ හොඳට හම්බ වෙන්නෙ, කමටහන් ටිකක්. තමන්ගෙ ශරීරය තරම් කමටහන් ටිකක් තවත් නැහැ. මේ විදියට ඔහොම හිතන්න. මෙහෙම හිතන ගමන්, ඕවා තමයි විදර්ශනා ඥාණ. ඔය විදර්ශනාව. **ඔය විදර්ශනා භාවනාව. ඔය ලෝකයා බොහොම ලස්සන සත්වයෙක් පුද්ගලයෙක් දකිනකොට, ලෝකයා දකින දේට ඔබ්බෙන් දකිනවා එයා.**

විශුද්ධි දර්ශණයක් සුඟද්ගෙද ගාමයක්, මොකක්ද? මේ වගේ හොඳ මට්ටමට ඉදිරි පත් කරලා තියෙන්නෙ, පැත්තකට වෙලා හැංගිලා, කබ කඩලා, හොටු හූරලා, මල මුත්‍රා අයින් කරලා මෙන්න මේ විදියට මහා දුකක් දාලයි මේ තියෙන්නෙ, මේක තමයි ඇත්ත. මේ තරම් පිළියම් කරලා තමයි මේ රූපෙ දාලා තියෙන්නෙ. ඒත් ඊට පස්සෙත් එතන තියෙන දේ තමයි බැහැර විතරක් බැලුවොත් ඔය පින්වතුන්ට පිළිකුල දැනෙයි, එතකොට එන්නෙ පටිඝය. ඒ නිසා ආධ්‍යාත්මිකවත් බලන්න.

මේ ආධ්‍යාත්මිකව නොබලා බැහැර අසුබය විතරක් බැලුවොත්, ඔය පින්වතුන්ට පිළිකුල දැනෙනවා. ඔය පින්වතුන් ගැටෙනවා. එතකොට නුවණ නෙවෙයි එන්නෙ, ගැටීම. ආධ්‍යාත්මිකවත් බලමින් බාහිරත් බැලුවොත්, මේක සමගාමීව යනවා. එතකොට පිළිකුල් කරන්නත් එක වගෙයි, පිළිකුල් නොකරන්නත් එක වගෙයි කියන තැනකට එනවා. එතකොට අයින් කරනවානම් මේ රූපෙත් (තමන් කියන) එක්කයි අයින් කරන්න වෙන්නෙ. පින්වතුන් බාහිර රූපෙට කලින් මේ රූපයත් අයින් කළ යුතුයි තැනකින් කළකිරෙන්නෙ මේ රූපෙට. තමන් කියන රූපෙටත් එක්කයි. ඒකයි ***අජ්ඣත්තං වා කායේ කායානුපස්සී*** නැතුව, බාහිර හම්බ වෙනවා හිතට හමුවෙන හමුවෙන හැම රූපයකම අසුබය බල බලා, බල බලා යන්නකො. පින්වතුන්ට අල්ලන්නවත් බැරි තරම් පිළිකුලක් පිලිගඳක් වගේ තැනකට එයි. එතකොට ගෙදරක ජීවත්වෙන්න බැරිවෙයි අන්තිමට, ගැටලු ප්‍රශ්න ඇතිවෙයි. එහෙම වෙන්නෙ මොකද, අමුයි.

මේ ආත්ම දෘෂ්ඨියේ බැසගෙන අසුභයක් හිතන්න වෙනවා. එතකොට ඉබේමයි මම පිරිසිදුයි, අනෙක් කෙනා අපිරිසිදුයි කියන තැනකින් තමයි තේරිලා තියෙන්නෙ. ඒකයි මේ කෙළෙසය. පිරිසිදු මට අපිරිසිදු කෙනෙක් හම්බ වෙලා වගේ තැනකින් කෙළෙස් යෙදෙන්නෙ, මේ රූපයෙන් නොමිදුනු නිසයි. ඒ නිසා ආධ්‍යාත්මික පැත්තෙන් අසුභ විදියට අර විදියටම බලනවා. බාහිරෙත් බලන කොට, පිළිකුල් කරන්න වෙන්නෙ බාහිර දේට වඩා, ඉස්සෙල්ලා ළඟම තියෙන දේයි එයාට ගොඩාක් අප්‍රසන්න වෙන්නෙ. මේ තමන් කියන තැන කළකිරෙන කොට කාගෙන්ද වැඩගන්නෙ. බාහිරෙන් කරන්න ඕන කියන එක නතර වෙන්නෙ ඉබේමයි. මේවගේ රූපයක් පරිහරණය කරනවට බනින්නම තමයි සුදුසු ගහන්නම තමයි සුදුසු කියන තැනකින් තමන්ට හිතන්න තරම් මනස හැදෙනවා. ඒ නිසා, ඒ විදියට විදර්ශනා කරන්න.

තව ඕකෙ ඕනෙ නම් පුළුවන් ඔය පින්වතුන්ට එක දෙයක් කරන්න. **ජීවිතේ හැමවෙලාවෙම පුළුවන් තරම් සිහියෙන් ඉන්න.** මේ ගොඩාක් ගැඹුරු දේවල් නෙවෙයි මම කියන්නෙ. අතට මොකක් හරි වදිනවනම් ඇඟට මොකක් හරි අහුවෙනවනම්, මේ අල්ලන හැම තැනකම, පඨවිය කියලා තීරණය කරන්න පුළුවන්නම්. දැන් මෙහෙම පෙනෙන

කොටම, අතට අහුවෙන කොට මේ කාය ස්පර්ශය සිහිකරගෙන, මේ පඨවි ධාතුවේ ස්පර්ශයක් නේද කියලා බලන්න. ඒකෙන් ලොකු කෙළෙසයක් ආවරණය කරනවා. මේ ඇහැට පෙනෙන දේ ඇල්ලුවා නෙවෙයි කියන එක කියනවා. කකුල අඩිය තියනකොට පඨවි කියලා හිතන්න, මේ පෙනෙන පොළවෙ අඩිය තිබ්බා නෙවෙයි කියන එක තේරෙනවා කාලයක් යනකොට පින්වතුන්ට. ඔය පින්වතුන් පෙනෙන දෙයට අඩිය තියලත් නැහැ. අඩිය තියන තැන පෙනිලත් නැහැ. ඔය පින්වතුන්ට කවදාවත් හිටපු තැනක මිම්මක්වත් හොයාගන්න බැරිවෙන්නෙ ඒ නිසයි. අද අපිට හිටපු තැනක මිම්ම සොයා ගන්න පුළුවන් වෙන්නෙ, අඩිය තිබ්බ තැන පෙනෙන කොට, පෙනෙන තැන අඩිය තියනකොට හිටපු තැන හොයාගන්න පුළුවන්. පින්වතුන්ට, මේ පෙනෙන තැන පඨවි ධාතුව කියලා තේරෙනකොට, පෙනෙන දේ ඇහැටයි පෙනෙන්නෙ හටගෙන නිරුද්ධ වෙනවා කියලා දැක්කොත්, පින්වතුන් අඩිය තියපු පඨවි ධාතුවේ නිමිති නැති වෙනවා.

ඒකයි ඒ රහතන් වහන්සේලා කියලා කියන්නෙ, ගිය තැනක අඩිය ඉතුරු කරලා එන්නෙ නැහැ. මාරයාගේ අඩි සළකුණු නැහැ. නමුත් අපි යන්නෙ වැල්ලෙ දුවනවා වගේ. වැල්ලෙ දුවනකොට අපි, ඉස්සරහට යන්නෙ පිටිපස්සෙන් එනකෙනාට අපි යන පාර හොයාගන්න පුළුවන් විදියට, අඩි සටහන් තියෙන විදියටනේ, අපි ගමන් කරන්නෙ. ජීවිතයේ සැබෑම අර්ථය තමයි මාරයට එන්න පුළුවන් විදියට අඩි සටහන් තිය තිය අපි යන්නෙ. නමුත් රහතන් වහන්සේලා කියන්නෙ ආකාසේ පියාසර කරන කුරුල්ලන්ගෙ පා සටහන් නැහැ වගේ, රහතන් වහන්සේලාගේත් පා සටහන් නැහැ. පා සටහන් නැහැ කියලා කියන කොට, මහ පොළවෙ අඩිය තියපු පා සටහන් ගැන නෙවෙයි මම මේ කියන්නෙ. ඒ මනසේ දැකපු දේවල් අහපු දේවල් කියලා නිමිති ඉතුරු වෙලා නැහැ. ගති ආගති නැහැ. හොඳට ඒක මතක තියාගන්න. ගති ආගති කියන්නෙ අහවල් තැන ඉඳන් ආවෙ, අහවල් තැනටයි යන්නෙ කියලා මිම් නැහැ. එහෙම ඒවා නැහැ. ගති ආගති ඇතිතාක් චුති උප්පත්ති දෙක නැති වෙන්නෙ නැහැ කියන එක මතක තියා ගන්න. ඒ කිව්වෙ, අහවල් තැන ඉඳන් ආවා අහවල් තැනටයි යන්නෙ, කොහුවල ඉඳන් මෙතෙන්ට ආවා කොහුවලටයි මෙතන ඉඳන් යන්නෙ, කියලා කියන්න පුළුවන් වෙන තාක්, වචනෙන් නෙවෙයි අපිට ඇත්තටම තියෙනවනම් කොහුවලත් මෙතනත්. වචනෙ නෙවෙයි, වචනෙන් කියන්න පුළුවන්. ඒ විදියට ඇති තාක් මතක තබා ගන්න, චුති ප්‍රතිසන්ධිය හිස් නැහැ. ඉපදීම මරණය දෙක හිස් නැහැ.

ගති ආගති අසති චුති උප්පත්ති. ගති ආගති නැත්නම්, ආපු තැනක් සහ ගිය තැනක් කියන්න බැරි නම්, ඒකෙ ලක්‍ෂණය තමයි ඉපදීම, මැරීම නැහැ එයාට, කියන තැන. අහවල් තැන ඉඳන් ආවහම මම මෙතන උපන්නා අහවල් තැන මැරුණා. කොහුවලින් මැරුණා, කොළඹින් උපන්නා, මෙහෙන් මැරෙනවා, එතනින් උපදිනවා. මේ චුති

උප්පත්තිය, ගති ආගති කියන්නෙ චුති උප්පත්තිය ඒ විදියටම සන්තති වශයෙනුත් ප්‍රතිසන්ධිය තියෙනවා.

ඉතින් මෙතනදි අතට අහුවෙන හැම එකක්ම පඨවි කියලා හිතන්න පුළුවන් නම්, ඊගාවට මෙහෙම ඇහැට පෙනෙන තැනක තියෙන්නෙ සතර මහාධාතුව නේද කියලා බලන්න පුළුවන් වුනොත්, ඒ කිව්වෙ කවදාවත් සතර මහාධාතුව පෙනෙන්නෙ නැහැ. නමුත් මෙහෙම පෙනෙන තැනක යටින් පෙනී හිටින්නෙ සතර මහාධාතුව නේද කියලා දකින්න ඕනෙ.

ඔය ස්කන්ධ වලට කියනවා 'මාර' කියලා. මාර කියලා කියන්නෙ. මරණය හෝ මරණ සමාන දුකකට අපිව දාන්න නිතරම මාරයගේ පැත්තට කටයුතු කරලා උදව් කරලා තියෙන්නෙ. මේ ස්කන්ධ ටිකක්, පංච උපාදානස්කන්ධයක්. ඒ නිසා මාර කියලා කියනවා. ඇයි මේ රූප, ශබ්ද,ගන්ධ, රස, පොට්ඨබ්බ කියන මේවා නැත්නම් රන්, රිදී, මුතු, මැණික් කියන මේ එක එක විදියට රූප පෙනී ඉඳලා අපිව අල්ලගන්න හදන්නෙ මොකටද, මේ පෙනෙන රූපයකට අපි තණ්හා කළොත්, අපේ සිත බැඳෙන්නෙ මහාභූතයන්ගේ. **මේ මහාභූතයන් විසින් අපිව සෘජුවම අල්ල ගන්න බැරි හින්දා එක එක විදියට අපිව මුලාවට පත් කරලා අල්ල ගන්න එවපු මාගීයක් වගේ තමයි මේ රූප ටික. මෙයා සෘජුවම එන්නෙ නැහැ.**

එතකොට අපි කියමු දැන් මට මොනවා හරි වැඩක් කරගන්න තියෙනවා ලාල් මහත්තයගෙන්. නමුත් එතුමාව මම හඳුනන්නෙ නැහැ. මම බලනවා එතුමගේ යාළුවෙක් ඉන්නවද කියලා. අඳුරන යාළුවට කතා කරලා කියනවා, මහත්තයා මට මෙහෙම වැඩක් කරගන්න තියෙනවා කියලා, ඒ යාළුවට කියලා එතුමගෙන් ඒ වැඩේ කරගන්නවා. ඒ යාළුවා තමයි එතුමට කියන්නෙ 'මේ වැඩේ කරලා දෙන්න' කියලා. අන්තිමට අර්ථ සිද්ධිය වෙලා තියෙන්නෙ කාටද, මට.

ඒ වගේ, මහාභූත ටික කෙළින්ම ඉදිරිපත් වෙලා නැහැ. මහාභූත ටිකෙන් මේ වගේ වර්‍ණ සටහනක් හදලා පෙන්නලා දීලා තියෙනවා. ඔය වර්‍ණ සටහනට තමයි අපි දුවා, පුතා, රන්, රිදී කැමති වෙලා තියෙන්නෙ. අන්තිමට යථාර්ථය සිද්ධ වෙලා තියෙන්නෙ, අපි කබලිංකාරාහාරයට විඤ්ඤාණය පිහිටියා කියන තැනකින්.

මොකද ඒ විදියෙ සටහන් ටිකක් හදලා හරියට වැද්දෝ, සත්තු අල්ල ගන්න බොරු වළවල් කපලා හැංගිලා ඉන්නවා වගේ, මහාභූත අපිව පටලවන්න මෙබඳු රූප ටිකක් හදලා හැංගිලයි ඉන්නෙ. මේ රූපයට අහුවුණොත්, වළට වැටුණොත්, මස් වැද්දටයි වාසි. ඒ වගේ මේ රූපයට අපි ඇලුනොත් බැඳුනොත් මහාභූත ටිකෙයි හිත බැඳෙන්නෙ අපේ. ඒ හින්දා ඔය පින්වතුන් හොඳට දකින්න, හතුරෙක් වදකයෙක් හැටියට

මේ රූප ටික වදක සංඥාවෙන් දකින්න, හතුරු සංඥාවෙන් දකින්න. හතුරෙක් හතුරෙකුට යමක් කරන්න කැමතිද ඒ විදියටම මේ රූප ටික අපිට අපේ අයහපත පිණිස ඉපදිලා නේද කියලා දකින්න.

ඔහොම නොබලන නිසයි අපිට වාසනාව ගෙන දෙන රූප මේ අතර තියෙන්නෙ, ඉතුරු වෙලා තියෙන්නෙ. ඇහෙන් බලන අපේ ජීවිතය සැපවත් කරන වාසනාව ගෙනත් දෙන සතුටු වෙන්න පුළුවන් රූප අපි ගාව, අපිට තියෙනවා කියලනේ හිතෙන්නෙ. නමුත් හැම රූපයක්ම (අපි එයාගෙ වදක ගතිය නොදකින නිසයි) මේ වදක බවයි, කියලා දකින්න.

බොහොම ප්‍රියවූ මනාපවූ ආදරණීයවූ දරුවා, බිරිඳ, අම්මා, තාත්තා, රන්රිදී, මුතු මැණික් කියලා බොහොම ආසාවෙන් අපේ ජීවිතයට ලං වෙලා තියෙන රූප ගන්න, යටින් තියෙන්නෙ වදක ජීවිතයක්. මේ රූප කියලා කියන්නෙ යම් දවසක තමන්ව මරණ හෝ මරණ හා සමාන දුකකට පමුණුවන රූපයක්. වදකවූ රූපයක් මේ තියෙන්නෙ. ඒත් වදක බව අපි දන්නෙ නැති කමයි මේ තියෙන්නෙ. කවදාම හරි දවසක, හුස්ම පොදවත් හෙළා ගන්න බැරිව හිරකරලා, වතුර උගුරක් පොවාගන්න බැරි තරමට පත් කරලා, තමන්ගෙ මල මුත්‍රා ගොඩේ තමන්ව වට්ටලා පිළිකා හොරි කුෂ්ඨ දද හදවලා, නින්දා අපහස කරන තත්වෙට පත්කරලා දුක් විඳින තත්වෙට පත් කරලා, මරණ විදියෙ රූපයක් තියෙන දුක් විඳවලා මරණවනම්, එබඳුනු රූපමයි මේ අද තියෙන්නෙ. අද මේ මගෙ දරුවා හැටියට පෙනී හිටින, බිරින්දෑ හැටියට පෙනී හිටින, රත්තරං හැටියට පෙනී හිටින, රිදී හැටියට පෙනී හිටින, රූප යම් දවසකදි මාව යම් විදියකට මරයිද ඒ වදක රූපමයි මේ තියෙන්නෙ. තාම වදක බව අපි නොදන්නවා.

ඔය මහාභූත සහ උපාදාය රූපවල වෙනසක් නැහැ. ඔය රූපයකින්මයි අපේ ජීවිතයත් චුත වෙන්නෙ. ඔය රූපෙක තියෙන විපරිණාම බවෙන්මයි අපේ ජීවිතයක් ක්ෂය වෙන්නෙ.

ඉතින් සැරියුත් මහ රහතන් වහන්සේ දේශනා කරන්නෙ, ඒ වගේ මේ ලෝකයා දුක්වූ, පංච උපාදානස්කන්ධය දුකයි කියලා නොදන්න, වදක චිත්තයමයි මේ ස්කන්ධ ටිකේ තියෙන්නෙ. කවදාවත් එයා කීකරු වුණේ නැහැ. ඒ නිසා ඔය පින්වතුන්ට මොන තරම් ප්‍රියමනාපව ලස්සනට පෙනුනත්, පින්වතුන්ට පුළුවන් නම් නුවණ අරගෙන යන්න මරණය දක්වා, දහමක යෙදෙන්න නොදී මරණය දක්වා අපිව අරගෙන යන්න එක එක විදියට පෙනී හිටලා රවට්ටන්න ආපු වදකයෝ ටිකක් හැටියට මේ රූප දිහා බලන්න. මේ රූපවලට එක එක විදියට හිත තඩලා එක එක විදියට අපි රැවටෙනවා නම්, අපි රූපෙන් මිදිලා රූපෙන් පලායන්න තියෙන ගමන් මග නතර කරලා මැරෙණ තැන දක්වාම අපිව

අරගෙන යන්න පුළුවන්. ඒකටයි මේ උපාය. ඒ වගේ කෘත්‍යයක් මේ රූපෙන් කරලා තියෙනවා කියලා මතක තියාගන්න.

ඔය විදියට හෝ හිතන්න පුළුවන් නම්, ඔය පින්වතුන්ට මේ රූප රාගය, රූපයන්ගේ වටිනාකම අඩු වෙනවා. ඔය විදර්ශනාව කියලා, භාවනාව කියලා ජීවිතයේ කොටුවෙන්න එපා, තවත් ටැංකියකට බහින්න එපා. ටැංකි සහගත ජීවිතයෙන් එළියට යන්නයි මේ දහම තියෙන්නෙ, මනස තියෙන්නෙ. ඉතාමත් නිදහස්ව, ඉතාමත් සැහැල්ලුවෙන්, මේ ජීවිතය බොහොම ප්‍රිය මනාපව සමනළ තට්ටක් වගේ, ඉන්න ඉන්න තැන හැසිරෙන්න පුළුවන්ද පරිසරයක් සකසලා දෙන එකටයි කියන්නෙ, භාවනාව කියලා. එයා දක්ෂයි ඒ විදියට ඕන ඕන තැනට මනස හසුරුවා ගන්න. ටවුන් (town) එකක් මැද්දෙ යද්දි නැත්නම් බොහොම ලස්සන රූප තියෙන තැනක ක්ෂණිකව මෙයා නුවණ ඉදිරිපත් කර ගත්තා. මේ විදියෙ සංඥාවන්ගෙන් එයා බේරිලා.

එහෙම නැතුව භාවනා කරනවා අපි නිවන් දකින්න කටයුතු කරනවා කියලා, තවත් ටැංකියකට බැහැ ගන්න එපා, ඒක හරිම අපහසුවක් වෙයි. ඒ නිසා දුක්ඛ සංඥාවෙන් හෝ වදක සංඥාවෙන් හෝ ධාතු වශයෙන් හෝ කුමන ආකාරයකට මනස රැකගන්න, අලුතෙන් නීවරණ ධර්ම නොඑන විදියට. ඔය විදියෙ ඇත්ත දකින මට්ටමක් තබා ගන්න. ඕක තමයි ඔය පින්වතුන්ගෙ විදර්ශනාව.

ලෝකයා ප්‍රියමනාපයි, ලස්සනයි කියලා දකින අරමුණු වල, ලෝකයාට වඩා ඇත්ත ඇති හැටියෙ විශේෂණයකින් දකිනවා විදර්ශනාවෙන්. කොහොමද වදක සංඥාවෙන් දකිනවා. වදකයෙක් කියලා. මේ තමයි එයාගෙ විදර්ශනාව.

ඒ විදියට බලනවා, විවේක තියෙන වෙලාවට එක තැනක ඉඳගෙන ඔන්න චිත්ත සමථය ඇති වෙන්න, නීවරණ ධර්ම අඩුවෙන්න භාවනා කමටහනක් ගන්නවා. එක තැනක ඉඳගෙන කරන්න එපා කියන එක නෙවෙයි. ඒක ඇත්තටම හිත වේගවත්. එක තැනක ඉඳගෙන කරන කමටහන හිත වැඩෙන්නයි වැඩි පහසු කමක් තියෙන්නෙ, නුවණ වැඩෙන එකට සීමාවක් නැහැ. ඉඳගෙන, හිටගෙන, නිදාගෙන, ඇවිදින ඕනම වෙලාවක නුවණ වැඩෙන කමටහනක යෙදෙන්න එකසේ පහසු. හිත වැඩෙන කටමහන් වලදි නම් වර්ගීකරණය කරගත යුතුයි. ඇවිදීම පරිහරණය කරන අවස්ථාවේදි හිත වැඩෙන වේගයට වඩා වැඩි සීඝ්‍රතාවයක් හිත වැඩෙන්න වැඩි ප්‍රවනතාවයක් තියෙනවා, එක විදියකට ඉඳගෙන හිත වැඩෙන කමටහනක් කරන කොට. ඒ නිසා එහෙම කළ යුතුයි. එහෙම කරනවා සීලයක පිහිටලා.

මේ ටික මෙහෙම කරන කොට මේ ටිකේ ප්‍රතිඵලය තමයි අර කියපු විදියට ඇත්තටම අපි හිතින් වටලලා හාත්පස අරගෙන කළොත් මේ එකතැන පල්වෙන්නෙ නැහැ. අපි බණ අහනවා අහනවා කියනවා. එක තැනක පල් වෙන්නෙ ඇයි අපේ ජීවිතය? බණේ වරදක් නෙවෙයි. ඒක අපේ ජීවිතයට ප්‍රායෝගිකව යොදා නොගන්න නිසයි. යොදා නොගන්නෙ අපි ඒක ඉගෙන ගෙන නැහැ. අපි දන්නෙ භාවනාවක් කියලා තව ටැංකියකට බහින්න විතරයි.

නමුත් එහෙම නෙවෙයි, මේ විදියට ඔය පින්වතුන් මනසින් විදර්ශනාව දකින්න, දහම තුළින්. ඒ ඒ තැනට අමුතුවෙන් ක්‍රම උපායන් හදාගන්න, ඇලෙන්නෙ ගැටෙන්නෙ නැතුව සාමාන්‍ය ලෝකයාගේ මනසටත් වඩා විශේෂණයකින් යුක්ත, ඕන මනසිකාරයකින් හදා ගන්න ජීවිතය. මම කියලා දෙනවා වචන ටිකක් ඒක සම්මත රටාවකට මගෙ වචන ටිකට විතරක් කොටු වෙන්න එපා. ඒක එක දැක්මක් විතරයි. ඒ වගේ කියලා ගන්න. එතනින් උපදින අර්ථය බඳු අර්ථයක් උපදින විදියට ඕන විදියෙ මනසිකාරයක් කරන විදියට. කෙනා කෙනා තමයි දන්නෙ, මට මේ විදියට පහසු මේ විදියෙ මනසිකාරයකින් තමයි මට කරන්න පුළුවන් කියලා. ඒ විදියට හිතාගන්න පුළුවන්, හදාගන්න පුළුවන්.

දැනට වැඩ කටයුතු කරන අවස්ථාවක ප්‍රමාද වෙන්න පුළුවන්. නමුත් එතනින් නිදහස් වුණු හැටියෙ, දැනට තියෙන්නෙ මතක් කර කර අමතක වුණු කාලෙදි අවරෙ ගිය ටිකත් අතහැරෙන්නත් එක්කම මතක් කරගෙන අනිත් විදියට ගන්න.

අපි තවම දක්ෂ මදි නිසා රාජකාරි කරන වෙලාවෙදි අපිට මතක් නොවෙන්න පුළුවන්. නමුත් වාහනයට නගින වෙලාවෙදිත් අපිට පුළුවන් නම් පැයක් හරි වාහනයක යද්දි මේක හිතන්න, ඔහොම කරනකොට රාජකාරි කරන මට්ටමේදිත් මේ නුවණින් යුක්තව කරන මට්ටමකට එනවා. ඔන්න ඔය මට්ටමට ආවහම නීවරන ධර්ම දුරු වෙනවා.

ඔය ටික කරන ගමන් මම කිව්වනෙ, කල්‍යාණ මිත්‍ර ඇසුරෙන් සද්ධර්ම ශ්‍රවනයෙන් උපාදාය රූප සහ මහාභූත කියන්නෙ මොකක්ද, කියලා දැනගෙන අහිංසකව හෙමින් හෙමින් ඒක තේරුම් ගන්න උත්සහවත් වෙන්න කියලා. මෙහෙන් මේ ටික කරන කොට ඔය පැත්තෙනුත් ඔය ටික ටික ටික ටික තමන්ටම දැනුම් එනවා. ආවහම නීවරණ ධර්ම දුරුවෙනකොට මේ ඉගෙන ගත්ත ටික දකින දවසක් එනවා.

ඒ දකිනකොට තමන්ට යන එන මං නැති වෙනවා. යන එන මං නැති වෙනවා කියලා කිව්වෙ, 'අහවල් තැන ඉඳලා අහවල් තැනට ගියා, අහවල් තැන ඉඳලා අහවල් තැනට ආවා' කියලා මිම් නැහැ. ලෝකෙ කිසිවකට මනින්න විදියෙ කයක් ඉතිරි වෙන්නෙ නැහැ. හැම රූපයක්ම මහාභූතයි සහ උපාදායයි කියලා තමන්ම දන්නවා තමන්ම

දකිනවා. ඒ මහාභූත සහ උපාදාය රූප හේතු ප්‍රත්‍යයි. ඒ අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර කියන හේතුව නිසයි කියලා දන්නවා.

ඒ නිසා කෙනෙක්ද නෙවෙයි, කෙනෙක්ගෙද නෙවෙයි. කෙනෙක් හදපුවද නෙවෙයි. දෙවියෙක් මැව්වා හෝ බ්‍රහ්මයෙක් මැව්වා හෝ ඊශ්වරයෙක් මැව්වා හෝ නෙවෙයි, හේතු ප්‍රත්‍යයි. ඒ නිසා කරන්නෙක් හෝ කරවන්නෙකුත් නැති, වන්නෙක් හෝ වුවෙකුත් නැති, අනාත්ම වූ ධර්ම ධාතුවක් දකියි. මෙන්න මේ ටික දකින කොට අහංකාර මමංකාර කියන මාන අනුසයම දුරුවෙනවා ඔය දර්ශනයට. මත්තේ කළයුත්තක් නැහැ කියලා දන්නවා.

මත්තේ කටයුත්තක් නැහැ, මම මගෙ කියන අහංකාර මමංකාර කෙළෙසයන්ගෙන් මිදිලා, මගෙ කියන දැක්මකින් තොර, හේතුඵල දහම නැමැති නුවණකින් යුක්ත ස්කන්ධ පරිහරණයක් කරනවා.

මෙතනදි කියනවා රහතන් වහන්සේ සෝපදිශේෂ නිබ්බාන කියලා. සත්ව පුද්ගලභාවයෙන් එන, පංච උපාදානස්කන්ධයකින් එන දුක සම්පූර්ණ නිරුද්ධ වෙලා. ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ දෝමනස්ස, උපායාසයක් තියෙනවා නම් සත්වයො මැරිලා, සත්වයන්ගෙ ඉපදීම නිසා, සත්වයන් ලෙඩවීම නිසා, සත්වයන්ගේ මහළු බව නිසා, මරණය නිසා එන දුක් ටිකෙන් ඔක්කොගෙන්ම මිදිලා. හැබැයි ඒ ඒ ස්කන්ධයන්ගේ ජරා, මරණයක් තියෙයි. ඒ ටිකේ දුක විතරක්ම විදිනවා. ඒකට කිව්වා - ක්ලේශ පරිනිර්වාණය කියලා. රහතන් වහන්සේ කියලා.

පුරාණ කර්මයන්ගෙන් හට ගත්ත මේ ස්කන්ධ ටික පරිහරණය කරනවා. ඒකෙ ආයු සංතතියකුත් තියෙනවා. ඒ ආයුෂ ටිකත් ඉවරවෙනකොට මේ කය මුල් කරගෙන ජීවිතය මුල් කරගෙන වින්ඳ යම් දුක් ටිකක් තියෙනවනම් ඒ දුක්වූ ස්කන්ධ ටිකද නිරුද්ධ වෙනවා. ඒ නිසා අනුපාද පරිනිර්වාණයකුත් වෙනවා. ඒකට කියනවා අනුපාදිශේෂ නිබ්බාන කියලා.

ලෝකයා මරණය දකින තැන එයාට ඒකද උතුම් මංගල කාරණාවක්. එයා දුක නිරවශේෂයෙන්ම නිරුද්ධ කරපු තැනක, ජීවිතයේ උතුම්ම මංගල කාරණාව වුණේ මරණය කියන තැන. ලෝකයාට මරණය වුණා කියන තැන තමයි මෙයාට ජීවිතයේ උතුම්ම අවස්ථාව, යහපත ලැබෙන තැන. මහ විශාල යහපතක් කර ගත්තා, ගුරු බර බහා තැබුවා. වැඩි බර කොටස අයින් කරගත්තා, කෙළෙස් ටික නැති කිරීමෙන්. සියලුම ආකාරයන්ගෙන් භාග්‍යවන්ත වාසනාවන්තම දිනය උදා වෙන්නෙ ජීවිතය අතහැරපු දවසට. සියලුම දුක් නැති වෙනවා.

ඊකනේ අපි බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල සමරන්නෙ. ඉපදීම, බුදුවීම, පිරිනිවන්පෑම. ඉපදුණු නිසයි බුද්ධත්වයට පත්වෙන්න පුළුවන් වුණේ. බුද්ධත්වයට පත් වෙන්න පුළුවන් වුණු නිසයි, සියලු කෙළෙස් ටික නැති කරලා පංච උපාදානස්කන්ධ දුකින් මිදුණේ. පිරිනිවන් පෑවා කියන්නෙ, බුදුරජාණන් වහන්සේගේ ජීවිතයෙ බුදුරජාණන් වහන්සේට සාක්ෂාත් වුණු උතුම්ම මංගල කාරණාව.

අපේ මඟුල නෙවෙයි. බුදුරජාණන් වහන්සේගේ තෙමගුල. බුදුරජාණන්වහන්සේට මංගල අවස්ථා තුනක්. බුදුරජාණන් වහන්සේට ඉපදීමත් මංගල අවස්ථාවක් බුදුවීමත් මංගල අවස්ථාවක්. පිරිනිවන් පෑමත් මංගල අවස්ථාවක්. මොකද ගොඩාක් දෙනෙක් තර්ක කරනවා, වෙසක් එක කොහොමද හාමුදුරුවනේ අපිට තෙමඟුල වුණේ, අපිට මඟුල් කාරණාවක් වුණේ, බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන්පාපු එක අපිට, ලෝකයාට කොහොමද මංගල කාරණාවක් වුණේ, අපිට අවාසනාවක්නේ. බුදුරජාණන් වහන්සේ හිටියා නම් බණ ටිකක් හරි කියනවනේ කියලා.

මම කියන්නෙ මෙතනදි බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල සමරනවා මිසක අපේ තෙමඟුලක් නෙවෙයි මේ සමරන්නෙ කියලා, ඒක තේරුම් ගන්න කියලා. මොකද බුදුරජාණන් වහන්සේගේ ජීවිතයට යහපතක් උදාවුණු තැන. ඊකෙන් අපි අත්දැකීමක් ගන්නවා බුදුරජාණන් වහන්සේට යහපතක් උදාවුණු සිද්ධාන්ත තුනක් තියෙන මේ දවසෙ අපිටත් එහෙනම් යහපත උදාකරගන්න පුළුවන් නේද කියලා උත්සහවත් වෙන්න පුළුවන්. මම ඊකෙන් මතක් කළේ, කෙනෙක් මරණය කියන තැනක ජීවිතයේ යහපත්ම මංගල කාරණාව කරගන්න පුළුවන් අවස්ථාවට එනවා.

මේ බුද්ධෝත්පාද කාලයේ සද්ධර්මය තියෙන වටපිටාවක ඉපදුනේ, මෙබඳු විදියෙ බණ අහන්න අපිට ලැබුණේ ඇත්තටම අපිට පින තියෙන නිසයි. හේතු තියෙන නිසයි. ඒ නිසා එක කාරණාවක් පොඩ්ඩක් අපිට කරන්න වෙනවා. ලෝකයේ කිසිම කෙනෙක් ලෝකයාගෙ ආශිර්වාදය ඇතුව සසරින් මිදුනෙ නැහැ කියන එක මතක තියාගෙන ලෝකයට උදව් උපකාර කරන්න, යුතුකම් කරන්න. හැබැයි තමන් තුල ලෝකයාගේ වචනෙට අනුව වැටෙන්නෙ නැති දහම තුළින් ඍජු හැඟීමක් යථාර්ථ වශයෙන් තමන්ගෙ මනසෙ තියාගන්න, කියන කාරණාවත් මතක් කරන්න වෙනවා.

යම් අදහස් යම් තැන් තියෙන්න වෙනවා, ලෝකයේ බොහෝ දෙනෙක් මෙහෙම කියද්දි, 'නැහැ මම මෙහෙම කරනවා' කියන තැනකින් කටයුතු කරනවා, කරන්න ඕනෙ, කළ යුතුයි. එහෙම කෙනාටයි මේ මගේ යන්න පුළුවන් වෙන්නෙ කියන කාරණාවත් මතක තබා ගන්නට ඕනෙ.

ඕකෙන් මම මතක් කළේ නැහැ, ඔය පින්වතුන්ට ගෙදරින් එපා කියද්දිත් ගිහින් මහණ වෙන්න කියන එක නෙවෙයි. මම මේ කිව්වේ. ගෙදරින් සමහර විටෙක බණ අහන්න එපා කියලා යන්න එපා කියලා අකමැති වෙන්න පුළුවන්. නමුත් ගෙදර සමගිය කියන කාරණාවෙදි වුනත් එතනදි ඕනෑවට වඩා අපි කීකරු වියයුතු නැහැ. මොකද මම සසරට වැටුණා කියලා ගෙදර අය එන්නෙ නැහැ. මාව බේරගන්න. අපි උත්සහවත් වෙන්න ඕනෙ එයාවත් ගන්න. නැතිනම් ගෙදර සමගිය වෙනම තබා ගන්න. මේක මගෙ පෞද්ගලික ජීවිතේට පෞද්ගලික යහපතටයි කියලා කොන්ද ටිකක් කෙලින් තියාගන්නවා කියන තැනකින් ජීවිතේ රැකගන්න.

එතකොට නෝනා මහත්මිය දැහැමියි, මහත්මයා අදැහැමියි නම් නමුත් එතැනදි ටිකක් කියලා හරි කරලා හරි දැහැමි වෙන්න වෙනවා. එහෙම නැතිනම් අර ලෝකය තුළ ඕනෑවට වඩා කඩා වැටිලා මේ වටිනා අවස්ථාව අතහැර ගන්න එපා. ඒනිසා බොහොම නුවණින් කල්පනා කරලා ජීවිතය හදාගෙන මේ ජීවිතයේදීම මේ නුවණ හදාගන්න උත්සහවත් වෙන්න.

මේ සූත්‍රයට අනුව තව විස්තර කරන්න ගොඩාක් තියෙනවා. මේ වේදනාව, සංඥා, සංඛාර, විඤ්ඤාන කියන ටික ***නේතං මම නේසෝ හමස්මිං නමෙසෝ අත්තානි ඒවමේතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං***

මේවද මම නෙවෙයි, මගෙ නෙවෙයි, මගෙ ආත්මය නෙවෙයි කියලා ඇත්ත ඇති හැටියෙ දැක්ක යුතුයි කියලා පෙන්නුවා. ඊට පස්සෙ ඔය වේදනාව කියන එකක් ඔය වගේම එකොළස් පළක් තියෙනවා. සංඥාව, සංඛාරය, විඤ්ඤාණය කියන ඒවා මොනවද ඒවයේ එකොලොස් පළ මොනවද, ඒවයේ යථාභූත ස්වභාවය මොනවද කියලත් බලන්න වෙනවා. ඉතින් පසු කාලෙදි දවසක අපි මේ ටික කතා කරගන්න බලමු.

නමුත් අපි දන්නවා, **රූපය පිරිසිඳ දැක්කොත් අනාගාමී වුණ හැකියි. නාම ධර්ම පිරිසිඳ දැක්කොත් රහත් වෙන්න පුළුවන්.** රහත් වෙන තැනට තවම අඩු පාඩුවක් තියෙන්න පුළුවන්. නමුත් අනාගාමී වෙන තැනට රූපය පිරිසිඳ දකින තැනට අඩුවක් නැහැ. ඒ නිසා මේ ටික අපිට කියලා දුන්නෙ නැහැනෙ. හාමුදුරුවනෙ අඩුයිනෙ, කියලා මේ කරන එකට බාධාවක් වෙලා නැහැ. බාධාවක් නම් මම කොහොම හරි ඒ ටිකත් කියනවා.

ඒ නිසා මේකෙ මුළු දේම බැලුවොත් අඩුවක් වෙන්න පුළුවන්. පස්සෙ ඒ ටික ලැබෙයි. ලබාගන්නත් පින්වතුන්ට කල් තියෙනවා. දැන් මේ පෙන්නපු ටිකෙන් අප්‍රමාදි වෙන්න. ඊකට මේ කරන ටිකට මේ නොදන්නා කම හරස් වෙන්නෙ නැහැ. මේ නොදන්නා

කම තවම බාධාවක් නැහැ. බාධාවක් වෙන්නෙ ඒ මට්ටමේ දහමකට. මේ දහමට මේ මට්ටමට මේක බාධාවක් නෙවෙයි. ඒ නිසා මේ මට්ටමට ඕනෙ අර සීල, සමාධි, ප්‍රඥා කියන ත්‍රිශික්ෂාවේ පුළුවන් තරම් හොඳ උත්සහයෙන් කරන්න. හැම රූපයක්ම, එකොළොස් ආකාරයේ හැම රූපයක්ම මහාභූත සහ උපාදාය රූපයි කියන එක හිතේ කොනක තබාගෙන ඒකෙ අර්ථය තේරුම් ගන්න අභිංසකව උත්සහවත් වෙන්න. ටික ටික එකපාරට බැහැ.

මහාභූත ඇසුරු කරගෙන පවතින 'උපාදාය රූප'

මහාභූත රූප සහ උපාදාය රූප. උපාදාය කියලා කිව්වේ ඇසුරු කරගෙන පවතිනවා, නිසා පවතිනවා කියන අර්ථය.

චත්තාරොච-මහා භූතා, චතුංනඤ්ච මහා භූතානං උපාදාය රූපං එතකොට 'සතර මහාධාතූන්ගේ' උපාදාය රූප. සතර මහාධාතූව නිසා පවත්නා රූපය. සතර මහාධාතුව ඇසුරු කරගෙන පවතින රූපය. එතකොට ඒ රූපය කවදාවත් සතර මහාධාතුව එහෙම නෙවෙයි.

පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන ධර්මතා හතරට කියනවා මහාභූත කියලා. ඒ මහාභූත රූපය නිසා විද්‍යාමානයි. මහාභූත රූපයන්ගේ උපාදාය රූපය.

එතකොට හැම වෙලාවෙම උපාදාය රූප කියන කොට ඒ උපාදාය රූපය අපට හම්බ වෙන්නේ හිතත් එක්ක සම්බන්ධ වෙලාමයි. හිතේ සම්බන්ධයකින් තොරව උපාදාය රූපයක් නැහැ. අපි කිව්වේ අර අත උපමා කරගෙන, ඒ අත මොකක් වගේද දකින්න කිව්වේ? සතර මහා ධාතුව වගේ. එතකොට සතර මහාධාතුව තිබුණාට කවදාවත් සෙවනැල්ලක් වැටෙන්නේ නැහැනේ අනිත් වටපිටාවෙ උපකාරය නැතුව. ආලෝකය, ආලෝකය පතිත වෙන්න ඕනෙ කියන ධර්මතා වලට සාපේක්ෂව තමයි සතර මහාධාතුවේ සෙවනැල්ලක් පෙනෙන්නේ. ඒ වගේ මේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතර මහාධාතුව තියෙන තැනක ඇහැ, හිත වගේ ධර්මතාවයන්ගේ උපකාරයෙන් තමයි උපාදාය රූපයක් විද්‍යාමාන වෙන්නේ. එතකොට උපාදාය රූපය කියන එක සතර මහාධාතුව නිසා පෙනෙනවා, නමුත් සතර මහාධාතුව නෙවෙයි.

මේ උපාදාය රූපය කියන කොට ඇහැ-රූප, කන-ශබ්ද, නාසය-ගන්ධ, දිව-

රස, කය .. මෙතැනදි පොට්ඨබ්බ ධාතුව කියන එක උපාදාය රූපයක් නෙවෙයි, මහාභූතයි. හැම වෙලාවෙම සතර මහාධාතුව තියෙන තැනක අපිට පෙනෙන්නේ හිතට. දැන් ඔන්න අපිට ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්, කෙනෙකුට තර්කයක් කරන්න පුළුවන්, සතර මහා ධාතුව ගැන කතා නොකොට පෙනෙන්නේ හිතටයි කිව්වොත්, එහෙනම් අපිට යන්න පුළුවන්නේ, ඇඟේ හැප්පෙන්නේ නැහැනේ කියලා තර්කයක් ඉදිරිපත් කරන්න පුළුවන්. ඇයි පෙනෙන්නේ හිතට නම්, සතර මහාධාතුව ගැන කතා නොකොට අපි කතා කරන්න ගියොත් මේ පෙනෙන්නේ හිතටයි කියලා, ඉතින් හිතට නම් පෙනෙන්නේ, අපිට හැප්පෙන්න පුළුවන්ද පෙනෙන දේ? බැහැ.

මහා භූතයන් ගැන කතා නොකොට කෙනෙක් කතා කළොත් 'අපිට මේ ඉදිරියෙන් පෙනෙන දේ තියෙනවා නෙවෙයි, පෙනෙන්නේ හිතටයි' කියලා, කෙනෙකුට ප්‍රශ්නයක් අහන්න පුළුවන්, තර්කයක් නගන්න පුළුවන්, එහෙනම් අපිට හැප්පෙන්නේ නැතුව යන්න පුළුවන් වෙන්න ඕනෙ කියලා. ඇයි පෙනෙන දේ තියෙනවා නෙවෙයි. පෙනෙන්නේ හිතට නම්, පෙනෙන්නේ මෙහෙට (අභ්‍යන්තර), එහෙට (බාහිර) යන්න බැරිද? පුළුවන් වෙන්න ඕනෙ නේ.

නමුත් දැන් මේකට කාටවත් තර්ක කරන්න බැහැ. අපි කියන්නේ, කතා කරන්නේ මෙතැන ඇත්ත මේකයි. පවතින්නේ සතර මහාධාතුව, පෙනෙන්නේ හිතට. එහෙම තියෙන තැනක මෙහෙම පෙනෙනවා. **අපිට මෙහෙම පෙනුනට පෙනෙන දේ තියෙනවා නෙවෙයි, තියෙන්නේ සතර මහාධාතුව කියලයි අපි කියන්නේ. එතකොට අපි ගියොත් හැප්පෙනවා. හැප්පෙන්නේ සතර මහාධාතුවේ මිසක පෙනෙන දේහි නෙවෙයි. ඒකයි මේ කයට හැමවෙලාවෙම ගැටෙන්නේ පොට්ඨබ්බයමයි. යථාභූත ස්වභාවය.**

අපි කියමු, වැලි කැට තියෙන තැනක වැලි කන්දක් වගේ පෙනෙනවා. දැන් අපිට වැලි ගොඩක්, කන්දක් වගේ පෙනුනට තියෙන්නේ වැලි කැට. අපි ගියොත් දැන් පෙනෙන දේ හිතට තමයි. අපි ගියොත් වැලි ගොඩේ වැලි කන්දේ හැප්පෙන්නේ නැහැ. වැලි කැට ටිකේ හැප්පෙන්නේ. මොකද 'වැලි කැට' ටික තියෙන ටිකනේ. ඒ නිසයි යන්න බැරි.

යමක් පෙනී සිටින කොට අපි දැනගන්න ඕනේ, අපිට මේ සටහනක් පෙනෙනවා කියන එකෙන් කියනවා මහාභූත මෙතැන තියෙනවා, ඒ නිසා යන්න බැහැ මෙතැනින් එහාට කියන එක. අපිට යන්න බැරි පැකිලෙන්නේ, මහාභූත තියෙන නිසා. මේ සටහන අනුව බලලා බලා ගන්න ඕනේ මේ හැඩේ මෙහෙම තියෙනවා කියන කොට, මේ පෙනෙන දේ තියෙනවා කියලා නෙවෙයි, එයා ඒකෙන් දන්නේ. මෙහෙම පෙනෙනවා කියලා කියන්නේ 'මහාභූත රූපය මෙතැන තියෙනවා' කියන එකයි මේකෙන් කියන්නේ.

ඒ කියන්නේ කයට ගැටෙනවා නම් ගැටෙන්නේ කෙළින්ම මොකක්ද, තියෙන දේනෙ හැපෙන්නේ, තියෙන දේ හැපෙනවා. අපි යන්න ගියාට වැලි ගොඩ කියන එක අපේ හිතට පෙනුනට, අපිට පෙනෙන දේ නොතිබුණාට, යන්න ගියාට යන්න බැහැ, ඇයි? තියෙන දේ හැපෙනවා. මෙතැන තියෙන යමකුත් තියෙනවනේ. මොකක්ද තියෙන දේ? වැලි කැට ටික. ඒ වගේ පෙනෙන දේ හිතට තමයි, පෙනෙන දේ තියෙනවා නෙවෙයි. නමුත් යන්න ගියොත් හැපෙනවා. මොකේද? සතර මහාධාතුවේ. එතකොට ඒ නිසයි අපිට යන්න බැරි.

සතර මහාධාතුව ගැන කතා නොකොට කෙනෙක් ‘මේ පෙනෙන්නේ හිතටයි, පෙනෙන දේ තියෙනවා නෙවෙයි’ කියලා කිව්වොත් වැරදියි. තර්කයක් නගන්න පුළුවන් කාට හරි, එහෙනම් ‘අපිට යන්න පුළුවන්නෙ හැප්පෙන්නේ නැති වෙන්න’ කියලා නේද? ඇයි පෙනෙන්නේ හිතට නම් යන්න බැරිද? පුළුවන්. නමුත් මෙතැන අපි යථාභූත ස්වභාවයක් ගැන කියන්නේ, අපිට මෙහෙම පෙනුනට, අපිට මෙහෙම පෙනෙන තැනක අපිට නොපෙනෙන බවින් පෙනී සිටිනවා, මෙතැන තියෙනවා සැබෑවටම යමක්, මොකක්ද? ධාතුව. ඒ කියන්නේ අපිට ජලය වගේ පෙනුනට මෙතැන සැබෑවටම තියෙනවා යමක්, මොකක්ද මිරිඟු ස්වභාවය. නැත්නම් හැම තැනම ජලය වගේ පෙනෙන්න එපායැ. අපිට ජලය වගේ පෙනුනේ මිරිඟු ස්වභාවය නිසානේ. ඒ වගේ මහාභූත කියන කොට කවදාවත් අපිට මේ ඇහෙන් දකින්න බැහැ.

කයට ගැටෙන ස්පර්ශයෙන්ම මහාභූත ගත යුතුයි මිසක, මහාභූතයෝ ඇහෙන් දැකලා මහාභූත ස්වභාවය ගන්න බැහැ. කනෙන් අහලා, නාසයෙන් ආඝ්‍රහණය කරලා, දිවෙන් රස බලලා ගන්න බැහැ. ඒකයි ඒවා උපාදාය රූපයි කියලා කියන්නේ. ඒ ආයතන අරභයා අපට එන අත්දැකීම් මහාභූතයන් නිසාම හිතට ලැබෙන අත්දැකීම් මිසක මහාභූත නෙවෙයි. මේ හිතේ හැකියාවක්.

කර්මජ රූප කියලා කියන්නේ, මේ ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන මේවට කියනවා කර්මජ රූප කියලා. කර්මජ රූප කියලා කිව්වේ ඇයි? යම් යම් ආකාරයකට විපාක විඳින්න පුළුවන් වෙන විදිහේ, රූප හදලා දෙන්නේ අපිට මේ ආයතන ටිකෙන්. ඒ ආයතනය කියන විදියට තමයි අපිට රූප බලන්න වෙන්නේ. දැන් ඇහැ මෙහෙම හැදුණු නිසයි, ඇහැ කියලා අපිට හම්බ වෙන නිසයි, අපිට මහාභූත රූප වල මෙන්න මෙහෙම හැඩයක් පෙනෙන්නේ. දැන් මේ ඇහෙන් ධාතුව දිහා බලන කොට, මේ අවකාශ ධාතුවේ ඉතා චූටි රූප කලාප තියෙන්න පුළුවන්. අපිට මේක මේ ඇහැට පෙනෙනවද? පෙනෙන්නේ නැහැ. නමුත් සියුම් අන්වීක්ෂයකින් බැලුවොත් අපිට පෙනෙනවා.

ඒ වගේ දැන් මේ ඇහැ හරහා බැලුවහම අපිට මේ සතර මහාධාතුව තුළ මේ වගේ හැඩතල පෙනෙනවා. නමුත් මේ ඇහැ මීට වඩා සියුම් වුණොත් මේ පෙනෙන මට්ටම බොරු වෙනවා අපිට. මේ පෙනෙන දෙයිනුත් ඔබ්බෙ පෙනෙනවා අපිට. ඊට වඩා සියුම් දෙයක් අරමුණු කරන්න පුළුවන්. එතකොට ඒ මට්ටම අපිට ඇත්ත වෙනවා. තව ටිකක් හිත වැඩුනොත් ඊටත් ඔබ්බෙ යමක් පෙනෙනවා.

දැන් අපිට **මේ ඇහේ මට්ටමට මේ ලෝකය හම්බවෙලා තියෙන්නේ. අපිට පෙනෙන දේ විපාක විඳින්න වෙන විදිහට වටපිටාව සැකසිලා මිසක, මේ විදිහටම ලෝකය කියලා යමක් තියෙනවා, තියෙන එක අපිට පෙනෙනවා එහෙම නෙවෙයි.**

සතර මහාධාතුව තුළ නැහැ හැඩ තල. පඨවි ධාතුව තුළ දිග පඨවි ධාතු, රවුම් පඨවි ධාතු, හතරැස් පඨවි ධාතු කියලා එහෙම මොකුත් නැහැ. පඨවිය කියලා කියන්නේ තද ස්වභාවය. දිග, තද ස්වභාවය කියලා ගත්ත හැකිද? එහෙනම් හතරැස්, වටැස්, අටැස්, තද ස්වභාවය. එහෙනම් ගලන වැගිරෙන ස්වභාවය, බැහැ. සතර මහාධාතුවේ එහෙම නැහැ. එහෙම තියෙන තැනක අපේ හිතට ලැබෙන නිමිත්තක්, ඇහැ හරහා හිතට ලැබෙන නිමිත්තක් තමයි මේ දිග බව, හතරැස් බව, රවුම් බව, වට බව, නිල්, කහ කියලා අපට පෙනෙන්නේ. නමුත් බොහෝ කාලෙක ඉඳලා අපි ඉගෙන ගෙන නැහැ කවදාවත්, ධාතුව නිසා අපට පෙනෙනවා කියන එක. අපි ඉගෙන ගෙන තියෙන්නේම ‘පෙනෙන දේ මෙහෙ තියෙනවා’ කියලා.

චූටි වෙනසක් තියෙන්නේ, මේ ආශ්‍රවයන්ගේ වෙනසක් තියෙන්නේ. අපිට වැලි කැට ටිකක් තියෙන තැනක, නැත්නම් බාහිර ධාතුව තියෙන තැනක, ඇහැ උදව්කරගෙන අපිට පෙනෙනවා මෙහෙම හැඩයක්. **අපිට ධාතුව නිසා මෙහෙම පෙනුනට, පෙනෙන දේ ධාතුවේ තියෙනවා නෙවෙයි. ධාතුව නිසා පෙනෙන්න පුළුවන්. නමුත් පෙනෙන දේ ආපහු ධාතුවට අයිති නැහැ.** හේතුවක් නිසා ලැබෙන ඵලය ආපහු හේතුවට අයිති වෙන්නේ නැහැ කිසිම වෙලාවක.

නමුත් අපි සසරෙදි කවදාවත් ඉගෙන ගෙන නැහැ, බාහිරේ නිසා තමා තුළට එන සිද්ධියක් දකින්න. හුරුව තියෙන්නේම මෙහෙන් බාහිර දෙයක් බලන්නමයි. ආශ්‍රව කියලා කියන්නේ, ආශ්‍රවක්ෂය කියන්නේ කරුණු දෙකක්. මොකක්ද **බාහිර ධාතුව නිසා තමාට පෙනෙනවා, ඇහෙනවා කියන සිද්ධියක් වෙනවා කියලා දැක්කොත්, ලෝකයා කියලා බාහිරෙන් යමක් ඉතුරු වෙන්නේ නැහැ. ආශ්‍රව කියලා කියන්නේ තමන්ට බාහිර යමක් පෙනෙනවා, ඇහෙනවා නම්, මේක තමයි ආශ්‍රව කියන්නේ.** එතකොට ලෝකය බාහිර වෙනවා. ඉතින්

සසර සහ නිවන කියන ධර්මතා දෙක තියෙන්නේ ඔය මත.

අපි ගොඩාක් දේවල් අමාරුයි කිය කිය හිතුවට, කතා කළාට, මේ ප්‍රභේදය තියෙන්නේ, මොකක්ද? හැම වෙලාවෙම **අපිට 'බාහිරෙන් රූපයක් බලන්න' මට්ටමක් තියෙනවා නම් දකින්න මේ කර්මයි.** බාහිර ශබ්දයක් අහන මට්ටම කර්මයි. බාහිර ගඳ සුවඳ, තමන්ට බාහිර ආයතන එකක් හරි හම්බ වෙනවා නම්, බාහිර ආයතනයක් ගැන හිතන්න හෝ කියන්න හෝ කරන්න හෝ සිහිය යොමුකරගෙන හෝ ඉන්න හම්බ වෙනවා නම්, ඒ කියන්නේ ආශ්‍රව, කෙළෙස්. තමන්ට තේරෙනවා නම් බාහිරය නිසා තමන් තුළ පෙනීම්, ඇහීම් වෙනවා. ඇත්තටම අපිට පෙනෙනවා කියන සිද්ධිය එහෙ (බාහිර) තියෙනවා නම් හැමෝටම එක විදියටම පෙනෙන්න ඕනේ නේද? දැන් ඉඳිකටුවක් අරගෙන නූල දාන්න කිව්වොත් පුංචි ළමයෙකුට හොඳට පෙනෙනවා. ටිකක් තරුණ ළමයෙකුට තව මට්ටමකට පෙනෙනවා. වයසක කෙනෙකුට තව විදිහකට පෙනෙනවා. පෙනෙන දේ එහෙට (බාහිර) අයිතියි නම් ළමයට පෙනෙන මට්ටමම අපිටත් පෙනෙන්න එපායැ වැඩිහිටි කෙනාටත් පෙනෙන්න එපායැ. එක්කෙනෙකුට වැඩි වුණොත්, එක්කෙනෙකුට අඩු වුණොත් ඇයි? එහෙනම් ඇහැ හරහා පෙනීම තමන් තුළට ඇවිල්ලා හින්දා නේද මේ වෙනස?

දැන් පෙනෙන සිද්ධිය බාහිර සිද්ධියක් වුණානම්, පෙනීම සමාන වෙන්න ඕනෙ නේ. ඇයි තමන්ගේ සම්බන්ධයක් නැතුව බාහිර තියෙන දේනෙ පෙනෙන්නේ. පොඩි ළමයෙකුට ඉඳිකටුවට නූල ක්ෂණිකව දාන්න පුළුවන්. අවුරුදු හතලිහක්, පනහක් වුණ කෙනෙකුට පුළුවන්ද එහෙම? අමාරුයි. එයාට ඕනෙ වෙනවා අර පොඩි ළමයට පෙනෙන මට්ටමට මේ සිව්ය හදාගන්න. එක්කො කණ්නාඩියක්වත් දාගන්න වෙනවා නේද?

ඒකෙන් කියන්නේ මේ ඇහැ හරහා ආපු අත්දැකීම තුළින් තමන්ට තීරණයක් හම්බ වෙලා තියෙනවා මිසක, මේ ධාතුව, පෙනෙන මට්ටම වෙනස් කර ගන්න වෙනවා අපිට, කියන කාරණාවක් තියෙනවා නේද? මේ තියෙන ධාතුවම පෙනෙනවා නම්. කණ්නාඩි ඕනෙ වෙයිද? ඕනෙ නැහැ. මොකද ඇහේ ප්‍රශ්නයක් නැහැනේ. පෙනෙනවා කියන එක බාහිරේට අයිති එකක් නම්, බාහිර තියෙන එකක් නම් පෙනෙන්නේ, කණ්නාඩි දාන්න ඕනෙද? ඕනෙ නැහැ. එහෙනම් ඇහේ අනිත්‍යතාවයක් පෙනෙයිද? පෙනුනත් ප්‍රශ්නයක් නැහැ, ඇහෙන් වැඩක් නැහැනේ.

එතකොට ඇහැ උදව්වෙන් ලැබෙන අත්දැකීම නම් අපිට හම්බ වෙන්නේ, හොඳට බලන්න බාහිරේ නිසා පෙනීම් කෘත්‍යය ඇවිල්ලා තියෙන්නේ හිතටනේ. අපි මෙහෙම කිව්වොත් ඇහැට ඔබ්බෙන් රූපය තියෙන්නේ, රූපය ගාවට ඇහැ, ඇහැට ඔබ්බෙන් සිත. දැන් මේ හිතේ අත්දැකීමට බාහිර රූපය ඇහැ හරහා තමයි හිතට

ලැබෙන්නේ. එතකොට පෙනීම කියන එක මෙහෙට ඇතුලට ඇවිල්ලා තියෙනවා මිසක, දැන් පෙනුන දෙයින් එහාට (බාහිරයට) යන්න පුළුවන්ද? දැන් පෙනෙනවා කියන්නේ, අපි එහෙ (බාහිරය) බලනවා කියන්නේ මේ සිද්ධිය සම්පූර්ණම අපිට අත හැරිලා නෙවෙයිද?

ඒ කියන්නේ දැන් අපිට මෙහෙම බාහිර පෙනෙනවා කියලා බලනකොට, ඇහැ හම්බ වෙන්නේ නැහැ, මේ හිත හම්බ වෙන්නේ නැහැ, මේ ධාතුව හම්බ වෙන්නේ නැහැ. මේ මොකුත් හම්බ වෙන්නේ නැහැ. කෙළින්ම අපි නැඹුරු වෙලා ඉන්නේ, පය ගහලා ඉන්නේ මේ පෙනෙන දේට නැඹුරු වෙලා. **පෙනෙන දේට නැඹුරුවෙලා රූපයක් බැලුවොත් තියෙන ලක්ෂණය බලන්න කවදාවත් චිත්ත චෛතසික ටික අපිට හම්බ වෙන්නේ නැහැ. පෙනෙන්නේ මෙහෙ (අභ්‍යන්තරයෙන්) කියලා හම්බ වෙන්නේ** නැහැ. අපිට රූපයක් පෙනෙනවා කියන තැනක කාටද චිත්ත චෛතසික ටික හම්බ වෙන්නේ. හම්බ වෙන්නේ නැහැ.

උපාදාය රූපය කියලා කියන්නේ හැම වෙලාවෙම, සතර මහාධාතුව නිසා, සතර මහාධාතුවත්, හිතට පෙනෙන නාමධර්මත් දෙකම එකක් කරලා හිතින් හදාගත්ත මට්ටමක් මේ තියෙන්නේ. හිතට පෙනෙන මට්ටම. ඒ කියන්නේ අපි රූපයක් කියලා හිතාගෙන ඉන්න තැනද තියෙන්නේ, යථා ස්වභාවයට ගත්තොත් සතර මහාධාතුව නිසා පෙනෙන සංඥා මාත්‍රයක්. නමුත් අපි ඒ අවස්ථාව පහුකරලා මෙහෙම (බාහිරය) බලලා මේ තියෙන්නේ.

උපාදාය රූපය කියලා එකක් හම්බ වෙන තැනක, ස්කන්ධ පහක් වැයවෙලයි මේ රූපය කියන එක අපිට හම්බ වෙන්නේ. **අපි රූපය බලනවා කියන තැනක, ලෝකයේ රූපය බලනවා කියන සිද්ධියට ස්කන්ධ පහක් වැය වෙලයි මේ රූපය කියන එක පෙනෙන්නෙ. අපිට ලෝකයා රූපය බලනවා කියන තැන තියෙන ස්කන්ධ පහ බැලුවොත් රූපයෙන් අත හැරෙනවා. එහෙමයි තියෙන්නේ.** ඒ කියන්නේ දැන් කෙනෙකුට මෙහෙම රූපයක් පෙනෙන කොට, මෙතැන තියෙන ඇත්ත සිද්ධිය තමයි සතර මහාධාතුවත්, ඒ ධාතුව නිසා හිතෙන් අරමුණ විඳලා, හිතෙන් හඳුනලා, ඒ හඳුනපු දේට හිතලා, දැනගන්නවා කියන සිද්ධි ටිකක් හිතේ වෙලා. මේ ධර්මතා පහ තියෙන තැන, ඕක නොදන්නා කම නිසා පෙනෙන දේ එහෙ (බාහිර) තියෙන්නේ කියලා ආපහු මේ නැඹුරු වෙලා ඉන්නේ අපි. අපි එහෙම හිතුවා කියලා ස්කන්ධ පංචකය වෙනස් වෙලා නැහැ.

අපිට එක රූපයක් හම්බ වෙන තැනක, මිරිඟුව කියලා මිරිඟු ස්වභාවය දකින්න සතර මහාධාතුව වගේ. ඒ නිසා ජලය වගේ පෙනෙනවා කියන ටික දකින්න චෛතසික - විඳිනවා, හඳුනනවා, කල්පනා කරනවා කියන ටික දකින්න, ජලය වගේ පෙනෙන්නේ හිතට අපිට. හිතේ පහළවෙන සංඥා. දැන් මේ රූපයයි නාමයයි දෙකම උදව්කරගෙන තමයි

කෙනෙකුට, තිරිසන්ගත සතාට බාහිරෙන් රූපය කියලා එකක් හම්බ වෙන්නේ. එයා මෙහෙම බැලුවට, එක රූපයක් දැක්කට, මෙතැන නාම - රූප කියන ධර්මතා දෙකක් තමයි, නාම-රූප කියන ධර්මතා දෙක තමයි රූපය හැටියට අරමුණු කරගෙන තියෙන්නේ. නමුත් මෙයා මේ 'රූපය නිසා පහළ වුණු නාම ධර්ම, නාම-රූප දෙකක් කියලා අවබෝධ කළොත්, 'බාහිර ජලය' කියන රූපයෙන් මිදෙනවා. අපි මෙහෙම රූපය කියලා, අරමුණු කරන තැනක නාම-රූප ධර්මතා දෙකක් තියෙන්නේ.

ඒ නාම-රූප කියන ධර්මතා දෙක දැක්කොත් අපිව මේ රූපයෙන් අත හැරෙනවා. ඔය සිද්ධියයි මේ හැම වෙලාවෙම මතක් කරන්නේ.

ඉමස්මිං සති ඉදං හෝති-ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති කියලා කියන්නේ, අවිද්‍යාව තිබුණොත් ලෝකයට, මේ පෙනෙන අරමුණු රූපයක් හැටියටමයි හම්බ වෙන්නේ. ඒ කියන්නේ, **එහෙන් (බාහිරව) වර්ණ රූපයක් තියෙනවා කියලයි හම්බ වෙන්නේ. එහෙම හම්බ වෙන්නේ නිකම් නෙවෙයි, ධර්මතා දෙකක් නිසා. ස්කන්ධ ටිකයි, අවිද්‍යාවයි කියන ධර්මතා දෙකෙන්. අවිද්‍යාවට ආපහු ඒ ස්කන්ධ ටිකමයි වැරදියට පෙන්වන්නේ. ඒකයි මේක අපිට ලෙහා ගන්න බැරි.** ඇත්තටම පවතින්නෙත් ස්කන්ධ ටික, අවිද්‍යාව මිශ්‍ර වෙලා වැරද්දක් පෙන්වන්නෙත් ඒ ස්කන්ධ ටිකෙන්මයි.

අපි අර වෙනදා කතා කරන උපමාව තියෙන්නේ, ඈත පඹයෙක් ඉන්නවා නම්, දැන් පඹයා කියන තැන දකින්න ඇත්තටම තියෙන සිද්ධිය. මොකක්ද ඇත්තම සිද්ධිය, ඔන්න මුට්ටි කෑල්ලක් තියෙනවා, කෝටු කෑලි ටිකක් එල්ලලා තියෙනවා, කමිසයක් අන්දලා තියෙනවා, කලිසමක් අන්දලා තියෙනවා, ඔන්න ඔය කෑලි ටික තියෙනවා දැන්. සත්ව පුද්ගල නොවූ කෑලි ටිකක් තියෙනවා. දැන් ඔය කෑලි ටික තියෙන තැනක අපිට ඒ අරමුණ පිරිසිඳ නොදන්නාකම නිසා, පඹයා වූ තැන පඹයා බව නොදන්නා කම නිසා, මනුස්සයා කියලා අපි දකිනවා. දැන් හොඳට බලන්න මනුස්සයා කියලා අපි දකින්නෙම ආපහු අර පඹයා වූ තැනමයි. හැබැයි මනුස්සයා කියලා දකින කොට දැන් කාරණා දෙකක් තියෙනවා. ඇත්තටම තියෙන ස්කන්ධ ටිකත්, නොදන්නා කම කියන කෙලෙසයත් දෙකම එකතු වෙලායි අපිට පඹයා පෙනෙන්නේ.

දැන් පඹයා තියෙන තැනක මනුස්සයෙක් පෙනෙන්නේ කොහොමද? පඹයා වූ තැන පඹයා හැටියට දැක්කොත් මනුස්සයෙක් ඉන්නවද? නැහැ. පඹයා නැතුව අවිද්‍යාව විතරක් තිබුණොත් මනුස්සයෙක් ඉන්නවද? නැහැ. අවිද්‍යාවට පතිත වෙන්න තැනක් තියෙන්න එපායැ නේද? අවිද්‍යාවයි ඇත්තටම පවතින ස්කන්ධ ටිකයි දෙකම එකතු වෙලා නේද අපිට මනුස්සයෙක් හැටියට පෙනෙන්නේ. ඔන්න දැන් අපිට මනුස්සයෙක් හැටියට

පෙනෙන තැනක, ඇත්තටම පවතින ටික කියන්න ගියොත් මොකද වෙන්නේ? මෙතන තියෙන්නේ පඹයා, මේ පඹයා නොදන්නාකම නිසා මනුස්සයා කියන අදහසක් ඇති වෙනවා. දැන් මනුස්සයා කියන අදහස නැති කරන්න නම් කොහොමද වෙන්නේ. ඇත්තටම තියෙන ස්කන්ධ ටිකත් කෙළෙස් ටිකත් දෙකම නිසා නම් අපිට මනුස්සයා කියන අදහස ඇති වෙලා තියෙන්නේ, ඇත්තටම තියෙන ස්කන්ධ ටික නැති කරන්න අපිට බැහැනේ, ජීවිතය තියෙනකල්. නමුත් අපිට කෙලේසය නැති කරන්න පුළුවන්නේ.

අපි මොකද කරන්නේ පඹයා කියන තැන, පඹයා බව පිරිසිඳ දකිනවා. පිරිසිඳ දකිනකොට, නොදැකීම කියන කෙලේසය අත හැරෙනවා. එතකොට මනුස්සයා කියන අදහස නැති වෙනවා. ඇයි, මනුස්සයා කියන අදහස ඇති වුණේ ධර්මතා දෙකක උපකාරයෙන්. තනියම ඇති වෙන්නේ නැහැ. අවිද්‍යාව කියන කෙලේසය තනියම තිබිලා මනුස්සයා ඇති වෙනවද? නැහැ. අවිද්‍යාව නැතුව පඹයා විතරක් තිබුණොත් ඇති වෙනවද? නැහැ. මේ දෙන්නා නිසාම නම්, ස්කන්ධයි කෙළෙසුයි කියන දෙන්නා නිසාම නම් අපිට මනුස්සයා කියන අදහස ඇතිවුණේ, මේ දෙන්නම හෝ දෙන්නගෙන් එක් කෙනෙක් හෝ නැති වුණොත් මේ දෙන්නා නිසා ඇති වුණ එක නැති වෙනවනේ. ඒ හින්දා දැන් පඹයා කියන එක අපිට නැති කරන්න බැහැනේ. අපි නැති කරනවා කෙලේසෙ, මොකක්ද? පඹයා බව නොදැකීම කියන කෙලේසය, නැති කරනවා. පඹයා, පඹයා බව දකිනවා අපි. ඔන්න ඒ දැකපු නිසා ස්කන්ධ ටික තිබුණට ස්කන්ධයි කෙළෙසුයි දෙන්නම උදව් වෙලා ඇති වුණු මේ ස්කන්ධය ඇති වෙන්නේ නැහැ දැන්. මනුස්සයා කියන අදහස අපිට ඇති වෙන්නේ නැහැ. ඒ මනුස්සයා කියන අදහස අපිට ඇති වුණේ පඹයා කියලා කියන තැනම ඇත්ත නොදැකීම, කියන කෙලේසයක් උදව් කරගෙන. දැන් මනුස්සයා කියන අදහස නැති වුණොත් පඹයා කියන තැනමයි, ඇත්ත දැකලා.

ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ මේ තණ්හාව උපදින්නේ කොහෙද, පවතින්නේ කොහෙද, ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය. තණ්හාව නැති වෙන්න ඕනේ කොහෙද, ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය ඕකෙමයි නැති වෙන්නත් ඕනේ.

ඒ වගේ දැන් අපිට පඹයා වූ තැන වගේ, සැබෑවටම තියෙන සතර මහා ධාතුවත්, එබඳු රූපයක් ඇස් හමුවට ආවම සිතින් විඳින්න පුළුවන්, හඳුනන්න පුළුවන් කියන ගති ටිකත් කියන ස්කන්ධ ටිකත් මුල්වෙලා, මේ ටික නොදන්නා කම කියන කෙලේසයත් මුල්වෙලා මේ දෙකම එකතු වෙලා තමයි එහෙන් (බාහිරව) රූපයක් පෙනෙන්නේ. බාහිර ස්කන්ධ ටික මෙහෙම හැදෙනවා. දැක්කත් නැතත් වෙනවා. ඔය ටිකත් ඕනේ. ඔය ටික නොදන්නා කමත් ඕනේ. ඒ දෙකේම කෘත්‍යය තමයි මොකක්ද? මනුස්සයෙක් පෙනෙනවා වගේ මේ කෙනෙක් පෙනෙනවා. නැත්නම් මේ ඉදිරියෙන් යමක්

පෙනෙනවා අපිට, කියන තැන නිර්මාණය වෙලා.

දැන් අපිට මේ ධාතුව දිහා බැලුවහම ස්කන්ධ ටික පහළ වෙන එක නැති කරන්න පුළුවන්ද ජීවිතය තියෙන කල්, බැහැ. දැන් අපිට පුළුවන් නොදන්නා කම නැති කරන්න. මොකක්ද නොදන්නාකම? මේ ස්කන්ධ ටික ස්කන්ධ ටිකක් හැටියට දකිනවා. දැක්කහම වෙනවා මොකක්ද? මේ ස්කන්ධ ටිකත් නොදැකීමත් නිසා (බාහිරය) මෙහෙම බලන සිද්ධිය අත හැරෙනවා අපිට. තේරෙනවද? **ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ, ජීවත්ව ඉන්නකොට අපිට කරන්න තියෙන්නේ මොකක්ද කෙළෙස් නැති කරන එක විතරයි. ස්කන්ධ නැති කරන්න බැහැ. ක්ලේෂ පරිනිර්වාණයක් කරන්න පුළුවන් කියලා කිව්වේ. මොකද රහතන්වහන්සේ නමකට වුණත් රහත්වුණත් සතර මහාධාතුව තියෙන තැනක මෙහෙම හැඩතල පෙනෙනවා. ඒකෙ දෝෂයක් නැහැ. නමුත් ඒ සිද්ධිය දන්න නිසා, ඒ ඇත්ත දකින නිසා. අවිද්‍යාව නැති නිසා, කෙළෙස් නැති නිසා, මෙහෙම බලන එක නැහැ.** පඹයා වූ තැන පඹයා බව පෙනෙනවා හැමෝටම. අවිද්‍යාව, පඹයා බව නොදන්නා කම තිබ්බොත් තමයි මනුස්සයා කියලා මෙහෙම බලන්නේ. මනුස්සයා කියලා බලන බව ඇතිවෙලා තියෙන්නේ පඹයයි, කෙළෙසයයි කියන ධර්මතා දෙකෙන්. ඒකෙන් ඇත්ත ඇති සැටියෙ, පඹයා වූ තැන පඹයා බව දැක්කම, මනුස්සයා කියලා බලන ගතිය නැති වෙනවා.

හැම වෙලාවෙම, ලෝකයේ උපාදාය රූප කියලා කියන්නේ, මහාභූතයන් නිසා පෙනෙන රූප කියලා කියන්නේ, මෙන්න මෙතැනදි ගන්න **යථාභූත ස්වභාවය තමයි සතර මහාධාතුවත්, ඒ සතර මහාධාතුව නිසා හිතට පහළවෙන වේදනා, සංඥා, සංඛාර, කියන නාම ධර්ම ටිකත් තියෙන්නේ. මේ ධර්මතා දෙක නොදන්නා කෙනාට මේ හිතේ තියෙන ගති ටික පෙනෙන්නේ රූපයක් හැටියට.** එතකොට සතර මහා ධාතුව නිසා පහළ වුණු නාම ධර්ම ටික, ධාතුව නිසා මෙහෙමනේ පෙනුනේ. ඒ පෙනෙන සිද්ධියේම, එයා බලන්නේ දැන් අවිද්‍යාව නිසා එහෙ (බාහිර) කියලානේ. පෙනෙන දේ උපාදාය රූපය කියලා, උපාදාය කියලා කියන්නේ මහාභූතයන් නිසා පෙනෙන රූපය කියලා ලෝකයාට හම්බ වෙන තැනක, අපිට මෙහෙම දකින තැන ගත්තහම, ඔතන යථා ස්වභාවය ගවේෂණය කරන්න ගියොත් ස්කන්ධ පංචකයක් තියෙනවා. අපිට රූපයක් පෙනෙනවද හිත නැතුව නැහැ. අපිට රූපයක් පෙනෙනවද වේදනා, සංඥා, සංඛාර, කියන නාමධර්ම නැතුව නැහැ. දැන් මෙතනදි අපි හිතන්නේ අපිට මෙහෙම රූපයක් පෙනෙනවා, ඇහැ තියෙනවා, මෙහෙම පෙනෙන රූපයක් තියෙනවා, හිත තියෙනවා, ඒ නිසා මෙහෙම පෙනෙනවා කියලා.

දැන් මේ සිද්ධිය ගැන බලන්න. මේ සිද්ධිය ගැන හොඳට සියුම්ව හිතන්න. දැන් ඇහැ, හිත, රූපය කියන ධර්මතා තුනක් ගැන අපි හිතනවා. මේ තුන්දෙනාගෙ එකතුව ස්පර්ශයයි කියලා. ස්පර්ශ වුණා කියන්නේ අපිට පෙනෙනවනේ. දැන් ඇහැ උපදින්න ඉස්සරවෙලා, හිත උපදින්න ඉස්සර වෙලා, රූපයක් ගැන දන්නවද අපි? රූපය කියලා

එකක් ගැන දන්නවද? දන්නෙ නැහැ. එහෙනම් මේ පෙනෙන අරමුණේ රූපය ගැන දැනුම ආවේ කොහොමද අපිට? ස්කන්ධ පහකින් තොරව රූපය ගැන දැනුමක් එන්න පුළුවන්ද? බැහැ. ස්කන්ධ පහක් වැයවෙලා නේද රූපය ගැන දැනුමක් එන්නේ. දැන් ඇහැ නිසා, රූපය නිසා, හිත නිසා කියන කොට දැන් ඇහැ ගැන දැන ගත්තේ කොහොමද? ඇහැ ගැන දැනුම ආවේ කොහොමද අපිට. ඒත් ස්කන්ධ පහකින්. රූපය ගැන දැනුම එන්නේ කොහොමද? ස්කන්ධ පහකින්. හිත ගැන දැනුම එන්නේ කොහොමද, ස්කන්ධ පහකින්. දැන් ඔය එකක් එකක් ගානෙ දැනුම එනවානම් වෙන වෙනම, අපිට ස්කන්ධ පංචකයක්ම ඕනෙනේ.ඕනේ නේද? ඕනේ. දැන් එක ධර්මතාවයක් ඇති වුණේ කොහොමද? එක ධර්මතාවයක් හම්බ වුණාට පස්සේ? ස්කන්ධ උපදින්නේ කොහොමද එහෙනම් අපිට?

එතැනදි අපි 'රූපය තියෙනවා තියෙන රූපය නිසා අපි අරමුණ විඳිනවා, හඳුනනවා, කල්පනා කරනවා, දැනගන්නවා' කියලනේ හිතන්නේ. දැන් ඔන්න තියෙන රූපය විඳින්න පුළුවන්, හඳුනන්න පුළුවන්, කල්පනා කරන්න පුළුවන්, දැනගන්න පුළුවන්. ඔන්න රූපය හම්බ වුණාට පස්සේ. රූපය හම්බ වුණේ මොන හිතටද? මම අහන ප්‍රශ්නය.

දැන් ඔය පින්වතුන්ට රූපය ගැන දැනුමක් ආවට පස්සෙනේ රූපය විඳින්න හඳුනන්න පුළුවන්. දැන් රූපය ගැන දැනුම ආවෙ? රූපය හම්බ වුණාට පස්සෙයි ඔන්න විඳින්නේ. රූපය ඉස්සෙල්ලා හම්බ වෙනවා, දැන් අරමුණ විඳින්න පුළුවන්, හඳුනන්න පුළුවන්, කල්පනා කරන්න පුළුවන්, දැනගන්න පුළුවන්නේ. ඔය රූපය හම්බ වුණේ මොකේටද දැන්? රූපය ගැන දැනුමක් අපිට ආවට පස්සෙනේ මේක විඳින්න පුළුවන්. දැන් විඳිනවා, හඳුනනවා, දැනෙනවා, දැනගන්නවා කියන මේ හතර ස්කන්ධය ඉපදුණේ ඊට පස්සෙනේ. දැන් හතර ස්කන්ධ ටික රූපය හම්බ වුණාට පස්සෙනේ ආවේ. ඔය පින්වතුන්ට රූපය හම්බ වුණේ මොන හිතටද දැන්? කොහොමද හතර ස්කන්ධයකින් තොරව ඉස්සෙල්ලා රූපය හම්බ වුනේ? පින්වතුන්ට මම අහන එක තේරෙනවද?

මලක් දැක්කහම ඒ මල විඳින්න පුළුවන්, හඳුනගන්නත් පුළුවන්, මල කියලා හිතන්නත් පුළුවන්, දැනගන්නත් පුළුවන්. ඔන්න මල විඳින්න, හඳුනගන්න, කල්පනා කරන්න, දැනගන්න පුළුවන්. මල තමයි රූපය. ඒක විඳින එක-වේදනාව, හඳුනන එක-සංඥාව, හිතන එක-සංඛාරය. දැන ගන්න එක-විඤ්ඤාණය. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ. දැන් ඔය මල කියලා ඔය පින්වතුන්ට පෙනුනේ කොහොමද? මල පෙනුනට පස්සෙනේ ඔය පින්වතුන් විඳින්නේ, හඳුනන්නේ මුලින්ම මලනෙ හම්බ වෙන්නෙ, නේද?

වටාපත ගන්න, මේ වටාපත පෙනෙනවනේ. පෙනුන එක විඳින්න පුළුවන්නේ. දැන් ඉස්සෙල්ලා විඳලා පස්සේ පෙනෙනවද? නැත්නම් පෙනුනට පස්සේ විඳිනවද?

පෙනුනට පස්සේ විඳිනවා. දැන් පෙනුන දේනෙ රූපෙ, ඊට පස්සෙනෙ දැන් විඳින්නෙ. නාමධර්ම නැතුව පෙනෙනවාද රූපය විතරක්? පෙනෙන්න, එක හිතකුත් ඕනේ, තව හිතකින් විඳින්න, හඳුනන්න, කල්පනා කරන්න, දැනගන්නත් ඕනේ. කොහොමද මේක වෙන්නේ? චක්ඛු විඤ්ඤාණය වර්තමානයේ වෙන්න එපායැ. පෙනුන දේකටනේ අපි ඇලෙන්නේ හෝ ගැටෙන්නේ. ඇලෙන්නේ හෝ ගැටෙන්නේ හිතෙන්නේ. එතකොට පෙනුන එක සිත් දෙකක්ද?

ඒ නිසයි මම ඔය පින්වතුන්ට හැම වෙලාවෙම කියන්නෙ, **අපිට පෙනෙනවා කියන තැන නිර්මාණය වෙන්න ස්කන්ධ පංචකය ඕනේ. ඊට පස්සේ ඒ ස්කන්ධ පංචකය, ස්කන්ධ පංචකයක් හැටියට නොදන්නා කම නිසයි, පෙනෙන දෙයක් ගැන විඳින්න පුළුවන් කමක් අපිට හම්බ වෙන්නේ, ඒ තව හිතකින්.**

එහෙම නැතුව මේ පෙනෙන අරමුණෝම අපිට විඳිනවා කියන සිද්ධියක් වෙන්නේ නැහැ. හැම වෙලාවෙම ඒ කියන්නේ. අපි අද හිතාගෙන ඉන්නේ රූප කියලා යමක් එහෙ (බාහිරව) තියෙනවා, තියෙන රූපය තමයි අපි විඳින්නේ කියලා. **නමුත් මෙතැනදි එහෙ (බාහිරව) රූපයක් තියෙනවා නෙවෙයි, අපිට රූපය කියලා හම්බ වෙන තැන ඇත්ත දැක්කොත් මේක විඳිනවා කියන සිද්ධියෙන් අපේ මනස අතහැරෙනවා. එහෙම වුණොත් තමයි අපිට ගැලවීමක් තියෙන්නේ.**

අපිට රූපය හම්බ වෙන තැනද අපි රූපය විඳිනවා. අපිට රූපය හම්බ වෙනතාක් අපි රූපය විඳිනවා. රූපයෙන් අපි මිදුණොත්, අපිට රූපයෙන් මිදෙන්නට නම් මොනවද කරන්න වෙන්නේ? මේ පංච උපාදානස්කන්ධය නැත්නම් ස්කන්ධ පංචකය අවබෝධ කරගන්න වෙනවා.

අපිට මලක් කියලා යමක් පෙනෙනවා නම්නේ විඳින්න පුළුවන්. මලක් කියලා රූපයක් හම්බ වෙනවා නම් ඒ රූපය අපිට විඳින්න පුළුවන්. දැන් මලක් කියලා පෙනෙන තැනක අපි වෙනදා වගේ විඳින්න යන්නේ නැතුව, මේ 'මල පෙනෙනවා' කියන සිද්ධිය බැලුවොත් අපි, අපිට තේරෙනවා මෙතන තියෙනවා ස්කන්ධ පංචකයක්. එතකොට මේ ස්කන්ධ පංචකය, ස්කන්ධ පංචකයක් හැටියට දකිනවා මිසක අපි

- මල කියලා දකින්නේ සතර මහා ධාතුවද?
- එහෙම නැත්නම් ඒ නිසා පහල වුණු විඳීමද?
- එහෙමත් නැත්නම් මේ හැඩතල පෙනෙන සංඥාවද?
- නැත්නම් ඒ සංඥාව අරභයා මල කියලා හිතන ගතියද?

ස්කන්ධ පංචකයක පැවැත්මක් හම්බ වෙයි මිසක මල කියලා බහාලන්න එකක් නැතිවෙයි අපිට. ඒ ස්කන්ධ ටික නොදැක්කොත්. අපිට ඔක්කොම ගුලි කරලා එක මලක් හම්බ වෙයි. මලක් හම්බ වුණොත් ඔන්න අපිට ඇලෙන්න, ගැටෙන්න පුළුවන්.

අපි කිව්වේ මිරිඟුව නිසා හිතට විඳින බවක්, හඳුනන බවක් හඳුනනවා කියන කොට වතුර වගේ පෙනෙනවා. ***මරීචිකූපමා සංඥා*** - සංඥාව මිරිඟුවක් වගේ කියන්නේ, නැති දෙයක් ඇති බවට පෙන්වනවා. එතකොට ඔන්න සංඥාවක් පහළ වෙනවා. අපි ඒ ගැන හිතනවා, දැන් දැනගන්නවා. ඔන්න බාහිර මිරිඟුව නිසා තමා තුළට දැනුම ආවා ටිකෙන් ටික. ඒ ධාතුවත් ඒක වින්ඳා, හැඳුනුවා, කල්පනා කලා, ඔන්න ඔහොම. දැන් මේ ධර්මතා පහ යෙදිලා තියෙන තැනක ඔය ටික නොදැක්කොත් ඔය ටික ඔක්කොම කෙටි කරලා කැටි කරලා අපිට හම්බවෙනවා එක රූපයක් මොකක්ද? වතුර. දැන් **වතුර කියලා එකක් හම්බ වෙන තැනක යට තියෙනවා පහක්**.ඊට පස්සේ ඔන්න වතුර විඳිනවා, වතුර ගැන හඳුනනවා, වතුර ගැන හිතනවා, කියන ටිකක් අපිට පහළ වෙනවා. දැන් වතුර හම්බ වුණාට පස්සෙයි අපි ඒ ගැන විඳින්නේ, වතුර හඳුනන්නේ, වතුර ගැන කල්පනා කරන්නෙ. දැන් මේ අවිද්‍යාව ඇතුළෙ ඔක්කොම. නමුත් **වතුර හම්බ වෙනවා කියන සිද්ධිය ඇත්ත වුණොත් ඒක නොවිඳ ඉන්නේ නැහැ. වතුර කියන එකෙන්ම අපේ මනස මිදෙන්න නම් අපිට වෙනවා, මෙතන තියෙන ස්කන්ධ ටික දකින්න** නේද?

ඒ වගේ, මිරිඟුවේ වතුර පෙනෙනවා වගේ තමයි අපිට 'මනුස්සයෙක්' පෙනෙනවා කියන තැන. ඊට පස්සෙයි ඒ මනුස්සයා විඳිනවා, නැත්නම් මනුස්සයා එක්ක ඇලෙනවා, ගැටෙනවා කියන සිද්ධියක් අපට වෙන්නේ. අපිට හැම වෙලාවෙම රූපයක් හම්බ වෙනවා නම් හම්බ වෙන රූපෙන් මිදෙන විදියට අපි බලන්න ඕනේ. ඒ කියන්නේ **ලෝකයට එක රූපයක් හම්බ වෙන තැනක අපිට තියෙනවා ධර්මතා පහක්.** ඇහැ කියලා හිතන්නකො, ඇහැ කියන දැනුම එනකොට අපිට තියෙනවා ස්කන්ධ පහක්, හිත කියලා හිතන්නකො, හිත කියලා හිතන තැන තියෙනවා ස්කන්ධ පහක්. රූපය කියලා හිතන්නකො. රූපය කියලා හිතන තැන තියෙනවා ස්කන්ධ පහක්. එහෙම ඒ ඒ ස්කන්ධයට නුවණ ආවොත් උදය වැය දැක්කොත් එයා ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණ කියන මේවයින් මිදෙනවා මනස. ලෝකයෙන් මිදෙනවා මනස. එහෙම නැති වුණොත් ඒ ටික ඇත්ත වෙනවා.

යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං - යමක් සමුදය ස්වභාවය කොට ඇද්ද, ඇති වීම ස්වභාව කොට ඇද්ද ඒ සියල්ලම නිරුද්ධ වෙන ස්වභාවයෙන් යුක්තයි කියන කොට, උපදින උපදින හැම ධර්මතාවයක්ම දැක්කොත් ඇති වෙන ඒවා නැති වෙනවා, එකට එකතු කරලා ගන්න බැහැ. එකට එකතු කරලා ලැබෙන

අත්දැකීමක් නැහැ.

මොකද මෙහෙම සිද්ධියක් තියෙනවා, **අපිට රූපය පෙනෙනවා කියන තැනක රූපයක් පෙනෙන කොට. ඇහේ කෘත්‍යයත් වැය වෙලා, රූපයේ කෘත්‍යයත් වැය වෙලා, හිතේ කෘත්‍යයත් වැය වෙලා, වේදනා, සංඥා, සංඛාර කියන ඔය ධර්මතා ටික ඔක්කොම වැයවෙලා, ඕවා නොදන්නා තැනක ඉඳගෙන තමයි රූපය කියලා එකක් හම්බ වෙන්නේ අපිට. දැන් ආයෙ වෙනම අමුතුවෙන් ඇහැක් රූපයක්, චක්ඛු විඤ්ඤාණයක් ඕවා දකින්න යන්න එපා, ඕවා නැහැ.** ඊට පස්සේ, අපි පෙනෙන සිද්ධියට කැමති වුණානම් ඒ වෙලාවෙදි අපි ඇහැට කැමති වෙලා, අපි හිතට කැමති වෙලා, චක්ඛු සම්ඵස්සයට කැමති වෙලා, චක්ඛු සම්ඵස්සයෙන් උපන්න වේදනාවට කැමති වෙලා, ඒ නිසා උපන්න සංඥාවට කැමති වෙලා, කියන සිද්ධි ටික ඔක්කොම එකට තියෙන්නේ. මොකද පෙනෙනවා කියන ධර්මතාවය නිර්මාණය වුණේ මේ ධර්මතා ටික ඔක්කොම වැයවෙලා නිසා.

එතකොට දැන් අපිට ඇහැ කියලා යමක් කතා කරන කොට රූපය වැයවෙලා, හිත වැයවෙලා, චෛතසික වැයවෙලා, මේ ඔක්කොම වැයවෙලා තමයි ඇහැ කියලා ධර්මතාවයක් හම්බ වෙන්නේ. ඇහැ කියලා එකක් වෙනම හම්බ වෙන්නේ නැහැ. එතකොට එතැනදි අපිට පුළුවන්කම තියෙන්න ඕනේ, ඒ මොහොතෙදි ඒ ස්කන්ධ ටික යෙදිලා හම්බ වෙන දේ, අපි කියමු **පෙනෙන්නේ ඔක්කොම ස්කන්ධ ටික වැයවෙලා රූපය නම් ඒ පෙනෙන රූපයෙන් මිදෙන විදියට හිටියොත් ඒ ස්කන්ධ ටිකෙන්ම මිදිලා ඒ වෙලාවට, එයා ඒ ඇහෙනුත් මිදිලා, ඒ හිතෙනුත් මිදිලා, ඔක්කොම ටිකෙන් මිදිලා. ආයෙ දැන් ඇහෙන් මිදෙන්න වෙනම හිතන්න ඕනේ නැහැ.**

- පෙනෙනවා කියන සිද්ධිය නිර්මාණය වුණේ ඇහැ, හිත මේ ඔක්කොම ටික එකතු වෙලා නම්, පෙනෙන දෙයින් මිදෙන කොට එයා මේ ඇහැ, හිත, චෛතසික ඔක්කොම ටිකෙන් මිදිලා ඒ වෙලාවට.
- ඇහැ හිත මේ ඔක්කොම ටික වැය වෙලානම් ඇහැ ගැන දැනුමක් එන්නේ, ඒ ඇහෙන් මිදෙන්න බලනකොට මෙයා ආපහු රූපෙන් මිදෙන්න හිතන්න ඕනේ නැහැ. ඔක්කොගෙන්ම මිදිලා.

නමුත් මෙතැනදි අපට හම්බ වෙන්නේ එක දෙයයි හැම වෙලාවෙම. මොකක්ද රූප විතරයි, ඇහැට ඔබ්බෙන් පවතින රූප විතරයි. රූප හරහායි ඇහැත් හම්බ වෙන්නේ අපිට. ඒ නිසා පෙනෙන රූපයට අහුනොවෙන විදියට හිටියොත් අපි, මේ ඔක්කෝම ආයතන ටිකෙන් මිදෙනවා. පෙනෙන රූපෙට අහුනොවෙන විදියට, පෙනෙන රූපෙන් මිදෙන විදියට හිටියොත් ඔක්කෝම ආයතන ටිකෙන් මිදෙනවා.

පෙනෙන රූපයෙන් මිදෙන විදියට ඉන්න තියෙන්නෙ වෙන මොකුත් නෙවෙයි, රූපයක් පෙනෙනවා කියන තැනක ස්කන්ධ පංචකයක් දකින්න. රූපයක් පෙනෙනවා කියන තැනක ස්කන්ධ පංචකයක් දකින්න ගියොත් ඔය පින්වතුන්ට **එහෙ නිසා මෙහෙ ඇති වෙන සිද්ධියක් දකින්න වෙනවා.** රූපය කියන එකක් පෙනෙන තැනක ස්කන්ධ පංචකයක් තියෙනවා කියලා දකින්න ගියොත් මෙහෙන් (අභ්‍යන්තරයෙන්) බලලා කවදාවත් ස්කන්ධ පංචකයක් දකින්න බැහැ. එහෙ නිසා මෙහෙට පහළවෙනවා කියන සිද්ධියක් හම්බ වෙයි. ඒ කියන්නේ රූපය පෙනෙනවා කියන තැනක.

මෙතැන මෙහෙම සිද්ධියක් තියෙන්නේ.

- ධාතුව නිසා නාමධර්ම ඇති වෙලා රූපය පෙනෙනවා කියන සිද්ධියකුත් තියෙනවා.
- ඒ නාම-රූප දෙකම උපකාර කරගෙන රූපය දැකලා, ඒ රූපය විඳිනවා කියන සිද්ධියකුත් තියෙනවා.

ඒකයි මේ රැවටෙන්නෙ අපි. ඒ කියන්නේ මිරිඟුව ජලය වගේ හිතට පෙනෙනවා කියන සිද්ධියක් තියෙනවනේ. ඒ ස්කන්ධ ටිකත්, ඒක නොදන්නා කමත් කියන කෙළෙසයත් ඇති වෙලා, ඒ ස්කන්ධ ටිකට කෙළෙසය යෙදිලා, වතුර කියලා එකක් පෙන්වනවා. ඊට පස්සේ, 'වතුර කියලා එකක් රූපය කරගෙන', වතුර විඳිනවා, හඳුනනවා කල්පනා කරනවා දැනගන්නවා කියලා තව එකක් තියෙනවා. ස්කන්ධ පංචකය සහ පංච උපාදානස්කන්ධය කියලා අපිට හම්බ වෙන දෙකක් තියෙනවා නේද? මෙන්න මේක. මේ සිද්ධියයි පැටලෙන්නේ ඔය පින්වතුන්ට.

වතුර ගැන විඳින්න ගියොත්, හඳුනන්න ගියොත්, කල්පනා කරන්න ගියොත්, ඒක බාහිරෙන් හම්බ වෙන සිද්ධියක්මයි අපිට, එතකොට මිරිඟුව හම්බ වෙන්නේ නැහැ. සිතුවිලි හම්බ වෙන්නෙ නැහැ. චෛතසික හම්බ වෙන්නෙ නැහැ, කෙලින්ම රූපයක් හම්බ වෙනවා, බාහිර රූපය විඳිනවා. පංච උපාදානස්කන්ධයේ ලක්ෂණය. තේරුනාද?

ස්කන්ධ සහ පංච උපාදානස්කන්ධ කියලා දෙකක් තියෙනවා. ස්කන්ධයන්ගේ උදය වැය බැලුවොත් පංච උපාදානස්කන්ධය නිරුද්ධ වෙනවා. පිරිසිඳ දකින්න පුළුවන්. පංච උපාදානස්කන්ධ රූපය කියන එක ඇති වෙන්නේ මෙහෙමයි නේද? කියන එක දකින්න පුළුවන්, රූපය කියන එක නැති වෙන්නේ මෙහෙමයි නේද කියන එක දකින්න පුළුවන් ඒ කියන්නේ අපි කියමු

- මිරිගුවත් ඒ නිසා පහළවෙන චෛතසික ටිකක් කියන මේ නාම-රූප දෙකත්, අවිද්‍යාවත් කියන ඒවා එකතු වෙලා තමයි රූපය හැදෙන්නේ. ඔන්න උපාදාය රූපය හැදෙන හැටි.
- අවිද්‍යාව නැති වුණොත්, මේ ස්කන්ධ නැති වුණොත් මේ රූපය නැති වෙනවා, රූපය නැති වෙන හැටි පෙනෙයි.
- දැන් ඒ ඇතිවීම නැතිවීම නොදැක්කොත් රූපය කියලා එකක් අපිට ඇති බවටම හම්බ වෙනවා.
- එහෙම වුණොත් හැම වෙලාවෙම ඒ රූපය අපි විඳිනවා හඳුනනවා කල්පනා කරනවා.
- ආයෙත් රූපය මනසින් අරමුණු කරනවා
- ආයෙත් රූපය බලන්න එනවා
- ආයෙත් රූපය විඳිනවා, හඳුනනවා, කල්පනා කරනවා, දැනගන්නවා.
- ආයෙත් රූපය බලන්න එනවා කියලා උඩින්ම කැරකෙනවා එකට.

ඔන්න බලන්න එනවා, වතුර තියෙනවා කියලා දැක්කේ. ඒ වතුර වින්ඳා, බලාගෙනම වතුර විඳලා, හඳුනලා වතුර හොඳයි කියලා පැත්තකට යනවා. ගිහිල්ලත් වතුර සිහි කරනවා. සිහි කළොත් ආයෙත් බලන්න එනවා. ආයෙත් වතුර ගැන බලනවා, ආයෙත් වතුරම විඳිනවා. ආයෙත් පැත්තකට ගිහිල්ලා වතුරම සිහිකරනවා. කියලා උඩින් උඩින් හැසිරෙන්න බැරිද? උඩින් උඩින් උඩින් උඩින් කැරකෙනවා ලෝකෙ. හිතෙන් හිතුවත් වතුර වලක ඉන්නේ, ඇහෙන් දැක්කත් වතුර වලක ඉන්නේ විදියට ඉන්න පුළුවන්. ඕක තමයි පංච-උපාදානස්කන්ධ ලෝකය කියන්නේ.

එතකොට පංචස්කන්ධ ලෝකය කියලා කියන්නේ, මේ චක්‍රයෙන් මිදෙනවා අපි. වතුර වලෙන් මිදෙනවා වතුරෙන්ම මිදෙනවා එයා. ඒකට දකින්න තියෙන්නේ මොකක්ද? මේ නාම-රූප දෙක පිරිසිඳ දකින්න, දිට්ඨි විසුද්ධිය. මේ අපට වතුර කියලා හම්බ වෙන තැන, විඳිනවා, සිහි කරනවා, කියලා එකක් මෙච්චර කල් කළේ. දැන් වතුර කියලා අපිට හම්බ වෙන සිද්ධිය පිරිසිඳ දකින්න ඒ වගේ දැන් අපි මෙහෙම බලනකොට මේ මනුස්සයෝ කියලා පෙනෙනවා. මනුස්සයෝ ගැනම විඳිනවා, හඳුනනවා, හිතනවා. පැත්තකට ගිහිල්ලා මනුස්සයෝ කියලා කල්පනා කරනවා. ආයෙත් ඇවිල්ලා මනුස්සයෝම බලනවා, දකිනවා. ආයෙත් මනුස්සයෝම විඳිනවා, හඳුනනවා. ආයෙත් පැත්තකට ගිහිල්ලා සිහිකරනවා, ආයෙත් සිහි කරන මනුස්සයෝ බලන්න එනවා. මේ උඩින්ම එකක කැරකෙනවනෙ අපි. කැරකි කැරකි, කැරකි කැරකි ඉන්නවා.

යම් වෙලාවක මනුස්සයා කියලා හම්බ වෙන තැන මොකක්ද ඇත්ත කියලා බලන්න ගියොත්, අන්න එතකොටයි මම මේ කියන සිද්ධිය හම්බ වෙන්නේ, **මේ දැන් ලෝකෙට නෙවෙයි. මේ ලෝකෙන් මිදෙනවා නම් යම් කිසි කෙනෙකුට, එයාට මේ චක්‍රය හරියන්නේ නැහැ. චක්‍රයෙන් වෙන් වෙන්න වෙනවා.** දැන් අපිට මනුස්සයෙක් පෙනෙනවා. පෙනෙන මනුස්සයා ගැන දැන් තණ්හාව ඇති කරගන්නවා. පැත්තකට ගිහිල්ලා ආයෙත් මනුස්සයා ගැන සිහි කරනවා ආයෙත් බලන්න එනවා.

දැන් තිරිසන්ගත සතෙක් පොකුණකට එබුණොත් තමන්ගේ ඡායාව වැටෙනවනේ, දැන් තමන්ගේ ඡායාව, තමන්ගේ ඡායාව හැටියටම දන්නේ නැහැ. දන්නෙ නැති කම හින්දා, ඇත්ත නොදන්නා කම හින්දා, මිත්‍යා දෘෂ්ඨියක් ඇති කරගන්නවා, මොකක්ද තව සතෙක් ඉන්නවා කියලා. ඔන්න ඉන්න සතාට කැමැත්ත, අකමැත්ත දෙක ඇති කරගෙන ඉන්නවා. පැත්තකට යනවා. පැත්තකට ගියාම හිතේ ඒක සිහි කරනවා. හිතේ සිහි කරනකොට එයාට පෙනෙන්නේ, පොකුණෙ ඉන්නවා වගේ, බාහිරේ ඉන්නවා වගේ, ආයෙත් බලන්න එනවා.

බලන්න එබුණ හින්දම තමන්ගේ ඡායාව වැටෙන කොට, ආයෙත් දැන් 'හරි මේ ඉන්නේ' කියලා හිතන්නේ. දැන් එබුණ හින්දමයි තියෙන්නේ. ඒත් එයා හිතන්නේ මොකක්ද 'මේ ඉන්නේ, මේ ඉන්න හින්දම හම්බවෙනවා' කියලා ආයෙත් හයියෙන් බුරනවා. බුරලා එහෙම කෙනෙක් ඉන්නවාමයි කියලා යනවා.

දැන් මෙයා දිහා බලන්න. ඇහෙන් බැලුවත් තව සතෙක් ඉන්නවා. හිතෙන් හිතුවත් තව සතෙක් ඉන්නවා. මෙයා දැන් දෙන්නෙක් එක්ක නෙවෙයිද ඉන්නේ. මෙයාගෙ ලෝකය හිස්ද? ඔය වගේ වතුර වලවල් දහයකට විතර එබුණොත්. බල්ලෝ රෑනක් එක්ක ඉඳියි මෙයා. ඔය සිද්ධියම නෙවෙයිද මේ කරලා තියෙන්නේ අපි. දැන් සෙනඟ ගොඩාක් එක්ක මේ ඉන්නේ. ඒ සිද්ධියම නේද අපිත් මේ කරලා තියෙන්නේ.

දැන් මේ ඉදිරියෙන් යමක් පෙනෙන කොට, මේ අපේම ඡායාවයි කියලා අපිට පෙනෙන්නේ නැහැ. ධාතුව නිසා මනසට පහළ වුණු මේ ඡායාව කියලා අපි දන්නේ නැහැ. ඇත්ත නොදකින කොට, අර තිරිසන්ගත සතා තමන්ගේ ඡායාව කියලා නොදන්නාකොට, දෘෂ්ඨියක් ඇති වෙනවා 'තව සතෙක් ඉන්නවා' කියලා. බාහිරෙන් කෙනෙක් ඉන්නවා කියලා.

ඒ වගේ මේ මගෙම ඡායාවයි කියලා හම්බ වෙන කොට, අපි ඒක නොදන්නකොට දෘෂ්ඨියක් ඇති වෙනවා මෙහෙ කෙනෙක් ඉන්නවා කියලා. දැන් හිතා

ගන්නවා. හිතාගෙන බුරනවා කියලා කියන්නේ, එයා බුරනවා වගේ ඉන්න කෙනාට බනිනවා. ඉන්න කෙනා එක්ක හිනා වේවී ඉන්නවා දැන් මනසින්. ඔන්න දැන් ඇහෙන් බැලුවත් කෙනෙක් එක්ක ඉන්නවා වගේ. දැන් පැත්තකට ගියහම ඔන්න මෙහෙම කෙනෙක් ඉන්නවා කියන එකෙන් ඉන්නේ. ඉන්න කෙනාව බලන්න එනවා. ඔන්න ඇස් ඉදිරිපිටට මේ ධාතුව එනකොට ආයෙත් මේ සංඥාව පහළ වෙනවා. ආයෙත් තමන්ගේ ඡායාවම, ඡායාව කියලා දන්නේ නැහැ. ආයෙත් හිතා ගන්නවා මෙහෙ කෙනෙක් ඉන්නවා කියලා. දැන් අපි ඇහෙන් බැලුවත් තව කෙනෙක් ඉන්නවා. හිතෙන් හිතුවත් තව කෙනෙක් ඉන්නවා.

දැන් ඔය වගේ අරමුණු සීයක් බැලුවොත් සිය දෙනෙක් එක්ක ඉන්නේ, දාහක් බැලුවොත් දාහක් එක්ක ඉන්නේ, ලක්‍ෂයක් බැලුවොත් ලක්‍ෂයක් එක්ක ඉන්නේ. ඉතින් ලෝකය හිස් නැහැ බොහෝ පිරිසක් එක්ක ඉන්නේ. කවදාවත් අපිට ඒ 'ශූන්‍යත දර්ශනය' අහුවෙනවද? අර සතාට ඒ සතා තනියම ඉන්නේ කියලා කවදාවත් අහුවෙයිද? අහුවෙන්නේ නැහැ. අහුවෙනවා නම් තමන්ගේ ඡායාව, තමන්ගේ ඡායාව කියලා දකින්න ඕනේ.

ඒ වගේ, මෙතැනදි දැනට කෙටි ක්‍රමයක් තමයි මම මේ උපාදාය රූපය ගැන කතා කළේ. ඇත්ත තමයි, අපිට උපාදාය රූපය කියලා හම්බ වෙන තැනක නාම-රූප ධර්මතා දෙකක් කියන තැනකින් තමයි මිදෙන්න තියෙන්නේ. නමුත් සතර මහාධාතුව නිසා සිතට පහළ වෙන්නේ නාම ධර්මයි. කියන එක අපිට පෙනෙන්නේ නැහැනේ. ඒකට උපායක් තමයි මම මෙහෙම කියන්නෙ, දැනට ගන්න. තවම අපි දක්‍ෂ නැහැ ධාතුවේ ඉඳන් මෙහෙට පෙනෙනවා කියන එක බලාගන්න. මේ උපායක් මම මේ කියන්නේ. අපිට හුරුව තියෙන්නෙම ආශ්‍රව කියන්නෙම, කෙළෙස් කියන්නෙම මෙහෙ තියෙනවා කියන තැනින්මයි හුරු.

මෙහෙම තියෙනවා කියලා, බලන ගතිය නැති කරගන්න ඉස්සෙල්ලා ඒකෙ බලය අඩු කරගන්න වෙනවා. ඒකට උපායක් හැටියට තමයි මෙච්චර මේ උපාදාය රූපය කියලා බලන සිද්ධිය දිහා බලන්න, අපිට මේ පෙනෙන දේ බලන්න. මෙහෙම පෙනෙන තැනක තියෙන්නේ සතර මහාධාතුව කියලා බලන්න කියන්නේ.

ඒකද මෙහෙම බලන ගතියද අයින් කරවන්න ඕනේ කවදාහරි. මේ උපායක් දැන් මේ කියන්නේ මම. ඒ කියන්නේ, **යම් දවසකදි, රූපය කියලා විදර්ශනා කරන්න තියෙන වටපිටාවද අත හැරෙන්න ඕනේ.** නමුත් එකපාරට එහෙම කරන්න බැහැ. මේ නාම-රූප දෙකක් කියන එක දකින මට්ටමට එන්න ඕනේ. නමුත් තාම බැහැ. එහෙ (බාහිර) තියෙනවා කියන එක බලවත් වැඩියි. ඒ නිසා, එහෙ තියෙන්නේ කියලා බලන එකේ බලය

අඩු කරන්න ක්‍රමයක් තමයි මම මේ මහාභූත සහ උපාදාය කියන එක දැනට පෙන්වන්නෙත්, හැම වෙලාවෙදිම.

ඒකෙදි උපාදාය රූපය කියන එක දකින්න කිව්වා මම, කොහොමද ඡායාවක් වගේ කියලා. අත නිසා, ඉඩ අවකාශය නිසා, බාහිර ආලෝකය නිසා තුන් දෙනා නිසාම පහළ වෙන ඡායාවක්. එතකොට මේ ඡායාව හුදු ඡායා මාත්‍රයක් මිසක කවදාවත් සැප දුක් විඳින්න පුළුවන් යමක් නැහැ. ඒ වගේ, අත වගේ දකින්න කිව්වා පඨවි, ආපෝ, තේජෝ වායෝ කියන සතර මහා ධාතුව ඒ සතර මහා ධාතුව තියෙන තැනක, හිත නිසා, ඇහැ නිසා අපිට හැඩ තලයක් පෙනෙනවා. **දිට්ඨේ දිට්ඨ මත්තං** කියන කොට '**පෙනීම පෙනීම් මාත්‍රයක්**' මිසක කවදාවත් පෙනෙන දේ අල්ලන්න බැහැ.

මම ඕකට තව උපමාවක් කියන්නේ උපාදාය රූපය, වර්ණ රූපය කියන එක මෙන්න මේ අදහසින් දකින්න. වතුරක් ගාව තියෙන, පොකුණක් ගාව තියෙන ගහක් හරි නැත්නම් අපේ මුහුණ බැලුවොත් වතුරෙ ඒ ඡායාව වැටෙනවා නේද? හොඳයි ඡායාව අල්ලන්න කියලා අත දැම්මොත් අපි, අපේ අත හැපෙන්නේ කොහෙද? වතුරේ. කවදාවත් ඡායාව අල්ලන්න පුළුවන්ද? ඒකෙන් සැපදුක් ස්පර්ශ කරගන්න පුළුවන්ද? බැහැ. උපාදාය රූපය දකින්න, දැන් මේ එළඹ සිටින තැන වතුර වගෙයි, වතුරේ පතිත වෙලා තියෙන ඡායාවක් වගේ දකින්න මේ පෙනෙන බව. මේ පෙනෙන දේ අල්ලන්න ගියොත් මහාභූතයන්ගේ අත හැපිලා හිටියි මිසක පෙනෙන දේ අහු වෙන්නේ නැහැ. උපාදාය රූපය කියලා කියන්නේ එබඳු මට්ටමක්. වතුරේ පෙනෙන ඡායාවද උපාදාය රූපයක්. වතුරක මුහුණ බලන්න බැරිද අපිට? පුළුවන්. හොඳයි පෙනෙන දේ අල්ලන්න බලන්න. පෙනෙන දේ පෙනීම් මාත්‍රයක් මිසක **දිට්ඨෙ දිට්ඨ මත්තං** වෙන්න ඕනේ. දකින දේ දකින්න විතරමයි පුළුවන්. ඒකෙන් කියනවා කවදාවත් ඒක අල්ලන්නවත් බැහැ ඒකෙන් සැප දුක් විඳින්න බැහැ. පෙනෙන දේ අල්ලන්න කියලා අත දැම්මොත් අත හැපෙන්නේ කොහෙද? වතුරේ.

ඒ විදියටම දකින්න මේ පෙනෙන දේ. එතැන වතුර වෙනුවට මෙතැන දකින්න සතර මහාධාතුව. මේ පෙනෙන දේ දකින්න පොකුණෙ පෙනෙන ඡායාව වගේ. පෙනෙනවා දැන් මෙහෙම. මේ අඩුපාඩුවක් නැතුව කණ්නාඩියක් ඉදිරිපිටට ගියහම, පොකුණකට වැටුනහම, ඡායාවක් වැටෙනවා වගේ, මේ පෙනෙනවා ඡායාව. නමුත් මේ පෙනෙන දේ අල්ලන්න කියලා අත දැම්මොත් මේ අත හැපිලා හිටියි කොහෙද, සතර මහාධාතුවේ මිසක, උපාදාය රූපය අහුවෙන්නේ නැහැ. ඒකයි ඒක **දිට්ඨේ දිට්ඨ වත්තං** දැකීම් මාත්‍රයක් විතරයි.

වතුරෙ තියෙන ඡායාව දකින්න විතරමනේ අපිට පුළුවන් නේද?

- පැත්තකට ගිහිල්ලා හිතින් සිහිකෙරුවොත්, ඒකද දැකපු එක නෙවෙයි, මනෝ සම්ඵස්සයෙන් ඉපදුණු එකක්.
- ඒකේ ගඳ සුවඳ බලන්න ගියොත් වතුර පල්වෙලා තියෙනවානම්, වතුර පල් වුණු නිසා ගඳ සුවඳ එයි මිසක, පෙනෙන දෙයින් ගඳ සුවඳ එනවද?
- රස විඳින්න ගියොත් වතුරෙ තියෙන පැණි රසක් හෝ තිත්ත රසක් තියෙනවා නම් ඒක එයි මිසක අර ඡායාවේ රසයක් එනවද?
- අල්ලන්න ගියොත් වතුර ස්පර්ශ වෙයි මිසක අර ඡායාව ස්පර්ශ වෙනවද?

නැහැ. ඒ වගේ මේ පෙනෙන දේ වතුර වගේ දකින්න මහාභූත රූපය. පෙනෙන දේ අල්ලන්න කියලා ගියොත් අත දැම්මොත් මහාභූතයෝ හැපිලා හිටියි. ගඳ සුවඳක් ආවොත් මේ මහාභූතයන්ගේ ඇසුරු කරන වර්ණ, ගන්ධ, රස, ඕජා කියලා තියෙන ශුද්ධාෂ්ඨක. ඒ නිසා මහාභූත නිසා ඇති වෙන ගන්ධ සංඥාවක් දැනෙයි මිසක ඒ පෙනෙන දෙයින් නෙවෙයි. රසයක් තිබුණොත් මේ මහාභූත නිසා දිවට රසයක් දැනෙයි මිසක මේ පෙනෙන දෙයින් නෙවෙයි. එතකොට පෙනෙන දේ පෙනීම් මාත්‍රයක් විතරයි නේද, වතුරක තියෙන ඡායාව. ඒ වගේ දකින්න උපාදාය රූපය.

ඔන්න ඔය විදියට දකින කොට, මේ උපායක්. ඔය පින්වතුන් එහෙට (බාහිරව) බලන්න තියෙන බලය අඩු වෙනවා. මෙච්චර කාලයක් දරුවාමයි පෙනෙන්නේ කියලා, ගෙදරමයි පෙනෙන්නේ, අම්මමයි පෙනෙන්නේ කියලා මේ ඇත්තම වෙලානේ. මේ ඇත්තම වුණු කෙළෙසය රළුව තියෙද්දි, පෙනෙන්නේ මෙහෙ කියලා බලාගන්න බැහැ. ඒකටයි මේ උපාදාය රූපය පිරිසිඳ දකින්න උපායක් මේ කියන්නේ. මේක පටලවා ගන්න එපා. ඔය විදියට උපාදාය රූපයේ අර්ථය දක්වා ගන්න.

මේ උපමා ඔය පින්වතුන්ට හරි වටිනවා ඔය පින්වතුන් හොඳට මතක තියාගන්න, අරමුණක් සම්මර්ශණය කරන කොට, මම මේ කියලා දෙනවා වගේ, කෙනා කෙනා තමාටම උගන්නවා ගන්න. උගන්වන්න. මෙහෙම යමක් පෙනෙන කොට සිහිකරගන්නවා වතුරට වැටුනු ඡායාව හොඳට. වතුරටත් හොඳට අඟ පසඟ ඔක්කොම තියෙන මිනිස් රූපය වැටෙනවා තමයි. නමුත් ඒ වැටුණු මනුස්සයාව, රූපය අල්ලන්න කියලා අත දැම්මොත් අත වතුරෙ නම් හැපිලා ඉඳියි, රූපය නම් අල්ලන්න බැහැ නේද? එහෙනම් ඒ වතුර වගේ මෙතැනත් පවතින ස්වභාවය සතර මහාධාතුයි. මේ ධාතුව

ඇසුරු කරගෙන මෙහෙම හැඩයක් පෙනෙනවා. මේ පෙනෙන දේ අල්ලන්න කියලා ගියොත් අත හැපිලා හිටියි සතර මහාධාතුවේ. නමුත් පෙනෙන දේ අහුවෙන්නේ නැහැ නේද? පෙනෙන දේ දිහා බලාගෙන ඉන්නකොට ගඳ සුවඳක් ආවොත්, වතුර පල්වෙලා තිබුණොත් ගඳ සුවඳ එයි. ඒත් මේ පෙනෙන දෙයින් එනවා නෙවෙයි නේද? මෙහෙම ගඳ සුවඳක් එනකොට මේ පෙනෙන දේ ඇසුරු කරගෙන පවතින සතර මහාධාතුව නිසා මේ ගඳ සුවඳ එයි. ඒත් මේ පෙනෙන දෙයින් ගඳ සුවඳ එනවා නෙවෙයි නේද?

මේ ආයතන වෙන් වෙනවා වේගයෙන්. **අපේ මේ ආයතන එකට බැඳිලා තියෙන එකමයි මේ සංයෝජන. ආයතන වෙන් වෙනවා වේගයෙන්.** ඊට පස්සේ රසයක් දැනුනොත්, මේ වතුර පැණි රස හෝ තිත්ත රසනම් ඒ නිසා රසයක් දැනෙයි මිසක පෙනෙන දෙයින් රස එනවා නෙවෙයි නේද? කියලා බලනවා. ඒ වගේ මේ පෙනෙන දෙයින් රස එනවා නෙවෙයි මේ ධාතුව නිසා එන රස. ඇහැට පෙනෙන දේ අනෙක් ආයතනයන්ගෙන් වෙන් කරනවා. අනිත් ආයතන පෙනෙන දෙයින් වෙන් කරනවා. ඔය විදියට බලන්න. මෙහෙම බලන කොට හොඳට නුවණ එනවා, මේ විදියට උපමා උපමෙයිය දක්ව දක්වා ඔන්න බලන කොට මේ **පෙනෙන දේ හුදු පෙනීම් මාත්‍රයක් විතරයි.**

තව උපමාවක් ගත්තොත්, **අපේ කම්ටේ මේ මැව්ලා පෙනෙන්නේ.** මම කිව්වේ කුණ්ඩදාන මහරහතන් වහන්සේ ගැන. කුණ්ඩදාන මහරහතන් වහන්සේගේ පිටිපස්සෙන් නිතරම ස්ත්‍රියක් යනවා එනවා වගේ අනෙක් අයට පෙනෙනවා මැව්ලා. මේ කර්මජ රූප කියන්නේ ඕවා. ඒ කියන්නේ කර්මජ රූප වලින් හදලා පෙන්වන ලෝකය ඔහොමමයි. **මේ වගේ ධාතුවේ අපිට මෙහෙම මැව්ලා පෙනෙන නිසයි මේ, අපි සැප දුක් විඳින්නේ.** මේ විදියට, මේ පෙනෙනවා කියපු වර්ණ රූපය, උපාදාය රූපය බලන කොට පෙනෙන දේ තියෙනවාමයි, කියලා ඇත්ත වුණු ගතිය ටිකක් අඩු වෙනවා. පෙනෙන දේ විඳින්න පුළුවන්මයි. පෙනෙන දේ රස බලන්න පුළුවන්මයි. පෙනෙන දේ ගඳ සුවඳ බලන්න පුළුවන්මයි. පෙනෙන දේ අල්ලන්න පුළුවන්මයි කියන ගතිය අඩු වෙනවා ටික ටික. ඒ ගතිය අඩු වෙනවා කියලා කියන්නේ දුවම වුණු ගතිය අඩු වෙනවා, පුතාම වුණු ගතිය අඩු වෙනවා, රත්තරන්ම වුණු ගතිය අඩු වෙනවා, මේ ගෙවල් දොරවල් මිල මුදල් යාන වාහන කියන ගතිය අඩුවෙනවා. ඔන්න ඔය ගතිය අඩු වුණොත් එයාට පුළුවන් ධාතුව කියන තැනක මෙහෙට නේද පෙනෙන්නේ කියන එක බලාගන්න. එදාට මෙහෙ බලන්න ඕනෙම නැහැ. කෙළින්ම යථා ස්වභාවයට හිත තබලා **'එහෙ නිසා මෙහෙ'** කියලා බලන්න පුළුවන්.

අද මම මේ ඇත්ත වෙනම කියලා, ආපහු මේ උපාදාය රූපය මහාභූත නෙවෙයි, ඒ නිසා ඇසුරු කරන උපාදාය මට්ටමක් විතරයි කියලා වෙනම මේ කියලා දෙන්නෙ උපායක්. මේ යථාර්ථයට ආවොත් මේ ටික ඕනෙම නැහැ. නමුත් එතෙන්ට ගන්න

බැහැ. ඇයි ඒ? අද අපේ සංයෝජනය බලවත් වැඩියි. උපාදාය රූපය, මහාභූත රූපයක් වෙලා අපට තියෙන්නේ. ඒ තුළ පය ගහලා අපි ඉන්නේ. අපිට මේ වතුරක වැටිලා තියෙන ඡායාවක් නෙවෙයි, මුළු ආත්ම භාවයේම තියෙන ඡායා මාත්‍රයක් නෙවෙයි, මුළු ආත්ම භාවයේම තියෙන ජීවිතයක් වෙලා මේ වර්ණ සටහන තියෙන්නේ. **දිට්ඨේ දිට්ඨ මත්තං** නෙවෙයි අපිට, ආයතන හය නෙවෙයි, ආයතන හයට වැඩි තව ආයතන තියෙනවා නම් ඒවත් ඔක්කොම ක්‍රියා කරවන්න පුළුවන් එකක් හැටියට මේ තියෙන්නේ.

එබඳු තැනක අපේ මනස තියෙන නිසා ඒ බලය අඩු කරන්නයි මේ විදියට මේ පෙන්වන්නේ. එතකොට හොඳට මතක තියාගන්න දැනට බලන්න උපාදාය රූපය කියන තැනින්. ඇහැට පෙනෙන එක උපාදාය රූපයක්, කනට ඇහෙන එක උපාදාය රූපයක් නාසයට දැනෙන එක උපාදාය රූපයක් දිවට දැනෙන එක උපාදාය රූපයක්, හැබැයි කයට ගැටෙන එක මහාභූතයි. එතකොට ඇහැට පෙනුනොත් ඡායාවක්, අත දැම්මොත් නම් වතුරෙ හැප්පෙනවාමයි. ඡායාවේ හැප්පුනේ නැති වුණාට වතුරෙ හැප්පෙනවාමයි. ඒ උපමාවල් අරගෙන මේ අරමුණු දකින වෙලාවට විදර්ශනා කරන්න. හිතට සිහිවෙන කොට, දරුවා කියලා සිහිවෙනකොට හොඳට දකින්න. හිතට සිහිවෙන අරමුණේ දරුවා කියලා මේ පෙනෙන සටහන හොඳට ගන්න, මේ පෙනෙන්නේ හිතට නේද? ඒ පෙනෙන දරුවා අල්ලන්න කියලා ගියොත් මේ අත හැපිලා හිටියි සතර මහාධාතුවේ. නමුත් මෙහෙම සටහනක් ඒ ධාතුවේ නැහැ නේද? මනෝමයෙන් හිතනවා. බලන්න කියලා ගියහමත් ඒ ධාතුව නිසා මෙහෙට පෙනෙයි මිසක පෙනෙන දේ අල්ලන්න කියලා ගියත් අර අත වතුරෙ හැපිලා හිටිනවා වගේ, ධාතුවේ හිටියි. එහෙනම් එහෙ තියෙනවා නෙවෙයි මෙහෙට නේද?

එහෙම යනකොට හොඳට පෙනෙනවා, තියෙන්නේ වතුරෙ ඡායාවක්, පෙනීම් මාත්‍රයක් මිසක, තියෙනවා නෙවෙයි කියන එක පෙනෙනවා. මේ විදියට, ඔන්න ඔය විදියට ටික ටික ටික මේ යද්දි එද්දි වටපිටාව බලද්දි පෙනෙද්දි හොඳට මේ උපාදාය රූපය කියන එක පිරිසිඳ දකින්න උත්සහවත් වෙන්න.

උපාදාය රූපය කියන එක පිරිසිඳ දකින්න කියන්නේ හරයක් නැති බවින් පෙනෙන්න ඕනේ. හරයක් නැහැ කියන්නේ ජීවිතයට පිහිටක්, සරණක් ලබාගන්න පුළුවන් දෙයක් නෙවෙයි. දැන් වතුරක තියෙන ඡායාව දැක්කා කියලා ඒකෙන් පිහිටක් සරණක් ලබාගන්න පුළුවන්ද? හීනෙන් ඔය පින්වතුන්ට මොනවා හරි රූපයක් පෙනුනහම ඒ හීනෙත්, මේ ජීවිතේ සාර්ථක කරගන්න පුළුවන්ද ඒ රූප වලින්? බැහැ. ඒ හීනෙන් පෙනෙන මට්ටමේ රූපමයි මේ දැන් තියෙන්නෙත්.

සුපිනූපමා කාමා - කාමය කියන එක හීනයක් වගේ, මේද හීනයක් ඒද හීනයක්, මේ හැඩේ හීනෙන් දැක්කොත් අපිට කොහොමද පෙනෙන්නේ මේ විදියටමයි. දැන් දැක්කොත් ඒත් එහෙමයි. දැන් එතකොට හීනෙනුත් මෙහෙම නම් පෙනෙන්නේ, හැබැහිනුත් මෙහෙම නම් පෙනෙන්නේ, කෝකටද හීනෙ කියන්නේ? ඇයි මේකට ඇත්ත කියන්නේ? ඇයි මේකට ඇත්ත, ඒකට හීනේ කියන්නේ? හීනෙන් දැක්කොත් මේ හැඩේ මෙහෙමම පෙනෙනවද නැද්ද? පෙනෙනවා. ඒ පෙනෙන කොට මේක වටාපත කියලා පෙනෙනවද නැද්ද? එතකොට පෙනෙන්නෙත් මේ හැඩයම නම් හිතෙන්නෙත් වටාපතම කියලා නම්, ඒක හීනයක්ලු. දැන් පෙනෙන්නේ කොහොමද? මේ හැඩයම පෙනෙනවා. දැන් වටාපත කියලා හිතෙනවද නැද්ද? හැබැහැට පෙනෙන්නෙත් එහෙම නම් දැන් මේකෙ එකක් හීන, එකක් ඇත්ත වුණේ කොහොමද? ප්‍රශ්නයක් තියෙනවා.

පෙනෙන්නෙත් එකම විදියට, දැනගන්නෙත් එකම විදියට, එක පැත්තකට හීනෙලු එක පැත්තක් ඇත්තලු. ඉතින් හීන වෙනවා නම් දෙපැත්තම හීන වෙන්න ඕනේ, ඇත්ත වෙනවා නම් දෙපැත්තම ඇත්ත වෙන්න ඕනේ. එහෙනම් මේ ලෝකයේ අම්මා, තාත්තා, දුවා, පුතා, ගෙවල් දොරවල්, යාන, වාහන කියලා තියෙන්න පුළුවන්ද? බැහැ. එහෙනම් යන්න එපා කව්රුවත්. ඉතිං හීන නම්, යන්න එහෙම දේවල් තියෙනවද? හීනෙන් නැගිට්ටහම ඒ දේවල් වලට ආපහු හොයාගෙන යනවද ඔය පින්වතුන්? මම අහන්නේ ඒවා ඇත්තටම කතා කරන විදියට හීන නම් දැන් යන්න මොනවත් තියෙනවද ඔය පින්වතුන්ට? එහෙනම් යන්නේ? හීනෙත් දැක්කහම පුළුවන්ද නැති තැනක් මවාගෙන යන්න? බැහැ එහෙනම් දැන් යන්නේ? ඒ කියන්නේ මේක ඇත්ත වෙලානේද? හීනයක් කියලා කිව්වට, අපේ කට බොරු කිව්වත් දිව බොරු කියන්නෙ නැහැ කියනවා. ඒ දැකපු එකට හීනයක් කියලා රැවටෙනවා. දැන් මම ඉදිරිපිට හීනයක් කියලා කිව්වට, මේක හීනයක් නෙවෙයි ඔය පින්වතුන්ට මේක ඇත්ත වෙලා තියෙනවා තව ටිකකින් යන එක. හීනයක් නම් යන්න තැනක් නැති වෙන්න ඕනේ. හීනෙනුත් වටාපත ඇල්ලුවොත් ඒ ස්පර්ශයම දැනෙනවා. මනසටත් ඒ ස්පර්ශයම දැනෙනවා

නමුත් මේ අවස්ථාවෙදි මම කිව්වේ ස්පර්ශය ගැන නෙවෙයි, 'පෙනෙන දේ' ගැන. හීනය කියන එක හීනයක් වුණොත්, සැබෑවටම අද මේ දකින, මේ ජේනවා කියන මට්ටමත් ඔය පින්වතුන්ට හීනයක් වුණොත් ඇත්තටම යන්න තැනක් නැති වෙනවා. එහෙම වුණොත් මේ දැන් හිටපු තැන ඉඳලා මේ දැන් පිරිනිවන් පාන්න පුළුවන් ඕනම කෙනෙකුට. එහෙම වුණේ නැහැ කියලා කියන්නේ, මනසට බොරු කරන්න බැහැ, අපි වචන කිව්වට, මේකට හීන කිව්වට, මේක හීන නෙවෙයි. මේක ඇත්ත වුණා කියන කෙළෙසයක් අපේ තියෙනවා තව. ඒ හින්දයි අපි යන්නේ. මම හිතනවා මේක හීන කියලා

කිව්වට මේක ඇත්ත තව ඔය පින්වතුන්ට. හීන වුණොත් ඒකෙ කිසිම වෙනසක් නැහැමයි. හීන ලෝකයෙන් නැගිට්ටහම ඒක හීන මිසක ඒ තුළ ගෙවල් දොරවල්, දූ දරුවෝ, ඒවා ඔක්කොම ආයෙ හොයාගෙන යන්න නැහැමමයි. දැන් මෙහෙම හිටියොත් ඒ ජීවිතයේ ලබපු අත් දැකීම හීනමම මිසක ආයෙ එහෙම දෙයක් එයාට ඇත්තෙමම නැහැ. මේ දැන් ඉඳගෙන ඉන්න අරමුණෝ එහෙමම පිරිනිවන් පාන්න පුළුවන්. ඒ මට්ටමටම එනවා. දැන් අපට තියෙනවා මෙතනදි මෙන්න මෙහෙම එකක්.

මේ දෙකේදි මේකෙ නානත්වයකුත් තියෙනවා, මම ඒක කියලා දෙන්නම්, **මේ පෙනෙන අරමුණත් හීනෙන් පෙනෙන අරමුණත් දෙකම එක මට්ටම.** මේ අරමුණෝදි කාම ආශ්‍රවය අපේ යෙදෙනවා, ඒ නිසා මේ අරමුණ සජීවී වෙලා තියෙනවා, ඒ කෙළෙසයට. හීනෙන් පෙනෙන එකේ කාමාශ්‍රවය යෙදිලා නැහැ. ඒ නිසා ඒක හීන වගේ වෙලා. නැත්නම් මේ අරමුණෝ මට්ටම දෙකම එකයි. මේ කෙළෙසයටයි සජීවි වෙලා තියෙන්නේ. කෙළෙසය අත හැරුණොත් ඒ පෙනෙන මට්ටමයි, මේ පෙනෙන මට්ටමයි වෙනසක් ඇත්තෙම නැහැ. රහතන් වහන්සේලාට මෙහෙම ගෙවල් දොරවල්, යාන වාහන, මිල මුදල්, දූ දරුවො කියන අය ඉන්නවද? මේ මොකුත් නැහැ. ගහක් යටද හිටියේ, ඉන්න තැනක පිරිනිවන් පාන්න පුළුවන් එහෙමම. ඒකයි ***සුපිනූපමා කාමා*** - කාමය හීනයක් වගේ කියන තැනට ආපු දවසටයි අපි ලෝකයෙන් මිදෙන්නේ.

අද මේ ඇහැට පෙනෙන දේ ඇත්තයි කියලා අපිට ඇත්ත වෙලා තියෙන්නේ, කාම ආශ්‍රවය කියන කෙළෙසය යෙදෙනවා මේ අරමුණෝ. ඒ කෙළෙසයට මේ සජීවි වෙලා තියෙනවා මිසක අරමුණ ඇත්ත හින්දා ඇත්තට පෙනිලා නෙවෙයි මේ. හිතට මේ හැඩය පෙනුනට ඒක හීනයක් වුණේ, ඒ අරමුණෝ මේ ආශ්‍රවය දුබලයි. ඔය පින්වතුන්ට මේ පෙනෙන අරමුණොන් ඒ ආශ්‍රවය දුබල වුණොත්, මේ පෙනෙන මට්ටමත් හීනයක්මයි. මේ කෙළෙසයට මේ සජීවී වෙලා මිසක, මේ කෙළෙසයට මේ මට්ටම ඇත්ත වෙලා මිසක මේක ඇත්තටම තිබුණ හින්දා හෝ අල්ලන්න පුළුවන්කම හින්දා හෝ වත්, අරක ඇත්තටම නැහැ, අල්ලන්න බැරි හින්දා හෝ වත් නෙවෙයි. මට්ටම් දෙකම එකයි. මේ කෙළෙසයට පංචායතනයේදි කාමාශ්‍රවය යෙදෙනවා අපිට. මේ ආශ්‍රව බලවත්ව යෙදුණු නිසයි සජීවී වෙලා ඇත්තම වෙලා තියෙන්නේ,

එතකොට දකින්න මේ ඇත්ත වෙලා තියෙන්නේ ඇත්තටම කෙනෙක්, ලෝකයක් තියෙන නිසා නෙවෙයි, අපේ මනසේ තියෙන කෙළෙසය නිසයි. ඒකට උපමාව තමයි ඒ කෙළෙසය අඩුවෙන් යෙදුණු මේ මට්ටමම අපේ මනසේ, ඒක හීනයක්. ඔය පින්වතුන්ට මේ පෙනෙන මට්ටමේදි, පෙනෙන අරමුණොත් ආශ්‍රව අඩු වුණොත් කෙළෙස් අඩු වුණොත් ලැබෙනවා, මොකක්ද? **අද ඇත්ත වුණු එක හීනයක් වෙන දවසක් එනවා.** එදාට හීනෙට

අඬන්නේ නැහැනේ. හීනයක් දැක්කා ඉවරයි හීනයක් දැකලා නැගිට්ටහම කෑගහලා අඬනවද? මේකත් එහෙමයි කෙනෙක් හම්බ වුණා කියන්නේ හීනයක් දැක්කා වගෙයි. ආපහු යනකොට ආයෙ අඬන්න එහෙම දේවල් නැහැ. හීනෙ මට්ටමට මේ මට්ටමත් හීනයක් වෙන්නේ ආශ්‍රව අඩු වුණහමයි. ආශ්‍රව අඩු වෙන්නේ නාම-රූප දෙක පිරිසිඳ දැක්කොත්. 'එහෙ නිසා මෙහෙට එනවා' කියලා දැක්කොත්. ඒක දකින්න නම් වෙනවා මෙහෙම (බාහිරය) බලන ගතිය අඩු වෙන්න ඕනෙ. බලන ගතිය අඩු වෙනවා මහාභූත සහ උපාදාය කියන රූප දෙක පිරිසිඳ දකින්න. මෙහෙම පෙනෙනවා කියන එක උපාදාය රූපයක්, පෙනෙන දේ පවතින්නේ මෙහෙම මහාභූතයක පිහිටලා. අපිට මෙහෙම පිහිටි තැනක මෙහෙම පෙනෙනවා. පෙනුනට මේක තියෙනවා නෙවෙයි.

ජලය සහ ජලයේ තියෙන ඡායාව වගේ දේවල් උපයෝගී කරගෙන, වැලි කැට සහ කන්ද උපයෝගී කරගෙන, මිරිඟුව සහ පෙනෙන සංඥාව උපයෝගීකරගෙන මේ වගේ උපමා උපමෙයිය දිදී පහුරු ගගා බලන්න. හැම වෙලාවෙම හිත හිතා, අවුස්ස අවුස්සා ***පඤ්ඤාමය යුග නංගලං*** - ප්‍රඥාව නගුල් හිසක් වගේ කියලා කියන්නේ, හාරලා බලන්න. ඒ විදියට එහෙම උත්සාහවත් වෙනකොට, වීරිය කරනකොට, ඝටනකොට, වෑයම් කරනකොට, බලනකොට තමයි ටික ටික කෙළෙස් දුරුවෙන්නේ.

එහෙම නැත්නම් මේ පොහොයට සිල් ගත්තා, ආයුධ කට්ටල ටික ඔක්කොම පැත්තකට දැම්මා, කෑගහලා වෙනදා වගේ ඉන්නවා. ආයෙත් පෝය දවසට පන්සලට එනවා ඔබ වහන්සේට පුළුවන් නම් අපිව නිවන් දක්වන්න කොහොම හරි. ඉතින් හාමුදුරුවන්ගෙ බලයට තමයි නිවන් දක්වන්න හදන්නේ. ඉතින් ආයෙත් අහගත්තා, ආපහු ගෙදර ගියා, ආයෙත් සිල් ඇඳුම් ටික බලන්නේ පෝයට ඉස්සෙල්ලා දවසේ. එහෙම හරියන්නේ නැහැ. තමන්ට උවමනාවක් තියෙන්න ඕනේ මේ කියලා දෙන දේ, හාමුදුරුවෝ මහන්සි වෙලා කියන දේ අපිත් කරන්න ඕනේ වීර්ය කරන්න ඕනේ, සසර ගෙවා ගන්න ඕනේ කියලා, ඒද නිකම් හිතන්නේ නැහැ. ගන්න අරමුණෝ තමන් හොඳට දක්ෂ වෙනවා උපමා උපමෙයිය දීලා, තව කෙනෙක් තව කෙනෙකුට උගන්වනවා වගේ, තමන් තමන්ට උගන්වන්න ඕනේ. මෙහෙම පෙනෙන කොට, ජේනවා කියන දේ ඇත්ත වෙනකොට, මේ පෙනෙන දේ හිතට පෙනීම් මාත්‍රයක් විතරයි. ඇයි එහෙම කියන්නේ? තමන්ම තමුන්ගෙන් ප්‍රශ්න කරන්න ඕනේ. එහෙම කියන්න හේතුව, මෙතන තියෙන්නේ මහාභූත නේ. මහාභූත තියෙන තැනක මෙහෙම පෙනෙනවා නේ. කොහොමද එහෙම කියන්නේ? ඔන්න එතකොට තමන්ම උපමාවක් ගන්නවා. හොඳයි වතුරකට ඡායාවක් වැටුනහම ඒ වැටුණු ඡායාව අල්ලන්න පුළුවන්ද? තමන්ම හිතනවා මේ හිතෙන්. මේකට අත දැම්මොත් අත හැපී හිටියි මේ වතුරෙ, ඒ වගේ නේද මේ පෙනෙන දේ. මහාභූත තියෙන තැනක පෙනුනට, මේක අල්ලන්න ගියොත් අත හැපිලා හිටින්නේ මහාභූතයක මිසක පෙනෙන දේ නෙවෙයිනේ.

ඔන්න මුලදි මුලදි නොතේරුනාට, ටිකක් දවස් යනකොට යනකොට මේ උපමාව හිතට ගැලපෙනවා. මුලදි බැලුවට උපමාවවත් හිතට සැසඳෙන්නේ නැහැ. එච්චරට අපේ මනස රළුයි. ටිකක් යනකොට උපමාව හිතේ හොඳට හැපිලා හිටිනවා. ටිකක් දවස් යනකොට ආයෙත් බලනකොට ඒකට කරුණු කාරණා ඉදිරිපත් නොකර පිළිගන්න මට්ටමට එනවා. ටික දවසක් ආයෙ බලන කොට තමන්ට හොඳට තේරෙනවා, ඇත්ත තමයි. ඔහොම යනකොට උපමාව සිහිකරන්න ඕනේ නැහැ, 'පෙනෙන දේ මනසනේ' කියන එක සිහිකරගන්න පමණකින් තමන්ට අර්ථෙ තියෙනවා. මේ වගේ ටික ටික ටික ටික දියුණු වෙන්න ඕනේ එකපාරටම ගෙඩි පිටින්ම කන්න බැහැ.

ඒ වගේ, අපි බණ අහලා අහලා කොයි වෙලාවෙ හරි එක පාරටම නිවන් දකියි කියන තැනකින් වගෙයි ඉන්නේ. එහෙම බැහැ. ටික ටික ටික ටික උත්සහවත් වෙන්න. ඒ සඳහායි මේ බණ අහන්නේ, උපමා උපමෙයිය කියන්නේ. ඒ කියන දේවල් ජීවිතය කරගන්න. මේවා අහලා නිකම් ඉන්න නෙවෙයි, මේ විදර්ශනාවට කමටහන්. අපි භාවනා කරනකොට භාවනා කරගන්න බැහැ, වෙන්නෙ නැහැ, පෙනෙන්නෙ නැහැ අරමුණ. එතකොට ඒකට උපකාර පිණිස තමයි මේ ධර්මය අහගත්තා කියලා කිව්වේ, හාමුදුරුවො එදා මෙහෙම උපමාවක් කිව්වා නේද? ඒ උපමාව හොඳට සම්මර්ශණය කරනවා. සම්මර්ශණය කරන කොට උපමාව හොඳට ඉස්සෙල්ලා වැටහෙනවා. ඊට පස්සේ තමන් පැටලෙන අරමුණේ, රැවටෙන අරමුණේ උපමාව තබනවා. 'මේ පෙනෙන තැනත් ඒ වගේනේ. අපිට මෙහෙම පෙනුනට මේ සිද්ධිය මෙහෙමනේ' කියලා බලනවා. අපි මෙහෙම බලනකොට තමන්ට ටිකක් විසඳෙනවා මේ ප්‍රශ්නේ.

ඔය විදියට, ඔය විදියට ආයෙත් හිතනවා. ආයෙත් ඔහොම හිතලා ආනාපාන සතිය, මෛත්‍රී වගේ සමථ කමටහනක් වඩනවා. ආයෙත් උපදින අරමුණ මෙහෙම මෙනෙහි කරනවා. ආයෙත් සමථ කමටහනක් වඩනවා. ආයෙත් මෙහෙම මෙනෙහි කරනවා. ඔය විදියට යනකොට නොබෝ දවසකින් තමන් කෙරෙහි වූ, තමන්ටම නුවණක් පහළ වෙනවා. හැමදාම අනුන්ගේ අතේ, අනුන්ගේ ඇඟිල්ලේ එල්ලිලා යන්න ඕනේ නැහැ. අනේ මේක මොන තරම් ඇත්තක්ද? අපි මොනතරම් රැවටීමකද ඉන්නෙ, කියන එක. පෙනෙන දේ හීනයක් කියන එක පෙනෙන මට්ටමටම එනවා. ඒ විදියට හැමදෙනාම ටිකක් බලන්න.

මම විටෙක **මහාභූත නිසා පෙනෙන දේ උපාදාය රූපයක් කියලා බලන්නත්, එක වෙලාවකට උගන්වනවා. විටෙක ස්කන්ධ පංචකයක් කියලත් උගන්වනවා. මේ ධර්මතා දෙකක් නෙවෙයි, එකම සිද්ධිය,** මේක අවස්ථා දෙකකින් ගත යුතුයි. උපාදාය රූපයක් කියලා

කියන්නේ මේ ඉන්න තැනේ බලය අඩුකරන්න.

නාම-රූප දෙකක් මේ ස්කන්ධ පංචකයක් කියලා කියන්නේ මේ පවතින යථාස්වභාවයෙන් බලන්න. අන්තිමට ගත්තහම මෙහෙම උපාදාය කියලත්, මහාභූත කියලා බලලත් ආයෙ එන්න වෙන්නේ මෙතෙන්ටමයි. මේ එක පාරට මෙහෙම බලන්න බැරි නිසයි මෙහෙම කියන්නේ. එතකොට ඒ උපාදාය රූප කියපු ඔක්කොම රූපවල ගතිය හිතට නගාගන්න අර වතුරෙ තියෙන ඡායාව වගේ කියලා. උපාදාය රූප කියන ඔක්කොම, එතකොට ඒ වතුරේ තියෙන ඡායාව ඇහැට අයිතිත් නැහැ, හිතට අයිතිත් නැහැ, වතුරට අයිතිත් නැහැ. නමුත් ඒවා ටික නිසාම පෙනෙනවා. ඇසුරු වෙනවා. නමුත් එකකටවත් අයිති නැහැ. ඒ වගේ මේ **දැකීම දැකීම් මාත්‍රයක් පමණයි. ඇසීම ඇසීම් මාත්‍රයක් පමණයි, කියලා උපාදාය රූපත් ඒ වගේම දකින්න.**

උපාදාය රූපයන්ගේ 'රළු' සහ 'සියුම්' රූප

ඔය පටිච්ච සමුප්පාද ධර්මයේ ඔය පින්වතුන් අහලා ඇති 'අවිද්‍යා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං' කියලා මේ කාරණා ටිකක් තියෙයිනේ, ඒකෙදි අපි මෙතැනදි කෙටි කරලා, සරල කරලා ගන්නවා එක දෙයක්. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා රූපය කියන එක යම්කිසි කෙනෙක් පිරිසිඳ දැක්කොත්, නාමධර්ම පැත්තකින් තැබේවා, නාමධර්ම ඕනේ නැහැ **රූපය පිරිසිඳ දැක්කොත් අනාගාමී ඵලයට පත්වෙන්න පුළුවන්.** හැබැයි එයා රූපය පිරිසිඳ දකින කොට කරුණු ටිකක් තියෙනවා දැන ගන්න.

ඉති රූපං, ඉති රූපස්ස සමුදයෝ, ඉති රූපස්ස අත්ථංගමෝ මේ රූපයයි, මේ රූපයේ ඇති වීමයි, මේ රූපයේ නැති වීමයි කියලා රූපයත්, රූපයේ ඇති වීමත්, නැති වීමත් නැති කරන මගත් දැන ගන්නට ඕනේ. ඔය ටික දන්න කෙනාටයි, රූපයත් දන්නවා, රූපය ඇති වුණු හැටිත් දන්නවා, ඒ රූපය නැති වෙන හැටිත් දන්නවා රූපය නැති කරන මගත් දන්නවා කියන තැනක් තියෙනවා නම් අන්න එයාටයි රූපය පිරිසිඳ දකින්න පුළුවන්.

උපාදාය රූප

ඕදාරික (රළු) ⑩

සුඛුම (සියුම්) ⑭

1. ඉත්ථි ඉන්ද්‍රිය
2. පුරුෂ ඉන්ද්‍රිය
3. ජීවිත ඉන්ද්‍රිය
4. කාය විඤ්ඤප්ති
5. වචී විඤ්ඤප්ති
6. ආකාශ ධාතු
7. රූපස්ස ලහුතා
8. රූපස්ස මුදිතා
9. රූපස්ස කම්මඤ්ඤතා
10. උපචය
11. සන්තති
12. ජරතා
13. අනිච්චතා
14. කබලිංකාරාහාරය

සටහන 3

රූපය දන්නවා නම්, රූප සමුදය දන්නවා නම්, රූප නිරෝධය දන්නවා නම්, රූප නිරෝධ ගාමිනී පටිපදාව දන්නවා නම් එයාට කියනවා බුදුරජාණන් වහන්සේ, රූපය දැකලා රූප සමුදය, රූප නිරෝධය, රූපය නිරෝධ කිරීම පිණිස යමෙක් පිළිපන්නා නම්, **තේ ලෝකේ සුපටිපන්නෝ** - අන්න සුපටිපන්න ගුණය පෙන්වනවා. රූපය ගැන, රූප සමුදය ගැන, රූප නිරෝධය දැන, රූප නිරෝධ ගාමිණී පටිපදාව ගැන දන්න කෙනා
යේ සුපටිපන්නා තේ ඉමස්මිං ධම්මවිනයේ ගාන්ධී - සුපටිපන්නයි. යමෙක් සුපටිපන්න නම් එයා මේ ධර්මය දැක්ක කෙනෙක්. ඒ නිසා අපි රූපය කියන එක ටිකක් තේරුම් ගන්න උත්සහවත් වෙමු.

මේ රූපය කියන එක තේරුම් ගන්න අපිට මේ රූපයේ ඇත්ත ඇති හැටිය පවතින ස්වභාවයම දැන ගන්න වෙනවා මිසක ආයෙ අනිත්‍යයි කියලා බලලා, කෑලි කෑලි වලට කඩලා බලලා, වෙන් වෙන් කරලා බලලා හැම රූපයක්ම තේරුම් ගන්න බැහැ. ඒ හින්දා රූපය කියන එක තේරුම් ගන්න පුළුවන් ප්‍රමාණයක් තියෙනවා. මේ රූපය පිරිසිඳ දකිනවා නම්, කාම භූමියට එන හේතුව නැති කරන්න නම්, රූපය පිරිසිඳ දකින්න ඕනේ. රූපය පිරිසිඳ දකින්න නම් රූපයේ තියෙනවා ප්‍රධාන වශයෙන් ප්‍රභේද විසි අටක්.

මේ විසි අට රූපයම හොඳට දැන ගන්න ඕනේ. දැන ගත්තහමයි කන බොන ආහාරයෙන් හැදෙන මේ රූපයේ තියෙන පුද්ගල භාවය අතහැරෙන්නේ. එතෙක් මම නෙවෙයි, මගේ නෙවෙයි, මගේ ආත්මය නෙවෙයි කියලා කිව්වට කවදාවත් කෙළෙසය නැති වෙන්නේ නැහැ. රූපය මම නෙවෙයි නම්, මගෙ නෙවෙයි නම්, මගෙ ආත්මය නෙවෙයි නම්, 'මම නෙවෙයි, මගෙ නෙවෙයි, මගෙ ආත්මය නෙවෙයි' කියලා කියන්නේ ඇයි කියලා සහේතුකව කරුණු ඉදිරිපත් කරන්න වෙනවා.

ඔය පින්වතුන්ගේ ගෙදර තව කාගෙ හරි කියලා කව්රු හරි නඩුවක් දැම්මොත්, ඔය පින්වතුන් ගිහිල්ලා නඩුකාරයට 'නැහැ නැහැ ඒක මගෙ' කියලා කටවචනෙන් කිව්වොත් නඩුකාරයා ඒක දෙනවාද? දෙන්නේ නැහැ. ඔය පින්වතුන්ට ඔප්පු තිරප්පු පෙන්වන්න වෙයි, ලයිට් බිල් පෙන්වන්න වෙයි. ඔය පින්වතුන්ගේ බව ඔප්පු කරලා පෙන්වන්න වෙයි. ඒ වගේ ඇහැ මම නෙමෙයි, මගෙ නෙවෙයි, මගෙ ආත්මය නෙවෙයි කියලා කියන්න නම් ඒක ඔප්පු වෙන කරුණු ටික පෙන්වන්න වෙනවා. ඒ නිසා මේ ටික අපි ඉස්සෙල්ලාම බලමු.

මේ රූපයේ මහාභූත රූප හතරක් සහ උපාදාය රූප විසි හතරක් තියෙනවා. (සටහන 1)

ඒකෙදි හොඳට අපි බලමු, මහාභූත ටික කෙටියෙන් ගත්තහම කෙස්, ලොම්, නිය, දත්, හම්, මස් නහර කියලා තියෙන තද වශයෙන්, රළු වශයෙන් තියෙන ප්‍රධාන කොටස් ටික හැදිලා තියෙන්නේ පඨවි ධාතුවෙන්. පිත, සෙම, සැරව, ලේ, දහඩිය කියන මේ කොටස් ටික හැදිලා තියෙන්නේ ආපෝ ධාතුවෙන්. එතකොට ශරීරයේ තියෙන ආහාර පාන දිරවන උෂ්ණයක් තියෙයි නම්, ජීවිතය ජීවත් කරවන සන්තති තේජෝ ධාතුව කියලා ජීවිතේ ජීවත් කරවන්න අවශ්‍යය උෂ්ණත්වයක් තියෙයි නම් ඒක තේජෝ ධාතුව. ඊට පස්සේ කෙස් පැහෙනවා හම රැලි වැටෙනවා කියලා ශරීරයේ ඉන්ද්‍රියයන් මුහුකුරණ ඒ කොටස් තේජෝ ධාතුව.ඊට පස්සේ වාත කොටසුත් තියෙනවා. අශ්වාස ප්‍රශ්වාස වාතය, ඉක්කා ඔක්කා වාතය, අතපය නමන්න දිගහරින්න පුළුවන් වාතය, මේ වගේ වාත කොටස් හතරකුත් තියෙනවා, වායෝ ධාතුව කියලා.

මේ ශරීරයේ ප්‍රධාන පිහිටීම, ප්‍රධාන කණුව, ප්‍රධාන ටැඹ ඔන්න ඔය ධාතු හතර. බාහිර ගස් වැල්වල තියෙන තද ගතියක් තියෙයි නම්, කෙස්,ලොම්, නිය, දත් වල තියෙන තද ගතියක් තියෙයි නම් මේ දෙකම සමානයි. එහෙනම් මේ කෙස්, ලොම්, නිය, දත්, සම්, මස් වල තියෙන තද ගතිය පුද්ගලයෙක්, සත්වයෙක් නෙමෙයි. බාහිර ලිං, වැව්, පොකුණුවල තියෙන ගලන වැගිරෙන ගතියක් තියෙයි නම්, පිත, සෙම්, ලේ, සැරව වල තියෙන ගලන වැගිරෙන ගතියක් තියෙයි නම් දෙකම සමානයි. බාහිර ගිනි ගොඩක, පහන් දැල්ලක යම් උෂ්ණයක් තියෙයි නම්, මේ ශරීරයේ උෂ්ණයක් තියෙයි නම් දෙකම එකයි. බාහිර හමන සුළඟක් තියෙයි නම් මේ ශරීරයේ වායෝ ස්වභාවයක් තියෙයි නම් දෙකම එකයි. ඔන්න ඔය බාහිර සතර මහාධාතුන්මයි මේ ශරීරයේත් තියෙන්නේ.

මේ සතර මහාධාතු ටික තව පැත්තකින් බෙදලා ප්‍රකට වශයෙන් කෙස් ලොම් නිය දත් සම් මස් නහර කියලා කුණප කොටස් තිස් දෙකක් තියෙනවා කියලා අපි කියනවා. ඔය සතර මහාධාතුව හැදිලා තියෙන්නේ මොකකින්ද කියලා දන්නවාද? කන බොන ආහාරයන්ගෙන්. බත්, පාන්, කව්පි, මුං ඇට වගේ, අපි දවස ගානෙ කන්නේ, ඒ කන බොන ආහාරයට තමයි මේ රූපය හැදිලා තියෙන්නේ. ආහාර කියලා කියන්නේ පාලි වචනයක් ***ආහරතීති ආහාරෝ*** - ඵලයක් ගෙන එන නිසා ආහාරයි කියලා කියනවා. පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා කියලා මේ අෂ්ඨමක රූප කලාප හදන නිසා කන බොන ආහාරයට, 'ආහාරයි' කියලා කියනවා. ඔන්න මේ කන බොන ආහාරය නිසා තමයි මේ ශරීරය හැදිලා තියෙන්නේ. මේ සතර මහා ධාතු. තව පැත්තකින් අපිට හම්, මස්, ලේ, නහර කියලා මේ තියෙන්නේ කන බොන ආහාරයමයි. කොහොඹ ඇටයක් හිටෙව්වහම හට ගන්න ගහ වෙන එකක් වෙන්නේ නැහැ හටගන්නේ කොහොඹ ගහක්මයි. කන බොන බත්, පාන්, කව්පි, මුං ඇට සත්වයෙක් පුද්ගලයෙක් නෙවෙයි නම්, අනාත්ම නම් එයින් හට ගන්න ඵලය ආත්ම වෙන්නේ නැහැ. ඒකත් අනාත්මමයි.

එතකොට අපි ඌරෙක්, කුකුළෙක්, හරකෙක් ගත්තම ඒ ශරීරය එයාට තමන්ගේ ඇඟ. කුකුළට ඒ ඇඟ එයාගේ ඇඟ ඌරට එයාගේ ඇඟ. තමන්ගේ ඇඟ. හරකට එයාගේ ඇඟ තමන්ගේ ඇඟ. ඒක අපිට සාපේක්ෂව ආහාරයක්. මේක, අපේ ඇඟ. කොටියෙක් හරි සිංහයෙක් හරි කෑවොත් එයාට ඒක ආහාරයක්.

එතකොට කෙනා කෙනා කබලිංකාරාහාරයටයි මම, මම කියාගෙන ඉන්නේ. ඔය තමයි කබලිංකාරාහාරයෙන් හැදුණු රූපය. මේ රූපයේ ඇත්ත.

මේ ශරීරයෙන් කෙස් ටිකක් කපලා බිමට දාන්න. කෙස් කියලා පෙනෙයි, මම කියලා පෙනෙනවද? ලොම් ගස්, නියපොතු, හම්, මස් කෑල්ලෙන් කෑල්ල අහකට දාන්න. ඒ කොටස් පෙනෙයි, මම පේන්නේ නැහැ. අදත් තියෙන්නේ එහෙම කොටස් ටිකක්. කනබොන ආහාරයෙන් හැදිලා තියෙන්නේ.

ඊට පස්සේ තව පොඩි කරුණක් මේකෙ තියෙනවා. ඔය ප්‍රධාන කොටස් හතර. උපාදාය රූප කියලා විසි හතරක්. උපාදාය රූප කියන්නේ 'මහාභූත නිසා ප්‍රකට වන චිත්ත චෛතසික ටික උදව් කරගෙන, සිත සහ සිතුවිලි උදව් කරගෙන ඔය සතර මහාධාතු රූපයේ හැදෙන' ගති විසි හතරක් තියෙනවා තව. ඔය ප්‍රධාන රූපයේ හැදෙන ගති විසි හතරක් තියෙනවා චිත්ත චෛතසික ටික නිසා හැදෙන. ඔන්න ඔය ටික නොදන්නාකම හින්දයි ඔය පින්වතුන් මේ රූපය කෙනෙක්, පුද්ගලයෙක් කියලා රැවටෙන්නේ. ඔය ප්‍රධාන හතර, සතර මහාධාතු කන බොන ආහාරයෙන් හැදුණු රූපය. හරියට සිහිපත් කරගන්න මළ මිනියක් වගේ. මළ මිනියක තියෙන්නේ හරියටම කන බොන ආහාරයෙන් හැදුණු පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන ගති හතරෙන් යුක්ත රූපය විතරමමයි, මහා භූත රූපය.

ඊට මෙහා පුද්ගලයෙක්, සත්වයෙක්, කෙනෙක් කියලා රැවටෙන්න, මේ කන බොන ආහාරයෙන් හැදුණු රූපයේ බැදිලා තියෙන සිතෙන් කෙරෙන වැඩ ටිකක් තියෙයි. අනිත් පැත්තෙන් ගත්තොත්, අපි කියමු උපාදාය රූප විසි හතරක් තියෙනවා. උපාදාය කියන්නේ 'මහාභූත' නිසා, 'මහාභූතයන් ඇසුරු කරගෙන' පවතින උපාදාය රූප විසි හතරක්. ඒකෙදිත් තියෙනවා **රළු රූප** සහ **සියුම් රූප** කියලා කොටස් දෙකක්. රළු රූප දහයක් තියෙනවා. රළු කියලා කියන්නේ ගැටීමක් ඇති වෙන්න පුළුවන්, ගැටෙන්න පුළුවන් රූප වලට රළුයි කියලා කියනවා. ඇහැ රළුයි කියනවා රූපය ගැටෙන හින්දා, රූපයට රළුයි කියනවා ඇහේ ගැටෙන හින්දා. කනට රළුයි කියනවා ශබ්දයේ ගැටෙන හින්දා, ශබ්දය රළුයි කියනවා කනේ ගැටෙන හින්දා. නාසයට රළුයි කියනවා ගන්ධයේ ගැටෙන හින්දා, ගන්ධයට රළුයි කියනවා නාසයේ ගැටෙන හින්දා. දිවට රළුයි කියනවා රසයේ ගැටෙන හින්දා, රසයට රළුයි කියනවා දිවේ ගැටෙන හින්දා. කයට රළුයි කියනවා

බාහිර වස්තූන්ගේ, පොට්ඨබ්බයේ ගැටෙන නිසා, පොට්ඨබ්බයට රළුයි කියනවා කයේ ගැටෙන හින්දා. ඔය රළු රූප දහය.

ඔය වගේ අපි දැනගත්ත මට්ටම් වලට වඩා විශේෂයෙන්ම දැන ගත යුතු ගොඩාක් ඇත්තක් තියෙනවා. නමුත් ඒ ටික නිතර අහන්න ලැබෙන හින්දා මම පොඩ්ඩක් ඒ ටික පැත්තකින් තියන්නම්.

ධම්මායතනය පරියාපන්න 'සුඛුම රූප'

තව දාහතරක් තියෙනවා සියුම් රූප. ඒ සියුම් රූප දාහතර මම පොඩ්ඩක් විස්තර කරන්නම්. මෙන්න මේ රූප විසි හතර හරියට තේරුම් ගත්තොත් පුද්ගලභාවය නොගෙවුනොත් තමයි පුදුමෙ. හැබැයි ඒක හරියට පෙනෙන මට්ටමට එන්න ඕනේ. ඉස්සෙල්ලා දැනගන්න ඕනේ, දැකගන්න බැහැ දැනගත්තේ නැත්නම්. ඉඩ ලැබුණොත් අපි ඔය රළු රූප දහය ගැන විස්තර කරමු. අපි ඒක කරලා තියෙන හින්දා මම මේ සියුම් රූප ටික විස්තර කරනවා. ඔයගොල්ලො හොඳට ටිකක් නුවණින් තේරුම් කර ගන්න උත්සාහවත් වෙන්න.

ප්‍රධාන රූපය තමයි, රූප දෙකක් තියෙයි මේ සියුම් රූප වල, ඉත්ථි ඉන්ද්‍රිය රූපය සහ පුරුෂ ඉන්ද්‍රිය රූපය කියලා. අපි ස්ත්‍රියක් කියලා, පුරුෂයෙක් කියලා ක්ෂණිකව රැවටෙනව නේ, ඊට ඇලුම් කරනවානේ. නමුත් අපි ආස කරන ආදරය කරන ස්ත්‍රිය හරි පුරුෂයා හරි හැදුණේ කොහොමද කියලා බලා ගන්න ඒ ඉත්ථි ඉන්ද්‍රිය රූපය සහ පුරුෂ ඉන්ද්‍රිය රූපය කියන එක තේරුම් ගන්න ඕනේ.

ඔය සුඛුම රූප ටික සුඛුම කියන්නේ 'සියුම්' අවබෝධයට ඉතාමත් දුෂ්කර නිසා, ගැටීමක් ඇති වෙන්නේ නැති නිසා, ගැටීම් කෘත්‍යයක් නැති නිසා, කවදාවත් දකින්න බැරි නිසා, කවදාවත් අල්ලන්න බැරි නිසා,. නුවණින්ම විතරක් දැකිය යුතු නිසා මේකට සුඛුම රූප කියලා කියනවා. මේ සුඛුම රූප කවදාවත් ඇහෙන් දකින්න බැහැ. කවදාවත් අල්ලන්න බැහැ. කවදාවත්ම මේ සුඛුම රූපයක් ගැටෙන්නේ නැහැ තව යමක. ඒක නුවණින්ම අවබෝධ කරගත යුතුයි. ඊට පස්සේ රූප කලාප කඩ කඩා බලන්න බැහැ. එහෙම නැත්නම් රූප කලාප මේ තුළ නැහැ, මේ සුඛුම රූප ඇතුළේ එහෙම දේවල් නැහැ.

සුඛුම රූප කියන එක ධම්මායතනය පරියාපන්නයි. ධම්මායතනය කියලා කියන්නේ, සිතේ තියෙනවා වේදනා, සංඥා, සංඛාරා කියලා චෛතසික තුනක්. ඔය විඳීම,

හැඳිනීම. සංඛාර. කියන කොට ඒක ටිකක් ලොකු ගොඩක්. ගති පනහකින් යුක්තයි සංඛාර ස්කන්ධය. හැම එකකම ගති පනහ නැහැ හැම සංස්කාර ස්කන්ධයකම. **මේ වේදනා, සංඥා, සංඛාර කියන ගති ටිකට එකතු කරලා තමයි 'ධම්මායතනය' කියලා කියන්නේ. මනෝ ධාතු, ධම්ම ධාතු කියලා කියන්නේ ධම්ම ධාතු කියන කොට විඳින බව හඳුනන බව, කල්පනා කරන බව, තව සියුම්, සියුම් ගති ගොඩාක් තියෙනවා. ඔක්කොම එකතු කරලා සංඛාර ස්කන්ධය කියනවා. ඔය ටිකට තමයි ධම්මායතනය කියලා කියන්නේ.**

ඔය ධම්මායතනය අනුව ගිය රූප ටිකක් තියෙනවා. ඔය හිතේ තියෙන ගති ටික මේ කන බොන ආහාරයෙන් හැදුනු රූපයෙන් තමයි ප්‍රකට වෙලා තියෙන්නේ.

* * *

මේ **ඉත්ථි ඉන්ද්‍රිය, පුරුෂ ඉන්ද්‍රිය,** කියන ටික මේ කන බොන ආහාරයෙන් හැදුනු පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතර මහාධාතුවේ හැකියාවක් නෙවෙයි. සතර මහාධාතුවේ ස්ත්‍රී සතර මහාධාතු, පුරුෂ සතර මහා ධාතු කියන ඒවා නැහැ. ස්ත්‍රී පඨවි, පුරුෂ පඨවි, ස්ත්‍රී ආපෝ, පුරුෂ ආපෝ කියලා තියෙයිද? එහෙම ඒවා නැහැ. මේ ස්ත්‍රියක් පුරුෂයෙක් කියලා ලෝකයේ ව්‍යවහාර කරන විදිහටම රූපයක් හදන්න පුළුවන්කම - අර හැදුණු සතර මහා ධාතු රූපය - හරියට අපි කළු ගලක් තැබුවා වගේ තමයි. ඒකේ ලස්සන කැටයමක් හදනවා වගේ තමයි උපාදාය රූප ටික. කෙනෙකුගේ හිත ඇදලා ගන්න පුළුවන් විදිහේ කැටයමක් හදනවා වගේ තමයි මේ උපාදාය රූප ටික. ඔය සතර මහා ධාතු රූපය ස්ත්‍රියක් කියලා, පුරුෂයෙක් කියලා ව්‍යවහාර වෙන, දකින්න පුළුවන් විදියට සතර මහා ධාතු රූපය හැඩකරන්න පුළුවන් කමට ඉත්ථි ඉන්ද්‍රිය, පුරුෂ ඉන්ද්‍රිය කියනවා. ඒක තියෙන්නේ සිතේ තියෙන අරගති ටිකේ. ධම්මායතනයේයි තියෙන්නේ ඒක. ඒ කර්මයෙන් උපන්න රූපයක්. කර්මජ රූපයක්. කර්මයට හටගත්ත එකක්.

ඕකට මම කියන්නේ. අපි තල් ඇටයක් හරි, පොල් ගෙඩියක් හරි පොළොවේ වල දැම්මොත්, පහු කාලෙදි බීජ අංකුරයක් ආවොත් පොළොවේ තියෙන පස්, ගිනි, දිය, සුලං කියන සතර උරාගෙන, ඔය හතරේ අනුග්‍රහය ලබාගෙන අතු ඉති බෙදෙන්නේ නැතුව ගහක් හැදෙයි. අතු ඉති බෙදෙන්නේ නැතුව ගහක් හැදුනේ පස්, දිය, ගිනි, සුලං කියන හතරේ හැකියාව නිසා නෙවෙයි. පස්, ඇදලා ගන්න ආහාරය, පස්, දිය, ගිනි, සුලං කියන හතර අතු ඉති බෙදෙන්නේ නැතුව හදන්න ඕනේ කියන ගතිය, ගහ හදන්න ඕනේ කියන ගතිය, තිබුණේ බීජයේ. තල් ඇටය තුළ, පොල් ගෙඩිය තුළ. ඒ බීජය නිසා එකතු වුණු ගතිය නිසා හැදුනු ගහ තමයි අපිට පෙනෙන්නේ. තාල වර්ගයේ ගහක් කියන කොට, තාල

වගීය කියන එක තියෙන්නේ ඇටේ ඇතුළෙ. ඒ නිසා, ඒ වගීය නිසා හදපු ගහ මේ තියෙන්නේ. මොකද ඒ ගහ හැදුනේ නැවතත් එහෙම බීජ හදන්න පුළුවන්කම ඒකේ තියෙනවා. නුග ඇටයක් ගත්තොත් ඒකෙ අතු බෙදිලා, ඉති බෙදිලා මහා විශාල ගහක් හැදෙනවා නම්, එබඳු විදිහේ අතු ඉති බෙදිලා හදන්න පුළුවන් ගතිය තිබුණේ ඇටේ. ඒ බීජයේ. ඒකටත් පස්, දිය, ගිණි, සුලං හතර උපකාර වෙනවා. දැන් මේ දෙකටම පස්, දිය, ගිනි, සුලං එකම විදිහට උපකාරය ලබාගෙන, එක ගහක් එක විදිහකටත්, තව ගහක් තව විදිහකටත් හැදුනේ ඇයි? එතැන තිබුණ බීජ නානත්වය නිසා මිසක පස්, දිය, ගිණි, සුලං හතරේ වෙනස් කමක් හින්දද? නැහැ ගහ එබඳු තත්වයකට පත් කරන්න පුළුවන් වුණු හැකියාව තිබුණේ ආහාරයෙත් නෙවෙයි, ගහේ හැකියාවකුත් නෙවෙයි, ඒ බීජයේ.

ඒ වගේ ඔය පින්වතුන් දන්නවද කර්මය කියන එක බීජයක්. ඒ කර්ම නිමිත්තට අනුවම බැසගත්ත ප්‍රතිසන්ධි සිතේ 'කර්ම සිතේ ගති ටික' එහෙමම තියෙනවා.

මව් කුසට ප්‍රතිසන්ධි වශයෙන් පැමිණිලා කන බොන ආහාරයෙන් හැදුන, සතර මහාධාතු රූපය ඇසුරු කරගෙන පවතින හිතේ තියෙනවා ඉත්ථි ඉන්ද්‍රිය, පුරුෂ ඉන්ද්‍රිය කියලා රූපයක්. සිතේ. ඒ ඉන්ද්‍රිය සිතේ තියෙන ගතියට හැදුනු රූපයයි මේ. අර තල් ඇටේ තියෙන ගතියට හැදුනු ගහයි තල් ගහ, ඒ බීජයේ තියෙන ගතියට. හිතේ තියෙන ගතියට රාශි වුණු සතර මහාධාතු රූපයයි මේ. ඉත්ථි ඉන්ද්‍රිය රූපය, පුරුෂ ඉන්ද්‍රිය රූපය, නැත්නම් මේ විදියට රූපයක් හදන්න පුළුවන් ගති ටික. 'ගති ටික' තියෙන්නේ හිතේ. ඒක කාටවත් පෙනෙන්නේ නැහැ. ඉත්ථි ඉන්ද්‍රිය පුරුෂ ඉන්ද්‍රිය රූපය පෙනෙන්නේ නැහැ. මළ මිනියක ඉත්ථි ඉන්ද්‍රිය රූපය නැහැ පුරුෂ ඉන්ද්‍රිය රූපය නැහැ. ඉත්ථි භාව රූපය නැහැ, පුරුෂ භාව රූපය නැහැ. ඒ රූපය නිසා හැදුනු රූපයයි තියෙන්නේ.

එතකොට ඔය පින්වතුන් දැනගන්න, එකම බත්, පාන්, කව්පි, මුං ඇට කාලා ස්ත්‍රියක් හැදෙන්නේ, පුරුෂයෙක් හැදෙන්නේ කොහොමද? බත්, පාන්, කව්පි, මුං ඇට වල වෙනසක් තිබුණු හින්දද? නැහැ. ඒ කන බොන ආහාරය ගත්තට ඒ කෙනා කෙනාගෙ හිතේ තියෙන කර්ම ගති ටිකටයි ඒ රූපය මේ විදියට හැඩ වෙලා තියෙන්නේ. මෙහෙම ස්ත්‍රියෙක් හරි, පුරුෂයෙක් හරි පෙනෙන කොට, මේ කය ඇසුරු කරගෙන පවතින හිතේ තියෙන ගතිය දකින්න පුළුවන් ඔන්න ඔය පින්වතුන්ට. මේ ස්ත්‍රියක්ම කියලා මේ රූපයට රැවටෙන්න එපා. ස්ත්‍රියෙක් කියලා ආසා කරනවා නම් ඔය පින්වතුන් කර්මයටයි ඇළුම් කරලා තියෙන්නේ. රූපය හදපු ගතිය තියෙන්නේ, ස්ත්‍රී ගතිය තියෙන්නේ ඒ සිතේ. ආපහු ඔය පින්වතුන් එබඳු කර්මයකට කැමතියි. ඔය පින්වතුන් ස්ත්‍රියක් වෙන්නේ ඒ හින්දා පුරුෂයෙක් වෙන්නේ ඒ හින්දා.

එතකොට, කවදාවත් අපිට ස්ත්‍රියක් අල්ලන්න බැහැ, පුරුෂයෙක් අල්ලන්න

බැහැ. මොකද ඇත්ත ඒකයි. ස්ත්‍රියෙක් හෝ පුරුෂයෙක් කියන 'ඉන්ද්‍රිය නිසා හැදුනු මහා භූත ටික' මේ තියෙන්නේ. මේ ඇල්ලුවට පුරුෂයා ඇල්ලුවා නෙවෙයි. මහාභූත ටික ඇල්ලුවේ. හැබැයි මේ මහාභූත ටික ලෝකය තුළ කර්ම විපාක විඳින්න මේ අපට හම්බ වෙලා තියෙන්නේ. කර්ම විපාකය අනෙක් පැත්තට යන්න නම් ඒ විපාකය, අපිව 'රවට්ටන්න හදපු දේහිම නොරැවටී ඉන්න' අපි වග බලා ගන්න ඕනේ. ඒකයි, ***තණ්හං නිස්සාය තණ්හා පහා තබ්බා*** - තණ්හාවෙන් හැදුණු දේම උදව් කරගෙන තණ්හාව නසන්න කියලා කියන්නේ. තණ්හාවට හැදුනු රූපය, ඒ රූපයම උදව් කරගෙන තණ්හාව නසන්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. ***ආහාරං නිස්සාය ආහාරා පහාතබ්බා*** - ආහාරයෙන් හැදුනු රූපය, ඒ රූපයම උදව් කරගෙන ආහාරය නසන්න කියනවා. ඔය ඉත්ථි ඉන්ද්‍රිය, පුරුෂ ඉන්ද්‍රිය රූප.

✶ ✶ ✶

ජීවිත ඉන්ද්‍රිය කියන කොට, ජීවිත ඉන්ද්‍රිය දෙකට බෙදනවා, කොටස් දෙකකට, 'රූප ජීවිත ඉන්ද්‍රිය' සහ 'නාම ජීවිත ඉන්ද්‍රිය' කියලා. මේවා ගැඹුරු වුණත් අහගෙන ඉන්න. බොහෝ කාලයක් හිතසුව පිණිස පවතියි. අපි කියන්නේ, පණ ඇති සහ පණ නැති කියලා රූප තියෙනවානේ. මේ වගේ මේසයක් ගත්තොත් මේවා අජීවී, පණ නැහැ. නමුත් ගස් කොලන් වගේ දේවල් ගන්න, පණ තියෙනවා. ඒ වගේ මේ (තමා) රූපයටත් පණ තියෙනවා. පණ තියෙන රූප වලට කියනවා ජීවිත ඉන්ද්‍රිය තියෙනවා කියලා. හැබැයි අපි පණ තියෙනවා කියන රූපයේ විශේෂයක් තියෙනවා, නාම ජීවිත ඉන්ද්‍රියකුත් මෙතැන තියෙනවා. රූප ජීවිත ඉන්ද්‍රියකුත් තියෙනවා බාහිර වස්තූන්ට රූප ජීවිත ඉන්ද්‍රියක් තියෙනවා, නමුත් නාම ජීවිත ඉන්ද්‍රියක් නැහැ.

ජීවිත ඉන්ද්‍රිය තියෙන තැනක ඇති විශේෂත්වය ඔය පින්වතුන් දන්නවද? තමන්ට තමන්ව හදාගන්න පුළුවන් නැවත නැවත. ගෙවන ගෙවන එක අළුත් වැඩියා කරගන්න පුළුවන්. ජීවිත ඉන්ද්‍රියේ ලක්ෂණය ඒකයි ජීවත් කරගන්න පුළුවන්කම. ගහක අත්තක් කැඩුවොත්, කොලයක් කැඩුවොත් ඒක නැවත නැවත ආහාර හදලා ලියලවා ගන්නවා. මේ රූපයත් එහෙමයි. ඔය පින්වතුන් අළුතෙන් සෙරෙප්පු දෙකක් අරගෙන දාන්න මාස පහක් හයක් කොච්චර ගෙවිලා තියෙයිද? සෙරෙප්පු නැතුව මාස පහක් හයක්. ඇවිද්දොත් කකුල් කොච්චර ගෙවිලා තියෙයිද? බැරි වෙලා ඔය විදියට ගෙවුණොත් මැරෙන කොට මැරෙණ්න රූපයක් ඉතුරු වෙන්නේ නැති වෙයි, අඟලක් විතර වෙලා තියෙයි. නමුත් මේ ජීවිත ඉන්ද්‍රිය ඔය පින්වතුන් දන්නවද කරලා තියෙන දේ? ගෙවෙන

ගෙවෙන එක වෙනුවට අළුතෙන් අළුතෙන් හදන්න පුළුවන්. මේ ජීවිත ඉන්ද්‍රියේ තියෙන කෘත්‍යය ඕක. අජීවී කියලා කිව්වේ ගෙවෙන ගෙවෙන එක හදන්න බැහැ. ගෙවුණා නම් ගෙවුණාම තමයි. ඒ ජීවිත ඉන්ද්‍රියක් නැති නිසා. ගහකට ගෙවුණු එක හදාගන්න පුළුවන් ඇයි? ජීවිත ඉන්ද්‍රිය තියෙන නිසා.

මේ කෙනෙක් ජීවත් වෙනවා වගේ තියෙන්නේ මේ ජීවිත ඉන්ද්‍රිය කියන කෘත්‍යය නිසයි, රූපය නිසයි. නැත්නම් අපි ඇවිදින ගානට මේවා ගෙවෙන්න එහෙම ගියානම්, ඔය ජීවිත ඉන්ද්‍රිය කියන එක නොතිබුණා නම්, අපිට රූපයක් ඉතිරි වෙන්නේ නැති වෙයි. හැබැයි බාහිර ජීවිත ඉන්ද්‍රිය තියෙන වස්තු වලත් ඔය වැඩීම තියෙනවා. එයා ආහාර පාන සපයගෙන එයාගෙ ජීවිතය පවත්වන්න පුළුවන්. අජීවී සහ සජීවී කියන දෙකේ විශාල වෙනස තමයි, අජීවී එකට ආහාර පාන සපයගන්න බැහැ. සජීවී කියන එකේ තේරුම මොකක්ද? ආහාර පාන සපයගන්න පුළුවන්.

එහෙම ආහාර පාන සපයගන්න වස්තූන් අතරෙන් ආහාර පාන සපයගන්න මේ කය තවත් විශේෂයකින් යුක්තයි. මේකට තියෙනවා නාම ජීවිත ඉන්ද්‍රිය කියලා එකකුත්. ඒ කියන්නේ චිත්ත චෛතසික ටික කියන නාමධර්ම ටික ජීවත් කරවන කෘත්‍යයත් කරනවා. රූපය ජීවත් කරවන කෘත්‍යයත් කරනවා.

ලේ ධාතුව දවලා, කර්මයෙන් උපන්න තේජසට ලේ ධාතුව දැවීම නිසා සිතුවිලි පහළ වෙනවා. සිතුවිලි පහළ වෙන එකට ආයෙත් ලේ ධාතුව දැවෙනවා. ලේ ධාතුව දැවෙන ශක්තිය උදව් කරගෙන ආයෙත් සිතුවිලි පහළ වෙනවා. ආයෙත් සිතුවිලි පහළ වෙන එකට ලේ ධාතුව දැවෙනවා කියලා, එයා ජීවත් වෙන්න සිතුවිලි පහළ කරන එකෙන් ලේ ධාතුව දැවීමෙන් ඇති වෙන ශක්තිය උදව් කරගෙන ඊළඟට සිතුවිලි පහළ කරනවා, ඒ සිතුවිලි පහළ කරන එකෙන් ආයෙත් ලේ ධාතුව දැවෙනවා කියලා එක දිගටම නාමධර්ම පවත්වන කෘත්‍යයක් තියෙනවා.

වාහනයක් පදවන කොට දැන් ඔය එන්ජිම ස්ටාර්ට් (start) කරනවනේ. එතකොට වෙන්නේ ඉස්සෙල්ලාම උඩට ආපු පෙට්‍රල් ටික දහනය වෙනකොට, ඒ ගිනිගත්ත එකෙන්ම ඊගාවට එතෙන්ට එන පෙට්‍රල් ටික, ඒ කියන්නේ, ඒ වාහනය ස්ටාර්ට් වුණාහම, ඒ පටන්ගත්ත එකෙන්ම ඊළඟට තියෙන තෙල් ටික දහනය කරනවා. දහනය කිරීමෙන් ඇතිවෙන ශක්තියෙන් අර මෝටරය වැඩ කරනවා. වැඩ කරන එකටම ආයෙත් තෙල් ටික දහනය වෙනවා. මේ එකම ශක්තියයි. එකකින්ම යනවා. ඒ විදිහමයි මේ ශරීරයත්. නාම ධර්ම ටික ඔය විදියටම වැඩ කරනවා. ඕකට කියනවා නාම ජීවිතින්ද්‍රිය කියලා.

මෙන්න මේ ගෙවෙන එක වෙනුවට අළුතෙන් හදාගන්න පුළුවන් රූපෙකුත්,

ගෙවෙන එක වෙනුවට අළුතෙන් හදාගන්න පුළුවන් චිත්ත චෛතසික ටිකකුත් තියෙනවා මේකෙ. ඔන්න ඔය ජීවිත ඉන්ද්‍රිය රූපය. ඒකේ නාමධර්ම ටිකත් පැත්තකට දාමු. මේ රූපයේ ජීවිත ඉන්ද්‍රිය කියලා රූපය ජීවත් කිරීමේ කෘත්‍යයක් වෙනවා, ආහාර පාන නැවත නැවත හදාගෙන. ඔන්න ඕකත් මේ චිත්ත චෛතසික ටික තියෙන නිසයි වෙන්නේ.

✶ ✶ ✶

ඊළඟ එක තමයි **ආකාශ රූපය.** ආකාශ රූපය කියන එකත් ධම්මායතනය පරියාපන්න රූපයක්, නැත්නම් කර්මයෙන් හටගත්ත රූපයක් කියලා අපි හිතන්නේ නැහැ නේ. ආකාශය කොටස් දෙකකට බෙදෙනවා බාහිර සහ ආධ්‍යාත්මික. කන් සිදුරු, මුඛ සිදුරු, ආහාර පාන නැත්නම් මල මුත්‍රා බැහැර කරන්න අවශ්‍යය වෙන ඉඩ තියෙන තැන් වලට ආධ්‍යාත්මික අවකාශ ධාතුව කියනවා. මේකත් කර්මයෙන් හටගත්ත අවකාශ ධාතුව. ඊට පස්සේ මේ බාහිර අවකාශ ධාතුවත් සංඛතයි, හදාගත්ත එකක්.

මේ අවකාශය කියන එක ඔය පින්වතුන් හිතන්නේ, මේ අවකාශය කියන එක කිසිවකින් හැදුණු එකකුත් නෙමෙයි, කිසිවකින් නැසී යන එකකුත් නෙමෙයි, අවකාශය කියන එක තියෙන එකක් කියලා. ඒකනේ සමහරු අවකාශය - නිවන කියන්නේ අවකාශය වගෙයි කියලා අවකාශයට උපමා කරන්නේ. ඔය පින්වතුන් දන්නවද මේ අවකාශය සංඛතයි, අපි හදාගත්ත එකක්. මේ අවකාශය තියෙන්නේ මේ කයට සාපේක්ෂව. මේ බඩු භාණ්ඩ වල හැප්පෙන්නේ නැති විදියට යන්න පුළුවන්, කය අරගෙන යන්න පුළුවන් තැන්වලට අපි අවකාශය කියලා කියන්නේ.

නමුත් අපි මීට වඩා සුකුම ආත්ම භාවයක් ඇති දෙවියෙක් හරි වෙලා පෙරේතයෙක් හරි වෙලා උපන්නොත් ඇහැට නොපෙනෙන සියුම් ශරීරයක් තිබුණොත්, එයා ඒ මට්ටමේ රූපවල හැප්පෙන කොට, අවකාශය ක්ෂණයකින් වෙනස් වෙනවා. එතකොට අවකාශය කියන එක අද දවසෙදි අපට තියෙන්නේ මේ කයට සාපේක්ෂවයි කියන එක දකින්න. කන් සිදුරු, මුඛ සිදුරු, ආහාර පාන වැටෙන තැන්, මේවා කර්මයෙන් හටගත්ත අවකාශ ධාතු. ඔන්න අකාශ රූපය.

✶ ✶ ✶

ඊළඟට, **කාය විඤ්ඤාප්ති, වචී විඤ්ඤප්ති රූප.** කාය විඤ්ඤප්ති කියලා කියන්නේ, ඔය පින්වතුන් දැන් මේ පුද්ගලයෙක් කියලා රැවටෙන්නේ මේ රූප ටික හඳුනන්නේ නැති නිසා. ඔය පින්වතුන් දන්නවද කාය විඤ්ඤප්ති රූපය, වචී විඤ්ඤප්ති රූපය කියන එක මේ සතර මහාධාතු රූපයට මොකක් කරලා තියෙනවද කියලා? දැන් අත්දිග කමිසයක් තියෙනවා නම්, කමිසෙට පුළුවන්ද ඉබේම ඉස්සෙන්න, කමිස අතට? අපි ඔය කමිසයට, අපේ අත බහාලා, අපේ අත ඔසවන කොට කමිසෙ අත ඉස්සෙනවා නේද? අන්න ඒ වගේ ඔය පින්වතුන් දන්නවද කාය විඤ්ඤප්ති කියලා කියන්නේ මේ හිතෙන් අත වගේම මනෝමය රූපයක් උපද්දලා, මේ කයට බහාලා, හිතෙන් ඒක ඔසවන කොටයි මේ අත එසවෙන්නේ එහෙම නැතුව මේක ඔසවන්න බැහැ.

ඊට පස්සේ බෙල්ල හරවන්න ඕනෙ වුණාහම හිතෙන් එබඳුම රූපයක් හදලා ඒක හරවන කොටයි අපිට මේ බෙල්ල හරවන්න පුළුවන්. එහෙම නැතුව මේ මළ මිනිය හරවන්න බැහැ. එතකොට හරියට ඔය පින්වතුන් දැකලා තියෙනවනේ අර ඔලු බක්කො නටනවා කියලා අර මහා විශාල රූපයක් හදලා ඒකට මනුස්සයෙක් බැහැලා, එයා එක එක ඒවා කරන කොට අපිට පෙනෙන්නේ අර විශාල මිනිහා නටනවා වගේ. ඒ වැඩ ටිකම මේකෙත් කරනවා. ඒකට කියනවා විඤ්ඤප්ති රූප කියලා. කාය විඤ්ඤප්ති රූප කියලා. යන්න ඕනේ කියන අදහසක් ඇතුව සිතින් රූප උපද්දලා, ඒ රූපය මේ කයට බහාලා වායෝ ධාතුව පැතිර යනකොට මේ කය ඉදිරියට යනවා. ඔන්න ඔහොමයි 'කයෙන් කෙරෙනවා' කියන එක වෙන්නේ.

වචී විඤ්ඤප්ති කියලා කියන්නේ, මෙහෙම ඔය පින්වතුන්ට තේරෙන වචන කවුරුවත් කතා කරලා නැහැ. මෙතැනදි, සිතින් මොනවා හරි අදහසක් කියන්න ඕනෙ වුණාහම, ඒ අදහසේ හැටියට, සිතින් වායෝ ධාතුවක් උපද්දනවා. මේ වායෝ ධාතුව තල්ලෙ, උගුරෙ, තොල්වල, දත්වල, ඒ තැන්වල හැපිලා එළියට එන 'ශබ්දයක්' විතරයි. ඇහැට පෙනෙන රූපවලට හඳුනගෙන නම් කරලා තියෙනවා වගේ, සංඥාවට සංඛාර කරලා තියෙනවා වගේ, අපි මේ ශබ්ද සංඥාවත් සංඛාර කරගෙන තියෙනවා. ඒ සංඥාව පහළ වෙනකොටම අපි ගාව තියෙන සංඛාරය මතක් වෙනවා.

සංඥාව සහ සංඛාරය කියන එක තේරුම් ගන්න. **සංඥාවට තව කෙනෙක්ව යොමු කරන්න පුළුවන් ප්‍රඥප්ති මාත්‍රයට තමයි විඤ්ඤප්තිය කියලා කියන්නේ. කාය විඤ්ඤප්ති, වචී විඤ්ඤප්ති දෙක නැතුව,තව කෙනෙකුට තව දෙයක් හඟවන්න බැහැ. එක්කො වචනයකින්, එක්කො කයින්.** 'අර කෝප්පෙ දිහා බලන්න' කියලා එක්කො මට වචනයකින් කියන්න වෙනවා, කිව්වෙ නැත්නම් ඇඟිල්ල දික් කරලා හරි පෙන්වන්න වෙනවා. කය වචනය දෙක උදව් කරගන්නේ නැතුව මොකක් දිහාද බලාගෙන ඉන්නේ?

කියලා ඔය පින්වතුන්ට අහන්න පුළුවන්ද? බැහැ. ඒ හින්දා තමයි ඒවට විඤ්ඤප්ති රූප කියලා කියන්නේ.

එතකොට මේ කාය විඤ්ඤප්තියයි, වචී විඤ්ඤප්තියයි කියන දෙකෙන් **වචනය කියන එක ඔය තොල්වල, උගුරේ ඔය විදිහට හැපිලා එන ශබ්දය තියෙන්නේ. සංඥාවක් විතරයි. සංඥාව අපි දන්නේ නැහැ. ඒකට සංඛාරයකින් ව්‍යවහාර කර ගන්න ඕනේ.** අපි කියමු දැන් රූප සංඥාව කියලා කියන්නේ නිල්පාට, රතුපාට, කහපාට කිව්වහම නිල්පාට, රතුපාට කහපාට කියලා කියන්නේ සංඥාව නෙවෙයි. ඕක සංඥාව හඳුන ගන්න ගත්ත මාධ්‍යය. අපි ඒ ව්‍යවහාරය අත හැරලා සංඥාව ගත යුතුයි. ඒ කියන්නේ පාට පෙනෙන බවට තමයි සංඥාව කියන්නේ. අර මාස පහක හයක පොඩි ළමයි අඩනකොට, අම්මලා අරගෙන එල්ලන්නෙ එක එක පාට තියෙන, කැරකෙන ටිලිං ටිලිං ගාලා සද්දෙ ඇහෙන ඒවා. ඒ ළමයට වර්ණය හොඳට පෙනෙනවා. ඒ පාට දැකලා ඒ දිහා බලාගෙන ඉන්නවා ඇඩිල්ල නතර කරලා. නමුත් මේකට කියන්නේ කහ, රතු, සුදු, නිල් කියලා ප්‍රඥප්ති දන්නේ නැහැනේ. අන්න ඒ ළමයගෙ තියෙන මට්ටම දකින්න. සංඥාව කියන්නේ එතැනට. ඒක පහුකාලෙදි අපි හඳුනගන්න උදව් කරගත්ත ව්‍යවහාර මාධ්‍යයට තමයි නිල්පාට, කහපාට, රතුපාට, සුදුපාට කියලා කියන්නෙ. එතකොට සංඥා, සංඛාර දෙකම එකටම තියෙන්නේ.

අපි කතා කරන කොටම සංඥාව, සංඛාරකින්මයි අර්ථ දක්කවාගෙන තියෙන්නේ. 'කෝප්පෙ' කියන කොට මේ හැඩය පෙනෙන එක සංඥාව, ඒක පෙන්නගන්න අපි ගත්ත ව්‍යවහාර මාධ්‍යය තමයි 'කෝප්පෙ' කියන වචනය. 'මේ' හැඩය තමයි සංඥාව, මේ සංඥාව පෙන්නගන්න ගත්ත ව්‍යවහාර මාධ්‍යය තමයි මොකක්ද 'මේසේ' කියන එක. ඒකයි ඒකට විඤ්ඤප්ති රූප කියන්නේ. විඤ්ඤාපනය කරන්න බැහැ ඔය විතක්ක විචාර නැත්නම්. මේසේ.. ඒ කියන්නේ තව කෙනෙකුට යමක් කියන්න බැහැ. හිතේ ඒ සංඥාව මැවුනොත් තමයි අපි ඒක දන්නවා කියන්නේ. ඒ සංඥාව මවාගන්න බැහැ සංඛාර නොකළොත්. එතකොට ඔය **සංඛාරයෙන් හැමදාම කරන්නේ සංඥාවට සටහන් තබා ගන්න එක.** ඒකයි ***වෝහාර වේපක්ඛං භික්ඛවේ සංඥා වදාමි*** - සංඥාවගේ විපාකය ව්‍යවහාරයයි.

දැන් මෙතැන මේ පෙනෙන හැඩය සංඥාව. අපි ඒකට සංඛාර කරලා ටෙලිෆෝන් එක, දුරකථනය කියනවා. එතකොට ඒ වචනය කිව්වහම මේ හැඩය හිතේ මැවෙයි. මැවෙන එක සංඥාව. දැන් සංඥා සංඛාර දෙක දන්නවානේ, ඒ වගේ, මේ ශබ්ද සංඥාවක් විතරයි එන්නේ. ශබ්ද නානත්වයක්. අපි ඒක ව්‍යවහාර කරගන්නවා 'අහවල් ගායකයා, අහවල් ගායිකාව, අම්මගෙ කටහඬ, දුවගෙ කටහඬ, බල්ලෙක් කෑගහනවා,

හරකෙක් කෑගහනවා, කාමරේ ටෙලිෆෝන් එක කියලා ශබ්දයට, සංඛාර කරගන්නවා අපි. ඒ මොකද, තව කෙනෙකුට ව්‍යවහාර කරන්න පුළුවන් වෙන්න.

දැන් අපිට අපි ගාව තියෙන ශබ්ද සංඥාව කෙනෙකුගෙ මනසේ ඇති කරවන්න නම් මේ වගේ ව්‍යවහාරයක් තියෙන්න ඕනේ. බල්ලෙක් කෑගහන ශබ්දය කියන කොට ඔන්න ඒ සංඥාව එක පාරටම අනෙක් කෙනාගෙ මනසේ උපදිනවා. එතකොට අපි යමක් කිව්වා වගේ තේරෙනවා. කවුරුවත් කියන්නේ නැහැ. මේ වචනෙ කියන කොට එයා එයා ගාවම උපද්දවා ගන්නවා. එයා ගාවින් උපද්දවා ගන්න දන්නේ නැත්නම් අපි ඒක දන්නේ නැහැ.

ඒකයි වෙන භාෂාවක් කියන කොට, ඒ සංඥාව අරභයා එයා සංඛාර කරලා තියෙන ක්‍රමයට, අපි මේ ශබ්දය එක්ක ඒ නිමිත්තට ඒ සංඥාවට සංඛාර කරලා තියෙන්නේ වෙන විදියකට. එතකොට එයා ඒ වචනෙ කිව්වට අපිට සිහි කරගන්න බැහැ ඒ සංඥාව. එතකොට අපිට භාෂාව තේරෙන්නේ නැහැ.

දැන් අපි මේ හැඩේට සිංහල භාෂාවෙන් 'කෝප්පෙ' කියලා කියනවා, දැන් කෝප්පෙ කියන වචනය කිව්වොත් ඔක්කෝටම මේ හැඩය හිතේ මැවෙයි. එතකොට ඔය පින්වතුන් 'හාමුදුරුවො කෝප්පෙ ගැන කිව්වේ' කියලා හිතාගන්නවා. ඇත්තටම මම කිව්වෙ කෝප්පෙ ගැන නෙවෙයි, මා ගාව තියෙන සංඥාවට, සංඛාර කරපු අදහස සිහි කරයි, වචනය විතරයි කිව්වේ. කෙනා කෙනා ගාව තියෙන කෝප්පය සිහි කරගනියි. නමුත් ලෝකයා කියන්නෙ 'හාමුදුරුවො කෝප්පෙ ගැන කිව්වා' කියලා. එතකොට භාෂාව තේරෙනවා කියනවා.

අපි දැන් ඉංග්‍රීසියෙන් කියමු, කවුරුවත් අපි ඉංග්‍රීසි දන්නේ නැහැ. කවුරුහරි කෙනෙක් දැන් මේ හැඩේට එයාගෙ භාෂාවෙන් 'කප්' කියලා කියනවා කියන්නකො. දැන් අපිට ඔය ශබ්දෙ ඇහුනොත් අපි භාෂාව ඉගෙන ගෙන නැත්නම් අපිට මේ රූපය හිතේ මවාගන්න බැහැ. ශබ්දයක් විතරයි, රූපයක් මැවෙන්නේ නැහැ. මේ සංඥාව මැවෙන්නේ නැහැ. එතකොට 'දන්නේ නැහැ' කියනවා. භාෂාවක් දන්නේ නැහැ කියන්නෙ ඕකයි.

මේ විඤ්ඤත්ති රූප කියලා කියන්නේ, හිතෙන් මේ යම් යම් දේවල් තේරුම් කරවන්න අනෙක් අයට, අපි ගාව මනසේ උපදින ව්‍යවහාර තියෙනවා. මේ කයෙනුයි, සිතෙනුයි, කරන්න පුළුවන් විදිහේ රූප හදන්න පුළුවන් ව්‍යවහාරෙට. ඒකට විඤ්ඤත්ති රූප කියලා කියනවා, කාය විඥ්ඥප්ති, වචී විඥ්ඥප්ති කියලා.

* * *

ඊට පස්සේ **ලහුතා රූප.** ලහුතා කියලා කියන්නේ සැහැල්ලුව. අපි කිරුවොත් අපේ මේ ශරීරය තරාදියකට දාලා බර කොච්චරක් වෙයිද? කිලෝ පනහක්, හැටක්, කිලෝ පනහක් කියමු අඩුම ගානෙ නේද? කිලෝ පනහයි සිමෙන්ති මිටියක්. සිමෙන්ති මිටියක් කරේ තියාගෙන යන බර දැනෙනවද ඔය පින්වතුන්ට ඔය කයෙන් යනකොට? ඔය පින්වතුන් දන්නවද මේ සිතේ තියෙන ගතියෙන් මේ කය නිබර කරලා තියෙනවා කියලා. ලහුතා රූපය කියන්නේ නිබර කරනවා. අලියෙක් කිරුවොත් කිලෝ දාහක් විතර තියෙයි. අලියට කිලෝ දාහක් ගෙනියනවා වගේ කියලා තේරෙනවද එයාට? නැහැනෙ.

හිතට පුළුවන් කය නිබර කරන්න. ඒකයි ධම්මායතන පරියාපන්න රූප කියන්නේ, හිතේ තියෙන ගති ටික මහාභූත රූපයෙන් ප්‍රකට වෙලා. මහාභූත රූපය සැහැල්ලු කරලා, ඔය වගේ නමන්න, දිගහරින්න හදලා ඔය රූප ටික තියෙන්නේ. එතකොට මේ කයේ බර තේරෙන්නේ නැත්තේ ලහුතා රූපය හින්දා.

* * *

ඊට පස්සේ **මුදිතා රූපය.** මළ මිනි දැකලා තියෙයි නේද? මළ මිනියක් අල්ලලා තියෙනවද කව්රුවත්? ඔය පින්වතුන් ඕනෙ නම් මළ මිනියක් ඔබලා එහෙම බලන්න එබෙයිද කියලා. හරියට මෙන්න මේ මේසෙ ඔබන්න යම්සේ බැරිද, ඒ වගේමයි මළ මිනියක් එහෙම ඔබනවා කියන එක. මේ මටසිළුටුකම් මොකුත් නැහැ. මේ සිත නිසයි මේ ශරීරය මෙහෙම එබෙන්නේ, ඉතාමත් මුදු මොළොක් බව තියෙන්නේ. ඔයාගෙ මුහුණ හරි සිනිදුයි. අත හරි සිනිඳුයි කියලා කියන්නේ, හිතේ තියෙන කමට මහාභූත රූපය මොළොක් වෙලා මේ තියෙන්නේ. මේකට කියනවා මුදිතා රූපය කියලා.

ඔය පින්වතුන් මේ රූපය පුද්ගලයෙක් කියලා රැවටෙන්නේ මේ රූපෙය් තියෙන සියුම් රූප ටික හැදිලා තියෙන හැටි දන්නේ නැති හින්දා. ඒකයි මෙච්චර දුර මේ ඇවිල්ලා තියෙන්නේ. මේ රූපය ගල් ගෙඩියක් වගේ තිබුණොත් ඔය පින්වතුන් හිතනවද මේ රූපයට මෙහෙම ආසා වෙයි කියලා. මේ දර කෝටුවක් වගේ තිබුණොත්? මේ විදිහමයි රූපය. මේ හිතේ තියෙන ගති ටිකට රූපය මොළොක් වෙලා. මේකට කියනවා මුදිතා රූපය කියලා. මේ අල්ලනකොට 'අනේ ඔයාගෙ අත හරි සිනිඳුයි' කියලා කියන්නේ මුදිතා රූපය නිසා. ඒ හිතේ තියෙන ගතිය නිසා. ඒකයි හිත නිරුද්ධ වුණහම ඔය ගති එකක්වත් නැහැ.

* * *

ඊට පස්සෙ, මැරුණු කෙනෙකුගේ අත පය දැකලා තියෙනවද? කෝටු වෙලා, දරදඬු වෙලා නේද? මේ අත නවන්න පුළුවන් කම තියෙන්නේ මේ කය ඇසුරු කරගෙන පවතින හිත නිසා. ධම්මායතනය පරියාපන්න රූප කියන්නේ හිතේ තියෙන චෛතසික ටික නිසයි මෙහෙම නවන්න පුළුවන්, දිග අරින්න පුළුවන්කම තියෙන්නේ. ඒකට කියනවා **කම්මඤ්ඤතා රූපය** කියලා. මේ සිතේ තියෙන මේ ගතියටයි 'අත නවන්න පුළුවන්, අත දිග අරින්න පුළුවන්, 'අරයා මට අත වනනවා' කියලා ඔය කියන්නේ කම්මඤ්ඤතා රූපය හින්දා.

✶ ✶ ✶

ඊළඟට **උපාචය රූපය** කියලා කියනවා. උපචය කියන්නේ රැස් වෙනවා කියලා. පසුව පසුව එන දේවල් මුලින් මුලින් යමක රැස් වෙයි නම් ඒකට කියනවා උපචය කියලා. මුලින්ම මේ මහාභූත රූපය ඇසුරු කරගෙන පවතින චිත්ත චෛතසික ටික නිසා, ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන මේ ටික මුලින්ම හදනවා. ඒකට උපචය කියනවා. ඒ මොකද පසුව පසුව එන, පසුව පසුව උපදින චිත්ත චෛතසික ටිකකින් අළුත් වැඩියා කරන්න පුළුවන්කම තියෙන නිසා. මේ මුලින්ම රැස්වුණු එකට උපචය කිව්වා. උපචය කිව්වේ පසුව උපදින දේවල් ඒකෙන් හදන්න, අළුත්වැඩියා කරන්න පුළුවන්. ඒක පසුව එන දෙයින් හදන කොට, අළුත්වැඩියා කරන කොට, උපචය කියන එක නැවත නැවත රැස් වෙනකොට **සන්තති** කියලා කියනවා. ඒ උපචය, සන්තති.

ඒකට මම උපමාවක් කිව්වොත්, ඔය පින්වතුන් ගන්නවා කාර් එකක් හරි වෑන් එකක් හරි. අරගෙන ඕකට දැන් නම්බර් ප්ලේට් (number plate) එකකුත් දෙනවනේ, නේ? දැන් මුලින්ම කාර් එක හැදුණු එකට කිව්වා උපචය රූපය කියලා. ටිකක් කල් යනකොට කාර් එකේ ටයර් එක ගෙවිලා, දැන් අළුතෙන් ටයර් ටිකක් දානවා. ආයෙ ටිකක් කල් යනකොට සීට් එක පරණයි, සීට් ටිකත් ඔක්කොම දානවා. ආයෙ ටිකක් කල් යනකොට, අවුරුදු දහයක්, පහළොවක් යනකොට ඇන්ජිම හොඳටම පරණයි, ඇන්ජිමත් දානවා. ආයෙත් ටිකක් කල් යනකොට වටේ තියෙන තහඩුව සම්පූර්ණයෙන් පරණයි, ඔන්න තහඩුවත් දානවා. අන්තිමට අළුතෙන් අළුතෙන් මෙහෙම කෑලි ටිකක් මෙහෙම රැස්වෙලා, අවුරුදු දහයක් පහළොවක් යන කොට ගෙනෙනකොට තිබුණු එකම කෑල්ලක්වත් නැහැ. නමුත් මුලින් තිබුණු එකට වෙන වෙනම කෑලි හැදිලා රැස් වෙලා. හැබැයි නම්බර් ප්ලේට් එක වෙනස් වෙලාත් නැහැ.

දැන් අපි කියමු මුලින් අවුරුදු දහයක් පහළොවකට ඉස්සෙල්ලා ගත්ත වාහනයේ එකදු කෑල්ලක්වත් අද නැහැ. සමහරවිට තියෙන්නේ ඔක්කොම අළුත් ඒවා. නමුත් අළුත්ම කාර් එකක් ගත්තොත්, නම්බර් ප්ලේට් එක වෙනස් වෙන්න ඕනෙනේ නේද? එතකොට පරණ එකත් නෙවෙයි තියෙන්නේ, අළුත් එකකුත් නෙවෙයි. උපචය, සන්තති කියන දෙකේ හිතේ ස්වභාවය. ඒ හින්දා මුලින්ම හැදුණු නාම රූප දෙකෙන් ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන ටික හැදුනහම, පසුව පසුව උපදින චිත්ත චෛතසික ටික නිසා ආයතන ටික එදා එදා අළුත් වැඩියා වෙනවා. කාලයක් යනකොට පරණ ඒවා එකක්වත් නැහැ, තියෙන්නේ අළුත් ඒවා. නමුත් කෙනා වෙනස් වෙලත් නැහැ.

ඒ කියන්නේ, දැන් කුඩා කාලයේ තිබුණු රූපය අරගෙන බලන්න, ඒකේ තිබුණු කෑල්ලකටවත් සමාන වෙනවද දැන් තියෙන ඒවා. ඒකෙ එක කොටසක්වත් නැහැ දැන්. ඒ රූපයයි දැන් රූපයයි අරගෙන බැලුවොත්. ඒ එදා එක නෙමෙයි නම්, මේ නාම රූප වාසගම් එහෙනම් අයින් කරන්න වෙනවා. එදා එක කියලා කියන්නත් බැහැ, එදා එක නෙවෙයි කියන්නත් බැහැ නේද? ඒකට මොකක්ද හේතුව, උපචය වුණු නිසා, නැවත නැවත ආපු ඒවා මුලින් එකට රැස් වුණු ගණයට ගිය නිසා. අර වාහනේ කොච්චර කෑලි අළුතෙන් අළුතෙන් ආවත්, 'මුල් වාහනය' යන ගණයට ගිය නිසා. ඒ කෑලි දැන් නැති වෙන්න පුළුවන්. නමුත් ඒ ක්‍රමය වෙනස් වෙන්නේ නැහැ. ඔන්න ඕකට කියනවා උපචය රූප, සන්තති රූප කියලා.

✶ ✶ ✶

ඊට පස්සේ, **ජරතා රූප** කියලා කියනවා මේ රූපයේ දිරන බවට, කෙස් පැහෙනවා, හම රැලි වැටෙනවා, ඕකට ජරතා රූපය කියනවා. ජරතා රූපය ඇති වෙන්න හේතුව තමයි ආයුෂය හිඳෙන එක. ඒ කියන්නේ, මේ ශරීරයේ තියෙන කර්මජ රූපය කියන්නේ යමක් දිරනවා කියන්නේ තේජෝ ධාතුවේ ක්‍රියාවක්.

ගහක කොලයක් හරි, ගෙඩියක් හරි පෑගෙනවා කියන්නෙ පඨවි, ආපෝ, වායෝ, කියන ගති ටික අඩු කරනවා, තේජෝ ධාතුව වැඩි වෙනවා. තේජෝ ධාතුව වැඩිවෙන කොට තියෙන දිය ගතිය හිඳෙනවා. පඨවි ගතිය, ඒ කියන්නේ කර්කෂ ගතිය එන්න එන්න මතුවෙනවා. එතකොට වායෝ ගතිය අඩු වෙනවා. එතකොට ඒකෙ පැහැය වෙනස් වෙනවා. ඒකට කියනවා පැහෙනවා, ඉදෙනවා කියලා. ඕකම වෙනවා මේකෙත්, මේ ශරීරයෙත් ජරතා රූපය කියන්නෙ ඒකයි. පොඩි ළමයෙක් කියන කාලෙදි, මේ ශරීරය

හැදෙන්නෙ කන බොන ආහාරපාන ගන්න කොට, රූප කලාප සියයක් හැදෙනවා නම් කන බොන ආහාරයෙන්, කුඩා ළමයා කාලෙදි නැසෙන්නේ රූප කලාප දහයයි, හැදෙනවා සියයක්. එතකොට වැඩෙන පැත්ත ඉක්මනට පෙනෙනවා. ඒකයි අවුරුදු දහයක විතර පොඩි ළමයෙක් ගත්තොත් තව අවුරුදු දහයකින් පහළවකින් දැක්කොත් හඳුනාගන්න බැරිවෙන්නේ. මොකද එච්චර වේගයෙන් හැදෙනවා. ඔය තරම් වේගයෙන් පොඩි කාලෙ ඉඳලාම හැදෙන වේගයෙන් කෙනෙක් හැදුනොත් මරණ මොහොත වෙනකොට අඩි පහළොවකටත් වැඩිය උස වෙයි. නමුත් එහෙම වෙන්නේ නැහැ. තලත්තෑනි වයස කියන මට්ටමට එනකොට අවුරුදු විසිපහ පැන්නට පස්සේ හැදෙන රූප කලාප ප්‍රමාණය පනහක් නම් නැසෙන ප්‍රමාණයක් පනහක් වෙනවා. සමානව වගේ සිදු වෙනවා.

ඒකයි ඔය පින්වතුන්ට සාමාන්‍යයෙන් තරුණ මට්ටමේ කෙනෙක් දැක්කහම අවුරුදු දහයකින් පහළවකින් දැක්කත් ආයෙත් හඳුනා ගන්න පුළුවන්. ඒක එහෙම කාලයක් තියෙනවා. ඊට පස්සෙ අවුරුදු පනහක් වයසට යනකොට මහළු වෙනවා කියන්නෙ මොකක්ද දන්නවද? රූප කලාප විසිපහක් හැදෙනකොට, රූප කලාප පනහක් නැසෙනවා, හැදෙන පැත්ත අය පැත්ත අඩුයි, වැය පැත්ත වැඩියි, එතකොට දිරනවා. එතකොට ඉක්මනට මේ රූපය වෙනස් වෙනවා කියලා තේරෙනවා. ඔන්න ඔහොමයි මේ ජරතා රූපය කියන එක වෙන්නේ. ඒක වෙන්නේ මේ ශරීරයේ තියෙන තේජෝ ධාතුව නිසා. මේ ශරීරයේ තියෙනවා කර්මයෙන් හටගත්ත තේජෝ ධාතු. ඔය තේජෝ ධාතුවට ආහාර පාන ලැබීමෙන් ඇති වන උෂ්ණත්වය, ඒ කියන්නේ මේ ආයුෂය, මේ තේජෝ ධාතුවෙන් ඉක්මනට දැවෙනවා. දැවෙන නිසා ආයුෂය හැදෙනවා, ආයුෂය නිසා උෂ්ණය හැදෙනවා. ආයුෂය කියලා කියන්නේ කන බොන ආහාරයෙන් හැදෙන ස්පිරිට් (spirit) එකටනේ. ඕකට ජරතා රූපය කියලා කියනවා.

★ ★ ★

අනිච්චතා රූපය කියල කියන්නේ, මේ රූපයේ වාතය, පිත, සෙම මේවා ප්‍රධාන වශයෙන් වෙනස් වීමෙන් යම් යම් විපරිනාම බවවල් ඇති වෙනවා.

★ ★ ★

ඊලගට **කබලිංකාරාහාරය.** කබලිංකාරාහාරය කියලා කියන්නෙත් ඇහැට නොපෙනෙන සියුම් රූපයක්. ඇයි කබලිංකාරාහාරයට ඇහැට නොපෙනෙන සියුම්

රූපයක් කියලා කියන්නේ. අපි බත්, පාන්, කව්පි, මුං ඇට කියලා මේවා ගත්තට, කටේදි කෙලත් එක්ක එකට එකතුවෙලා, ආහාරය කට ඇතුළේදිම තැම්බෙනවා. ඒක ආමාශයට ගියහම ආමාශයේ තියෙනවා ආහාර දිරවන ඕජාවක්. ඕජාවට එකතු වෙලා කොට්ටාශ වාතයෙන් මේක පෙරලලා, අර වොෂින් මැෂින් (washing machine) එකක රෙදි සෝදනවා වගේ ඔක්කොම පෙරලලා සම්පූර්ණ ආහාරය දියරයක් බවට පත් කරනවා.

ඊට පස්සෙ ස්ත්‍රියන්ට විසි අට රියන්, පුරුෂයන්ට දෙතිස් රියන් කියල දිග බඩවැලක් තියෙනවා. මේ දියරය බඩවැල ඇතුළෙ දිගට යනවා. හොඳට රත්වුණු බටයකට වතුර ටිකක් දාන්නකො, ටිකක් වෙලා යනකොට මොකක් වෙයිද? වාෂ්ප වෙනවා. අර ආමාශයේ තියෙන ඕජාව, අර බඩවැල දිගේම යනකොට, මේකේ ඇති වෙනවා කර්මජ තේජෝ ධාතුව කියලා එකක්. කර්මයෙන් උපන් උණුසුමක්. ඔය උණුසුමට, මේ නලය දිගේ යන ජලය ඔක්කොම වාෂ්ප වෙනවා. රස කොටස් ටික උරා ගන්නවා. උරා ගත්ත. අන්න ඒ ටික තමයි නියම කබලිංකාරාහාරය කියන්නේ. අපි කන බත් පාන් කවුපි ටික නෙවෙයි ඔන්න ඔය උරා ගන්න ස්පිරිට් (spirit) එක වගේ වාෂ්ප වෙන ගතියකින් යුක්ත ඔය ටිකෙන් තමයි කෙස් හැදෙන්නේ, හම් හැදෙන්නේ, මස් හැදෙන්නේ, මේ රූපය හැදෙන්නේ. මෙහෙම ගිහිල්ලා ගිහිල්ලා, රොඩු ටික විතරක් එහා කෙළවරට විසි වෙනවා. ඒකට අපි අශූචි කියනවා. ඔන්න ඕක තමයි කබලිංකාරාහාරය.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★

ඒ වගේම තව ඇහැ, කන, දිව, නාසය, ශරීරය ගැනත් දැනගන්න ඕනේ. අපි ඕවා ගැන දන්නේ නැහැ. මේ කන බොන ආහාරයෙන් හැදුණු රූපය ඇසුරු කර ගෙන පවතින හිතෙන්, මේ කයේ ඔන්න ඔහොම විශාල වැඩ කොටසක් කරලා හින්දා, ඔය පින්වතුන් මේ රූප ටික ඇත්ත ඇති හැටියේ දන්නේ නැති හින්දා, පුද්ගලයෙක්, සත්වයෙක් කියලා රැවටිලා ඉන්නේ.

ඉතින් මේක තමයි රූපයේ හැටි. රූපය ඇති වෙන්න හේතුව තමයි, මෙයට පෙර කොතැනක හරි අපි ඉපදුණා කියලා හිටියා නම්, තිරිසන්ගත සතෙක් වේවා, දෙවියෙක් වේවා, මනුස්සයෙක් වේවා, කාම භූමියේ කොතැනක හරි, යම් රූපයක් තිබුණා නම්, ආත්ම භාවයක් තිබුණා නම්, විඤ්ඤාණය නිසා නාම-රූප වෙලා, නාම-රූප නිසා ආයතන හැදුණා කියලා ටිකක් ඔය තියෙන්නේ. ඔය විඤ්ඤාණ, නාම-රූප, සළායතන කියන ටික තමයි මම ඔය කිව්වේ. ඒ කියන්නේ, විඤ්ඤාණය රූපෙකට බැස ගෙන නාම-රූප වෙනවා කියන්නේ, නාමධර්මයන්ගේ තියෙන ගතිටික රූපයටත්, රූපයේ තියෙන

ගතිටික නාමධර්මයන්ටත් සම්බන්ධ වුණාහම තමයි ඔය රූපය මෙහෙම වෙලා තියෙන්නේ. ඔය විසි අට රූපය හැදුණේ එතකොටයි. නාම-රූප වුණා කිච්චහමයි විසි අට රූපය හැදුණේ. එතකොට, මෙයිට පෙර කොතැනක හරි කෙනෙක් උපන්නා කියන තැනක තිබුණු රූපයක් තිබුණා නම්, ඒ හැම රූපයක්ම කන බොන ආහාරයෙන් හැදුණු, පඨවි ආපෝ තේජෝ, වායෝ රූපයක්. ඒ කය ඇසුරු කරගෙන පවතින චිත්ත චෛතසික ටික නිසා, කයේ මෙහෙම මෙහෙම සියුම් රූප ටිකක් විද්‍යාමානයි.

එදා, කන බොන ආහාරයෙන් හැදුණු සතර මහාධාතු රූපයත්, සතර මහාධාතු රූපය ඇසුරු කරගෙන පවතින සුඛුම රූප ටිකත් තේරුම් නොගත්තකම නිසා, ඒ ඇත්ත ඇති හැටියෙ නොදන්නාකම තමයි අවිද්‍යාව කිව්වේ - නොදන්නාකම නිසා සත්වයෙක්, පුද්ගලයෙක් කියන නිමිත්තක් හදා ගත්තා ***අවිජ්ජා පච්චයා සංඛාරා.***

ඊට පස්සේ, ඒ 'ඉන්න' සත්වයා මම 'ඉන්න' සත්වයා මගෙ දුවා, පුතා කියලා දැකලා, ඉන්න දරුවට, ඉන්න පුතාට අපි කැමති වුණා, තණ්හා උපාදාන වුණා.

ඒ රූපයේ ඇත්ත ඇති හැටියේ නොදැක, අවිද්‍යාවෙන් සත්ව පුද්ගල සංඥාවක් හදාගෙන, ඇලුණු ගැටුණු කම හේතු වුණා, විඤ්ඤාණය අද මෙබඳු රූපයකට බැස ගන්න, සතර මහාධාතු රූපයකට. අද සතර මහාධාතු රූපයකට බැස ගත්ත මේ සිතෙන්, අදද මේ වගේ රූපයේ වැඩ ටිකක් කරනවා. අදත් රූපය සතර මහාධාතුයි, ඒ සතර මහාධාතු රූපය, ඇසුරු කර ගෙන පවතින, සිත නිසා මේ රූපයේ මෙහෙම ගති ටිකක් වෙලා තියෙන්නේ නේද කියලා, ඇත්ත ඇති හැටියේ නොදැක්කොත්, අදත් මේ රූපය සත්වයෙක් පුද්ගලයෙක් කියලා ඔය පින්වතුන්ට පෙනෙයි.

ඒ ඉන්න සත්වයා මගෙ දුවා, මගෙ පුතා, නැත්නම් 'මේ මම' කියලා වැරදි දැක්මක් හදා ගනියි. ඊට පස්සේ ඔය පින්වතුන් දුවට කැමතියි, පුතාට කැමතියි, මට කැමතියි කියලා තණ්හා උපාදානයක් වෙයි. මේ ආහාරයෙන් හැදුණු, මේ චිත්ත චෛතසික ටිකකින් හැදුණු මේ රූපය බිඳිලා යයි. හදාගත්ත ඒ දෘෂ්ටිය නැති වෙන්නේ නැහැ. ඒ නිසා ඇති වුණු ඇලීම, තවත් මෙබඳුම ආහාරයෙන් හැදුණු රූපයකට මේ සිත බැස ගන්න හේතුයි.

එතකොට, මෙතන තියෙන්නේ පටිච්ච සමුප්පාද සිද්ධියක්. පෙර මේ රූපයේ ඇත්ත නොදන්නාකම නිසා හදාගත්ත කර්ම නිමිත්ත හේතු වුණා, අද මේ වගේ රූපයකට බැස ගන්න, චිත්ත චෛතසික ටික හදා ගන්න.

අද මේ චිත්ත චෛතසික ටිකෙන් සතර මහාධාතු රූපය මේ වගේ හැඩ කරලා

හදලා තියෙනවා. අද රූපය පිරිසිඳ නොදන්නාකම නිසා අපි කෙනෙක් කියලා රැවටෙන්නේ පුද්ගලයෙක් කියලා රැවටෙන්නේ, කෙනෙක් හිනාවෙනවා, පුද්ගලයෙක් හිනාවෙනවා, ලස්සණයි කියලා රැවටෙන්නේ මේ මේ හිතේ තියෙන ගති ටික මේ මහාභූත රූපයෙන් ප්‍රකට වෙලා නේද කියලා, අද රූපය පිරිසිඳ නොදකින කොට, සත්වයෙක්, පුද්ගලයෙක් කියන වැරදි දැකීමක් ඇති වෙයි. සත්වයෙක් පුද්ගලයෙක් කියන වැරදි දැකීම ඇති වෙන කොට, ඇලීම ගැටීම දෙක නැති කරන්න බැහැ. ඒ කියන්නේ, ලෝභ ද්වේෂ දෙක නැති කරන්න බැහැ. ඒ ලෝභ ද්වේෂ දෙක හේතුයි නැවත විඤ්ඤාණය, නැත්නම් මේ සිත තවත් රූපයකට බැසගන්න.

එහෙම උපන්නහම එතැනත් මේ වගේම රූපයකට විඤ්ඤාණය බැස ගත්තහම, මේ වගේම සවිඤ්ඤාණක වෙනවා. උපන්නහම ශීත දැනෙයි, උෂ්ණ දැනෙයි, බඩගින්න, පිපාසය, අන්තිමට ඉපදිලා තියෙන්නේ දුක. මහළු වෙනවා, මරණයට පත් වෙනවා, නින්දා - අපහාස, ඇනුම් - බැනුම්, අහන්න වෙනවා කියලා අද තියෙනවා වගේම, මේ නාම-රූප දෙක ජීවත් කරවන්න අන්තිමට මේ කරලා තියෙන්නේ. නමුත් ඒක කරවන්න ගියහම මහා දුක් ගොන්නක් විඳින්න වෙයි.

එදාටත්, එතැන තියෙන රූපය පිරිසිඳ නොදැක්කොත්, මේ රූපය කන බොන ආහාරයෙන් හැදෙනවා. ඒ කය ඇසුරු කරගෙන පවතින චිත්ත චෛතසික ටික මෙතැන පවතින හින්දයි දැන් මෙතැන සවිඤ්ඤාණක වෙලා තියෙන්නේ. මේ චිත්ත චෛතසික ටික පිරිසිඳ නොදකින කම නිසා ආපහු ඒ රූපයේ සත්වපුද්ගල භාවය ඇති කර ගනියි. නාම-රූප දෙක බිඳිලා යයි. අර වැරදි දැක්ම නිසා ආපහු රූපයයි, තව සිතකුයි.

මේ චක්‍රයේ කෙළවරක් නැහැ

ඉතින් මේක නතර කර ගන්න පුළුවන්. ඒකයි, මේ දහම හොඳට තේරුම් කර ගන්න කෙනාට. හොඳට වර්තමානයේ තේරෙනවා, මොකක්ද? සක්කාය දිට්ඨිය අතහැර ගන්න. රූපය සත්වයෙක් කියලා එයා දකින්නේ නැහැ. රූපය ඇසුරු කරගෙන සත්වයෙක් ඉන්නවා, සත්වයෙක් නිසා රූපය පවතිනවා, රූපය නිසා සත්වයෙක් පවතිනවා, කියන එකක් එයාට තේරෙන්නේ නැහැ. එයා දන්නවා රූපය හේතු ප්‍රත්‍යයයි. රූප ටික හොඳට දිග හැරලා බලලා තියෙනවා. රූප ටික තියෙන්නේ ඔක්කොම කන බොන ආහාරයෙන් හැදිලා, සුඛුම රූප ටික චිත්ත චෛතසික ටික නිසා ප්‍රකට වෙනවා, ධම්මායතනය පරියාපන්නයි.

ඒ හින්දා රූපය මම හෝ රූපය මගෙ හෝ රූපය මගෙ ආත්මයයි කියන අදහසත් නැහැ. රූපය සත්වයෙක් කියලා, නැත්නම් රූපය ආත්ම වශයෙන් ගන්නවා

කියන එකක් හෝ ආත්මයක් නිසා රූපය පවතිනවා කියලා එකක් හෝ, රූපය නිසා ආත්මය පවතිනවා කියලා හෝ ආත්මය නිසා රූපය පවතිනවා කියලා හෝ රූපය අරභයා සක්කාය කෙරෙහි දෘෂ්ටිය නැහැ. වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන නාමධම් ටික හොඳට දන්නවා. වේදනාව කියන්නේ - විඳිනවා. සංඥාව කියන්නේ - හඳුනනවා. සංඛාරය කියන්නේ - හිතනවා. විඤ්ඤාණය කියන්නේ - දැනගන්නවා. මේ ටික, පෙර මේ රූපය පිරිසිඳ නොදන්නාකම නිසා ඇති වුණු වැරදි දෘෂ්ටිය, තණ්හාව කියන කාරණාව නිසා ඇති වුණු ධර්මයක් කියලා දකිනකොට, කෙනෙක්ගේ සිතක් ආවා හෝ පුද්ගලයෙක්ගේ සිතක් ආවා හෝ ආත්මයක් ආවා නෙවෙයි. ***සංඛාර පච්චයා විඤ්ඤාණං*** කියලා දකිනවා.

එතකොට 'මේ නාමධම් ටික, වේදනාව ඇසුරු කරගෙන ආත්මයක් තියෙනවා, ආත්මය ඇසුරු කරගෙන වේදනාව තියෙනවා', එහෙම ආත්ම වේදනා කතා මොකුත් නැහැ, නාමධම් ටිකේ. විසි ආකාර සක්කාය දිට්ඨියම අතහැරෙනවා, අතහැරෙන කොට 'පුබ්බන්තේ කංඛති' අත හැරෙනවා. පෙර අපි හිටියද, හිටියා නම් කොහේ ඉන්න ඇත්ද, කොහොම ඉන්න ඇත්ද, කොහොම වෙලා කොහොම ඉන්න ඇද්ද කියන මේ අදහස් නැහැ.

පෙර අපි හිටියද කියලා පුද්ගලයෙක් හිටියා නෙමෙයි, පෙර මම හිටියා නෙමෙයි, කොහොම හරි හිටියා නෙමෙයි. පෙරත් වුණා නම් වුණේ,

- මේ වගේම මහා භූතයන්ගෙන් රූපය හැදිලා තියෙනවා.
- ඒ කය ඇසුරු කරගෙන පවතින චිත්ත චෛතසික ටිකෙන් උපාදාය රූපය හදලා තියෙනවා.
- ඒ නාම-රූප දෙක නොදන්නාකම නිසා පුද්ගල දෘෂ්ටියක් හදාගෙන.
- ඒ දෘෂ්ටිය නිසා ඇලීම් ගැටීම් ටිකක් මනසේ හදාගෙන තියෙනවා.

පඹයෙක් ඉන්නවා ඈත වෙලක. පඹයා කියන තැන හැදිලා තියෙන්නේ කෙළින් අතට ලී කෝටුවක් ගහලා, හරස් අතට ලී කෝටුවක් ගහලා, සරමක් අන්දලා, කමිසයක් අන්දලා, මුට්ටියක් මුනින් නමලා, ඒකට හුණු ටිකක් ගාලා. දුර වැඩිකම හින්දා පෙනෙන්නේ නැහැ හරියට. පඹයා වූ තැන පඹයා බව පිරිසිඳ නොදන්නාකම නිසා, හොඳට නොපෙනෙනකම නිසා මනුස්සයා කියන අදහසක් අපේ හිතේ තියෙනවා.

දැන් අපේ හිතේ මනුස්සයෙක් ඉන්නවා කියන අදහසට ලී කෑලි ටික, කෝටු කෑලි ටික සම්බන්ධ නැහැ. ඒක හරියට පැහැදිළි නැති කම නිසා ඇති වුණු වැරදි අදහසක්. දැන් මම 'අනේ ඒ මනුස්සයාට මම හරි ආදරෙයි' කියලා සෙනෙහසක් ඇති කර

ගත්තොත්, මම හිතේ තියෙන මගෙම අදහසට, මගෙම සංඥාවට නෙමෙයිද ඇළුම් කරලා තියෙන්නේ. නැත්නම් 'ඔය මිනිහා නම් කපන්න ඕනේ, මරන්න ඕනේ, කොටන්න ඕනේ' කියලා පටිඝයක් ඇතිකර ගත්තොත්, මගෙ හිතේම තියෙන තරහව නෙමෙයිද?

අවිද්‍යා පච්චයා සංඛාරා - අවිද්‍යාව කියන්නේ මොකක්ද? පඹයා වූ තැන පඹයා බව නොදකිනකම නිසා මේ පුද්ගල සංඥාව. පුද්ගල සංඥාව නිසා ඇලීම ගැටීම. පඹයා වූ තැන කෝටු ටිකක් දිරලා යයි. මුට්ටියත් බිඳිලා යයි, ඒක පිරිසිඳ නොදැක්කොත්, මා ළඟ තියෙන මනුස්ස සංඥාව දුරු වෙයි කියලා හිතනවද. මරණාසන්න මොහොතේදි මම කැමති මනුස්සයා සිහිවෙයි. ඒ මනුස්සයාට තියෙන ආදරේ, ආසාව නිසා ඒ මනුස්සයා ලබා ගන්න ඕනෙකමට මගෙ තණ්හාව ඉදිරිපත් වෙයි.

දැන් අපට වෙන්නේ, ඔය පින්වතුන්ට දැන් ගෙදර මතක් වෙනකොට ඉක්මනට ගෙදර යන්න වෙනවානේ. ගෙදර සිහිවෙලා යන්න යනවානේ. ඔය විදිහටමයි මරණාසන්න මොහොතේ, දැන් ගෙදර සිහිවෙලා මේ කය අරගෙන යන්න පුළුවන් හින්දා යනවා. මරණාසන්න මොහොතේ ඔය වගේම තමන්ට යන්නම ඕනෙ, අවශ්‍යමයි කියලා හිතෙන නිමිත්තක් සිහි කරලා යන්න ඕනෙකම ඇති වෙන කොටම, කාය ජීවිතීන්ද්‍රිය බිඳිලා. යන්න බැහැ. හිත එහෙමම යොමු වෙනවා එතෙන්ට. ඕකයි වෙන්නෙ හැමදාම.

එතකොට දැන් පඹයා වූ තැන පඹයා බව නොදන්නාකම නිසා මනුස්සයා කියන අදහස ඇතිකර ගෙන දැන් ඒ ටික ඔක්කොම මනසේ. ***අවිජ්ජා පච්චයා සංඛාරා*** - අවිද්‍යාව කිව්වේ පඹයා වූ තැන පඹයා බව නොදන්නාකම නිසා. ඒ නිසා කැමැත්තක්, අකමැත්තක් ඇති වෙනවා. ඉන්න පුද්ගලයාට. ඒ ටිකත් ඔක්කොම මනසේ. ඒ මනසේ ඇති කරගත්ත පුද්ගලභාවය හේතුවෙන් නැවත රූපයකට, පඹයා හොයා ගෙන යනවා. පඹයා නෙමෙයි, මනුස්සයා හොයාගෙන යනවා කියන තැනකින් අපි යන්නේ. ගියාට ලැබෙන්නේ පඹයෙක්. ආයෙ ආයෙත් රූපයකට බැස ගන්නවා හිත.

පඹයා වූ තැන පඹයා බව නොදන්නවා වගේ, කන බොන ආහාරයෙන් හැදුණු, චිත්ත චෛතසික ටික නිසා ප්‍රකට වුණු රූපය, අනාත්ම වූ සත්ව පුද්ගල භාවයෙන් යුක්ත රූපය, දුර වැඩි හින්දා, නුවණ නැති කමින් නුවණට දුරස් නිසා, දුර වැඩි නිසා, පැහැදිළිව නොපෙනෙනකම නිසා, මම කියන අදහසක් ඇති වෙලා, මනුස්සයෙක් කියන අදහසක් ඇති වෙලා, සත්වයෙක් කියන අදහසක් ඇති වෙලා. මේ අදහස්ටික ඔය පින්වතුන්ගේ මනසේ තියෙන්නේ, ***අවිජ්ජා පච්චයා සංඛාරා***

රූපය පිරිසිඳ නොදන්නාකම නිසා මනසේ තියෙන දෘෂ්ටි ටිකක් ඔය. මේ රූපය දිරලා යයි. මේ නාමධම් ටිකත් නිරුද්ධ වෙයි. නමුත් මනසේ තියෙන ඔය අදහස දුරු

වෙන්නේ නැහැ. මගෙ දරුවා, මගෙ දුවා, මගෙ පුතා, මගෙ අම්මා, මගෙ අප්පච්චි කියන ටික නැති වෙන්නේ නැහැ. ඔය පින්වතුන්ගේ දෙමව්පියෝ නැති වෙලා ඉන්නවා නම්, ඒ රූප ටික, ඒ ස්කන්ධ ටික නිරුද්ධ වෙලා ඇති. ඒ සටහන ඔය පින්වතුන්ගේ මනසේ නිරුද්ධ වෙලාද කියලා බලන්න. ඒ සෙනෙහස, ආදරය නිරුද්ධ වෙලාද කියලා බලන්න. නැහැ. ඕවා, මොකද, ඉන්න කොටවත් තියෙන එකකට නෙමෙයි, අපි අවිද්‍යා ප්‍රත්‍යයෙන් හදාගත්ත එකක් නිසා. මරණාසන්න මොහොතේ ඔය මනසේ තියෙන ටික නිසා අපි ආපහු මේ වගේ රූපයකට බැස ගන්නවා.

ඔය ටික දකින කොට එයා දන්නවා, පුබ්බන්තේ කංඛති නැහැ. අතීතයේත් කෙනෙක් හිටියා, පුද්ගලයෙක් හිටියා, සත්වයෙක් හිටියා, එහෙම කියලා එකක් නැහැ. අතීතයේදිත් මේ නාම-රූප දෙකක් තිබිලා තියෙනවා, ඒ ටික පිරිසිඳ නොදන්නාකම නිසා පුද්ගල භාවයක් හදාගෙන, ඇති කරගත්ත කෙළෙස් ටිකක් තිබුණා. ඒක හේතු වුණා අද කන බොන ආහාරයෙන් යුක්ත රූපය සවිඤ්ඤාණක වෙන්න කියලා දන්නවා. අද රූපය සවිඤ්ඤාණක වෙලා නාම-රූප දෙකක් මේ තියෙනවා, මේ සුඛුම රූප ටික හදලා තියෙනවා. අද මේ ටික පිරිසිඳ නොදැක්කොත්, අනාගතයට අද ඇති කර ගන්න වැරදි දැකීම, සත්ව පුද්ගල හැඟීම, අවිද්‍යා සංඛාරය මුල් කාරණාව කරගෙන විඤ්ඤාණය නැවත රූපයකට බහියි කියලා දකින හින්දා, මම උපදියිද, කොහේ උපදියිද, කොහොම උපදියිද, මොකෙක් වෙලා මොකක් වෙයිද කියන අදහස එයාට නැහැ දන්නවා. වුණොත් වෙන්නේ මොකක්ද, **අද නාම-රූප දෙක නොදන්නාකම නිසා අවිද්‍යාවෙන් හටගත්ත කර්ම නිමිත්ත මුල් කරගෙන, විඤ්ඤාණය නැවත රූපයකට බැස ගනියි. බැසගෙන නැවත සතර මහාධාතු රූපයක් සවිඤ්ඤාණක වෙයි කියන එක දන්නවා මිසක, මම ඉපදෙනවා හෝ කෙනෙක් ඉපදෙනවා නෙමෙයි කියන එක දන්නවා.**

පුබ්බන්තේ කංඛති අතහැරෙනවා, අපරන්තේ කංඛති අතහැරෙනවා, පුබ්බන්ත අපරන්තේ කංඛති අතහැරෙනවා. ඒ කියන්නේ, මේ සත්වයා කොහේ ඉඳන්ද ආවේ. මේ සත්වයා කොහාටද යන්නේ කියන එක නැහැ. අතීතයේදිත් අවිද්‍යා කර්ම නිසා මේ නාම රූප දෙක හැදුණා. අද මේ ටික පිරිසිඳ දකින්න බැරි වුණොත් නැවත අවිද්‍යා කර්මයෙන් නැවත නාම-රූප ටික හැදෙයි නේද කියන නුවණ දකිනවා. ***පටිච්ච සමුප්පාදේසු ඤාණං*** - මේ පටිච්ච සමුප්පාද ධර්මයක් කියන නුවණ එනවා.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★

මේ ***පටිච්ච සමුප්පාද ඤාණං*** - දකිනකොට සක්කාය දිට්ඨිය නැති වෙනවා. ඒකාන්තයෙන් ඒ සම්මා සම්බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධමයි කියන දැක්ම එනවා. ඒකාන්තයෙන් මේ ධර්මය මොන තරම් ඇත්තක්ද, බුදුරජාණන් වහන්සේ දැකලමයි මේක දේශනා කරලා තියෙන්නේ, මේක මනාව අවබෝධ කරගෙන තියෙනවා, සම්මා සම්බුද්ධයි කියලා අපි අද වචනයෙන් කියන ගුණ ටික ඔය පින්වතුන්ට හිතට දැනෙයි. මේ ධර්මය ස්වාක්ඛාතයි - මනාකොට දේශනා කරලා තියෙනවා. සන්දිට්ඨිකයි - කල් නොයවා විපාක දෙනවා, මෙහෙ එන්න මෙහෙ ඇවිත් බලන්න, කියලා ඕනෙ කෙනෙකුට පෙන්නන්න පුළුවන් ටිකක් නේද කියලා ධර්මයේ ගුණ දැනෙයි.

යම් කිසි කෙනෙක් රූපයත් දැනගෙන, රූපයේ ඇති වීමත් නැති වීමත් දැනගෙන, අතීතයේදි පිළිපැද්දා නම් එයාගේ ප්‍රතිපදාව සුපටිපන්නමයි, මනාවම ප්‍රතිපදාවකට පිළිපන්න කෙනෙක්මයි, ඒ හැම කෙනෙක්ම නියම ප්‍රතිපදාවට ආපු අයයි කියලා සංඝයාගේ ගුණ දැනෙයි. බුද්ධේ කංඛති, ධම්මේ කංඛති, සංඝේ කංඛති අත හැරෙයි.

ඊට පස්සේ, මේ දුක් නැති කරන්න මේ සීල සමාධි ප්‍රඥා කියන ත්‍රිශික්ෂාවමයි පුරන්න ඕනේ කියන නුවණ ඔය පින්වතුන්ට එළඹ සිටිනවා ශික්ෂාය කංඛති.

ඔය ටික දකිනකොට, 'ශීල ව්‍රත පරාමර්ශනය' අතහැරෙනවා. ශීල ව්‍රත කියන්නේ ඉස්සර කාලේ තිබුණා ව්‍රත සමාදන් වෙනවා. හරකෙක් වගේ හිටියහම දුකෙන් මිදෙන්න පුළුවන්, ඌරෙක් වගේ හිටියහම, එළුවෙක් වගේ හිටියහම, කුකුළෙක් වගේ හිටියහම දුකෙන් මිදෙන්න පුළුවන් කියලා ඒ ඒ සත්තු විදිහට, එක එක ව්‍රත සමාදන් වෙලා ඉන්න ක්‍රමයක් තිබුණා. දැන් කවදාවත් මෙයා ඒ වගේ ව්‍රත සමාදන් වෙන්නේ නැහැ.

එතකොට සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස කියන මේ ධර්මතා තුන අත හැරෙනවා මේ වර්තමාන රූපය පිරිසිඳ දැකීමත් එක්කම, දැන් රූපය පිරිසිඳ දකිනකොටම දැන් තමන්ට තේරෙනවා, මේ ටික දැක්කේ නැති හින්දා 'මම' කියන අදහසක් මේ තරම් කල් හිතේ ඇසුරු වුණා, මේ තව සත්වයෙක් පුද්ගලයෙක් කියන අදහස ඇතිවෙලා තිබුණා නේ, සැනෙකින් අතීතය තේරෙනවා. එහෙනම් අතීතයේදිත් මෙහෙමම සිද්ධියක් වුණු තැනක මේ වැරදි දැකීම මුල් වුණා මෙතෙන්ට එන්න අද මේක නොදැක්ක නිසයි, වැරදි දැකීම තිබුණ තැන අනාගතය වෙන්නේ කියන නුවණ ඇති වෙනකොට, පටිච්ච සමුප්පාදය ගැන නුවණ එනකොට, මේ සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස කියන කෙළෙස් ටික ඉතුරු නැතුවම නැති වෙනවා. දකින මට්ටමටම

එනවා.

ලෝකයත් දන්නවා, මේ හැම තැනකම සත්ව පුද්ගල බවක් ඇසුරු කරන්නේ, නැවත නැවත ජරා මරණ දුක හැදෙන විදිහට කටයුතු කරන්නේ මේ සම්මා දිට්ඨිය නැතිකම නිසා නේද, කියන එකත් දකිනවා. අනේ කොහොමද මේ ලෝකයට පටිච්ච සමුප්පාදය කියලා දෙන්නේ, උගන්නන්නේ කියලා කරුණාවක් එනවා මිසක, තව සත්වයෙක් නැති වුණා, සත්වයෙක් මැරුණා කියලා දුකක් ඒ මනසේ නැහැ. සත්ව පුද්ගල මානසික ස්වභාවයෙන් මුදවා ගන්නේ කොහොමද මේ අවිද්‍යාවෙන් මුදවා ගන්නේ කොහොමද කියන අදහස. තව සත්වයෙකුට පිහිටවෙන අදහසක් නැහැ අවිද්‍යාවෙන් මනස මුදවන්නේ කොහොමද, මෙතැන තියෙන අවිද්‍යාව නමැති කෙළෙස් ටික අයින් කරන්නේ කොහොමද කියන අදහසයි එන්නේ. මේ දුක නිරුද්ධ කරන්න උදව් කරන්නේ කොහොමද කියන අදහසයි එන්නේ.

එතකොට මෙන්න මේ ටික නුවණින්, කල්‍යාණ මිත්‍ර ඇසුරින් ඔන්න ඔය ටික දැන් ඔය පින්වතුන් අහගත්තා කියන්නකො. රූපයත් දැනගත්තා රූපය ඇති වුණු හේතු ටිකත් දැනගත්තා. අතීතයේ කෙරුණු හේතු නිසා දැන් රූපය ඇති වුණු හැටිත්, දැන් මේ හේතුව තිබුණොත් අනාගතයට රූපය ඇති වෙන හැටිත් දැනගත්තා. අතීතයේ මේ වරද නොවුණා නම් අද මෙහෙම රූපයක් හැදෙන්නේ නැහැ කියලත් දැන ගත්තා. අද මේ රූපය පිරිසිඳ දැකලා අවිද්‍යා කර්‍ම නැති කළොත්, අනාගතයට රූපය හැදෙන්නේ නැහැ නේද කියලා රූප නිරෝධයත් දැන ගත්තා. දැනගෙන, දැන් ඔය පින්වතුන්ට එක කාරණාවක් 'එහෙනම් දැන් මේ වර්තමානයේ රූපය පිරිසිඳ දකින්න ඕනේ' කියන සම්මා දිට්ඨියත් ගත්තා. **මේ රූපය පිරිසිඳ දකින්න නම්, සිතේ නීවරණ ධර්‍ම දුරුකරන්න ඕනේ, ඒ හින්දා සමථ කමටහනක් වඩන්න ඕනේ. සමථ කමටහනක් වඩන්න නම් කය වචන දෙක සංවර වෙන්න ඕනේ, එහෙනම් ඒ සඳහා සීලයක් රකින්න ඕනේ** කියන දැනුමකුත් ඇතිකර ගත්තා. සීලයක පිහිටලා සමථ කමටහනක් වඩමින්, රූපය පිරිසිඳ දකින්න නුවණින් යෙදිය යුතුයි.

'යම් දවසකදී, මෙන්න මේ විදිහට සීලයක පිහිටලා, සමථ කමටහනක් වඩමින් නීවරණ ධර්‍ම දුරු කරලා, මේ රූපය පිරිසිඳ දකින්න, නුවණින් බලන්න' කියලා රූපයත්, රූපයේ ඇති වීමත් නැති වීමත් බලනවා. මෙහෙම කටයුතුයි කියලා කල්‍යාණ මිත්‍ර ඇසුරින්, සද්ධර්‍ම ශ්‍රවණයෙන් ඉගෙන ගත්තා. රූපය ඉගෙන ගත්තා, රූපය ඇති වෙන හැටි ඉගෙන ගත්තා, රූපය නැතිවෙන හැටි ඉගෙන ගත්තා. රූපය නැති වෙන හැටි කියන්නේ, ඇත්ත දැක්කහම වැරදි දැකීම නැති වෙලා, නැවත දුක් වූ රූපය මෙහෙම හටගන්නේ නැහැ කියන එක දැක්කා. උත්තරේ ආවේ ඇත්ත දැක්කහම නේ, සම්මා දිට්ඨිය.

ඒ සම්මා දිට්ඨිය, නැත්නම් ඒ ඇත්ත ඇති හැටියේ දැකීම ළඟා කරගන්නයි මනසට, සීලයක පිහිටලා සමථ කමටහනක් වඩන්නේ කියලා ඉගෙන ගත්තා. ඔන්න දැන් කල්‍යාණ මිත්‍ර ඇසුරෙන්, සද්ධර්‍ම ශ්‍රවණය කියන ටිකෙන් රූපයත්, රූපයේ ඇති වීමත්, නැති වීමත්, නැති කරන ප්‍රතිපදාවත් ඔය පින්වතුන්ට හම්බවුණා, කල්‍යාණ මිත්‍ර ඇසුර, සද්ධර්ම ශ්‍රවණය.

දැන්, අහගත්ත එකේ පිහිටලා, ඔය පින්වතුන් කියලා දුන්නු විදිහට සීලයක පිහිටනවා, සමථ කමටහනකින් සිත වඩනවා. බුදු ගුණ, අසුභය, මරණය, මෛත්‍රිය වගේ කමටහනකින් සිත වඩනවා. හිත වඩ වඩ රූපය පිරිසිඳ දකින්න ටික ටික නුවණින් මෙනෙහි කරනවා. කලින් කළට උඩටත් යටටත් බලනවා. මේ රූපයේ මේ ඇත්ත නොදන්නාකම නිසා, අතීතයේදිත් රූපය පිරිසිඳ නොදන්නාකම නිසා වැරදි අදහසක් ඇති වෙලා, ඒ අදහස මත ඇලීම් ගැටීම් දෙක ඇති වුණු එක හේතු වුණා, ඒ කෙළෙසය හේතු වුණා අද මේ කය සවිඤ්ඤාණක වෙන්න කියලත් බලනවා. අද මේ කය පිරිසිඳ නොදැක්කොත් ඇති වෙන වැරදි දැකීම මුල් කරගෙන, නැවතත් විඤ්ඤාණය රූපයකට බැස ගෙන, නැවතත් මේ නාම කයකුයි, රූප කයකුයි හැදෙයි නේද කියලත් බලනවා.

ඔහොම කලින් කළට උඩට යටට බල බල, වර්තමානයේදි ආහාර ප්‍රත්‍යයෙන් හටගත්ත රූපය විතරක් බලනවා. බල බල සමථ කමටහනකින් සිත වඩනවා. හිත වඩ වඩ සීලයක පිහිටලා ඉන්නවා. ඉතින් මේකෙදි බුදු දහමෙ පෙන්නන්නේ, ඔය සමථ කමටහනකින් හිත වඩ වඩ නුවණින් විදර්ශනා කරන එක, රූපයේ ඇත්ත බලන එකට කියනවා විදර්ශනා කරනවා කියලා, සමථ කමටහනට කියනවා 'චිත්ත භාවනා' කියලා.

ඕක බුදුරජාණන් වහන්සේ පෙන්නන්නේ කම්මල්කරුවෙකුට උපමා කරලා. කම්මල්කාරයෙක් යකඩයක් රත් කර කර තලනවා. දුණු කොල කෑල්ලක් අරගෙන ආයුධයක් හදන්න ඕනෙ කෙනා යකඩෙ ගෙනිහිල්ලා කිණිහිර උඩ තියලා තලනවද? තලන්නේ නැහැ. තලා ගන්න බැහැ. එයා මොකද කරන්නේ? රත් කරනවා. හොඳයි, හොඳට හොඳට අඹ දල්ලේ පාටට රත් කරලා, තැළුවේ නැත්නම් ආයුධයක් හැදෙයිද? තැළුවේ නැත්නම් ඒත් ආයුධයක් හැදෙන්නේ නැහැ. රත් කරන්නේ නැහැ තලන්න හැදුවොත්? ඒත් හදාගන්නවා කියන එක වෙන්නේ නැහැ. කම්මල්කරුවා යකඩෙ රත් කර කර තලනවා. තල තල රත් කරනවා. ඔහොම කරලා ආයුධය හදනවා.

බුදුගුණ, අසුභය, මරණය, මෛත්‍රිය කියන සමථ කමටහන් ටික තියෙන්නේ යකඩයක් රත් කරනවා වගේ. කෙනෙක් ඔය ටික විතරක් නම් වඩන්නේ, දකින්න යකඩෙ රත් කරනවා විතරයි, හැබැයි තලන්නේ නහැ. කෙනෙක් මේ රූපය කන බොන

ආහාරයෙන් හැදිලා තියෙන්නේ, කෙස් ලොම් නිය දත් හම් මස් නහර වලින් යුක්තයි, පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන ධාතූන්ගෙන් යුක්තයි, කය ඇසුරු කරගෙන පවතින හිත නිසා මේ කයෙන් ප්‍රකට වෙන ගති ටික ටික ටික හිතනවා. මෙහෙම හිතන එක විදර්ශනා කරනවා. හැබැයි සමථ කමටහන් වඩන්නේ නැහැ. මේ ටික විතරක් හිතනවා. එතකොට යකඩෙ තලනවා විතරයි. ඒකත් ආයුධය හදනවා කියන එක ලේසි නැහැ. මොකද කොච්චර බැලුවත් පුද්ගලභාවය ගෙවෙන්නේ නැහැ. එක තැන දුවනවා වගේ. තමන් කියලමයි හිතෙන්නේ. පුද්ගලයෙක් කියලමයි හිතන්නේ, කොයිතරම් බැලුවත්.

ඒ හින්දා සමථ කමටහනකින් සිත වඩ වඩ නුවණින් බලනවා. යකඩය රත් කර කර තලනවා වගේ. යකඩය ටිකක් රත් කරලා තලන්න ඕනේ. තලනකොට නිවෙනවා. ආයෙත් රත් කරනවා. ඒ වගේ සමථ කමටහනකින් හිත වඩලා ටිකක් විදර්ශනා කරන කොට චිත්ත සමාධි ගතිය අඩු වෙනවා. ආයෙත් තලන එක නතර කරලා සමථ නිමිත්තට හිත තබන්න ඕනේ. මෙනෙහි කරන්න ඕනේ. ආයෙත් මෙනෙහි කරලා, සමථ කමටහනකින් හිත වඩලා ආයෙත් මෙහෙම බලන්න ඕනේ.

මේ විදිහට කරන කොට මේකෙ ඇත්ත දකින්න පුළුවන් දවසක් එනවා. ඔය සීලයක පිහිටලා, සමථ, කමටහනකින් හිත වඩන එකට කියනවා ඔය පින්වතුන්ගේ 'ධර්මානුධර්ම ප්‍රතිපත්තිය' කියලා. රූපයේ ඇත්ත ඇති හැටියේ බලන්න නුවණින් මෙනෙහි කරන එකට කියනවා 'යෝනිසෝමනසිකාරය' කියලා. කළ්‍යාණ මිත්‍ර ඇසුරෙන්, සද්ධර්ම ශ්‍රවණයෙන් ලැබුණා, රූපයත්, රූපයේ ඇති වීමත්, නැති වීමත්, නැති කරන හැටිත් කියලා නුවණක්. ඒ ක්‍රමයට අනුව පිහිටලා තමන් ධර්මානුධර්ම ප්‍රතිපත්තියේ, යෝනිසෝමනසිකාරයේ පිහිටියාම, මේ ටිකේ ප්‍රතිඵලය තමයි මේ පුද්ගලභාවය ගෙවිලා රූපය හොඳට පෙනෙන දවසක් එනවා.

රූපය ඇති වුණු හේතුව අතීතයේදිත් මේ විදිහට තිබිලා, එදා මේ ඇත්ත නොදැක්ක නිසා ඇලීම බැඳීම නිසායි අද මේ රූපය හැදෙන්න හේතුව කියලත් තේරෙනවා. අද මේ ඇත්ත බැරිවෙලා හරි නොදැක්කා නම්, මගෙ මනසේ මේ පුද්ගල භාවය ඇති කරගෙන, ඇලීම බැඳීම තබා ගෙන නැවත දුකට යන හැටිත් පෙනෙනවා එයාට.

මේ ටික දකිනකොට 'පටිච්ච සමුප්පාද ධර්‍මයක් මේ' කියලා දකිනකොට, අර කියපු ගුණ ටික හිතේ ඇඳෙනවා. සක්කාය දිට්ඨිය අතහැරෙනවා. බුද්ධාදී අටතැන කෙරෙහි සැකය අතහැරෙනවා. සීලබ්බතපරාමාසය අතහැරෙනවා. තමන් තමන්ටම කවුරුවත් ඕනේ නැහැ' මේක තේරෙන්නේ සෝවාන් කෙනාටයි, නැත්නම් ඔයා දැන් සෝවාන් වෙලා ඉන්නේ' කියලා කවුරුවත් කියන්න ඕනේ නැහැ. කෙනාටම තේරෙනවා.

එයිට මෙහා තමන්ට පටිච්චසමුප්පාදය නැත්නම් 'වර්තමානයේ රූපය' දන්නේ නැත්නම් පුබ්බන්තේ කංකති තියෙනවා නම් මම කොහේ ඉන්න ඇත්ද, කොහොම ඉන්න ඇත්ද, කොහොම කොහොම ඉන්න ඇත්ද කියලා හිතේ තියෙනවා නම්, අපි මැරිලා උපදියිද, උපදියි නම් කොහේ උපදියිද, කොහොම උපදියිද, කොහොම කොහොම වෙලා උපදියිද කියන ගතිය තියෙයි නම් දකින්න, අපට දෘෂ්ටිය දුරුවෙලා නැහැ කියලා. තමන් තමන්ව රවටා ගන්න එපා.

මේ ධම්මආදාසය - දහම් කැඩපත් තියෙන්නේ. ඒකයි මම කිව්වේ ගෙවිවොත් ගෙවෙනවා කියලා. **ඔය පින්වතුන් හරියටම මේ ටික ඉගෙන ගෙන මේ විදිහට කරලා බලන්න. නොවුණොත් තමයි පුදුමේ. සෝවාන් නොවුණොත් පුදුමයි. සෝවාන් වෙනවා කියන එක වෙන්නේ නැති එකක් නෙමෙයි. ලබන්න බැරි එකක් නෙමෙයි. හැබැයි ඒකට ක්‍රමයක් තියෙයි.** ඒකට මගෙ අදහසක් නෙමෙයි. ඔය පින්වතුන් මේ බණ ටිකට බනිනවා නම් බනින්නේ බුදු දහමට. මොකද මම කිව්වේ පිටකයේ තියෙන දේ, අර්ථය. මම මගෙ පෞද්ගලික එක වචනයක්වත් මෙතෙන්ට දාලා නැහැ.

ඒ හින්දා කෙනෙක් 'දිට්ඨිසම්පන්න' වෙනවා කියලා කියන්නේ මෙන්න මේ පටිච්ච සමුප්පාදය හරහා. මෙන්න මේ ටික තේරුම් ගත්තොත් අනන්ත අපරිමාන සංසාරෙක අපි හැමදාම හෙව්වේ නිදුක් බව, අපිට ඕනෙ වුණේ සැනසිල්ල. හැමදාම අපිට ලබා ගන්න බැරි වුණොත් මේ ටික. **මනුස්සයන් අතරේ ශ්‍රේෂ්ඨම පුද්ගලයා බුදුරජාණන් වහන්සේ පෙන්නුවේ චක්‍රවර්තී රජ කෙනෙක් වෙනවට වඩා, එහෙම නැත්නම් දෙවියෙක් බ්‍රහ්මයෙක් වෙනවට වඩා, සෝතාපත්ති ඵලය උතුම් කියලා.** බුදුරජාණන් වහන්සේ පෙන්නුවා, දිට්ඨි සම්පන්න පුද්ගලයෙක් කවදාවත් සතර අපායට පත්වෙන්නෙ නැහැ, එයා ***නියතෝ සම්බෝධි පරායනෝ*** එයා නිවනට නියත වුණු කෙනෙක් කියලා.

බුදුරජාණන් වහන්සේ එක්තරා අවස්ථාවකදී මුං ඇට තරම් පොඩි ගල් කැට හතක් අරගෙන පෙන්නලා 'මහණෙනි මේ ගල් කැට හතද ලොකු, හිමාල පර්වතයද' කියලා අහනවා. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මේ හිමාල පර්වතය අතිශයින් විශාලයි. මේ ගල්කැට හතේ ගණනකටවත් යන්නෙ නැහැ. මේ ගල්කැට හත ඉතාමත් සියුම්, කියලා භික්ෂූන් වහන්සේලා උත්තර දුන්නම, භාග්‍යවතුන් වහන්සේ දේශනා කරනවා මහණෙනි, දිට්ඨි සම්පන්න පුද්ගලයා සෝවාන් වුණු පුද්ගලයගෙ ගෙවුණු දුක, නැතිවුණු දුක, අත හැරුණු දුක හරියට මේ හිමාල පර්වතය වගේ. ඉතිරි වුණු දුකක් තියෙයි නම් මෙන්න මේ මුං ඇට තරම් පොඩි ගල්කැට හතක් වගේයි ගෙවුණු දුක වැඩියි කියලා පෙන්වනවා. භවයේ නැවත හත් වතාවකට වැඩිය උපදින්නෙ නැහැ. මේ දිට්ඨි සම්පන්න බවේ වටිනා කම තමයි බුදුරජාණන් වහන්සේ සෝතාපත්ති සංයුක්තය කියන තැනින් හැම තැනකදිම

පෙන්වන්නෙ. **සෝවාන් වුණු පුද්ගලයාගේ දිට්ඨි සම්පන්න පුද්ගලයාගේ ගෙවුණු දුකම හිමාල කන්ද වගේ. ඉතුරු වුණු දුක මේ මුං ඇට තරම් පමණ වූ ගල් කැට හත වගේ.** ඉතුරු වුණු දුකම ටිකයි. භවයේ උපරිම හත් වතාවකට වඩා උපදින්නේ නැහැ කියනවා.

ඔය පින්වතුන්ට පුළුවන් නම් ඔන්න ඔය ටික කර ගන්න. මට සත්පුරුෂයෙක් හැටියට කරන්න පුළුවන් ටික මම කළා. මම දන්නේ ඔය ටික. මම බුදු දහම කියලා බොරුවක් කියනවා නෙමෙයි, කරනවා නෙමෙයි. ඇත්ත මේක. මම මේ කියන්න බය නැහැ. ඔය පින්වතුන්ට සමහර විට ධර්ම දේශනාවක අපි අද එක එක දේවල් අහලා අපේ ඔළුව කුරුවල් වෙලා. අපි නිවන කියලා සංඥා, එක එක දේවල් මවාගෙන. භාවනා කියලා එක එක දේවල් මවා ගෙන. පද පෙරළ, පෙරළ පද හදාගෙන මේ යථාර්ථයක් හොයන්න යනවා. ඔහොම හොයන්න බැහැ.

ජීවිතයේ ඇත්ත කියලා ගොඩාක් නැහැ. සත්‍යයවල් ගොඩාක් නැහැ. එකයි තියෙන්නේ. කෙනෙක් දිට්ඨි සම්පන්න වෙනවා නම් වෙන න්‍යාය මෙන්න මේකයි.

ඒ නිසා මෙන්න මේ වගේ සහේතුක දහමක් තියෙනවා. මේ ක්‍රමය ඉගෙන ගෙන, ඔය පින්වතුන්ම කරලා බලන්න. කළොත් ඔය පින්වතුන්ටම මේ දහම දකින්න පුළුවන් තැනකට එනවා.

දිට්ඨි සම්පන්න පුද්ගලයාගේ ප්‍රධාන ලක්ෂණයක් තියෙයි. ***බුද්ධෙ අවෙච්චුප්පසාදෝ, ධම්මෙ අවෙච්චප්පසාදෝ, සංඝෙ අවේච්චප්පසාදෝ, පටිච්ච සමුප්පාද ධම්මො දිට්ඨො හොති සුදිට්ඨො*** පටිච්ච සමුප්පාද ධර්මය දැක්කා, මනාව දැක්කා ***සේඛෙන ඥානෝ ඉතිපි සේඛෙන සම්න්නාගතො ඉතිපි*** - එයා සේඛ ඥාණයෙන් යුක්තයි, සේඛ ධර්මයන්ගෙන් සමන්නාගතයි. තමන්ම තමන් අපායට යන්නේ නැහැ. ***නියතො සම්බෝධි පරායනො*** මම නිවනට නියත වූ කෙනෙක් කියලා තමන්ටම තමන්ම කියන්න පුළුවන් කියලා බුදු හාමුදුරුවෝ දේශනා කරලා තියෙනවා.

ඒක ඇත්තද කියලා බලන්න. හැබැයි ඔය අහගත්තට පුළුවන් වුණා කියන්නේ නැහැ මම. අහගත්තා දැන් රූපය කියන්නේ මෙන්න මේකයි කියලා, රූපය ඇති වුණු හැටි අහගත්තා, නැති වෙන හැටි අහගත්තා. ඒ රූපය නැති වෙන්න නම් ඇත්ත දැක්කහම, වැරදි දැකීම - කෙළෙස් ටික නැති වුණාහම නේ රූපය නැති වෙන්නේ. එහෙනම්, ඒ ඇත්ත දකින තැනට යන්න මේ සීල, සමාධි, ප්‍රඥා, මේක පුරන්න කියලා ඉගෙන ගත්තා දැන්. ඉගෙන ගත්තා විතරයි. දිට්ඨි සම්පන්න වෙන්න තියෙන සෝතපත්ති අංග සෝවාන් ඵලයට පත්වෙන්න තියෙන අංග දෙකක් ලැබුවා. ඉතුරු දෙක තමන් තුළින්,

ධර්මානුධර්ම ප්‍රතිපත්තිය, යෝනිසෝමනසිකාරය ඔය දෙක පිරුනහමයි, ඔය දෙක කරන කොටයි ඔය ඇත්ත පෙනෙන්නේ. ඒ පෙනුනහම ඇති වෙන ගති ටිකයි ඔය කිව්වේ.

සෝතාපන්න කියලා කියන්නේ ඔය පින්වතුන් කරන කොට දැනෙන ගති ටික. කල්‍යාණ මිත්‍ර ඇසුරෙන්, සද්ධර්ම ශ්‍රවනයෙන් මේ දහම අහලා, මේ ටිකෙන් අපි යුක්තවෙන කොට 'සෝතාපත්ති අංග' රැක්කා වෙනවා. 'සෝතාපත්ති අංග වලට' පැමිණුනා වෙනවා. ඒක හරියටම කරන කෙනාට, දකින මට්ටමට එනකොට 'සෝතාපන්න' වෙනවා, 'දකින මට්ටමට එනකොට'.

ඉතින් ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ මුළු ලෝකයටම අධිපති චක්‍රවර්තී රජ කෙනෙක් වෙනවට වඩා, දිව්‍ය ලෝකයේ යනවට වඩා, **මහා බ්‍රහ්මයෙක් වෙනවාටත් වඩා, සෝවාන් ඵලයම උතුම් කියලා කිව්වේ. අර ඔක්කෝම, මහා බ්‍රහ්මයත් ඊළඟ ආත්ම භවයෙදි ඌරෙක් වෙලා ඉන්න පුළුවන්. නැත්නම් මනුස්සයෙක් වෙලා ආයෙත් අකුසල් කරලා ආයෙත් දුක් විඳින කෙනෙක් වෙන්න පුළුවන් දෙවියත් ඒක පිරිහිලා අපායේ යන කෙනෙක් වෙන්න පුළුවන්. සක්විති රජ්ජුරුවොත් අපායේ යන කෙනෙක් වෙන්න පුළුවන්. නමුත් සෝවාන් පුද්ගලයා එහෙම වෙන්නේ නැහැ.**

ඒ නිසා මුළු ලෝකයේ හැම දේකටම කෙටි මිම්මක් දෙනවා, රජකමට කැමති වෙනවාටත් වඩා දහමට කැමති වෙන්න, මුළු දිව්‍ය ලෝකයක්ම බාර දෙනවාටත් වඩා දහමට කැමති වෙන්න, බ්‍රහ්ම ලෝකයේ තියෙන සම්පත්තියකටත් වඩා දහමට කැමති වෙන්න කියලා මිනුම් දන්ඩක් තියෙනවා.

පර්චස් පහළොවක ගේ කෑල්ලකට කැමති වෙනවා කියන එක ගැන කවර කතාද කියලා මනින්න. කාරෙකකට, බඩුවකට, රූපවාහිනියකට කැමති වෙනවා කියන එක කවර කතාද කියලා මනින්න. මේ දහමේ වටිනාකම තේරුම් ගන්න පර්චස් දහයක පහළොවක ඉඩම් කෑල්ලකට ඇයි ඔයතරම්? මම ඔය පින්වතුන්ට දෝෂයක් කියනවා නෙමෙයි අපේ මනසේ ස්වභාවය අතහැරවා ගන්න කියන්නේ. ඇයි මේ චූටි පටු තැනකින් මනස අල්ලා ගන්නේ කියන එක හිතන්න මේ තරම් වස්තුවක් ලැබිලා තියෙද්දි. ***පථව්‍යා එක රජ්ජේන*** මුළු පොළවටම, මුළු පොළවටම රජ වෙනවාටත් වඩා කිව්වහම මේ අක්කර දහයක පහළොවක කෑල්ලක් අල්ලා ගත්තොත් වගේද? ඒකට කැමති වෙන්නේ නැතුව දහමට කැමති වෙන එක සුදුසුයි කියන එක කියනවා.

අනන්ත සංසාරෙ අපි ගෙවල් හදලා ඇති, දරුවෝ හදලා ඇති, වාහන අරගෙන ඇති. දුක නැති කරන්නයි මේවා කළේ. ඒත් තාමත් අපි මේ දුක් සහගත සසරේ ඉන්නේ.

ඉතින් ඒ නිසා හැම දෙනාම බොහෝම උවමනාවෙන් ශ්‍රද්ධාව අවංකවම හදාගන්න. වංකව නෙමෙයි, සම්ප්‍රදායිකව නෙමෙයි, ලෝකයේ භාවනා කරනවට කරනවා නෙමෙයි, තව එක ව්‍යාජත්වයකට නෙමෙයි. කොහොමහරි පද පෙරලපුවහම හම්බ වෙනවා කියන අදහසකිනුත් නෙමෙයි. සහේතුකව බුදුදහම කියන්නේ මොකක්ද කියලා තේරුම් අරගෙන, ජීවිතයේ අවබෝධයක් ඇති කර ගන්නවා කියන තැනින් හැම දෙනාම උත්සාහවත් වෙන්න.

ඔය පින්වතුන්ගේ ජීවිත වාසනාවන්තයි. ඔය පින්වතුන් සසර පෙර පින් කළ නිසා, පුළුවන්කමක් තියෙන නිසයි බුද්ධෝත්පාද කාලයක මනුෂ්‍යය ආත්ම භාවයක් ලබලා මේ වගේ ධර්මය තියෙන වටපිටාවක උපන්නේ. ඒ වාසනාව තිබුණට අපි අද උත්සාහවත් නොකළොත් ඒක ලැබෙන්නේ නැහැ. සාරාඅසංඛ්‍යය කල්ප ලක්ෂයක් පෙරුම් පුරලා ‘මම බුදුවෙයි’ කියලා බෝසතාණන් වහන්සේ ගෙදරට වෙලා හිටියා නම් බුද්ධත්වයට පත් වෙන්නේ නැහැනේ. කොච්චර වීරිය කළාද. ඒ වාසනා ගුණයට අත දීලා නැගිට්ටවලා ගන්නේ.

ඔය පින්වතුන්ගේ නිවීම මිදීම මේ ජීවිතයේදීම හදාගන්න පුළුවන්. ඒ සඳහා මේ දේශනාව ඔය පින්වතුන්ට හේතු උපනිශ්‍රයම වේවා!

ලෝකයෙන් එතෙර වීමට නම් ලෝකයේ කෙළවරට යා යුතුමය

(රෝහිතස්ස සූත්‍රය ඇසුරෙන්)

මම මේ කියන්න හදන ධර්මතා ටික, නොදන්නා කමමයි සසර. මේ කියන්න හදන ධර්මතා ටික හමුනොවුණු නිසාමයි, අනවරාග්‍ර සංසාරයේ එන්න හේතු වුණේ. මේ කියන්න හදන ධර්මතා ටික හමුවීමමයි, බුද්ධ ශාසනයේ හමුවීම. මේ කියන්න හදන ධර්මතා ටික අවබෝධ වීමමයි, බුද්ධ ශාසනය අවබෝධ වීම. එතකොට ඊට මෙහා ලෝකය තුළ යම් පැවැත්මක් වුණා නම් යම් සසරක් වුණා නම් මේ පෙන්වන දහම් කරුණු ටික නොදැක්ක කම, නොලැබුණු කම නිසයි.

අපි මෙහෙම කියමු, එදා රෝහිතස්ස කියන දෙවියට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ‘රෝහිත, මේ පා ගමනින් ගිහිල්ලා ලෝකය කෙළවර කරන්න පුළුවන් කමක් නැහැ. නමුත් ලෝකයේ කෙළවරකට නොගොස් දුක් කෙළවර කරනවා කියන ධර්මතාවයකුත් විද්‍යාමාන වෙන්නෙ නැහැ. ඇහැ ලෝකයේ කෙළවරයි, රූපය ලෝකයේ කෙළවරයි, කන ලෝකයේ කෙළවරයි, ශබ්දය ලෝකයේ කෙළවරයි’ කියලා පෙන්වලා, ඒ රෝහිතස්ස දෙවියට කියනවා,

ඉමස්මිඤ්ඤේව බ්‍යාම මත්තෙ කළේබරේ සසඤ්ඤම්හි සමනකෙ ලෝකඤ්ච පඤ්ඤාපේමි, ලෝක සමුදයඤ්ච පඤ්ඤාපේමි, ලෝක නිරෝධඤ්ච පඤ්ඤාපේමි, ලෝක නිරෝධ ගාමිනි පටිපදඤ්ච පඤ්ඤාපේමි.

මේ බඹයක් පමණ ශරීරය තුළම ලෝකයත්, ලෝකය ඇති වීමත් නැති වීමත්, නැති කරන මගත් පෙන්නුවනේ. එතකොට ඔය තමයි, බුදුරජාණන් වහන්සේගේ දර්ශනය.

බුදුරජාණන් වහන්සේගේ දැක්ම තියෙන මනස. ඔතන ඉන්නකොට ඇති වුණු දැකීම තුළ ඉඳලා තමයි, මේ ලෝකයේ යම්ම දෙයක් කිව්වනම් කිව්වේ. එපා කියලා හෝ ගන්න කියලා හෝ කරගන්න කියලා හෝ ක්‍ෂාත් කරන්න කියලා හෝ මිදෙන්න කියලා හෝ කිව්වනම් ඔතන දැකලයි, ඔතන ඉඳගෙනයි. ඔතෙන්ටයි එන්න ඕනෙ අපි. දැන් ඒ සිද්ධිය අපි නොදැන අපි නොදැක කවදාවත් අපි දුකෙන් මිදෙන්නෙ නැහැ. එතකොට මේ බඹයක් පමණ ශරීරය තුළින්ම, අපි ඇහැ දකින්න ඕනෙ, රූපයත් දකින්න ඕනෙ, චක්ඛු විඤ්ඤාණයත් දකින්න ඕනේ. ඇහැට රූපයක් පෙනෙන්නෙ නැහැ, හිතටයි කියන තැනකින් නෙවෙයි. බඹයක් පමණ ශරීරයෙන් අපිට රූප පෙනෙන්නත් ඕනෙ.

බඹයක් පමණ ශරීරය අරක් ගෙන ලෝකයම මවන ස්පර්ශ ආයතනයන්

දැන් ඇහැට රූපයක් පෙනෙන්නෙ නැහැ පෙනෙන්නෙ හිතටයි කිව්වොත්, දැන් හිත කියලා (බඹයක් පමණ ශරීරයෙන්) අපි, අපේ මනසයි ධම්මාරම්මණයයිනේ දකින්නෙ එතකොට. කොහොම හරි ඒ වගේ, දර්ශනයක් ගොඩ කරගෙන කරගෙන ගියොත්. මනසයි ධම්මාරම්මණයයි මනෝ විඤ්ඤාණයි කියන තැනකින් ආධ්‍යාත්මය දකියි අපි. නමුත් එතකොට අපිට හම්බ වෙන්නෙ නැහැ ඔය සිද්ධියේදි බුදුරජාණන් වහන්සේ දේශනා කළ ඇහැ ලෝකය, රූපය ලෝකය, චක්ඛු විඤ්ඤාණය ලෝකය කියන එක. එතකොට බඹයක් පමණ ශරීරය තුලින් ඒ හිත හම්බ වෙලා නැහැනෙ අපිට නේද? දැන් මේ පෙනෙන දේ අනෙකක්, තියෙන දේ අනෙකක්, මේ පෙනෙන්නෙ මනසටයි කියන තැනකින් ගත්තහම, ඔය කාරණා ටිකෙන් හරි අපිට එක කාරණාවකට එකඟ වෙන්න පුළුවන්. මනෝමයෙන් අපි දකිනවා (මනෝ විඤ්ඤාණ මට්ටමෙන්) ලෝකයක් වගේ තැනක්. එතකොට ඇහැ, රූපය, චක්ඛු විඤ්ඤාණය වගේ ටිකට උත්තර නැහැනේ අපිට නේද?

නමුත් මෙතනදි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ලෝකයේ හැටි. ඒ කියන්නෙ පංච උපාදානස්කන්ධයම, දොළොස් ආයතනයම, අටලොස් ධාතුවම, බඹයක් පමණ ශරීරයෙන් දකින්න කියලා. අපි සාමාන්‍යයෙන් හිතාගෙන ඉන්නෙ ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන ආධ්‍යාත්මික ආයතන ටික විතරනේ බඹයක් පමණ ශරීරයට අයිතියි කියලා. එතකොට මෙතනදි ඕකට තව හොඳ සූත්‍රයකුත් තියෙනවා. අපි පස්සෙ ගලපා ගනිමු. එතකල් මම පොඩි උපමාවක් පෙන්වන්නම්.

එක්තරා මනුස්සයෙක් ඉන්නවා ගෙදරක, ඒ මනුස්සයාම ගේ හදාගන්නවා. ගේ හදාගෙන ඒ ගෙදරට දොරවල් හයකුත් දානවා. හැබැයි එතනදි තමන්ට ඕනෙ විදියටමයි මේ ගේ හදාගන්නෙ එයා. පාරෙ යන එන අයට ඕනෙ විදියට, අනෙක් අයට ඕනෙ විදියට නෙවෙයි. මට ඕනෙ මේකට මෙතන්ට කර්ටින් (curtain) එකක් දාන්න, මදුරු දැලක් දාන්න මදුරුවො එන්නෙ නැති වෙන්න, මෙතෙන්ට මේ විදියෙ වීදුරුවක් දාගන්න ඕනෙ, මේ පාටින් වීදුරුවක් දාගන්න ඕනෙ, කියන කාරණා ටික තෝරගන්නෙ ගෙදර අයිතිකාරයා. තමන්ට ඕනෙ විදියට වීදුරු සහිත දොරවල් ජනෙල් දාලා ගේ හදාගෙන, දැන් ගේ මැද්දට වෙලා ඉන්නවා. දැන් පොතක් කියවනවා. මෙහෙම ඉන්නකොට, ඉස්සරහ වීදුරුවට දාලා තියෙන්නෙ නිල් පාට. මෙහා පැත්තෙ වීදුරුවට දාලා තියෙන්නෙ කහ පාට. ඊගාව එකට දාලා තියෙන්නෙ රතු පාට. දැන් මෙයා හදාගත්ත ගේ මේ.

දැන් පොත කියව කියව ඉන්නකොට, ගෙට එපිටින් ඈත ඉඳලා කිසියම් කෙනෙක් එනවා ගේ දොර ගාවට. අපි කියමු සුදු පාට ඇඳුමක් ඇඳ ගත්තු මනුස්සයෙක් නිල් පාට වීදුරුවක් දාපු දොර ඉස්සරහට එනවා. එනකොට දැන් ගෙදර අයිතිකාරයා පොතක් කියව කියව ඉන්නෙ. දැන් දොරගාවට මනුස්සයෙක් ආවම දොර හරහා, මෙයා ඉන්න තැනට කෙළින්ම පණිවුඩය ලැබෙන්නෙ. එතකොට මෙයාට කව්ද ආවා වගෙයි, කියලා දැනෙනවා. තාම දන්නෙ නැහැ. දැන් අපි මොනව හරි දෙයක් කර කර ඉන්නකොට කව්රු හරි ආවොත්, නිකම් කව්ද ආවා වගේ කියලා තේරෙනවනේ. හොඳට බලන්න කව්ද ආවා වගෙයි කියලා තේරෙනකොට, කරන වැඩේ නතර කරනවා. නතර කරලා, (පොත බලන එක නතර කෙරුවා) දොරටුව දිහා බැලුවා. දොර දිහා බලනකොටම දොරට එපිටින් ඉන්න කෙනා පෙනෙනවා.

මෙන්න මේ උපමාවෙන් වගේ, මේ ප්‍රතිසන්ධි වශයෙන් විඤ්ඤාණය බැසගත්තට පස්සෙ, මේ විඤ්ඤාණය කය ඇසුරු කරගෙන තියෙද්දි, ඔය හිතේ තියෙනවා (ප්‍රතිසන්ධි හිතේ) ඉත්ථින්ද්‍රිය, පුරුෂින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය කියලා කර්මජ රූප ටිකක්. ධම්මායතනය පරියාපන්න රූප. ඔන්න ඕකෙ තියෙන ගතියට තමයි, මේ ප්‍රසාද ටික ඔක්කොම හැදෙන්නෙ. දැන් විඤ්ඤාණය රූපෙට බැසගත්තහම කන බොන ආහාරය ලැබෙන්න ලැබෙන්න වෙන්නෙ, ප්‍රසාද ටික හැදෙන එක. නාම-රූප, සළායතන. ආයතන ටික ඔක්කොම හදලා ගෙදර අයිතිකාරයා දැන් ඇතුළට වෙලා ඉන්නවා වගේ තමයි, හිත භවාංග මට්ටම. දැන් මේ ගේ ඔක්කොම තමන්මයි හදාගෙන තියෙන්නෙ, තමන්ට ඕන විදියට. ඇතළ ඉඳන් මේවා හැදුවා මිසක, පිට ඉඳන් මේවා කව්රුවත් හැදුවෙ නැහැ. ප්‍රසාද ටික ඔක්කොම හැදිලා තියෙනවා, දැන් ගේ ඇතුළට වෙලා ඉන්නවා. ඔය භවාංග මට්ටම දකින්න හරියට නිර්වින්දන එන්නතක් දුන්නා වගේ. මේ ස්පර්ශ ආයතන හයෙන් එකක්වත් දැන් ඉපදිලා නැහැ. දන්නෙ නැහැ මොකුත්. මෙයාට දැන් එක

දොරටුවක්වත් පෙනෙන්නේ නැහැ. තමන්ම තමයි මේ ගේ හැදුවේ, හදලා දැන් පොත කියවනවා, මැද්දට වෙලා ඉඳගෙන. මෙයාට දැන් එක දොරටුවක්වත් පෙනෙන්නෙ නැහැ. මොකුත් ඒ ගැන හැඟීමක් සංඥාවක්වත් නැහැ.

එතකොට පොත කියව කියව ඉන්න කෙනාට, අර දොරට එපිටින් කෙනෙක් ආවහම කෙනෙක් ආපු බව දොර හරහා, (විනිවිද පෙනෙන වීදුරුවක්නෙ තියෙන්නෙ) දොර හරහා දැනෙනවා කව්ද ආවා වගේ කියලා. කව්ද ආවා වගේ දැනෙන එක තමයි - භවාංග චලන කියලා කියන්නෙ. පොත කියව කියව ඉන්න එක නැවැත්තුවා වගේ තමයි - භවාංග උපච්ඡේද, දොර දිහා බලන්න හැරුන එක තමයි - ද්වාරා වජ්ජන. දොර දිහා බැලුවහම එපිටින් ඉන්න කෙනා පෙනෙනවා. එපිටින් ඉන්න කෙනා පෙනෙන එකෙන් දකින්න ඕනෙ, දැන් මෙයා දොර දිහා බලාගෙනයි ඉන්නෙ කියලා. දොර දිහා බැලුවහම, බැලුවා කියන්න තියෙන ලක්ෂණය තමයි එපිටින් ඉන්න කෙනාව පෙනෙනවා කියන එක.

හැබැයි ඉතින් හොඳට මතක තියා ගන්න ඕනෙ, මෙයාට පෙනෙන්නෙ නිල් පාට කෙනෙක්. හැම වෙලාවෙම වීදුරුව හරහයිනේ මෙයාට බලන්න වෙන්නෙ. මෙයාට ඇතුළට හම්බ වෙන්නෙත් නිල් පාට ඇඳගෙන ඉන්න කෙනෙක් ආවා කියන අදහසමයි. දොරට එපිටින් සුදු පාට ඇඳගත්තු කෙනෙක් ආවෙ. නමුත් මේ එපිටින් ඉන්න කෙනා ආපු බව මෙතෙන්ට දැනෙන්න වෙන්නෙත් වීදුරුව හරහා නම්, ආපහු බලන කොට බලන්න වෙන්නෙත් වීදුරුව හරහා නම්, මෙයාට පෙනෙන්නෙ කොහොමද, නිල් පාට ඇඳගත්ත කෙනෙක්මයි කියන එක. මෙයා උපන්න දවසෙ ඉඳලම ගේ ඇතුළෙම නම් හිටියෙ, ගේ ඇතුළෙ ඉඳගෙනම එයාම නම් හදාගත්තෙ මේ විදියට, මෙයාට හැමදාම මේ දොරටුවෙන් බැලුවොත් පෙනෙන්නෙ වෙන්නෙ නිල් පාට අයවමයි. සැබෑවට ගතියක් තිබුණා නම් කවදාවත් මෙයාට මේක අවිෂයයි. පෙනෙන්න බැහැමයි, තේරෙන්නෙ නැහැමයි.

දැන් මට කියන්න මේ ගේ අයිතිකාරයාට අයිතියි නේද, මේ ගේයි, දොරවල් ටිකයි? එතකොට දැන් ඒ දොරටුවෙන් ඒ වීදුරුවෙන් බලන කොට, නිල් පාටට පෙනෙන රූපයක්, එතකොට ඒ රූපය අයිති කාටද? දොරටුවෙන් එහා පැත්තට ආවේ සුදු පාට කෙනෙක්නේ. දැන් නිල් පාටට පෙනෙනවා නම්, මෙහෙම පෙන්නීමේ හැකියාව තියෙන්නෙ කාටද වීදුරුවටනේ. වීදුරුවෙන් නිල් පාට රූපයක් හදලා පෙන්නන කොට මේ නිල් පාට රූපය අයිති කාටද දැන්? මෙහෙම රූපයක් පෙන්නීමේ හැකියාව තියෙන්නෙ දොරටනේ නේද? දොර අයිති, ගේ අයිතිකාරයටනේ. දොරටුවත් අයිති මෙයාට, මෙහෙම රූපයක් පෙනෙනවනම් මේ රූපය අයිතිත් මෙයාට, යන ඝනයට යනවා නේද? දැන් එයා ඒ පාට වීදුරුවක් දාගත්තෙ එයාට ඒ පාට විඳින්න ඕනෙ හින්දනේ. ඒ පාටට කැමති හින්දනේ. දැන් එයාම හදාගත්ත එකෙන් එයාට විඳින්න වෙනවා. මිසක කාගෙවත් කැමති පාටකින්

නෙවෙයි එයා විඳින්න්නෙ, එයා කැමති පාට තමයි දැන් එයාට විඳින්න වෙලා තියෙන්නෙ. එයාට නිල් පාටක් ඕනෙ හින්දයි එයා ඒ පාට දාගත්තෙ. ඒ හින්දා දැන් එයාට විඳින්න වෙන්නෙ නිල් පාට රූපයක්. මොකද එයාට එහෙම එකක් විඳින්න ඕනෙ හින්දයි එයා මෙහෙම වීදුරුවක් දාගත්තෙ ගෙදරට.

ඒ හින්දා තමන්ම හදාගෙන මේ විඳින්නෙ තමන්ගෙම චරිතෙ. ඒ වගේ දැන් ඇහැ, කන, දිව, නාසය, ශරීරය, මනස කියන මේ ආයතන ටික ප්‍රසාද ටික පිහිටලා සම්පූර්ණ සවිඤ්ඤාණකයි හිත, භවාංග මට්ටමේ තියෙන්නෙ. අර ගේ හදලා පුද්ගලයා ඇතුළෙ ඉන්නවා වගේ. සම්පූර්ණ සවිඤ්ඤාණකයි මේ ආයතන ටික, පුද්ගලයා ඉන්නවා.

ඇහැට එපිටින් තියෙන්නෙ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතර මහාධාතු. මේ පංච මහාභූත තියෙන්නෙ. රූප කලාප කලාප කලාප කලාප. දැන් එහෙම කලාප වල, හැඩතල මොකුත් නැහැ. එහෙම කෙළවරක් නැති හිස් අවකාශයේ රූප කලාප කලාප වලින් පිරුනු ඒ හිස් අවකාශ ධාතුව තුළ මේ ඇහෙන් මොකද කරන්නෙ, බලනකොට මේ ඇස් ඉදිරිපිටට යම් කලාප කලාප රාශිවුණු රූපයක් ආවහම, ඇහැ හරහා හැඩයක් ඇතුවයි එන්නෙ මෙහාට. ඊට පස්සෙ මේ ඇහැ හරහා ආපු කෙනාව බලන කොට, අපිට පෙනෙන්නෙ මෙහෙම හැඩයක්මයි. **මොකද අවිද්‍යාව මුල් කෙළවරයි**. මීට පෙර ජීවිතයේ මම මේ මට්ටමේ රූපයක් ඇහින් දැකලා, මේ වගේ රූපෙකට නම් තණ්හා කළේ, මට දැන් හැදෙන ලෙන්ස් (lence) එක හැදෙන්නෙත් මේ මට්ටමේ රූප ගෝචර වෙන විදියට. නමුත් මේ අහසෙ, මේ සියුම් රූප කලාප දැනුත් තියෙනවා ඕන තරම්. ඒ මට්ටමේ එකක් පෙනෙන විදිහෙ ඇහැක් හැදුනොත් මට මේ මට්ටම විඳින්න බැහැනෙ. ඒ කියන්නේ මේ රූප කලාප ටිකයි මෙතන අහසෙ තියෙන රූප කලාප ටිකයි එකතු කරලා රූපයක් පෙනෙන විදියට හැඩයක් එහෙම හැදුනොත්, මට මේ විදියෙ එකක් විඳින්න බැහැ. එහෙම නැත්නම් මේ සියුම් රූප විතරක් පෙනුනොත් මට මේ විදියෙ එකක් විඳින්න බැහැ. මට යන්න බැරිවෙයි. මේකෙ පෙරේතයො, මනුස්සයො අඩියක් තියාගන්න බැරිවෙයි.

නමුත් මේ කාචය හැදුනේ මගෙ කර්මයට. කර්මය කිව්වෙ, මම ප්‍රාර්ථනා කළේ 'මෙහෙම රූපයක් ලැබේවා' කියන තැනකින් නම්, ඔහොම රූපයක් පෙනෙන මට්ටමටයි දැන් මේ කාචය හැදෙන්නෙ. දැන් මේ කාචය හරහා බලනකොට මට හැඩතලයක් පෙනෙනවා. එහෙම යමක් පෙන්නීමේ හැකියාව තියෙන්නෙ කාටද, මේ ඇහැට. දැන් ඇහෙන් හදලා පෙන්වනවා. නමුත් මේ ඇහැට ඔබ්බෙන් තියෙන යථාර්ථය (මට අහුවෙන්නෙ මෙහෙම වුණාට) මේ විතරක් නෙවෙයි, මෙතන සියුම් රූප කලාප ටිකක් තියෙනවනම් දැන් මේ ඇහැට නොපෙනෙන, මේ ඇහැට පෙනෙන සිද්ධිය තුළත්

තියෙන්නෙ ඔය මට්ටමමයි. මේ දැන් යථාර්ථය. මේකෙන් මට විපාක විඳින්න ඕනෙ මට්ටමට ටිකක් මැවෙයි. තව කෙනෙක් සිත දියුණු කළොත් මේකෙ තියෙන තව කලාප ටිකක් අල්ලලා තව හැඩයක් හදලා දෙන්න පුළුවන් ඕනෙනම්. එහෙම නැත්නම් මේ හිස් අවකාශ ධාතුවේ තවත් කලාප අහුවෙන මට්ටමක් තිබුණොත් මේ ලෙන්ස් එකේ, තවත් වෙන හැඩයක් හැදෙයි.

ඊකෙන් මම මතක් කළේ දැන් භවාංග මට්ටමේ හිත තියෙද්දි, ආයතන ටික සවිඤ්ඤාණකයි. ලෙන්ස් එකට අහුවෙන්නෙ හැම වෙලාවෙම කලාප කලාප වශයෙන් තියෙන මෙහෙම හැඩ සටහන් මට්ටමට අහුවෙන සිද්ධියක්. එතකොට කලාප කලාප වශයෙන් මෙතන තියෙන රූප කලාපයක් විතරක් අහුවෙන මට්ටමක් තිබුණොත්, මේකෙන් විඳින්න බැහැ මට. අවකාශ ධාතුවෙ රූප කලාප රාශියක් එක මට්ටමකට එකතු කරලා ගන්න පුළුවන් හැකියාව මෙයාට තියෙනවා. එහෙම හැකියාවකින් සටහනක් හදලා, ඇතුළට මේ වගේ හැඩයක් පෙන්වනවා, (කාචයට වැටෙන කොට). දැන් ඇතුළට එන්නෙත් හැම වෙලාවෙම ඇහැ හරහා නම්, ඒ කියන්නෙ නිල් පාට ඇඳ ගත්ත කෙනෙක්වමයි ඇතුළෙ ඉන්න කෙනාට පණිවිඩය එන්නෙ. එතකොට කව්ද ආවෙ කියලා (කව්ද ආවෙ කියලා බලන්න මෙහාට ඇහැ ගත්තොත්) බැලුවොත් පෙනෙන්නෙ නිල් පාට කෙනෙක්මයි.

එතකොට දැන් මෙතනදි රූපය උපකාරයි ඇහැ උපදින්න. අර මනුස්සයා පොත කියව කියව ඉන්නකොට, කෙනෙක් දොරගාවට ආපු නිසානේ, කව්ද ආව වගේ කියලා තේරුනේ. ඒ නිසානේ දොර දිහා බැලුවෙ. දොර දිහා බලපු නිසානෙ, දොර දැක්කෙ. එතකොට දොර දිහාට යොමුවෙන්න, දොර ගැන දැනුම එන්න, රූපය උපකාරයි. දොර දිහා බලපු හින්දයි රූපය පෙනුනේ. රූපය හම්බ වෙන්න දොර උපකාරයි. මේ දෙන්නා උපකාරයි හිත උපදින්න. හැම වෙලාවෙම රූප කලාප වශයෙන් තියෙන තැනක මෙහෙම සටහනක් හදලා මේ ප්‍රසාදය ඇතුලට දුන්නු එක උපකාරයි, මේ භවාංග චලන, භවාංග උපච්ඡේද, භවාංග ද්වාරා වජ්ජන කියන ටික ඇති වෙන්න. ඒ ටික උපකාරයි මෙයාව අවදි කරවන්න. ඒ ටික උපකාරයි ඔන්න දොර ගැන දැනුම එන්න. ඇහැ උපන්නා, (ඇහැට සිහිය යොමුවුණා) ඇහැට හිත යොමුවුණා. ඇහැට හිත යොමු වුණොත් රූපය පෙනෙනවා. දැන් ඇහැ උපකාරයි රූපය බලන්න. රූපය උපකාරයි ඇහැ උපදින්න. ඔවුනොවුන්ට උපකාරීව මේ දෙන්නා ඉපදිලා, ඒ දෙන්න උපකාරයි හිත උපදින්න.

නිල් පාට ඇඳගත්ත කෙනා දොර ගාවට එන්නත් ඕනෙ. පොත බල බලා ඉන්න කෙනාට තේරිලා පොත කියවන එක අත හැරලා, මේ පැත්ත බලන්නත් ඕනෙ. එයා මේ පැත්තෙ දොර දිහා බැලුවම එපිටින් ඉන්න කෙනාව පෙනුනා. ***තින්නං සංගති ඵස්සෝ*** -

එයා බැලුවා, දොරත් පෙනුනා දොරට එපිටින් ඉන්න කෙනෙත් පෙනුනා. දැන් කෙනෙක්ව පෙනෙනවා, විඳිනවා වගේ තැනකින් කාරණා ලැබෙනවා එකටම.

ඒ වගේ දැන් හැම වෙලාවෙම මෙතෙන්ට තමන් කියන තැනින් මනින්න එපා. මේ ගේ අපේ ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන්නෙ අපේ ගේ. පුද්ගලයා, කෙනා කියලා අපිට හැඟීමක් ආවනම් මේ තැන තමයි කෙළින්ම **විඤ්ඤාණං මජ්ඣෙ** - ඒ කියන්නෙ භවාංග මට්ටමේ සිත. එතකොට මෙතන ඉන්න කොට එකම ස්පර්ශයක්වත් නැහැ. මේ ආයතන ටික පෙර නොතිබීම හටගන්න සිද්ධියක් තියෙන්නෙ.

මෙතනදි දකින්න ඕන එක සිද්ධියක් තියෙනවා. ආයතන වලින් ඇතුළට ඇහැ, කන, දිව, නාසය, ශරීරය දකින්න එපා. චක්ඛු ප්‍රසාද, සෝත ප්‍රසාද .. දකින්න එපා. මේ දැන් කයේ හැටි. කය සවිඤ්ඤාණකයි. ඇයි දැන් විඤ්ඤාණය රූපයට බැසගෙන තියෙන කොට දැන් ආයතන ටික හැදිලා කියන්නෙ, සියුම් ප්‍රසාද සම්පූර්ණයෙන් හැදිලා. මේ කයේ හැටි. කයේ එක තැනක් තියෙනවා, (එක ප්‍රසාදයක් තියෙනවා) රූප පැටලෙනවා. රූපයක් පැටලෙනකොට ඒ සඳහා හිත එතෙන්ට යොමු කළහම බාහිර රූපය පෙනෙනවා. රූප බලන්න පුළුවන් කයේ ඒ තැන නම් කරනවා චක්ඛු ප්‍රසාදය කියලා, මේ බලන සිද්ධියට සාපේක්ෂව කයේ එතැන නම් කරනවා. අල්ලන්න පුළුවන් හින්දා අල්ලෙ මෙතැන නම් කරනවා අපි 'අල්ල' කියලා. නවන්න පුළුවන් හින්දා අපි 'හන්දි' කියනවා. ඒ ඒ කරන වැඩෙන් කයේ ඒ ඒ තැන් නම් කරනවා වගේ.

දැන් උදාහරණයක් හැටියට අපායෙ ඉන්න දෙව්දත්තර හාමුදුරුවන්ගෙ ශරීරය කපන්න පුළුවන්නෙ මල් පෙත්තකින්. අපේ ශරීරය රූප මාත්‍රයක් ඉදිරිපිටට ආවහම, බිඳෙන ශරීරයක් අපිට තියෙන්නෙ. මේ ලොකු එකක් නෙවෙයි, පුද්ගලයා කියලා කියන්නෙ. මුළු ශරීරයම චක්ඛු ප්‍රසාද, සෝත ප්‍රසාද, ඝාන ප්‍රසාද, ජිව්හා ප්‍රසාද, කාය ප්‍රසාද කියන මේ ප්‍රසාද ටිකයි දැන් කය. ඔය ඔක්කොම කය හරහායි එන්නෙ. තාම චක්ඛු කෘත්‍යයක් නැහැ. කයට යමක් ගැටුනහම ගැටුනු තැනට අපි හිත යොමු කරනවා, මොකක්ද කියලා. ඒකයි මම අර කියන්නෙ, ඕනෙ නම් ඇහැට ඉඳිකට්ටකින් ඇනලා (ඇහැ කියන තැනට ඉඳිකට්ටකින් ඇනලා) බලන්න. උපදින හිත මොකක්ද කියලා, කාය විඤ්ඤාණය. මේක ඇහැ නම් උපදින්න ඕනෙ චක්ඛු විඤ්ඤාණයනේ. නමුත් රිදෙන්නෙ ඇයි?, දුක් වේදනාව නිසා. වේදනාව ආවෙ කාය විඤ්ඤාණය නිසානේ, එහෙනම් දැන් මේක කයනේ. මෙහෙන් බලන කෘතයට අනුවයි චක්ඛු කියන්නෙ. දිවේ ඕනම තැනකට ඇනලා ඇනලා බලන්න, කෝ දිව කියලා. ඕනම තැනකට ඇන්නොත් තේරෙයි මේක කාය විඤ්ඤාණය කියලා. දුක් වේදනාව දැනෙන්නෙ කාය විඤ්ඤාණයට, එතකොට කෝ දිව?

මෙතනින් දැන ගන්න ඕන දේ තමයි (අපි තේරුම් කර ගන්න ඕන දේ තමයි) හැම වෙලාවෙම විඤ්ඤාණය භවාංග මට්ටමේ පවතිනකොට මේ මුළු කයම සවිඤ්ඤාණකයි. ඒ කයේ ප්‍රසාද හැදිලා තියෙන්නෙ කර්මානුරූපීව. කයේ එක තැනක් තියෙනවා රූප ගැටෙන. එතකොට රූප වල දැනීම එනවා. තව තැනක් තියෙනවා කම්පන ශබ්ද තරංග දැනෙන, තව තැනක් තියෙනවා ගඳ සුවඳ දැනෙන. ඒකයි ශරීරය නිසා මෙතෙන්ට දැනුනහම භවාංග මට්ටමටම දැනෙනවා කියන්නෙ. එතන තියෙන හිතටම දැනෙනවා කියන්නෙ. අර මකුළුවා දැල බැඳලා මැදට වෙලා ඉන්නවා වගේ. එතකොට තමන්ම මේ දැල හදාගෙන තියෙන්නෙ. මොකටද ගොදුරු කන්න. ඒකයි අපි එක තැනක ඉඳගෙන, ආයතනයට මොනවා හරි පැටලුනා කියලා දැනුනහම, කරන වැඩේ නතර කරලා දැල හරහා නැත්නම් මේ දොර හරහායි හැම වෙලාවෙම බලන්නෙ. දොරේ තියෙන ගතියෙන්මයි විඳින්නෙ අපි. දොර හදාගෙන තියෙන්නෙ අපේ කර්මයේ මට්ටමටයි. එයා දෙන මට්ටමෙන් තමයි අපිට විඳින්න වෙලා තියෙන්නෙ.

එතකොට අපිම උපද්දවා ගත්ත ලෝකයක් තමයි අපිට විඳින්න වෙලා තියෙන්නෙ. දැන් මෙහෙම සටහනක් පෙන්නීමේ හැකියාව තියෙන්නෙ මේ ඇහැට. නැත්නම් මේ හිස් අවකාශ ධාතුවේ රූප කලාප තියෙන්නෙ මෙච්චරක් විතරක් නෙවෙයි. මේ සියුම් සියුම් රූප කලාප, පෙරේත රූප, මනුස්ස රූප, දිව්‍ය රූප, කියලා ඕන තරම් තව තියෙනවා. ඕවා පැටලෙන්නෙ නැහැ මේ ඇහැට. ඒ කියන්නෙ අර උපමාවෙන් බලන්න. මොන වර්ණයකින් ආවත් මට නිල් පාට කණ්නාඩිය හරහායි බලන්න වෙලා තියෙන්නෙ වගේ, කණ්නාඩියේ තියෙන පැවැත්මෙන් පෙනෙන රූපයක් තියෙනවනම් ඒ රූපය, මම අවස්ථාවට හදාගෙනයි බලන්නෙ. අවස්ථාවටයි දොර දිහාවට මම හිත යොමුකලේ. යොමු කළ නිසයි මට මෙහෙම දෙයක් පෙනුනේ. මම ආපහු පොත දිහාවට යොමු වුණොත් දොර පෙනෙන්නෙ නැහැ, දොර පෙනෙන්නෙ නැති වුණාහම මෙහෙම රූපයක් මෙහෙ කොහෙවත් නැහැ දැන්. තේරුනාද?

ඒ වගේ මේ ඇහැ, රූප, චක්ඛු, විඤ්ඤාණ කියන මේ ටිකම බඹයක් පමණ ශරීරයෙන් අපට පෙනෙන්න ඕනෙ. ඒ කියන්නෙ ධාතුව තියෙන තැනක ඇහෙන් බලපු නිසාම මේ ඇහැට මෙහෙම ඉපදිලා පෙනෙනවා. එතකොට තමන් දන්නවා මෙහෙම සටහනක් පෙන්නීමේ හැකියාව තියෙන්නෙ මේ ඇහැට කියන කාරණාව. අපි කියමු, ශබ්දය ගත්තහම මේ දැනුත් රේඩියෝ එකක් දැම්මොත් මෙතන මේ ශබ්දය ඇහෙයි. මේ ශබ්ද තරංග කම්පන තරංග ඕන තරම් මේ හිස් අවකාශයේ තව තියෙනවා. නමුත් අපි මේ මීටරය අරගෙන තියෙන්නෙ ඒ ඔක්කොම ශබ්ද ඇහෙන්න පුළුවන් විදියට නම්, ඉන්නවත් බැරිවෙයි ජීවත් වෙලා, මේ මට්ටමක් විඳින්න බැරි වෙයි අපිට. නිහඬ පරිසරයකින් විඳින්න තියෙන ටිකක් ඕන වෙලාවට විතරක් ශබ්ද අහන්න ඕන කියන

මට්ටමකින් විඳින්න ඕන ටිකක් හම්බ වෙන්න නැති වෙයි. අපිට කන හැදිලා තිබුණොත් හෝ ගාලා මේ ඔක්කොම ශබ්ද අහුවෙන විදියට. මොකද ශබ්ද නැතුව නෙවෙයි තියෙනවා, මේ හිස් අවකාශයේ.

නමුත් කර්මජ රූපය කියන්නෙ, මේ කන හැදිලා තියෙන්නෙ මට ඕන ශබ්දය විතරක් අහන්න කියන තැනකින්. ඉතින් මේ කන හරහා අපි අහනකොට, ඒ තරංග වලින් විතරක් අපිට වැඩ සටහන් හම්බ වෙනවා. හම්බ වෙන කොට ඒ ටික අපි විඳිනවා. එතකොට අපිට හම්බ වෙන රූපයක් වේවා, ශබ්දයක් වේවා, ගන්ධයක් වේවා, මේ ආයතන හරහා උපද්දවගෙනයි අපි බලන්නෙ. හැම වෙලාවෙම ඇහැ - රූප, කන - ශබ්ද, නාසය - ගන්ධ මේ ටික මේ හැදිලා තියෙන්නෙ. හැදිලා කියනකොට මේ කෘතයෙන් නම් කරලා මේ කියන්න වෙන්නෙ. ඇහැට හිත යොමු කළොත් රූප පෙනෙනවා කියන සිද්ධිය වෙනවා. කන යොමු කළොත් ශබ්ද ඇහෙනවා කියන සිද්ධිය වෙනවා. යොමු නොකර ඉන්න තාක් මොකුත් පෙනෙන්නෙ නැහැ. එතකොට යොමු කරන්න තියෙන මාර්ගය තමයි, ඒ ඒ තැන්වලට මේ ආයතන හය තියෙන කොට මොනවා හරි එකක් පැටලෙනවාමයි. පැටලෙන පැටලෙන ගානේ මෙහාට ඇවිල්ලා මෙහෙන් අවධි වෙවී මයි ඉන්නේ. ඒකයි අපි මොනවා හරි බල බල දැක දැකමයි ඉන්නෙ මේ. අහ අහමයි ඉන්නෙ. අපි ලෝකය එක්ක සම්බන්ධ වෙලාමයි ඉන්නෙ හැමවෙලාවෙම.

නමුත් අපිට හිතෙන්නෙ, දකින්න ඉස්සර වෙලත් රූපයක් තිබුණා. දැක්ක වෙලාවෙදිත් තියෙනවා, දැක්කට පස්සෙත් තියෙනවා, බාහිර තියෙන රූපය මේ ඇහෙන් බලනවා කියලයි. නමුත් ඇත්තටම වෙලා තියෙන්නෙ, ඒ මෝඩකම උපකාරයි ආයෙත් මේ ඇහැ උපද්දවන්න. ඇහැ තියෙනවා කියන එක හිතාගෙනනේ බලන්න යන්නෙ අපි. ආයෙත් තියෙනවා. නමුත් හැමදාම වෙලා තියෙන්නෙ මේ ඇහෙන් බලපු හින්දම හැඩයක් පෙනෙනවා. ඇහැ අහකට යනකොටම පෙනෙන හැඩේ නැති වෙනවා. ආයෙත් මෝඩකමට යනවා. රූපයක් තිබුණා, තිබුණ රූපයම මේ ඇහෙන් දැක්කා කියලා. දැන් ඇහැ අහකට ගත්ත නිසා පෙනෙන්නෙ නැහැ. නමුත් රූපය තියෙනවා කියන තැනකින් හිටින්නෙ. මේ මෝඩකමම හේතුයි ආයෙත් ඇහැ හැදෙන්න. ඒ කියන්නෙ, බලන්න ඕනෙ කියලා හිත යොමු කරනකොට ඇහැ සවිඤ්ඤාණක වෙනවා. එතකොටම රූපය පෙනෙනවා.

හැමදාම අපි රූපය ඉතුරු කරලා ලෝකය ඉතුරු කරලා තියෙන්නෙ මෙහෙ. නමුත් ලෝකය කියන එක අවස්ථාවට උපදවාගෙනයි පරිහරණය කරන්නෙ.

යංකිංචිං සමුදය ධම්මං - සබ්බං තං නිරෝධ ධම්මං - හේතු ටික නිරුද්ධ වෙනකොට නිරුද්ධ වෙනවා. ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය, ඇහැත් රූපයත් චක්ඛු විඤ්ඤාණයත් තුන්දෙනාගෙ එකතුවෙන් ලෝකය උපන්නා. මේ පෙනෙන බව වුණා. එතකොට රූපය පෙනුනෙ ඇහැ නිසයි, ඇහැ කියන එක උපන්නෙ රූපය නිසයි, කියන එක හොඳට දැනගන්න ඕනෙ අපි. මට රූපයක් පෙනුනා කියන්න තියෙන ලක්ෂණය තමයි එහෙනම් ඇහැ ඉපදිලා. හිතට ඇහැ ගැන දැනුම ඇවිල්ලා. ඇහැ ගැන දැනුම ආවා කියන්න තියෙන ලක්ෂණය තමයි, රූප පෙනෙනවා. පෙනෙන රූපයෙන් ඇහැ උපදින බවට නුවණත්, ඇහැ ඉපදුන බවට රූප පෙනෙන එකෙන් නුවණත්, මේ දෙන්නා හම්බ වෙන එකට ඊට අනුව හිත තියෙනවා කියන නුවණත්, මේ තුන්දෙනාගෙ එකතුවෙන් දන්නවා.

මේක පෙනෙන්නෙ නැහැ කියනකොට, දැන් දන්නවා එයා, පෙනුන රූපෙ තියෙනවා. දැන් ඇහැ අහකට ගිය ගින්දා පෙනෙන්නෙ නැහැ කියන තැනකින් දකින්න ඇහැක් නැහැ එයාට. එයා දන්නවා රූපය නැත්නම් ඇහැ කියලා එකක් නැහැ. දැන් තියෙන්නෙ එතන කය. චක්ඛු ප්‍රසාදය කියලා කිව්වෙ, රූපය පෙන්නනවා කියන කෘත්‍යයට, ඒ කයේ තැන නම් කළා අපි. දැන් ආපහු භවාංග මට්ටම තිබුණාහම සවිඤ්ඤාණක කය. දැන් ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන කතාවක් නැහැ. භවාංග මට්ටම කියන්නෙ හරියට නිර්වින්දන එන්නතක් දුන්නා වගේ. දැන් ස්පර්ශ ආයතන හයම නැහැ. ආයෙත් ස්පර්ශ ආයතනයක් උපදිනවා නම්, පෙර නොතිබීමමයි උපදින්නෙ.

ඔන්න ඔය නිසයි පවතින දේ අනෙකක් පෙනෙන දේ අනෙකක් කියලා කියන්නෙ. නිල් පාට කණ්නාඩිය හරහා බැලුවහම නිල් පාට කෙනෙක් ඉන්නවා වගෙයි පෙනෙන්නෙ. නමුත් ඉන්නෙ සුදු පාට ඇඳගත්ත කෙනෙක්. ඉන්නෙ සුදු පාට ඇඳගත්ත කෙනෙක් වුණත් පෙනෙන්නෙ නිල් පාට ඇඳගත්ත කෙනෙක් වගේ. පෙනෙන දේ නෙවෙයි තියෙන්නෙ, තියෙන දේ නෙවෙයි පෙනෙන්නෙ. පවතින දේ අනෙකක් පෙනෙන දේ අනෙකක්. එයා දන්නවා ඇහැට මෙහෙම යමක් පෙන්නලා ඒ පෙනෙන දේම හිතෙන් විඳින්න සලස්වලා. අපි විඳින්නෙ අපේම ජීවිතේ මේ. පුරාණ කර්මය විඳ විඳ ඉන්නවා කියලා කියන්න වෙන්නෙ ඒකයි. දැන් ඇහැ හැදුවේ පුරාණ කර්මය. මේ පුරාණ කර්ම ප්‍රත්‍යය උපකාරයෙන් නම් රූපය හැදුනේ, රූපයත් කර්ම ප්‍රත්‍යයෙන් හැදුනා කියලා තමයි කියන්න වෙන්නෙ. රූපයටත් කියන්න තියෙන්නෙ ඇහේ ප්‍රත්‍යය ටිකමයි. ඇහැ පෙර කර්ම, තණ්හාවෙන් නම් හැදුනේ, ඒ ඇහැ උපකාරයෙන් නම් රූපය හැදුවේ, ඒ රූපයටත් කියන්න වෙන්නෙත් ඇහේ ගති ටිකමයි. අවිද්‍යා ප්‍රත්‍යයෙන්, කර්ම ප්‍රත්‍යයෙන් තණ්හා ප්‍රත්‍යයෙන්, ආහාර ප්‍රත්‍යයෙන් කියන ටිකකින්මයි අපිට කියන්න වෙන්නෙ.

නැත්නම් අපිට හම්බ වුනත් නැතත්, පවතින වර්ණ රූපයක් තිබුණානම් ඒක අවිද්‍යා ප්‍රත්‍යයෙන් කර්ම ප්‍රත්‍යයෙන් කියලා පනවන්න බැහැ අපිට. ඒ කියන්නෙ දැන් අපි දකින්න ඉස්සර වෙලා, එතන තියන ටිකකින් මේ වර්ණ සටහන කියන එක හැදිලා තිබුණා නම්, බලන වෙලාවෙදි අපි බලනවා, බැලුවට පස්සෙත් තියෙනවා කියන තැනකින් හිස් අවකාශ ධාතුව තුල තියෙන වර්ණ සටහනක් දැක්කොත්, ඒකත් අවිද්‍යා ප්‍රත්‍යයෙන් හටගත්තේ, කර්ම ප්‍රත්‍යයෙන් හටගත්තෙ, තණ්හා ප්‍රත්‍යයෙන් හටගත්තෙ, ආහාරයන්ගෙන් හටගත්තෙ, කියන එකෙන් කියන්න ගියොත්, ගස් කොළන් වලටත් එහෙනම් අවිද්‍යාව තියෙනවා තියන තැනකින් අපිට ඇති කරන්න වෙයි ප්‍රතිපදාවක්.

නමුත් දැන් පංච උපාදානස්කන්ධ හැම රූපයක්ම (වර්ණ සටහනක්ම) ගන්න, ***අවිජ්ජා සම්භූතං - කම්ම සම්භූතං තණ්හා සම්භූතං - ආහාර සම්භූතං චවත්තේති*** - ඇහැට කියන්න තියෙන කාරණා ටික මොකක්ද? අවිද්‍යා ප්‍රත්‍යයෙන්, කර්ම ප්‍රත්‍යයෙන්, තණ්හා ප්‍රත්‍යයෙන්, ආහාර ප්‍රත්‍යයෙන් කියන කාරණා ටික තමයි ඇහැට කියන්න තියෙන්නෙ නේද? මොකද මෙයා (රූපය) ඔසවලා තියෙන්නෙ මෙයාගෙන් (ඇහෙන්) ඊට පස්සේ එයාගෙ, (ඇහේ) තියෙන ගති ටිකෙන් තමයි මෙයාව (රූපය) කියන්න වෙන්නෙ. ඇහැ කියන එක හැදිලා තියෙන්නෙ මෙයාගෙන් (රූපයෙන්) කියන ටිකකින් තියෙන්නෙ.

නිල් පාට රූපයක් පෙනෙන එකනේ වර්ණ සටහන. එතකොට මේ දොර දිහා බලනකොට නිල් පාට රූපයක් පෙනෙනවා නම් මේක හදපු එකේ අයිතිකාරයා හැටියට කියන්න වෙන්නෙ කණ්නාඩිය හදපු කෙනාගෙ විස්තර ටිකම තමයි කියන්න වෙන්නෙ. දොරටුවෙන් බැලුවහම නම් මෙහෙම හැඩයක් පෙනෙන්නෙ, දොර හැදුවෙ කව්රු කව්රු එකතු වෙලාද? කමලුයි, නිමලුයි, සරතුයි එකතු වෙලා නම් දොර හැදුවෙ, මෙහෙම රූපයක් හදලා තියෙන්නෙත් කමලුයි, නිමලුයි, සරතුයි එකතු වෙලා කියලා තමයි, කියන්න වෙන්නෙ. නැත්නම් මේ රූපයට අයිතිකාරයෙක් නැහැ මේ නිල් පාටට. අර සුදු පාට ඇඳගත්තු කෙනාගෙ විස්තර ටික කියලා හරියනවද මේකට. එහෙම හරියන්නෙ නැහැ.

එතකොට මේ සසර කියලා කිව්වෙ වෙන මොකුත් හිතන්න එපා. මේ අනිත්‍ය දන්නෙ නැහැ. ලෝක නිරෝධය දන්නෙ නැහැ. හැම තැනකටම තියෙන්නෙ එකයි. ඇහෙන් දකින්න පෙරත්, දැක්කට පස්සෙත් දකින වෙලාවෙදිත් ඇහැට පරිබාහිර රූපයක් තියෙනවා. ඇහේ කෘත්‍යය කළත් නොකළත් තියෙන රූපයක් තියෙනවා, තියෙන රූපය ඇහෙන් දකිනවා. අපි ඇහැ අරගෙන පැත්තකට ගියහම දැන් පෙනෙන්නෙ නැහැ, නමුත් රූපය තියෙනවා කියන තැනකින් තිබ්බොත්, මේ තමයි බාහිරෙන් යමක් දැක්කොත්, දකින්න නිත්‍ය සංඥාව තියෙනවාමයි. නිත්‍ය සංඥාව කවදාවත් දුරු කරන්න බැහැ.

බාහිර ආයතනය අනුව විඤ්ඤාණය පිහිටවලා. බඹයක් පමණ ශරීරයෙන් දැක්කොත් ලෝකය - ඇහැ, රූප, චක්ඛු, විඤ්ඤාණය අනිත්‍ය දෙයක් හැටියට පෙනෙනවා. 'රාහුල, ඇහැ නිත්‍යද, අනිත්‍යද? රූපය නිත්‍යද, අනිත්‍යද? චක්ඛු විඤ්ඤාණය නිත්‍යද අනිත්‍යද? අනිත්‍ය නම් රාහුල, ඒක මම හෝ මගෙ හෝ මගෙ ආත්මය හෝ කියලා ගන්න සුදුසුද?' දැන් මේවට මගේ වූ ඇහැක් එහෙම හම්බ වෙන්නෙ නැහැ. මගේ වූ රූපයක් එහෙම හම්බ වෙන්නෙ නැහැ. මගේ වූ චක්ඛු විඤ්ඤාණයක් එහෙම හම්බ වෙන්නෙ නැහැ. ප්‍රත්‍ය ටිකකින් උපන්නා, නිරුද්ධ වෙනවා, මෙහෙම සිද්ධියක් කියන තැනකින් නුවණ යෙදෙන්නෙ, ජීවිතය වෙලා කියන තැනකින්.

එතකොට, ඔන්න මේ මට්ටමට දකින්න පුළුවන්නම් මෙයා තමන්ගෙම ජීවිතය දැන් දකින්නෙ. ඒ කියන්නෙ මෙහෙම බලනකොට, යම් ඇහැක් තියෙනවනම්, යම් රූපයක් තියෙනවනම්, යම් හිතක් තියෙනවනම් මේ ඔක්කොම තමන්ගෙ චරිතය කියලා දකින්න. මේ ඉදිරියෙන් තියෙන දේට කවදාවත් ඇලෙන්න, ගැටන්න බැහැ. දැන් තමන්ට අයිති නැති තැනකින් කෙනෙක් ඉන්නවා කියලා දකිනතාක් මම ඉන්න කෙනාට බනියි, ඉන්න කෙනාගෙ ඇලෙයි. මෙහෙම ධාතුව දිහා බලනකොට මෙහෙම යමක් පෙන්නීමේ හැකියාව තියෙන්නෙ මගේ ඇහැට නම්, ඇහෙන් බලලා මේ වීදුරුවෙන් බලලා මම නිල් පාට දෙයකට කැමතියි කියනවනම්, මම මටමනේ ආපහු තණ්හා කරලා තියෙන්නෙ. මමමයි වීදුරුව හැදුවෙ, හදපු වීදුරුවෙන් මෙහෙම පෙනුනා, අන්තිමට මම තණ්හා කරලා තියෙන්නෙ මගේම චරිතයට, මගේම ක්‍රියාවට කියන තැනකින් උත්තර ආවොත් මෙයා මෙහෙ නිල් පාට එකකට තණ්හා කරන්නෙ නැහැ. මෙයාගෙ ලෝකය සුඥ්ඥෝගාමී කියන තැනකට එනවා. රූපයෙන් කියන අර්ථය එන්නෙ නැහැ මෙයාට විඳින්න. ඒ කියන්නෙ දැන් මෙහෙම ආයතනයෙන් ධාතුව දිහා බැලුවහම, මේ ඇහෙන් බැලුවහම නම් මේ උපද්දලා පෙන්වන්නෙ, මම ආපහු ඇලිලා හෝ ගැටිලා තියෙන්නෙ මගේම ජීවිතය එක්ක. මේ හිත එක්ක, කියන අර්ථයක් එනවා ආපහු.

එතකොට ලෝකය කියන එක සංඥා සහිත බඹයක් සහිත ශරීරය තුළින්ම ඇහැත් රූපයත් චක්ඛු විඤ්ඤාණයත් දකිනවා. ***අජ්ඣත්තං වා පරිනිබ්බාය*** - තමන් තුළම පිරිනිවීමක් දකිනවා. මේ විදියට දකින කොට මොකද වෙලා තියෙන්නෙ, කාලයක් කළොත් මෙච්චර කාලයක් බාහිරෙන් දැකපු පංච උපාදානස්කන්ධයක්, දැකපු වර්ණ රූපයක් තිබුණා නම් ඒ සියලුම රූප, ශබ්ද, ගන්ධ, රස - රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණයන්ගෙන් මෙයාගෙ මනස මිදෙනවා. ඒ අනුව ගිය කෙළෙසුන්ගෙන් මෙයාගෙ මනස මිදෙනවා. තමන් තුළම ඉපිද නිරුද්ධ වෙනවා කියන මේ දර්ශනය කරගෙන කරගෙන යනකොට ඔය ටික ඔක්කොම වෙනවා. මනසයි, ධම්මාරම්මණයයි මනෝ විඤ්ඤාණයි කියන තැනට ඇවිල්ලා.

දැන් කාම භූමියේදි රූපය තියෙනවා කියන තැනකින් පිරිසිඳ දකින්න මෙහෙම හම්බ වෙන මේ රූපයත්, අපි උපද්දවාගෙනයි බලන්නෙ කියන තැනකින් උත්තර යොදාගෙන යොදාගෙන යනකොට, කාමයෙන් මිදෙනවා. ඊට පස්සෙ තමන්ට උද්ධම්භාගිය කියලා කියන්නෙ, මෙහෙම කියලා දැකලා තියෙන තැනක මනසමනේ කියන තැනට උත්තර එනවා. ඒ කියන්නෙ දැන් මෙහෙම පෙනුනත් පෙනෙන්නෙ හිතටමනේ කියන තැනට උත්තර එනවා. ඒක ඕනෙ නැහැ දැනට, කාම ලෝකයේ අනිත්‍ය දකින්න. **මේ ටික දැක්කානම් අනාගාමී වෙනවා.** මෙහෙ කිසිම වෙලාවක යමක් ඉතුරු වෙන්නෙ නැහැ. දැන් මාර්ග ඵල වර්තන සිත්වල ලක්ෂණය තමයි මොකක්ද දර්ශනාර්ථයෙන් 'සම්මා දිට්ඨි', එතකොට ***මිච්ඡා දිට්ඨි, උච්චාහති තදනුවත්ත කිලේසේහිච කන්දහිච්ච උච්චාහති.***

එතකොට ලෝකෝත්තර හිතක ලක්ෂණය තමයි, මාර්ගඵල සිතක ලක්ෂණය තමයි දර්ශනාර්ථයෙන් 'සම්මා දිට්ඨි'. ඒ කියන්නෙ දැන් ලෝකයා දකින්න පෙරත්, දකින වෙලාවෙදිත්, දැක්කයින් පස්සෙත් තියෙන බාහිර රූපයක් දකින තැන, මෙයා දකිනවා මොනවට දුක් විඳීම පිණිස පවතින පංච උපාදානස්කන්ධයේ උදය වැය. ඒ කියන්නෙ මේ ඇහැ නිසයි රූපය උපන්නෙ. මෙහෙම රූපයක් පෙන්නීමේ හැකියාව තියෙන්නෙ මේ ඇහැට නේද? එතකොට මේ ඇහැ උපන්නෙ හිත හින්දා නේද? ඒ කියන්නෙ මේ රූ සටහන ඇහැ හරහා ආපු නිසයි ඇහැ දිහා බැලුවේ, ඇහැ දිහා බලපු නිසයි මෙහෙම පෙනුනෙ, මේ දෙන්නා නිසයි හිත උපන්නෙ, මේ ලෝකය හදාගෙන නේද පෙනෙන්නෙ. මේ පංච උපාදානස්කන්ධයේ උදය වැය මොනවට දුක් ගෙවීමක් පිණිස කියන එකයි බලන්නෙ, එයා ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය අවස්ථාවට උපද්දවාගෙනයි දැන් බලන්නෙ. ඇහැ අහකට යනවා කියන්නෙ මෙහෙම රූපයක් ශේෂයක්වත් නැහැ. එතකොට රූපය කියන එකෙත්. දැන් ඇහැ කියන එක ශේෂයක්වත් නැහැ. මේ දෙන්නා නැහැ කියන්නෙ හිත කියන එක ශේෂයක්වත් නැහැ කියලා ඉතුරු නැතුවම නිරෝධය දකින කොට, මෙන්න මේ දැකීම අර්ථයෙන් 'සම්මා දිට්ඨි' කියනවා.

එතකොට ***මිච්ඡා දිට්ඨි උච්චහති*** - මිච්ඡා දිට්ඨිය නැති වෙනවා. මිච්ඡා දිට්ඨිය කියන්නෙ මොකක්ද, නිත්‍යයි, සැපයි, ආත්මයි. ඒ කියන්නෙ දකින්න පෙරත් රූපය තිබුණා තියෙන රූපය දැන් දකිනවා දැක්කට පස්සෙත් තියෙනවා, කියන යම් නිත්‍ය බවක් තිබුණා නම් මේ වැරදි දැකීම අත හැරෙනවා. දැන් එහෙම එකක් නැහැ. දැන් අනිත්‍යයි කියන දැක්ම තියෙන්නෙ. එතකොට යමක් අනිත්‍යයි නම් ඒක අල්ලගෙන විඳින්න පුළුවන් සැප විඳින්න පුළුවන් කියන මට්ටම අත හැරෙනවා. ඒක මම මගේ කියලා ගන්න තියෙන ටික අත හැරෙනවා. ***තදනුවත්ත කෙලේසේහි ඛන්දේහිච උච්චහති*** - ඒ අනුව ගිය

කෙළෙසුන්ද ස්කන්ධයන්ගෙන්ද, රූපය කියලා යමක් ගත්ත නම් ඒ රූපය විඳින්න පුළුවන් හඳුනන්න පුළුවන් කියන තැනකින්, රූපය විඳිනවා හඳුනනවා කියන තැනකින්, ඒ ස්කන්ධය, ඒ රූපය මගෙ කියලා ගන්න මට්ටමේ කෙළෙසුත් තියෙනවනම් ඒ දෙකෙනුත් අත හැරිලා දැන් මෙයාට. කෙළෙසුයි ස්කන්ධයෝයි දෙකම අතහැරිලා. ***බහිද්ධා සබ්බ නිමිත්තේහි උට්ඨාහති*** - බාහිර සියළුම නිමිත්තන්ගෙනුත් දැන් නැගිටලා. දැන් එයාට හම්බ වෙන්නෙ බාහිර කියලා කෙනෙක් නෙවෙයි නිමිත්තක්.

මෙන්න මේ ටික දැන් පෙන්නුවෙ මාර්ග සිතක ලක්ෂණ ටික. එතකොට ඵල සිත කියන්නෙම ඔය දර්ශනයමයි ප්‍රයෝගය සංසිඳුනු බව විතරයි. එතකොට මෙන්න මෙතනදි හොඳට බලන්න, ලෝකෝත්තර සිත කියලා කිව්වේ, ලෝකයේ කියලා යමක් ඉතුරු නොවී තමන් තුළ ලෝකය කියලා පෙනෙන මට්ටමට, තමන් තුළම මේ ටික ඉපිද නිරුද්ධ වෙනවා කියන ලක්ෂණයට. ඒකෙදි හිස් බවක් සුඤ්ඤ බවක් අල්ලන සිතකට ලෝකෝත්තර කියලා හඳුන්වන්නෙ නැහැ. මේ ලෝකයෙන් එතෙර වෙන මට්ටම, මේ සම්මා දිට්ඨි අර්ථයෙන් දකින්න ඕනෙ. එතකොට ඔය වගේ කන, ශබ්දය, සෝත විඤ්ඤාණය කියන ටිකත් තමන් තුළම දැක්කොත් මේ ස්පර්ශ ආයතන හයම දොළොස් ආයතනයම, අටලොස් ධාතුවම තමන් තුළ ඉපිද නිරුද්ධවෙන සිද්ධියක් හැටියට දැක්කොත් ඉබේමයි 'ශූන්‍යතාවය' එළඹ සිටින්නෙ.

මම වෙනදා කියන උපමාව ඔය අර්ථයෙන්ම ගන්න. ඇස් ඉදිරිපිටට වැලි කැට ටිකක් ආවොත් වැලි කැට ටිකක් තියෙන තැනක මේ ප්‍රසාදය හරහා ඇතුළට දැනෙන්නෙ කන්දක සංඥාවක්. මොකද ඉදිරියෙන් වැලි කැට කැට කැට කැට තිබුණාට, එහෙම තියෙන දේ ඇහැට වැටුණහම ඇහැට වැටෙන්නෙත් වැලි කැට කැටමයි. ඇහැ හරහා ඇතුළට යන්න තියෙන පණිවිඩය මොකක්ද, මේ ඇහේ තියෙනවනේ ගතියක්, ගොඩක් එකතු කරලා පෙන්වන ලක්ෂණයකින් තමයි භවාංග සිතට යන්නෙ. ඒකයි දැන් චක්ඛු විඤ්ඤාණය උපදින්න රූපය ඇරඹෙන පැත්තෙන් ප්‍රත්‍යය වෙනවා කියලා, මෙහෙම ආවහම ආපු එක ආවර්ජනය කරගෙනයි මෙයාට නැගිටින්න වෙන්නෙ දැන්. ඇහැ හරහා ඇතුළට ආවෙත් ඔන්න දැන් කන්දක්මයි. ඊට පස්සෙ ඇහැ හරහා කරන දේ නතර කරලා දොර දිහානෙ බලන්න වෙන්නෙ මෙයාට. දොරටුව හරහා බලනකොට ඉදිරියෙන් තියෙන දේ පෙනෙනවා කියලා කියන්නෙ දොරටුවේ තියෙන ගතියයි මේ පෙනෙන්නෙ දැන්. පෙනෙන්නෙ වැලි ගොඩක්. වැලි ගොඩක් බලාගෙන ඉන්නවා. මේ ස්කන්ධයන්ගේ උදය වැය නොදන්නා කම නිසා, ලෝකයා ස්කන්ධයන්ගේ උදය වැය නොදන්නවා කියන කොට මේ තියෙන රූපයකුයි පෙනෙන්නෙ, මේ තියෙන රූපයක්ම බලාගෙන ඉන්නවා, දැකපු රූපය තියෙනවා කියන තැනකින් තමයි ප්‍රතිචාර එන්නෙ. ඔන්න දැන් වැලි ගොඩක් තියෙන්නෙ එයාට. තියෙන වැලි ගොඩක් දකින්නෙ, තියෙන වැලි ගොඩයි පෙනෙන්නෙ.

පෙනුන වැලිගොඩ තියෙනවා කියන තැනකින් උත්තර එනවා.

දැන් ඉතින් මේ වැලි ගොඩ හොඳයි, කපරාදු කරන්න හරි, සිමෙන්ති දාන්නහරිත් හොඳයි, වැලි කියුබ් එකක් මෙච්චර වෙනවා කියන තැනකින් තීන්දු තීරණ නාවොත් තමයි පුදුමෙ. මොකද මේ ස්කන්ධයන්ගේ උදය වැය දන්නෙ නැහැ. ඉතින් නීතියක් දානවා, අපි නිකමට කිව්වොත් වැලිගොඩ දිහා බලාගෙන ඉන්න කොට එන්න කියනවා සෙනඟ ලක්ෂයකට විතර. වැලි ගොඩට එහෙම අත තියන්නෙ නැහැ කව්රුවත්, වැලිගොඩ ගෙනියන්න තහනම්. එක්කෙනෙක් එක වැලි කැටය ගානෙ අරගෙන යන්න ඕනෙ. එක එක්කෙනාට දෙනවා වැලි කැටේ කැටේ කැටේ කැටේ ඔතනින් ඉවත් කරන්න. ගොඩ ගෙනියන්න තහනම්. දැන් අපි බලාගෙන ඉන්න එක විතරයි කරන්නෙ, මේ ඇහෙන්. බලාගෙන ඉන්නකොට අපිට කන්දක් නැති වෙනවා. ඊට පස්සේ වැලි ගොඩක් ගෙනෙන්න තහනම්. එක් කෙනෙකුට පුළුවන් එක වැලි කැටයක් ගෙනත් දාන්න, දානවා දැන්. දැම්මහම ආයෙත් ගොඩක් පෙනෙයි.

දැන් හොඳට අපි තේරුම් කරගන්න ඕනෙ, වැලි ගොඩක් මෙතන තියෙනවා, වැලි ගොඩක් නැති වෙනවා, කියන කාරණා ටික අපිට පෙනෙද්දි බාහිර ධාතුවේ වුනේ මෙහෙම සිද්ධියක්. රූප කලාප කලාප විසිරෙන කොට මෙහෙම පෙනෙන්නෙ නැහැ. රූප කලාප කලාප රාශි වෙනකොට මෙහෙම පෙනෙනවා. වැලි කැට කැට ටික විසිරෙන කොට මෙහෙම පෙනෙන්නෙ නැති වුනාට, වැලි කැට කැට ටික එකතු වෙනකොට ගොඩක් පෙනෙනවා. මේ කෙනා ගේන වැලි කැටය අනෙක් කෙනා ගේන වැලි කැටයට සම්බන්ධ නැහැ. මෙයා ගේන වැලි කැටය අනෙක් කෙනා ගේන වැලි කැටය දන්නෙ නැහැ.

අවකාශ ධාතුවට රාශි වෙලා තියෙන්නෙ ඔහොමමයි. ඔහොම තියෙන කොට දැන් මෙයා දැක්කොත් අපි දකින්න පෙරත් දැක්කයින් පස්සෙත් දකින වෙලාවෙදිත් තියෙන්නෙ වැලි කැට. වැලි කැට තියෙන තැනක මෙහෙම හැඩයක් පෙන්නීම මේ ඇහේ හැකියාව නේද, කියලා බැලුවොත් දැක්කොත්, මෙයා දන්නවා වැලි ගොඩ කියන එක උපද්දවාගෙනයි දැන් පරිහරණය කරන්නෙ කියලා. ***තින්නං සංගති ඵස්සෝ*** - මේ ඇහැ, රූප, චක්ඛු, විඤ්ඤාණය යන තුන්දෙනාගෙ එකතුව කියන කොට ඇහෙන් වැලි ගොඩ හදලා, වැලි ගොඩ ඇහැ හදලා, ඒ දෙන්නම එකතු වෙලා පෙනෙන හිත හදලා, හිත මේ දෙන්නව හදලා මේ තුන්දෙනා එකට එකතු වෙලා පෙන්වනවා මෙහෙම හැඩයක්.

විඤ්ඤාණය මායාවක් වගේ කියන්නෙ ඒකයි එවෙලෙම ලෝකය හදලා දෙනවා දැන්. කොත්තුවක් හැදුවා වගේ, ඒ කියන්නෙ මේකෙන් ටිකක් දැම්මා මේකෙන් ටිකක් දැම්මා දඩ බඩ ගාලා ගැහුවා, මෙන්න කොත්තුව කියලා දුන්නා වගේ. ඇහෙන් ටිකක්

දැම්මා රූපෙට, රූපෙන් ටිකක් දැම්මා ඇහැට දෙන්නා එකතු වෙලා හිතට දැම්මා තුන්දෙනා එකතු වෙලා දුන්නා ලස්සන රූපයක් දැන්. මේ පෙර නොතිබීම හටගෙන ඉතිරි නැතුව නැති වෙනවා **යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං** - කියලා මේ හේතුඵල දහම දන්නෙ නැත්නම්, මේ මේ ප්‍රත්‍ය ටික නිසයි ලෝකය උපන්නෙ, ප්‍රත්‍ය ටික නැති වෙන කොට නැති වෙනවා කියන තැනකින් නොදන්නවා වෙනකොට මේ රූපය ඉතුරු වෙනවා. දැන් මේ ටික දැක්කොත් වැලි ගොඩ කියන එක පෙර නොතිබීමයි මේ හටගන්නෙ. මේ කිහිප දෙනාගෙම කෘත්‍යයෙන් කරලා තියෙන්නෙ මේ ටිකනෙ දැන්. දොරෙන් එහා නිල් පාට කෙනෙක් ඉන්නවා කියලා පෙන්වන එකයි මේ කරලා තියෙන්නෙ. දොර හැදුවෙත් ඒකට, කෙනා යොමුවුණොත් ඒකට, ඔක්කොම ටිකේ ප්‍රතිඵලය වුණොත් මෙහෙම දෙයක් පෙන්නන්න.

දැන් පැත්තකට ගියහම තියෙන්නෙ වැලි කැට කියලත් තේරෙනවා නම්, ආපහු වැලි කැට දිහා බැලුවම ඇහෙන් බලනකොට මෙහෙම ගොඩක් පෙනෙනවා කියලත් තේරෙනවා නම්, එහෙනම් එයා දන්නවා වැලි ගොඩ, දකින්න පෙර (ඇහෙන් බලන්න පෙර) තිබුණත් නෙවෙයි, ඇහෙන් බැලුවට පස්සෙ තියෙනවත් නෙවෙයි. ඇහෙන් බලන වෙලාවට මෙන්න මේ ප්‍රත්‍ය ටික නිසා මෙහෙම පෙනෙනවා. මේ ප්‍රත්‍ය ටික නැති වෙන කොට නැති වෙනවා කියලා නුවණක් ආවොත්, දැන් මේ පෙනෙන වැලිගොඩ ගත්ත හැකිද කපරාදු කරන්න. මොකද වැලි කැට ටික දකින කොට මේක කපරාදු කරන්න හොඳයි කියලා හිතෙන්නෙ නැහැනෙ වැලි කැට ටික බලලා. වැලි ගොඩ දැක්කමනෙ හිතෙන්නෙ. දැන් ඔය පෙනෙන වැලි ගොඩෙන් ඔහොම දැක්කොත් ඔය වැලි කියුබ් එක රුපියල් දහ දාහයි කියලා මනියිද? මනින්න පුළුවන්ද? දැන් මේ වැලි ගොඩෙන් කපරාදු කරන්න ඕනෙ, සිමෙන්ති දාන්න ඕනෙ, මේ ඇස් පනාපිට පෙනෙනවනම් තමන්ම උපද්දලයි තමන්ට පෙනෙන්නේ වැලි ගොඩ කියලා. මෙහෙන් එන ප්‍රතිචාර නැහැ. ලෝකය තියෙන මට්ටම .

ඒ නිසා හොඳට දකින්න ඕනෙ. මේ ලෝකය කියන එක අපි ආයතන ටිකෙන් බලලයි මේ පෙනෙන්නෙ. අපිට පෙනුනහම අපි අහකට යනකොට ඉතුරු නැතුවම නැති වෙනවා, මේ පෙනෙන හැම එකක්ම. ඊට පස්සෙ කිසිම හැඩ තලයකින් තොර රූප කලාප මේ අවකාශ ධාතුව තුල අහුරාගෙන තියෙන්නෙ. අපි මේ මට්ටමේ රූප දකින්න අපි ගාව තිබුණු තණ්හාව නිසා, මේ හිස් අවකාශයේ තියෙන රූප කලාපත් මේ දැන් වස්තුවක් පෙනෙන කොට ඒ අභ්‍යන්තරය හැදිලා තියෙන රූප කලාපත් එක මට්ටමක තියෙන්නෙ. නමුත් එක එක මට්ටමට අවකාශ ධාතුව තුල රූප කලාප එකතු කරලා පෙන්නීමේ හැකියාව මේ විපාකයක මට්ටම.

තව එකක්, මම අර කිව්වෙ, දැන් ලෝකයේ වර්ණ අන්ධතාවය කියලා එකක් තියෙනවා. අහලා තියෙනවද? දැන් මම අහන්නෙ ඔය වර්ණ සටහන කියන එක බාහිරයෙන්ම පෙනෙන එකක් නම්, දැන් රතු පාට වර්ණ අන්ධතාවයට (ගොඩාක් අයට රතු පාට පෙනෙන්නෙ නැහැ) මට රතු පාටට පෙනෙන්නෙ නැති වර්ණය ඔබ වහන්සේට හොඳට පෙනෙනවා. මෙතන තියෙන වර්ණ සටහන කොහොමද මට පෙනෙන්නෙ නැති වුණේ, ඔබ වහන්සේට පෙනුනෙ? වර්ණ අන්ධතාවය කියන එක පිළිගන්නවද ඇහේ තියෙන ස්නායු දුර්වල කමක් කියලා. දැන් එහෙනම් එහෙම වර්ණයක් පෙන්නලා තියෙන්නෙ ඇහෙන් කියන එක අපිට පිළිගන්න වෙනවා නේද? දැන් අපි හිතාගෙන ඉන්නෙ ඇහේ සම්බන්ධයකින් තොරව, ඇහැ උදව් වුනත් නැතත් තියෙන වර්ණ සටහනක් ගැනනේ, ලෝකයා කතා කළේ. එහෙම එකක් නැහැ හදාගෙනයි පරිහරණය කරන්නෙ කියන සිද්ධිය ඔප්පු වෙනවා නේද එහෙනම්.

ඒකෙන් කියනවා. මෙහෙම වර්ණ සටහන් පෙනීමේ හැකියාව තියෙන්නෙ, මේ ඇහැට. මේ ඇහේ යම් යම් ස්නායු දුර්වල වුණොත් ඒකෙ වර්ණ පෙන්නීමේ හැකියාව නැහැ. රස දැනෙන කොට රස නහරවල් කියලා තියෙනවා. ඒ කර්මජ රූප. ඒ ඒ ස්නායු මැරුණොත් මේ දැනෙන රසය අඩුයි. චක්‍රවර්ති රජ කෙනෙකුට රස නහරවල් හත් සියයක් තියෙනවලු. එයාට දැනෙන රස වැඩියි. ඒ රසය අපිට එහෙම දැනෙන්නෙ නැහැ. එතකොට මේ රසය කෙනා කෙනාගෙ කර්මයට උපදින රසයක්. මේක අනිත්‍යයි. ඉපිද නිරුද්ධ වෙන එකක් මේ රසය. එහෙමනම් එහෙ තියෙන රසය නම් ඔක්කොටම දැනෙන්නෙ, චක්‍රවර්තී රජුට වැඩි රසයක් දැනෙන්නෙ කොහොමද? අනෙක් කෙනාට රස අඩුවෙන්නෙ කොහොමද? එතකොට හොඳට දකින්න ඕනෙ ඒ බාහිරේ ඉපැද්දුවෙ මෙහෙන්. මෙහෙ ඉපැද්දුවෙ එහෙන්. ඒකෙන් දකින්න මේ ලෝකය, තමන් තුළින්ම දකින්න මේ ලෝකය ඉපිද නිරුද්ධ වෙන බව.

ඔන්න ඔය ටික දැකලා ඔය ටික කරන්න. 'නිවන' කියලවත් අමුතුවෙන් ඕනෙ නැහැ. ඒකමයි නිවන. ඒ කිව්වෙ මේ ටික තමන් තුළින්ම මේ ස්කන්ධයෝ දකින කොට සුඤ්ඤතාවය එළඹ සිටින්නෙ ඉබේමයි. ඕක පෙන්වනවා බුදුරජාණන් වහන්සේ කිංසිකෝපම සූත්‍රයේදි. පූසෙකුට බල්ලෙකුට රිංගන්න බැරි මහා ප්‍රාකාරයක් තියෙනවා, දොරටු හයක් තියෙන. ඔය විදර්ශනා කරන්න තියෙන ක්‍රමය පෙන්වනවා හොඳට. ඒ ප්‍රාකාරයෙන් ඇතුළෙ සිව් මංසලක් තියෙනවා. සිව් මංසලක නගර හිමියෙක් ඉන්නවා. සීඝ්‍රදූත යුවලක් මේ දොරටු හරහා ඇවිත් නගර හිමියට පණිවිඩේ පවරලා දීලා යනවා, කියන තැනකින්. මේ ප්‍රාකාරය වගේ තමයි බල්ලෙකුට පූසෙකුට එන්න බැරි දොරටු හයක් තියෙන මේ ශරීරයේ දොරටු ටික. දොරටු පාලයා තමයි - සිහිය. සිව් මංසල වගේ තමයි පඨවි, ආපෝ, තේජෝ, වායෝ. නගර හිමියා කිව්වේ - විඤ්ඤාණය. මේ හරහා පණිවුඩය

පවරලා දෙනවා, කියන තැනකින් මේ දර්ශනය කියනවා බුදුරජාණන් වහන්සේ හරි ලස්සනට. මේකම ආ මඟින්ම යනවා කියන කොට මේ තමයි ආර්ය අෂ්ඨාංගික මාර්ගය.

ඔය විදියට බැලුවහම මේ ඇහැ තමන්ගේ කියන මිම්ම අත හැරෙනවා ඉබේම. ඒ කියන්නෙ දැන් අපි දන්නවා ඇහැ උපකාරයෙන් මේ වස්තූන් අරහයා කෙළින්ම එන්නෙ හිතට, තමන්ටමයි, තමන්ගෙම භවාංග මට්ටමටමයි. තමන් මේ දොරටුව දිහා බලපු හින්දා ඇහැ දිහා බලපු හින්දා හිත, හිත ඇහැට යොමු කරපු හින්දයි දැන් මෙහෙම සටහනක් පෙනෙන්නෙ ඇහැ හරහා, කියලත් තේරෙනවා. එතකොට මේ ඇහැ, කන, දිව, නාසය, ශරීරය කියන්නෙ තමන් නෙවෙයි, තමන්ගෙ ගේ. ඉබ්බා යන යන තැන කටුව උස්සගෙන යනවා වගේ. මේ ගේත් උස්සගෙනයි යන්නෙ අපි යන යන තැන. මේ ගෘහය හදන වඩුවා තමයි හොයා ගන්න බැරිවෙලා තිබුණෙ මෙච්චර කල්. මේ ගේ මමයි කියලා අරගෙන මේ තියෙන්නෙ. ඉතින් මේ ගේ, ගේ හදන්නෙ මේ ආයතන තුළ ඉඳගෙන. ඉතින් ඒ බව හොඳින් තේරුම් කර ගන්න. අපි දහමක් හිතනකොට, ඔන්න ඔතෙන්ට තියලා හිතන්න හැම දහමකට උත්තර එනවා ක්ෂණිකව, හරියටම බැලුවොත්. ඔය ටික තමයි මට කියන්න තියෙන්නෙ. එතකොට මේ ලෝකය කියන එක, බාහිරෙන් දකින්න එපා. ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය අවස්ථාවට ඉපදිලා නිරුද්ධ වෙනවා. නිදොස්වූ ආර්ය වූ මොනවට දුක් ගෙවීම පිණිස පවතින පංච උපාදානස්කන්ධයේ උදය වැය දැකීම කියන තැනකින් කියන්නෙ, මේ සිද්ධියමයි නිවන් දකින්න තියෙන්නෙ. මොනවට දුක් ගෙවීම පිණිස පවතිනවද? **සම්පූර්ණ ලෝකයක් ඇති වීම, නැති වීම, පෙනෙනවා.**